

# සංයුක්ත ප්‍රදීපිකා

නම්

# සගාථක ධර්මකථා

(ප්‍රථම භාගය)

# SANUKKTHA PRADĪPIKA

OR

# SAGATHAKA DHARMA KATHA.

FIRST PART.

# සංයුක්තප්‍රදීපිකා

නම්

# සගාථක ධර්මකථා.

ප්‍රථම භාගය.


බෙන්තර

ශෛලානන්දායතන පරිවෙණාධිපති අතිගරු

ආනන්ද ධර්මදර්ශි ශ්‍රී ශරණඞ්කරාභිධාන

නායක මාහිමියන් වහන්සේ

විසින්


පිළ ..න්තාලදී.


ජී. ඇ. ල්. පී. ගුණසේකර සේනානායක මහතුන්

විසින්

මහාබෝධි යන්ත්‍රාලයේ මුද්‍රණය කරවා

ප්‍රසිද්ධ කරණලදී

ශ්‍රී: බු: ව: 2480.

ක්‍රි: ව: 1936.

මිල [illegible] සි

# SANUKKTHA PRADĪPIKA.

FIRST PART OF THE BOOK CALLED

SAGHATHĀKA-DHARMA-KATHA

OTHERWISE KNOWN AS

SANUKKTHA PRADIPIKA.

*Consisting of the summaries, explanatory notes,*
*extracts and ellucidations of the*

## SANUKKTHA NIKĀYA.

---

EDITED BY

REV: KIRIELLE ÑANAWIMALA BHIKKHU
AND
PANDIT G. K. MARAJASINGHE UHANOWITA.

---

REVISED BY
THE VERY VENERABLE
BENTHARA ANANDA DHARMADHARSI SRI SARANANKARA
*Mahā Nāyaka Thera,*
*The Principal of Sailānthayathana Pirivena.*

---

PUBLISHED BY
**ALEXANDER LAWRENCE PIERIS GUNASEKERA SENANAYAKA ESQ.**
*of Malwatta Walawwa, Grandpass, Colombo.*

---

PRINTED AT THE
Maha-Bodhi Press, Colombo.

---

B. E. 2480
C. E. 1936

# සංයුක්ත ප්‍රදීපිකා
නම්
# සගාථක ධර්මකථා.

---

රත්නපුර මාරපණ ගඞ්ගාතිලක විහාරාධිපති

අතිගරු

**මාරපණ මේධඞ්කර මහාස්ථවිරපාදයන් වහන්සේගේ**

සහ

තත් විහාරස්ථ

**ශාසනෝදය පරිවෙණාධිපති කර්මාචාර්ය ධුරන්ධර**

විචිත්‍රකථික

**ශ්‍රී සෝභිත සිරිසුමන මහාස්ථවිරපාදයන් වහන්සේගේ ද ශිෂ්‍ය**

## කිරිඇල්ලේ ඤාණවිමල ස්වාමීන් වහන්සේ

හා

විද්‍යෝදය පරිවෙණාධිපතිව වැඩවිසූ අතිගරු

**ශ්‍රී ඤාණේශ්වර නායක මාහිමියන් වහන්සේ වෙතින්**

ධර්මශාස්ත්‍රාදග්‍රහණය කළ

## ජී. කේ. මාරාජසිංහ උහන්ඕවිට පඬිතුමන්

විසින්

**සම්පාදනය කරනලදී.**

---

බෙන්තර ශෛලාන්තායතන පරිවෙණාධිපති අතිගරු

## ආනන්ද ධර්මදර්ශී ශ්‍රී ශරණඞ්කරාභිධාන

**සෙලන්තරමූල නිකායේ ප්‍රධාන නායක මාහිමියන්**

වහන්සේ විසින්

පිරික්සනා ලදී.

---

කොළඹ "ග්‍රෑන්පාස්" හි මල්වත්තේ වලව්වේ

**ඇලෙක්සැන්ඩර් ලෝරන්ස් පීරිස් ගුණසේකර සේනානායක**

මහතුන් විසින්

ලංකාබෝධි යන්ත්‍රාලයෙහි මුද්‍රණය කරවා

ප්‍රසිද්ධ කරනලදී.




සත්කීත්තිමත්

ජී. ජේ. බී. කිරිඇල්ලේ

දිශාමන්ත්‍රීශ්වරයාණො.

**FIRST PART**

OF

# Sanukktha Pradipika

IS

**Dedicated**

TO

**G. F. B. Kirielle Esqr. R. M.**

OF

KUKULU KORALE

*In Appreciation of His Services*
*to Buddhism and to Education.*

---

"සංයුකතප්‍රදීපිකා"

නම් මේ ග්‍රන්ථයේ

ප්‍රථම භාගය

කුකුළුකෝරළේ රට ලැබි කරවන සත්කීර්තිමත්

ජී. ජේ. බී. කිරිඇල්ලේ දිශාමන්ත්‍රීශ්වරයානන්

වෙත ස්වකීය පළාත්වාසීන්ගේ

අධ්‍යාපනාදී පොදු සහපතන් විශේෂයෙන්

සම්බුද්ධශාසනයේ දියුණුවත් සඳහා

දක්වන අමන්දෝත්සාහයට බුහුමන් කිරීමක් වශයෙන්

සමර්පණය කරණ ලදී.

---

# PREFACE.

This treatise entitled Samukkthapradīpikā is an easy commentary on the Samukktha Nikāya, one of the divisions of the Sutra Pitaka which contains the doctrines preached by the Buddha.

According to the divisions made at the rehearsal in the First Council by the arahat monks headed by Mahākassapa, this is the third of the five Nikāyas, Dīgha, Majjhima, Samukktha, Anguttara and Khuddaka. This is called the Samukktha, "Collected Sayings", because it consists of groups, each group pertaining to one subject, such as questions of the gods and their answers. This Nikaya is divided into five sections, Sagāthaka, Nidāna, Khanda, Salāyatana and Mahāvagga, which are again subdivided into fifty-five groups.

From time to time there have appeared from the hands of scholars incomplete commentaries on the verse or prose of the Samukktha, which we trust have been of use to the Buddhists. The present work also was undertaken solely with a view to facilitate the understanding of the Buddhist doctrine. This is only the first part of our proposed commentary on the Samukktha, and consists of an exposition of the Devatāsamukktha. It consists of five parts—a table of contents, the subject matter in outline, a paraphrase, translation and explanatory matter. Which includes illustrative stories. In compiling this book we have taken extracts from the following works.— Vibhanga, Sammohavinodanī, Abhidharmārthasangraha, Visuddhimagga, Paramatthamanjūsā, Sumangalavilāsini, Papancasūdani, Atthasālinī, Mahavagga, Samantapāsādikā, Manôrathapūranī and other works. We hope that this work would be of use to both monks and laymen.

Our thanks are due to Ananda Dharmadharsi Sri Saranankara Nayaka Thero, principal of Sailāntayatana Pirivena, Bentara, for reading the final proof sheets. We hope to place before the Buddhist public the rest of the work as immediately as possible. As the compilation and printing of this book was done hurriedly any errors that may have crept in will be corrected in the second *edition*.

**KIRIELLE ÑANAWIMALA.**

**Pandit, G. K. M. UHANOWITA.**

B. E. 2480 / A. D. 1936 5th, May.

# ස්වභාව විඛ්‍යාපනය.

නමෙ ත්වා තුඞ්ග ජනමනොඤ්ඤුණ තමොනුදං,
මුනින්ද මිඤුදිතුත වරණණජ මුත්තමං.

කාමොඝාදි විසං යුත්තං
යුත්ත මුත්තම සන්තිදං,
සන්තිදං සාධු සංයුත්තං
යුත්ත පජ්ජොත භාසිතං.

"සංයුක්ත ප්‍රදීපිකා" නම් වූ මේ **සගාථක ධර්මකථාව** වනාහි **සනරාමර ලොකගරුවූ තථාගතවර ධර්මචක්‍රවර්ත්ති සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ** විසින් දෙශනාකර වදාළාවූ **සූත්‍රධර්මාභිධර්ම විනය** සඞ්ඛ්‍යාත ත්‍රිපිටකයෙන් සූත්‍රපර්‍ය්‍යාපන්න සංයුක්ත නිකායාන්තර්ගත ධර්මාවබොධය සුවසේ කරගැන්ම සඳහා එහි ගාථා මුල්කොට තබා **මාතෘකා, පිණ්ඩාර්ථ, භාවාර්ථ, අනුවාද, ප්‍රකටීකරණාර්ථ** පිළිවෙළින් යෙදුනාවූ අනුකථා විපපණියකි.

**සංයුක්සඟිය** සඞ්ගීතිකාරක මහාකාශ්‍යපාදී මහරහතන් වහන්සේලා විසින් "**සම්බුද්ධ ධර්මය විමුක්තිරසවශයෙන් එකවිධය, ධර්ම-විනය වශයෙන් ද්විවිධය**" යනාදී නයින් **කරණලද** විභාගයෙහි (බෙදීමෙහි) පඤ්චවිධ විභාගය යි

## සංයුත්ත නිකාය.

නියමිත දීඝ- මජ්ඣිම- සංයුත්ත- අඞ්ගුත්තර-ඛුද්දක යන නිකාය (සගි) පසින් තුන්වන නිකාය යි හෙවත් සගියයි. මෙය දෙවතාදීන්ගේ ප්‍රශ්න යන්ද ඒ ප්‍රශ්නයන්ගේ විසර්ජනයන්ද, ඒ ඒ සූත්‍රයන්හි සංයොගවූයෙන් ඒ සූත්‍ර සමූහය එක්තැන් කරණලද්ද **සංයුත්ත නිකාය** නම් විය.

ඒ මේ **සංයුත්ත නිකාය:—**

**"සත්ත සුත්ත සහස්සානි-සත්ත සුත්ත සතානි ච,**
**වාසට්ඨි චෙව සුත්තන්තා-එසො සංයුත්ත සඞ්ගහො"**

**"සංයුත්ත වග්ග පතිමණ්ඩිතස්ස**
**සංයුත්ත ආගමවරස්ස**
**බුද්ධානුබුද්ධ සංවණ්ණිතස්ස**
**ඤාණප්පභෙද ජනනස්ස"යි.**

දක්වනලද **සගාථක වර්ගය**, **නිදාන වර්ගය**, **ඛන්ධක වර්ගය**, **සළායතන වර්ගය**, **මහා වර්ගය** යි වර්ග **පසකින්** සඞ්ගෘහිත විය, **සංයුත්ත** වශයෙන් **දේවතා සංයුත්තය**, දේවපුත්ත, කොසල **මාර**, බ්‍රහ්ම, බ්‍රාහ්මණ, සක්ක, අභිසමය, ධාතු, අනමතග්ග, කස්සප, **ලාභසක්කාර**, රාහුල, ලක්ඛණ, ඔපම්ම, භික්ඛු, ඛන්ධ, රාධ, දිට්ඨි, ඔක්කන්ත, උප්පාද, කිලෙස, සාරිපුත්ත, නාග, සුපණ්ණ, ගන්ධබ්බකාය, වලාහක, වච්ඡගොත්ත, සමාධි සංයුත්තාදී වශයෙන් **සූපනසක් පමණ** වේ. **භාණවාර වශයෙන්** සියයකි. **සූත්‍ර වශයෙන් සත්දහස්සත්සිය** දෙසැට (7762) කි.

මේ **සංයුත්තනිකායට** කලින් කල පඬිවරුන් කිපදෙනෙකුන් විසින් කරණලද ගාථාර්ථවර්ණනාදී ව්‍යාඛ්‍යාවෝ වෙත්. එයින් ද ලක්වැසි බෞද්ධ සාධූන්ට ප්‍රයෝජන ඇතැයි සලකමු. අපගේ මේ ව්‍යාඛ්‍යානොමෝ ධර්මාවබෝධය ම ගරුකොට කරණ ලද්දීය.

## සංයුක්තප්‍රදීපිකා නම් සගාථක ධර්මකථා.

වර්ග අටකින් ද, ගාථා දෙසිය **පණසකින්** ද, සූත්‍ර අසූ එක කින් ද, යුක්තවූ **දේවතාසංයුත්තය** සම්පූර්ණකොට මේ **ප්‍රථම භාගය** බෞද්ධයන් අතට දීමට අදහස් කෙළෙමු.

මේ ව්‍යාඛ්‍යාවෙහි අප විසින් **මාතෘකා**, **පිණ්ඩාර්ථ**, **භාව**, **අනුවාද**, **ප්‍රකීර්ණකාර්ථ** යයි කොටස් පසකින් අර්ථවර්ණනා කරණ ලදී. එයින් අනුවාදයෙහි යථාස්ථානික ධර්මවිශෙෂයන් හා කථාවස්තූහු ද ප්‍රකාශ වෙයි. එයින් විශෙෂ ධර්මාවබෝධයක් මේ පොත පරිශීලනය කරන්නවුන්ට ලැබීම නොඅනුමානයි. **ඒ සඳහා** අප විසින් **මහාවග්ගපාලි**, **පාරාජිකාපාලි**, **ධම්මපද පාලි**, **විභඞ්ගප්‍රකරණය**, **සම්මොහ විනොදනී** (අටුවාව), **සමන්තපාසාදිකා** (විනය අටුවාව) **සුමඞ්ගල විලාසිනී** (දීඝනිකාය අටුවාව) **පපඤ්චසූදනී** (මජ්ඣිමනිකාය අටුවාව), **මනොරථපූරණී** (අඞ්ගුත්තරනිකාය අටුවාව), **විශුද්ධිමාර්ගය**, **සද්ධම්මජොතිකා** (එහි ටීකාව), **අභිධර්මාර්ථ සඞ්ග්‍රහව**, **විභාවිනී** (එහි ටීකාව)

ආදී ධර්මග්‍රන්ථයන්ගෙන් ධර්මකොට්ඨාසයෝ උපුටාගන්නා ලදහ. මේ පොත භාවිත කරණ ධර්මකථික යතිවරයෝ ද ධර්මාවබෝධයෙහි නියැලී ගිහි බෞද්ධයෝද එයින් අතිශය සන්තුෂ්ටියට පැමිණෙතැයි සලකමු.

අපගේ මේ ග්‍රන්ථය පිළිගෙණ වදාළාවූ **බෙන්තර** ගලපාත රජමහාවිහාරාධිවාසී **ශෛලාන්තායතන** පරිවෙණාධිපති බෙන්තර **ආනන්ද ධර්මදර්ශී ශ්‍රී ශරණඞ්කරාභිධාන ශෛලාන්තරමූල**

(ගලතුරුමූල) නිකායෙහි ප්‍රධාන සඞ්ඝනායක ධුරන්ධර මහාස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ ද, අපගේ ආචාර්‍ය්‍ය පදප්‍රාප්ත **විද්‍යෝදය පරිවේණාධිපතිව වැඩවිසූ මහගොඩ ශ්‍රී ඥානේශ්වර-කහාවේ ශ්‍රී සුමඞ්ගල රතනසාර** යන නායක මාහිමියන් වහන්සේලා ද ගෞරවස්ථානයෙහි ලා සලකමු.

මේ ධර්මග්‍රන්ථය පිළිගෙණ වදළාවූ නායක මාහිමියන් වහන් සේගේ උත්තම ශිෂ්‍යරත්නය වූ එම පිරිවෙණෙහි **උපප්‍රධානාචාර්‍ය්‍ය** (1936 අප්‍රේල් මස 11 වන දින) ස්වර්ගස්ථවී වදළ අප හිතවත් **පණ්ඩිත පන්නිල උපනන්ද ස්ථවිරයන් වහන්සේ ද** කෘතඥතා පූර්වකව මෙහි සඳහන් කරමු.

තවද **මඩිරගම පුෂ්පාරාම** විහාරවාසී **දෙඩම්පේ සුනන්ද** ආයුෂ්මතුන් වහන්සේ ද, **හක්මන** මාලිගාතැන්නේ විහාරවාසී **උහන්ඕවිට සාසනතිලක** ආයුෂ්මතුන් වහන්සේද ආධාරකාරිවූ බැව් මෙහිදී සිහිපත් කරම්හ.

මෙහි ඉතිරි කාණ්ඩ ද අවකාශ ලැබුනු පරිදි ඉක්මනින් බෞද්ධ මහජනයා අතට පැමිණවීමට අපේ බලාපොරොත්තුවයි. මේ පොතේ ප්‍රමාණවත් කාණ්ඩයකදී විස්තර සංක්‍ෂේපනයක් හා ශුද්ධි පත්‍ර ද යොදන අදහස ඇත්තෙමු. මෙය ලිවීමත් මුද්‍රණය කිරීමත් ඉතා ඉක්මනින් කරණලද හෙයින් යම් ඛලිතස්ථාන ඇත් නම් මේ පොත බලන පඬිවරයෝ ඒ තැන් කරුණාපූර්වකව අප වෙත දන්වා එවනු ලැබෙත්වා. ඒ තැන් ශුද්ධිපත්‍රයෙන් ප්‍රකට කරන්නෙමු. පොතේ **සම්පූර්ණ** අයිතිය ග්‍රන්ථකර්තෘවරු වෙත තබා ගන්නාලදී.

**කිරිඇල්ලේ ඥාණවිමල.**
**පණ්ඩිත ජී. කේ. ඇම්. උහන්ඕවිට.**

ශ්‍රී: බු: ව: 2480 වෙසක් පුර පසළොස්වක් ලත්

ක්‍රි: ව: 1936 මැයි මස 5 වෙනි දිනා දීය.

# සූත්‍ර ප්‍රදීපයන්හි දැක්වෙන මාතෘකා.


## 1.

| පිට. | සූත්‍රය. | නළවර්ගය. |
|---|---|---|
| 1. | 1. | තථාගතයන් වහන්සේ බ්‍රාහ්මණවූ පරිදි. |
| 6. | 2. | නිර්වාණයට පැමිණි සියලු සත්ත්වයෝ දුකින් මිදෙත්. |
| 8. | 3. | මරණ ප්‍රශ්නය වදාළ පරිදි. |
| 10. | 4. | වයස්ගතවීමේ භය. |
| 11. | 5. | සිඳියයුතු, හැරියයුතු, වැඩියයුතු කරුණු සහ ඔඝ තරණය වදාළ පරිදි. |
| 13. | 6. | නිද්‍රාධර්ම පඤ්චකය සහ ජාගරධර්ම පඤ්චකය. |
| 14. | 7. | ප්‍රබෝධවියයුතු කාලය වදාළ පරිදි. |
| 16. | 8. | සුසම්මුට්ඨ-අසම්මුට්ඨයෝ කවරහුද යන බව. |
| 17. | 9. | ශීලභේදය, චාතුර්මාර්ගදේශනය හා නිර්වාණය, නැතිවන පරිදි. |
| 19. | 10. | වර්ණසම්පත්තිය හා වර්ණවිපත්තිය දක්වූ පරිදි. |

## 2.

### නන්දන වර්ගය.

| | | |
|---|---|---|
| 21. | 1. | දෙවියන්ට නන්දනවනය සැපබව හා රහතුන්ට නිවන සැප බව. |
| 23. | 2. | තෝසවන්නු (සතොස්වත්) සෝකවන්නු (සෝවත්)බව, |
| 26. | 3. | අසමාන වස්තු ධර්ම අටකි. |
| 27. | 4. | ශ්‍රේෂ්ඨසත්ත්වයෝ අටදෙනෙකි. |
| 29. | 5. | භයට හේතුකාරණය අභිරතියක් වීම. |
| 30. | 6. | මාර්ග සහජාත වීර්යයෙන්ම මාර්ගවිශුද්ධිය වේ. |
| 31. | 7. | මහණදම් පිරීම දුෂ්කර බව. |
| 33. | 8. | ලජ්ජා (හිරි) නිසා පව් නොකිරීම. |
| 34. | 9. | මව, බිරිඳ, දරුවන් හා තණ්හාව යන සතරදෙනෙකුට උපමා ධර්ම සතරක්. |
| 36. | 10. | කාමවිභාග සහ රහතුන්ගේ ගුණ. |

### 3.

### සත්ති වර්ගය.


| පිට. | සූත්‍රය. | |
|---|---|---|
| 47. | 1. | කාමරාග ප්‍රහාණය සහ සක්කායදිට්ඨි ප්‍රහාණය. |
| 49. | 2. | නොකළ දේ පල නොදේ; කළ දේ පල දේ. |
| 50. | 3. | අවුල හා නිරවුල; අවුල සින්දවුන් හා සිඳෙන තැන. |
| 54. | 4. | අකුශලයෙන් පමණක් සිත වළක්වාගතයුතු බව. සංයතභාවයට පත් සිත නොවැලැක්විය යුතු බව |
| 55. | 5. | කථාව්‍යවහාරනීතිය සම්මුතිය බව. |
| 57. | 6. | පස්වන බැබලිමක් නැති බව. |
| 58. | 7. | නිර්වාණයෙන් සංසාර ජලාධාර නවතිත්;එහි කෙලෙස් වැසි නැත; නාම-රූප අශෙෂයෙන් නිරුද්ධ වෙයි; මහාභූත ප්‍රතිෂ්ඨාද නැත. |
| 59. | 8 | ප්‍රව්‍රජිතයෝ පඤ්චකාම උත්සාහ නැත්තෝය. |
| 60. | 9. | ශරීරයාගේ පරිමුක්ති ගතිය කෙසේද? |
| 62. | 10. | බුදු සිරුරේ හැඩහුරුකම් හා දුකින් මිදෙන අයුරු· |


———:———

### 4.

### සතුල්ලපකායික වර්ගය.


| | | |
|---|---|---|
| 64. | 1. | පණ්ඩිත සත්පුරුෂ සමාගම ලාමක නොවේ. |
| 70. | 2. | දානඵල විභාගය. දන් නොදෙන හෙතු හා දන් දිය යුතු බව. |
| 75. | 3. | දානයටත් වඩා ධර්මපද (නිර්වාණ) යම ශ්‍රෙෂ්ඨයි. |
| 78. | 4. | පෙරළා නොඑන තැනට හෙවත් නිවණට නොයන්නෝ. |
| 82. | 5. | බුද්ධබලය හා පණ්ඩිතමානී දෙවතාවෝ. |
| 87. | 6. | ශ්‍රද්ධාව දෙවැන්නිය; අප්‍රමාදය ධනයයි. |
| 89. | 7. | මහා සමාගම් සම්පත්ති සහ සරණගමන ඵලය. |
| 105. | 8. | සමාධිබලයෙන් වෙදනා අධිවාසනය, |
| 111. | 9. | ආර්‍යධර්මයට ගැරහීමෙන් රෞරව නරකයත්, රුචිවීමෙන් දිව්‍ය ලොකයත් ලබති. |
| 113. | 10. | ධර්මය සවල්පයෙන් කියන පරිදි. |


———:———

### 5.

### ආදිත්ත වර්ගය.


| | | |
|---|---|---|
| 115. | 1. | ලොකය ඇවිලීමත් නිවීමත් කෙසේද යන බව. |
| 117. | 2. | ලැබීමට දියයුතු දේ සහ අනුරූප විපාක. |
| 120. | 3. | ආහාරදානයෙන් මෙලෝ පරලෝ දෙක්හිම සැප ලැබෙන බව. |

පිට. සූත්‍රය.

124. 4. සමුදුර වැනි සංසාර පාතාලය.
130. 5. නම් අටක් කියා බුදුන් දැකීම.
131. 6. මෝහන වනයෙන් නිවනට යාම.
136. 7. රෑ දවල් පින් වැඩෙන ධර්මිෂ්ඨ ශීලසම්පන්නයෝ දෙව් ලොව යන බව.
138. 8. ජේතවන ගුණ වැනුම සහ සත්ත්වවිශුද්ධිය.
142. 9. තද මසුරන්ට යමලෝකය සතු බව හා සහබත් දෙන්නන් බබලන බව.
146. 10. මානුස දෙහ-දිබ්බයෝග-විමුක්ති සහාය සඞ්ගම.

---

## 6.

## ජරා වර්ගය.

149. 1. සාධුධර්ම, මිනිසුන්ගේ රත්න හා, සොරකම් නොකට හැකි දේ කුමක්ද යන බව.
161. 2. අවිපත්තියෙන් සාධුත්වය.
162. 3. මිත්‍ර සත්තු සහ මිත්‍ර වස්තු.
163. 4. මිනිසුන්ගේ වස්තුව, මිතුරු; ජීවනය.
165. 5. පුද්ගලයා ඉපදවීම, ඔබමොබ දිවීම, සසරට පැමිණීම, මහාභය ඇතිවන්නේ කෙසේද යන බව.
169. 6. දුකෙන් නොමිදීම.
173. 7. කර්මය සත්වයාට පරායණ බව.
183. 8. සුගති-නිවන් දෙකට නොමග; රෑ දවල් ක්ෂය කරන්නා; බඹසර මල; පැන් නැතිව නැම.
186. 9. නිවන්යාමට ශ්‍රද්ධා ප්‍රඥා උපකාරී බව.
188. 10. ගාථාවන්ගේ 1. නිදාන, 2. ජනන, 3. නිස්සිත, 4. ආසය සතර.

---

## 7.

## අත්ත වර්ගය.

193. 1. නාමයෙන් මිදුනු සත්ව-සංස්කාර නැත.
199. 2. වසඟයට යන එකම ධර්මය සිත වේ.
201. 3. තෘෂ්ණාවට සියල්ලෝ යට වෙත්.

පිට. සූත්‍රය.

206. 4. තණ්හිරාග බැම්ම, විතර්ක පාදයෝ, නිර්වාණය.
209. 5. සියලු බැඳුම් බිඳ හැරීම.
214. 6. ලෝකය දුම් ගසන ආකාරය.
218. 7. මරහු විසින් ලෝකය පියනලද බව හා දුකෙහි පිහිටි බව.
221. 8. ජරාවෙන් පිරිවරණලද ලෝකය තෘෂ්ණාව විසින් උඩ එල්වනලද බව.
222. 9. ඉච්ඡාවෙන් වෙන්වීමෙන් බන්ධන සිඳේ.
226. 10. සයකින් සයක් ගැලපීම ලෝකයයි.

—:—

8.

## ඛණ්ඩා වර්ගය.

228. 1. සැප සයනය ක්‍රෝධ නැත්තාවය.
230. 2. රථාදීන්ගේ පෙනුම ධ්වජාදිය වේ.
231 3. ප්‍රඥාවෙන් ජීවත්වන්නහුගේ ජීවිතය ශ්‍රේෂ්ඨයි.
234. 4. ශ්‍රේෂ්ඨ වස්තු කවරේද යන බව.
236. 5. ධර්ම සතරක පිහිටියේ නම් පරලොවට බිය නොවන්නේය.
238. 6. දිරණ දෑ ආදිය හා ලෝකයෙහි සිදුරු කෙතෙක්ද යන බව.
241. 7. ශ්‍රමණයන් වහන්සේ නැවත නැවත ආවත් නුම නැත්තෝ පිළිගණිති.
243. 8. බෝධිසත්වකෙනෙක්ම ආත්මපරිත්‍යාග කරන්නේය.
244. 9. ශ්‍රී තොමෝ භෝග වාසස්ථාන බව හා ඉච්ඡාව දුරලීම දුෂ්කර බව.
246. 10. ලෝකප්‍රදීපය ප්‍රඥාවයි; වැස්ස මව මෙති.
248. 11. හීන ජාති ඇතත් සිල්වත් මහණහුව දෙවියෝ පවා වඳිත්,

—:—

## සංයුක්ත ප්‍රදීපිකා

නම්

# සගාථකධම්කථා.

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

**1. චිරස්සං වත පස්සාම බ්‍රාහ්මණං පරිනිබ්බුතං,**
**අප්පතිට්ඨං අනායූහං තිණ්ණං ලොකෙ විසත්තිකං.**

සංයුත්තං සබ්බධම්මෙහි - විසංයුත්ත මසෙහි' පි,
සංයුත්තදෙසකං වන්දෙ - ජිතං සජ්ජන පූජිතං.
සංයුත්තදීපො සම්බුද්ධ - ධම්මස්නෙහස්ස පූරිතො,
පජ්ජාලීයති විජ්ජන්ති - මන්දිරෙහාසබන්ධුරෙ.
තථාගතාගමෙ සුද්ධ - බුද්ධිවුද්ධිකරෙ'හයං,
ඔඝතරණ සුත්තාදිප්පකාසො ධම්මසඞ්ගහො.
සීහලානං හි භාසාය - සක්‍යසීහස්ස සාසනෙ,
පුබ්බාචරියවාචානු - ගතො සංඛිත්තවුත්තිකො.

**1 - 1 - 1.**

i. **මාතෘකා:-**

**තථාගතයන්වහන්සේ බ්‍රාහ්මණවූ පරිදි.**

ii. **පිණ්ඩාර්ථය,**

දෙවතාවන්ගේ පැමිණීම, සැකච්චාරීම, ඔඝතරණය, අකුසල් සිත් හා සුගතිප්‍රතිසන්ධිය, මානනිග්‍රහය, පරිනිර්වාණය.

iii. **භාවය,**

1. "නොපිහිටා වෑයම් නොකොට ලොකයෙහි විසත්තිකා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව තරණය කොට පිරිනිවී පව් බැහැර කළ බමුණෙකු බෝකලකින් දකිමු" යි නාමගොත්‍රයෙන් අප්‍රකට රූපාවචර දෙවතාවෙක් (බ්‍රහ්මයෙකි) බුදුන්ට සතුති කොළේය. ඒ මෙසේ දතයුතු:-

බුදුරජානන්වහන්සේ අනේපිඩු සිටුහුගේ දෙව්රම් වෙහෙර වැඩසිටින කල්හි එක් දවසක් මධ්‍යම රාත්‍රිය ඉක්මවා පැමිණි බ්‍රහ්ම දෙවතාවෙක් භාග්‍යවතුන් වැඳ එකත්පසක සිට "නිදුකානෙනි! ඔබ කෙසේ ඔඝතරණය කළ සේක්දැයි" ඇසීය. "ඇවැත්නි! මම නොපිහිටා වෑයම් නොකොට ඔඝය එතර කෙළෙමියි" අභිමාන නිග්‍රහමුඛයෙන් නොතේරෙනසේ වදාළසේක.

මේ ඇසූ දෙවතාවා විමතියට වැටී සිතනුයේ "බැහැර සැඩ පහර එතර කරන්නෝ නම් සිටිය යුතු තැන සිටිත්. එගොඩ කළ යුතු තැන ආයූහනයෙන් එගොඩ වෙත්, මුන්වහන්සේ වනාහි අවීචියේ පටන් භවාග්‍රයතෙක් පතළාවූ කෙලෙස් රැස 'නොනැවතී ව්‍යායාම නොකොට බැහැර කළසේකැයි' කිය. මේ කුමක්ද? කෙසේදැයි "අනතුරුව නිහතමානීවූ දෙවතාවා" නිදුකානන් වහන්ස! ඔබවහන්සේ නොපිහිටා නොවැයම් කොට කෙසේ ඔඝ තරණය කළසේක්දැයි මට දැනෙනසේ කිවමැනවයි" යාඥා කෙලේය. "ඇවැත්නි! යම් කලෙක මම සිටියෙම් නම් ගිලාබසිමි. යම්කලෙක මම වෑයම් (පීනීම්) කළෙම්නම් ඇත්වී පාවෙමි, ඇවැත්නි! මම එහෙයින් නැවතී නොසිට වෑයම් නොකොට ඔඝතරණය කෙළෙමියි". මේ ප්‍රශ්න විසඳීම ඇසූ දෙවතාවා සෝවාන්පෙළේ පිහිටා තුටුපහටුව තමාගේ තුෂ්ටිප්‍රසාද පව සන්නී මේ ගාථාව කීවාය.

iv. **අනුවාදය:-**

සැවත්නුවරදී ඔඝතරණක්‍රමය නොදත් දෙවතාවාට
වදාල ධර්මයකි.

මෙහි ඔඝ **සතරක්වෙත්**. i **කාමඔඝය**, ii **භවඔඝය**, iii **දිට්ඨිඔඝය**, iv **අවිජ්ජාඔඝය**, කියායි. එයින් **පඤ්චකාමගුණයෙහි** ඡන්දරාගය කාමෞඝ නම් වේ. **රූපාරූප භවයන්හි** ඡන්ද රාගයද ඣානනිකාන්තියද භවඔඝ නම් වේ. **දෙසැට දෘෂ්ටිය** දෘෂ්ටිඔඝ නම් වේ. **චතුසත්‍යයන්හි** නොදැනීම අවිද්‍යා ඔඝ නම් වේ. මේ සතර ඔඝයෙන් කාමඔඝය ලොභසහගත **චිත්තොත්පාද අටේ** උපදියි. භවඔඝය දෘෂ්ටිගත විප්‍රයුක්ත **ලොභසහගත චිත්තොත්පාද සතරෙහි** උපදියි. දිට්ඨිඔඝය **දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත චිත්තොත්පාද සතරෙහි උපදී**. අවිද්‍යාඔඝය සියලු අකුශල චිත්තොත්පාදයන්හි උපදී. මේ සියල්ලමත් අව හනනාර්ථයෙන්ද රාශ්‍යර්ථයෙන්ද ඔඝ යයි දතයුතුයි. අව හනනාර්ථයෙන් යනු අධඃගමනාර්ථයෙනි. (ගිලාබැසීමෙනි)

මේ ඔඝය·වනාහි තමාගේ වසහෙහි වූ සත්වයන් කිඳවයි. නිරය ආදී භෙදවත් දුගතියේම උපදවයි. උපරිභාවවූ නිර්වාණයට යන්ට නොදී යට තුන් භවයෙහිද සතර යෝනියෙහිද, පඤ්චගතියෙහිද විඥානස්ථිති සතෙහිද නවසත්තාවාසයෙහිද ගමන් කරවයි යන අර්ථයි.

**රාශ්‍යර්ථයෙන්** යුතු සමූහාර්ථයෙන් මේ ක්ලේශ රාශිය මහත් සමූහයකි. අවීචියේ පටන් භවාග්‍රය තෙක් පිළිබඳ පස්කම් ගුණයන්හි ඡන්දරාගය පතළේ වේ. සෙසු ඔඝයන් විෂයෙහි ද මේ ක්‍රමයයි. මෙය මෙසේ රාශ්‍යර්ථයෙනුත් ඔඝයයි දතයුතුයි.

v. **ප්‍රකාශීකරණාර්ථ**.-

මෙහි සූත්‍රයෙහි **දක්වුනු** සන්තිට්ඨන, සංසිදන, ආයූහන, නිබ්බුය්හණ යන මේ චතුෂ්කය පිළිබඳව සප්තවිධ කෙනෙක් දක්වනලදහ.

1. කෙලෙස්වසයෙන් සිටින්නේ **සංසීදති** ( ගිලෙන්නේ ) නම් වේ. අභිසංස්කාර (රැස්කිරීම්) වශයෙන් වෑයම්කරන්නේ **නිබ්බුය්හති** (පාවෙන්නේ) නම් වේ.

2. තෘෂ්ණා දෘෂ්ටි දෙකෙන් තැගී සිටින්නේ **සංසීදති** නම්වේ ඉතිරි වෙෂ මොහ මාන කෙලශයන්ගේ ද අභිසංස්කාරයන්ගේ වශයෙන්ද ආයූහනය කරන්නේ **නිබ්බුය්හති** නම් වේ.

3. තෘෂ්ණාවශයෙන් සිටින්නේ **සංසීදති** නම් වේ. දෘෂ්ටි වශයෙන් ආයූහනය කරන්නේ **නිබ්බුය්හති** නම් වේ.

4. ශාශ්වත දෘෂ්ටියෙන් සිටින්නේ **සංසීදති** නම් වේ. උච්ඡෙද දෘෂ්ටියෙන් ආයූහනය කරන්නේ **නිබ්බුය්හති** නම් වේ.

5. ඔලීයනාභි නිවෙස ලක්ෂණ භවදෘෂ්ටියද අති ධාවනාභි නිවෙස ලක්ෂණ විභව දෘෂ්ටියද ලීන වශයෙන් හෝ සිටින්නේ **සංසීදති** නම් වේ. ඖද්ධත්‍ය වශයෙන් ආයූහනය කරන්නේ **නිබ්බුය්හති** නම් වේ.

6. කාමසුඛල්ලිකානු යොගවශයෙන් ගැලී සිටින්නේ **සංසීදති** නම් වේ. ආත්මකලමථානු යොගවශයෙන් ආයූහනය කරන්නේ **නිබ්බුය්හති** නම් වේ.

7. සර්වඅකුශලාභිසංස්කාරවශයෙන් ගැලී (සංගතව) සිටින්නේ **සංසීදති** නම් වේ. සියලු ලෞකික කුශලාභිසංස්කාර වශයෙන් ඉහළ (ඌර්ධ්ව) නගින්නේ **නිබ්බුය්හති** නම් වේ.

වදාළේමැනෝ:-

"චුන්දය! යම්කිසි අකුශල ධර්මකෙනෙක් වෙත්ද ඒ සියල්ලෝ පහළ (අධෝභාගයට) බස්නාහුය. යම් කිසි කුශල ධර්ම කෙනෙක් වෙත්ද ඒ සියල්ලෝ ඉහළ (උපරිභාගයට) නගින්නාහුය" කියායි.

බ්‍රාහ්මණං:-

"යො බ්‍රාහ්මණො බාහිතපාපධම්මො
නිහුහුඞ්කො නික්කසාවො යතත්තො,
වෙදන්තගූ වුසිතබ්‍රහ්මචරියො
ධම්මෙන සො බ්‍රහ්මවාදං වදෙය්‍ය,
යස්සුස්සද නත්ථි කුහිඤ්චි ලොකෙ."

යමෙක් පාපධර්ම බැහැරකළ හෙයින් බ්‍රාහ්මණ වේද, දිට්ඨ මඞ්ගලිකත්වයෙන් හුහුංකාර කසටාදී පාපධර්මයුක්තවී හුදෙක් ජාති මාත්‍රයෙන් බමුණු බව ප්‍රතිඥකෙරේද, හේ බ්‍රාහ්මණ නොවේ.

හුහුංකාර ප්‍රභානයෙන් "හුම්! හුම්" නොගාන්නේ රාගාදී කසාව නැත්තේ භාවනානුයොග යුක්තසිත ඇතිහෙයින් යතත්ත වූයේ හෝ සීල සංවරයෙන් හෝ සඤ්ඤත චිත්තතායෙන් යතත්ත වූයේ චතුමග්ගඤාණ සඞ්ඛ්‍යාත වෙදකරණකොට ගෙන අන්තයට ගියේ හෝ වේදයන්ගේ අන්තයට ගිය බැවින් හෝ මාර්ග බ්‍රහ්මචරියාවාසය කළ හෙයින් හෝ මම බ්‍රාහ්මණ යයි මේ කථාව ධර්මයෙන් කියන්නේය. යමෙකුට සකලලොකසන්නිවාස යෙහි එකම අරමුණකවත් රාගඋස්සද, දෙ‍ාසුස්සද, මොහුස්සද, මානුස්සද, දිට්ඨුස්සද යන මේ උස්සන්නයෝ නැත්නම් හෙතෙම බ්‍රාහ්මණ වේ.

පරිනිබ්බුතං:-

පරිනිබ්බාණය දෙවැදෑරුම්ය. **කිලෙස පරිනිර්වාණය, ඛන්ධ පරිනිර්වාණය** යන දෙකයි. කෙලෙසුන් සුන්කරමින් සතරමග සතරඵලය ලැබීම **කිලෙසපරිනිර්වාණය** වේ. පඤ්චඋපාදානස්කන්ධ ව්‍යවහාරය රහත්ඵලය දක්වා වේ. රහත්වීමෙන් පසුත් පඤ්චස්කන්ධය වේ. පඤ්චස්කන්ධ භාරය නැතිවීමෙන් පසු අසංඛත ධාතුවට පත්වීම (රහතුන්ගේ මරණය) වද පිරිනිවන් පෑම යයිද ඛන්ධපරිනිර්වාණයයිද කියති. **සඋපාදිසෙස නිර්වාණය- අනුපාදි සෙසනිර්වාණය** යනුද මේ ක්‍රම දෙකමය.

**පරිනිබ්බුතං,** යන ගාථාපදයෙන් ප්‍රකාශවන්නේ සඋපාදිශේෂ කෙලෙස් පරිනිර්වාණ සමඩගී බුදුරජානන් වහන්සේගේ ගුණයකි.

**විසත්තිකා:-**

රූපාදී අරමුණුවල ඇලීම් වෙළීම් ආදී කරුණුවලින් **විසත්තිකා** යයි **තෘෂ්ණාවට** කියනු ලැබේ. විසත්තිකා තරණය කළ සේකැයි බුදුන්ට පැසසීමයි. **කාමසුඛල්ලිකානුයොග** වශයෙන් නොපිහිටා **අත්තකිලමථානුයොග** වශයෙන් වැයම්නොකොට මජ්ඣිම පටිපදා වශයෙන් සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක්ස්මෘතිය, සම්‍යක් සමාධිය යන අෂ්ටාඩග මාර්ග භාවනාවෙන් සසරසයුරෙන් එතරවූබව දතයුතුයි. රාග ගින්න, ද්වේෂ ගින්න, මොහ ගින්න, නිවූ බැවින් පිරිනිවුනේ යයි ද සැලකිය යුතුයි.

---

# 1. ඔඝතරණ සූත්‍ර ප්‍රදීපයයි.

---

**2 නන්දීභවපරික්ඛයා සඤ්ඤාවිඤ්ඤාණසඞ්ඛයා**
**වෙදනානං නිරෝධා උපසමා එවංඛ්වාහං ආවුසො ජානාමි**
**සත්තානං නිමොක්ඛං පමොක්ඛං විවෙකන්ති.**

---

**1 - 1 - 2.**

i. **මාතෘකා:-**

**නිර්වාණයට පැමිණි සියලු සත්වයෝ දුකින් මිදෙත්.**

ii. **පිණ්ඩාර්ථය:-**

නන්දිමූලක කර්මභවය ගෙවීමෙන් සංඥා විඥාන ක්ෂයවීමෙන් වෙදනා නිරොධ උපසමයෙන් සත්වයන්ගේ නිමොක්ඛ පමොක්ඛ විවෙක වශයෙන් නිවන් ලැබීම දනිමියි වදාළ සේක. මෙහි මාර්ගය **නිමොක්ඛයි** ඵලය **පමොක්ඛයි** නිර්වාණය **විවෙකයි.**

iii. **භාවය:-**

මාර්ගයෙන්ම සත්වයෝ කෙලෙස් බැඳුමෙන් මිදෙත්; එහෙයින් මාර්ගය සත්වයන්ගේ නිමොක්ඛ (නික්මීම) යයි කියනලදී. ඵල ක්ෂණයෙහි (මාර්ගඵල ලබන අවස්ථාවේදී) ඒ ආර්ය සත්වයෝ කෙලෙස් බැඳුමෙන් ප්‍රමුක්තයහ; එහෙයින් ඵලය සත්වයන්ගේ පමොක්ඛ (පලායාම) යයි කියනලදී. නිවණට පැමිණි සත්වයන් ගේ සියලු දුක් දුරුවෙයි. එහෙයින් නිර්වාණය විවෙකයයි කියන ලදී. නිමොක්ඛ, පමොක්ඛ, විවෙක යන වචනත්‍රයෙන්ම එකම නිර්වාණය හෝ කියනලදැයිද ගතයුතු වේ;

වචනත්‍රයම නිර්වාණයට නම්වන හෙයිනි.

iv. **අනුවාදය:-**

මේ සූත්‍රය සැවැත්නුවරදී අන්‍යතර බ්‍රහ්මදෙවතාවෙකුගේ මාර්ග - ඵල - නිර්වාණ ප්‍රශ්නයට වදාළ බුද්ධ සිංහනාදයකි.

ඒ මෙසේයි.

“ජානාමි ඛ්වාහං ආවුසො සත්තානං නිමොක්ඛං පමොක්ඛං විවෙකං,”

මම දනිම්මය, සත්වයන්ගේ නිමොක්ඛාදිය දැනගැනීම පිණිසම මාවිසින් සම තිස් පෙරුම් පුරා සර්වඥතාඥානය ප්‍රතිවෙධ කරණ ලදැයි ශ්‍රෙෂ්ඨනාද පවත්වයි.

v. **ප්‍රකීර්ණාර්ථ:- නන්දීභවපරික්ඛයා.**

නන්දී මුල්වූ කර්මභවය ගෙවීමෙන් හෝ නන්දිය හා කර්මභවය ගෙවීමෙන්; මෙයින් ත්‍රිවිධකර්මාභිසංස්කාර වශයෙන් සංස්කාර ස්කන්ධය ගන්නාලදී.

**සඤ්ඤාවිඤ්ඤාණ සඞ්ඛයා:-**

සංඥා= විඥාන දෙකෙන් තත් **සම්ප්‍රයුක්ත සංඥාස්කන්ධය විඥානස්කන්ධය** යන දෙක ගත්හ. මෙහි කී සංස්කාර, සංඥා විඥාන යන ස්කන්ධත්‍රයෙන් සම්ප්‍රයුක්ත වේදනාව ඔවුන්ගේ ග්‍රහණයෙන් ගත්තාමයයි අනුපාදින්නක වූ සතරවැදෑරුම් අරූප ස්කන්ධයන්ගේ නොපැවැත්ම වශයෙන් **සඋපාදිසෙස නිර්වාණය** කියන ලද්දේවේ.

**වෙදනානං නිරොධා උපසමා:-**

උපාදින්නක වේදනාවන්ගේ නිරෝධයෙන්ද ව්‍යුපශම (සංසිඳීම)යෙන්දැයි එකී වේදනා ශබ්දයාගේ ගැනීමෙන් ඒ වේදනාව සමග යෙදුන සංස්කාර, සංඥා, විඥාන යන ස්කන්ධත්‍රය ගන්නාලදී. ඔවුන්ගේ වස්ත්වාරම්මණ හෙයින් රූපස්කන්ධයද ගැණේ. මෙසේ මේ උපාදින්නක පඤ්චස්කන්ධයන්ගේ නොපැවැත්ම වශයෙන් **අනුපාදිසෙස නිර්වාණය** වදාරණ ලදී. තවත් ක්‍රමයකින් වනාභින්නදිග්‍රහණයෙන් සංස්කාරස්කන්ධය ගන්නා ලදී, භවග්‍රහණයෙන් උත්පත්තිභව සංඛ්‍යාත රූපස්කන්ධයද, සංඥාදි ස්වරූපයෙන්ම ත්‍රිවිධ ස්කන්ධයෝද ගත්හ.

—:—

# 2 නිමොක්ඛ සූත්‍ර ප්‍රදීපයයි.

—:—

**3 උපනීයති ජීවිතමප්පමායු - ජරූපනීතස්ස න සන්ති තාණා,**
**එතං භයං මරණෙ පෙක්ඛමානො - පුඤ්ඤානි කයිරාථ සුඛාවහානි.**

**4 උපනීයති ජීවිතමප්පමායු - ජරූපනීතස්ස න සන්ති තාණා,**
**එතං භයං මරණෙ පෙක්ඛමානො ලොකාමිසං පජහෙ සන්තිපෙක්ඛොති.**

---

**1 - 1 - (3 - 4.)**

i. **මාතෘකා**:-

**මරණප්‍රශ්නය වදාළ පරිදි.**

ii. **පිණ්ඩාර්ථය:-**

පින් කිරීම **අනිය්‍යාණිකවට්ට** කථාවකි. ශාන්තිය බලා ලොකාමිස පරිත්‍යාගය **නිය්‍යාණික විවට්ට** කථාවකි.

iii. **භාවය:-**

3. ජීවිතය පිළිවෙළින් මරණය වෙතට එළඹේ; ආයුසය අල්පයි හෙවත් ක්ෂය වේ; ජරාවට පැමිණියෙකුට රැකෙන තැන් නැත; මරණයෙහි මේ භය දක්නේ සැපදෙන පින් කරන්නේය.

4. ජීවිතින්ද්‍රිය නිරුද්ධවේ. ආයුඃකාලය ස්වල්පයි. ජරාඋප ගතයාට ලීනස්ථාන කොතෙක් නොවෙත්. **මරණූපගමය, ආයුපරිත්තතාවය, ජරූපනීතයාට ත්‍රාණාභාවය** යන මේ භයට වස්තුවූ කාරණාතුන මැරීමෙහි ලා නුවණින් බලන්නේ **නිර්වාණ සඞ්ඛ්‍යාත අත්‍යන්ත අතික්‍රාන්ත ශාන්තිය ප්‍රාර්ථනා කරමින් ත්‍රෛභූමික වෘත්ත ලොකාමිසය අත්හරින්නේය.**

**ගොපලුවිසින් යම්සේ ගවමුල දක්කාගෙණ යයිද, එසේම ජරාව විසින් ජීවිතය මරණය ලඟට පමුණුවනු ලැබේ. ආයුෂ්‍යාගේ ටිකබව දෙයාකාරයකින් දතයුතුවෙත්. සරසපරිත්ත තාවය, ඛණපරිත්තතාවය යන දෙවිධියෙති.**

**"මහණෙනි! යම් මනුෂ්‍යයෙක් චිරජීවීද, හෙතෙමේ වෂී සියයක් අඩුවැඩියෙන් ජීවත් වේ" යන බුද්ධවචනයෙන් ස්වභාව යෙන්ම මදබව දතයුතු.**

iv. **අනුවාදය:-**

පරමාර්ථ හෙයින් සත්ත්වයන්ගේ ජීවිතක්ෂණය ඉතා ටිකය; එකචිත්තප්‍රවෘත්තිමාත්‍රයකි. යම්සේ රියසක පෙරළෙන්නේද සිටින්නේද එකම නිම්වළල්ලේ පෙදෙසින්ම පෙරළෙයි. සිටියි. එමෙන්ම සත්ත්වයන්ගේ ජීවිතය එකචිත්තක්ෂණික නිසා එය නිරුද්ධවූකල්හි සත්ත්වයෙක් මළේය, නිරුද්ධවූයේයයි කියනු ලැබේ. මෙසේ වදාරතිබේ:- "ඉකුත්වූ සිත් සණෙහි ජීවත්විය, ජීවත් නොවෙයි, ජීවත්නොවන්නේය; අනාගත චිත්තක්ෂණයෙහි ජීවත්නොවිය, ජීවත්නොවෙයි, ජීවත්වන්නේය; පවත්නා සිත් සණෙහි ජීවත්නොවිය, ජීවත්වෙයි, ජීවත්නොවන්නේය."

v. **ප්‍රකටීකරණාර්ථ:-**

**පුඤ්ඤානිකයිරාථ සුඛාවහානි**=ඒ දෙවතාවා මෙසේ ප්‍රකාශ කරන්ට යෙදුනේ තෙමේ දීර්ඝායුකසත්ත්වවූ බ්‍රහ්මලොව උපන් හෙයින් ස්වල්පායුෂකවූ පහත් කාමාවචර දෙවියන් අතරෙහි උපදින මැරෙණ සත්ත්වයන් බොල් පිණිබිඳු වැසි වැසිමක්සේ දක්කහෙයින් අහෝ! මේ සත්ත්වයෝ ධ්‍යානවඩා නොපිරිහුණු ධ්‍යානයෙන් මැරී බ්‍රහ්මලොකයෙහි ඉපදී එක, ද්වි, චතු, අට්ඨ, සොළස, බත්තිංස, චතුසට්ඨි කල්පප්‍රමාණකාලයක් සිටින්නාහු නම් ඉතා යෙහෙකැයි සැලකූ බැවිනි.

**ලෝකාමිසං:- ත්‍රෛභූමික වෘත්ත සඞ්ඛ්‍යාත පර්‍යාය ලෝකාමිෂයද, සිව්පස සඞ්ඛ්‍යාත නිෂ්පර්‍යාය (අස්වාභාවික) ලෝකාමිෂයද ප්‍රකාශිතයි.**

——:——

# 3. උපනෙය්‍ය සූත්‍ර ප්‍රදීපයයි.

——:——

5. අච්චෙන්ති කාලා තරයන්ති රත්තියො
වයොගුණා අනුපුබ්බං ජහන්ති.
එතං භයං මරණෙ පෙක්ඛමානො
පුඤ්ඤානි කයිරාථ සුඛාවහානි.

6. අච්චෙන්ති කාලා තරයන්ති රත්තියො
වයොගුණා අනුපුබ්බං ජහන්ති,
එතං භයං මරණෙ පෙක්ඛමානො
ලොකාමිසං පජහෙ සන්තිපෙක්ඛො'ති.

---

**1 – 1 – ( 5 – 6. )**

i. **මාතෘකා:-**

**වයස්ගතවීමේ භය.**

ii. **පිණ්ඩාර්ථය:-**

නිර්වාණය අපේක්ෂා කරන්නේ ලෝකාමිෂය දුරලන්නේය.

iii. **භාවය:-**

5. පෙර බත් ආදී කාලයෝ අතික්‍රමණය වෙත්; ගත වන්නා වූ රාත්‍රිහු පුද්ගලයා මරණය ලඟට වහ වහා යවත්; ප්‍රථම, මධ්‍යම, පශ්චිම වයස් රාශිය පටිපාටියෙන් පුගුලා හරීත්; කාලාතික්‍රමණය, රෑ දවල් ගතවන බව, වයෝ ගුණ ජහනය, යන මේ ත්‍රිවිධ භය මරණයෙහි ලා නුවණ යොමා බලන පණ්ඩිත ජනතෙම සුව එලවන පින් කරන්නේය.

6. නිර්වාණය අපේක්ෂාකරණ තැනැත්තේ **ලෝකාමිෂය** දුරලන්නේය.

(**සෙස්ස [ 3 – 4 ] පෙරසේමැයි.**)

—:—

## 4. අච්චෙන්ති සූත්‍ර ප්‍රදීපයයි.

—:—

**7. කති ඡින්දෙ කති ජහෙ-කති චුත්තරි භාවයෙ,**
**කති සඞ්ගාතිගො භික්ඛු-ඔඝතිණ්ණො'ති වුච්චති'ති.**

**8. පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ-පඤ්ච චුත්තරි භාවයෙ,**
**පඤ්චසඞ්ගාතිගො භික්ඛු-ඔඝතිණ්ණොති වුච්චති'ති.**

---

**1 - 1 - ( 7 - 8. )**

i. **මාතෘකා:-**

**සිඳිය යුතු, හැරිය යුතු, වැඩිය යුතු, කරුණු සහ ඔඝතරණය වදාළ පරිදි.**

ii. **පිණ්ඩාර්ථය:-**

පාදයන්හි ගල්බැඳියෙක් මෙන් යටට අදිනු ලබන **ඔරම්භාගිය** සංයොජන පස අනාගාමි මාර්ගයෙන් සිඳිමත්, අත් වලින් නවාගත් වෘක්ෂශාඛා "මෙන්" ඉහළට අදිනු ලබන **උද්ධම්භාගිය** සංයොජන පස අර්හත් මාර්ගයෙන් හැරීමත් දෙවතාවාවිසින් ආරොපිතයි; ලෞකික ලොකොත්තර පඤ්චෙන්ද්‍රිය භාවනාද මෙහි වදාරණ ලදී.

iii-iv. **භාවය:-**

7. සිඳින්නෙක් කීයක් සහමුලින් සිඳින්නේද? දුරුකරන්නෙක් කීයක් දුරුකරන්නේද? වඩන්නෙක් මත්තෙහි කීයක් වඩන්නේද? කොතෙක් සඞ්ගයන් ඉක්මීම කළාවූ මහණතෙම ඔඝතරණය කෙළේය යි කියනු ලැබේද?

8. සිඳින්නෙක් පසක් සහමුලින් සිඳින්නේය. දුරුකරන්නෙක් පසක් දුරුකරන්නේය. වඩන්නෙක් (භාවනාවශයෙන්) මත්තෙහි පසක් වඩන්නේය. සඞ්ගයන් පසක් ඉක්මීම කළාවූ මහණතෙම ඔඝතරණය කෙළේ යයි කියනු ලැබේ.

v. **ප්‍රකටීකරණාර්ථ.-**

**පඤ්ච ඡින්දෙ= සක්කායදිට්ඨි,** විචිකිච්ඡා, සීලබ්බතපරාමාස, කාමරාග, ව්‍යාපාද යන පස **ඔරම්භාගිය සංයොජන** වෙත්. කාමධාතු භජනය කරණහෙයින්ද කාමාවචරයෙහි අජ්ඣත්ත වශයෙන් සත්වයන් බඳිත්නුයි, ගැටගසත්නුයි, නොහොත් කර්ම හෙතුවෙන් විපාකයෝ සත්වයන් දුක්සමග යොදවත් නුයි **සංයොජන,** නම් වූවානු වෙත්.

**පඤ්ච ජහෙ.**– රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යන **පස උද්ධම්භාගිය** සංයෝජන වෙත්. රූපධාතු, අරූපධාතු, භජනය කරණ හෙයින්ද, රූපාවචර අරූපාවචර යන්හි බහිධා වශයෙන් බදින, යොදන හෙයින්ද, උඩම්භාගිය නම් වෙත්.

මෙයින් **සක්කායදෘෂ්ටි, විචිකිච්ඡා, ශිලව්‍රතපරාමර්ශ** තුන සෝවාන් මාර්ගයෙන් සමුච්ඡේද කරති. **කාමරාග, ව්‍යාපාද** දෙක සකෘදාගාමි මාර්ගයෙන් තුනීකොට අනාගාමි මාර්ගයෙන් සමුච්ඡේද කරති. **උඩම්භාගිය** පස අර්හත්මාර්ගඥානයෙන් මුල් සිද පියති.

**පඤ්ච චුත්තරි භාවයෙ:**– මේ දස සංයෝජනයන් සිදීම පිණිසත් ප්‍රහාණය පිණිසත් මත්තෙහි අතිරේක විශේෂ භාවනා කරන්නේ **ශ්‍රද්ධා, වීර්ය, ස්මෘති, සමාධි, ප්‍රඥා,** යන **ඉන්ද්‍රිය** පස අභිවය දක්වා වඩන්නේය.

**පඤ්ච සඞ්ගාතිගො:**– රාගසඞ්ගය, ද්වෙෂසඞ්ගය, මෝහසඞ්ගය, මානසඞ්ගය, දිට්ඨිසඞ්ගය යන මේ පඤ්චවිධ කෙලශාලිඞ්ගනයන් අතික්‍රාන්ත කෙළේය.

**භික්ඛු ඔඝතිණ්ණො:**– සංසාර භය දක්නා අර්ථයෙන් භික්ෂු නම් ලද යොගාවචරතෙම සසරෙහි ගිල්වන කාමාදීඔඝ සතර මෙසේ තරණය කරණ ලද්දේ වේ.

——:——

## 5. කතිඡින්දෙ සූත්‍ර ප්‍රදීපයයි.

——:——

9. කති ජාගරතං සුත්තා-කති සුත්තෙසු ජාගරා,
කතිහි රජමාදෙති-කතිහි පරිසුජ්ඣති.

10. පඤ්ච ජාගරතං සුත්තා- පඤ්ච සුත්තෙසු ජාගරා,
පඤ්චහි රජමාදෙති-පඤ්චහි පරිසුජ්ඣති'ති.

---

**1 - 1 - ( 9 - 10. )**

i. **මාතෘකා:-**

**නිද්‍රා ධර්ම පඤ්චකය සහ ජාගර ධර්ම පඤ්චකය.**

ii. **පිණ්ඩාර්ථය:-**

පඤ්චනීවරණයෙන් කෙලෙස් රජස් ගණී. පඤ්ච ඉන්ද්‍රිය යන් නිසා පිරිසිදුවේ.

iii. **භාවය:-**

9. නොනිදන්නන් අතුරෙහි කිදෙනෙක් නිදිගත්තෝද? නිදාගන්නන් අතුරෙහි නොනිදන්නෝ කෙතෙක්ද? කෙතෙක් ධර්ම කරණකොට ගෙණ කෙලෙස් රජස් පරාමර්ශනය කෙරේද? කෙතෙක් ධර්මයන් හෙතුකොටගෙණ පිරිසිදුවේද?

10. ශ්‍රද්ධාදී පඤ්චෙන්ද්‍රියයන් නොනිදද්දී කාමච්ඡන්දාදී නීවරණයෝ පස්දෙන නිදති; පඤ්චනීවරණයන් හෝනාකල්හි පඤ්චෙන්ද්‍රියයෝ නොනිදති. නීවරණ පස හෙතුකොට ගෙණ තත් සමඞ්ගී පුද්ගලතෙම කෙලෙස් රජස් ගණියි. පඤ්චෙන්ද්‍රිය යන් කරණකොට ශ්‍රද්ධා, වීර්‍ය්‍ය, සමෘති, සමාධි, ප්‍රඥා, සමඞ්ගී පුද්ගල තෙම සකල කෙලශයන් කෙරෙන් පිරිසිදුවේ.

iv. **අනුවාදය:-**

යම්හෙයකින් නීවරණ සමඞ්ගී පුද්ගලතෙම යම් කිසි තැනක හිඳගත හෝ සිටගෙන හෝ අරුණ නගන්නේ නමුත් ප්‍රමාද තාවෙන් අකුශල සමඞ්ගිතාවෙන් හොත්තේ නම් වේ. මෙසේ සුප්තවූ (නිදන්නාවූ) පඤ්චනීවරණයන් ඇතිකල්හි පඤ්චෙන්ද්‍රියෝ ජාගර (නොනිදන්නෝ) නම් වෙත්.

කුමක්හෙයින්ද යත්:- යම්හෙයකින් ශ්‍රද්ධාදීන් යුක්ත පුද්ගල තෙමේ යම්කිසි තැනක වැදහෙව නිදන්නේ නමුත් අප්‍රමාද තායෙන් කුශල සමඞ්ගී බැවින් ජාගර නම් වේ. පඤ්චනීවරණ යන් කරණකොට ගෙණම කිලෙස රජස් අදියි; ගණියි. පරා මසියි. පලමු කාමච්ඡන්දාදීහු පසුව උපදින්නවුන්ට ප්‍රත්‍යය වෙත්නුයි ඉන්ද්‍රිය පසින් පිරිසිදුවෙයි; මෙහි පඤ්චෙන්ද්‍රියයෝ **ලෞකික, ලොකොත්තර** වශයෙන්වදාරණ ලදහ.

——:——

## 6. කතිජාගර සූත්‍ර ප්‍රදීපයයි.

——:——

**1\. යෙසං ධම්මා අප්පටිවිදිතා - පරවාදෙසු නීයරෙ,**
**සුත්තා තෙ නප්පබුජ්ඣන්ති - කාලො තෙසං**
**පබුජ්ඣිතුං.**

**12\. යෙසං ධම්මා සුප්පටිවිදිතා-පරවාදෙසු න නීයරෙ,**
**සම්බුද්ධා සම්මදඤ්ඤාය- චරන්ති විසමෙ සමං'ති.**

---

**1 - 1 - ( 11 - 12. )**

i. **මාතෘකා:-**

**ප්‍රබොධවියයුතු කාලය වදාළ පරිදි.**

ii. **පිණ්ඩාර්ථය:-**

11\. ධර්මය නොදත් අයට තුණුරුවන් පහළවූ මේ කාලය ප්‍රබොධයට සෑහෙයි.

12\. බුදුවරයෝ මනාකොට දත විෂමලොකසන්නිවාසයෙහි සමව හැසිරෙත්.

iii. **භාවය:-**

11\. යම්කෙනෙකුන්විසින් චතුරාර්‍ය්‍යසත්‍යධර්මයෝ ඥාණයෙන් ප්‍රතිවෙධ නොකරණ ලද්දාහුද, ශාසනයෙන් බාහිර දෙසැට දෘෂ්ටිගත වාදයන්හි ආත්මධර්මතාවශයෙන් යමෙක් තුමූ පැමිණෙත්ද, මෙරමාවිසින් පමුණුවනු ලබත්ද, ප්‍රමාද නිද්‍රාවෙන් හොත්තාවූ ඔව්හු නො පුබුදිත්. අවබොධ නොකරත්. ඔවුන්ට පුබුදින්ට මේ තුණුරුවන් උපන් කාලය වේ.

12\. යම් කෙනෙකුන්විසින් ධර්මයෝ පරිඥෙයිසමයාදී ඥානයෙන් මනාකොට ප්‍රතිවෙධ කරන ලද්දාහුද, එහෙයින්ම පරවාදයන්හි නොපැමිණෙත්ද නොපමුණුවනු ලබත්ද, ඒ සම්බුද්ධවරයෝ මනාවූ කාරුණෙන් ධර්මයන් අවබොධකොට දත විෂමයෙහි සමව හැසිරෙත්.

v. **ප්‍රකාශිකරණාර්ථ:-**

**පරවාදෙසු:-** දෙසැට දෘෂ්ටිගත වාදයෝ මේ ශාසනයෙන් අන්‍ය වූ තීර්ථකයන්ගේ වාද බැවින් පරවාද නම් වෙත්.

**කාලො තෙසං පබුජ්ඣිතුං:-** ඒ පරවාද ගත්තන්ට පුබුදින්නට මේ කාලය වේ. ලොකයෙහි බුදුන් පහළ විය. ධර්මය දෙශ

නාකරණු ලැබේ. සඞ්ඝතෙම සුප්‍රතිපන්නය. ප්‍රතිපදාව හද්‍රය, මේ මහාජනයෝ වනාහි වෘත්තයෙහි සුප්තයෝ ප්‍රබොධ නොවෙත් යයි දෙවතාවා කීය.

**සම්බුද්ධා**:- මනාහෙතුවෙන් කාරණයෙන් දැනගත්තෝය, බුදු වරයෝ සතරදෙනෙක් වෙත්, **1. සබ්බඤ්ඤුබුද්ධ, 2. පච්චෙකබුද්ධ, 3. චතුසච්චබුද්ධ, 4. සුතබුද්ධ** කියායි. එයින් සමතිස් පෙරුම්පුරා සම්මාසම්බොධියට පැමිණියේ සර්වඥබුද්ධ නම් වේ. කල්ප සියක්දහසක් අධිකකොට ඇති දෙයාසඞ්ඛ්‍යයක් පාරමීන් පුරා ස්වයම්භූ බවට පැමිණියේ ප්‍රත්‍යෙකබුද්ධ නම් වේ. අවශෙෂ ක්ෂීණාශ්‍රවයෝ චතුස්සත්‍යබුද්ධ නම් වෙත්. බහුශ්‍රැතයෝ ශ්‍රැතබුද්ධ නම් වෙත්. මෙහි පළමු තුන් බුදුවරයෝ ඇතුළත්වෙති.

**චරන්ති විසමෙ සමං**:-ලොකසන්නිවාස විෂමය, සත්වනිකාය විෂමය, ක්ලෙශජාත විෂමය යන විෂමස්ථාන තුනෙහි සමව හැසිරෙත්. (රහතුන්ගේ චිත්ත චෛතසික ධර්ම ලොකොත්තර හෙයින් ලොක විෂමයක් නැත. සත්වාවාස නවයෙහි උත්පත්ති භෙද නැතිහෙයින් දිව්‍යබ්‍රහ්මාදී භෙදයට නොපැමිණෙත්. කෙලෙස් නැතිබැවින්ම රාගාදී විෂම නැත.)

——:——

## 7. අපප්‍රතිවිදිත සූත්‍ර ප්‍රදීපයයි.

——:——

13. යෙසං ධම්මා සුසම්මුට්ඨා පරවාදෙසු නීයරෙ,
සුත්තා තෙ නප්පබුජ්ඣන්ති කාලො තෙසං පබුජ්ඣිතුං.

14. යෙසං ධම්මා අසම්මුට්ඨා පරවාදෙසු නනීයරෙ,
සම්බුද්ධා සම්මදඤ්ඤාය චරන්ති විසමෙ සමං'ති.

---

1 – 1 – ( 13 – 14 )

i. **මාතෘකා:-**

**13. නුවණින් නොදන්නෝ සුසම්මුට්ඨ (සුනෂ්ට) වෙත්.**

**14. ප්‍රඥාවෙන් ප්‍රතිවෙධ ඇත්තෝ අසම්මුට්ඨ (අවිනෂ්ට) වෙත්.**

iv. **අනුවාදය:-**

යම්සේ කෙත් දෙකක් සී සෑම් කොට එකක් වපුරා වී බොහෝකොට ලබා නොවැපුරූ කෙතෙන් තොලත් දේ සඳහා මගේ ධාන්‍ය බොහෝ නටහයි කියන්නේ තොලද්දම නෂ්ට යයිකි යති. එපරිද්දෙන් මෙහිදු ප්‍රතිවෙධ නොකරණ ලද්දෙම සුසම්මුට්ඨ නම් වෙත්.

සෙස්ස පෙර ( 11 – 12 ) සේමැයි.

——:——

## 8. සුසම්මුට්ඨ සූත්‍ර ප්‍රදීපයයි.

——:——

15. න මානකාමස්ස දමො ඉධත්ථි
න මොනමත්ථි අසමාහිතස්ස,
එකො අරඤ්ඤෙ විහරං පමත්තො
න මච්චුධෙය්‍යස්ස තරෙය්‍ය පාරං.

16. මානං පහාය සුසමාහිතත්තො
සුචෙතසො සබ්බධි විප්පමුත්තො,
එකො අරඤ්ඤෙ විහරං අප්පමත්තො
ස මච්චුධෙය්‍යස්ස තරෙය්‍ය පාරං'ති.

---

## 1 - 1 - (15 - 16)

i. **මාතෘකා:-**

**ශීලභෙදය, චාතුර්මාර්ගඥානය හා නිර්වාණය නැතිවන පරිදි.**

ii. **නිෂ්ඨාර්ථය:-**

මානයෙන් **සමාධිපාක්ෂික** ධර්ම නැතිවීමත් ශීල හෙදයත් වේ. අසමාහිතයාට **චතුර්මාර්ගඥානය** නැත. ඥානවිප්‍රයුක්ත ප්‍රමත්ත යාට **ප්‍රතිවෙධ තරණ** නම්වූ නිවන නැත.

iii. **භාවය:-**

15. මානකාමී පුද්ගලයාහට සමාධිපාක්ෂිකධර්මසංඛ්‍යාත දමථයක් නැත්තේය. සමාධි රහිත පුද්ගලයාහට **මෞන** සඞ්ඛ්‍යාත චාතුර්මාර්ගික ඥානයක් නැත්තේය. හුදකලාව අරණ්‍ය යෙහි වාසය කරමින් සමෘති විප්‍රවාසීවූ පුද්ගලතෙම **මෘත්‍යුධෙය** සඞ්ඛ්‍යාත **ත්‍රෛභූමික** වෘත්තයාගේ පාර සඞ්ඛ්‍යාත නිර්වාණය ප්‍රතිවෙධ නොකරන්නේය.

16. හුදකලාව වනසෙනසුන්හි වෙසෙමින් සමෘති සම්පන්න වූ ඒ පුද්ගලතෙම නවවිධමානය අර්හත්මාර්ගයෙන් ප්‍රහාණකොට **උපචාර, අර්පණා** සමාධින් මොනවට අරමුණෙහි පිහිටි සිත් ඇත්තේ ඥානසම්ප්‍රයුක්ත හෙයින් සොඳුරු සිත් ඇත්තෙක්ව සකල ස්කන්ධායතනාදීන්හි විප්‍රමුක්තව මෘත්‍යුධෙය සඞ්ඛ්‍යාත ත්‍රෛභූමික වෘත්තයාගේ පරතෙර යයි කියනලද **නිර්වාණයට** පැමිණෙන්නේය.

iv. **අනුවාදය:-**

**මානං පහාය** ( 16 ) යනාදී ගාථාවෙන් ත්‍රිවිධ ශික්ෂා කියන ලද්දුහ. කෙසේද? මේ මානය නම් සිල් හෙදකරන්නේය. මෙයින් **අධිශීල ශික්ෂාවද**, සුසමාහිත යන්නෙන් **අධිචිත්ත ශික්ෂාවද**, **සුචෙතසො** යන මෙයින් **අධිප්‍රඥා ශික්ෂාවද** වදාළහ.

අධිශිලය වූකලී ශිලය ඇති කල්හිම වේ අධිචිත්තය චිත්තය ඇති කල්හිය; අධිප්‍රඥාව ප්‍රඥාව ඇති කල්හිය; පන්සිල්, දසසිල්, සිල් නම් වේ; ප්‍රාතිමොක්ෂසංවර (උපසම්පදා) ශීලය අධිශිල නමැයි දතයුතු. අෂ්ටසමාපත්තිහු චිත්තනම්; විදශීනා පාදක ධ්‍යානය අධිචිත්තයයි; කම්මස්සකතාඥාණය . ප්‍රඥාවයි; විදශීනාව අධිප්‍රඥාවයි; අබුද්ධොත්පාදකාලයෙහිද පඤ්චශීල, දශශීල සිල්ම වේ. ප්‍රාතිමොක්ෂ සංවරශිලය බුද්ධොත්පාදයේදීම පවතියි. අෂ්ටසමාපත්තියත් කර්මස්වකඥානයත් බුදුන් පහළ නොවූ කල්හිත් වෙති. විදශීනාපාදක ධ්‍යානයත් විදශිනාවත් බුදුන් පහළවූ කල්හිම වෙති. තවද නිවන් පතන්නහු විසින් සමාදන්වූ පන් සිල් දසසිල්ද අධිශීලමය; නිවන් පතමින් සමවන් අෂ්ටසමාපත්තිහුද අධිචිත්තමය; ලෞකික සියලු සිල්ම ශීල නම් වේ. ලොකුත්තර ශීලය අධිශීලයයි. චිත්ත ප්‍රඥාදෙක්හිද මේ ක්‍රමය වේ.

මෙසේ මේ ගාථාවෙන් සමොධාන කොට ත්‍රිශික්ෂාවත් සකල ශාසනයත් වදාරණ ලදහු වෙති.

---

## 9. නමානකාම සූත්‍රප්‍රදීපයයි.

---

**17. අරඤ්ඤෙ විහරන්තානං-සන්තානං බ්‍රහ්මචාරිනං,**
**ඒකභත්තං භුඤ්ජමානානං-කෙන වණ්ණො පසීදති.**

**18. අතීතං නානුසොචන්ති-නප්පජප්පන්තිනාගතං,**
**පච්චුප්පන්නෙන යාපෙන්ති-තෙන වණ්ණො පසීදති.**

**19. අනාගතප්පජප්පාය-අතීතස්සානුසොචනා,**
**එතෙන බාලා සුස්සන්ති-නළො'ව හරිතො ලුතො'ති.**

---

**1 - 1 - ( 17 - 18 - 19. )**

i. **මාතෘකා:-**

**වර්ණසම්පත්තිය හා වර්ණ විපත්තිය දැක්වූ පරිදි,**

ii. **පිණ්ඩාර්ථය:-**

17. කුමන කාරණයකින් ඡවිවර්ණය ප්‍රසන්න වේද?

18. පසුගිය දේට ශෝක නොකර මතු ලැබෙන දේ පැතීම නොකොට ලද දෙයින් යැපෙන හෙයින් සිරුරු පැහැති වේ.

19. අනාගත ප්‍රාර්ථනාවෙනුත් අතීත ශෝකයෙනුත් ශරීර ප්‍රභා වැනසේ, (නැතිවේ).

iii. **භාවය:-**

17. මෙතෙහි වසන්නා වූ කෙලෙසුන් පැත්තකට කළ හෙයින් ශාන්ත වූ හෝ පණ්ඩිත වූ බ්‍රහ්මචාරී වූ එක් බතක් බුදින්නා වූ භික්ෂූන්ගේ සිව්වන් (ඡවි වර්ණය) කුමකින් පහදීද?

18. භික්ෂූහු අතීත ප්‍රත්‍යයලාභය ලක්ෂණ කොට ශෝක නොකරත්. අසම්ප්‍රාප්ත වස්තුවක් ද නොපතන්නාහුය; එකෙණෙහි ලත් යම්කිසි පසයකින් ජීවිතයාපනය කෙරෙත්. ඒ කරුණු තුනෙන් ඡවිවර්ණය ප්‍රසන්නවේ.

19. නොලත් පසය ගැන බලාපොරොත්තුවෙන්ද, පසු ගිය දේට නැවත නැවත ශෝක කිරීමෙන්ද, යන මේ කාරණවයෙන් අඥනජනයෝ සිඳිනලද නිල් ලපටි රණහුණකිළිලක් හෝ බට ගොපිලක් මෙන් තුමූම වියලෙති.

iv. **අනුවාදය:—**

වන ලැහැබේ විසූ ඒ භූමාට්ඨ දෙවතාවා වනවාසී භික්ෂූන් පසු බත් කල පිණ්ඩපාතයෙන් පෙරළා අවුත් අරණ්‍යයට පිවිස රත්තිට්ඨාන-දිවාට්ඨාන යන්හි මූලකර්මස්ථාන (බුද්ධානුස්සති හෝ කායානුපස්සනා) ගෙන හිඳින්නන් දකියි; මෙසේ උන්නාවූ උන්වහන්සේලාට බලවත් චිත්තෛකාග්‍රතා උපදියි; එයින් විසභාග සන්තති සංසිඳෙයි; සභාග සන්තති බැසගණියි, සිතපහදියි; සිත

ප්‍රසන්න කල්හි ලේ පැහැදේ; චිත්තසමුට්ඨාන උපාදාරූප පිරිසිදු වෙත්. නැටියෙන් ගැලවුනු තල්ගෙඩිය මෙන් මුහපාටවේ; ඒ දැක දෙවතාවා සිතීය. මේ ශරීරවර්ණය නම් ප්‍රණීත රස සම්පන්න බොජුන්ද සුව පහස් ඇඳුම් පෙරවුම් සයනයන්ද, ඍතු සුඛවත් තුන්මහල් ආදි ප්‍රාසාදයන්ද මල්ගඳවිලවුන් ආදියද ලබන්න වුන්ටය.

මේ භික්ෂූන්වහන්සේලා පිණ්ඩචර්‍ය්‍යාවෙන් ලැබූ මිශ්‍රක බොජුන් වළඳත්; ඉදල් ඇඳක හෝ පුවරුවක හෝ ගල්පොත්තක හෝ සයනය කෙරෙත්; රුක්මුල් ආදියේවත් අභ්‍යවකාශ (ඉඩකෙළි) යකාවත් වසත්. මොන කාරුණක් නිසා මුන්වහන්සේලාගේ වර්ණ ප්‍රසන්නය වේදැයි ඇසිය. භාග්‍යවතුන්වහන්සේ දෙවෙතිගයින් කාරණය වදාළාහ.

18. අතීතයෙහි අසවල් රජ ධාර්මික විය; හෙතෙමේ අපට ප්‍රණීත ප්‍රත්‍යය දුන්නේය. ආචාර්‍ය්‍ය උපාධ්‍යායයෝ ලාභිවූහ. එකල අපි මෙබඳු බොජුන් වැළඳූයෙමු. සිවුරු පෙරෙව්වෝ වෙමුයි මෙසේ ඇතැම් ප්‍රත්‍යය බාහුලිකයන් මෙන් මේ මහණහු අතීතයට පුන පුනා සොක නොකරත්.

අනාගතයෙහි දැහැමිරජෙක් වන්නේය. දනව් පිරී සමෘද්ධ වන්නේය. බොහෝ ගිතෙල් වෙඬරු ආදිය උපදින්නාහ. කාන්ඩය, වළඳන්ඩය යි ඒ ඒ තැන කියන්නෝ වන්නාහ; එකල අපි මෙබඳු බොජුන් වළඳන්නෙමු; සිවුරු පොරවන්නෙමුයි; මෙසේ අනාගතය නොපතත්. එකෙණෙහි ලද යමකින් යැපෙත් යයි එකී ත්‍රිවිධ කාරණයෙන් වර්ණ සම්පත්තිය දක්වා දැන් ඒ වර්ණයාගේම විනාශය දක්වමින් අනතුරු ගාථාව වදාළෝය.

v. **ප්‍ර: කා:—නළොව හරිතො ලුතො**=තිල්වන් බටගොපිළක් කපා රත්වූ ගලක් උඩ දැම්මාක්මෙන් ශොකාග්නියෙන් රත්වූ ප්‍රසාද රූප කලාප මැලවීගොස් ශරීර සිවියේ දිලිසීම වැනසේ.

මේ සූත්‍ර දහය සැවැත්නුවරදී දෙවතා
ප්‍රශ්න විසඳීම් වස් වදාළසේක.

——:——

# 10. අරඤ්ඤ සූත්‍රප්‍රදීපයයි.

## පළමු නළවග්ගයි.

(තස්සුද්දානං.

ඔඝං නිමොක්ඛං උපනෙය්‍යං අච්චෙන්ති කතිඡින්ද ජාගරං,
අප්පටිවිදිතා සුසම්මුට්ඨා නමානකාමො දසමො අරඤ්ඤේ'ති.)

——:——

**1. න තෙ සුඛං පජානන්ති-යෙ න පස්සන්ති නන්දනං,**
**ආවාසං නරදෙවානං-තිදසානං යසස්සිනං'ති.**

**2. න ත්වං බාලෙ විජානාසි-යථා අරහතං වචො,**
**අනිච්චා සබ්බ සඞ්ඛාරා-උප්පාද වය ධම්මිනො;**
**උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති - තෙසං වූපසමො සුඛො'ති.**

---

**2 - 1 (1 - 2.)**

i. **මාතෘකා:-**

**දෙවියන්ම නන්දන වනය සැප බව හා**
**රහතුන්ම නිවන සැප බව.**

ii. **පිණ්ඩාර්ථය:-**

නන්දනවනය ප්‍රථමයෙන් (අලුතෙන්) දැක කුල්මත්ව ගී කියන නිවන් නොදුටු දෙවතාවාට ආර්‍යශ්‍රාවිකා දෙවතා වෙක් නිවන් සුවයම ශ්‍රෙෂ්ඨය කියා නිගා කිරීමයි.

iii. **භාවය:-**

1. යමෙක් යශස් සමෘද්ධි ඇත්තාවූ තාවතිංස දිව්‍යපුරුෂයන්ගේ වාසස්ථානවූ නන්දනවනය නොදකිත්ද ඔව්හු සැපය නොදනිත්.

2. අඥානදෙවතාව! තුඹ රහතුන් වහන්සේලාගේ දෙශනා වචනය පරිදි හොඳින් නොදන්නෙහිය; සියලු සංස්කාරයෝ අනිත්‍යයහ; උත්පාදව්‍යය ස්වභාව ඇත්තාහ; ඉපිද නිරුද්ධවෙත්; ඒ සංස්කාරයන්ගේ සංසිඳීමයයි කියනලද නිවන සැපය යනු රහතුන්ගේ වචනයි.

v. **ප්‍රකටීකරණාර්ථ:-**

**සුඛං:**-මනවඩන **රූප, සද්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ** සංඛ්‍යාත පඤ්චකාම සැපයයි. ඇස, කණ, දිව, නාසය, කය යන මේ පසිඳුරන් පරිවරණය කිරීමෙන් සුවවේ. අභිනවයෙන් පිළිසිඳ ගත්කෙණෙහිම රත්රන් කඳක්මෙන් බබලන තුන්ගව් පමණ ආත්මභාව ඇතිව උපන් ඒ දිව්‍යපුත්‍රයා දිව්‍යවස්ත්‍ර හැඳ පැලඳ දිව්‍යාලඞ්කාර ප්‍රතිමණ්ඩිතව දිව්‍යමාලාවිලෙපන ධරා දිවසඳුන් සුනු මොනවට ගල්වාගෙණ දිව්‍යමය පඤ්චකාම ගුණවලින් ඔතා ගොතා වෙළී ලොභයෙන් මැඩී **ලොභනිස්සරණ නිර්වාණය** නොදක්නේ ආසභවාක් කියන්නාක් මෙන් මහහඬින් මේ ගාථාව ගායනාකරමින් නන්දනවනයෙහි හැසුරුණේය.

**නන්‍දනං**:- මේ උයනට ප්‍රවිෂ්ට ප්‍රවිෂ්ටයන් නන්‍දනය කරයි, සන්තොෂකරයි නුයි නන්‍දන නම්. **මරණනිමිති පස**- 1. පැලඳි මල් මැලවීම, 2. ඔහදිය සෙලවීම, 3. වස්ත්‍ර කිලුටුවීම, 4. ආසනයෙහි අනභිරමණය, 5. කයෙහි දුර්වර්ණය එළඹ සිටීම, මේ පස උපන් කල්හි සම්පත් හැර චුතවන්නෙමු, චුතවන්නෙමුයි, විලාප කියන දෙවතාවාට ශක්‍රදෙවෙන්‍ද්‍රතෙමේ "නොවැලඹෙව, නොබිඳෙන සවභාව ඇති සංස්කාරයෙක් නම් නැතැයි" අවවාද කොට මේ නන්‍දනුයනට බස්වයි; අනික් දෙවතාවන් විසින් අත් අල්වාගෙණ ඇතුල් කළත් ඔවුන්ගේ මරණශොකය සම්පත් දකීමෙන්ම සංසිඳෙයි; ප්‍රීතිප්‍රමොද්‍යයම උපදියි; ඉක්බිති එහි කෙළිමින්ම උෂ්ණ සන්තප්ත හිම පිඩක්මෙන් වැගිරෙත්; හුලං වැදුනු පහන් සිලක් මෙන් නිවෙත්; මෙසේ ඇතුළුටවන් කවුරු නමුත් නන්‍දනය තොෂණය කෙරේම නුයි=නන්‍දන නම්වේ.

**තිදසානං**:- තුන්වරක් දසය බැගිනි (තාවතිංසයි).

මඝ නම් බෝසත් මානවකයා සමග **මචලගමදී** කාලක්‍රියා කොට උපන් තෙතිස් (33) දෙව්පුතුන් පටන් මේ දෙව්ලොවට මේ ප්‍රඥප්තිනාමය වීයයි කියති. සෙසු සක්වලෙහිද කාමාවචර සදෙව්ලෝ ඇත්තාහ. "සහස්සං චාතුම්මහාරාජිකානං සහස්සං තාවතිංසානං" යනාදිය දක්වීමෙති.

**අරහතං වචො**:-

රහතුන්ගේ වචනය නම්, කාම-රූප-අරූප සංඛ්‍යාත ත්‍රෛභූමිකවූ (පුඤ්ඤාභිසඞ්ඛාර-අපුඤ්ඤාභිසඞ්ඛාර- ආනඤ්ජාභිසඞ්ඛාර හෙතුවෙන්වූ) රූප, වෙදනා, සඤ්ඤා, සඞ්ඛාර, විඤ්ඤාණ යන පච උපාදානස්කන්ධාදී සංඛත සංස්කාරයෝ අනිත්‍යයි. උත්පාදයද. ව්‍යයද, අන්‍යථාත්වයද, සවභාවකොට ඇත්තෝය. ඔහු ඉපදී නිරුද්ධ වෙත්;ඒ මේ ගති ඇති සංස්කාරයන්ගේ ව්‍යුපශම සඞ්ඛ්‍යාත නිර්වාණයම සැපවේ. නන්‍දනවනාදිෂයෙහි සැප විපරිනාම දුක්ඛයවේ.

—:—

## 2. 1. නන්‍දන සූත්‍රප්‍රදීපයයි.

—:—

3. නන්දති පුත්තෙහි පුත්තිමා-ගොමිකො ගොහි තථෙව නන්දති,
උපධීහි නරස්ස නන්දනා-න හි සො නන්දති යො නිරූපධි.

4. සොචති පුත්තෙහි පුත්තිමා-ගොමිකො ගොහි තථෙව සොචති,
උපධීහි නරස්ස සොචනා-න හි සො සොචති යො නිරූපධී'ති.

---

**2 – 2 – ( 3 – 4. )**

i. **මාතෘකා:-**

**නෝසවත්ථු (සතොස්වත්) සොක වත්ථු (සෝවත්) බව.**

ii. **පිණ්ඩාර්ථය:-**

• පඤ්චකාම ගුණ උපධි නිසා තන්දනයත් එයින්ම සොචනයත් හැර කාමූපධි, ඛන්ධූපධි, කිලෙසූපධි, අභිසඞ්ඛාරූපධි රහිත නිරූපධි වූ මහාක්ෂීණාශ්‍රවයින්ගේ සොකයක් නැත

iii. **භාවය:-**

3. බොහෝ දරුවන් ඇත්තේ පුත්‍ර සම්පතින් සතුටුවේ; ගෙරි හිමි ජනතෙම එසේ ගවසම්පතින් සතුටුවේ; පස්කම් ගුණ කරණකොටගෙණ සත්‍වයාගේ තුටුවීම වේ. යමෙක් කාමගුණ සම්පත් නැති දිළින්දෙක් වේනම් හෙතෙම කෑම් ඇඳීම් දුලීභ හෙයින් අතනමන නොවේ.

4. බොහෝ දරුවන් ඇති පුද්ගලතෙම පුත්‍රයන් කරණකොටගෙණ නව ආකාරයකින් ශොක කෙරේ; ගො සවාමි පුද්ගලතෙම ගෙරින් කරණකොට ගෙණ එපරිද්දෙන්ම නවවිධ ශොකය කෙරේ; මෙසෙයින් කාම උපධින් හෙතුකොට ගෙණ සත්‍වයාට ශොකකිරීම වේ; යමෙක් කාම, සකන්ධ, කෙලශ, අභිසංසකාර, අධිෂ්ඨාන, උපධිරහිතවේද; ඒ මහරහතුන්වහන්සේ සොක නොකරන්නාහ.

iv. **අනුවාදය:-**

3. බොහෝ දරුවන් ඇත්තහුගේ ඇතැම් පුත්තු කෘෂිකර්මකොට ධාන්‍ය කොටු පුරවත්; සමහර දරුකෙනෙක් වෙළඳාම් කොට රන්රුවන් ගෙණෙත්; කිසිවෙක් රජසේවායෙන් යාන

වාහන ග්‍රාම නිගමාදිය ලබති; තවද ඒ දරුවන්ගේ කුශලානුභාව සමභූත ශ්‍රී අනුභව කරමින් මව්ද, පියාද, සතුටුවෙත්; සැණකෙළි- දවස් ආදියෙහි මණ්ඩිත ප්‍රසාධිත පුත්‍රයින් සම්පත් අනුභව කරණු දූකා තුටුවෙත්. එහෙයින් "නන්‍දති පුත්තෙහි පුත්තිමා"යි දෙවතාවා කීයේය. [යම්සේ පුතුන් ඇත්තා පුතුන්ගෙන් තුටුපහටු වේනම් එසේම ගෝහිමියාද සම්පූර්ණ ගොමඬල දූකා ගෙරින් නිසා පස්ගෝරස සම්පත් අනුභව කරමින් ගෙරින්ගෙන් නන්‍ද වෙයි. මෙහි වත්‍ථූහි කාමූපධි සඞ්ඛ්‍යාත රූප, ශබ්ද, ගන්‍ධ, රස, සප්‍රෂ්ටව්‍ය පස්කම්ගුණයෝ ත්‍රිභූමකාදි ප්‍රාසාද, උළාර සයන වස්ත්‍රාලඞ්කාර, නාටක පරිවාරාදි වශයෙන් ප්‍රත්‍යුපස්ථිත (ලඟට) වූවාහු ප්‍රීතිසෞම්නස් ගෙනදෙන්නෝ නන්‍දනය (සන්තොෂය) කරති]

4. කාම ගුණසම්පත් රහිත දිළින්ද ඝාසච්ඡාදන (කෑම්පීම්) දුලීහවූයේ සන්තුෂ්ට නොවෙයි; කෑම් ඇඳීම් නැති මනුෂ්‍ය ප්‍රෙතද, මනුෂ්‍ය නෙරයිකද කෙසේ තුටුවන්නේද, භාග්‍යවතුන් වහන් සැයි කීය. මේ අසා ශාස්තෲන් වහන්සේ සිතාවදළසේක්=මේ දෙවතාවා; ශොකවස්තුවක්ම නන්‍දන වස්තු කරයි; ඕහට ශොක වස්තුභාවය දක්වන්නෙමි'යි ගෙඩියකින් ගසා ගෙඩියක් හෙලන් නාක්මෙන් එකී උපමාවෙන්ම එකී දෙවතාවාදය බිඳිනසේක් එම ගාථාවම පෙරලා "**සොචති**" යනාදිය වදාළෝය.

v. **ප්‍රකටීකරණාර්ථ:-**

උපධි සතරකි. කාමූපධි කියනලදී. **ඛන්‍ධූපධි, කිලෙසූපධි, අභිසඞ්ඛාරූපධි** තුන මෙසේ දතයුතු; රූපාදිස්කන්‍ධයෝ ස්කන්‍ධ මූලක දුකට අධිෂ්ඨාන භාවයෙන්ද, කෙලශයෝ අපාය දුක්ඛයට ආධාරස්ථාන හෙයින්ද, අභිසංස්කාරයෝ භවදුඃඛයට අධිෂ්ඨාන භාවයෙන්ද උපධාරණාර්ථයෙන් උපධි නම්වූහ.

**සොචති පුත්තෙහි:**-විදෙශ ගමනාදී වසයෙන් පුතුන් නැතිවූ කල්හිද, නැතිවන කල්හිද, දූන් නසින්නාහ කියා සංකාවෙන්ද සොක වෙයි.

මළ කල්හිද මැරෙන කල්හිද චොර රාජපුරුෂාදීන් විසින් ගත් කලැ හෝ පසම්තුරන් අතට ගියකල්හි හෝ මරණ සංකා ඇත් තේද සෝකීවේ. වෘක්ෂප්‍රපාතාදියෙන් වැටී අත්පා ආදය බිඳීම්

වශයෙන් බිඳුනු කැඩුනු කල්හිද, බිඳෙන කැඩෙන කල්හිද, බිඳේය කැඩේය යන සැක ඇතිවීද, සෝකයට පත්වේ; ශෝකීමියාද, මෙකී ආකාර නවයෙන්ම ගවයන් කරණකොට ගෙන ශොකී වෙයි.

**නරස්ස ශොචනා**:-යම්සේ පුත්‍රයෝ ගවයෝ වෙත්නම් එසේ පස්කම් ගුණ උපධීන්ගෙන්ද;

“තස්ස වෙ කාමයානස්ස-ඡන්දජාතස්ස ජන්තුනො,
තෙකාමා පරිහායන්ති-සල්ලවිද්ධොව රුප්පතී'ති.”

කම්සැප යානාවක් කොට ආශා ඇති සත්වයාට ඒ කාමාශා පිරිහෙත්; උලක් ඇනුනාක්මෙන් වැනසේ යයි වදාළ ක්‍රමයෙන් සොකිවෙත්; එහෙයින් සත්වයාගේ සොචනාව සොකවාසතුකම යයි දතයුතුයි.

—:—

## 2. 2. නන්දනූපධි සූත්‍රප්‍රදීපයයි.

—:—

5. නත්ථි පුත්තසමං පෙමං - නත්ථි ගොසමිතං ධනං,
නත්ථි සූරිය සමා ආභා - සමුද්දපරමා සරා.

6. නත්ථි අත්තසමං පෙමං - නත්ථි ධඤ්ඤසමං ධනං,
නත්ථි පඤ්ඤාසමා ආභා - වුට්ඨි වෙ පරමා සරා'ති.

---

2 - 3 - (5 - 6.)

i. **මාතෘකා:-**

අසමාන වස්තුධර්ම අටකි.

ii. **පිණ්ඩාර්ථය:-**

5-6. පුත්‍ර-ආත්ම ප්‍රෙම බලවත් බවද, ගොධන-ධාන්‍යධන උතුම්බවද, සූර්‍ය්‍යාලොක-ප්‍රඥාලොක ශ්‍රෙෂ්ඨබවද, සමුද්‍රයත්-වර්‍ෂා වත් මහත් ජලාසය වනද, ප්‍රකාශ වෙත්.

iii. **භාවය:-**

5. දරුපෙම්වැනි ප්‍රේමයක් නැත්තේය; ගොධන සමාන ධනයක්ද නැත; හිරු එලිය සම ප්‍රභාවකුත් නැත; සියලු උදක ස්ථාන සමුද්‍රය උසස්කොට ඇත්තාහ.

6. ආත්ම ප්‍රේමය සමාන අන්‍ය ප්‍රේමයක් නැත; ධාන්‍ය ධනය සමාන ධනයක් නැත; ප්‍රඥාව සමාන ආලොකයක් නැත; වැස්ස සමාන විලක්ද නැත.

iv. **අනුවාදය:-**

විරූපවුවද තමපුතුන් රන්පිළිමසේ හඟිත්; මල්ගුළුමෙන් හිසපිට කරපිට තබා පරිහරණය කරන්නෝ වඩිස් හෙලුවත් මූත්‍ර දූමුවත් සෙම්සොටු ගෑවත් සුවඳ විලවුන් වැටුනාක් මෙන් පිළිගන්නාහු සොම්නසට පැමිණෙත්.

එසේද වුවත් ආත්මප්‍රේමයට සමාන ප්‍රේමයක් නැත්මය; මව්පියාදීහුද අහක දමා දූපුත් ආදීහුද පොෂණය නොකොට සත්වයෝ තමාම රකිති.

**ධාන්‍යසමාන ධනයක් නැතිබව**- දුර්භික්‍ෂ කාලයකදී රන් රුවන් ආදියද ගො මහිසාදියද ගෙණ වී හාල් ආදිය ගෙනෙන් නට ධාන්‍ය හිමියන් ලඟටම යෑමෙන් දතයුතුයි.

**ප්‍රඥාව සමාන බැබලීමක් නැතිබව**-සූර්‍ය්‍යාදීහු එක් දෙසක්ම එලිය කරත්; පවත්නා අඳුරම දුරුකරත්; ප්‍රඥාව වනාහි දශ සහශ්‍රී ලොකධාතුවද එකට බබුලුවන්ට හැකිවේ; අතීතාංසාදී ප්‍රතිච්ඡාදක තමසද විධ්වංශනය කරයි.

**මෙඝවෘෂ්ටියට සමාන සරසියක් නැතිබව**-මේඝ වර්‍ෂා ප්‍රවර්තන කලැ මහමුහුදේ ඇඟිලි පුරුක තෙමන තරම්වත් ජලියක් නොවෙයි; වැසවස්නා කල්හි සුභකිණ්ණක * භවනය තෙක්ද එකම උදකයක් වේ.

—:—

## 2. 3. නපුත්තසම සූත්‍රප්‍රදීපයයි.

—:—

* ආභස්සර යනුද පාඨාන්තරයි.

7. ඛත්තියො දිපදං සෙට්ඨො-බලිවද්දො චතුප්පදං,
කොමාරී සෙට්ඨා භරියානං-යො ච පුබ්බජො.

8. සම්බුද්ධො දිපදං සෙට්ඨො-ආජානීයො චතුප්පදං,
සුස්සූසා සෙට්ඨා භරියානං-යො ච පුත්තානමස්සවො'ති.

---

### 2 - 4 (7 - 8).

i. මාතෘකා:-

**ශ්‍රෙෂ්ඨ සත්වයෝ අටදෙනෙකි.**

ii. භාවය:-

7. දෙපාසතුන්ගෙන් රජතෙම ශ්‍රෙෂ්ඨය; සිව්පාවුන්ගෙන් බලිවද්දයා ශ්‍රෙෂ්ඨය; භාර්‍යාවන් අතුරෙන් කුමාරී අවස්ථාවෙහි ගත් ස්ත්‍රී ශ්‍රෙෂ්ඨයි; පුත්‍රයන් අතුරෙන් වැඩිමහලු පුතා ශ්‍රෙෂ්ඨයි.

8 දෙපා ආදී සියලු සතුන් අතුරෙන් සම්‍යක්සම්බුද්ධතෙම ශ්‍රෙෂ්ඨ වේ; සිව්පා සතුන්ගෙන් අජානීයතෙම ශ්‍රෙෂ්ඨය; භාර්‍යාවන්ගෙන් කිකරු භාර්‍යාතොමෝ ශ්‍රෙෂ්ඨයි; පුත්‍රයන්ගෙන් 'සුවච' පුතා ශ්‍රෙෂ්ඨ වේ.

iv. අනුවාදය:-

ඛත්තියො-සම්බුද්ධො-රජුගේ ශ්‍රෙෂ්ඨත්වයට වඩා සම්බුද්ධ ශ්‍රෙෂ්ඨත්වය සියලු තැනම අප්‍රතිහත (නොවැලකියහැකි) වේ.

බලිවද්දො-ආජානීයො-ඇතෙක් හෝ අශ්වාදීන්ගෙන් එකෙක් හෝ යමෙක් කාරණා දන්නේද මේ ආජානීයයාම සිව්පාවුන්ගෙන් ශ්‍රෙෂ්ඨවේ; කූටවණ්ණ රජුගේ ගුලවණ්ණ අශ්වයා මෙනි; කූටවණ්ණ රජතෙමේ චෛත්‍යගිරි නැගෙණහිරි දෙරින් නික්ම චෛත්‍ය පර්වතයට යන්නෙමි'යි කොළොම් හොය තෙරට සම්ප්‍රාප්ත වූයේය. අශ්වයා ඉවුරේ සිට දියට බසින්නට නොකැමතිවිය;රජතෙමේ අශ්වාචාර්‍යයාට ආමන්ත්‍රණය කොට "ඔහෝ! තා විසින් අසු මනාකොට හික්මවන ලදවේ, දියට බසින්ට නොකැමැතිවෙයි" කීය; අස් ඇදුරු දෙවයිනි! අශ්වතෙම සුශික්ෂිතයි, ඔහුගේ "හිත" මම දියට බැස් සෙම් නම් වල්ගය තෙමෙන්නේය, වල්ගය තෙමිකල රජුගේ ඇගේ ජලය වැටෙන්නේය."යි මෙසේ නුඹවහන්සේගේ සිරුරෙහි දියබිඳු වැටෙන බියෙන් නොබසියි; වාලධිය ගන්වනු මැනවැයි කීය; රජ්ජුරුවෝ එසේ කෙරෙව්වෝය; අසු වේගයෙන් බැස එගොඩට ගියේය.

**කොමාරී-සුස්සූසා:**-කුමාරී කාලයෙහි ගත් භාර්‍ය්‍යාවටත්!වඩා කිඩකර බිරින්ද ශ්‍රෙෂ්ඨයි; කුමරිකල ගත්තා හෝ පසුව හෝ සුරූප හෝ විරූප හෝ යම් ස්ත්‍රියක් තොමෝ ස්වාමියාට සුස්සූසා කෙරේද,ඇහුන්කන්දේද, පරිචය්‍යා කෙරේද, සන්තොෂ කෙරේද, ඈ භාර්‍ය්‍යාවන් ගෙන් ශ්‍රෙෂ්ඨවේ.

---

**පුබ්බජෝ-අස්සවො:**-පළමු උපන්නේ ත්‍රණෙක් හෝ තොර පිළු ආදීන්ගෙන් එකෙක් හෝ වේවා; මෙතෙමේම ශ්‍රෙෂ්ඨ පුත්‍රයයි මේ දෙවතාවාගේ වාදය නමුත් මූනපා අසන්නාවූ සුවච පුත්‍ර ජ්‍යෙෂ්ඨ හෝ කනිෂ්ඨ හෝ මවුපිය වචනය අසා පිළිගෙන අව වාද ප්‍රතිකාරී නම් මේතෙම පුත්‍රයින්ගෙන් ශ්‍රෙෂ්ඨයි; තදත්‍ය සැඩ වෙජ්දක (උමංකත) සොරපුතුන්ගෙන් මොන වැඩක් වේද? නොවේමය, දෙවතාවෙනි!'යි වදළසේක.

——:——

## 2. 4. ඛත්තිය සූත්‍රප්‍රදීපයයි.

——:——

**9. සීතෙ මජ්ඣන්තිකෙ කාලෙ-සන්නිසින්නෙසු* පක්ඛිසු, සණතෙව† බ්‍රහාරඤ්ඤං-තං භයං පටිභාති මං.**

**10. සීතෙ මජ්ඣන්තිකෙ කාලෙ-සන්නිසින්නෙසු පක්ඛිසු, සණතෙව බ්‍රහාරඤ්ඤං-සා රතී පටිභාති මං නති.**

**2 – 5 (9 – 10).**

i. **මාතෘකා :-**

**භයට හේතුකාරණය අභිරතියක් වීම.**

ii. **පිණ්ඩාර්ථය :-**

9. මහවනයේ ඉරමුදුන් වේලේ තමා හා හිඳීමට හා කථාවට දෙවැන්නෙක් නොලැබීම දෙවතාවාට බය උපදවයි.

10. පිණ්ඩපාතයෙන් පෙරළා අවුත් විවිත්ත අරඤ්ඤයතන යෙහි කමටහන් ගෙණහුන් භික්‍ෂුහට අතලපසුබ උපදවයි; මේ ඒ සඳහා වදාළ තැනකි.

"සුඤ්ඤාගාරං පවිට්ඨස්ස-සන්තචිත්තස්ස භික්ඛුනො,
අමානුසී රතී හොති- සම්මා ධම්මං විපස්සතො.
පුරතො පච්ඡතො වා'පි-අපරො චෙ න විජ්ජති,
අතී'ව ඵාසු භවති-එකස්ස වසතො වනෙ'ති."

ගේ දොර නැති වනාන්තරයකට ප්‍රවිෂ්ටව සම්‍යක් ධම් විදර්ශනා කරණ ශාන්ත සිත් ඇති භික්‍ෂුහට අමානුසීරතිය (දිව්‍යමය ඇලීම) ක්වේ; ඉදිරියෙන් හෝ පස්සෙන් වෙනෙකෙක් නැත් නම් වනයෙහි තනිව වසන්නාට ඉතාම පහසුවේ." යනුයි.

iii. **භාවය:-**

9. සීත මධ්‍යාහ්න කාලයෙහි මෘගපක්ෂීන් සන්සුන්ව හුන් කල්හි මහවනය මහහඬ පතුරුවන්නාක් මෙනි; එය හුදකලාවූ මට බියක්ව වැටහේ.

10 සියලු සත්‍වයන්ට ඊර්‍ෂ්‍යාපථදෞර්බල්‍යය ඇති ඉරමුදුන් වේලේ මෘග පක්ෂීන් නිශ්ශබ්දව හුන්කල්හි මහවනය ශබ්දකරන්නාක් මෙනි; මෙබඳු කල්හි ඒ තනිව ඉඳිම විවෙකකාමීවූ මට චිත්තාභිරතියක්ව වැටහෙයි.

v **ප්‍රකාශිකාරණාර්ථ:-**

**සණතෙව බ්‍රහාරඤ්ඤං:** මහා විරුවයක් මෙනි'යි කියනු ලැබේ; සනමානයම "සනතීඑව'යි කියනලදී. නියං සමයෙහි සීතමජ්ඣන්තික කාලයෙහි සිව්පා ගණයාද, පක්ෂිගණයාද, නිශශබ්දව හුන්කල්හි වාතපූරිත සිදුරු ඇති වෘක්‍ෂයන්ගේද ඡිද්‍ර ඇති වේණුපවී උණ පුරුක්)ආදීන්ගේද කඳෙන්කඳ අත්තෙන් අත්ත ඝට්ටනය වන්නාවූ පාදපයන්ගේ අරණ්‍ය මධ්‍යයෙහි මහා ශබ්දය උපදියි; ඒ සඳහා මෙය කියනලදී.

—:—

## 2. 5. සීතමජ්ඣන්තික සූත්‍රප්‍රදීපයයි.

—:—

* "සනතිසිතෙනසු"-යි ද;— † "පණතෙව"-යි ද— පාඨාන්තරයි.

11. නිද්දා තන්දී විජම්භිතා-අරතී භත්තසම්මදෝ,
එතේන නප්පකාසති-අරියමග්ගො ඉධ පාණිනං.

12. නිද්දං තන්දිං විජම්භිතං-අරතිං භත්තසම්මදං,
විරියෙන නං පණාමෙත්වා-අරියමග්ගො විසුජ්ඣතී'ති.

---

**2 - 6 - ( 11 - 12. )**

i. **මාතෘකා:-**

**මාර්ග සඞ්ඛ්‍යාත වීර්යයෙන්ම මාර්ග විශුද්ධියවේ.**

ii. **භාවය:-**

1. නින්දත්, අලසබවත්, ඇඟපත සැරසීමත්, අරතියත්, බත්-මතත්, යන මේ පස උපක්ලේශ කාරණකොට ගෙණ ලෝකෝත්තර මාර්ගය පහළ නොවේ.

2. නිද්‍රා-තන්ද්‍රා-විජෘම්භිකා-අරති-භක්තසම්මද යන මේ ක්ලේශජාතය වීර්ය්‍යයෙන් බැහැරකිරීමේ හෙතුවෙන් ආය්‍ය්‍යීමාර්ග විශුද්ධිය වේ.

v. **ප්‍රකීර්ණකාර්ථ:-**

**නිද්දා**—"**අභිජානාමහං අග්ගිවෙස්සන ගිම්හානං පච්ඡිමෙ මාසෙ නිද්දං ඔක්කමිතා**"යි වදාළ මෙබඳු අව්‍යාකෘත නිද්‍රාවට පූර්වභාග අපරභාග දෙක්හි ශෛක්ෂ පෘථග්ජනයන්ගේ සසංස්කාරික අකුශල චිත්තයෙහි උපන් **ථිනමිද්ධය** නිද්‍රාවයි; **තන්දී**-අධික බඩගිනි තදසීත වාතාදිය ඇතිකල උපන් ආගන්තුක ආලසියයි.

**විජම්භිතා**—කායවිජෘම්භනාවයි; ගාත්‍රාවයව විදහාපෑන විජෘම්භනයයි; සැරසීමයි.

**අරතී** -කුශල පාක්ෂික ක්‍රියාවන්හි කලකිරුණු බවයි. එරති ගතියයි, කුශල්හි නොඇලීමයි

**භත්තසම්මදෝ**—භක්තමූර්ච්ඡාවයි, (කෑපතරෙගයයි); අත්ත කිලමථ-චිත්තදරථ නිශ්‍රිතාදී කාලයෙහි මොව්හු වෙත්.

——:——

## 2. 6. නිද්දාතන්දි නප්පකාසන සූත්‍රප්‍රදීපයයි.

——:——

13. දුක්කරං දුත්තිතික්ඛංච-අබ්‍යත්තෙන ච සාමඤ්ඤං,
බහූ හි තත්ථ සම්බාධා-යත්ථ බාලො විසීදති.

14. කතිහං චරෙය්‍ය සාමඤ්ඤං-චිත්තං චෙ න නිවාරයෙ,
පදෙ පදෙ විසීදෙය්‍ය-සඞ්කප්පානං වසානුගො.

15. කුම්මොව අඞ්ගානි සකෙ කපාලෙ
සමොදහං භික්ඛු මනොවිතක්කෙ,
අනිස්සිතො අඤ්ඤමහෙඨයානො
පරිනිබ්බුතො නූපවදෙය්‍ය කඤ්චි'ති.

---

2 - 7 - ( 13 - 14 - 15. )

**මාතෘකා:-**

**මහණදම් පිරීම දුෂ්කරබව.**

**පිණ්ඩාර්ථය,**

මහණකමේ දුෂ්කරතාවය සහ චිත්තවසිකයාට මහණදම් කරන්ට නොපිළිවන් බවත් උපවාද නොකියා කරුණාවෙන් දෝස් කියයුතු බවත් ප්‍රකාශිතයි.

iii. **භාවය:-**

13 අව්‍යක්ත බාලයා විසින් ශ්‍රමණධර්මය ආරම්භවශයෙන් කරනු නොහැකිසි, අනුයුජ්ජනවශයෙන් නොඉවසිය හැකිසි, යම් මහණ දමෙක්හි බාලතෙම වැතිරේද, පසුබසීද, ඒ ශ්‍රාමණ්‍ය සඞ්ඛ්‍යාත ආර්‍යමාර්ගයෙහි පරිශ්‍රමයෝ බොහෝ වෙති.

14. කාමසංකල්පනාදී වසයට පැමිණියේ අයෝනිසොමනසිකාර වශයෙන් උපන් සිත නොවලක්වන්නේ නම් කිදිනක් මහණකම් කරන්නේද? එක දවසකුත් නොකරන්නේය; අරමුණක් අරමුණක් නොහොත් පියවරක් පියවරක් පාසා කිඳ බසින්නේය.

15. ග්‍රීවය පස්වැනි කොට ඇති අවයවයන් සිය කබලෙහි එකතුකොට බහන්නාවූ කූර්මයෙක් (ඉදිබුවෙක් හෝ කැස්බෙක්) මෙන් යොගාවචර මහණතෙම සිතතුළ උපන් විතර්කයන් හකුලා ගෙණ තෘෂ්ණා දෘෂ්ටි නිශ්‍රිත නොවූයේ අනිකෙකු නොවෙහෙසන්නේ කෙලෙසුන් නිවීමෙන් පිරිනිවියේ කිසිවෙකුට 'ඕප දූප' නොකියන්නේය.

iv. **අනුවාදය:-**

දෙවතාවා මේ කාරණය පෙන්වයි; පණ්ඩිත කුලපුත්‍රයෝ යම් හෙයකින් දසවසක් විසිවසක් හැටවසක් දතින්දත දමාගෙණ දිවෙන් තල්ල ඔබාගෙණ හිතෙන් හිතට නිගාකොට එකාග්‍ර

එකභත්තාදිය පටිසෙවනය කරමින් දිවිකෙළවර කොට බඹසර හැසිරෙන්නාහු සමණබැව් කරති, භාග්‍යවතුන් වහන්ස! බාල, අව්‍යක්තතෙම ඒ මහණකම කරන්ට නොහැක්කේය, කියායි.

යම් යම් අරමුණක කෙලෙස් උපදීද, ඒ ඒ අරමුණෙහිද යාම් ඊම් ආදී යම් යම් ඉරියව්වල උපන් කෙලෙස්ද, කිඳවන්නේය. පාකොට නොහරින්නේය.

යම්සේ ඉදිබුවා හෝ කැස්බා තුඹත් පා සතරත් කබල ඇතුලට ගනිමින් සිවලුන්ට ඉඩනොදේද, එකතුකොට නොමැඩිය හැකි බවට පැමිණේද, එමෙන්ම භික්‍ෂුතෙම සිතෙහි උපන් කාම විතර්කාදිය සවකීය ආලම්බන කබලෙහි එකතුකොට සමොදහන කිරීමෙන් මාරයාට අවතාර නොදෙයි; මොනවට ඇතුල්කොට ගෙණ අප්‍රසහ්‍යත්වයට පැමිණෙයි.

v. ප්‍රකටීකරණාර්ථ:-

**බහූහි නාපර සම්බාධා**—ඒ ශ්‍රාමණ්‍ය සඞ්ඛ්‍යාත ආර්‍යමාර්ගයෙහි බාධාවෝ බොහෝය, මාර්ගාධිගමයට පිළිපදින්නහුට පූර්වභාගයෙහි පරිශ්‍රමයෝ බොහෝය’යි දක්වයි. **“චිත්තං චෙ න නිවාරයෙ”** අනුපාය මනසිකාරයෙන් සුභ සුඛ ආදී වශයෙන් උපන් අකුශල් සිත නිවාරණය නොකරන්නේ නම් එකදවසක් වත් මහණදම් නොකරන්නේය.

**න උපවදෙය්‍ය කඤ්චි**:-අන්කිසි පුද්ගලයෙකුට ආචාර විපත්ති, දිට්ඨි විපත්ති, ආජීවවිපත්ති ආදී යම්කිසිවකින් මකු කරනු කැමැත්තෙක්ව නොකියන්නේය.

**‘කාලෙන වක්ඛාමි නො අකාලෙන”**–යනු ආදී පඤ්චධර්ම කෙනෙක් සිතේ තබා ගෙණ මතුකර පාකරණ සවභාවයෙන් පිහිටි සිතෙන් කරුණාව පිණිස කියන්නේය.

---

## 2. 7. කුම්ම සූත්‍රප්‍රදීපයයි.

---

**16. හිරී නිසෙධො පුරිසො-කොචි ලොකස්මිං විජ්ජති,**
**යො නින්දමප්පබොධති-අස්සො භද්‍රො කසාමිව.**

**17. හිරිනිසෙධා තනුයා-යෙ චරන්ති සදා සතා,**
**අන්තං දුක්ඛස්ස පප්පුය්‍ය-චරන්ති විසමෙ සම'න්ති.**

---

**2 - 8 - ( 16 - 17 )**

i. **මාතෘකා:-**

**ලජ්ජා (හිරි) නිසා පව් නොකිරීම.**

ii. **පිණ්ඩාර්ථය:-**

16. අභූතාක්‍රොශයෙන් (නිෂ්කාරණ බැණුමෙන්) පිරිමුත් කෙනෙක් නැත.

17. හිරි කාරණකොටගෙණ අකුශලධර්ම වළකා හැසිරෙන් නාවූ ක්ෂීණාශ්‍රවයෝ අල්ප වෙත්.

iii. **භාවය:-**

16. සුන්දර ආජානීය අශ්වයෙක් කස පහරට ඉඩ නොදෙන් නාක් මෙන් යම් මහණෙක් නින්දා වළකා පුබුදීද, ලජ්ජාවෙන් අකුසල් වළහන්නාවූ කිසියම් ක්ෂීණාශ්‍රව පුරුෂයෙකුත් ලොකයෙහි ඇත්ද?

17. යම්කෙනෙක් හැම කල්හි සිහි ඇතිව හැසිරෙත්ද, ලජ්ජාවෙන් අකුශලධර්මයන් නිසෙධ කොට හැසිරෙන්නාවූ ක්ෂීණාශ්‍රව පුද්ගලයෝ ස්වල්පදෙනෙක් වෙත්; ඔව්හු දුක් කෙළවරට පැමිණ විෂමයෙහි සමව හැසිරෙන්නෝද වෙත්.

iv. **අනුවාදය:-**

යම්සේ භද්‍ර (සොඳුරු) ආජානීය අශ්වයෙක් පතොදච්ඡායාව (කස සෙවනැල්ල) දුටු තැතිගත්තේ වේගවත් ගමනින් තමා කෙරේ කසය වැටෙන්ට නොදේ ද, එමෙන්ම නින්දාවට ආක්‍රොශයට භයවූ 'භික්ෂුතෙමේ දශවිධ ආක්‍රොශවස්තු තමා කෙරේ වැටෙන්ට නොදෙන්නේ නින්දා වළහා පුබුදියි; එබඳු යම් රහත් කෙනෙක් විද්‍යමාන වෙත්දැයි දෙවතාවා අසයි,

v. **ශබ්දවිවරණාර්ථ:-**

**සදාසතා**-නිතිකල් ස්මෘතිවෛපුල්‍යයෙන් සමන්වාගතවූ;

**අන්තං දුක්ඛස්ස පප්පුය්‍ය:**- වෘත්තදුඃඛයාගේ කෙළවරවූ, අන්ත යවූ නිවණට පැමිණ විෂම ලොකයෙහි සමව හැසිරෙති.

——:——

## 2. 8. හිරීනිෂෙධ සූත්‍රප්‍රදීපයයි.

——:——

18. කච්චි තෙ කුටිකා නත්ථි-කච්චි නත්ථි කුලාවකං,
කච්චි සන්තානකා නත්ථි-කච්චි මුත්තො'සි බන්ධනා.

19. තග්ඝ මෙ කුටිකා නත්ථි-තග්ඝ නත්ථි කුලාවකං,
තග්ඝ සන්තානකා නත්ථි-තග්ඝ මුත්තො'ස්මි බන්ධනා.

20. කින්තාහං කුටිකං බ්‍රූමි-කින්තෙ බ්‍රූමි කුලාවකං;
කින්තෙ සන්තානකෙ බ්‍රූමි-කින්තාහං බ්‍රූමි බන්ධනං.

21. මාතරං කුටිකං බ්‍රූසි-භරියං බ්‍රූසි කුලාවකං,
පුත්තෙ සන්තානකෙ බ්‍රූසි-තණ්හං මෙ බ්‍රූසි බන්ධනං.

22. සාධු තෙ කුටිකා නත්ථි-සාධු නත්ථි කුලාවකං,
සාධු සන්තානකා නත්ථි-සාධු මුත්තො'සි බන්ධනා'ති.

---

2 - 9 - ( 18 - 19 - 20 - 21 - 22. )

i. මාතෘකා:-

මව, බිරිඳ, දරුවන් හා තණ්හාව යන සතර දෙනෙකුට උපමා බැඳී සතරක්.

ii. පිණ්ඩාර්ථය:-

1. මෑණියෝ කුටියකි. 2. බිරිඳ කූඩුවකි. 3. දරුවෝ ජල සන්තතිය (හැත්ත) කි. 4. තණ්හාව බන්ධනයකි.

iii. භාවය:-

18. නුඹ වහන්සේට කුටිකාවක් නැත්ද? කැදූල්ලක් කිම නැත්ද? සන්තානකයෝ (පැටව්) කිම නැත්තාහුද? බන්ධනයෙනුත් මිදුනේ වෙහිද?

19. මට කුටිකාවක් ඒකාන්තයෙන් නැත; කැදූල්ලක්ද නැත; සන්තානකද නැත්තාහ. බන්ධනයෙන්ද මිදුනේ වෙමි.

20. මම නුඹවහන්සේට කුමක් කිළියක් කොට කියම්ද? කුමක් කැදූල්ලක් කොට කියම්ද? කුමක් සන්තානකයන් කොට කියම්ද? යුෂ්මත්හට මම කුමක් බන්ධන කොට කියම්ද?

21. මව කිළියක් කොට කීයෙහිය; භාර්‍යාව කැදූල්ලක් (කූඩුවක්) කොට කියෙහිය. පුත්‍රයන් සන්තාන කොට කියෙහිය; තෘෂ්ණාව බන්ධනයකොට මට කීයෙහිය.

22. නුඹවහන්සේට කිළියක් නැත, හේ යහපති. කැදැල්ලක්ද නැත්තේය; හෙද යහපති. සන්තානක (පුත්‍ර)යෝ නැත්තාහ, සාධුයි. තණ්හා බැම්මෙන් මිදුනේ වෙහිය; හේ මැනවි.

iv. **අනුවාදය:-**

මේ දෙවතාවා දසමසක් ඇතුළත වසන අර්ථයෙන් මව කුටියක් කොටද, යම්සේ සකුණයෝ දවල් ගොදුරෙහි පසුතයෝ රාත්‍රි කුලාවකය (කූඩුව) එලිගනිත්. එමෙන්ම සත්වයෝ ඒ ඒ තැන ගියත් මාගම (භාර්යාව) ලඟට එතියි, ආලය වශයෙන් භාර්යාව කුලාවකයක් කොටද, කුල ප්‍රවේණී ගොතන අර්ථයෙන් පුත්‍රයන් සන්තානකයන් කොටද, තෘෂ්ණාව බන්ධනය කොටද, මේ ප්‍රශ්නයන් ගාථා බැඳුයෙන් එකතුකොට භාග්‍යවතුන් පිළිවිසියේය. භාග්‍යවතුන් වහන්සේද ඔහට විසඳ "තග්ඝ" යනාදිය වදාළ සේක.

**ප්‍රකාශීකරණාර්ථ:-**

**තග්ඝ**-යනු එකාංශ වචනයෙහි නිපාත පදයකි. නත්ථි-යනු අත්හැරදමා පැවිදිවූ බැවින් වෘත්තයෙහි හෝ නැවත මව්කුස විසීමද දාරාභරණයද පුත්‍රනිෂ්පත්ති හෙවත් දරු උපතද අභාව හෙයින් නැත.

**කිංනාහං**-(කිං තෙ අහං:)දෙවතාවා නැවත සිතුවාය;මාවිසින් සන්නාහ බන්ධන කොට ගූඪ ප්‍රශ්න විචාළාහ—මේ මහණහුද විචාළ මතතින්ම විසඳුයේය. මගේ අදහස දැනගෙණ කිව්වේද, නොදැන යම් ඒ කටට ආවක් කීයේදැයි සිතා නැවත "කිත්තාහං" යනාදිය කීයේය. ඉන්පසු භාග්‍යවතුන් වහන්සේ ඔහට විසඳ වදරමින් "මාතරං". යනාදිය වදාළහ. එවිට දෙවතාවා 'සාහුතෙ' යන ගාථාවෙන් අනුමෝදන්ව ප්‍රීතිය මනාසේ ප්‍රකාශ කොට භගවතුන් වැඳ සුවඳමල් ආදියෙන් පුදා තමාගේ දෙවස්ථානයටම ගියාය

---

## 2. 9. කුටිකා සූත්‍රප්‍රදීපයයි.

---

23. අභුත්වා භික්ඛසි භික්ඛු-න හි භුත්වාන භික්ඛසි,
භුත්වාන භික්ඛු භික්ඛස්සු-මා තං කාලො උපච්චගා.

24. කාලං වො'හං න ජානාමි-ඡන්නො කාලො න දිස්සති,
තස්මා අභුත්වා භික්ඛාමි-මා මං කාලො උපච්චගා.

25. අක්ඛෙය්‍යසඤ්ඤිනො සත්තා-අක්ඛෙය්‍යස්මිං පතිට්ඨිතා,
අක්ඛෙය්‍යං අපරිඤ්ඤාය-යොගමායන්ති මච්චුනො.

26. අක්ඛෙය්‍යං ච පරිඤ්ඤාය-අක්ඛාතාරං න මඤ්ඤති,
තඤ්හි තස්ස න හොති'ති-යෙන නං වජ්ජා න තස්ස
හොති; සචෙ විජානාසි වදෙහි යක්ඛ.

27. සමො විසෙසී අථවා නිහීනො
යො මඤ්ඤතී සො විවදෙථ තෙන,
තීසු විධාසු අවිකම්පමානො
සමො විසෙසී'ති න තස්ස හොති.
සචෙ විජානාසි වදෙහි යක්ඛ.

28. පහාසි සඞ්ඛං න විමානමජ්ඣගා
අච්ඡෙච්ඡි තණ්හං ඉධ නාමරූපෙ,
තං ඡින්නගන්ථං අනීඝං නිරාසං
පරියෙසමානා නාජ්ඣගමුං.
දෙවා මනුස්සා ඉධ වා හුරං වා
සග්ගෙසු වා සබ්බනිවෙසනෙසු;
සචෙ විජානාසි වදෙහි යක්ඛ.

29. පාපං න කයිරා වචසා මනසා
කායෙන වා කිඤ්චනං සබ්බලොකෙ,
කාමෙ පහාය සතිමා සම්පජානො
දුක්ඛං න සෙවෙථ අනත්ථසංහිත'න්ති

2. නන්දන වග්ගො.

---

**2 – 10 ( 23 – 29. )**

i. **මාතෘකා:-**

**කාම විභාග සහ රහතුන්ගේ ගුණ.**

ii. **පිණ්ඩාර්ථය:-**

පඤ්චකාම සෙවනයට සෑහෙන්නේ දහර යෞවනකාලයේ'වේ, ජරාවෙන් ජීර්ණවූ ඔක්කානැහුනු දණ්ඩපරායනවූ වෙව්ලන්නාවූ

කාශශක්ත්‍යාභිභූතයෙකුවිසින් කාමපරිභොගය නොහැකි වේ. මෙසේ මේ තෙරුන්ගේ තරුණකාලය සඳහා දෙවතාවාවිසින් "මා තං කාලො උපච්චගා"යි කියනලදී.

"ජීවිතං ව්‍යාධි කාලො ච-දෙහනික්ඛෙපනං ගති,
පඤ්චෙතෙ ජීවලොකස්මිං-අනිමිත්තා න ඤායරෙ".

ජීවිතය, ව්‍යාධිය, කාලය, දෙහනික්ඛෙපනය, උත්පත්ති ගතිය, යන මේ පසම ලොකයෙහි නිමිති (ලකුණු) නැති බැවින් නොදතහැක්කෙන් සම්ඩි මහරහතුන් වහන්සේ, "කාලං වොහං න ජානාමි" යන ගාථාව මරණකාලය සඳහා වදාළේය.

**අනිමිත්ත පඤ්චක ප්‍රකාශීකරණය:—**

1. **ජීවිතකාලය**-මෙතෙක් ජීවත්විය යුතුයයි ව්‍යවස්ථාවක් නැතිහෙයින් අනිමිත්තය; කලල රූප කාලයේදීත් සත්වයෝ මැරෙති, අබ්බුද කාලය, ඝන කාලය, මාසය, දෙමාසය, තුන්, සාර, පස්, සය, සත්, අට, නව, දස මාසකාලයන්හිද මැරෙත්; මව්කුසින් බිහිවූ කාලයෙහිද, ඉන්පසු සියක් අවුරුද්ද ඇතුළතද, ඉන් එහාද, මැරෙත්.

2. **ව්‍යාධිය**:-මේ ව්‍යාධියෙන්ම සත්වයෝ මැරෙත්, අනිකකින් නොමැරෙතැයි ව්‍යවස්ථාවක් නැතිහෙයින් අනිමිත්තය; ඇස් රොගයෙන්ද සත්වයෝ මැරෙත්, කන්රොගාදියෙන්ද සත්වයෝ මැරෙති.

3. **කාලය**:-මේ කාලයේම මැරෙන්නට යුතුය, අන්කලෙක නොමැරෙන්නට යුතුයයි ව්‍යවස්ථා නැති බැවින් එයද අනිමිත්තයි; පෙරවරුද සත්වයෝ මැරෙත්, මධ්‍යාහනාදී කාලයකද මැරෙත්.

4. **දෙහනික්ඛෙපනය**- මැරෙන්නන්ගේ සිරුර මෙහිම වැටිය යුතුය, අන්තැනක නොවැටිය යුතුය කියා ව්‍යවස්ථා නැති බැවින් අනිමිත්තය; ඇතුළුගම උපන්නන්ගේ ආත්මභාවය ගමින් පිටද වැටේ. පිට ගමේ උපනුන්ගේ සිරුරු ඇතුල් ගමේද වැටෙත්; ගොඩ උපන්නන් දියෙහිද දියේ උපන්නන් ගොඩද මැරී වැටෙත්.

5. **ගතිය**-මෙයින් චුතව මෙහිම ඉපදිය යුතුයයි ව්‍යවස්ථාවක් නැතිහෙයින් අනිමිත්තය; දිව්‍යලොකයෙන් චුතවූවෝද මනුෂ්‍යයන් අතර උපදිත්; මනුලොවින් සැව දෙව්ලෝ ආදී යම්කිසි තැනකද උපදිතියි; මෙසේ යන්ත්‍ර යුක්තගවයෙකු

(සෙක්කුවේ බැඳපු ගොනා) සේ ගතිපක්ෂවූ ලෝකය තෙමේ අති ශයින් පෙරළෙයි; මෙසේ පෙරළෙන්නාවූ ඔහුගේ මරණය, මෙතම් කාලැයි මරණය සම්බන්ධ මේ කාලය මම නොදනිමි.

මෙහි **නිදානය**-භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීප තපොදාරාමයෙහි වැඩ විසූසේක; එකල **සමිද්ධි** ආයුෂ්මතුන් වහන් සේ අළුයම නැගී ගාත්‍රපරිසේකයට (ඇඟසේදීමට) තපොදාවට වැඩියේය.

**තපොද ප්‍රකවීකරණය.**-තප උද-රත්වූ උදක ඇති හෙයින් ලද නාමයකි. වෙභාර පර්වතය යට බූමාටු නාගයන්ගේ යොදුන් පන්සියයක් නාගභවනය දෙව්ලෝ වැනිවේ; මාණික්‍යමය බිමෙන්ද, අරම් උයන්වලින්ද, සමන්විත වේ; එහි නාගයන්ගේ ක්‍රීඩාස්ථානයේ මහා උදකරහදයක් (විලක්) වේ; එයින් තපොද නම් නදිය ගලාබසියි; කැලඹි උණුදිය ඇත්තීය; මේ තපෝද නදිය මෙසේ වන්නි කුමකින්ද? රජගහනුවර වටකොට පිරිවරා මහා ප්‍රේතලොකය තිබේ; එහි මහාලෝකුම්භනරකදෙක අතුරෙන් මේ තපෝද නදිය එයි; එහෙයින් කුපිතව (කැකැරී) ගලයි; වදාරණ ලදමැයි; "යතො යං භික්ඛවෙ තපොද සන්දති, සො-පෙ-තෙනායං තපොදකුපිතා සන්දතී"තියි; මේ ආරාමයට අභිමුඛ ස්ථානයෙහි ඒ නදියෙන් මහදියවිලක් විය; ඒ විසින් මේ විහාරය **තපෝදාරාමයයි** කියනු ලැබේ.

**සමිද්ධිනාමය**-ඒ තෙරුන්නාන්සේගේ ආත්මභාවය සමෘද්ධය; අභිරූපයි, ප්‍රාසාදිකයි, (පිරිහැඩගැසී පිනවයි); එහෙයින් සමිද්ධි සඞ්ඛ්‍යාතවී. පධානික ස්ථවිරකෙනෙක්වූ මූන්වහන්සේ බොල් පින්නේම හුනස්නෙන් නැග සිරුරු උතුගන්වා පිටත හැටරියන් මත් මහ සක්මන්මලුවේ ඔබිමොබ සක්මන් කොට සෙද ගත් ගතින් පරිභොග කරන සෙනස්න කෙලෙසෙන්නේයයි හගිමින් ගත් පිරිසින්නට (ශරීර ශොධනය පිණිස) එළඹියේය; එසේ එළඹ අඳනය ඇඳ පටිය බැඳ සිවුර අතින්ගෙන සිටියේය ගත් පෙරසේ තෙතහින්දමින්; තෙත්සිරුරේ පෙරෙව්සිවුර කිලිටිවෙයි, දුගඳ වෙයි, ඒ වතද නොවේ. තෙරනුවෝ වතාහි වත්සපන් හෙයින් වතපිහිටා නහා ගොඩ බැස සිටිසේක.

**නහනවත**-ස්නානතීර්ථයට (නානතොටට) ගොස් සිව්රැ එහේ මෙහේ දමා වේගයෙන් සිටිවනම නොපැන්න යුතුයි. හැම පැත්තම බලා විවෙකබව දැන කනු, පඳුරු, වැල් ආදිය වැවැත්තා කොට තුන්වර කාරා නැමී සිටගෙන උතුරුසළු සිවුර

ඇඟෙන් ඉවත්කොට දිගහැරිය යුතුයි; කඟබාන (පටිය) මුදා සිවුරුපිට තැබිය යුතුයි; ඉදින් දියඇළි වක් (නානකඩක්) නැත්නම් උදකාන්තයෙහි උක්කුටුකයෙන් හිඳ හඳනය ලිහා නැමුනු තැනක් ඇත්නම් දිගහැරිය යුතුයි, නැත්නම් හකුළා තැබිය යුතුයි; දියට බස්නහුවිසින් හෙමින් නැබ පමණට බැස රැළි නොනංවා ශබ්ද නොකර නැවතී ආදෙසට අභිමුඛව ගිලිය යුතුයි; මෙසේ සිවුරු රැක්කේවෙයි; මතුවෙන්නහු විසින්ද ශබ්ද නොකර සෙමින් මතුවී නෑම අවසන්කල උදකාන්තයෙහි ඇසවටුවෙන් හිඳ නිවාසනය පිරිකෙවි කොට නැගිට සුපිරිමඬුලුව හැඳ කාය බන්ධනය බැඳ සිවුර නොපොරවාම සිටිය යුතුයි; මේ ස්නාන ව්‍රතයයි.

**සමිද්ධි** තෙරනුවෝ එසේ ස්නානය කොට ගොඩබැස දිය හිඳෙන ඇඟ බලමින් සිටිසේක; ප්‍රකෘතියෙනුත් ප්‍රසාද බහුලවූ අළුයම් වේලෙහි මනාකොට පරිනත ආහාර ඇත්තාවූ උණු දියෙන් ස්නානය කළහුගේ මූඛවර්ණය අධිකව බැබලින, නැරියෙන් ගැලවී වැටුනු තල්පලයක්මෙන් ප්‍රභා සම්පන්නවූයේ පූර්ණ චන්ද්‍රයා මෙන්ද එකෙණෙහි පිපුනු පියුමක් මෙන්ද මූහුණ සශ්‍රීක විය, ශරීර වර්ණයද විප්‍රසන්න විය. එසමයෙහි වනලැහැබෙහි අධිවාසී භූමමදෙවතාවා ප්‍රසාදවහවූ භික්‍ෂුව බලමින් සවකීය රාග සහගත හිතට නිගාදෙන්ට නොහැකිවන්නී කාමපරිදාහාභිභූතවූවා තෙරුන් පොළඹවන්නෙමියි ආත්මභාවය උළාර අලංකාරයෙන් සරසා දහස්වැටි පහනක් දල්වන්නාක්මෙන්ද සැදපැවූකලක් මෙන්ද සකලාරාමය එකොභාෂකොට තෙරුන්වෙත එළඹ නොවැඳම අහසේ සිටියා "අභුඤ්ජා" යනාදී ගාථාව කීවාය.

iii. **භාවය**:-

23. මහණ! පස්කම්රස අනුභව නොකොට පිඬු පිණිස හැසිරෙහිය, පළමුකොට පස්කම් සැප වළඳා දැන් භික්‍ෂාටනය නොකෙරෙහිය, භික්‍ෂු! පස්කම් සැප අනුභව කොට පසුව භික්‍ෂාවෙහි හැසිරෙව, පඤ්චකාම රස ප්‍රතිසෙවනක්‍ෂම යෞවනකාලය තෙම නුඹ ඉක්ම නොයේවා.

24. මම මරණකාලය නොදනිමි, කාලය තෙමේ ප්‍රතිච්ඡන්න වූයේ නොපෙණේ, එහෙයින් පඤ්චකාම ගුණානුභව නොකොට පිඬු පිණිස හැසිරෙමි, මහණදම් කරණ අන්තිම වයසට නොපැමිණි යෞවනකාලයතෙමේ මා ඉක්ම නොයේවා. ඉන්පසු ඒ දෙවතාවා බිමට බැස සමිද්ධි ආයුෂමතුන්ට මෙසේකීය:-"දහරෙ

හි ත්වං භික්ඛු පබ්බජිතො යුවා සුසුකාළකෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා, අනික්කීළිතාවී කාමෙසු, භුඤ්ජ භික්ඛු මානුසකෙ කාමෙ, මා සන්දිට්ඨිකං හිත්වා කාලිකං අනුධාවී"ති". එවිට සමිද්ධි තෙරුන් මෙසේ කීහ:-

"න ඛ්වා'හං ආවුසො සන්දිට්ඨිකං හිත්වා කාලිකං අනුධාවාමි, කාලිකඤ්ච ඛ්වා'හං ආවුසො හිත්වා සන්දිට්ඨිකං අනුධාවාමි, කාලිකා හි ආවුසො කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා ආදීනවො එත්ථ භීය්‍යො, සන්දිට්ඨිකො අයං ධම්මො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී"ති.

මෙසේ කීමෙන් අන්ධයාට රූප විශෙෂ නොපෙනෙන්නාක් මෙන් "දෙවතා" තෙරුන් කී අර්ථ නොදැන "මහණ භාග්‍යවතුන්වහන්සේ විසින් කාමයෝ කල්ගොස් පලදෙන්නාහ, බොහෝ දුක්ය, ආයාස බොහෝය, මෙහි දෝෂ බොහෝ යයි කෙසේ වදාළෝදැයි" ඇසිය. "ඔබ දෙව්දුව! මම නවකය ලඟදී මහණවූයෙමි, මේ ශාසනයට පැමිණියේ අලුතයි, විස්තරයෙන් කියන්ට නොහැක්මි; ඒ අභිත්සම්‍යක් සම්බුද්ධ භාග්‍යවතුන්වහන්සේ රජගහනුවර තපොදාරාමයේ වැඩවෙසේ, ඒ බුදුන් වෙතට ගොස් මේ කරුණු විචාරව, උන්වහන්සේ විසඳන පරිදි දැනගනුවයි" කීකල්හි, "මහණ ඒ භගවත් අප විසින් එළඹෙන්ට සුකරකෙනෙක් නොවේ, අන්‍ය මහෙශාක්‍ය දෙවතාවන්විසින් පිරිවැරූය, අප වැනි මාගමුන්ට ලංවිය නොහැක, නුඹවහන්සේ ගොස් මේ අරුත පිළිවිසින්නෙහි නම් අපිත් ධර්මශ්‍රවණයට එන්නෙමු, "එසේ වේවායි සමිද්ධි ආයුෂ්මත් දෙවතාදුවට කියා බුදුන් ලඟට ගොස් වැඳ එකත්පස්ව හිඳ මෙපුවත් සැලකළසේක. ඒ දේවතාදුවගේ කීම සත්‍යනම් ඕ මේ නුදුරේ ඇතැයිකීම හා සමගම **අසව මහණ! අසව ඔහණ!** මේ මම ආවෙමියි කීකල්හි භාග්‍යවතුන්වහන්සේ **අක්ඛෙය්‍යසඤ්ඤිනො**-යනාදී ගය වදාළසේක.

**26.** iii. **භාවය:-**

සත්වයෝ සියලු අක්ඛාත (කථාව්‍යවහාර)යන්ට වස්තුහෙයින් පඤ්චස්කන්ධයන්හි සත්වපුද්ගල ස්ත්‍රීපුරුෂාදී සංඥ ඇත්තෝ වෙත්; අක්ඛෙය්‍ය පඤ්චස්කන්ධයෙහි **රාග, ද්වේෂ, මොහ, දිට්ඨි, අනුසය, මාන, විචිකිච්ඡා, උද්ධච්ච** වසයෙන් අටවිධියකින් පිහිටියාහුය; පඤ්චස්කන්ධ පිරිසිඳ නොදන්න මාරයාගේ ප්‍රයොග (උපක්‍රමවශය) ට පැමිණෙත්.

## කාමයන් කාලිකබව.

සිතට අනතුරුව නොලැබියහැකි හෙයින් දිව්‍යමයවූද, මානුෂ්‍යවූද, පස්කම් ගුණ කාලික වෙත්; සිතට අනතුරුව ලැබිය හැකි නිසා ලොව්තුරු දහම් සන්දිට්ඨිකයි; පස්කම්ගුණ එකතුවූ කල්හිද සම්පූර්ණ කාමියාටත් සිතූසිතට අනතුරුව කැමති කැමති අරමුණු අනුභවකිරීම් සම්පාදන නොවේ; චක්ෂුර්ද්වාරයෙහි ඉෂ්ටාරම්මණයක් (ඇසට ප්‍රියරූපයක්) අනුභවකරණු කැමැත්තහු විසින් සිත්තරු, පොත්තරු, රූකරු ආදීන් කැඳවා මෙනම් රූපයක් සාදව් කියයුතුවේ; මේ අතරතුර අනෙකකොටිසහස්‍ර සිත් ඉපදී නිරුද්ධවෙත්; ඊට පසුව ඒ අරමුණ ලැබෙන්නේය; ශ්‍රොත්‍රද්වාරාදියෙහි ඉෂ්ටාරම්මණ අනුභවයද මෙසේ කල්ගතවී ලැබෙනබව දතයුතුයි.

## ලොකොත්තරධර්ම අකාලිකබව.

ශ්‍රොතාපත්තිමාර්ග සිතට අනතුරුවම සොතාපත්තිඵලයම උපදියි; මාර්ගචිත්තයට අනන්තරවම අන්‍ය චිත්තොත්පත්තියකට වාරයක් නැති; සකෘදාගාමිඵල-අනාගාමි-අර්හත්ඵල ලැබීමෙහිද මේ ක්‍රමය නිසා තමන්ගේ පලදීම සඳහා මාර්ගසිතට කලක් නැති හෙයින් අකාලිකබව කීය.

**26.** iii. **භාවශ**:-

**පඤ්චස්කන්ධයට ඥාතපරිඥා, තීරණපරිඥා, ප්‍රහාණ පරිඥා** යනමේ ත්‍රිවිධ පිරිසිඳිනුවතින් දූන ආඛ්‍යාතව්‍ය (ප්‍රකාශකටයුතු) පුද්ගලයෙකු, එනම්= යම්කිසි නාමගොත්‍රයකින් කිවයුත්තෙක් නොදකියි; ක්ෂීණාශ්‍රවයාට ඒ සත්වපුද්ගලාදී මඤ්ඤනාහෙතුව නොවේද එහෙයිනි.

යම්විදියකින් මෙසේ රාගරක්තය, ද්වෙෂදුෂ්ටය, මොහමූළ්හය කියා කිසිවෙකින් රහතුන්ට කියන්නේනම් ඒ කාරණය රහතුන් සම්බන්ධ නොවෙයි; යක්ෂය! (දෙවතාව)යම්විධියකින් මෙබඳු ක්ෂීණාශ්‍රවයෙකු දන්නෙහිනම් කියවයි වදාළකල්හි ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! නුඹවහන්සේගේ සංක්ෂිප්තභාෂිතයාගේ විස්තරාර්ථ නොදනිම්, භගවත් වදාළ භාෂිතයාගේ විස්තරාර්ථ දැනගතහැකි සේ වදාරන්නේනම් මැනවැයි ආරාධිත භාග්‍යවතුන් **"සමො විශෙසි"** යන ගය වදාළසේක.

**27**. යමෙක් සමවූද, විශිෂ්ටවූද, නිහීනවූද ගුණ ඇත්තෙම්'යි මානමඤ්ඤනාවෙන් කල්පනාකරයි නම් ඒ පුද්ගලතෙම නවවැදෑරුම් මාන කාරණකොටගෙන යම්කිසිවෙකු සමග විවාදකරන්

නේය; තෝ කුමකින් මට කිට්ටුවන්නෙහිද? ජාතිභෙදයෙන්ද, ගොත්‍රයෙන්ද, කුලයෙන්ද, හැඩහුරුකමෙන්ද, බහුශ්‍රුතබැවින්ද, ධුතගුණයෙන්දැයි කියායි. "**තිස්සො ඉමා භික්ඛවෙ විධා, කතමා තිස්සො, සෙය්‍යොහමස්මීති විධා, සදිසොහමස්මීති විධා, හීනොහමස්මීති විධා**" යි වදාළ ත්‍රිවිධ මානයන්හි නොසෙලෙන්නාවූ යමෙක් වේද, ඒ මානප්‍රහීණ ක්ෂීණාශ්‍රවයාට සම, විශෙෂ, හීන ගුණැත්තෙමියි මානවශයෙන් අදහසක් නොවේ; යක්ෂය! දන්නෙහි නම් කියවයි වදළත් නොවැටහුනු දෙවතාවා නැවතත් විස්තර යාඥා කළ හෙයින් "**පහාසි සඞ්ඛං**" යන ගාථාවත් වදළා සේක.

**28. රතෙනා, දුමටඨා, මූළ්හා** යනමේ ප්‍රඥප්තිය යම් ක්ෂීණාශ්‍රවකෙනෙක් දුරුකෙළේද? මානයට නොහොත් මච්කුසට නොපැමිණෙන්නේද? මේ නාමරූප දෙකේ තණ්හාව සින්දේද, කෙලෙස් ගැට සතර සුන්කළ නිදුක්වූ ආසානැත්තාවූ ඒ රහතුන්වහන්සේ කාබුන් මරණින්මතු උපදින තැනක් හෝ උපන් තැනක් හෝ සොයන්නාවූ දෙවියෝද, මනුෂ්‍යයෝද මෙලොව හෝ පරලොව හෝ ස්වර්ගයන්හි හෝ සත්ත්වනිවෙසන සියල්ලෙහි හෝ කොතනකවත් නොලබත්, නොදකිත්; යක්ෂය! දූන් දන්නෙහිනම් කියවයි මේ ගාථාවෙන්ද **සාන්දෘෂ්ටික ලොකොත්තර ධර්මයම** කථිත කල්හි භාග්‍යවත් වදළ සංඛිත්ත දෙශනාර්ථ මෙසේ දැනගතිම්යි "**පාපං න කයිරා**" යන ගාථාව දෙවිදූ කීවාය.

**29.** වාග්වාරයෙන් චතුර්විධ දුශ්චරිතයද, මනොවාරයෙන් ත්‍රිවිධ දුශ්චරිතයද, කයින් හෝ කිසිදුසිරිතක් (ප්‍රාණඝාතාදී තුනද) නොකරන්නේය; මුළුලොකයෙහි සියලු කාමයන් (කාමසුඛල්ලිකානුයොගය)හැර සමෘතිමත්වූ සම්‍යක්ප්‍රඥ ඇත්තාවූ පුද්ගලතෙම අනර්ථසහගතවූ දුක් (අත්තකිලමථානුයොගය) සෙවනය නොකරන්නේය; අන්තදෙක හැර කාරණාවූ සතිසම්පජඤ්ඤයන් සමග දශකුශලපථ ධර්මය ඔබවිසින් වදළලෙස දනිම්'යි කියයි. අෂ්ටාඞ්ගිකමාර්ග වශයෙන් මේතය වේ; ඒ තපොදරාමයෙහි මහත්වූ ධර්මදෙශනාවක් විය; දෙශනාවේ අවසානයෙහි දෙවතාවා සිටිතැනම සිටගෙණ දෙශනානුසාරයෙන් ඥාණපෙසනයකොට සෝවාන්පෙලේ පිහිටා තමාලැබූ අවහිමග දක්වමින් මේ ගාථාව කීය:= "**වචසා**" යන පදයෙන් සම්‍යක්වචනය ගැණේ; මනස මාර්ගාඞ්ගයක් නොවන නිසා "**මනසා**" යනුවෙන් මාර්ගසම්ප්‍රයුක්ත සිත ගන්නාලදී. "**කායෙනවා කිඤ්චනං සබ්බලොකෙ**" යන්නෙන් සම්මාකම්මන්තය ගන්නාලදී; ආජීවය වනාහි වාචාකම්මන්ත පාක්ෂිකත්වයෙන් ගත්තේමය; "**සතිමා**" යන්නෙන් ව්‍යායාම

සම්‍යක්සමාධි ගත්තෝය; **"සම්පජානො"** යන පදයෙන් සම්‍යක් දෘෂ්ටි සම්‍යක්සංකල්ප ගත්හ; "කාමෙපහාය දුක්ඛං න සෙවෙථ" යන දෙපදයෙන් අන්තදෙක හැරීමයි කියා මේ අන්තදෙකට නොපැමිණ ඔබවිසින් වදාළ මැදුම් පිළිපැදුම දනිම්යි තථාගතයන් ගඳමල් ආදියෙන් පුදා ප්‍රදක්ෂිණාකොට ගියාය.

v. **ප්‍රකටීකරණාර්ථ:-**

**1. අක්ඛෙය්‍ය, 2. පරිඤ්ඤා, 3. සංඛං, 4. නාමරූප, 5. ගන්ථ,** පදප්‍රකටීකරණය - සහ - **6. භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො, 7. අනික්කීළිතාවී කාමෙසු, 8. මා සන්දිට්ඨිකං හිත්වා, 9. බහුදුක්ඛා, 10. සන්දිට්ඨිකො අයං ධම්මො, 11. අකාලිකො, 12. එහිපස්සිකො 13. ඔපනයිකො, 14. පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි** යන පද විස්තරයද ගතයුතුයි.

**අක්ඛෙය්‍ය සඤ්ඤිනො**-දිව්‍ය, මනුෂ්‍ය, ගෘහස්ථ, ප්‍රව්‍රජිත ආදී ක්‍රමයෙන් අක්ඛෙය්‍ය හෙයින්ද, සර්වකථා ව්‍යවහාරයන්ට වස්තුභූත හෙයින්ද, පඤ්චස්කන්ධයන්ට අක්ඛෙය්‍යයයි කියති, නර පොස පුරිස ඉත්‍ථි සත්ත්ව පුද්ගලාදී සංඥා මොවුන්ට ඇත්තුයි සංඥින් වෙත්. අක්ඛෙය්‍ය විෂයෙහිම සංඥා ඇත්තෝනුයිද **අක්ඛෙය්‍ය සඤ්ඤිනො**= පඤ්චස්කන්ධයන්හි සත්ත්වපුද්ගලාදී සංඥා ඇති යන අර්ථයි. පියවි කථා නාමයි.

**අක්ඛෙය්‍යස්මිං පතිට්ඨිතා:-** පඤ්චස්කන්ධයන් කෙරෙහි අෂ්ටාකාරයකින් ප්‍රතිෂ්ඨිතයි; රක්තයා රාගවශයෙන්ද, දුෂ්ටයා වෙෂ වශයෙන්ද, මූඪයා මොහවශයෙන්ද, පරාමෘෂ්ටයා දෘෂ්ටිවශයෙන්ද, ස්ථාමගතයා අනුශය වශයෙන්ද, විනිබද්ධයා මානවශයෙන්ද, අනිෂ්ඨගතයා විචිකිත්සා වශයෙන්ද, වික්ෂෙපගතයා ඖද්ධත්‍ය වශයෙන්ද යන මෙකී ආකාරයන්ගේ වශයෙනි.

**අක්ඛෙය්‍යං අපරිඤ්ඤාය:—** යනු පඤ්චස්කන්ධය ත්‍රිවිධප්‍රඥවෙන් නොපිරිසිඳ දැන යනුයි.

**යොගමායන්ති මච්චුනො:—** මෘත්‍යුහුගේ යොග, ප්‍රයොග, ප්‍රක්ෂෙප, උක්ෂෙප, උපක්‍රම අභ්‍යන්තරයට එති. මාරවශයට එත් යන තේරුමයි.

**පරිඤ්ඤාය:—** ඤාතපරිඤ්ඤා, තීරණපරිඤ්ඤා, පහාන පරිඤ්ඤා යනමේ පිරිසිඳීම් තුනෙන් දැන යන අදහසයි. එහි ඤාතපරිඤ්ඤා කවරීද? පස්කඳින් පිරිසිඳ දනියි. මේ රූකඳ මේ වෙන්කඳ, මේ සන්කඳ, මේ සකරකඳ,

මේ විඤ්ඤාතකද වේ; මොව්හු ඒ ස්කන්දයන්ගේ ලකුණුය, රස කිසය, සමීප තැනය, පිහිටන තැනය කියායි; මේ ඤාත පරිඥා වේ.

තීරණපරිඥා තොමෝ කවරිද? මෙසේ පඤ්චස්කන්ධ ලක්ෂණ, රස, ප්‍රත්‍යුපස්ථාන පදස්ථානවශයෙන් විදිතකොට තීරණය කරයි. 1. අනිත්‍ය, 2. දුක්ඛ, 3. රොග, 4. ගණ්ඩ, 5. සල්ල, 6. අඝ, 7. ආබාධ, 8. පර, 9. පලොක, 10. ඊති, 11. උපද්දව, 12. භය, 13. උපසග්ග, 14. චල, 15. පභඞ්ගු, 16. අධුව, 17. අත්තාන, 18. අලෙණ, 19. අසරණ, 20. රිත්ත, 21. තුච්ඡ, 22. සුඤ්ඤ, 23. අනත්ත, 24. ආදීනව, 25. විපරිනාම ධම්ම, 26. අසාරක, 27. අඝමූල, 28. වධක, 29. විභව, 30. සාසව, 31. සඞ්ඛත, 32. මාරාමිස, 33. ජාති ධම්ම, 34. ජරාධම්ම, 35. ව්‍යාධිධම්ම, 36. මරණධම්ම, 37. සොකධම්ම, 38. පරිදෙවධම්ම, 39. උපායාසධම්ම, 40. සංකිලෙසධම්ම, 41. අසරණීභූත, 42. ආදීනව වශයෙන්දැයි දෙසාලිස් ආකාරයෙනි.

## චත්තාලීසාකාරය.

1. එකෙකං ඛන්ධං අනිච්චන්තිකතාය ආදිඅන්තවන්තතායච අනිච්චතො, 2. උප්පාදවයපටිපීළනතාය දුක්ඛවත්ථුතායච දුක්ඛතො, 3. පච්චයයාපනීයතාය රොගමූලතායච රොගතො, 4. දුක්ඛතාසූලයොගිතාය කිලෙසාසුචිපග්ඝරණතාය උප්පාදජරාභඞ්ගෙහි උද්ධුමාතපරිපක්කපභින්නතායච ගණ්ඩතො, 5. පීළාජනකතාය අන්තොතුදනතාය දුන්නීහරණීයතායච සල්ලතො, 6. විගරහණීයතාය අවඩ්ඪිආවහනතාය අඝවත්ථුතායච අඝතො, 7. අසෙරිභාවජනකතාය ආබාධපදට්ඨානතායච ආබාධතො, 8. අවසතාය අවිධෙය්‍යතාය පරතො, 9. ව්‍යාධිජරාමරණෙහි පලුජ්ජනතාය පලොකතො, 10. අනෙකව්‍යසනාවහනතාය ඊතිතො, 11. අවිදිතානංයෙව විපුලානං අනත්ථානං ආවහනතො සබ්බුපද්දවවත්ථුතායච උපද්දවතො 12. සබ්බභයානං ආකරතාය දුක්ඛවූපසමසඞ්ඛාතස්ස පරමස්සාසස්ස පටිපක්ඛභූතතායච භයතො, 13. අනෙකෙහි අනත්ථෙහි අනුබද්ධතාය දොසූපසට්ඨතාය උපසග්ගොවිය අනධිවාසනාරහතායච උපසග්ගතො, 14 ව්‍යාධිජරාමරණෙහිචෙව ලාභාදීහිච ලොකධම්මෙහි පචලිතතාය චලතො. 15 උපක්කමෙනචෙව සරසෙනච පභඞ්ගුපගමනසීලතායච පභඞ්ගුතො, 16. සබ්බාවත්ථානිපාතිතාය ථිරභාවස්සච අභාවතාය අධුවතො, 17. අතායනතායචෙව අලබ්භනෙය්‍යඛෙමතායච අත්තාණතො, 18 අල්ලීයිතුං අනරහතාය අල්ලීනානම්පිච ලෙණකිච්චාකාරිතාය අලෙණතො, 19. නිස්සිතානං භයසාරකත්තාභාවෙන අසරණතො, 20. යථාපරිකප්පිතෙහි ධුව

සුභසුඛත්තභාවෙහි රිත්තතාය රිත්තතො, 21. රිත්තතායෙව තුච්ඡතො, අප්පකත්තාවා අප්පකම්පිහි ලොකෙ තුච්ඡන්ති වුච්චති. 22. සාමි නිවාසී කාරකවෙදක අධිට්ඨායකවිරහිතතායසුඤ්ඤතො, 23. සයංච අස්සාමික භාවාදිතාය අනත්තතො, 24. පවත්ති දුක්ඛතාය දුක්ඛස්සච ආදීනවතාය ආදීනවතො. (අථවා) ආදීනං වාති ගච්ඡති පවත්තතීති=ආදීනවො, කපනමනුස්සස්සෙතං අධිවචනං, ඛන්ධාපිච කපනායෙවාති ආදීනව සදිසතාය ආදීනවතො, 25. ජරායචෙව මරණෙනචාති වෙධා පරිණාම පකතිතාය විපරිණාම ධම්මතො, 26. දුබ්බලතාය ඵෙග්ගුවිය සුඛභඤ්ජනීයතායච අසාරතො, 27. අඝහෙතුතාය අඝමූලතො, 28. මිත්තමුඛසපත්තොවිය විස්සාසඝාතිතාය වධකතො, 29. විගතභවතාය විභවසම්භූතතායච විභවතො, 30. ආසවපදට්ඨානතාය සාසවතො, 31. හෙතුපච්චයෙහි අභිසඞ්ඛතතාය සඞ්ඛතතො, 32. මච්චුමාර කිලෙසමාරානං ආමිසභූතතාය මාරාමිසතො. 33. ජාතිජරා ව්‍යාධිමරණපකතිතාය ජාතිධම්මතො, 34. ජරාධම්මතො, 35. ව්‍යාධි ධම්මතො. 36. මරණධම්මතො, 37. සොකහෙතුතාය සොකධම්මතො, 38. පරිදෙවහෙතුතාය පරිදෙව ධම්මතො, 39. උපායාස හෙතුතාය උපායාස ධම්මතො, 40. තණ්හාදිට්ඨි දුච්චරිත සංකිලෙසානං විසය ධම්මතාය සංකිලෙසිකධම්මතො, 41. අසරණීභූතතො, 42. ආදිත්තවතොති යි; මෙසේ ප්‍රභෙද වශයෙන් දක්වනලද දෙසාළිස් (42) ආකාර අනිත්‍යාදිය සම්මසනවශයෙන් සම්මර්ශනයකෙරේ; මෙහි අනිත්‍ය, පලොක, චල, පභඞ්ගු, අද්ධුව, විපරිනාමධම්ම. අසාරක, විභව, සඞ්ඛත, මරණධම්ම දැයි එක එක ස්කන්ධයෙහි දසය දසය බැගින් අනිත්‍යානුපස්සනා පණසක් වෙත්; පර, රිත්ත, තුච්ඡ, සුඤ්ඤ, අනත්ත, වශයෙන්ද එක එක ස්කන්ධයෙහි පස පස කොට අනත්තානුපස්සනා විසිපහක් වෙත්.

සෙසු දුක්ඛාදී විසිපහ එක එක ස්කන්ධයෙහි විසිපහ බැගින් එක්සිය පස්විසි අනිත්‍යානුපස්සනා කෙනෙක් වෙත්.

**පහාණපරිඤ්ඤා කවරීද?** මෙසේ තීරණකොට අග්‍රමාර්ගයෙන් පඤ්චස්කන්ධයෙහි ඡන්දරාගය දුරුකරයි; මේප්‍රහාණපරිඥනම්.

**අක්ඛාතාරං න මඤ්ඤති**-මෙසේ ත්‍රිවිධ පරිඥවන්ගෙන් පඤ්චස්කන්ධය පිරිසිඳ දැන ක්ෂීණාශ්‍රවතෙමේ ආඛ්‍යාතෘ (කිව යුතු) පුද්ගලයෙක් නොහඟියි. "**අක්ඛාතාරං**"යනු කර්ම වශයෙන් කාරකය දතයුතුයි, අඛ්‍යාතව්‍ය, කථෙතව්‍ය පුද්ගලයෙක් මන්‍ය නොකරයි; නොදකියි යන අර්ථවේ. කුමැයි කිවයුතුද? තිස්සාදී යම්කිසි නමකින් හෝ ගොතකින් ප්‍රකාශකළ යුත්තෙක් නොදකියි.

**පහාසි සඞ්ඛං**-"පටිසඞ්ඛායොනිසො ආහාරං ආහරති"යනාදියෙහි ප්‍රඥවට"**සඞ්ඛා**"යයි ආවාය; "**අපි පන කොචි ගණකො වා මුද්දිකො වා සඞ්ඛායිකො වා යොප හොති ගඞ්ගාය වාලිකං ගණෙතුං**" යන මෙහි ගණනාවයි; "**සඤ්ඤා නිදානා හි පපඤ්චසඞ්ඛා**"යන ආදියෙහි කොට්ඨාසයයි; "යා තෙසං තෙසං ධම්මානං සඞ්ඛා සමඤ්ඤා"යන මෙහි ප්‍රඥප්ති "සඞ්ඛා" නමින් ආවාය, මෙහිද මේ ප්‍රඥප්තියම අභිප්‍රෙතයි; "පහාසි සඞ්ඛං" යනපදයට මේ අර්ථයි, රත්තො-දුට්ඨො-මුළ්හො- යන මේ ප්‍රඥප්තිය ක්ෂීණාශ්‍රවයන් වහන්සේ ජහන පජහන කෙළේයි.

**නාමරූප**-නැමීම ලක්ෂණකොට ඇති වෙදනා, සංඥා, සංස්කාර, විඥාන සතර නාමවෙත්; රූපනය ශීත උෂ්ණාදියෙන් විනාශවන රූපස්කන්ධය (දශීත විෂය රූපය) රූප නම්වේ.

**ගන්ථ** (ග්‍රන්ථ) ගැට හතරයි; කාම, භව, දිට්ඨි, අවිජ්ජා යන මොහුයි.

**අනික්කීළිතාවී කාමෙසු**:-කාමයන්හි අකෘත ක්‍රීඩා ඇත්තේ, නොකෙළි කම්කෙළි ඇත්තේ යනුයි.

**මා සන්දිට්ඨිකං හිත්වා-සන්දිට්ඨං අරහතීති, සයං දට්ඨබ්බො වා=සන්දිට්ඨිකො**; තමාට පෙණෙනදේ හැරදමා බෙහෙවින් සත්‍ව දශීත නැති ඒ අවිතරාගී පරසිත් නොදන්නා දෙවතාවෝ භික්ෂූන් දසවසක්, විසිවසක්, හැටවසක් පිරිසිදු නොකඩවූ (අඛණ්ඩ) බඹසර හැසිරෙනු දුක මේ මහණහු මිනිස් පස්කම්ගුණ අත්හැර දිව්‍යකාම ප්‍රාර්ථනාවෙන් මහණදම් කරත්යයි සංඥ උපදවත්; මෑත් එසේම සිතක් උපදවා මිනිස්කාමයන් සාන්‍දෘෂ්ටික වශයෙන් සිතා දිව්‍ය කාමයන් කාලිකකොට මෙසේ කීය.

**අකාලිකො**-කල්නොයවා පලදෙන්නේය;

**එහිපස්සිකො**-විද්‍යමානහෙයින්ද, පිරිසිදු හෙයින්ද එවබලව කිවයුතු;

**ඔපනයිකො**-උපනයනයට සෑහෙයි, ඇවිලගත් සළුවක් හෝ ගිනිගත් හිස හෝ නොබලා තමසිතේ එළවා තබන්නට වටී.

**පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි**-සියලු නුවනැත්තන් විසින් තමන් තමන් කෙරෙහිලා දතයුතුයි.

——:——

## 2. 10. සමිද්ධි සූත්‍රප්‍රදීපයයි.

——:——

දෙවෙනි නන්‍දන වගයි-තස්සුද්දානං.

නන්‍දනා නන්‍දතිචෙව-නත්ථිපුත්තසමෙන ඛත්තියො සනනිකායො,
නිද්දා තන්‍දිච කුම්මො ච-හිරියා කුටියෙන ච දසමො සමිද්ධිචෙව.

——:——

1. සත්තියා විය ඔමට්ඨො-ඩය්හමානො'ව මත්ථකෙ,
කාමරාගප්පහාණාය-සතො භික්ඛු පරිබ්බජෙ.

2. සත්තියා විය ඔමට්ඨො-ඩය්හමානො'ව මත්ථකෙ,
සක්කායදිට්ඨිප්පහාණාය-සතො භික්ඛු පරිබ්බජෙ'ති.

---

## 3 - 1 - ( 1 - 2 )

i. **මාතෘකා:-**

**කාමරාග ප්‍රහාණය සහ සක්කාය දිට්ඨි ප්‍රහාණය.**

ii. **පිණ්ඩාර්ථය:-**

ඇණුනු උල අදින්නාක්මෙන්ද, හිස ගිනිගත්තාක්මෙන්ද, කාමරාගය හා සක්කාය දිට්ඨිය දුරුකළයුතුබව.

iii. **භාවය:-**

1. එකතොධාරදී ශස්ත්‍රයකින් මත්තෙහි සිට අධොමුඛ කොට පහරගසනු ලැබුවෙක්මෙන්ද, හිස ගිනිගත්තෙක්මෙන්ද, පටන්ගත් වීර්‍ය්‍යයෙන්යුත් සිහි ඇති මහණතෙම කාමරාගප්‍රහාණය පිණිස අප්‍රමාද විහරණය කරන්නේය.

2 එබඳුවූම යොගාවචරතෙම සත්කායදෘෂ්ටිය සොවාන් මගින් සමුච්ඡෙද ප්‍රහාණය කිරීම පිණිස සමෘති සමපන්නව පරාක්‍රම කරමින් වාසය කරන්නේය.

iv. **අනුවාදය:—**

**ඔමට්ඨ, උම්මට්ඨ, මඨ, විමඨ,** යන සැත් පහර සතරින් ඉතා දරුණු "ඔමට්ඨ" ප්‍රහාරයයි; උදුරන්ට අමාරු උලයි; පිළියමද දුෂ්කරයි; අනන්තදෝෂයි; ලේ සැරව ඇතුළතම වේ; ලේ සැරව පිටනොවී ව්‍රණමුඛය වැහෙයි; ලේ සැරව පිටකරන්ට ඇදේ බැඳ ඔළුව පාතට හැරවිය යුතුයි.

මෙයින් නොමැරුණොත් මරණය සමාන දුකට පමුණුවයි; මෙබඳු උලක් ඇණුනු පුරුෂයෙක් ව්‍රණචිකිත්සා පිණිස වැයම් කරන්නේ යම්සේද? මස්තකය දැවෙනකල්හි ආදීප්ත ශීර්ෂඇත්තේ එය නිවීමට යම්සේ උත්සාහ කරන්නේද? එසේම භික්ෂුතෙම

ඡාමරාගය දුරුකොට සිහිඇතිව අප්‍රමත්තව විහරණය කරන්නේ යයි දෙවතාවා කීකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙසේ සිතා වදාළේය;- මේ දෙවතාවාවිසින් උපමාවනම් දැඩිකොට ගෙනාය, උපමේයාර්ථය වනාහි පරිත්තග්‍රහණයෙන් සිටියි; පුන පුනා කිවත් මෝ කාමරාග විෂ්කම්භණ ප්‍රහාණයම කියන්නීය; කාමරාගය තෙමේ මාර්ගඥානයෙන් සමුද්ඝාටනය නොවනතෙක් අනුබන්ධම වෙයි; මෙසේ උපමාව ගෙණ ප්‍රථම මාර්ගවශයෙන් දෙශනාව පෙරළා දක්වමින් දෙවෙනි ගාථාව වදාළසේක.

**ශබ්දවිවරණාර්ථ:—**

**කාමරාගප්පහානාය:**-කාම වස්තූන්ට ආසාකරණ ගතිය සකෘදාගාමී මාර්ගයෙන් තුනීකිරීම විනා සමුච්ඡේද ප්‍රහාණය නොවේ.

**සක්කායදිට්ඨිප්පහාණාය:**-විංශති වස්තුක සක්කායදිට්ඨිය සෝවාන් මාර්ගයෙන් සමුච්ඡේද (මුල්සිඳ) ප්‍රහාණකරයි; ඒ සක්කාය දිට්ඨිප්‍රහාණය නොකර කාමරාගය විෂ්කම්භන කිරීම ප්‍රතික්ෂෙප කොට වදාළ තැනකි.

——:——

## 3. 1. සත්ති සූත්‍රප්‍රදීපයයි.

——:——

3. නා'ඵුසන්තං ඵුසති-ඵුසන්තං ච තතො ඵුසෙ,
තස්මා ඵුසන්තං ඵුසති-අප්පදුට්ඨප්පදොසිනං.

4. යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති
සුද්ධස්ස පොසස්ස අනඞ්ගණස්ස,
තමෙව බාලං පච්චෙති පාපං
සුඛුමො රජො පටිවාතං'ව ඛිත්තො'ති.

---

3 - 2 - ( 3 - 4. )

i, **මාතෘකා:-**

**නො කළ දේ පල නො දේ, කළ දේ පල දේ.**

ii, **පිණ්ඩාර්ථය:-**

නිරපරධීන්ට කරණ අපරධය හුලං හමන පැත්තට දමා ගසනලද ධූලිරැසක් මෙන් ආපසු තමාකරම විපාකවශයෙන් එන්නේය; අනුන්ට කළදේ තමූන්ට පලදේ; පව්කළ මෝඩයාට මෙලොවදී හෝ පරලොවදී පාපවිපාක විඳින්නට වේ.

iii. **භාවය:-**

3. කර්මස්පර්ශ නොකරන්නහු විපාකස්පර්ශ නොකරයි. කර්මයම හෝ නොපහස්නහුට කර්මය නොපහස්නේය; කර්මය වනාහි අකාරකයෙක් කාරකයෙක් නොකරයි; එහෙයින් කර්මය තැවරුණ හුට විපාකයද තැවරෙයි; කර්මයම හෝ කර්මකාරයාට ලඟාවෙයි, පහස්නහු පහසියි; කර්ම නොකරන්නාහට විපාකයක් නැත්තේය; කර්මකාරයාටම විපාක ඇත්තේය; මේ "කර්මවිවාද"නම් වේ. එහෙයින් අප්‍රදුෂ්ට ශුද්ධ පුද්ගලයන්ට උපඝාත කරන්නාවූ එසේ ස්පර්ශ කරන්නාවූ පුඟුලා කර්මය හෝ විපාකය ස්පර්ශ කෙරේ.

4. යම්කිසි පුද්ගලයෙක්තෙම තමාටවත් අනුන්ටවත් අපරධ යක් නැති පිරිසිදු නිකෙලශීවූ නරපුරුෂ සඞ්ඛ්‍යාත පුද්ගලයෙකුට අපරධ කෙරේද, ඔහුවිසින් කරණලද ඒ පාපකර්මය උඩුසුලඟට දමනලද සියුම් රජස් මෙන් ඒ බාලයා කරම පෙරළා පැමිණෙයි.

**අනුවාදය:-**

අනුන්ට උපඝාතකරන්ට හැකි වූවත් නොහැකි වූවත් ආත්මය වනාහි උතුමන්ට වෛෂ කළ අපරධකාරයාවිසින් සතර අපායෙහි තැබුවේ නම් වේ; විදි ඊතලය වැරදුනත් අපාය නො වැරදෙයි.

———:———

3. 2. ඵුසන්ත සූත්‍රප්‍රදීපයයි.

———:———

5. අන්තො ජටා බහි ජටා-ජටාය ජටිතා පජා,
තං තං ගොතම පුච්ඡාමි-කො ඉමං විජටයෙ ජට'න්ති.

6. සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො-චිත්තං පඤ්ඤං
ච භාවයං,
ආතාපී නිපකො භික්ඛු-සො ඉමං විජටයෙ ජටං.

7. යෙසං රාගො ච දොසො ච-අවිජ්ජා ච විරාජිතා,
ඛීණාසවා අරහන්තො-තෙසං විජටිතා ජටා.

8. යත්ථ නාමඤ්ච රූපං ච-අසෙසං උපරුජ්ඣති,
පටිඝං රූපසඤ්ඤා ච-එත්ථෙසා ඡිජ්ජතෙ ජටා'ති.

---

**3 – 3 – (5 – 6 – 7 – 8,)**

i. **මාතෘකා:-**

**අවුල හා නිරවුල; අවුල සින්දවුන් හා සිඳෙන තැන.**

ii. **පිණ්ඩාර්ථය:-**

රහත් වීම තෙක් අවුලයි; රහත්වූ පසු අවුල හැරෙයි; අවුල කැපීමට සීලයෙහි පිහිටිය යුතුයි; කර්මජ ත්‍රිහෙතුක ප්‍රතිසන්ධිප්‍රඥව සමාධි-විදර්ශනාදෙකට මුලයි; වීර්‍ය්‍යත් පාරිහාරිය ප්‍රඥවත් තෘෂ්ණා පඳුරු කැපීමට බලය වේ; තෘෂ්ණාව ජටාවයි; නිර්වාණය නිර්ජටාවයි.

**සපඤ්ඤො, පඤ්ඤං, නිපකො**, යන පද තුනෙන් කියූ **ජාති ප්‍රඥා, විදර්ශනා ප්‍රඥා, පාරිහාරිය ප්‍රඥා** නමින් තුනක් වෙත්. ස්ව පරික්ඛාර, ස්වආත්මභාව, අජ්ඣත්තිකායතන, **අන්තොජටායි**. පරපරික්ඛාර, පරආත්මභාව, බාහිරායතන **බහිජටායි**; රූපාදී අර මුණුවල උඩුයටිව උපදින තණ්හාජාලිනියට ජටානාමය වේ. සත්ව නිකාය සඞ්ඛ්‍යාත ප්‍රජාව තෘෂ්ණාඅවුලේ පටලැවී සිටී; මේ තුන්ලෝ ඔතා ගොතා සිටි ජටා විජටනය කරන්නා කවිද? සිල්වත් නුවණැති එකඟ සිතින් වීර්‍ය්‍යවඩන තැනට ඔබින ප්‍රඥවෙන් භාවනා කරණ යොගාවචර මහණතෙම ජටා විජටනය කරන්නේ වේ.

උපමාව කවරීදයත්?-යම්බඳු පුරුෂයෙක් භූමියෙහි සිටගත ගලක මනාසේ තියුණු (මුවහත්) කළ ශස්ත්‍රයක් අතින් ඔසවා මහත් උණපඳුරක් කපා හෙලන්නේද එමෙන්, ජාති ප්‍රඥාදියෙන් සමන්නාගතවූ භික්ෂුකෙනෙක් චතුපාරිශුද්ධි සීල යෙහි පිහිටා සමාධිගලේ තියුණුකළ විදර්ශනාප්‍රඥශස්ත්‍රය වීර්‍ය්‍යබල යෙන් දැඩිකොටගත් පාරිහාරිය ප්‍රඥ අතින් ඉහළ නගා තම සන්තතිහි සිටි සියලු තෘෂ්ණාජටාව අවුල්හරින්නේය, කපන්නේය

පළාදමන්නේය, කියායි; මෙයින් ශෛක්‍ෂභූමිය කථිතයි; ඊළඟට ජටාවිජටිත ක්‍ෂීණාශ්‍රවයන් වහන්සේ **රාග ද්වේෂ අවිද්‍යා** ප්‍රතිප්‍රශ්‍රබ්ධ ප්‍රහාණය කළබවත්, ජටාවිජටිත අවකාශයවූ නිර්වාණධාතුවෙහි නාමරූපයන්ගේ නිරවශෙෂ වැළහීමත් වදාරණ ලදී.

iii. **භාවය:-**

5. ඇතුළතත් අවුලය, පිටතත් අවුලය, සත්වප්‍රජාව අවුලෙන් පැටලුනාය, ගෞතමයන් වහන්ස! එහෙයින් ඔබ අතින් විචාරමි; කවරෙක් මේ තෘෂ්ණාජටාව නිජේඨනය කරන්නේද? වෙළුම් ලිහන්නේද?

6. සප්‍රාඥවූ කෙලෙස්තවන වීර්‍ය්‍ය ඇති නිපක (මේරූ) නුවනැතිවූ යම් සත්ව කෙනෙක් සිව් පිරිසිදු (චතුපාරිසුද්ධි) සිල්හි පිහිටා සමාධියත් විදර්ශනාවත් වඩන්නේ වේද? ඒ සසර බිය දක්නා පුද්ගලතෙමේ තෘෂ්ණා නමැති අවුල මොනවට සිඳින්නේය.

7. යම් කෙනෙකුන් විසින් රාගයත් ද්වේෂයත් අවිද්‍යාවත් මනාසේ දුරු කළාහුද, ආශ්‍රවක්‍ෂයකළ ඒ රහතුන්වහන්සේලා විසින් තෘෂ්ණා සඞ්ඛ්‍යාත ජටාව ප්‍රදලනය කරණලදී.

8. යම් අවකාශයෙක්හි වේදනාදී අරූපස්කන්ධ සතරත් රූපයත් 'පටිඝ' නම්වූ කාමභවයත් රූප සංඥා සංගෘහිත රූපාරූප භවදෙකක් ඉතුරුනොවී උපරෙධවේද? මේ ත්‍රෛභූමික වෘත්ත පර්‍ය්‍යාදියනස්ථානයෙහි (නිවන් පැමිණි තැනදී) මේ ජටාව සිඳෙයි.

iv. **අනුවාදය -**

**ආතාපී නිපකො:-** යනුවෙන් කී වීර්‍ය්‍යවශයෙන් සතතක්‍රියා ප්‍රඥාවෙන් සම්ප්‍රජානකාරීව සීලයෙහි පිහිටා චිත්ත ප්‍රඥාවශයෙන් කී සමථ විදර්ශනා වැඩියයුතු; මෙයින් වනාහි ත්‍රිශික්‍ෂාද, ත්‍රිවිධ කල්‍යාණ ශාසනයද, ත්‍රිවිද්‍යාතාදීන්ට උපනිශ්‍රයවූ අන්තවය දුරුකරණ මධ්‍යම ප්‍රතිපත්ති සෙවනයන්ද, අපායාදී සමතික්‍රමණ උපායවූ තුන් අයුරකින් ක්ලෙශප්‍රහාණයද, ව්‍යතික්‍රමණාදීන්ට ප්‍රතිපක්‍ෂවූ සංක්ලෙසත්‍රය විශොධනයද, ශ්‍රොතාපත්ති ආදී භාවයට කාරණාද ප්‍රකාශිත වේ.

v. **ප්‍රකටීකරණායි:-**

**අජ්ඣත්තාජටා**-ස්වකීය පරිෂ්කාර ස්වකීය ආත්මභාව අධ්‍යාත්මික ආයතන වශයෙන් තමාගේ පිරිකර ආදියද, තම ශරීරයේ හිසකෙස් ආදියද, ස්වකීය චක්ඛායතන, සොතායතන, ඝාණායතන, ජිව්හායතන, කායායතන, මනායතන පිළිබඳවූද තෘෂ්ණා අවුලයි.

**බහිජටා**:-පරකීය පරිෂ්කාර, පරකීයාත්මභාව, බාහිරායතන වශයෙන් අනුන්ගේ පිරිකර ආදියද; අනුන්ගේ කෙස්, ලොම්, නිය, දත්, සම් ආදියද, රූපායතන, ශබ්දායතන, ගන්ධායතන, රසායතන, ඵස්සායතන, ධම්මායතන පිළිබඳ තෘෂ්ණාජාලයයි.

**සීලෙ පතිට්ඨාය**:-චේතනාශීලය, චෛතසිකශීලය, සංවර ශීලය, අව්‍යතික්‍රමශීලය යන චතුර්විධශීලයෙහි පිහිටීමයි.

**නරෝ සපඤ්ඤෝ**:-අලෝභ, අද්වේෂ, අමෝහ වශයෙන් පැවති පෙරජාතියේ කුශලකර්මවිපාක හේතුවෙන් ප්‍රතිසන්ධියෙන් ලැබුනු ජාතිප්‍රඥාවෙන් යුක්තයායි.

**චිත්තං පඤ්ඤං ච භාවයං**:-කුසල චිත්තඒකාග්‍රතා සමාධිනම්වූ චිත්තචෛතසිකයන් එක අරමුණෙහි සමව මනාකොට තැබීමත්, අනිත්‍යානුපස්සනාදී අටළොස් මහාවිදර්ශනාවෙන් නිත්‍යසංඥාදිය දුරුකිරීමත් භාවනා නම්වේ.

**ආතාපී**:-වීර්‍ය්‍ය ඇත්තේය, කිලෙසයන් අවිගස්වා වේලා දමන හෙයින් උත්සාහයට "ආතාප" නම් වේ; 'ආතාප' ඇත්තේ 'ආතාපී' නම් වේ.

**නිපකො**:-ප්‍රඥාවට "නෙපක්කය"යි කියනු ලැබේ. මෙයින් මේ උද්දේසකාලය මේ පරිපුච්ඡාකාලය යනාදී සර්වකෘත්‍ය පරිනායකවූ **ස්ථානොචිත ප්‍රඥාව** ගැණෙයි.

මෙහි සීලයෙන් අධිශීල ශික්ෂාවද අධිචිත්ත හා අධිප්‍රඥාශික්ෂා වෝද, ශාසනයාගේ ආදි- මධ්‍ය- පර්‍ය්‍යවසාන කල්‍යාණතාවෝද, එයින්ම අවිප්‍රතිසාරාදී ගුණ වහනයද, ඍධිවිධ්‍යාදී ගුණ වහනයද, ඉෂ්ටානිෂ්ටවිෂයෙහි තාදීභාවාවහනයද, ශීලයෙන් ත්‍රිවිද්‍යාවට උපනිශ්‍රයද, සමාධියෙන් ෂඩ්අභිඥාවට උපනිශ්‍රයද, ප්‍රඥාවෙන් ප්‍රතිසම්භිදා ප්‍රභේදයට උපනිශ්‍රයද ප්‍රකාශිතයි.

**කාමසුඛල්ලිකානුයෝග-ආත්මක්ලමථානුයෝග** සඞ්ඛ්‍යාත අන්තවය වර්ජනයද, සමතික්‍රමණ උපායද, මධ්‍යම ප්‍රතිපද් සෙවනයද; එසේම අපාය සමතික්‍රමණ උපායද, කාමධාතුසමතික්‍රමණ උපායද, තදඞ්ගවශයෙන් කෙලෙස් පහකිරීමද, විකැඹුන් වශයෙන් කෙලෙස් පහකිරීමද, සහමුලින් සිඳීම් (සමුච්ඡේද) වශයෙන් ක්ලේශප්‍රහාණයද, ශීලයෙන් ක්ලේශයන්ගේ ව්‍යතික්‍රම ප්‍රතිපක්ෂයද, සමාධියෙන් පර්‍ය්‍යුත්ථාන ප්‍රතිපක්ෂයද, ප්‍රඥායෙන් අනුශය ප්‍රතිපක්ෂයද, දුශ්චරිත සංක්ලේශ විශෝධනයද, තෘෂ්ණා සංක්ලේශ

විසොධනයද, දෘෂ්ටිසංක්ලේශ විශොධනයද, සීලයෙන් සොවාන් සකෘදාගාමීභාවයන්ට හෙතුවද, සමාධියෙන් අනාගාමි භාවහෙතුවද, ප්‍රඥවෙන් අර්හත්වකාරණයද පවසනලදී.

සොවාන් පුද්ගලතෙමේ **ශීලපරිපූරකාරි** වේ. අනාගාමී **සමාධිපරිපූරකාරී** වේ. අර්හත් **ප්‍රඥාපරිපූරකාරී** වේ. මෙසේ ගුණත්‍රික නවයක් (27) ප්‍රකාශිතවෙත්.

**චතුර්විධශීලය**– i. කම්මස්සකතාවෙන් සතුන්නොමැරීමාදියෙන් සත්වැදෑරුම් කර්ම පථවෙතනාද, වත්පිළිවෙත් පිරීමේ සිතිවිලිද වෙතනාශීලය වේ.

ii. ප්‍රාණාතිපාතාදී විරමණ ඇත්තහුගේ විරතියත් අනභිද්‍යා අව්‍යාපාද සම්‍යක්දෘෂ්ටි ධර්මත් **චෛතසිකශීලවේ.**

iii. ප්‍රාතිමොක්ෂ සංවරයද, ස්මෘති සංවරය (ඉන්ද්‍රිය සංවරය)ද. ඥාන සංවරය සහ ප්‍රත්‍යය සංනිශ්‍රිතයද, ශීත උෂ්ණ ක්ෂමතාදී ක්ෂාන්ති සංවරයද, උපන් කාමවිතර්ක අනධිවාසනාදි වීර්‍ය්‍යසංවරයත්, ආජීව පාරිශුද්ධියත් **සංවෘතිශීලවේ.**

iv. සමාදන් සිල්ඇත්තහුගේ කායික වාචසිකයන් නොඉක්මවීම **අව්‍යතික්‍රමශීලයයි.**

—:—

## 3. 3. ජටාවිජටන සූත්‍රප්‍රදීපයයි.

—:—

9\. **යතො යතො මනො නිවාරයෙ-න දුක්ඛමෙති තං තතො තතො,**
**ස සබ්බතො මනො නිවාරයෙ-සබ්බතො දුක්ඛා පමුච්චතී'ති.**

10\. **න සබ්බතො මනො නිවාරයෙ-මනො යතත්තමාගතං,**
**යතො යතො ච පාපකං-තතො තතො මනො නිවාරයෙ'ති.**

---

**3 - 4 - ( 9 - 10 )**

i. **මාතෘකා:-**

9\. **අකුශලයෙන් පමණක් සිත වලක්වා ගතයුතු බව.**

10\. **සංයත භාවයටපත් සිත නොවැලැක්විය යුතුබව.**

**නිවාරණ කළයුතු මනසකුත් ඇත; භාවෙතබ්බ මනස කුත් ඇත.**

ii. **පිණ්ඩාර්ථය:-**

මේ දෙවතාවා කුශලචිත්තය, අකුශලචිත්තය, ලෞකික චිත්තය, ලොකොත්තරචිත්තයයි භෙදයක් නොතකා සිත වැලැක් වියයුතුයයි **අනිශ්‍යාණික කථා** කිය. ඕහට විභාග කොට වදාළ සේක.

iii. **භාවය:-**

9\. යම් යම් පවකින් හෝ පිණකින් සිත වලක්වන්නේද? ඒ ඒ හේතුවෙන් තත් චිත්තනිවාරකයා කරා දුකක් නොපැමිණෙයි; සියල්ලෙන්ම යමෙක් සිත වලක්වන්නේද, හෙතෙම සියලු දුකින් මිදේයයි දෙවතාවා කිය. (හේ අනෛශ්‍යාණික ලබ්ධියකි).

10\. සියල්ලකෙරෙන් සිත නොවළක්වන්නේය; දන්දෙමියි, සිල්රකින්නෙමියි, යන මේ ආදී නයින් සංයතභාවයට පැමිණියාවූ සිත නොම වළහන්නේය; ඒකාන්තයෙන්ම වැඩිය යුතුය; යමකින් යමකින් අකුසල් උපදීද, එයින් එයින් සිත වළක් වන්නේය.

v. **ප්‍රකටීකරණාර්ථ:-**

**යතො යතො ච පාපකං**-යම් යම් කරුණකින් අකුසල් උපදී නම් ඒ ඒ කරුණෙන් පාපචිත්තය නිවාරණය කළයුතුයි.

**මනො යතත්තමාගතං**-සියල්ලෙන් නොවැලක්වියයුතු සිත නම් සංයතභාවයට පැමිණි සිතයි.

——:——

## 3. 4. මනොනිවාරණ සූත්‍රප්‍රදීපයයි.

——:——

11. යො හොති භික්ඛු අරහං කතාවී
ඛීණාසවො අන්තිමදෙහධාරී,
අහං වදාමීති'පි සො වදෙය්‍ය
මමං වදන්තීති'පි සො වදෙය්‍යා'ති

12. යො හොති භික්ඛු අරහං කතාවී
ඛීණාසවො අන්තිමදෙහධාරී,
අහං වදාමීති'පි සො වදෙය්‍ය;
මමං වදන්තීති'පි සො වදෙය්‍ය
ලොකෙ සමඤ්ඤං කුසලො විදිත්වා
වොහාරමත්තෙන ස වොහරෙය්‍යා'ති.

13. යො හොති භික්ඛු අරහං කතාවී
ඛීණාසවො අන්තිමදෙහධාරී,
මානං නු ඛො සො උපගම්ම භික්ඛු
අහං වදාමීති'පි සො වදෙය්‍ය;
මමං වදන්තීති'පි සොවදෙය්‍යා'ති.

14. පහීනමානස්ස න සන්ති ගන්ථා
විධූපිතා මානගන්ථස්ස සබ්බෙ,
ස වීතිවත්තො යමතං* සුමෙධො
අහං වදාමීති'පි සොවදෙය්‍ය,
මමං වදන්තීති'පි සොවදෙය්‍ය;
ලොකෙ සමඤ්ඤං කුසලො විදිත්වා
වොහාරමත්තෙන ස වොහරෙය්‍යා'ති.

---

**8 – 5 – (11 – 12 – 13 - 14.)**

i. **මාතෘකා:—**

**කථාව්‍යවහාර නීතිය සම්මුතිය බව.**

ii. **පිණ්ඩාර්ථය:—**

මමය, මටය යන කථාව රහතුන්ට ගැළපෙන්නේ ලොක ව්‍යවහාරය හෙයිනි; මානවශයෙන් ලොකවාසීන් කියනදේ බැවහාරයෙන් රහතන්වහන්සේලාද කියති.

iii. **භාවය:—**

11. යම් මහණෙක්තෙම සිව්මගින් කොට නිමවූ කටයුතු ඇත්තේ ක්‍ෂයකළ ආශ්‍රව ඇත්තේම චරිම ශරීරය දරන්නේ රහත්කෙනෙක් වේද, හෙතෙම මම කියමියි, සත්තුපලබ්ධිසිත කථා කියන්නේද, මට කියායයි කියන්නේදැයි ඇසිය.

12. රහත්තෙමේ මම කියමි, මට කියයි යනු සත්වඋපලබ්ධි නිශ්‍රිතනොවව්‍යවහාරමාත්‍රයෙන් කියන්නේය. ස්කන්ධධාතු ආයතනාදීන්හි දක්‍ෂවූ ඒ ක්‍ෂීණාශ්‍රවතෙම ලොකව්‍යවහාරය දැන සලකා ව්‍යවහාරමාත්‍රයෙන් කියන්නේයයි වදාළසේක.

---

* 'මඤ්ඤතං' යනුද පාඨාන්තරයි.

13. රහත්වූයේ මානයට පැමිණ අසම්මාන වශයෙන් මමය මටය කියන්නේදැයි ඇසුවාය.

14. අර්හත්මාර්ගයෙන් ප්‍රහීනවූ මාන ඇති රහතුන්වහන්සේට මානග්‍රන්ථි නැත්තාහ; ඔහු විසින් සියලු මානගැට විධ්වංසිත යහ; අර්හත්මාර්ගඥාන අග්නියෙන් දවනලද්දහ; ඒ මේ සුප්‍රාඥවූ අර්හත්තෙම තෘෂ්ණා-දෘෂ්ටි-මාන වශයෙන් ත්‍රිවිධවූ මඤ්ඤනාව ඉක්මවූයේ වෙයි; ස්කන්ධාදීන්හි දක්‍ෂවූ ඒ ක්‍ෂීණාශ්‍රවතෙම ලොකනිරුක්තිය දැන මම කියමියයිද කියන්නේය.

මට කියායයිද කියන්නේය; හෙතෙම මමය මටය යනාදීන් කියන්නේ මානවශයෙන් සත්ත්වූපලබ්ධිනිඃසිත නොව ව්‍යවහාරමාත්‍රයෙන් මමය මටය කියන්නේයයි වදාරණලදී.

iv. අනුවාදය:—

මේ ඇසූ දෙවතාවා වනසණ්ඩවාසිනීය; ආරණ්‍යක භික්‍ෂූන්ගේ මම වළඳමි, මම හිඳිමි, මගේ පාත්‍රය, මගේ සිවුර යනාදී කථාව්‍යවහාරය අසා සිතුවාය; මම මේ භික්‍ෂූහු ක්‍ෂීණාශ්‍රවයෝයයි හඟිමි, ක්‍ෂීණාශ්‍රවයන්ගේ නම් මේ ආකාර සත්ත්වූපලබ්ධිනිශ්‍රිත කථාවේද, නොවේද්‍යෙහෝයි දැනගණිමියි විචාරයි.

v. ප්‍රකරණාර්ථ:—

කතාවි-සතරමාර්ගයෙන් කෘත කෘත්‍ය ඇත්තේ;
සමඤ්ඤං-ලොකනිරුක්තිය ලොකව්‍යවහාරය;
කුසලො-ස්කන්ධාදීන්හි දක්‍ෂවූයේ;

මානං නු ඛො:- ඒ මහණතෙම මානයට උපගතව මාන්නයෙන් කියන්නේදැයි සිතීය. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ මේ දෙවතාවා, ක්‍ෂීණාශ්‍රවයා මානසහිතයෙක් මෙන් කරයි කියා සිතා වදරා රහතුන්ට නවවිධ මානයම නැත ප්‍රහිනයයි දක්වමින් පිළිගය වදාළසේක.

විධූපිතා:—විධමිතයි, පිඹහැරියේය.

මානගන්ථස්ස:—මානයෝද ග්‍රන්ථයෝද මොහුටනුයි, 'මඤ්ඤතං' යනු මඤ්ඤනායයි. තෙවැදෑරුම් තණ්හා, දිට්ඨි, මාන හැඟීමයි. එය ව්‍යතිවර්තිතයි, අතික්‍රාන්තයි.

—:—

## 3. 5. අරහන්ත සූත්‍රප්‍රදීපයයි.

—:—

15. කති ලොකස්මිං පජ්ජොතා-යෙහි ලොකො පකාසති,
භගවන්තං පුට්ඨුමාගම්ම-කථං ජානෙමු තං මය'න්ති.

16. චත්තාරො ලොකෙ පජ්ජොතා-පඤ්චමෙත්ථ න විජ්ජති,
දිවා තපති ආදිච්චො-රත්තිං ආභාති චන්දිමා.

17. අථ අග්ගි දිවාරත්තිං-තත්ථ තත්ථ පකාසති,
සම්බුද්ධො තපතං සෙට්ඨො-එසා ආභා අනුත්තරා'ති.

---

**3 - 6 (15 - 16 - 17)**

i. **මාතෘකා:—**

**පස්වන බැබලීමක් නැතිබව.**

ii. **පිණ්ඩාර්ථය:—**

සූර්‍යයා දහවල් බබලයි, චන්ද්‍රයා රාත්‍රියෙහි බබලයි, ගින්න යම් යම් තැනක දල්වූයේ නම් ඒ ඒ තැන බබලයි. බබලන්නවුන් අතුරෙන් සම්‍යක්සම්බුද්ධතෙම සියල්ලන්ටම වඩා උතුම් වේ. [මේ බුද්ධාලොකය නිරුත්තරයි.]

iii. **භාවය:—**

15. යම් ප්‍රද්‍යෝත වස්තූන් කරණකොටගෙණ ලොකය දීප්‍යමානවේද හෙවත් බබලාද, එබඳු ප්‍රද්‍යෝත වස්තූහු ලොකයෙහි කෙතෙක් වෙත්ද? භාග්‍යවතුන්වහන්සේ (අතින්) විචාරණු සඳහා ඇවිත් සිටිමු; අපි ඒ කාරණය කෙසේ දැනගණිමුද?

16=17. ලොකයෙහි ප්‍රද්‍යෝතවස්තු සතරක් වෙත්; මෙහි පස්වැනි ප්‍රද්‍යෝතවස්තුවක් අවිද්‍යමානයි; සූර්‍යයතෙම දවල් දීප්ත වෙයි; චන්ද්‍රතෙම රාත්‍රියෙහි භාස්වර වෙයි; තවද අග්නිය දිවාරෑ දෙක්හිම යම් යම් තැනක දල්වූයේ නම් ඒ ඒ තන්හි ප්‍රභාස්වර වෙයි; බබලන්නවුන් අතුරෙන් සම්‍යක්සම්බුද්ධතෙම ශ්‍රෙෂ්ඨයි; ඥානාලෝකාදී මේ බුද්ධාලොකය නිරුත්තරයි.

v. **ප්‍රකටීකරණාර්ථය:—**

**එසා ආභා:-** මේ බුද්ධප්‍රභාව, ඕ තවරිදයත්, ඥානාලොකය හෝ වේවා, ප්‍රීත්‍යාලොකය හෝ වේවා, ප්‍රසාදාලොකය හෝ වේවා. ධර්මකථාලොකය හෝ වේවා, බුදුවරයන්ගේ පහලවීමෙන් උපන් සියලු ආලොකයතෙම 'බුද්ධාභා' නම්.

——:——

## 3. 6. පජ්ජොත සූත්‍රප්‍රදීපයයි.

——:——

18. කුතො සරා නිවත්තන්ති-කත්ථ වට්ටං න වත්තති,
කත්ථ නාමඤ්ච රූපඤ්ච-අසෙසං උපරුජ්ඣතීති.

19. යත්ථ ආපො ච පඨවී-තෙජො වායො න ගාධති,
අතො සරා නිවත්තන්ති-එත්ථ වට්ටං න වත්තති;
එත්ථ නාමඤ්ච රූපඤ්ච-අසෙසං උපරුජ්ඣතී'ති.

---

8 - 7 - (18 - 19)

i. **මාතෘකා:—**

**නිර්වාණයෙන් සංසාර ජලාධාර නවතිත්; එහි කෙලෙස් වැසි නැත; නාමරූප අශෙෂයෙන් නිරුද්ධවෙයි, මහාභූත ප්‍රතිෂ්ඨාද නැත.**

ii. **පිණ්ඩාර්ථය:—**

ස්කන්ධ පටිපාටිය නොසිඳ පවත්නා හෙයින් සසර පැවතුම් ජලාධාරයයි කියනලදී. ඒ සංසාරජලාධාරයන් පුරවන හෙයින් කෙලෙස් වැස්සවිය. මහාභූත ප්‍රතිෂ්ඨානොලැබීම නිර්වාණ ලක්‍ෂණයකි. නාමරූපයන්ගේ නිරවශෙෂ නිරොධයත් නිර්වාණයමැයි.

iii. **භාවය:—**

18. සංසාර ජලාධාරයෝ කොතැනින් නවතිත්ද? කොතැන්හි කෙලෙස්වැසි නොවසිද? කොතනදී නාමරූපවය නිරවශෙව නිරුද්ධවේද?

19. යමෙක්හි පඨවිධාතුවත් ආපොධාතුවත් තෙජොධාතුවත් වායොධාතුවත් නොපිහිටාද, මේ නිර්වාණයෙන් සංසාර ජලාධාරයෝ නවතිත්. මෙහි කෙලෙස්වැසි නොවසී. මේ නිර්වාණයෙහි නාමයද රූපයද නිරවශෙෂව නිරුද්ධ වේ.

v. **ප්‍රකවිකරණාර්ථ:-**

**න ගාධති:—** සතරමහාභූතයන්ගේ අප්‍රතිෂ්ඨාකථනයෙන් කාම රූප භවා භාවය සඳර්ශිතයි, තද්ග්‍රහය භවාභාව සඳශිත යෙන් අරූපභවාභාවයද ගම්‍යමාන වේ.

**අතො:—** මේ නිර්වාණයෙන්; නිවණට පැමිණ සංසාර ජලාධාරයෝ නවතිත් යන අදහසයි.

---

## 3. 7. සරනිවත්තන සූත්‍රප්‍රදීපයයි.

---

20. මහද්ධනා මහාභොගා-රට්ඨවන්තො'පි ඛත්තියා,
අඤ්ඤමඤ්ඤා'භි ගිජ්ඣන්ති-කාමෙසු අනලඞ්කතා.

21. තෙසු උස්සුක්කජාතෙසු-භවසොතානුසාරිසු,
කෝ'ධ තණ්හං පජහිංසු-කො ලොකස්මිං අනුස්සුකා'ති.

22. හිත්වා අගාරං පබ්බජිතා-හිත්වා පුත්තං පසුං පියං,
හිත්වා රාගං ච දෙසං ච-අවිජ්ජං ච විරාජිය;
ඛීණාසවා අරහන්තො-තෙ ලොකස්මිං අනුස්සුකා'ති.

---

3 - 8 - (20 - 21 - 22)

i. මාතෘකා:—

ප්‍රව්‍රජිතයෝ පඤ්චකාම උත්සාහ නැත්තෝය.

ii. පිණ්ඩාර්ථය:-

රජවරුන් පඤ්චකාමය ඇතැයි නොසිතත්. රහත්හු පස් කම්සැප විඳීමෙහි ව්‍යාපෘත නොවෙත්.

iii. භාවය:-

20. මහත් ධන ඇති මහත් භොග ඇති රටවල් ඇති ක්‍ෂත්‍රියයෝ පවා කාමයන්හි තෘප්ති නැත්තෝව තවතව සැප ගිජුවෙත්.

21. වෘත්තශ්‍රොතස අනුවයන්තාවූ ඒ රජුන් උත්සුක ජාතවූ කල්හි මේ ලෝකයෙහි කවරහු තෘෂ්ණාව දුරුකළාහුද? ලොකයෙහි කවුරු පඤ්චකාමාසා වශයෙන් අනුත්සුක වූවෝවෙත්ද?

22. ප්‍රියභාර්‍ය්‍යාව හා ගෘහයද, ප්‍රියපුත්‍රයාද, සිව්පාවුන්ද අත්හැර ශාසනයෙහි පැවිදිවූ යමෙක් තුමූ රාගයද, වෙෂයද දුරුකොට අවිද්‍යාවද නසා ක්‍ෂයකළ ආශ්‍රව ඇති රහත්හු වෙත්ද ඒ රහත්හු තුමූ ලොකයෙහි පඤ්චකාමොත්සාහ නැත්තෝ වෙත්.

v. ප්‍රකටීකරණාර්ථ:-

**අඤ්ඤමඤ්ඤාභි ගිජ්ඣන්ති**-ඔව්නොවුන් සැපපතත්; තව තව සැපගිජු වෙත්; කැමති වෙත්.

**උස්සුක්කජාතෙසු**-නොයෙක් කෘත්‍ය ඇති අය වූකල්හි නූපන් රූපාදීන් උපදවන්වත් උපන්රූපාදීන් අනුභව කරන්වත් උත් සුක ජාතවූකල්හි: යනුයි.

**අනුස්සුකා**-ව්‍යාවෘත නොවූ යෙදී බැඳී නැත්තාවූ; **අගාරං**-භාර්‍ය්‍යාසහිත ගිහිගෙය; **විරාජිය**-රැඳීමක් නැතිකොට නසා;

**භවසොතානුසාරිසු**-වෘත්තශ්‍රොතස අනුසරණය (සසර සැඩ පහර යන සැටියට ගමන) කරන්නාවූ;

---

3. 8. අනුස්සුක සූත්‍රප්‍රදීපයයි.

---

**23\. චතුචක්කං නවද්වාරං-පුණ්ණං ලොභෙන සංයුතං,**
**පඞ්කජාතං මහාවීර-කථං යාත්‍රා භවිස්සතී'ති.**

**24\. ඡෙත්වා නද්ධිං වරත්තං ච-ඉච්ඡාලොභං ච පාපකං,**
**සමූලං තණ්හං අබ්බුය්හ-එවං යාත්‍රා භවිස්සතී'ති.**

---

**3 - 9 - ( 23 - 24. )**

i. **මාතෘකා:-**

**ශරීරයාගේ පරිමුක්තිගතිය කෙසේද?**

ii. **පිණ්ඩාර්ථය:-**

ඉරියව් පැවැත්ම රියසක (රෝද) සතරකි; තෘෂ්ණාව වර පටකි; දෘෂ්ටිය දම්වැල් ගෙතුමකි; තණ්හාවේ මුලක් අවිද්‍යාවයි. ව්‍රණමුඛ නවය දොරටු නවයකි; ශරීරය මඩෙහි උපන.

iii. **භාවය:-**

23\. මහාවීරයන් වහන්ස, චක්‍ර සතරක් ඇත්තේය. ද්වාර නවයක් ඇත්තේය. අසුචියෙන් පිරිණ. තෘෂ්ණාවෙන් යුක්තය; මඩෙහි උපන. පරිමුක්තිය කෙසේවන්නේද?

24\. බලවත් ක්‍රොධරැහැණද, කෙලෙස් වරපටද, ලාමක ඉච්ඡා ලොභ දෙකද පිරිසිඳ මූල සහිතවූ තෘෂ්ණාව උපුලා මෙසේ නික්මීම වන්නේය.

v. **ප්‍රකවිකරණාර්ථ:-**

**චතුචක්කං**-ගමන, ඨාන, නිසජ්ජා, සයන, යන චතුරීයාපථය මෙහි චක්‍රවේත්.

**නවද්වාරං**-දෙකන්, දෙනාසා, දෙඇස්, මුව, මූ, මල, සිදුරු නවය ව්‍රණමුඛ වේත්.

**පුණ්ණං**-අසුචියෙන් පිරීම දෙතිස්කුණප වශයෙනි.

**ලොභෙන සංයුතං**-ලොබයෙන් බැඳින.

**කථං යාත්‍රාභවිස්සති**-ඒ මෙබඳු ශරීරයාගේ නිර්ගමනය කෙසේද? මුක්ති, පරිමුක්ති, සමතික්‍රම කෙසේ වන්නේදැයි විචාරයි.

**නද්ධිං**-බද්ධවෛරය, මුලින් ක්‍රෝධයයි; පසුව උපනාහය වේ. එසේ පැවති බලවත් ක්‍රෝධයයි. "ඡෙත්වා නද්ධිං වරත්තං ච සන්දානං සහනුක්කමං" යන මේ ගාථාවේ තෘෂ්ණාව වරපට (තෝන් ලනුව) යයිද දෘෂ්ටිය සන්දාන (ගෙතීම) යයිද කියනලදී; මෙහි පෙළේ දැක්වූ කෙලෙස් හැර අවශෙෂ කෙලෙස් වරපට යයි දත යුත්තාහ. මෙසේ කෙලෙස් වරපට සිඳදමා යන අර්ථය වේ.

**ඉච්ඡාලෝභං**-එකම ධර්මය ඉස්නා අර්ථයෙන් ඉච්ඡායයිද ලුබ්නා අර්ථයෙන් ලෝභයයිද කියනලදී. ප්‍රථමකොට උපදින දුර්වල ආශාව ඉච්ඡා නම් වේ. අපරාපරව උත්පත්ති ඇති බලවත් ආශාව ලෝභ නම් වේ. නොලත් දේ ප්‍රාර්ථනාව ඉච්ඡාය, ප්‍රතිලබ්ධ (ලද) වස්තූන්ගෙන් වූවා ලෝභය කියාද ගතයුතුයි.

**සමූලං තණ්හං**-අවිද්‍යා සඞ්ඛ්‍යාත මුලෙන් මූල සහිත (මුල් බැහැපු) තණ්හාවයි.

**අබ්බුය්හ**-අග්‍රමාර්ගී (රහත්මගින්) යෙන් උත්පාටනය කොට, (උගුළා)

—:—

# 3. 9. යාත්‍රා සූත්‍රප්‍රදීපයයි.

—:—

25. එණිජඞ්ඝං කිසං වීරං-අප්පාහාරං අලොලුපං,
සීහං 'වෙකචරං නාගං-කාමෙසු අනපෙක්ඛිනං;
උපසඞ්කම්ම පුච්ඡාම-කථං දුක්ඛා පමුච්චතී'ති.

26. පඤ්චකාමගුණා ලොකෙ-මනොඡට්ඨා පවෙදිතා,
එත්ථ ඡන්දං විරාජෙත්වා-එවං දුක්ඛා පමුච්චතී'ති.

---

### 3 - 10 - (25 - 26)

i. **මාතෘකා:-**

**බුදු සිරුරේ හැඩහුරුකම් හා දුකින් මිදෙන අයුරු.**

ii. **පිණ්ඩාර්ථය:-**

තථාගතයන් වහන්සේ එණිමුවන්ගේ මෙන් වටවූ කෙණ්ඩා ඇත්තේය; සුථූල කෙනෙක් නොවේ; මැලවුන සමය, මල්ගඳ විලවුන් වලින් නො වැඩුන ශරීරයයි; වීර්‍ය්‍යවත් වේ; භොජන යෙහි මාත්‍රඥතායෙන් සවල්පාහාර වළඳනසේක, විකල් බොජුන් ප්‍රතික්‍ෂෙප වශයෙන් පරිත්‍රාහාරීය; චතුෂ්ප්‍රත්‍යයෙහි ලොලුප්‍ප විරහිතයි, රසතෘෂ්ණා ප්‍රතික්‍ෂෙප කළසේක; එකචර සිංහයෙක් සමානය; තනිව හැසිරෙන ඇත්රජෙක් මෙනි; ගණවාසීහු ප්‍රමත්තයි; එකචරයෝ අප්‍රමත්තයි; එහෙයින් "එකචරය"යි ගත්තාලදී.

තථාගතයන් වහන්සේ සුප්‍රතිෂ්ඨිත පාදතාදී දෙතිස් මහාපුරුෂලක්‍ෂණයෙන්ද හෙබිසේක. සුප්පතිට්ඨිතපාදො; හෙට්ඨා පාද තලෙසු චක්කානි ජාතානි සහස්සරානි සනෙමිකානි සනාභිකානි සබ්බාකාරපරිපූරානි සුවිභත්තන්තරානි; ආයතපණ්හී; දීඝඞ්ගුලී; මුදුතළුණහත්ථපාදො; ජාලහත්ථපාදො; උස්සඞ්ඛපාදො; එණිජඞ්ඝො; ඨිතකො'ව අනොනමන්තො උභොහි පාණිතලෙහි ජණ්ණුකානි පරිමසති පරිමජ්ජති; කොසොහිතවත්ථගුය්හො; සුවණ්ණවණ්ණො කඤ්චනසන්නිභත්තචො; සුඛුමච්ඡවි සුඛුමත්තා ඡවියා රජොජල්ලං කායෙ න උපලිප්පති; එකෙක ලොමො එකෙකානි ලොමානි ලොමකූපෙසු ජාතානි; උද්ධග්ග ලොමො; උද්ධග්ගානිලොමානි ජාතානි නීලානි අඤ්ජන වණ්ණානි කුණ්ඩලාවත්තානි පදක්ඛිණා වත්තකජාතානි; බ්‍රහ්මුජ්ජු ගත්තො; සත්තුස්සදො; සීහපුබ්බද්ධකායො; චිතන්තරංසො; නිග්‍රොධපරිමණ්ඩලො යාවතක්වස්ස කායො තාවතක්වස්ස ව්‍යාමො යාවතක්වස්ස ව්‍යාමො තාවතක්වස්සකායො; සමවත්තක්ඛන්ධො; රසග්ගසග්ගී; සීහහනු; චත්තාළීසදන්තො; සමදන්තො; අවිවර දන්තො; සුසුක්කදාඨො; පහූතජිව්හො; බ්‍රහ්මස්සරො කරවීකභාණී;

අභිනීල නෙත්තො; ගොපඛුමො; උණ්ණාභමුකන්තරෙ ජාතා ඔදාතා මුදු තූලසන්නිභා; උණ්හීස සීසො;"යි කී **ලක්ෂණ දෙතිසෙන්** බුද්ධශරීරයේ රූපලක්ෂණ දතයුතුයි.

iii. **භාවය:-**

25. 'එණි මුවෙකුගේ මෙන් කෙන්ඩා ඇති සථූල නොවූ සම සිරුරු ඇති වීර්‍ය්‍යවත්වූ අල්පාහාර ඇති සිව්පසයෙහි ලොල්බව නැත්තාවූ එකලාව හැසිරෙන සිංහයෙක් වැනිවූද, හස්තිරාජයෙක් වැනිවූද,(ඔවුන් සේ අප්පමත්තවූ පඤ්චකාමයන්හි ආසා නැත්තාවූ ඔබවහන්සේ කරා එළඹ විචාරමි. සසරදුකින් කෙසේ මිදේද?

26. ලොකයෙහි මනස සවෙනි කොට ඇති පඤ්චකාම ගුණයෝ ප්‍රකාශිත වෙත්. මේ නාමරූපයෙහි ආශාව දුරුකොට ලුව හොත් මෙසේ සසර දුකින් මිදේ.

v. **ප්‍රකටීකරණාර්ථ:-**

**අප්පාහාරං**–ආහාරයෙහි පමණ දැන වළඳන හෙයින්ද, විකල් බොජුනෙන් වැළකී පෙරවරුවෙහි පමණක් වළඳන හෙයින්ද භාග්‍යවතුන්වහන්සේට දෙවතාවා මෙසේ පැසසීය.

**එත්ථ**–මේ නාම රූප වයෙහි; මෙහි පඤ්චකාමගුණ වශයෙන් රූපයද, **මනො**..යතනෙන් නාමය (වෙදනා-සඤ්ඤා-සඞ්ඛාර-විඤ්ඤාණ) ද ගන්නාලදී.

**සීහං චෙකචරං නාගං**–පිරිසෙහි වන්නෝ පිරිස නිසාම ප්‍රමාද වෙත්; හුදකලාව (තනිව) හැසිරෙන්නෝ එසේ නොවෙත්. (අප්‍රමාද වෙත්.) එහෙයින් බුදුරජාණන්වහන්සේට එකලාව හැසිරෙන සිංහයෙක් මෙනැයිද, හස්තිරාජයෙක් මෙනැයිද කියනලදී.

—:—

# 3. 10. එණිජඞ්ඝ සූත්‍රප්‍රදීපයයි.

—:—

තුන්වන සත්ති වගයි.

**තස්සුද්දානං.**

සත්තියා ඵුසතී චෙව–ජටා මනොනිවාරණා,
අරහන්තෙන පජ්ජොතො–සරා මහද්ධනෙන ච;
චතුචක්කෙන නවමං–එණිජඞ්ඝෙන තෙදසා'ති.

1 සබ්භිරෙව සමාසෙථ-සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය-සෙය්‍යො හොති න පාපියො'ති.

2. සබ්භිරෙව සමාසෙථ-සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය-පඤ්ඤා ලබ්භති නාඤ්ඤතො'ති.

3. සබ්භිරෙව සමාසෙථ-සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය-සොකමජ්ඣෙ න සොචති'ති.

4. සබ්භිරෙව සමාසෙථ-සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය-ඤාතිමජ්ඣෙ විරොචති'ති.

5. සබ්භිරෙව සමාසෙථ-සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය-සත්තා ගච්ඡන්ති සුගතිං'ති.

6. සබ්භිරෙව සමාසෙථ-සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය-සත්තා තිට්ඨන්ති සාතතං'ති.

7. සබ්භිරෙව සමාසෙථ-සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය-සබ්බදුක්ඛා'පි මුච්චති'ති.

---

4 - 1 - (1 - 2 - 3 - 4 - 5 - 6 - 7.)

i. **මාතෘකා:-**

**පණ්ඩිත සත්පුරුෂ සමාගම ලාමක නොවේ.**

ii. **පිණ්ඩාර්ථය:-**

තිසරණ පන්සිල් සමාදන්වූ පමණින් දිව්‍යසම්පත් ලැබේ; දෙව්ලොව උපන්නෝ පූර්වකර්මය බලත්; ආචාර්‍යයන් නිසා සම්පත් ලද්දේය. දෙවි වුවත් ගුරුවරයාගේ ගුණ වණති. සියලු හැසුරුම් සාධූන් සමග පැවැත්විය යුතුයි.

මිත්‍ර සන්ථවයට බුද්ධ, පසේබුද්ධ, බුද්ධසව්වෝම සෑහෙත්; තෘෂ්ණා සන්ථවය නොසෑහෙයි; පඤ්චශීලයද සද්ධර්මයයි. වැලිමිරිකා තෙල් ගනිතත් අන්ධබාලයන් කෙරෙන් ප්‍රඥාව නම් නොලැබේ. තල පොල් ආදියෙන්ම තෙල් ගන්නාක්මෙන් සත්පුරුෂ ධර්ම දත පණ්ඩිත සේවන භජනයෙන්ම ප්‍රඥාව ලැබේ. සොකී සත්වයන් මැද නොසොක වීමටත් නෑයින් මැද බැබලීමටත්, සුගතියට යන්ටත් සුවසේ චිරජීවනයටත්, ශ්‍රෙෂ්ඨවීමටත්, සියලු දුකින්මිදී නිවන් යාමටත්, සත්පුරුෂ සමාගම උපකාර වේ.

iii. **භාවය:-**

1. පණ්ඩිත සත්පුරුෂයන් සමගම එක්ව හිඳින්නේය; සත්පුරුෂයන් සමග මිත්‍රසන්ථවය කරන්නේය; බුද්ධාදී සාධූන්ගේ සදහම් දැන එසේ පිළිපදින්නහුට යහපත අභිවෘද්ධිය වෙයි; කිසි අයහපතක් අනභි වෘද්ධියක් නොවෙයි.

2. පණ්ඩිත-පෙ- පිළිපදින්නහුට ලොවී ලොව්තුරු පැණ ලැබෙයි; අන්‍ය අඥබාලයා කෙරෙන් නො ලැබෙයි.

3. එසේ පිළිපදින්නේ ශොකවසතුන් අතුරෙහි හෝ ශොකානුගත සත්වයන් මැද ශොක නොකරයි.

4. සාධූන්ගේ සද්ධර්මය දත නෑසමූහයා මැද බබලයි.

5. සාධූන්ගේ සද්ධර්මය දත සත්වයෝ සුගතියට යෙත්.

6. සත්වයෝ සැමකල් හෝ බොහෝ කල් සැපසේ සිටිත්.

7. තොප කී පමණක් නොව සියළු සසර දුකින් ද මිදේ.

iv. **අනුවාදය:-**

**සතුල්ලපකායිකා** දෙවතාවෝ සැවැත්නුවරදී බුදුන් හමුවෙහි මේ ගාථා කීවෝය. සත්පුරුෂ ධර්ම සමාදාන වශයෙන් උල්ලපනයෙන් ස්වර්ගීය ලොකොත්පත්තිය ලැබූවෝ- (සත-උල්ලප-කාය=ඉක=ආ) සතුල්ලපකායිකා වූහ.

**එහි කථාවස්තුව:-**

සමුද්‍ර වාණිජ සමූහයක් (මුහුදු වෙළඳ සමූහයක්) නැවකින් මුදට බැස්සාහුය. ඔවුන්ගේ විදි ඊතල වේගයෙන් සාගරයෙහි ගමන්ගත් නෞකාව සත්වෙනි දින මහාසාගර මධ්‍යයෙහිදී (මුද මැදදී) මහත් උත්පාතිකාවක් (කෝඩයක්) පහළවීම නිසා මහරළ නැඟී දියෙන් පිරෙන්නී නැව කිඳෙන කල මහජනයා තමන් තමන්ගේ දෙවතාවන්ගේ නම් ගෙන යාච්ඤා ආදිය කරමින් වැලපිත; ඔවුන් අතරෙහි එක් පුරුෂයෙක් මෙබඳු භයකදී මටත් පිහිටක් ඇත්දැයි ආවර්ජනා කරන්නේ තමාගේ පිරිසිදු සරණයන්ද සිල්ද දැක යෝගියෙක් මෙන් පර්‍යඞ්ක ආභොගකොට (පළඟබැඳ) සිටියේය. ඉතරයෝ ඔහු අතින් අභය කාරණය ඇසුවාහුය. හේ මෙසේ ඔවුන්ට කීය. "එව්! බලව්! (එබෙ!!) මම නැව් නඟින දවසේ භික්ෂුසඞ්ඝයාට දන්දී සරණයන්ද සීලයන්ද ගත්තෙමි; ඒ කරුණෙන් මට බයක්නැතැයි" "කිමෙක්ද?හිමියනි! ඒ සරණ හා සිල් අතිකුත්වත් වටිත්දැයි," "ඔව් වටිත්ය" "එසේ නම් අපටත් දෙන්නැයි" හෙතෙම ඒ මිනිසුන් සියේ සියේ බැගින් සත්කොටසක් කෙළේය. ඉක්බිති සිල් දුන්නේය; ඔවුනතුරෙන් ප්‍රථම ජඞ්ඝශතය(ගමන්කාරසියය) ගොප්ඇට මාත්‍ර ජලයෙහි සිට සිල් ගත්තේය; ද්විතීය ජඞ්ඝශතය (දෙවෙනි කණ්ඩායම) දනමත්තක් දියෙහිද, තුන්වන සියය කටිමත්තක්, සතරවන සියය නැබමත්තක්, පස්වන සියය තනමත්තක් හා සවෙනි සියය ගෙල පමණෙහිද, සත්වෙනි ජඞ්ඝසතය මුවෙන් ලුණුදිය පිවිස්නෙහිද

සිල්ගත්තේය. හෙතෙම ඔවුන් සත්සියයට සිල්දී. "නුඹලාට සීලය ආවර්ජනා කිරීම හැර වෙන පිළිසරණක් නැතැයි" හඬපෑවේය; ඔවුන් හැමදෙනම එහි කාලක්‍රියාකොට ආසන්නකාලයෙහි ගත් සීලය නිසා තව්තිසා බවනයෙහි උපන්හ. උන්ගේ සමූහ වශයෙන් සත්පෙළට විමන් පහළවූහ; සියල්ලන් මැද ඇදුරුට සියක් යොදුන් රන්විමනක් පහළවිය. අවසෙස් විමන් පිරිවරවී; හැමටම යටපෙළ දෙළොස්යොදුනක් විය. ඔහුතුමූ උපන් කෙණෙහිම කර්මාවර්ජනාකරන්නෝ ආචාර්‍ය්‍යන් නිසා සම්පත්ති ලාභය දැන "අපියමු; දසබලධාරී බුදුන් ලඟදීම අප ඇදුරිඳුගේ ගුණ වැණුම් කියමු"යි රෑ මැදුම්යම ගෙවුන තැනම භගවතුන් වෙතට එළඹුනාහුය; ඒ දෙවතාවුන්ගෙන් සදෙනෙක් ආචාර්‍ය්‍ය වර්ණනා භණනය පිණිස එක එක ගාථාවක් කියා පැවාහ.

**ප්‍රකීර්ණාර්ථ:-**

**සබ්භිරෙව**-(සබ්භි-එව) පණ්ඩිත සත්පුරුෂයන් සමගම; **සමාසෙථ** (සං-ආසෙථ) එකට හිඳිව්, සියලු ඉරියව් කරව්.

**සන්ථවං**-සන්තැත්ත-මිත්‍රසන්ථවයයි; තෘෂ්ණාසන්ථවය වනාහි කිසිවෙක් හා නොකට යුතුයි; බුද්ධ, ප්‍රත්‍යෙකබුද්ධ, බුද්ධශ්‍රාවකයන් සමග මිත්‍රසන්ථවය කටයුතුයි.

**සද්ධම්මං**-පඤ්චශීල, දශශීල, චතුසතිපට්ඨානාදී භෙද ඇති සද්ධර්මයයි; මේ දෙවභාෂිතයෙහි වනාහි පඤ්චශීල අභිප්‍රෙතයි.

**සොකමජ්ඣෙ න සොචති**:—

ශොක වස්තූන්ගේද, ශොකානුගත සත්වයන්ගේද, මධ්‍යගත වූයේ ශොක නොකරයි; බන්ධුල මල්ල සෙනාපතිගේ **මල්ලිකාඋපාසිකාව** මෙන්ද, පන්සියක් සොරුන් මැද ධර්මසෙනාපති **සැරියුත්** තෙරුන්ගේ සද්ධිවිහාරික **සංකිච්චසාමණෙර** මෙන්ද ශොක නොකරයි.

**ඤාතිමජ්ඣෙ විරොචති**-ඤාතිගණයා මැද සංකිච්චතෙරුන්ගේ සද්ධිවිහාරික **අධිමුත්ත** සාමණෙර මෙන් ශොභමාන වේ.

### අධිමුත්තක සාමණෙර වස්තුව.

අධිමුත්තක සාමණෙරයන් වහන්සේ වනාහි **සංකිච්ච** තෙරුන් වහන්සේගේ බෑණා(භගිණීපුත්‍ර)වෙයි; ඔහට සථවිරතෙම **එකල්හි මෙසේ වදාළේය; "සාමණේරය! නුඹ මහළුවූයෙහිය, යන්ඩ! වස්ගණන් පිළිවිස එහි, තා උපසපන් කරන්නෙමියි"**; හේ "මැන වැ"යි තෙරුන් වැඳ පාසිවුරු රැගෙන සොරඅඩවියේ අවරබාග

යෙහිවූ සංකිච්චතෙරුන්ගේ බැගැණියගේ ගමට ගොස් පිඬු පිණිස වැඩියේය; භගිණී ඒ සාමණේරයන් දැක වැද ගෙයි වඩා හිඳුවා වැළඳවූවාය. ඒ හෙරණතෙම කෘතහස්ත කෘත්‍ය ඇත්තේ වස් ඇසීය; ඕතොමෝ "මම නොදනිමි, මගේ මව් දනීයයි" කීවාය. හෙතෙම "නුඹ නවතින්න! මම මැතියන් සමීපයට යන්නෙමි"යි මහවනයට පිළිපන්නේය; ඒ සාමණේරයන් දුරදීම එක්තරා චෞර පුරුෂයෙක් දුටුයේ ඒ බව සොරුන්ට දැන්වූයේය. චෞරයෝ "එක් සාමණේර නමක් වනයට බටුයේය, පලයව්, ඔහු අල්වාගෙන එව්" කියා නියොගකොට ගෙන්වා එකෙක් "ඌ මරව් යයි"ද, එකෙක්"ඌ හැර දමව්"යයිද කීවෝය. සාමණේර තෙමේ මෙසේ සිතී; මම ශෛක්‍ෂවූ මගඵල කිස ඇත්තෙක්මි; මුන් සමග මතුරු සිය නිදහස කරගනිමි"යි සොරදෙටුවා අමතා "(ඇවැත්නි) නුඹට උපමාවක් කියන්නෙමියි", මේ ගාථාවෝ වදළේය.

1 "අහු අතීතමද්ධානං-අරඤ්ඤස්මිං බ්‍රහාවනෙ,
වෙත්තො කූටානි බන්ධිත්වා-සසකං අවධී තදා.

2. සසකං ච මතං දිස්වා-උබ්බිග්ගා මිගපක්ඛිනො,
එකරත්තිං අපක්කාමුං- අකිච්චං වත්තතෙ ඉධ.

3. තථෙව සමණං හන්ත්වා-අධිමුත්තං අකිඤ්චනං,
අඩ්ඪා නාගමිස්සන්ති-ධනජානි භවිස්සතී'' 'ති.

4. 'සච්චං ඛො සමණො ආහ-අධිමුත්තො අකිඤ්චනො,
අඩ්ඪා නාගමිස්සන්ති-ධනජානි භවිස්සති".

5. "සචෙ පටිපථෙ දිස්වා-නාරොචෙස්සසි තස්සචි,
තව සච්චමනුරක්ඛන්තො-ගච්ඡ භන්තෙ යථා සුඛ''න්ති.

1. අතීත කාලයෙහි අරණ්‍යප්‍රදෙශයේ මහලැහැබෙහි වැද්දෙක් උගුල් අටවා එදා සාවෙක් මැරුවේය.

2. මළ සසකයා දැක උද්විග්න (බියපත්) මෘගපක්‍ෂීහු එකරයකදී මෙහි අවැඩෙක් පවතීයයි බැහැර ගියාහුය.

3. එසේම අකිඤ්චන (කිසි ධනයක් නැති) අධිමුක්ත ශ්‍රමණයා නැසීමෙන් මගියෝ නොයෙත්, (එකල) නොපට ධන හානිය වන්නේයයි වදළසේක.

4-5. අධිමුක්ත ශ්‍රමණතෙම සත්‍යය(සැබව)ක්ම කියයි. මාර්ගිකයෝ නොඑන්නාහුය, ධනහානි වන්නේයයි සිතා, "ස්වාමීනි! පෙරමග දුටු කිසිවෙකු සමග ඉදින් නොකියන්නෙහි නම්

ඔබගේ සත්‍යය රකිමින් සැපසේ වැඩිය මැනවැයි" ඒ සොරුන් විසින් නිදහස් කරණ ලද උන්වහන්සේ වඩින්නේ නැයින් දුකත් ඔවුන්ටද නොදුන්වූයේය; ඉක්බිති ඒ නැයන් පැමිණි කලැ සොරහු අල්වා ගෙණ තැළුවාහුය; ලය පහරු විලාප කියන උන්වහන්සේගේ මැනියන්ට සොරු මෙසේ කීවාහුය.

1. "කිං තෙ හොති අධිමුත්තො-උදරෙ වසිති භාසසි,
පුට්ඨා මෙ අම්ම අක්ඛාහි-කථං ජානෙමු තං මය'න්ති

2. "අධිමුත්තස්ස අහං මාතා-අයං ච ජනකො පිතා,
භගිනී භාතරො චාපි-සබ්බෙ ච ඉධ ඤාතයො;
අකිච්චකාරී අධිමුත්තො-යං දිස්වා න නිවාරයෙ'ති.

3. එතං ඛො වත්තං සමණානං-අරියානං ධම්මජීවිනං,
සච්චවාදී අධිමුත්තො-යං දිස්වා න නිවාරයෙ.

4. අධිමුත්තස්ස සුවිඤ්ඤාත-සච්චවාදිස්ස භික්ඛුනො,
සබ්බෙව අභයං පත්තා-සොත්ථිං ගච්ඡන්තු ඤාතයො'''ති.

1. අධිමුක්තතෙමේ උදරයෙහි විසී (කුසහොත්තැයි) යයි කියන්නෙහිය; නිට කව්රු වේද? මැනියෙනි! මාවිසින් විචාරණ ලද්දී කිව මැනව අපි එය කෙසේ දනිමුද?

2. මම අධිමුත්තගේ මව්ය, මේ ද ජනක පියාය, භගිණී භාතෘ දෙදෙනාත් මෙහිය, ඒ සියලුදෙනාම ඤාතීහුය, අධිමුත්තයා අප දුකත් යම් හෙයකින් අප නොවැළැක්වීද, හේ අකෘත්‍යකාරීය; කටයුත්තක් නොකෙළේයයි.

3. තොප දුක යම් කරුණකින් නොනැවැත්තුවේද? ඒකාරණය වනාහි නිර්දොෂිවූ ධර්මජීවී ශ්‍රමණයන්ගේ ව්‍රතයකි; අධිමුත්තයන් වහන්සේ සත්‍යවාදී වේ.

4. සත්‍යවාදී භික්ෂුකෙනෙක්වූ අධිමුත්තයන් වහන්සේගේ මනා පුරුද්දෙන් සියලු දෙනම අභය ප්‍රාප්තයහ. නැයෝ සවස්තියට (සෙතට) පැමිණෙත්වායි මෙසේ ඔව්හු සොරුන් විසින් හැර දුමුවෝ ගොස් අධිමුත්තයන් වහන්සේට කීවාහුය.

තව තාත සුවිඤ්ඤාත-සච්චවාදිස්ස භික්ඛුනො,
සබ්බෙව අභයං පත්තා-සොත්ථිං පච්චාගමාමසෙ'ති.

දරුව! සත්‍යවාදී භික්‍ෂුකෙනෙක්වූ නුඹවහන්සේගේ මනාවූ පුරුද්ද නිසා අපි සියල්ලෝම අභයට පැමිණියම්හ; සුවසේ පෙරළා ආවෙමුයි.

ඒ සොරු පන්සියක් දෙනාද ප්‍රසාදයට පැමිණ අධිමුත්ත සාමණේරයන්ගේ සමීපයෙහි පැවිදිවූවාහුය.

උන්වහන්සේ ඒ සොරුන් කැඳවා ගෙන උපාධ්‍යායයන් සමීපයට ගොස් පළමුකොට තෙමේ උපසපන් වූයේ පසු ඒ පන්සියක් දෙනාද තමාගේ අතවැසියන් කොට උපසම්පද කරවූයේය.

ඒ භික්‍ෂූහුද අධිමුත්තතෙරුන්ගේ අවවාදයෙහි සිටියාහු සියලුදෙනාම අග්‍රඵලයවූ අර්හත්වයට පැමිණියාහුය. "සතං සධම්ම මක්ඛාය-ක්ඛන්තිමජ්ඣෙ විරොචති" යන ගාථාව මේ සඳහා කියනලදී.

## 4. 1. සභිය සූත්‍රප්‍රදීපයයි.

8. මච්ඡෙරා ච පමාදා ච - එවං දානං න දීයති,
පුඤ්ඤං ආකඞ්ඛමානෙන - දෙය්‍යං හොති විජානතා.

9. යස්සෙ'ව භීතො න දදාති මච්ඡරී - තදෙවාදදතො භයං,
ජිඝච්ඡා ච පිපාසා ච - යස්ස භායති මච්ඡරී;
තමෙව බාලං ඵුසති - අස්මිං ලොකෙ පරම්හි ච.

10. තස්මා විනෙය්‍ය මච්ඡෙරං - දජ්ජා දානං මලාභිභූ,
පුඤ්ඤානි පරලොකස්මිං - පතිට්ඨා හොන්ති පාණින'න්ති.

11. තෙ මතෙසු න මීයන්ති - පන්ථානං ව සහබ්බජං,
අප්පස්මිං යෙ පවෙච්ඡන්ති - එස ධම්මො සනන්තනො.

12. අප්පස්මෙකෙ පවෙච්ඡන්ති - බහුනෙකෙ න දිච්ඡරෙ,
අප්පස්මා දක්ඛිණා දින්නා - සහස්සෙන සමං මිතා'ති.

13. දුද්දදං දදමානානං - දුක්කරං කම්ම කුබ්බතං,
අසන්තො නානුකුබ්බන්ති - සතං ධම්මො දුරන්නයො.

14. තස්මා සතං ච අසතං ච - නානා හොති ඉතො ගති,
අසන්තො නිරයං යන්ති - සන්තො සග්ගපරායණා.

15. ධම්මං චරෙ යොපි සමුඤ්ජකං චරෙ
දාරං ච පොසං දදමප්පකස්මිං,
සතං සහස්සානං සහස්සයාගිනං
කලම්පි නාග්ඝන්ති තථාවිධස්ස තෙ'ති.

16. කෙනෙස යඤ්ඤො විපුලො මහග්ගතො
සමෙන දින්නස්ස න අග්ඝමෙති,
සතං සහස්සානං සහස්සයාගිනං
කලම්පි නාග්ඝන්ති තථාවිධස්ස තෙ'ති.

17. දදන්ති හෙකෙ විසමෙ නිවිට්ඨා
ඡෙත්වා වධිත්වා අථ සොචයිත්වා,
සා දක්ඛිණා අස්සුමුඛා සදණ්ඩා
සමෙන දින්නස්ස න අග්ඝමෙති,
එවං සහස්සානං සහස්සයාගිනං
කලම්පි නාග්ඝන්ති තථාවිධස්ස තෙ'ති.

---

**4 - 2 - ( 8 - 17.)**

i. **මාතෘකා:-**

**දානඵල විභාගය. දන් නොදෙන හෙතු හා දන් දිය යුතුබව.**

ii. **පිණ්ඩාර්ථය:-**

මසුරෝ දන් නොදෙත්, ප්‍රමාදීහුද දන් නොදෙත්, පින් කැමති නම් දන් දිය යුතුමය; දන් නොදෙන බාලයා දෙලොවදීම සා පිපාසා දුක් ලුහුබැඳ එන්නාහුය, දන් දෙන්නෝ අදත සීලතා

වෙත් නොමැරෙත්, මැරුණහුගේ භොගවස්තුවත් දන් නොදෙත් තහුගේ භොගවස්තුවත් සම සම වෙත්. අදානසීලයා මළත් දාන සීලයා නොමැරේ; මගීහු අදන් කතර (දීර්ඝ කාන්තාර) මාර්ගයේදී පාථෙය්‍ය බෙදා දෙති; අනමතග්ග සංසාර කතාරහි එකට යන්නෝ ටික තිබුණත් එසේ බෙදා දෙත්. මේ පෞරාණික පණ්ඩිත ධර්ම යකි. බොහොම ඇතත් සමහරු නොදෙත්, පලාකොළ ටිකවත් බෙදා දෙන්නාම ධර්මචර්‍ය්‍යා කරයි.

දිළින්දා දුන් බත් කොටසත් එක සලාක බතත් දශකොටි සහස්‍ර දානයටත් වඩා අගනේය; මහාදානය අපිරිසිදු නම් අල්ප ඵල වේ. පරිත්ත (ටික) දානය පිරිසිදු නම් මහත්ඵල වේ.

iii. **භාවය:-**

8. මාත්සර්‍ය්‍යය හෙතුකොටගෙණ ද ප්‍රමාදය හෙතුකොට ගෙණද මෙසේ යශ සම්පත්ති සුඛදායකවූ දානවස්තු පරිත්‍යාගය නොකරනු ලැබෙයි; පූර්වචෙතනාදී භෙද භින්නවූ පින්කැමැත්තාවූ දන්දීමෙහි පල ඇතැයි දන්නහුවිසින් දන් දියයුතු වේ යයි **සතුල්ලපකායික** එක් දෙවතාවෙක් කීයේය.

9. මසුරු පුද්ගලතෙමේ යමකට බියපත්වූයේ(වස්තුපරිහානි යෙන් කැම්පීම් නැතිවේයයි) පරහට කිසිත් නොදේද, එසේ නොදෙන මසුරාට එයම භයකාරණයයි; (එනම්-සා දුකද පවස් දුකද වෙයි,) දන් දෙන කල කැම් පීම් තමන්ට හිඟවේය යන බියෙන් මසුරා දන් නොදෙන නමුත් සා-පිපාසාදුකින් පෙළෙන්ට වන්නේ දන්නොදෙන නිසාම යයි හෙතෙමේ යම් බඩසා පවස් දුකකට භයවේද, ඒ සා පිපාසා දුක මෙලෝ පරලෝ දෙක්හිම කම්පල නොදන්න මසුරා ලුහුබඳියි. (දෙලොවදීම ජිඝච්ඡා-පිපාසා දුක්ඛයෙන් පෙළෙන්නට වෙයි.)

10. සා පිපාසා දුක් ලුහුබැඳ එන හෙයින් මසුරුමල දුරු කොට මැඩපවත්වන ලද මසුරුමල ඇත්තෙක්ව දන්දෙන්නේය; පුණ්‍යයෝ පරලෙව්හි දී සත්වයන්ට පිහිටවෙත්යයි තවත් දෙවතාවෙක් කීයේය.

11. යම්කෙනෙක් තුමූ කාන්තාරමාර්ග ප්‍රතිපන්නව යන්නේ තමන් සමග යන අන් මගීන්ටත් ස්වල්පදේ නමුත් බෙදාදෙන්නාක් මෙන් අල්පවූ දෙයධර්මය ඇතිකල්හිත් සංවිභාගකොට දෙත් නෝද, ඒ දාන ශීලි පුද්ගලයෝ තුමූ අදානශීලි පුද්ගලයන් අදාන ශීලනා මරණයෙන් මළකල්හි නොමැරෙත්; මේ පෞරාණික ධර්මයයි, පණ්ඩිත ධර්මයයි.

12. ඇතැම් කෙනෙක් ස්වල්ප දෙයධර්මයක් ඇති කල්හිද දන්දෙත්; ඇතැම් කෙනෙක් බොහෝ භොගයෙන් සමන්විතවූවාහු නමුත් දන් නොදෙත්; මද දෙයින් හෙවත් ටිකදෙය ඇති කල්හි ඒ දෙයින් කම්පල අදහා දෙන ලද්දවූ දක්ෂිණාව දහසක් සමග ප්‍රමාණ කරණ ලද්දීයයි අන්දෙවතාවෙක් කීවාය.

13. තවත් දෙවතාවෙක් මෙසේ කීය:—

අසජ්ජනයෝ තුමූ ස්වල්ප දෙය ඇතිකල්හි එයින් දීම දුෂ්කර වුවද, එසේ දුෂ්කර දානය දෙන්නාවූ එසේ දුෂ්කර සුචරිත ක්‍රියා කරන්නාවූ සාධූන්ගේ ක්‍රියාවලට අනුගත ක්‍රියා නොකෙරෙත්; ඒ එසේමැයි: සාධූන්ගේ දානාදී සුචරිතධර්මය අසාධූන් විසින් දුස්පූයරීයයි; දුරනුගමයි.

14 එහෙයින් සාධූන්ගේද අසාධූන්ගේද මේ මනුෂ්‍යාත්ම භාවයෙන් උත්පත්තිය පිණිස අනන්තර භවයකට චුතව යාම වෙනස් වේ. කෙසේදයත්:-අසත්පුරුෂයෝ නරකයට උත්පත්ති වශයෙන් යෙත්; සත්පුරුෂයෝ ස්වර්ග පරායන වෙත්.

තවත් දෙවතාවෙක් මෙසේ ඇසීය.- භාග්‍යවතුන් වහන්ස! මෙයින් සුභාෂිතය කාගේද? නොප සියල්ලන්ගේ වදන් ඒ ඒ වචනයෙන් (ක්‍රමානුගතව) සුභාෂිතයි; යළිත් මගේ භාෂිතයද අසව්!

16. යමෙක් ඉඳුල්කකා හැසිරෙන්නේ (දුක්ඛ ජීවිකාවෙන් යුක්තවූයේ) අඹුදරුවන් දුකසේ පොෂණය කරන්නේ මඳවූ දියයුතු දෙයක් ඇතිකල්හිද, ශ්‍රමණබ්‍රාහ්මණයන් විෂයෙහි ප්‍රදානය කරමින් ධර්මචර්‍ය්‍යායෙහි හැසිරෙන්නේද? භික්ෂූන් දහසකට දුන් දන් ඇති දෙහෝ නොහොත් කහවනු දහසකින් උපදවන ලද සහස්‍රයාග ඇත්තන්ගේ හෙවත් භික්ෂූන් දසකෙළකට හෝ කහවනු දසකෙළකින් දුන්නාවූ ඒ දානධර්මයෝතුමූ එබඳු දිළිඳු තැනැත්තාගේ දානය සම්බන්ධ සියයෙන් කොටසකටත් නොඅගිත්.

තවත් දෙවතාවෙක් මෙසේ කීය:-

16. මහත්වූ ප්‍රත්‍යය විශෙෂයෙන් උළාරබවට පැමිණියාවූ මේ සහස්‍රයාගයාදීන්ගේ දානය දැහැමෙන් සෙමෙන් ලැබ දුන් දායාගේ වටිනාකමට කවර හෙයකින් නොපැමිණේද? සහස්‍රයාග ඇති ලක්ෂයක් දෙනාගේ දශකෙළක් සම්බන්ධවූ ඒ දානධර්මයෝ තාදෘශ දුර්ගිපුරුෂයාගේ දානයෙහි කලාවකටත් කවර හෙයකින් නොඅගිත්ද?

භාග්‍යවතුන් වහන්සේ ඔහුට මෙසේ වදාළසේක.

17. ඇතැම් කෙනෙක් විෂමවූ කාය-වාග්-මනඃ කර්මයෙහි අභිනිවිෂ්ටයෝව පිහිටා අනුන් තළා මෙරමා මරා නවද අනුන් ශෝකී කොට යම් භෙයකින් දන්දෙත්ද, කඳුලු වැකුණු මුහුනැති කොට මෙරමා හඬවා දුන් හෙයින් "අස්සුමුඛ" නම්වූ ඒ දක්ෂිණා තොමෝ දැහැමෙන් සෙමෙන් ලැබ දුන් දානයාගේ ඇඟීමට එහෙයින් නොපැමිණේ; මෙසේ සහස්‍රයාග ඇති ලක්ෂයකාගේ ඒ දානයෙන් තථාවිධ (එබඳු) දුගීපුරුෂයාගේ දානයෙහි ශතභාගයකුත් නොම අගිත්.

v. ප්‍රකාශීකරණාර්ථ:-

**මච්ඡෙරා ච පමාදා ච**=ආත්මසම්පත්ති නිගූහන ලක්ෂණ මාත්සර්ය්‍යයෙන්ද, ස්මෘතිවිප්‍රවාස ලක්ෂණ ප්‍රමාදයෙන්ද:-ඇතමෙක් දෙන්නාවූ මගේ මේ වස්තුව පරික්ෂයට යන්නේය; මට හෝ මගේ ගෙදෙර මිනිසුන්ට හෝ නොවන්නේයයි සලකා මසුරුකමින් දන් නොදේ; ඇතමෙක් ක්‍රීඩාදියෙහි ප්‍රසූත හෙයින් ක්‍රීඩාදියේ ව්‍යාවෘත වූයේ දන්දිය යුතුයයි සිතක් පමණවත් නූපදවයි.

**එවං දානං න දීයති**=මෙසේ මේ යස ඓශ්වර්ය්‍ය (දායක) සම්පත්ති සුඛ දායකවූ දානය නොදේයයි, නොදීමේ කාරුණු කියයි.

**දජ්ජා දානං මලාභිභූ**=මසුරු ලෝබ කැත කුණුකම් අභිභවනය කරණ වස්තුපරිත්‍යාග සඞ්ඛ්‍යාත දානය දෙන්නේය.

**තෙ මතෙසු න මීයන්ති**=නොදීම් සවභාව මරණයෙන් මළවුන් අතර නොමැරෙත්; යම්සේ මළ තැනැත්තේ සපිරිවරු තැබූ අන්නපාන වස්ත්‍රාභරණ මුතු මැණික් රන්රුවන් වස්තු ඇතත් මේ මොහුට වේවා. මෙය "මූට" යයි නැගිට කොටස් බෙදීමක් නොකරයි; අදානශීලියාත් එසේමය. මළ එකාගේත් නොදෙන එකාගේත් භොගයෝ ඒකාකාර වෙත්; ඒ ක්‍රමයෙන් දානශීලීහු ඊදෘශ මෘතයන් අතරෙහි නොමියත්, යන අර්ථයි.

**පන්ථානං'ව සහබ්බජං අප්පස්මිං යෙ පවෙච්ඡන්ති**=

එකට යන පථිකයන්ට මෙන් ටික ඇතත් යමෙක් දෙත්ද, එසේ දෙන්නෝ නොමැරෙත්; අදානශීලතාවෙති.

**ධම්මඤ්චරෙ**=කුශලකර්මපථධර්මය කරන්නේ.

**යොපි සමුඤ්ජකං චරං**=යමෙකුත් කලවිට ආදිය සුධකිරීම (පිදුරු හැලීම) වශයෙන් සමුඤ්ජක වාරීද;

**සතං සහස්සානං**=දහස බැගින් ගණන්ගත් පුරුෂයන් සියය (100000) ක් ශත සහස්‍රයක් වේ.

**සහස්සභාගිනං**=භික්ෂු දහසකට දීම හෝ කහවනු දහසකින් නිපදවූ හෝ යාගය සහස්‍රයාගය වේ; ඒ සහස්‍රයාගය ඇත්තෝ මොවුන්ට නුසි **සහස්සභාගිසි:** ඒ දහස්යාගීන් සම්බන්ධවූ මේ ගණනින් කහවනු කෝටිදශයකගේ පිණ්ඩපාතය දක්වනලදී.

යම් කෙනෙක් මෙතෙක් දෙනත්; "තෙ කලමපි නාග්ඝන්ති තථාවිධස්ස" දිළින්ද උඤ්ඡාචය්‍යා කරමින් ධර්මයෙන් රකිමින් දර පොෂණයත් කරමින් යමක් දෙනලද නම් ඔහුගේ දුප්පත් දනයේ සියෙන් පංගුවකටවත් ඒ මහදන් දෙන හැමදෙනාගේම දන වටින්නේ නැත.

මෙසේ තථාගතයන් දනානිශංසය ප්‍රකාශකරද්දී ලඟ සිටි දෙවතාවා මෙසේ සිතුවේය; භාග්‍යවතුන්වහන්සේ මේසා මහත් ශතසහස්‍රදනයක් පසින් පෙරළා සියක්රියන් ගැඹුරු නරුවලක දමා මෙබඳු දන සිගිත්තක් සඳමඩලේ ගසන්නාක් මෙන් ඉහළ දමයි.

**ඒ** පරිත්තදනය (ස්වල්පදනය) මහඟුතර වන්නේ කෙසේද්‍යෙ හෝයි දනගැණීම පිණිස ගාථාවකින් කියා සිටියේය.

මේ සූත්‍රයෙහි 8. (9-10.) (11-12.) (13-14) 16. යන ගාථා අට දෙවතාවෝ පස්දෙනෙක් වෙන් වෙන්ව බුදුන් හමුවෙහි ප්‍රකාශ කළෝය.

15-17. මේ ගාථා වයෙන් ප්‍රකාශවන්නේ ඒ සඳහා තථාගතයන් වහන්සේ ඔවුන්ට වදාළ ධර්මයයි.

—:—

## 4 2. මච්ඡරි සූත්‍රප්‍රදීපයයි.

—:—

18. මච්ඡෙරා ච පමාදා ච - එවං දානං න දීයති,
පුඤ්ඤං ආකඞ්ඛමානෙන - දෙය්‍යං හොති විජානතා'ති.

19. අප්පස්මෙකෙ පවෙච්ඡන්ති - බහුනෙකෙ න දිච්ඡරෙ,
අප්පස්මා දක්ඛිණා දින්නා - සහස්සෙන සමං මිතා'ති.

20. දානං ච යුද්ධං ච සමානමාහු
අප්පාපි සන්තා බහුකෙ ජිනන්ති,
අප්පම්පි චෙ සද්දහානො දදාති
තෙනෙව සො හොති සුඛී පරත්ථ'ති.

21. යො ධම්මලද්ධස්ස දදාති දානං
උට්ඨානවිරියාධිගතස්ස ජන්තු,
අතික්කම්ම සො වෙතරණිං යමස්ස
දිබ්බානි ඨානානි උපෙති මච්චො'ති.

22. විචෙය්‍ය දානං සුගතප්පසත්ථං
යෙ දක්ඛිණෙය්‍යා ඉධ ජීවලොකෙ,
එතෙසු දින්නානි මහප්ඵලානි
බීජානි වුත්තානි යථා සුඛෙත්තෙ'ති.

23. යො පාණභූතෙසු අහෙඨයං චරං
පරූපවාදා න කරොති පාපං,
භීරුං පසංසන්ති න හි තත්ථ සූරං
භයා හි සන්තො න කරොන්ති පාප'න්ති.

24. අද්ධා හි දානං බහුධා පසත්ථං
දානා ච ඛො ධම්මපදං'ව සෙය්‍යො,
පුබ්බෙ ච හි පුබ්බතරෙ ච සන්තො
නිබ්බානමෙවජ්ඣගමුං සපඤ්ඤා'ති.

---

4 - 8 - ( 18 - 19 - 20 - 21 22 - 23 - 24. )

i. මාතෘකා:-

**දානයටත් වඩා ධර්මපද (නිර්වාණ) යම ශ්‍රේෂ්ඨයි.**

ii. පිණ්ඩාර්ථය:-

ස්වල්ප දෙය ඇතිකලත් දන්දීම යහපති, ශ්‍රද්ධාවෙන් දන්දීමත් යහපති. දන්දීමත් යුද්ධකිරීමත් සමානයයි කියත්; ධාර්මිකලාභයෙන් දන්දීමත් යහපති, සොයාබලා දන්දීමත් මැනවි (එයිනුත්) දක්ෂිණාර්හයින්ට දන්දීම මහත්ඵල වේ. යම්හෙයකින් පරූපවාද බයින් සත්වහිංසා නොකිරීමද පැසසිය යුත්තකි; දැහැමින් ලද දෙය දැහැමියාට දීමද සාධුයි.

iii. **භාවය:-**

18. මෙහි භාවය මෙම වග අඞ්ක 8 බලනු.

19. මෙහි භාවය මෙම වග අඞ්ක 12 බලනු.

20. දන්දීමද, යුඩකිරීමද, සමානයයි කියත්; වීරපුරුෂයෝ ටිකදෙනෙක් වුවද බොහෝ භීරුක පුරුෂයන් ජයගණිත්; ශ්‍රද්ධාදී ගුණධර්ම සම්පූර්ණවූ තැනැත්තේ කම්පල අදහන්නේ ස්වල්පවූ දනයක් දෙන්නේද බොහෝ මසුරන් පරදවයි; ඒ නිසාම පර ලෙව්හි දී බොහෝ දනවිපාක ලබයි; එයින් සුඛිත වේ.

21. යමෙක් උට්ඨානවීර්‍යයෙන් අධිගතභොගයෙ ධර්මයෙන් ආර්‍යගුණලාභී පුද්ගලයාට දන්දේද, ඒ මනුෂ්‍යතෙමේ යමයාගේ වෛතරණිය සහ එක්තිස් නිරය ඉක්මවා දිව්‍යස්ථානයන්ට පැමිණෙයි.

22. දෙයධර්ම සහ දක්ෂිණාහියන් තෝරා දන්දීම සුගතයන් වහන්සේ විසින් පසස්නාලදි. මේ ලොකයෙහි යම් කෙනෙක් දක්ෂිණාහී වෙත්ද උන්වහන්සේලා විෂයෙහි දෙනලද දනයෝ මහත්ඵල වෙත්; මනා කෙතේ වපුළ බිජුවට මෙනි.

23. යමෙක් සත්වයන් කෙරෙහි හිංසා නොකරන්නේ පරෝපවාද හෙතුවෙන් පව් නොකෙරේද, ඒ පාපභීරුකයාට සත්පුරුෂයෝ පසසත්; පාපීපුද්ගලයාට නොම පසසත්; ශාන්තපුරුෂයෝ භයින් පව් නොකරත්ද එහෙයිනි.

24. දන්දීම වනාහි ඒකාන්තයෙන් බොහෝ සේ පසස්නා ලදී; ඒ ප්‍රශස්තදනයටත් වඩා නිර්වාණ සඞ්ඛ්‍යාත ධර්මපදයම ශ්‍රෙෂ්ඨයි; පෙරකාලයෙහිත් ඉතා පෙරකාලයෙහිත් සප්‍රාඥවූ බුද්ධාදී සජ්ජනයෝ අසංස්කෘත නිර්වාණයටම පැමිණියාහුද එහෙයිනි.

iv. **අනුවාදය:—**

දෙවතාවෝ උදන් ඇනීම් වශයෙන් මේ ගාථා දහම් කීහ. උදහාර-උදහරණ මෙසේ දතයුතුයි; යම්සේ මනාවේ තෙල් පුරවනකල වැඩිතෙල් ඉතිරී ගලායන්නේද, ඊට 'අවශෙෂක'යයි කියනු ලැබේ. යම් ජලයක් තඩාගයේ නොඅල්වන්නේද, යටවී යන්නේද, ඊට 'ඔඝ' යයි කියනු ලැබේ; එපරිද්දෙන්ම යම් ප්‍රීති වචනයක් හෘදය ග්‍රහණයට නොහැක්කේ වැඩිවී ඇතුළත අසණ්ඨා නව බැහැර නික්මේද, ඊට 'උදන'යයි කියනු ලැබේ; එවරූපී ප්‍රීති මය වචන පිට කෙළේය.

v. **ප්‍රකීර්ණකාර්ථ:—**

. **දානං ච යුද්ධං ච සමානමාහු**-කර්මයත් කර්මඵලයත් අදහා දුන් දානයත් යුද්ධයත් සමාන වන ආකාරය; ජීවිතය නිසා භයපත්වන්නාට (පණට බයනම්) යුද්ධ නොකළ හැකියි; ක්‍ෂයභීරුකයා (වස්තු හානියට භයවන්නා) දන්දෙන්නට සමතෙක් නොවේ; ජීවිතයත් රකින්නෙමි, යුද්ධයත් කරන්නෙමියි, කියන්නේ යුද්ධ නොකරයි; ජීවිතයෙහි ආලය හැරදමා අත්පා ආදිය සිඳීම හෝ මරණය හෝ වේවා, අර ඓශ්වර්‍ය්‍යයට යන්නෙමි' කියා උත්සාහකරණ තැනැත්තේම යුද්ධකරයි; භෝගයත් රැකගන්නෙමි, දානයත් දෙන්නෙමි, කියන්නා දන් නොදේ; භොගයන්හි ආලය හැරදමා මහාදානයක් දෙන්නෙමියි, උත්සාහකරන්නාම දන්දෙයි; මෙසේ දානයත් යුද්ධයත් සමවේ. **"ඒකසාටක බ්‍රාහ්මණයා"** මෙන් පිකක් ඇති කල දන්දිය යුතුයි; **අඞ්කුරයා** මෙන් ඇදහීමෙන් දන්දිය යුතුයි.

**වෙතරණිං**=යමයාගේ වෛතරණියද **සංජීව-කාලසූත්‍රාදී** එක්තිස් මහානරක සියල්ලම ද ඉක්මවා;

**උට්ඨානවිරියාධිගතස්ස**=උට්ඨාන කායික වීර්‍ය්‍යයයි; **විරිය** චෛතසික වීර්‍ය්‍යයයි; භොග අධිගමයට මේ දෙවිධියම අවශ්‍යවේ.

**ධම්මලද්ධස්ස**=දැහැමෙන් සෙමෙන් ලද භොගයටද, ධර්මලාභී පුද්ගලයාටද, ව්‍යවහාරයකි; මෙහි පුද්ගලලබ්ධ ධර්ම නම් වේ, පැමිණි දහම් ඇත්තේ ආර්‍ය්‍යධර්ම ඇත්තේය; මෙසේ දැහැමින් ලද වස්තුව ධර්මලාභී පුද්ගලයාට දෙනු ලැබේනම් ඒද මැනවි.

**විචෙය්‍යදානං සුගතප්පසත්ථං**-විචිනනයකොට (තෝරාගෙණ) දුන් දානය සර්වඥයන්වහන්සේ විසින් පසස්නාලදී. තෝරාගැණීම් දෙකකි; දියයුතු වස්තු සඞ්ඛ්‍යාත දක්ෂිණා විචිනනයත්, පිළිගත යුතු දක්ෂිණෙය්‍යයන් විචිනනයත් යන දෙකයි; දෙයධර්ම දක්ෂිණාහී දෙකෙන් ලාමක ලාමක ප්‍රත්‍යය පහකොට ප්‍රණීත ප්‍රණීත ප්‍රත්‍යය තෝරාගෙන ඒ ප්‍රණීත දේ දන්දීම **දෙය්‍යධර්මවිචිනනය** වේ.

මේ ශාසනයෙන් බාහිරවූ පඤ්චනවුති පාෂාණ්ඩ (අනූපහක් පසඬු) ප්‍රභේද ඇති විපන්නසීල (ශීලවිපන්න) යන් දුශ්ශීලයන් නොහොත් සිල්නැත්තන් සඞ්ඛ්‍යාත අදක්ෂිණාහීයන් හැරදමා ශීලාදී ගුණසම්පන්නවූ ශාසනයේ ප්‍රව්‍රජිතයන්ට දීම දක්ෂිණෙය්‍ය විචිනනය නම් වේ. මේ ආකාර දෙකින් විචෙය්‍යදානය සුගත තථාගත ප්‍රශස්තවේ; (මෙහි ශාසනික ප්‍රව්‍රජිතයන්ට දන්දීම සඳහා විචිනනයක් තෝරාබේරා ගැණීමක් ප්‍රකට නොකරණලදී.)

**යො පාණභූතෙසු අහෙඨයං චරං**=ප්‍රාණීන් කෙරේ සංයත භාවයෙන් අවිහිංසා චාරීව පව් නොකරන්නේය යන මෙයින් මේ දෙවතාවා ඉතරයන් විසින් කියනලද දානානිසංස අතික්‍රමණය කොට ශීලානිශංස කථාවට පටන්ගත්තාය.

——:——

## 4. 3. සාධු සූත්‍රප්‍රදීපයයි

——:——

25\. න සන්ති කාමා මනුජෙසු නිච්චා
සන්තී'ධ කමනීයානි යෙසු බද්ධො,
යෙසු පමත්තො අපුනාගමනං
අනාගන්තා පුරිසො මච්චුධෙය්‍යා'ති.
ඡන්දජං අඝං ඡන්දජං දුක්ඛං
ඡන්දවිනයා අඝවිනයො අඝවිනයා දුක්ඛවිනයො'ති.

26\. න තෙ කාමා යානි චිත්‍රානි ලොකෙ
සඞ්කප්පරාගො පුරිසස්ස කාමො,
තිට්ඨන්ති චිත්‍රානි තථෙව ලොකෙ
අථෙත්ථ ධීරා විනයන්ති ඡන්දං.

27\. කොධං ජහෙ විප්පජහෙය්‍ය මානං
සංයොජනං සබ්බමතික්කමෙය්‍ය,
තං නාමරූපස්මිං අසජ්ජමානං
අකිඤ්චනං නානුපතන්ති දුක්ඛා

28\. පහාසි සඞ්ඛං න ච මානමජ්ඣගා
අච්ඡෙච්ඡි තණ්හං ඉධ නාමරූපෙ,
තං ඡින්නගන්ථං අනිඝං නිරාසං
පරියෙසමානා නාජ්ඣගමුං;
දෙවා මනුස්සා ඉධ වා හුරං වා
සග්ගෙසු වා සබ්බ නිවෙසනෙසු'ති.

29\. තඤ්චෙ හි නාද්දක්ඛුං තථා විමුත්තං
(ඉච්චායස්මා මොඝරාජා)
දෙවා මනුස්සා ඉධ වා හුරං වා,
නරුත්තමං අත්ථචරං නරානං
යෙ තං නමස්සන්ති පසංසියා තෙ'ති.

30\. පසංසියා තෙ'පි භවන්ති භික්ඛු(මොඝරාජාති භගවා)
යෙ තං නමස්සන්ති තථා විමුත්තං,
අඤ්ඤාය ධම්මං විචිකිච්ඡං පහාය
සඞ්ගාතිගා තෙ'පි භවන්ති භික්ඛූ'ති.

---

**4 - 4 - ( 25 - 26 - 27 - 28 - 29 - 30. )**

i. මාතෘකා:-

පෙරළා නොඑන තැනට හෙවත් නිවණට නොයන්නෝ.

ii. **පිණ්ඩාර්ථය:-**

නිවණින් මෙහාට සත්ත්වයෝ ආපසු නොඑත්. කාමයන්හි බැඳුනේද, ප්‍රමත්තවූයේද, අපුනාගමන සඞ්ඛ්‍යාත නිර්වාණයට පැමිණෙන්නට නොහැක්කේය; සදාකාලික කාමයෝ නැත්තාහ, තෘෂ්ණාච්ඡන්දයෙන් පඤ්චස්කන්ධදුක්ඛය වේ. තෘෂ්ණාවිනයෙන් පඤ්චස්කන්ධ විනයවේ, (සොපාදිශෙෂ නිර්වාණයයි) පඤ්චස්කන්ධ විනය හෙතුවෙන් වෘත්තදුඃඛ විනය වේ, (අනුපාදිශෙෂ නිර්වාණ යයි.) අරමුණ සිතියම් බොහෝ ඇතත් සංකල්පිත රාගයම කාමයයි.

iii. **භාවය:-**

25. මනුෂ්‍යයන් කෙරෙහි නිත්‍යවූ වස්තුකාම ක්ලේශකාමයෝ නැත්තාහ, මේ ලෝකයෙහි යම්බඳු වස්තුකාමයන්හි පිළිබඳ සිත්ඇති යම්බඳු කාමයන්හි සිහියවා පමාවූ පුරුෂතෙම තෛභූමක වෘත්තසඞ්ඛ්‍යාත මෘත්‍යුධෙයයෙන් අපුනාගමනයයි කියන ලද නිර්වාණයට නොපැමිණෙන්නේවේද, එබඳු රූපාදී ඉෂ්ටාරම්මණයෝ වෙත්. පඤ්චස්කන්ධදුඃඛය තෘෂ්ණාච්ඡන්දයෙන් උපන්නේවේ, අනවශෙෂපරියාදානවශයෙන් පඤ්චොපාදානස්කන්ධ දුඃඛය තෘෂ්ණාවෙන් නිපන්නේ වේ, තෘෂ්ණාවිනය හෙතුවින් දුඃඛ විනය වේ, අඝ විනය සඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධවිනය හෙතුවින් වෘත්ත දුඃඛ විනය වේ.

26. ලොකයෙහි විචිත්‍රවූ යම්රූපාදී අරමුණුකෙනෙක් වෙත්ද, ඔහුතුමූ කාමයෝ නොවෙති, පුද්ගලයාගේ සුභාදිවශයෙන් සංකල්පිත වස්තුවෙහිවූ රාගයතෙම කාම නම් වේ; ලොකයෙහි චිත්‍රආරම්මණ එසේම සිටිත්; එසේ තිබියදී ධෘතිසම්පන්න පණ්ඩිතයෝ මේ රූපාදී ෂඩාරම්මණයන්හි ඡන්දරාගය නික්මවත්.

27. ක්‍රොධය දුරලන්නේය, නවවිධමානය බැහැර කරන්නේය, සියළුම දශවිධසංයොජනය ඉක්ම වන්නේය, නාමරූපවයෙහි ඇලුම් නොකරන්නාවූ රාගාදිපළිබොධ නැත්තාවූ ඒ ක්ෂීණාශ්‍රවයාකෙරෙහි දුඃඛයෝ අනුපතිත නොවෙත්.

28. ප්‍රඥපතිනාමය යමෙක් දුරුකෙළේද, නවවිධ මානයට නොපැමිණියේද, මෙහි නාම-රූප දෙකේ තෘෂ්ණාව සින්දේද, සුන්කළ තෘෂ්ණාග්‍රන්ථි ඇති නිදුක්වූ පහව ගිය ආශාඇත්තාවූ ඒ ක්ෂීණාශ්‍රවයන් වහන්සේ දෙවියෝද, මනුෂ්‍යයෝද, සොයන්නාහු මේ ලොකයෙහිද, පරලොකයෙහිද, ෂට්විධකාම ස්වර්ගයන්හිද සියලු සත්ත්වාවාසයන්හිද, නොලැබූහ. (නොලබත්)

29. ආයුෂ්මත් මොඝරාජතෙම මෙසේ කියයි. ඉදින් දෙවියෝද, මනුෂ්‍යයෝද, මෙලෙව්හිද, පරලෙව්හිද සොයන්නාහු එසේ පඤ්චවිමුක්තියෙන් හෙවත් අර්හත්ඵල විමුක්තියෙන් මිදුනාවූ නරශ්‍රෙෂ්ඨවූ මනුෂ්‍යයන්ට අර්ථචාරීවූ ඒ සර්වඥයන්වහන්සේ නොදක්නාහුද, යම්කෙනෙක් ඒ සම්බුද්ධයන් වහන්සේට කායින් හෝ වචනයෙන් හෝ අනුගතප්‍රතිපදාවෙන් හෝ නමස්කාර කෙරෙත් නම් ඔව්හු පැසසිය යුත්තෝද?

30. මොඝරාජය! යම්කෙනෙක් එසේ පඤ්චවිමුක්තියෙන් මිදුනාවූ ඒ තථාගතයානන් වඳිත්ද, ඒ භික්ෂුහුද පැසසියයුත්තෝ වෙත්; ඒ භික්ෂුහුතුමූ චතුස්සත්‍ය ධර්මය දැන විචිකිත්සාව සමුච්ඡෙද වශයෙන් පහකොට රාගාදී රඤ්ජනයන් ඉක්මගියාහුද වෙත්; භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.

v. ප්‍රකාශිකරණාර්ථ:-

**කාමනීයානි**=රූපාදී ඉෂ්ටාරම්මණයෝ **චිත්‍රානි**=ආරම්මණ චිත්‍රයෝ; **සංකප්පරාගො**=සංකල්පිත රාගයයි; මෙසේ මෙහි වස්තුකාම ප්‍රතික්ෂෙපකොට ක්ලේශකාමයම කාමයයි කියනලදී. මේ අර්ථය වනාහි "**පසූරසූත්‍ර**" යෙන් විභාග දතයුතු වේ.

**සැරියුත්** තෙරුන් විසින් සංකප්පරාගය (සලකා ගත් ආසාව) පුරුෂයාට කාමයයි කියනලදින් **පසූර පරිබ්‍රාජක** තෙමේ මෙසේ කීය.

"න වෙතෙ කාමා යානි චිත්‍රානි ලොකෙ
සංකප්පරාගඤ්ච වදෙසි කාමං,
සංකප්පයං අකුසලෙ විතක්කෙ
භික්ඛූ'පි තෙ හෙස්සති කාමභොගී."

"ලොකයෙහි යම් විසිතුරු වස්තු ඇත්නම් ඒවා කාමනොවෙත්ය සංකල්පිතරාගය කාමයකැයිද කියන්නෙහිය; එසේනම් අකුශල විතර්ක සංකල්පනය කරන්නාවූ ඒ භික්ෂුහුද කාමභොගීන් වන්නෝය."

ඉක්බිති **පසූර** පිරිවැදියාට **සැරියුත්** තෙරුන්වහන්සේ මෙසේ වදාළේය.

"තෙ වෙ කාමා යානි චිත්‍රානි ලොකෙ
සංකප්පරාගං න වදෙසි කාමං,
පස්සන්තො රූපානි මනොරමානි
සුණ්‍යාපි' තෙ හෙස්සති කාමභොගී."

සුණනො සද්දානි-සායනො ගන්ධානි-සායනො රසානි-ඵුසන්නො ඵස්සානි මනොරමානි, සබ්බාපි තෙ හෙස්සන්ති කාම භොගී'ති.

ලොකයෙහි විසිතුරු යම් යම් දේ කාමයෝ වෙත්නම්, සංකප්ප රාගය කාමයයි ද නොකියන්නෙහි නම් මනොරම රූප දකින් නාවූ නුඹේ ශාස්තෘද කාමභොගී වන්නේය.

මනොරම්‍ය ශබ්ද ශ්‍රවණය කරන්නාවූ, ගන්ධාඝ්‍රාණය කරන් නාවූ, රස සායනය කරන්නාවූ, පහස් ස්පර්ශ කරන්නාවූ, තොපගේ ශාස්තෘතෙමේ ද කාමභොගියෙක් වන්නේය, කියායි.

අථෙත්ථ ධීරා=එසේ ඇතිකල්හි මේ අරමුණුවල පණ්ඩිතයෝ ඡන්දරාගය දුරුකරත්.

සංයොජනං සබ්බං=දසවිධ සංයොජන (සසර බැඳුම් දසය.)

අකිඤ්චනං=රාගකිඤ්චන (පලිබොධ ඇලීම්) ආදිය නැති;

නානුපතන්ති දුක්ඛා=වට්ටදුක් වනාහි ඔහු මත්තෙහි නොවැටෙත්.

පහාසි සබ්බං=යනාදී ගාථාව ඒ පිරිසෙහි අනුසන්ධිකුසල මොඝරාජ නම් ස්ථවිරතෙම මෙහි අර්ථය අනුසන්ධිවිධියට (ගැලපීමට) නොගියේය යි සිතා අනුසන්ධි ගලපමින් මෙසේ කීය.

ඉධ වා හුරං වා=මෙලොව හෝ පරලොව; නරුත්තමං අත්ථ චරං නරානං=සියලු ක්ෂීණාශ්‍රවයෝ මිනිසුන්ට උත්තමද, මිනිසුන් අතුරෙන් අර්ථචාරීද වෙත්; මොඝරාජ ස්ථවිරයෝ වනාහි දසබල ධාරීන් වහන්සේ සඳහාම මෙසේ කීහ.

යෙ තං නමස්සන්ති පසංසියා තෙ=යම් හෙයකින් එසේ මිදුනාවූ ඒ බුදුන්ට දෙව් මිනිසුන් නමදින්නාහු නම්, නවද යම් භික්ෂු කෙනෙක් ඒ භාග්‍යවතුන් වහන්සේට කායකර්ම වාක්කර්ම වශයෙන් හෝ අනුකූල ප්‍රතිපත්තියෙන් හෝ නමස්කාර කරන්නාහු නම් ඔවුහු ප්‍රශංසා කළ යුත්තෝද, නොහොත් අප්‍රශංසාහීයෝ දූයි; අඤ්ඤාය ධම්මං= චතුස්සත්‍යධර්ම දැන; සඞ්ඝාතිගා තෙපි භවන්ති=යම් කෙනෙක් ඒ භාග්‍යවතුන්වහන්සේ කාය-වචන-අනු ප්‍රතිපත්ති වශයෙන් නමදිත්ද, (පුදත්ද) ඔහුතුමූ සිව්සස් දහම් දැන සැක හැර සඞ්ඝාතිග ද වෙත්; පසංසිය ද වෙත්.

——:——

## 4. 4. නසන්ති සූත්‍රප්‍රදීපයයි.

——:——

31. අඤ්ඤථා සන්තමත්තානං-අඤ්ඤථා යො පවෙදයෙ,
නිකච්ච කිතවස්සෙ'ව-භුත්තං ථෙය්‍යෙන තස්ස තං.

32. යං හි කයිරා තං හි වදෙ-යං න කයිරා න තං වදෙ,
අකරොන්තං භාසමානං-පරිජානන්ති පණ්ඩිතා'ති.

33. නයිදං භාසිතමත්තෙන-එකන්තසවණෙන වා,
අනුක්කමිතුං වෙ සක්කා-යායං පටිපදා දළ්හා;
යාය ධීරා පමුච්චන්ති-ඣායිනො මාරබන්ධනා.

34. න වෙ ධීරා පකුබ්බන්ති-විදිත්වා ලොකපරියායං,
අඤ්ඤාය නිබ්බුතා ධීරා-තිණ්ණා ලොකෙ විසත්තිකං'ති.

35. අච්චයං දෙසයන්තීනං-යො චෙ න පටිගණ්හති,
කොපන්තරො දොසගරු-ස වෙරං පටිමුඤ්චතී'ති.

36. අච්චයො චෙ න විජ්ජෙථ-නොචීධාපගතං සියා,
වෙරානි ච න සම්මෙය්‍යුං-කෙනීධ කුසලො සියා'ති.

37. කස්සච්චයා න විජ්ජන්ති-කස්ස නත්ථි අපාගතං,
කො න සම්මොහමාපාදි-කො'ධ ධීරො සදා සතො'ති.

38. තථාගතස්ස බුද්ධස්ස-සබ්බභූතානුකම්පිනො,
තස්සච්චයා න විජ්ජන්ති-තස්ස නත්ථි අපාගතං;
සො න සම්මොහමාපාදි-සො'ධ ධීරො සදා සතො,

39. අච්චයං දෙසයන්තීනං-යො චෙ න පටිගණ්හති,
කොපන්තරො දොසගරු-සං වෙරං පටිමුඤ්චති;
තං වෙරං නාභිනන්දාමි-පටිගණ්හාමි වොච්චය'න්ති.

---

4 - 6 ( 31 - 39. )

i. **මාතෘකා ;-**

**බුද්ධබලය හා පණ්ඩිතමානී දෙවතාවෝ.**

ii. **පිණ්ඩාර්ථය :-**

31. වචනය අතකින් යයි; ක්‍රියාව වෙන අතකින් යයි, කියා තථාගතයන් වහන්සේගේ සිව්පස පරිභොගයට දෙස් නැගීම.

32. මෙතෙම කාරක (කරන්නා)ද අකාරක (නොකරන්නා) දැයි පණ්ඩිතයෝ දැනගණිති.

33-39. ධර්මානුධර්මප්‍රතිපදාව දෘඪයි, සථිරයි, ආරම්මණූපනිජ්ඣාන ලක්ඛණූපනිජ්ඣාන දෙක නිසා මාරබන්ධනයෙන් මිදෙත්; ප්‍රතිපදාව කියූ පමණින් හා ඇසූපමණින් පිළිපදින්ට

නොහැකි වේ, ලොකපරියාය දත් ධීරයෝ අතිශර්ම කථා නොකියත්, අහසේ සිට දෙස්කිවෝ බිමට බැස පාමුල වැටී වැඳ සමාව ඉල්වීම, තථාගතයන් වහන්සේ අග්‍රදන්ත දක්වා සිනා පහළකිර්ම, සදෙවක ලොකාග්‍ර පුද්ගල තථාගතයන් මහජනයාට සමාන කිරීම; සමාව නොදීමෙන් වැරදි වැඩිවන බව.

ප්‍රථමයෙන් බුඩබලය පෙන්වා පසුව සමාව දීම, බුදුන් කිපියේ වෛර ගැටගසත්ය යි කියූ දෙවියෝ; වහාම සමාව නොදීම, බුදුන් හැර ඉක්මන් නොවන්නේ කව්ද? අපරාධ නැත්තේ කාගේද? මූළා නොවන්නා කව්ද? සැමදම සිහි ඇති පණ්ඩිතයා කව්ද? බුඩ නාමය **විමොක්ඛන්තික පණ්ණත්ති** වශයෙනි. වෛරය මම සතු වින් නොපිළිගණිමි, නොපතමි, ඇවැත් දෙසීම නොපිළිගත් තොත් කොපනතර වේ, දෙෂගරු වේ, තොපගේ වරද පිළි ගණිමි. (කමාව දෙමි).

iii. **භාවශ:-**

31. යමෙක් අන්‍යාකාර ඇති තමන් වෙත අයුරකින් ප්‍රකාශ කරන්නේද, සාකුණිකයාගේ ලිහිණිමස් කෑම මෙන් ඒ කුහක මහණ විසින් නිකතියෙන් වඤ්චාවෙන් අනුන් රවටා ඒ සියළුම සිව්පසපරිභොගය සොරෙන් අනුභව කරණ ලද්දේ වේ.

32. යමක් තමන්කරන්නේ නම් එයම කියන්නේය; යමක් නොකරන්නේ නම් එය නොකියන්නේය; තමා නොකරන දේ කියන්නහු නුවනැත්තෝ දනගණිත්.

33. යම් මේ ප්‍රතිපදාවක් සපිරද, යම් ප්‍රතිපත්තියකින් ධ්‍යාන කරණ ධීරයෝ මාරබන්ධනයෙන් මිදෙත්ද, ඒ මේ ප්‍රතිපත්තිය කී මතකින් හෝ ඇසූ පමණින් ඒකාන්තයෙන් පිළිපදින්ට නොහැක්කේය.

34. **සංස්කාර** ලොකයාගේ ඇතිවීම හා නැතිවීම දන දුක්ඛාදී චතුස්සත්‍යධර්මයන් අවබොධ කොට ලොකයෙහි කෙලශපරිනිර්වාණ යෙන් පිරිනිවියාවූ **විසත්තිකා** සඞ්ඛ්‍යාත තෘෂ්ණාව එතර කළාවූ ධීරයෝ මෙසේ නොකරත්.

35. යමෙක්තෙම වරද කියා සිටින්නන්ගේ වරද නොපිළි ගණිද, ඇතුළත උපන් කොපය ඇති වෙෂයම ගරුකොට හැසි රෙන්නාවූ එ තෙමේ වෛරය ගැටගසා තබයි.

36. ඉදින් යුක්තිය ඉක්මවා යාමක් නැත්තේද? මෙහි අප රාධයකුත් නොවන්නේද? ඔහුගේ වෛරයෝ නොසන්සිඳෙන් නාහු නම් ඒ තෙමේ කවර කාරණයෙන් නිවැරදි පැවැත්මෙහි දක්ෂ වන්නේද?

37. කවරෙකුගේ ප්‍රඥප්තිව්‍යතික්‍රම වරද නැත්තාහුද? (වරද නැත්තේ කාගේද?) කවරෙකුගේ අපරාධ නැත්තේද? කවරෙක් සම්මෝහයට නොපැමිණියේද? (මෝඩනොවූයේ කවුද?) මේ ලොකයෙහි සැම කල්හි සිහි ඇති පණ්ඩිතයා කවරෙක්ද?

38. චතුස්සත්‍යාවබොධය කළාවූ සියලු සත්වයන් කෙරෙහි පතළ අනුකම්පා ඇති ඒ තථාගතයන් වහන්සේගේ වැරදි නැත්තාහ; උන්වහන්සේගේ අපරාධයක්ද නැත්තේය; සිහිමුළාවටද නොපැමිණෙයි. හැම කල්හි සිහි ඇති ධීරයා ද උන්වහන්සේ ම ය.

39. යමෙක් වරද දෙසන්නවුන්ගේ වරද නොපිළිගණීද? හෙතෙම කොපනාතරය; වෙෂගරුය, වෛරබඳින්නේයි, තොප කීසේ මැනව, එකී වෛරය නොපතමි; තොපගේ වෛරය පිළිගණිමි, ක්ෂමාකරමි.

iv. **අනුවාදය:-**

මේ ධර්මකථාවෙහි **නිදානය** මෙසේ දක්වා තිබේ, **උජ්ඣාන සඤ්ඤික** දෙවතාවෝ අහසෙහි සිටියාහු **"අඤ්ඤථා"** යනාදී දොෂාරොපන ගාථාවෝ තථාගතයන් වහන්සේගේ සිව්පස පරිභොගය උදෙසා ශබ්ද නගා කිවෝය.

ඔවුන්ට මෙබඳු අදහසක් විය; ශ්‍රමණභවත් ගෞතමයන් වහන්සේ භික්ෂූන්ට පසුල් සිවුරුදරීම (පාංශුකූල චීවර ධාරණය) පිණ්ඩපාලොපභොජනය වෘක්ෂමූල ශයනාසනය (රුක්මුල්-සෙනසුන) ගොමූත්‍ර භෛෂජ්‍යයන් ගෙන්(බෙහෙත් අරළුයෙන්) සන්තොෂයම පයසීතනකාරිත්වයෙන් හෙවත් අනතිම දක්වා වර්ණනා කරයි; තෙමේ වනාහි එළුලොම් දුහුල් කොමු ආදියෙන් කළ සිවුරු දරයි; රජ්ජහී උතුම් භොජනය වළඳයි, දෙව් විමන් වැනි ගඳකිළියෙහි වූ උතුම් යහනෙහි හොවියි, දහවල් කාලයෙහි මහජනයාට ධර්ම දෙශනාකරයි, ඔහුගේ (අවවාද) වචනය වෙන අනකය, ක්‍රියාව නවත් අනකය යි හඬ නගා කියමින් ආවාහුය. එහෙයින් ඔවුන්ට ධර්මසඞ්ගාහක තෙරුන් විසින් **"උජ්ඣාන සඤ්ඤිකා"** යයි නම් තබනලදී.

v. **ප්‍රකටීකරණාර්ථ:-**

**කිතවස්සෙව**=මෙහි ලිහිණිවැද්දට **කිතවයා** යයි කියනු ලැබේ. හෙතෙම යම්සේ තමා පඳුරක් නොවන්නේද, කොල අතුආදියෙන් ස්වකීය ශරීරය වැසීමෙන් පඳුරක ආකාර දක්වා තමා ලඟට පැමිණි මොණර-වටු ආදී පක්ෂීන් මරා අඹුදරුවන් රකින්නේය, මෙසේ ඒ ලිහිණිවැද්ද පක්ෂීන් රවටා ලිහිණිමස් අනුභවකරන්නාක් මෙන් කුහකයාද පංසුකූලයෙන් තමා වසා කථාවෙහි දක්ෂ බැවින් මහජනයා වඤ්චාකොට උදරපොෂණය කරමින් හැසිරෙන්නහු එ මෙනැයි දතයුතුයි.

**භුත්තං ථෙය්‍යෙන තස්ස තං**=ඔහුගේ සියලුම සිව්පස පරිභොගය සොරෙන් වැළඳුයේ නම් වේයයි දෙවතාවා භාග්‍යවතුන්වහන්සේ සඳහා කියයි.

**පරිජානන්ති පණ්ඩිතා**=මේ කාරකයා ද මේ අකාරකයා දැයි පණ්ඩිතයෝ දනිත් කියා ඒ දෙවතාවෝ තථාගතයන්ටත් වඩා අපි ම පණ්ඩිතයයි මම්මන්ව මෙසේ කිහු.

**යායං පටිපදා දළ්හා**=මේ ධර්මානුධර්මප්‍රතිපදාව දෘඪ වේ, ස්ථිර වේ; යම් පිළිපැදීමකින් ධෘති සම්පන්න පණ්ඩිතයෝ අරමුණු ලඟට ගෙන සිතීමෙන් ද, ලකුණු සිතට ගෙණ සිතීමෙන් දැයි ධ්‍යානදෙකෙන් දැහැන් වඩන්නෝ මරහුගේ බැම්මෙන් මිදෙත්ද, තත් ප්‍රතිපදාවට **භාෂිත** මාත්‍රයෙන් හෝ **ශ්‍රවණ** මාත්‍රයෙන් බැසගැණීමට හා පිළිපැදීමට නොහැකියි.

**න වෙ ධීරා පකුබ්බන්ති**=ධීරයෝ පණ්ඩිතයෝ සංස්කාර ලෝකයේ උදය (නැගීම) ව්‍යය (බැසීම) පරියාය දැන සිව්සස් දහම් ද අර්හත් මාර්ගඥානයෙන් දැන ක්ලේශපරිනිර්වාණයෙන් පිරිනිව්යෝ ලොකයෙහි ශක්ත විශක්තතා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව තරණය කළාහු 'තොපි කිසේ නොකරත් අපි මෙබඳු විරොධකථා නොකියමු'යයි වදාළසේක.

මෙසේ වදාළ කල්හි අහසේ නැවතී දෙස් කී දෙවතාවෝ අප විසින් අයුක්තක් කළෝය. නොකරන කොතෙක් ම කාරකවාද යෙන් අපි සමුදාචරණය (කියාපෑම) කළම්හ යි ලජ්ජාවෙන් මහා බ්‍රහ්මයා කෙරෙහි මෙන් භගවත් කෙරෙහි ගෞරව පෙරදැරිව ගිනි කඳක් වැනි උන්වහන්සේ ලඟට ලංවීම දුෂ්කරයයි කල්පණාකොට දක්නාහු අහසින් බැස බිම සිට කියනුවෝ ස්වාමීනි! අපරාධය අප ඉක්මවා පැවැත්තේය;(කුමක්හෙයින්ද? ඒ දෙවතාවෝ තථාගතයන් නොවැද අහසේ නැන්පත්වෙමින් කයින් ගැටූහ. කිතවයාගේ (ලිහිණිවැද්දාගේ) උපමාව කියා පා නානාප්‍රකාර අසභ්‍ය වචන කියමින් වචනයෙන් ගැටූහ.) අනාගතසංවරය පිණිසත්, තවත් මෙබඳු අපරාධ දෝෂ ස්ඛලිතයක් නොකිරීමටත්, අපේ වරද පිළිගෙණ ක්ෂමා කෙරේවා'යි" කී කල්හි භාග්‍යවතුන්වහන්සේ දන්තාග්‍ර දක්වා පහවූ අයුරෙන් සිනා පහළ කළසේක. මක්නිසාද? ඒ දෙවතාවෝ දෙවියන්ගේ ස්වභාවයෙන් ක්ෂමාකරවත්, ලෞකික මහජනයාත් දෙවියන් සහිත ලොකාග්‍රපුද්ගල තථාගතයනුත් එක සමාන කරත්. එහෙයින් භාග්‍යවතුන්වහන්සේ මත්තෙහි කථා උපන්කල බුදුබල පෙන්වා පසුව සමාවන්නෙමියි සිනාපහළ කළසේක. එවිට දෙවතාවෝ වඩ වඩාත් නුගුණ කියමින් අහස් මත්තට නැගුනාහ.

මූන්වහන්සේ අදට කිපියේ වනැයි සිතමින් "අච්චයං" යනාදී ගාථාද කිවේය. **කොපන්තරෙ**=අභ්‍යන්තරයෙහි උපන් කොප ඇත්තේ; **දොසගරූ**=ද්වේෂය ගුරුකොට ගෙන වසන්නේ; **ස වෙරං පටිමුඤ්චති**=ගැට අමුනන්නාක්මෙන් ඒ වෛර ආත්ම යෙහි ප්‍රතිමුක්තකරයි, තබයි, ප්‍රතිනිස්සජනය නොකරයි, යන අදහසයි.

**තථාගතස්ස**='තථාගතො' යනාදි කාරණයන්ගෙන් තථා ගතවූ; කරුණු අටකින් භාග්‍යවතුන් වහන්සේ තථාගත වේ.

1. තථා ආගතො'ති=තථාගතො.
2. තථා ගතො'ති=තථාගතො.
3. තථලක්ඛණං ආගතො'ති=තථාගතො.
4. තථධම්මෙ යථාවතො අභිසම්බුද්ධො'ති=තථාගතො.
5. තථදස්සිතාය=තථාගතො.
6. තථාවාදිතාය=තථාගතො.
7. තථාකාරිතාය=තථාගතො.
8. අභිභවනට්ඨෙන=තථාගතො-කියායි.

(1) **තථා ආගතො'ති තථාගතො**=යම්සේ සකලලොක යාට හිතපිණිස උත්සාහයට පත් **විපස්සි** ආදී පළමු සම්‍යක්සම්බුදු වරයෝ යම් අභිනීහාරය (ප්‍රාර්ථනාව)කින් ආවෝනම් අප භාග්‍ය වතුන් වහන්සේද, එසේ දාන, ශීල, නෛෂ්ක්‍රම්‍ය, ප්‍රඥා, වීර්‍ය්‍ය, ක්ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී, උපෙක්ෂා යන දසය, පාරමිතා උප පාරමිතා, පරමාර්ථ පාරමිතා වශයෙන් ත්‍රිවිධවූ සමත්‍රිංශත් (30) පාරමිතා පරිපූර්ණව, අඞ්ග, නයන, ධන, රාජ්‍ය, පුත්‍ර, දාර පරිත්‍යාග, පූර්වයොග, පූර්වචර්‍ය්‍යාදිය පුරා බුද්ධචර්‍ය්‍යාදියෙන් කොටි ප්‍රාප්තව ආයේය.

යම්සේ **විපශ්‍යාදි** සම්බුදුවරයෝ සතර සතිපට්ඨාන, සතර සම්‍යක්ප්‍රධාන, සතර ඍද්ධිපාද, පඤ්චෙන්ද්‍රිය, පඤ්චබල, සප්ත බොධ්‍යඞ්ග, ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගී වඩා භාවිතකොට ආසේක්ද එසේ අප භාග්‍යවතුන් වහන්සේ ද ආයේනුයි "තථාගත"වූසේක.

කියේ මැනෝ:—

"යථෙව ලොකම්හි විපස්සි ආදයො
සබ්බඤ්ඤුභාවං මුනයො ඉධාගතා,
තථා අයං සක්‍යමුනී'පි ආගතො
තථා ගතො වුච්චති තෙන චක්ඛුමා'ති."

ඉතිරි (7) පදයන්ගේ විස්තර මනොරථපූරණී (ත්‍රිපිටක මුද්‍රණ 58 පිට) බලා දතයුතුයි.

—:—

## 4. 5. උජ්ඣානසඤ්ඤික සූත්‍රප්‍රදීපයයි.

—:—

40. සද්ධා දුතියා පුරිසස්ස හොති
නො චෙ අස්සද්ධියං අවතිට්ඨති,
යසො ච කිත්ති ච තත්වස්ස හොති
සග්ගං ච සො ගච්ඡති සරීරං පහාය'ති.

41. කොධං ජහෙ විප්පජහෙය්‍ය මානං
සංයොජනං සබ්බමතික්කමෙය්‍ය,
තං නාමරූපස්මිං අසජ්ජමානං
අකිඤ්චනං නානුපතන්ති සඞ්ගා.

42. පමාදමනුයුඤ්ජන්ති-බාලා දුම්මෙධිනො ජනා,
අප්පමාදං ච මෙධාවී-ධනං සෙට්ඨං 'ව රක්ඛති.

43. මා පමාදමනුයුඤ්ජෙථ-මා කාමරතිසන්ථවං,
අප්පමත්තො හි ඣායන්තො-පප්පොති පරමං සුඛන්ති.

---

**4 - 6 - ( 40 - 41 - 42 - 43. )**

i. **මාතෘකා:—**

**ශ්‍රද්ධාව දෙවැන්නීය; අප්‍රමාදය ධනයයි.**

ii. **පිණ්ඩාර්ථය:-**

දෙව්-මිනිස්-නිවන් තුනට ම ශ්‍රද්ධාව සහාය (යහළු) වෙයි; යශස් කීර්ත්ති ශ්‍රද්ධාවෙන් ලැබෙයි; බාලයෝ ප්‍රමාද යෙහි යෙදෙත්; මෙධාවී අප්‍රමාද ධනය රකියි; අප්‍රමත්තව ධ්‍යාන වඩන්නේ රහත් සුව ලබයි.

iii. **භාවය:-**

40. පුද්ගලයෙකුට ශ්‍රද්ධාතොමෝ සහාය කෘත්‍යකරමින් තම හට දෙවෙනියා වෙයි; යම්හෙයකින් අශ්‍රද්ධාවන්තභාවය නොසිටී නම් ඒ ශ්‍රද්ධා හෙතුවෙන් ඔහුට පිරිවර ද, ගුණකීම ද වේ; හේ සැදැහැත්තේ මිනිස්සිරුර හැර දෙව්ලොවට ද යයි.

41. මේ වර්ගයෙහි (4-27) 'නාසනති' සූත්‍රභාවය බලනු.

42. මෙලෝ පරලෝ අර්ථ නොදන්නාහෙයින් බාලවූ නුවණ නැති ජනයෝ **සතිවිප්පවාස** පමාවෙහියෙදී කල්යවත්; **ධම්මොජ පඤ්ඤා** සමන්විත පණ්ඩිතතෙමේ එළඹ සිටි සිහියවූ අප්‍රමාදය පරම්පරාගත මුතු මැණික් ආදී උතුම් ධනයක් මෙන් රකියි.

43. පමාදය අනුයොග (අනුවයෙදීම) නොකරව්! කාමරති සත්ථවය නොකරව්! හෙවත් කාමවස්තූන්හි කෙලශකාමයෙන් නො ඇලෙව්! අප්‍රමත්තව ධ්‍යාන කරණ තැනැත්තෝ උතුම්වූ අර්හත්ඵල සැපතටපැමිණෙයි.

iv. **අනුවාදය:-**

**"සද්ධා දුතියා"-"කොධං ජහෙ"**-යන ගාථා දෙක **සතුල්ල පකායික දෙවතා** දෙදෙනෙක් කිහ.

v. **ප්‍රකීර්ණාර්ථ:—**

**සද්ධා දුතියා පුරිසස්ස හොති**=පුරුෂයාට දිව්‍ය ලොකයෙහිද, මනුෂ්‍යලොකයෙහිද, නිවන්යාමෙහිද, ශ්‍රද්ධාව සහාය සෘත්‍ය සාධකයි.

**නානුපතන්ති සඞ්ගා**:=රාග සඞ්ගාදී පඤ්චසඞ්ගයෝ අනුපතිත නොවෙත්.

**ඣායෙනො**:-ලක්ෂණූපනිධ්‍යානයෙන්ද, ආලම්බනූපනිධ්‍යාන යෙන්ද, ධ්‍යාන කරන්නෝ: එහි **ලක්ෂණූපනිධ්‍යාන** නම් විදර්ශනා, මාර්ග, ඵල තුනයි; **විදර්ශනාව** වනාහි ත්‍රිලක්ෂණ (අනිත්‍ය-දුඃඛ-අනාත්ම) සම්පකොට නිදහන් කෙරේනුයි= ලක්ෂණොප නිධ්‍යානයි; **මාර්ගය** විපස්සනෙන් ආ කිස සාදයි කියා=ලක්ෂණොප නිධ්‍යාන වී; **ඵලය** තථ ලක්ෂණ නිරොධ සත්‍යය වෙතට ගෙණ චින්තනය කරයි කියා=ලක්ෂණොපනිධ්‍යානයි. අෂ්ටසමාපත්තීහු වනාහි කසිණ අරමුණ සම්පකොට බලන හෙයින් **ආරම්මණොප නිධ්‍යාන** යයි දතයුතුයි.

**පරමං සුඛං**=මෙයින් අර්හත්සුවය අදහස් කරණ ලදී.

——:——

## 4. 6. සද්ධා සූත්‍රප්‍රදීපයයි.

——:——

44. මහාසමයො පවනස්මිං-දෙවකායා සමාගතා,
ආගතම්හ ඉමං ධම්මසමයං–දක්ඛිතායෙ අපරාජිතසඞ්ඝන්ති.

45. තත්‍ර භික්ඛවො සමාදහංසු-චිත්තං අත්තනො උජුකමකංසු,
සාරථී'ව නෙත්තානි ගහෙත්වා–ඉන්ද්‍රියානි රක්ඛන්ති
පණ්ඩිතා'ති.

46. ඡෙත්වා ඛීලං ඡෙත්වා පළිඝං-ඉන්දඛීලං ඌහච්චමනෙජා,
තෙ චරන්ති සුද්ධා විමලා-චක්ඛුමතා සුදන්තා සුසුනාගා'ති.

47. යෙ කෙචි බුද්ධං සරණං ගතාසෙ-න තෙ ගමිස්සන්ති අපායං,
පහාය මානුසං දෙහං-දෙවකායං පරිපූරෙස්සන්ති'ති.

---

4 - 7 - ( 44 - 45 - 46 - 47. )

i. මාතෘකා:—

**මහා සමාගම් සම්පත්ති සහ සරණගමන ඵලය.**

ii. පිණ්ඩාර්ථය:—

ශාක්‍ය ජනපදය, දිය දබරය, කුලමලකිම, ධාන්‍ය නිසාවූ රජ යුද්ධය, නෑසින්ගේ කලහ සමාදානය, පොළවේ අගය, කල්පාන්ත ක්‍රෝධප්‍රභවය, පරපත්නී නොවියයුතු බව, බලවත් ද දුබල වේ, සම ගියේ සිදුරු නැත, විවාදයේ ආශ්වාද නැත, දෙදහසක් පිරිවර සතර-මහදිව් රජය, ක්ෂත්‍රිය පරිවාරය, සිය කැමැත්තෙන් පැවිදි නොවූවන්ගේ කළකිරීම, **කුණාලඩිල** බලන්ට අහසින් යාම, මගේ වංශය, මගේ ප්‍රවේණිය, ගාථා තුන්සියයකින් විල් වර්ණනාවක්, සොවාන් මගින් සෘද්ධිප්‍රතිලාභය, බුද්ධානුභාවයෙන් ගොස් ස්වකීයානුභාවයෙන් ආපසු ඊම, කමටහන් දීම, උත්තම පුරුෂයන් වීමට ගස් මුල හිඳීම, දසදහසක් සක්වල දෙවියන් එක සක්වල රැස්වීම, පිළිවෙළින් පන්සියක් රහත්වීම, තම ගුණ කිමට ඔබ මොබ (වට පිට) බැලීම, රහතුන්ගේ ආකාර දෙක, ආයඝීමණ්ඩලය සහ චන්ද්‍රමණ්ඩලය, මහාසම්මත වංශික ක්ෂත්‍රිය රජ ප්‍රව්‍රජිත සමාගම, පාරිශුද්ධි සතරක්, දඹදිව ප්‍රමාණය, බඹලොව උස, අනාගාමී ක්ෂීණාශ්‍රවයන්ගේ ආවාස පස, මහාසමාගමට හිස්අතින් නොපැමිණීම, සිත් සෘජු කිරීම, තිල්වත්, රත්වත්, ලේවත්, සුදුවත්, සිව්දිගුන් අපරාජිත සඞ්ඝදර්ශනය, ඉන්ද්‍රඛීල, පසැස්, සුදාන්තයෝ, සුසුනාගයෝ හා තිබ්බමතික සරණගමණයද විස්තර වන්නේය.

iii. භාවය:-

44. භාග්‍යවතුන් වහන්ස! මේ වනලැහැබෙහි අද මහාසමූහ සන්නිපාතයකි; දිව්‍යසමූහයෝ රැස්වූහ; එසේ රැස්වූ දිව්‍යකාය දැක අපිත් මේ ධර්ම සමූහයට ආම්හ; කුමන කාරණයකින්ද? කිසි

වෙක් විසින් නොපරදවන ලද අදම තුන්මරුන් පරදවා දිනූ සඞ්ග්‍රාම ඇති සඞ්ඝයා දශීනය පිණිසයි; මේ ගාථාව කියා ඒ බ්‍රහමයා භාග්‍යවතුන්වහන්සේ වැඳ පුරත්‍ථිම (පෙරතු) සක්වළ මුවවිට්යෙහි ම සිටියේය.

45. (ඉක්බිති අදවෙනි බ්‍රහමතෙමේද) ඒ සන්නිපාත(සභා) යෙහි භික්ෂූහු සමාධියෙන් යෙදුනාහු; තමන්ගේ සිත් සියලු වඞක කුටිල ශඨ බැව් හැර සෘජු කළාහුය; රැහැන් ගෙන සිටි සාරථින් මෙන් පණ්ඩිත භික්ෂූහු ඉන්ද්‍රියයන් රකිත්-යයි කියා දක්ෂිණ චක්‍රවාට මුවවිට සිට්යේය.

46. රාග, මොස, මොහ බිලය (කණුව) සිඳ දමා කණයම (දොරපලුව) ගලවා ඉන්ද්‍රබිලය හෙවත් එලිපත උදුරා දමා තෘෂ්ණා එදය නැති නිරුපක්ලෙශවූ එහෙයින් නිර්මලවූ චක්ෂුර්මත්වූ මොන වට මුනු නාවූ තරුණ නාගවූ ඒ භික්ෂූහු හැසිරෙත්-යයි කියා පසු දිග මුවවිට සිටගත.

47. (සතරවෙනි දෙවතාවා මෙසේ කියේය.) යම් කිසි කෙනෙක් බුදුන් විමති රහිතව සරණකොට ගියාහු වෙත්ද ඔව්හු අපායට නොයන්නාහුය, මනුලොව සිරුර හැරදමා දෙව්ලොව සම්පූණි කරන්නෝයයි-කියා උතුරුදිග මුවවිට සිටගත.

iv. අනුවාදය:-

මහාසමය=සූත්‍රයෙහි නිදානය මෙසේයි; එක් සමයෙක භාග්‍ය වතුන් වහන්සේ ශාක්‍යජනපදයෙහිවූ කිඹුල්වත්පුර මහවන යෙහි රහත්වූ සියල්ලන්ගෙන් යුත් පන්සියයක් භික්ෂූන් සමග වාසය කළසේක; එතනට දසවිධ ලොකධාතුවෙන් දෙවතාවෝ බොහෝ කොට රැස්වූහ; භික්ෂුසඞ්ඝයා සහිත භාග්‍යවතුන් වහන්සේ දක්නා පිණිසය; සමවතින් නැගිට් ශුද්ධාවාසකායික දෙවතාවෝ සිව්දෙනෙක්හට මෙසේ අදහස් උපන; "අපි ද භාග්‍යවතුන්වහන්සේ වෙත එළඹ උන්වහන්සේ සමීපයෙහි වෙන වෙනම ගාථා සතරක් කියමු" කියායි. ඉක්බිති ඒ දෙවතාවෝ වක්කල අතක් දික්කරණ කෙළියෙන් සුද්ධාවාසයෙන් අතුරු දන්ව භාග්‍යවතුන්ගේ පෙරටුවට බැස්සාහුය; එයින් එක් එක් දෙවතාවෙක් බුදුන් වැඳ එකත්පසක සිට මේ ගාථා කිවාහුය.

එහි පිළිවෙළ කථාව මෙය වේ:- ශාකිය- කෝලිය දෙපස නෑයෝ කිඹුල්වත් නුවරටත් කෝලිය නුවරටත් අතර රෝහිණී නදිය එකම අමුණුබැම්මෙන් බඳවා ගොයම් කරවත්; ඉක්බිති පොසොන් මස මුල් කාලයෙහි ශෂ්‍ය මලානික වනවිට දෙනුවර වැසියන්ගේ කම්කරුවෝ රැස්වූහ; එහි කෝලිය නගරවැසියෝ

මෙසේ කීහ:—"මේ වතුර දෙපසකින් හැරගන්නේ තොපටත් නොපොහොයි,(නොසෑහෙයි) අපටත් නොසෑහෙයි, අපේ ගොයම එකම වතුරකින් නිපදින්නේය; (පිදෙන්නේය) මේ වතුර අපට දෙව්''යි. **කපිලවස්තු නගර වැසියෝද** මෙසේ කිවාහුය:-"තොප කොටු පුරවා සිටියදී අපි රනසවණී (රත්රන්) නිල්මැණික් කලු කහවනුත් ගෙණ පැස්, පසුම්බි ආදියද සමග තොපේ ගේ දෙරේ ඇවිදින්නට නොහැක්කෙමු, අපේ ගොයමුත් එක දියකින්ම නිෂ්පාදනය (පිදීම) වන්නේය; මේ දියවාරය අපට දෙව්"යි. "අපි නොදෙන්නෙමු"යි මෙසේ කථා වැඩිකොට (බහින්බස්වී) එකෙක් නැගිට එකෙකුට පහර දුන්නේය, ඔහු අනිකෙකුට දුයි මෙසේ ඔවුනොවුන් එකිනෙකා පහරදීගන රාජකුල දෙක සම්බන්ධ ජාතිය ගට ගටා කලහ වැඩූහ.

**කෝලිය කම්කරුවෝ** කියත්="තොපි කිඹුල්වත් වැසියන් ගෙණ ගජිනා කරව්ද? (ජගත්කම් කියන්නහුද?) සමහර එනෙක් බලු සිවල් ආදීහු මෙන් තමතමන්ගේ භගිණීන් සමග සංවාස කලෝද ඔවුන්ගේ ඇත්හුද, අශ්වයෝද, ඵලකාවුධද අපට කුමක් කරන්නෝ දැයි". **ශාක්‍ය කම්කරුවෝ** කියත්:-තොපි දුන් කුෂ්ට යාගේ දරුවන් ගෙණ ජගත්කම් කියව්ද? යම් අනාථ එකෙක් නිශ්ශ්‍රිකව(යන එනමං නැතිව)තිරිසනුන් මෙන් **කොලොම්රුකේ** විසුද, එවුන්ගේ හස්තිහුද, අශ්වයෝද, ඵලකාවුධයෝද, අපට කුමක් කරන්නාහුදැයි;" ඔවුහු ගොස් තමන්ගේ කම්ප්‍රයුක්ත (වැඩට යොදන) ඇමතිවරුන්ට මේ කරුණ කිවාහුය; එයින් **ශාක්‍යයෝ** "භූහුනතින් සමග විසූවන්ගේ ථාමයත් බලයත් පෙන්වන්නෙමු"යි යුඩයට සැරසී නික්මූනාහ. **කොලියෝ ද කොලොම්රුක්** වැස්සන්ගේ තරමත් බලයත් දක්වන්නෙමුයි යුඩයට සැරසී නික්මූනාහ.

භාග්‍යවතුන් වහන්සේද රාත්‍රි ප්‍රත්‍යූෂ (අළුයම්) සමයෙහි ම මහා කරුණාසමාපත්තියෙන් නැගිට ලොකව්‍යවලොකනය(ලොව බැලීම) කරණසේක් මොවුන් මෙසේ යුඩ සජ්ජව නික්මෙන්නන් දුටුසේක.

දුක වදුරු මා ගියකල මේ කොලාහලය ව්‍යුපශමනය වන්නේ (සංසිදෙන්නේ) දැයි සලකා වදරන්නේ "මම එහි ගොස් කලහ සංසිඳවීමට ජාතක තුනක් කියන්නෙමි, එයින් කලහ සංසිදෙන්නේය; තවද සාමග්ගිදීපනය සඳහා ජාතක දෙකක් කියා අත්ත දණ්ඩසූත්‍රය දෙශනාකරන්නෙමි; දෙශනාශ්‍රවණය කොට දෙනු

වර වාසීහු ම අඩුතුන් අඩුතුන් සියය බැගින් පන්සියක් කුමාර යන් දෙන්නාහ; මම ඒ කුමරුන් පැවිදිකරවන්නෙමි; එකල මහා සමාගමක් වන්නේය"යි සනිටුහන් කෙළේය.

එහෙයින් මේ දෙපිරිස යුද්ධයට සැරසී නික්ම යන කල කිසිවෙකුවත් ආරෙචනා නොකොට තමන්වහන්සේම පාත්‍රා සිවුරු ගෙන දෙසෙනග අතර ආකාශයෙහි පර්‍යඞ්ක ආභොගකොට (පලක් බැඳ) ෂඩ්වර්ණ රශ්මීන් විහිදුවා හුන්සේක.

**කිඹුල්වත්පුර වාසීහු**-භාග්‍යවතුන් වහන්සේ දුටුපමණින්ම අපගේ ඥාතිශ්‍රෙෂ්ඨ ශාස්තෘන් වහන්සේ ආයේය; උන්වහන්සේ විසින් අප කලහ කරණබව දක්නා ලද්දේයි සිතා උන්වහන්සේ පැමිණිකල්හි අප විසින් පරයන්ගේ ශරීරයෙහි ශස්ත්‍රපාතනය කරන්ට නොහැක්කේමය.

**කෝලිය නුවරවැස්සෝ**-"අප මරන්වා, වදකරන්වා"යි ආවුධ අහක දමා බුදුන් වැඳ හිඳගත්තාහුය. භාග්‍යවතුන් වහන්සේත් දූණ වදරණසේක්ම "මහා රජවරුනි! කුමක් නිසා මෙහි ආවෝදූ"යි විචාළෝය. "භාග්‍යවතුනි! තීර්ථ (තොටුපල්) ක්‍රීඩා පිණිසත් නොවේ, පර්වත ක්‍රීඩා පිණිසත් නොවේ; නදීක්‍රීඩා පිණිසත් නොවේ, ගිරි (කඳු) දර්ශනය පිණිසත් නොවේ, මේ ස්ථානයෙහිදී සංග්‍රාමයක් එළවා තබා ආම්හ"යි. "මහාරාජයිනි! තොපේ කලහය කුමක් නිසා හටගත්තේදූ"යි. 'ස්වාමීනි! උදක නිසාය"යි "වතුර කොපමණ අගනේද මහාරාජයිනි!" "ස්වාමීනි! අල්පයි " "මහාරාජයිනි! පෘථිවිය නම් කොපමණ අගනේද?" "ස්වාමීනි! අනර්ඝයි". "ක්ෂත්‍රියයෝ කෙතෙක් වටිත්ද?" "ක්ෂත්‍රියයෝ නම් අනර්ඝමය ස්වාමීනි!යි". "මහාරජවරුනි! මදක් වටනා වතුරක් නිසා කුමක්හෙයින් අනගි කැත්කුලයන් නසව්දූයි". කෝලාහලයෙහි ආශ්වාදනම් නැත, මහරජුනි! කෝලාහල වශයෙන් අස්ථානයෙහි වෛර කොට එක් රුක්දෙවියෙක් විසින් කාලසිංහයෙක් සමග බැඳි වෛරය මේ මුළුකල්පය අනුව පැවැත්තේමය"යි කියා **ඵන්දන ජාතකය** වදාළසේක.

"මහරජ! එහෙයින් පරපත්තියෙන් (අනුන්ගේ බස් අසා සිතා ගැණීමෙන්) යුක්ත නොවිය යුතුයි; පරපත් වීමෙන් වනාහි එක් සසකයෙකු (සාවකු)ගේ කථාව කරණකොටගෙණ තුන්දහස් යොදුන් මහතැති **හිමාල වනයෙහි** සිව්පා සමූහයෝ මුහුදේ පතින්නෝ වූහ; ඉන් නිසා පරප්‍රාපති නොවිය යුතුය"යි වදාරා **පඨවිඋද්‍රියන** (පොළව පෙරළෙන) **ජාතකය** කීසේක.

තවද "මහරජ! යම් කලෙක දුර්වලයාද මහා බලවතාගේ රන්ධ්‍ර විවර දකියි; ඇතැම් දවසක මහා බලැත්තේ දුබලයාගේ රන්ධ්‍ර විවර දකී; **ලටුකික ශකුණිකාවද** (කැටකිරිල්ලත්) හස්තිනාගයා මැරෙව්වා"යයි **ලටුකික ජාතකය** වදාළසේක

මෙසේ කලහ ව්‍යුපශමයට ජාතකත්‍රයක් වදාරා සමගියේ අගය විදහා පෑමට ජාතකධර්ම දෙකක් කීසේක; කෙසේද? "මහරජුනි! සමගි වූවන්ගේ කිසි අවතාරයක් (හැඩහුරුකමක්) නම් දකින්නට නොහැක්ය"යි වදාරා **රුක්ඛධම්ම ජාතකය** කීසේක.

තවද "මහරජුනි! "සමගිසම්පන්නයන්ගේ කිසි සිදුරක් දක්නට නොහැක්කේය; යම් දවසක එකිනෙකා විවාද කළාහුද? එදවස් නෙසාද (වැදි) පුත්‍රයා ජීවිතයෙන් ව්‍යපරෝපනය කොට ඒ වටුවන් රැගෙන ගියේයයි විවාදයෙහි ආස්වාදයක් නම් නැතැයි" වදාරා **වට්ටක ජාතකය** කීසේක.

මෙසේ මේ පස්වූ ජාතකයන් කියා අවසනැ **අත්තදණ්ඩ සූත්‍රය** වදාළසේක. රජදරුවෝ ප්‍රසන්නයෝ ව හොඳයි! ශාස්තෘන් වහන්සේ නොවැඩියසේක් නම් අපි සහතින් අතන් මතන් වද දී ලේ නදියක් පවත්වන්නෙමු; අපගේ දූ පුතුන් ද ගේ දොර ද නො බලන්නෙමු; ශාසන ප්‍රතිශාසනද හෙවත් හසුන් පිළිහසුනුත් අප වෙත රැගෙන එන්නකුත් නොවන්න; ශාස්තෘන්වහන්සේ නිසා අපි දිවි ලද්දෝ වෙමු. යම් හැටියකින් උන්වහන්සේ ගිහිගෙයි විසී නම් ද්වීප සහස්‍රයක් පරිවාරවූ චාතුර්මහාද්වීප රාජ්‍යය ඔහුගේ හස්ත ගතවූයේය; සහස්‍රාතිරේක පුත්‍රයනුත් වූහ; ඉන් ක්ෂත්‍රිය පරිවාර ඇත්තේම හැසිරෙන්නේය; ඒ මේ කියනලද සම්පත් හැරදමා නික්ම ගොස් සම්බෝධියට පත්තේ දැනුදු කැත් පිරිවරතිව හැසිරේවා"යි **කපිලවස්තු-කෝලිය** උභය නගරවාසීහු **අඞ්ඪත්‍රය අඞ්ඪත්‍රය** කුමාරශතයන් දුන්නාහුය.

භාග්‍යවතුන් වහන්සේද ඒ රජකුමරුන් පන්සියයට පැවිදි දෙවා මහවනයට ඔවුන් කැටිව වැඩිසේක; ගරුගාරවයෙන් තමන් නොරිසියෙන් ම පැවිදිවූ ඔවුන්ට අනභිරති උපන; පරණ දෙවැතියෝ (බිරින්දෑ) ද උන්වහන්සේලාට "ආර්‍යපුත්‍රයෝ උකටලී වෙත්වා, (බොටුවට එත්වා) ගෘහවාස නොසිටියි" යනාදීන් කියා ශාසන පෙෂණ කරත්; උන්වහන්සේලා අතිරේකතර උත්කණ්ඨාවට පත්වූහ. භාග්‍යවත් (තෙමේ) අවජන්නෝ උන් අනභිරත බැව් දැන "මේ භික්ෂූහු මා වැනි බුදුකෙනෙකුන් හා සමග වසන්

නෝ උකටලී වෙත්; හොඳයි, උන්ට **කුණාල දහ**වණ්ණනා කථනය කොට එහි ගෙන ගොස් අනභිරති විනෝදන කරමි"යි **කුණාල විලේ** වන්හුන් කීසේක. උන්වහන්සේලා ඒ විල දක්නැටියෝ වූහ.

"මහණෙනි! කුණාලවිල දක්නා කැමැත්තෝද"යි, "භාග්‍යවතුනි! එසේමැයි" "ඉදින් එසේ නම් එව්! යමු"යි "පිනැත්තෙනි! සෘද්ධිමතුන්ගේ ගමන් තැන් අපි කෙසේ යන්නමුදැ"යි "තෙපි ගනු කැම්මෝ වෙව්, මම මගේ ආනුභාවයෙන් ගෙන යන්නෙමි;" "වහන්ස! හේ මැනවි."

භාග්‍යවතුන් වහන්සේ භික්ෂුපඤ්චශතයන් එක්කගෙන අහසේ උත්පතිතව **කුණාලවිලේ** පිහිටා ඒ භික්ෂූන්ට මෙසේ වදාළේය; "මහණෙනි! මේ කුණාලතඩාගයෙහි යම් යම් මත්ස්‍යයන්ගේ නම් නොදන්නාහු නම් මා අතින් විචාරව්"යි; ඔව්හු ද විචාළාහුය; "භාග්‍යවතුන් විචාළ විචාළ දෑ කීසේක; මසුන්ගේ නම් පමණකුත් නොවෙයි; ඒ වන ලැහැබේ වෘක්ෂයන්ගේ ද පර්වතපාදයෙහි වසන විපාද චතුෂ්පාදයන් සහ පක්ෂීන්ගේ ද නම් අස්වා සැම කීසේක." ඉක්බිති පක්ෂීන් දෙදෙනෙක් විසින් මුව තුඩින් ඩැහැගත් දණ්ඩක හිඳගත් **කුණාල සකුණරාජයාම** (හංස) ඉදිරියෙන් පිටිපසින් හා දෙපසින්ද සකුණසඞ්ඝපරිවෘතව එයි; භික්ෂූහු ඒ දැක "ස්වාමිනි! අර පක්ෂියා මේ පක්ෂීන්ගේ රජ වන්නේය; උන් උගේ පිරිවරයි හඟිමු"යි කීවාහුය; "මහණෙනි! ඒ එසේය:– "මෙයද මගේම වංශයයි, මගේ ප්‍රවේණියයි", "වහන්ස! ඉදින් අපි **දූන්** මේ **ලිහිණි** සමූහය දකිමු; භාග්‍යවතුන්වහන්සේ යම් හෙයකින් මෙයත් මගේ වංශය මගේ ප්‍රවේණියයි වදාළාහ; ඒ අසනු කැමැත්තම්හ"යි; "මහණෙනි! අසනු කැමැත්තහුදැ"යි; "එසේය, භාග්‍යවතුනි"යි, "එසේ නම් අසව්"යි **ගාථා තුන්සියයකින්** ප්‍රතිමණ්ඩිත කොට **කුණාලජාතකය** වදාරන්නෝ ඒ භික්ෂූන්ගේ අනභිරතිය (ශාසනයෙහි නො ඇල්ම) දුරුකළසේක.

දෙසුන් පිරියෙසුන්හි හැමදෙනාම **සෝවාන්පෙලේ** පිහිටියාහ; මාගීප්‍රාප්තියෙන්ම උන්වහන්සේලාට සෘද්ධියද ආවාය. භාග්‍යවතුන්වහන්සේද "මේ භික්ෂූන්ට මෙතෙක්ම දූනට සෑහේ" යයි අහසේ පැනනැගී **මහවන උයනටම** වැඩිසේක. ඒ භික්ෂූන් වහන්සේලාද යන කල දශබලයානන්ගේ ආනුභාවයෙන් ගොස් එන කල ස්වකීය ආනුභාවයෙන් භාග්‍යවතුන් පිරිවරා **මහවන** උයනෙහි බැස්සෝය.

භාග්‍යවතුන් වහන්සේද පනවන ලද අස්නෙහි වැඩහිඳ භික්ෂූන් අමතා වදරා "එව්! මහණෙනි! හිඳගනිව්! තොපට **උපරි මාර්ගත්‍රයවධ්‍ය ක්ලේශයන්ට** කර්මස්ථාන කියන්නෙමි"යි කමටහන් වදාළසේක.

භික්ෂූහු මෙසේ සිතූහ; "භාග්‍යවතුන්වහන්සේ අපගේ අනභිරතභාවය දැන වදාරා **කුණාලවිලම** සැඳවා ගොස් අනභිරතිය දුරු කෙළේය. ශාස්තෲන්වහන්සේ **ස්‍රොතාපත්ති** ඵලයට පත්වූ අපට දැන් මෙහි ඉතිරි තුන්මග කමටහන් දුන්සේක. අපි සෝවාන් වූවෝයයි අප විසින් ව්‍යතිනාම කරන්ට නම් නොවටින්නේමයයි උත්තමපුරුෂ සදෘෂයන් විසින් වන්න අපට වටී"යයි උන්වහන්සේලා දසබලයන්වහන්සේගේ පා වැඳ නැගී සිට තිසිදන පොළ පොළා වෙන වෙනම පල්ලන්කඩ රුක්මුල්වල හිඳ ගත්තාහ.

භාග්‍යවතුන් වහන්සේ සිතූසේක් "මේ භික්ෂූහු ප්‍රකෘතියෙනුත් අවිස්සට්ඨකම්මට්ඨාන (නොහළවැඩ) ඇත්තෝය; උපා ලත් මහණහුට කිලමන කාරණ නම් නැත; යන්නෝ යන්නෝ විදසුන් පටන්ගෙණ අරහතට පත්වී තම තමන් පිළිවිද් ගුණ "ආරොචනා කරන්නෙමු"යි මාගේ සන්තිකයට එන්නාහුය; ඒ තැන් ආකල දස දහස් සක්වල දෙවතාවෝ එක් සක්වලේ සන්නිපාත වන්නෝය; මහාසමයක් වන්නේය; විවිත්ත ඔකාසයෙ (වෙන් ඉඩ කෙළිය)ක හිඳගන්නට වටී"යයි එයින් විවිත්තාවකාසයෙක බුඩාසනය පණවා හුන්සේක.

හැම දෙනාට පළමු කමටහන් ගෙන ගිය තෙරණුවෝ **ෂඩ්පිළිසිඹියා** සමග රහත්ඵලයට පැමිණියේය. ඉන්පසු තව කෙනෙක් දූයි පන්සියක් දෙනාවහන්සේම පියුම්තියේ පියුම්මෙන් පිපියාහ.

හැමට පළමු අභිඥාප්‍රාප්ත භික්ෂුව භාග්‍යවත්හට සැළකරන්නෙමියි පය්‍යඞ්කය විනිභෝගකොට (හුන්පළඟලිහා) හිඳගන්නා සිවුර ගසාදමා නැගී සිට දසබලබුදුන් අභිමුඛව වැඩියේය; මෙසේ තව කෙනෙක් තවත් කෙනෙක් දූයි පන්සියයම බත්හලට පිවිසෙන්නාහු මෙන් පටිපාටියෙන්ම වැඩියාහ. පළමු වැඩි රහතන් වහන්සේ බුදුන් වැඳ හිඳිනා සිවුර පණවා එකත්පසක හිඳගත ප්‍රතිවෙධ කළ ගුණාරොචනාකාරන්ට කැමැත්තේ "අන් කිසිවෙක් ඇද්දෙ නැද්දෙයි නිවතාහිතව (නැවතී) ආ මග බලන්නෝ තවත් කෙනෙක් දුටුසේක්මය. උන්වහන්සේලා සියල්ලෝම අවුත් එක් අතෙක හිඳගත්තෝ මේ මොහුට හරායමානව (හැරෙමින් ලජ්ජා

වෙන්) නොකිය. ඛීණාසවයන්ගේ වනාහි ආකාර දෙකෙක් වෙත්; ඒ මෙසේයි:- මා විසින් ප්‍රතිවිද්ධගුණය දෙවියන් සහිත ලෝවැස්සෝ වහාම ප්‍රතිවෙධකළෝ නම් ඉතා යෙහෙකැයි සිතක් උපදියි; පිළිවිද්බැව් නම් නිධානයක් ලත් පුරුෂයෙක් මෙන් අනිකෙකුට නොකියනු කැමතියෝ වෙත්.

මෙසේ ඒ ආයසීමණ්ඩලය ඕසටමත්තෙහි වනාහි ප්‍රාචීන යුගන්ධර පරික්ෂෙපයෙන් හෙවත් පෙරදිග යුගඳුරු පිරිකෙව්වෙන් අභ්‍ර-මහිකා-ධූම-රජස්-රාහු යන මේ පඤ්චාපක්ලෙශයෙන් විප්‍රමුක්තවූ බුද්ධොත්පාද ප්‍රතිමණ්ඩිත ලොකධාතුහුගේ රමණෙය්‍යක දර්ශිතයට පූර්වදිශාවෙන් ඉහළ නැගූ රිදීමුවා මහත් කැඩපත් මඩලක් වැනිවූ නිම්පිරිවැටිය ගෙණ පෙරලනු ලබන රජත චක්‍ර සශ්‍රීක පූර්ණචන්ද්‍රමණ්ඩලය උල්ලඞ්ඝනව ආකාශ පථයට පිළිපන්ය.

ඉදින් මෙබඳු ක්ෂණලය මුහුර්තයෙහි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යවූවන්ගේ දනව්වෙහි කපිලවාස්තුපුර මහාවන නම් ස්වයංජාත අරෙපිමවූ හිමවත හා එකාබද්ධ උයනෙහි මේ සූත්‍ර දෙසූ දවස්ම පැමිණි රහත්බැව් ඇති පන්සියයක් මත් භික්ෂූන්ගෙන් මහත්වූ භික්ෂුසඞ්ඝයා සමග විහරණය කළසේක.

එහි භාග්‍යවතුන්වහන්සේද මහාසම්මත වංශයෙහි උපන්සේක; ඒ පන්සියයක් භික්ෂූහුද මහාසම්මත කුලයෙහි උපන්නෝය; භාග්‍යවතුන්වහන්සේද ක්ෂත්‍රිය ගර්භයෙහි ජාතය, ඒ භික්ෂූහුද ක්ෂත්‍රිය ගර්භයෙහි ජාතයෝය; භාග්‍යවතුන්ද රාජප්‍රව්‍රජිතයයි, ඒ භික්ෂූහුද රාජපබ්බජිතයෝය; භාග්‍යවතුන් වහන්සේද සේසත් සහිත හස්තගත චක්‍රවර්ති රාජ්‍යය හැරදමා පැවිදි විය; ඔව්හුද ශ්වෙතච්ඡත්‍ර අත්හැර අතට පත් රාජ්‍යයන් නිසඟිකොට පැවිදි ගත්තෝය.

මෙසේ භාග්‍යවතුන්වහන්සේ පරිශුද්ධ අවකාශයෙහි පරිශුද්ධ රාත්‍රිභාගයෙහි ස්වයංපරිශුද්ධ වූසේක් පිරිසිදු පිරිවර ඇත්තේ, වීතරාග ඇත්තේ වීතරාග පරිවාර ඇත්තේ, වීතදොස ඇත්තේ වීතදොස පරිවාර ඇත්තේ, වීතමොහ ඇත්තේ වීතමොහ පරිවාර ඇත්තේ, නිත්තණ්හා ඇත්තේ නිත්තණ්හා පරිවාර ඇත්තේ, නික්ලෙශිවූසේක් නික්ලෙශ පරිවාර ඇත්තේ, ශාන්තවූයේ ශාන්ත පරිවාර ඇත්තේ, දමිතවූයේ දමිත පරිවාර ඇත්තේ, මුක්තවූසේක් මුක්තපරිවාර ඇත්තේ, අතිශයින් බබලන්නේ විය; (මේ වර්ණනා භූමි නමැයි යම් පමණ හැකි නම් එපමණ කිව යුතුයි.)

මේ දවසේ රැස්නොවූ දෙවතාවෝ නම් අසංඥතල වාසීහුත් අරූපාවචර දෙවතාවෝත් සමාපත්තියට සමවන් දෙවතාවෝත් යන ස්වල්ප දෙනෙක් පමණකි.

## දෙවතා සන්නිපතිත ක්‍රමය.

මහවනය හාත්පස දෙවතාවෝ චලනය වූවෝය. “යමු! පින්වතුනි! බුද්ධදර්ශනය නම් බහූපකාර වේ; ධර්මශ්‍රවණය ද බහූපකාරයි; භික්ෂුසඞ්ඝදර්ශනය ද එසේම බොහෝ උපකාරයි. වරෝ! යමු, වරෝ! යමු”යි, ඒ දෙවතාවෝ මහාශබ්දකරමින් අවුත් භාග්‍යවතුන් ද ඒ මොහොතේ රහත්පත් ක්ෂීණාශ්‍රවයන් ද වැඳ එකත්පස සිටියාහුය.

මෙකී උපායෙන්ම ඒ ඒ දෙවතාවුන්ගේ ශබ්ද අසා හඬ සතක්, අඩගව්වක්, ගව්වක්, අඩයොදුනක්, යොදුනක් ආදි වශයෙන් තුන්දහස් යොදුන් පමණ විස්තෘත හිමවතේ තුන්වරක්ද; තෙසැටදහස් නුවරවල ද, සයානූකෙළ ලක්ෂයක් පටුනුවල ද, සපතස්රත්නාකරයන්හි (මුහුදුවල) දූසි මුළුමහත් දඹදිව්හිද, පූර්වවිදෙහයෙහි ද, අපරගොයානයෙහි ද, උතුරුකුරු දිවයිනේ ද, කුඩා දිවයින් දෙදහස්හි දූසි සියලු සක්වල දෙවතාවෝ ද; එයින් දෙවෙනි, තුන්වෙනි සක්වළෙහි දෙවතාවෝ දූසි මෙසේ දශ සහස්‍ර චක්‍රවාටයන්හි දෙවතාවෝ රැස්වූහයි දතයුත්තාහ; දස දහසක් සක්වළම මෙහි දශවිධ ලොකධාතු යයි අදහස් කරණ ලදී.

මෙසේ රැස්වූ දෙවතාවුන් කරණකොට ගෙණ මුළු සක්වළ ගැබ බඹලොව දක්වා අතුරුසිදුරු නැති සේ ඉදිකටු බැහු හිදි ගෙයක් (කුලාවක්) මෙන් පිරුණේ වෙයි; එහි බ්‍රහ්ම ලොකයාගේ උස්බැව් මෙසේ දතයුතුයි. ලෝවාමහපායේ සත්වෙනි කූටාගාරය සමාන පාෂාණයක් බඹලොව සිට යටට දම්මොත් සාරමසකින් බිමට වැටෙයි; මේසා මහත් අවකාශයෙහි යට සිට විසිකළ මල් හෝ දුම් හෝ මත්තට යන්නටවත් මත්තෙහි සිට හෝ දමූ අබැටක් යටට වැටෙන්ට වත් අතරක් නො ලබත්.

මෙසේ අතුරු සිදුරු නැතිව දෙවතාවෝ සිටියාහුය; යම් සේ සක්විතිරජ හුන්තැන අසම්බාධ වේ ද, පැමිණි පැමිණි මහෙශාක්‍ය ක්ෂත්‍රියයෝ අවකාශ ලබත්මය. පරයෙන් පරය (එහාට එහාට) වනාහි අතිසම්බාධ වෙයි; එමෙන්ම භාග්‍යවතුන් වැඩහිඳි තැන අසම්බාධයි; ආවාවූ ආවාවූ මහෙශාක්‍ය දෙවියෝද බ්‍රහ්මයෝද අවකාශ ලබත්මය. එහිදු වනාහි භගවත් ආසන්න ආසන්නස්ථානයෙහි වලග නිතුදන මත් (අස්ලොමක් හෙලන තැන්) පෙදෙසෙහි දසයක් විස්සක් දෙව්වරු සියුම් අත්බැව් මවාගෙණ සිටියාහුය; සියල්ලන්ට එපිටින් සැට සැට දෙවතාවෝ සිටියාහුය.

සුඛවූ අනාගාමීන්ට හා ක්ෂීණාශ්‍රවයන්ට ආවාසවූ පස් බඹතෙලේ උපන්නෝ **ශුද්ධාවාසකායිකයෝ** වෙත්; ඔවුනතුරෙන් මේ බ්‍රහ්මරාජයෝ සතරදෙන සමවත් වැද පිරිසිඳි පරිද්දෙන් නැගී සිටියෝ බ්‍රහ්මවිමානය අවලොකනය කළෝ බතින් පසු බත්ගෙය මෙන් සුන්ව දක්කාහුය. බ්‍රහ්මයෝ කොහිගියාහුදැයි අවජන්නෝ **මහාසමාගමට** යයි දැන මේ සමාගම මහත්ය, අපි අවගිතයෝය, පසුවූවන්ට වනාහි අවකාශ දුර්ලභ වේ; එහෙයින් යන්නෝ නොකිස් අත් ඇතිව එක එක ගාථාව බැගින් සාදාගෙණ යමු! එයින් මහසභාවේද තමන් ආබැව් දන්වමු! දසබල ගුණවැණුම් කියන්නෙමු! කියා මෙසේ ඔවුන් සමවතින් නැගී සිටියෝ ආවජිනා කළ හෙයින් මෙබඳු අදහස් විය. ඔහුතුමූ වනාහි බඹලෝතෙලෙහි සිටියෝම ගාථා අභිසංස්කරණකොට එක් දෙවතාවෙක් **පූර්වම** සක්වළ මුවවිට බැස්සේය; එකෙක් **දක්ෂිණ** සක්වළ මුවවිට බැස්සේය; එකෙක් **පශ්චිම** සක්වළ මුවවිට බැස්සේය; එකෙක් **උත්තර** චක්‍රවාට මුඛවතීයෙහි ද බැස්සේය.

ඉක්බිති නැගෙණහිර සක්වළ මුවවිටෙහි අවතීර්ණ බ්‍රහ්ම තෙම **නිල්කසුන් සමවත්** සමවැද නිල්රැස් විහිදා, දසදහස් සක්වළ දෙවතාවන්ට මාණික්‍යව (මැණික් හැට්ට) පිළි මූදන්නාක් මෙන් තමන් ආ බැව් දන්වා බුඩවීපියට නම් කිසිවෙකු විසින් අවතරණය නොහැක; එබැවින් මහත් බුඩවීපියෙන්ම අවුත් භාග්‍යවතුන් වැඳ එක් අතෙක සිටයේය.

එකතක සිටියේම තමා විසින් අභිසංස්කෘත ගාථාව කියේය. දක්ෂිණ චක්‍රවාට මුඛවතීයෙහි අවතීර්ණ බ්‍රහ්මතෙමේ **පීත කසිණ**යට සමවැද සවර්ණප්‍රභා මුඤ්චනය කරමින් දසදහස් සක්වළ දෙවියන්ට රන්සළු පෙරවන්නාක් මෙන් තමන් ආ බැව් දන්වා එසේම කෙළේය.

පැදුම් සක්වළ මුවවිටියෙහි බැසි බඹතෙමේද **ලෝහිත කසිණ** සමාපත්තියෙන් ලේවන් රැස් මුදමින් දශසහස්‍රචක්‍රවාට දෙවතාවුන් රක්තවර්ණ උතුම් කම්බලයෙන් පරික්ෂේප කරන්නාක් මෙන් තමන් ආ බැව් දන්වා එසේම කෙළේය.

උතුරු සක්වළ මුවවිටියෙහි බැස්සාවූ බ්‍රහ්මයා **ඕදාත කසිණ**යට සමවැද ශුභ්‍රවර්ණ රශ්මීන් විහිදුවා දසදහස් සක්වළ දෙවතාවුන්ට සමන්මල් පිළි පොරවන්නාක් මෙන් තමන් ආ බැව් දන්වා එසේ කෙළේය.

v. **ප්‍රකීර්ණාර්ථ**:-

• **දන්තිනාගෙ අපරාජිත සඞ්ඝං**=කිසිවෙකු විසින් නොපරද වන ලද අදම දෙවපුත්‍ර-**ක්ලේශ**-**අභිසංස්කාර** යන තුන් මරුන් මැඩ දමා විජිතසංග්‍රාම ඇති මේ අපරාජිත සඞ්ඝදර්ශනය පිණිස ආම්හයි.

**සාරථී'ව නෙත්තානි ගහෙත්වා**= යම් සේ සමව පැවැත් තාවූ සෛන්ධවයන් කෙරෙහි කසය (කෙවිට) බහා තැබූ සාරථියා සියලු යොත් (රැහැන්) අල්වාගෙණ චොදනා නොකර වාරණය නොකර (චඃ! මඃ! නැතිව) සිටී ද, එසේම ෂඩඞ්ගඋපෙක්ෂාවෙන් සමන්වාගත ගුප්තවාර ඇති මේ භික්ෂු පන්සියයම පණ්ඩිතව ඉන්ද්‍රියයන් රකිති.

**ඡෙත්වා ඛිලං**=රාග, දොස, මොහ, ඛිල (උල්) සිඳ:

**පලිඝං**=රා- දෙස්- මෝ තුනම පරිඝණිත අර්ථ හෙයින් **පලිඝ** නම් වී.

**ඉන්ද්‍රඛීලං**=රාගයත්, ද්වෙෂයත්, මොහයත් නොසෙල්වන සේ පිහිටා සිටින බැවින් 'ඉන්ද්‍රඛිල' යයි කියනලදී. ('ඉන්ද්‍රඛිලය' නම් සතරදිගින් එන සුළඟට නොසෙල්වන සේ නගරවාරයෙහි පිහිටු වන්නකි. එලිපත්ත මධ්‍යස්ථානයේ පිහිටුවන වැඹට ද මේ නම ව්‍යවහාර වේ.)

**චක්ඛුමන්තා**= (පඤ්චවිධ චක්ෂූන්ගෙන් චක්ෂුමත්වූ) ෂඩ්විධ ඥානය, දිව්‍යශ්‍රොත්‍රඥානය, පරචිත්ත විජානනඥානය, පූර්වේනිවාසානුස්මෘතිඥානය, දිව්‍යචක්ෂුර්ඥානය යන මේ පසැස් ඇති;

**සුදන්තා**=චක්ෂුසින් හා සොත, ඝාණ, ජිව්හා, කාය, මනස් යන ඉන්ද්‍රියයන් ගෙන් දැමූනාවූ:

**සුසුනාගා**= තරුණ නාගයෝ; (ඡන්දාදීන් කාරණකොට ගෙණ අගතියට නොයන් නුයි නාගයෝයි.) තවද ඒ ඒ ආර්‍යමාර්ගයෙන් ප්‍රහීණ කෙලෙසුන්ට නොඑත් නුයි නාගයෝය; නානාප්‍රකාර ආගුසඞ්ඛ්‍යාත අපරාධ නොකෙරෙත් නුයි නාගයෝය; මේ මෙහි සංක්ෂේපයයි. විස්තරය **මහානිද්දේශ** යෙහි කී නයින් දතයුතුයි.

"ආගුං න කරෙති කිඤ්චි ලොකෙ
සබ්බසංයොගෙ විසජ්ජ බන්ධනානි,
සබ්බත්‍ථ න සජ්ජතී විමුත්තො
නාගො තාදී පවුච්චතෙ තථත්තා'ති."

"සුසුනාගභාව සමපත්තියට පැමිණියෝ" යන අර්ථයි. "මෙබඳු අනුත්තරයොග්‍යාචාර්‍ය කෙනෙක් විසින් දමනය කළ තරුණ නාගයන් (ඇතුන්) දර්ශනය පිණිස ආයෙමු; භාග්‍යවතුන්වහන් සැයි" කියා ගොස් සක්වළගල් ගැටියේම සිටියේය.

**සරණං ගතාසෙ:**— විමති රහිත සරණගමනයෙන් සරණ ගියාහු:

**සරණාගමනය.**

"සරණං පරායණං අස්සස තාතා හිතස්ස ච විධාතා" යන මේ අභිප්‍රායෙන් භාග්‍යවත් ගෞතම බුදුරජාණන් වහන්සේ "ගච්ඡාමි භජාමි, සෙවාමි, පයිරුපාසාමි, එවං ජානාමි, බුජ්ඣාමි." "බුදුන් සරණ යමි, බුදුන් භජනය කරමි, බුදුන් සෙවනය කරමි, බුදුන් පයිරුපාසනය කරමි, බුදුන් පිහිටයයි දනිමි, බුදුන්ගේ පිහිට අවබෝධකොට ගත්තෙමි, උන්වහන්සේ සරණයි, පරායණයි, දුකින් රකියි, හිත සැප විධානකරයි."

සරණගමනයන්හි කුශලබැව් පිණිස= **1. සරණය, 2. සරණගමනය, 3. සරණ යන්නා, 4. සරණගමන ප්‍රභේද, 5. සරණගමන ඵලය, 6. සරණගමන සඞ්ක්ලේශය, 7. සරණගමන භේදය,** යන සප්තාකාරය දතයුතුයි.

1. **සරණ විධිය:**— පදාර්ථවශයෙන් "හිංසතී'ති සරණං" සරණගතයන්ට ඒ සරණගමනයෙන්ම භය, සන්ත්‍රාස, දුඃඛ, දුර්ගති, පරික්ලේශ, නසයි, වනසයි, යන අරුත් වේ; මේ 'සරණ' යනු රත්නත්‍රයටම නමකි. තවද හිතෙහි පැවැත්වීමෙන් හා අහිතයෙන් නැවැත්වීමෙන් සත්වයන්ගේ බිය හිංසාකෙරේනුයි බුදුන් ද, භවකාන්තාරයෙන් එතරකිරීම හෙතුකොටගෙණ අස්සාස දෙන හෙයින් දහම් ද, අල්පවූත් සත්කාරයන්ට විපුලඵල ප්‍රතිලාභකරණයෙන් සඞ්ඝයාදූයි, මේ පරියායෙන් 'තුනුරුවන්' '**සරණ**' වී.

2. ඒ තුනුරුවන් කෙරෙහි පැහැදීම හා ගරුකිරීම යන දෙවිධියකින් නැසූ කෙලෙස් ඇති තත්පරායනතාකාර (ඒ පරම පිහිටි බැව් අයුරු) පැවැත්තාවූ චිත්තොත්පාදය **සරණගමන විධි** යයි.

3. ඒ සරණගමන චිත්තොත්පාද සමඞ්ගීසත්වතෙමේ සරණ යයි කියනලද **තත්ප්‍රසාද තත්ගරුතා** දෙකෙන් යුත් සිත ඉපදීමෙන් මේ බුද්ධ, ධර්‍ම, සඞ්ඝ, යන රත්නත්‍රය මගේ සරණයි; මේ බුදුන්, දහම්, සඟ, තෙරුවන් මට පිහිටයි; මෙසේ උපගත වන්නේ **සරණාගත** වේයයි මෙසේ පළමුකොට **සරණය, සරණාගමනය, සරණාගතය** යන මේ තුන දතයුතුයි.

4. **සරණාගමන ප්‍රභෙදය** වනාහි විවිධයි. **ලොකොත්තර ලෞකික** වශයෙනි.

i. එහි **ලොකොත්තර සරණාගමණය**-දක්නාලද සත්‍යයන් ඇතියනට ආයසීමාගීක්‍ෂණයෙහි සරණගමන උපකෙලශ සමුච්ඡෙදයෙන් ආරම්මණ වශයෙන් නිර්වාණාලම්බනව කෘත්‍යවශ යෙන් සකල රත්නත්‍රයෙහි එකවිධ ව සිඩ වේ.

ii. **ලෞකික සරණාගමනය**:—ලෞකික පෘථග්ජනයන්ට සරණාගමන උපකෙලශ විෂ්කම්භනයෙන් අරමුණු හෙයින් බුඩාදී ගුණාලම්බන ව සමෘඩ වේ.

එය අර්ථවශයෙන් බුඩාදිවස්තුකෙරෙහි ශ්‍රඩාප්‍රතිලාභය යි; ශ්‍රඩාමූලකවූ සම්‍යක්දෘෂ්ටියම දශපුණ්‍යක්‍රියාවස්තුන්හි දිට්ඨිජ්ජු කම්මයයි කියනු ලැබේ. ඒ මේ සරණාගමනය සතර ප්‍රකාරය කින් පවතියි.

1. අත්තසන්නියත්‍යාගතන සරණගමනය,
2. තප්පරායනතා සරණගමනය,
3. සිස්සභාවූපගමන සරණගමනය,
4. පණිපාත සරණගමනය කියායි.

(i) එහි **'ආත්මසන්නියත්‍යාගනය'** නම් අද මුල්කොට මම ආත්මය බුදුන්ට පාවාදෙමි; ධර්මයට ආත්මය පාවාදෙමි; සඞ්ඝ යාට ආත්මය පාවාදෙමියි මෙසේ බුඩාදී තුනුරුවන්ට ආත්මපරි ත්‍යාග කිරීමයි.

(ii) **'තත්පරායනතා'** නම් අද ආදිකොට මම බුඩ පරායනයි. අද ආදිකොට මම ධර්ම පරායනයි. අද ආදිකොට මම සඞ්ඝ පරාය නයි. මෙසේ මා දරණයේක්වා (දූනගත්තාසේක්වා) යි ඒ තුනු රුවන් පිහිටකොට ගැණීමයි.

(iii) **'ශිෂ්‍යභාවොපගමනය'** නම් මම අද පටන්කොට බුදුන්ගේ අතවැසියෙක් වෙමි; මම අද පටන් කොට ධර්මයට අතවැසියෙක් වෙමි; මම අද පටන්කොට සඞ්ඝයාට අතවැසියෙක් වෙමි; මෙසේ මා දරාගනුමැනවයි **'ශිෂ්‍යභාවොපගමනය'** මෙසේ වේ.

(iv) **'ප්‍රණිපාතය'** නම් "මම අද මයසීාදුකොට අභිවාදන, පච්චුට්ඨාන, අඤ්ජලිකම්ම, සාමීචිකම්ම, බුඩාදීත්‍රිවිධවස්තුවටම කරමියි එසේ මා දූනගත්තාසේක්වා"යි මෙසේ බුඩාදී තුනුරුවන් කෙරෙහි **පරමනිපච්චාකාරයයි** හෙවත් උතුම් යටහත් අයුරයි.

පූර්වෝක්ත සතරාකාරයන් අතුරෙන් එක්තරා ආකාරයක්වත් කරන්නා විසින් සරණය ගන්නා ලද වේමය.

තවද භාග්‍යවතුන්වහන්සේට ආත්මය පරිත්‍යාගකරමි; ධර්මයට ආත්මය පරිත්‍යාගකරමි; සඞ්ඝයාට ආත්මය පරිත්‍යාගකරමි; භාග්‍යවතුන්වහන්සේට ජීවිතය පරිත්‍යාගකරමි; ධර්මයට ජීවිතය පරිත්‍යාගකරමි; සඞ්ඝයාට ජීවිතය පරිත්‍යාගකරමි; බුදුන්ට මගේ ආත්මය පරිත්‍යාගකරණ ලද්දේමය; ධර්මයට-පෙ-සඞ්ඝයාට-පෙ-බුදුන්ට මගේ ජීවිතය පරිත්‍යාගකරණ ලද්දේමය; ධර්මයට-පෙ-සඞ්ඝයාට-පෙ-ජීවිතය පර්‍යන්තකොට බුදුන් සරණයමි; බුදුන් මට **සරණයි**, බුදුන් මට ලේනයි; බුදුන් මට **ත්‍රාණයි**, කියා මෙසේ **ආත්මසන්නිය්‍යාතනය** දතයුතුයි.

“සත්ථාරඤ්ච වතා'හං පස්සෙය්‍යං, භගවන්ත'මෙව පස්සෙය්‍යං; සුගතඤ්ච වතා'හං පස්සෙය්‍යං, භගවන්ත'මෙව පස්සෙය්‍යං; සම්මාසම්බුද්ධං ච වතාහං පස්සෙය්‍යං, භගවන්ත'මෙව පස්සෙය්‍යං” කියා මෙසේත් **මහාකාශ්‍යප** ස්ථවිරයන්වහන්සේගේ සරණාගමනයෙහි මෙන් **ශිෂ්‍යභාවූපගමනය** දක්කයුතුයි.

“සො අහං විචරිස්සාමි-ගාමා ගාමං පුරා පුරං,
නමස්සමානො සම්බුද්ධං-ධම්මස්ස ච සුධම්මතන්ති.”

මෙසේ ද **ආළවකාදීන්ගේ** සරණාගමනය මෙන් 'තත්පරායනතාව' දතයුත්තීය.

අථඛො බ්‍රහ්මායු බ්‍රාහ්මණො උට්ඨායාසනා එකංසං උත්තරසඞ්ගං කරිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවතො පාදානි මුඛෙන ච පරිචුම්බති, පාණීහි ච පරිසම්බාහති, නාමඤ්ච සාවෙති, “බ්‍රහ්මායු අහං භො ගොතම බ්‍රාහ්මණො, බ්‍රහ්මායු අහං භො ගොතම බ්‍රාහ්මණො” යි මෙසේ **ප්‍රණිපාතය** දතයුතුයි.

**ඒ මේ ප්‍රණිපාතය** 1. ඥාතිප්‍රණිපාතය, 2. භය ප්‍රණිපාතය, 3. ආචරිය ප්‍රණිපාතය, 4. දක්ඛිණෙය්‍ය ප්‍රණිපාතය වශයෙන් චතුර්විධ වේ. ඒ සතර අතුරෙන් **දක්ඛිණෙය්‍ය ප්‍රණිපාතයෙන්** සරණාගමන වෙයි; ඥාතිප්‍රණිපාතාදී අනිත් තුනෙන් 'සරණාගමනය' නොවේ; ශ්‍රෙෂ්ඨවශයෙන් 'සරණය' ගනු ලැබෙයි; ශ්‍රෙෂ්ඨවශයෙන් බිඳෙයි.

එබැවින් යම් **ශාක්‍යයෙක්** හෝ **කොලියයෙක්** හෝ බුදුන් අපගේ ඥාතියෙක්යයි වඳීද, සරණය නොගත්තේ මැයි. යමෙක් ශ්‍රමණ භගවත් ගෞතම තෙමේ රාජපූජිතය, මහානුභාව ඇත්තේය, නොවැන්දේ නම් අනර්ථයකුත් කරන්නේයයි භයින් වඳියි ද, සරණ නොගත්තේමය. යමෙකුත් බොධිසත්වකාලයෙහි භාග්‍යවතුන්වහන්සේ සන්තිකයෙහි කිසිඋගෙණීමක් සිහිකරමින්,

බුද්ධකාලයෙහිද:—

"එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය-ද්වීහි කම්මං පයොජයෙ,
චතුත්ථං ච නිධාපෙය්‍ය-ආපදාසු භවිස්සති."

කියා මෙබඳු අනුශාසනියක් උගෙණ මගේ ආචාර්යයයි වදී ද, **සරණ අග්‍රාහිකම** වේ.

යමෙක් වනාහි මුන්වහන්සේ ලොකයෙහි අග්‍රදක්ෂිණෙය්‍ය යයි වදීද, ඔහු විසින්ම **සරණ ගන්නාලද** වේ.

මෙසේ සරණගත් උපාසකයෙක් හෝ උපාසිකාවක් හෝ අන්‍ය තීර්ථකයන් කෙරෙහි ප්‍රව්‍රජිතයෙකුට මේ මගේ නෑයෙකැයි වදින්නහුගේ **සරණගමනය** නොබිඳෙයි; පැවිදි (තීර්ථක) නොවූ වෙකුට වැඳීම ගැණ කියනුම කවරේද? **සරණ නොබිඳෙයි** සේයි.

එසේම රජුන්ට භයවශයෙන් වදින්නාගේද සරණ නොබිඳේ; හෙතෙමේ රටවැසියන් විසින් පුදනලද හෙයින් නොවදින්නේ නම් අනර්ථයකුත් කරන්නේයයි; එසේ යම් ශිල්පයක් ශික්ෂාකරවූ තීර්ථකයෙකුට හෝ මගේ මේ ගුරුවරයායයි වදින්නහුගේද සරණ නොබිඳෙයි. මෙසේ **සරණගමන ප්‍රභෙද** දතයුතුයි.

(v) **සරණ**ගමන ඵලය:— මෙහි ද **ලොකොත්තර සරණාගමනයට** සතර ශ්‍රාමණ්‍යඵල විපාකපලය වේ; සර්වදුඃඛක්ෂය **ආනිසංසපලය** වේ. ඒ වදාරණලදමැයි —

"යො ච බුද්ධඤ්ච ධම්මඤ්ච-සඞ්ඝඤ්ච සරණං ගතො,
චත්තාරි අරියසච්චානි-සම්මප්පඤ්ඤාය පස්සති.

දුක්ඛං දුක්ඛසමුප්පාදං-දුක්ඛස්ස ච අතික්කමං,
අරියං චට්ඨඞ්ගිකං මග්ගං-දුක්ඛූපසමගාමිනං.

එතං ඛො සරණං ඛෙමං-එතං සරණමුත්තමං,
එතං සරණ'මාගම්ම-සබ්බදුක්ඛා පමුච්චතී'ති."

තවද නිත්‍ය හෙයින් අනුපගමන වශයෙන් ද ලොකොත්තර සරණගමන අනුසස් පල දතයුතුයි.

මේ කාරණය වදාරණලදමැයි:—

"අට්ඨාන මෙතං භික්ඛවෙ අනවකාසො යං දිට්ඨිසම්පන්නො පුග්ගලො කඤ්චි සංඛාරං නිච්චතො උපගච්ඡෙය්‍ය, සුඛතො උපගච්ඡෙය්‍ය, කඤ්චි ධම්මං, අත්තතො උපගච්ඡෙය්‍ය, මාතරං ජීවිතා වොරොපෙය්‍ය, පිතරං ජීවිතා වොරොපෙය්‍ය, අරහන්තං ජීවිතා වොරොපෙය්‍ය, දුට්ඨචිත්තො තථාගතස්ස ලොහිතං උප්පාදෙය්‍ය, සඞ්ඝං භින්දෙය්‍ය, අඤ්ඤං සත්ථාරං උද්දිසෙය්‍ය, නෙ'තං ඨානං විජ්ජති" යි ලෞකික සරණගමනයාගේ භවසම්පදාව ද භොග සම්පදාවද ඵලය වේ. ඒ වදාරණලදමය:—

"යෙ කෙචි බුද්ධං සරණං ගතාසෙ-න තෙ ගමිස්සන්ති අපායං,
පහාය මානුසං දෙහං-දෙවකායං පරිපූරෙස්සන්ති"යි.

තවත් එකක් ද කියනලදී. අථ ඛො සක්කො දෙවානමින්දො අසීතියා දෙවතා සහස්සෙහි සද්ධිං යෙනා'යස්මා මහාමොග්ගල්ලානො තෙනුපසංකමි -පෙ- එකමන්තං ඨිතං ඛො සක්කං දෙවානමින්දං ආයස්මා මහාමොග්ගල්ලානො එත'දවොච. "සාධු ඛො දෙවානමින්ද! බුද්ධං සරණාගමනං හොති; බුද්ධං සරණාගමනහෙතු ඛො දෙවානමින්ද එව'මිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජන්ති; තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති; දිබ්බෙන ආයුනා දිබ්බෙන වණ්ණෙන දිබ්බෙන සුඛෙන දිබ්බෙන යසෙන දිබ්බෙන ආධිපතෙය්‍යෙන දිබ්බෙහි රූපෙහි සද්දෙහි ගන්ධෙහි රසෙහි ඵොට්ඨබ්බෙහි" යි ධර්මයෙහි ද, සඞ්ඝයාකෙරෙහි ද මේ ක්‍රමය වේ.

තවද **වෙලාම**සූත්‍රාන්තාදී වශයෙන්ද සරණාගමනයාගේ ඵලවිශෙෂ දතයුතුයි. මෙසේ **සරණාගමන ඵලය** දැනගත යුත්තේය.

( vi. ) **සරණාගමන සංක්ලේශය**:—එහි ද **ලෞකික සරණාගමනය** බුද්ධාදී ත්‍රිවිධවස්තු විෂයෙහි අඥානකමින් ද, සංශයයෙන් ද, මිථ්‍යාඥානයෙන්දැයි, මේ ආදී කරුණුවලින් **සංක්ලේශ** වන්නේය. මහාජුතික නොවේ. (නොපැතිරෙයි.) **ලොකොත්තර සරණාගමනයාගේ** කෙලෙසීමක් නැත.

( vii. ) ලෝවැසි පුහුදුන් පිළිබඳ සරණාගමනයාගේ භේදය දෙවිධියකි: **සාවජ්ජභේදය, අනවජ්ජභේදය** කියායි. එයින් සාවද්‍යභේදය අන්‍ය ශාස්තෘධර්මාදීන්හි ආත්මනිර්යාතනාදියෙන් වෙයි; ඒ අනිෂ්ටඵලයි.

**අනවද්‍ය ශරණාගමනභේදය, කාලක්‍රියාවෙන් වන්නේය;** මැරීම කරණකොටගෙන වන්නාවූ සරණාගමන භේදය අවිපාක හෙයින් අපලවෙයි; ඒ සරණ බිඳීමෙන් වරදක් නොවේ යන අදහසයි.

**ලොකොත්තර සරණගමනයාගේ භේදයක් නැත්තේය.** (වෙනස්වීමක් නැත) **භවාන්තරයෙහිද** (වෙන ඉපදීමකට ගියත්) **ආර්‍යශ්‍රාවකතෙමේ අන්‍ය ශාස්තෘවරයකු අපදෙශ නොකරයි.** මෙසේ **සරණාගමන සංක්ලේශයද** භේදයද දතයුතුයි.

——:——

## 4. 7. මහාසමය සූත්‍රප්‍රදීපයයි.

——:——

48\. පඤ්චවෙදා සතං සමං-තපස්සී බ්‍රාහ්මණා චරං,
චිත්තං ච නෙසං න සම්මා විමුත්තං-හීනත්තරූපා න
පාරඞ්ගමා තෙ'ති.

49\. තණ්හාධිපන්නා වත සීලබද්ධා
ලූඛං තපං වස්සසතං චරන්තා,
චිත්තං ච නෙසං න සම්මා විමුත්තං
හීනත්තරූපා න පාරඞ්ගමා තෙ'ති.

50\. න මානකාමස්ස දමො ඉධත්ථි
න මොනම'ත්ථි අසමාහිතස්ස,
එකො අරඤ්ඤෙ විහරං පමත්තො
න මච්චුධෙය්‍යස්ස තරෙය්‍ය පාරන්ති.

51\. මානං පහාය සුසමාහිතත්තො
සුචෙතසො සබ්බධි විප්පමුත්තො,
එකො අරඤ්ඤෙ විහරං අප්පමත්තො
ස මච්චුධෙය්‍යස්ස තරෙය්‍ය පාරන්ති.

---

4 - 8 - ( 48 - 49 - 50- 51. )

i. **මාතෘකා:-**

**සමාධිබලයෙන් වෙදනා අධිවාසනය.**

ii. **පිණ්ඩාර්ථය:-**

දරුවාට වඩා හිමියා ගරුකිරීම; පරොපක්‍රමයෙන් බුදුවරුන් ගේ ජීවිතාන්තරාය නොවන බව, තථාගතයන්වහන්සේට අපාසු වී සිවිගෙයක වඩා හිඳුවාගෙණ යාම, සිංහසෙය්‍යාවෙන් සැතපීම, සත්සියක් දෙවතාවන් ගිලන් ඇඳ ලඟට පැමිණීම, නාගනාමය, සීහනාමය, අජානෙය්‍යනාමය, නිසභනාමය, ධොරය්‍යනාමය, දන්තනාමය, අන්ධබාලඅඥානයා බුදුන්ට ද අපරාධ කරයි, රාගානුගත සිත ඉදිරියට නැමෙයි, ද්වෙෂානුගත සිත පස්සට නැමෙයි, වෙද පසක්, සාසනයාගේ නෛර්‍යාණිකභාවය.

iii **භාවය:-**

48\. පඤ්චවෙදය හදාරා සියක් අවුරුද්දක් තපස් ඇතිව හැසිරෙන බ්‍රාහ්මණ කෙනෙක් වුවත් ඔවුන්ගේ සිත් මනාකොට නොමිදුනේ ද ලාමක ගතියෙන් පිරිහුනු අත් ඇති ඔහු තුමූ නිර්වාණපාරයට නොයත්.

49. තෘෂ්ණාවෙන් යටපත් කරණ ලද්දාවූ ව්‍රතයෙන් හා සීල යෙන් බැඳුනාවූ සිය වසක් රූක්ෂ තපස් කරන්නාවූ බමුණු කෙනෙක් වෙත්ද, ඔවුන්ගේ ද සිත් සම්‍යක්විමුක්ත නොවේද, හීනත්වරූපී ඔව්හු නිවන් පරතෙරට නොයත්.

50–51. තල වර්ගය බලනු.

iv. අනුවාදය:—

බිම්බිසාර රජුගේ පුත් අජාසත් කුමරු පිළිසිඳගත් කල ඔහු ගේ මෑනියන් විසින් "මේ මා කුස හොත් ගැබ රජුට සතුරු වන්නේය; මෙයින් මට කිම්" දැයි ගැබ්හෙළීම පිණිස දරුකුස මැඩි හෙයින් "මද්දකුච්ඡි" යයි නම්ලත්, මුවන්ට අභයවාසය පිණිස දුන් හෙයින් මිගදාය නම්වූ; රජගහ නුවර උද්‍යානයෙහි භාග්‍යවතුන් වහන්සේ වැඩවාසය කළසේක. එකල්හි උන්වහන් සේගේ පාදය ගල්පතුරකින් තැලුනේය.

## අනුපූර්ව කථාව.

දෙව්දත් වනාහි අජාසත් නිසා දුනුවායන් යෙදීමෙන්ද, ධනපාලයා මෙහෙයීමෙන්ද, තථාගතයන්ගේ ජීවිතාන්තරායක් කරන්නට නොහැකිවූයේ "සියතින් ම ඔහු මරන්නෙමි"යි ගිජු කුළු පව්වට නැගී කූටාගාරයක් පමණ මහත් ගලක් ඔසවා ගෙණ "ශ්‍රමණභවත් ගෞතම තෙමේ සුණුවිසුණුවේවා"යි පෙර ළයේය. මේ දෙව්දත් ඇතුන් පස්දෙනෙකුගේ බල දරයි; මහත් ථාමවතෙකි; අනුන්ගේ උපක්‍රමයකින් බුදුවරයින්ගේ ජීවිතාන්තරායක් වන්නේය යන මේ කාරණය අවස්ථානයක් මය; කිසිකලක නොවන දෙයකි. තථාගත ශරීරාභිමුඛව එන්නාවූ ඒ කුළුගල තවත් ගලක් නැගී පිළිගත්තේය; දෙගල් ගැටීමෙන් පහන් පතුරක් ගැලවී භාග්‍යවතුන් වහන්සේගේ පිටිපා කෙළවර හැපී තැලුනේය. ශ්‍රීපාදය මහ පොරවකින් පහළාක් මෙන් මතුවූ ලෙයින් ලතුදියෙන් රැඳවූවාක් මෙන් විය; භාග්‍යවතුන්වහන්සේ උඩ බලා දෙව්දත්හට මෙසේ වදාළසේක.

"මොඝ පුරුෂය! තා විසින් බොහෝ අකුශලයක් (ආනන්තරිය පවක්) රැස්කරණ ලදී. යම් බඳුවූ නුඹ ප්‍රදූෂිත සිතැත්තේ වධකචිත්ත ඇත්තේ තථාගතයන්ගේ ලේ උපදවූයෙහිද"යි. එතැන් පටන් භාග්‍යවතුන් වහන්සේට අපාසුවිය. භික්ෂූහු මෙසේ සිතූහ

“මේ ගිජ්ඣකූට විහාරය උජ්ජඞ්ගලය, (උසස් තද රළු බිමය) විෂමය, බොහෝ රජුන්ට හා පැවිද්දන්ට ද දුඃඛමදිය” කියායි ඒ භික්ෂූන්වහන්සේලා තථාගත බුදුන් මඤ්චසිවිකාවකින් (යාප්‍ය ඇඳකින්) උසුලාගෙණ ගොස් “මද්දකුච්ඡි” උයනට වැඩම කර ගත්හ.

එහිදී භාග්‍යවතුන් වහන්සේට බලවත් සුඛ ප්‍රතික්ෂිප්ත බහල ඵරුෂ තීක්ෂණ අමධුර මන නොවඩන ශාරීරික වෙදනා ඇතිවූහ. ඒ වෙදනා අධිවාසන සතිසම්පජඤ්ඤයෙන් සමන්නාගතව නොපෙළෙමින් නිසීදන සඞ්ඝාටි සිව්ගුණ කොට පණවා දකුණු ශ්‍රීපාදයෙහි වාම ශ්‍රීපාදය මදක් ඉක්මවා තබා ගොප් ඇටෙන් ගොප් ඇටය වත් දනෙන් දන වත් නොගැටෙන සේ සයන පරිග්‍රාහක ස්මෘති සම්පජන්‍යයෙන් යුක්තව සම්පරිවත්තක සායිකාවෙන් වෙදනා වසඟ නොවී දකුණැලයෙන් උතුම් සිංහසෙය්‍යාවෙන් සැතපි වදළසේක.

**සෙය්‍යා චතුෂ්කය.**

1. කාමභොගී සෙය්‍යාව.
2. ප්‍රෙත සෙය්‍යාව.
3. සිංහ සෙය්‍යාව.
4. තථාගත සෙය්‍යාව. කියා සෙය්‍යා සතරක් වෙත්.

1. එයින් “යෙභුය්‍යෙන භික්ඛවෙ කාමභොගී සත්තා වාමෙන පස්සෙන සෙන්ති.” යි මේ වදළේ **කාමභොගි සෙය්‍යාවයි.** ඒ කාමභොගීන් අතරෙන් බොහෝ සේ දක්ෂිණපාර්ශ්වයෙන් නිදන්නෝ නම් නැත.

2. “යෙභුය්‍යෙන භික්ඛවෙ පෙතා උත්තානා සෙන්ති.” යි මේ වදළේ **ප්‍රෙතසෙය්‍යාවයි**; ප්‍රෙතයෝ අල්පමාංසලොහිත බැවින් (මස් ලේ නැති නිසා) ම ඇට සැකිලින් අවුල්වීමෙන් එක ඇලයකින් නිදන්නට නොහැකි වෙත්. උඩුකුරුව හොවිත්.

3. “යෙභුය්‍යෙන භික්ඛවෙ සීහො මිගරාජා නඞ්ගුට්ඨං අන්තරසත්ථිම්හි අනුපක්ඛිපිත්වා දක්ඛිණෙන පස්සෙන සයති” යි වදළේ **සිංහසෙය්‍යාවයි**. තෙජසින් උස්සද බැවින්ම සිංහ මෘග රාජතෙම පුරිම පාදවය එක්තැනකද, පශ්චිම පාදවය එක්තැනකද, නඟුට දෙකලවා මධ්‍යයෙහි ද තබාගෙණ දෙපසවූ ගාත්සත රත් නඟුටත් සිටි ඉඹකෙළි සලකා පුරිම පාදවය මතුපිට හිස තබා හොවියි; දවසකුත් නිදා පිබිදෙමින් උත්‍රස්තව (තැතිගෙණ)

නො පුබුදියි; හිස ඔසවා ඉස්සරහ පාදද්වය තුබූ තැන් සලකයි; යම් විදියකින් කිසි තැනක් මාරුවී තිබුනේ නම් "මේ නුඹේ ජාතියට ද නුඹේ සූරභාවයට ද අනුරූප නොවේ"යයි අනත්මන්ව (නො සතුටුව) හුන්වනම හොවියි; ගොදුරු පිණිස පිටත් නො වෙයි. සතර පාදයන් හා නඟුට තුබූ තැන් අවිජහිතව තිබූ නම් "නුඹේ ජාතියටත් සූරභාවයටත් මේ අනුරූපය"යි තුටුපහටුව නැගිට සිංහ විජෘම්භිත විජඹවා කෙසුරු බර ගසා දමා තුන්වරක් සිංහනාද කොට ගොදුරට පිටත්වෙයි.

4. චතුර්ත්ථධ්‍යාන ශෙය්‍යාව වනාහි 'තථාගතශෙය්‍යා' යයි කියනු ලැබේ. ඒ ශෙය්‍යාචතුෂ්කය අතරෙන් මෙහි සිංහ ශෙය්‍යාව ආවාය. මේ වනාහි තෙජෝත්සාද ඊර්‍ය්‍යාපථ හෙයින් උත්තම ශෙය්‍යා නම් වී. මේ තථාගතයන් වහන්සේගේ ගිලන් සයනයේ ආකාරයි.

මෙසේ ගිලන්ව හොත් භාග්‍යවතුන්වහන්සේ බැලීමට සතුල්ලපකායිකා සත්සියක් දෙවතාවෝ පැමිණියෝ බුදුන් වැඳ එකත්පසක උන්හ. ඔවුනතුරෙන් එක් දෙවතාවෙක් උදන් ඇනූහ. ගිලන් ඇඳ ලඟට ආවුන්ට දෙම්නස් වියයුතුයි; මේ දෙවතාවුන්ට වනාහි තථාගතයන්වහන්සේගේ වෙදනාධිවාසනය දැක අහෝ! බුදුවරයින්ගේ මහානුභාවතාවක සැටි බලව්! මෙසා මහත් වෙදනාවක් පවත්නා කල්හිදු විකාරමාත්‍රයකුත් නැත. සිරියහන්හි අලඞ්කාර කොට තැබූ රන්රුවක් මෙන් නොසෙල්වෙන කයින් තිපන්නේය. දූන් වැඩියෙනුත් මුඛවර්ණය බබලයි; ආභාසම්පන්න පූර්ණචන්ද්‍රයා මෙනි; මේ දූන් පිපුන පියුමක් සේ මුන්වහන්සේගේ මුහුන හොබනේය; කයෙහි වර්ණායතනය ද මේ දූන් මනාකොට ඔප දමූ කසුන් පිඩක් සේ 'විප්‍රසන්න' යයි ප්‍රීතිවාක්‍ය පහළ කරමින් "නාගො වත භො සමණො ගොතමො නාගවතාය ච පනු'ප්පන්නා සාරීරිකා වෙදනා දුක්ඛා තිබ්බා ඛරා කටුකා අසාතා අමනාපා සතො සම්පජානො අධිවාසෙති අවිහඤ්ඤමානො"යි කීයේය.

තවත් දෙවතාවෙක් "සීහො වත භො! සමණො ගොතමො සීහවතාය ච පනුප්පන්නා සාරීරිකා වෙදනා දුක්ඛා තිබ්බා ඛරා කටුකා අසාතා අමනාපා සතො සම්පජානො අධිවාසෙති අවිහඤ්ඤමානො'ති කීයේය.

තවත් දෙවතාවෙක්="පඤ්ඤ සමාධිං සුභාවිතං චිත්තඤ්ච සුවිමුත්තං නචාභිනතං නචාපනතං, න ච සසංඛාරනිග්ගය්හවාරිතවතං යො එවරූපං පුරිසනාගං පුරිසසීහං පුරිසආජානියං පුරිසනිසභං පුරිසධොරය්හං පුරිසදන්තං අතික්කමිතබ්බං මඤ්ඤෙය්‍ය ක්මඤ්ඤත්‍ර අදස්සනා"ති.

යනාදී වශයෙන් දෙවතාවෝ සත්දෙනෙක් තත්අයුරින් උදන් ඇනුවෝය.

v. **ප්‍රකීර්ණකරණාර්ථ:—**

**නාගො වත භො**= "භො" යනු ධම්මාලපන සම්මුතිය (දහමින් කථාකිරීමේ සිරිත) යි; 'බලවන්ත' අර්ථයෙන් නාග (ඇත්) වේ. **සීහො වත**=අසන්ත්‍රාස (තැති නොගන්නා) අර්ථයෙන් සිංහ නම් වේ.

**ආජානෙය්‍යා**= ස්වාමිපාරිචර්‍ය්‍යාර්ථයෙන් (හිමියාට අනුකූල පැවැත්මෙන්) කරුණු නොකරුණු දැනීමෙන් හෝ 'ආජානෙය්‍ය' නම් වේ.

**නිසභො**=අප්‍රතිසම අර්ථයෙන් (තමන් සම කෙනෙක් නැත යන තේරුමෙන්) 'නිසභ' නම් වේ. ගවයන් සියයකට දෙටුවූයේ 'උසභ'යි. ගවයන් දහසකට ජ්‍යෙෂ්ඨවූයේ 'වෘෂභ' යි. ගවයන් ශතසහස්‍රයකට ජ්‍යෙෂ්ඨවූයේ 'නිසභ' යි. භාග්‍යවතුන්වහන්සේ වනාහි අප්‍රතිසම අර්ථයෙන් 'ආසභස්ථානය' ප්‍රතිඥකෙරෙයි; ඒ අර්ථයෙන්ම මෙහිදු **'නිසභ'** යයි කියනලදී.

**ධොරය්හො**=ධුරවාහාර්ථයෙන් 'ධොරය්හ' නම් වේ.

**දන්තො**=නිර්විශෙවතාර්ථයෙන් (නොදඟලන) දමුනාවූ;

**සමාධිං**=අර්හත්ඵල සමාධියයි,

**සුවිමුත්තං**=ඵල විමුක්තියෙන් මනාසේ මිදුනු;

**අභිනතං**=රාගානුගත සිත වනාහි අභිනත (ඉදිරියට නැමීම) නම් වේ.

**අපනතං**=ද්වේෂානුගත සිත වනාහි අපනත (ආපසු නැමීම) නම් වේ.

**න චාභිනතං න චාපනතං**=රාගානුගත ද්වේෂානුගත උභය ප්‍රතික්ෂෙපයෙන් යාමක් හෝ හැරීමක් නැති නැවතුනු සිතයි.

**න ච සසඞ්ඛාර නිග්ගය්හවාරිතවතං**=සසංඛාර සප්‍රයොගයෙන් (අනුන්ගේ මෙහෙයීමෙන්) කෙලශනිග්‍රහකොට වාරිතවත් නොවූ කෙලශයන් සුන්කළහෙයින්'වත'නම් වේ. ඵල සමාධියෙන් "සමාහිතය" යන අර්ථයි.

**අතික්කාමිතබ්බං**=වෙහෙසිය යුතු ගැටියයුතු; (ඉක්මවා යා යුතු)

**අදස්සනං**=අනුවනයි; අඥනවූ ම අඤබාලයෙක් ම එනත් ස්වරූප ශාස්ත්‍රෑන් කෙරේ අපරාධ කෙළේ යයි **දෙවදත්තශා** ටවා කියත්.

**පඤ්චවෙදූ**=ඉතිහාස පස්වෙනි කොට ඇති (ඍක්-යජුර්-සාම-අථර්වන්-ඉතිහාස) වෙදයන් දරන්නාවූ;

**න සම්මා විමුත්තං**=මෙබඳුවූ බ්‍රාහ්මණයෝ පවා අවුරුදු සියක් හැසුරුනත් ඔවුන්ගේ සිත් ද මනාකොට නොමිදුනෝය.

**හිනත්තරූපා න පාරඞ්ගමා තෙ**=ලාමකත්‍ව ස්වභාව ඇති ඔව්හු නිර්වාණඩගම නොවෙත්. "හීන'ත්ථ රූපා" යනු ද පාඨයි; "හීනාඃ ජාතිකයෝ පිරිහුණු අර්ථ ඇතියෝ" යන තේරුමයි.

**තණ්හා'ධිපන්නා**=තෘෂ්ණාවෙන් අධ්‍යවසනෲනයෝ (තණ්හාවෙන් කිඳ බැස්සෝ)

**වත සිලබ්බා**=අජ ව්‍රත-කුක්කුර ව්‍රත ආදී ව්‍රතයන් කාරණ කොටගෙණ ද තාදෘශ ශීල (එළුසිල්-බලුසිල් ආදිය) කරණකොට ගෙණද බැඳුනෝ;

**ලූඛං තපං**=පස් තැපුන් තපින්නාවූ කණ්ටක ශෙය්‍යාදියට ඇතුලත්වූ රළු තපස්; (ඉරමුදුන් වේලාවට සතර පැත්තෙන් ගිනිමැල සතරක් දල්වාගෙණ ඊ මැද උඩබලා ගිනිදෙවියා පිදීම විය යුතුයි.)

—:—

## 4, 8. සකලික සූත්‍රප්‍රදීපයයි.

—:—

52. වෙසාලිවනෙ විහරන්තං-අග්ගං සත්තාන සම්බුද්ධං,
කොකනදාහමස්මි අභිවන්දෙ-කොකනදා පජ්ජුන්නස්ස ධීතා.

53. සුතමෙව මෙ පුරෙ ආසි-ධම්මො චක්ඛුමතානුබුද්ධො,
සාහං'දානි සක්ඛි ජානාමි-මුනිනො දෙසයතො සුගතස්ස.

54. යෙ කෙචි අරිය ධම්මං-විගරහන්තා චරන්ති දුම්මෙධා,
උපෙන්ති රොරුවං ඝොරං-චිරරත්තං දුක්ඛං අනුභව'න්ති.

55. යෙ ච ඛො අරියධම්මෙ-ඛන්තියා උපසමෙන උපෙතා,
පහාය මානුසං දෙහං-දෙවකායං පරිපූරෙස්සන්තීති.

---

### 4 - 9 - (52 - 53 - 54 - 55.)

i. **මාතෘකා:—**

**ආර්‍ය්‍යධර්මයට ගැරහීමෙන් රෞරව නරකයත්,**
**රුචි වීමෙන් දිව්‍ය ලොකයත් ලබති.**

ii. **පිණ්ඩාර්ථය:—**

වස්සවලාහක දෙව්රජදුවගේ ධර්මාවබොධය, නම්-ගම්-ගොත් දම් කීයා වැඳීම, ආර්‍ය්‍යධර්ම ගර්හාවෙන් දුඃඛානුභවය, ආර්‍ය්‍යධර්මයෙහි යෙදීමෙන් දිව්‍යසමූහයට ඇතුළත්වීම, සත්වාග්‍ර සම්බුදුන්;

iii. **භාවය:-**

52. මම වස්සවලාහකයාගේ දුහිතෘවූ **කොකනද** වෙමි; ඒ මම **වෙසාලි** වනයෙහි වාසය කරන්නාවූ සත්වයන්ට අග්‍රවූ සම්බුදුන් සකසා වඳිමි.

53. චක්ෂුර්මතුන් වහන්සේ විසින් චතුස්සත්‍ය ධර්ම පරිච්ඡෙදයාදී වශයෙන් අනුබොධ කෙලේය කියා මා විසින් පෙර ඇසීම් මාත්‍රයක් ම ය; ඒ මම දැන් "මෞන" ගුණයෙන් යුත් දහම් දෙසන්නාවූ සුගතයන් වහන්සේගේ ධර්මාවබොධය ඇස් හමුවෙහි දුටිමි.

54. නුවණ නැති යම්කිසි කෙනෙක් ආර්‍ය්‍ය ධර්මයට නිගා කරමින් හැසිරෙත් ද (අකුරු අඩුය-පද හීනය-අරුත් මදය කියා හෝ නිවන් නොදෙන්නේය යි ගරහ ගරහා ඇවිදිද්ද) ඔව්හු දරුණු රෞරව නිරයට උත්පත්තිවශයෙන් පැමිණෙත්. එහිදී චිරාත්කාලයක් මුළුල්ලෙහි නිරාදුක් විඳිති.

55. පැණවත් යම් කෙනෙක් වනාහි ආයතිධර්මයෙහි රිසි කොට ගන්නා ක්ෂාන්තියෙන් ද, රාගාදීන් සන්සිඳවීමෙන් ද, උපෙත වූ ඒව පැමිණ පවතිත් ද, ඒ ආයතිධර්මය රුචිකර කමාකර රාගාදීන් ව්‍යුපශමිතයෝ මිනිස් දෙහය හැරදමා දිව්‍යකාය පරිපූර්ණ කරන්නාහුය.

iv. අනුවාදය:-

(කොකනද කථාව) විශාලාමහනුවර මහවනයෙහි වූ කූටාගාර ශාලාවේදී ප්‍රද්‍යුම්නගේ දූ වූ කොකනද දෙවඟණ භාග්‍යවතුන් වහන්සේ සමීපයේදී මේ ගාථා කීවාය.

v. ප්‍රකටීකරණාර්ථ:—

**පජ්ජුන්නස්ස ධීතා**=ප්‍රද්‍යුම්න නම් ඇති වස්සවලාහක චාතුර්මහාරාජික දිව්‍ය රජයාගේ දුහිතෘයි.

**අභිවන්දෙ**=භාග්‍යවතුනි! නුඹවහන්සේගේ ශ්‍රී පාදයන් සකසා වඳිමි.

**චක්ඛුමතා**=මාංශ චක්ෂුස, දිව්‍ය චක්ෂුස, ප්‍රඥා චක්ෂුස, බුද්ධ චක්ෂුස, සමන්තාත් චක්ෂුස යන පඤ්ච චක්ෂුසින් චක්ෂුර්මත් තථාගතයන්වහන්සේ විසින්; **ධම්මො අනුබුද්ධො**=ධර්මය පරිඥෙයාදී වශයෙන් අවබොධ කෙළේ යයි මේ කාරණය මා විසින් පෙර අනුන්ලඟදී ඇසීම පමණක්ම වීයැයි කියායි. **සක්ඛි ජානාමි**=ප්‍රතිවෙධ වශයෙන් ප්‍රත්‍යක්ෂකොට දනිමි.

**විගරහන්තා**=හීනාක්ෂර පදව්‍යඤ්ජනය කියා හෝ අනෛර්යාණිකය කියා හෝ මෙසේ ගරහන්නෝ; **රොරුවං**=රෞරව නරක දෙකක් වෙත්; ධූමරෞරවය, ජාලරෞරවය කියායි. මේ ජාලරෞරවය වනාහි අවීචිමහානරකයට ම නමකි; එහි සත්වයෝ වනාහි ගිනි දිලිසෙන දිලිසෙන කල්හි නැවත නැවත හඬත්; එහෙයින් ඒ අවීචිනරකය තෙම රොරුව යයි කියනු ලැබේ.

**ඛන්තියා උපසමෙන උපෙතා**=රුචිකොට ක්ෂමාකොට ගන්නා ක්ෂාන්තියෙන් ද, රාගාදී උපසමයෙන් ද උපෙතයි.

——:——

## 4. 9. පජ්ජුන්නධීතු සූත්‍රප්‍රදීපයයි.

——:——

56. ඉධාගමා විජ්ජුපභාසවණ්ණා
කොකනදා පජ්ජුන්නස්ස ධීතා,
බුද්ධඤ්ච ධම්මඤ්ච නමස්සමානා
ගාථා ඉමා අත්ථවතී අභාසි.

57. බහුනා පි ඛො තං විභජෙය්‍යං
පරියායෙන තාදිසො ධම්මො,
සඞ්ඛිත්තමත්ථං ලපයිස්සාමි
යාවතා මෙ මනසා පරියත්තං.

58. පාපං න කයිරා වචසා මනසා
කායෙන වා කිඤ්චනං සබ්බලොකෙ,
කාමෙ පහාය සතිමා සම්පජානො
දුක්ඛං න සෙවෙථ අනත්ථසංහිතන්ති.

---

**4 – 10 – ( 56 – 57 – 58. )**

i. **මාතෘකා:-**

**ධර්මය සංක්ෂෙපයෙන් කියන පරිදි.**

ii. **පිණ්ඩාර්ථය:-**

බුද්ධ-ධර්ම නමස්කාරයෙන්ම සඹසයාටත් වැදිම, අර්ථවත් ගාථා, දිව්‍යාඞ්ගනාවන්ට ධර්ම විභාග කළ හැකිබව, සාමාන්‍ය දහම් පරියාය බොහොමයකින් බෙදිය හැකි බව, සිතෙන් හැදූරූ බණ සංක්ෂෙපයෙන් කීම, තුන්දොරින් පව්නොකිරීමත්, සර්ව ලොක යෙහි නො ඇලී කාමය දුරුකර සිහිඇතිව නුවනින් යෙදී අනර්ථ සංහිත දුඃඛ සෙවනයත් නොකටයුතුබව.

iii. **භාවය:-**

56. පජ්ජුන්නධීතු **කොකනද** තොමෝ විදුලිය පැහැයෙන් බබලමින් බුදුන් ද, දහම් ද, සඟුන් ද නමදිමින් මා සමග මෙහි ආවාය; "වෙසාලිවනෙ විහරන්තං" යනාදී ඒ මේ අරුත් ඇති ගාථාවන් ද කීවාය.

57. ඒ කියනලද ධර්මය බොහෝ ක්‍රමවලින් මම විභාග කරන්නෙමි ධර්මය පරියායයෙන් තාදෘශ වේ. මා විසින් සිතින් පිරියත් අරුත් (මොහොතකින්ම) සැකෙවින් කියා පාන්නෙමි.

58. (58) කියනලද මැයි.

iv. **අනුවාදය**:–

භාග්‍යවතුන්වහන්සේ විසල්පුර මහවන කූටාගාර ශාලාවේ වැඩවාසය කරණ කල්හි **පජ්ජුන්නවලාහකයාගේ** ධිතෘවක්වූ **චූලකොකනද** තොමෝ බුදුන් වෙතට එළඹ මේ ගාථා කීවාය.

v. **ප්‍රකාශිකරණානි**:–

**ධම්මඤ්ච**=මෙහි "ච" ශබ්දයෙන් සඞ්ඝයාද ගැණේ. මෙසේ තුණුරුවන් නමදිමින් මෙහි ආවායයි කියා.

**අපචායති**=අභිවත් වූවා;

**බහුනා'පි ඛො තං**=යම් දහමක් කියේ ද ඒ දහම් බොහෝ ක්‍රමවලින් මම විභජනය කරන්නෙමි.

**තාදිසො ධම්මො**=භාග්‍යවතුනි! මේ ධර්මය තෙමේ එබඳු සංඝිති ඇත්තේය. සප්‍රතිභාග වේ. බහුපරියායයෙන් විභාග කට යුතු වේ යයි දක්වයි.

**ලපයිස්සාමි**=කියන්නෙමි.

**යාවතා මෙ මනසා පරියත්තං**=යම්තාක් මා විසින් හිතෙන් පිරවිද, ඒ තාක් දවස මුළුල්ල නොකියා මී පටලක් පෙළන්තාක් මෙන් මොහොතින්ම හකුළුවා කියන්නෙමි. සෙස්ස පෙරසේ මැයි.

——:——

# 4. 10. චූලකොකනද සූත්‍රප්‍රදීපයයි.

——.——

සතරවන සතුල්ලපකායික වගයි.

(තස්සුද්දානං.

සබ්භි මච්ඡරිනා සාධු-න සන්ති'ජ්ඣාන සද්ධිකා,
සමයො සකලිකා-උභො පජ්ජුන්නධීතරෙ'ති.)

1. ආදිත්තස්මිං අගාරස්මිං-යං නීහරති භාජනං,
තං තස්ස හොති අත්ථාය-නො ච යං තත්ථ ඩය්හති.

2. එව මාදිත්තකො ලොකො-ජරාය මරණෙන ච,
නීහරෙථෙව දානෙන-දින්නං හොති සුනීහතං.

3. දින්නං සුඛ ඵලං හොති-නාදින්නං හොති තං තථා,
චොරා හරන්ති රාජානො-අග්ගි ඩහති නස්සති.

4. අථ අන්තෙන ජහති-සරීරං සපරිග්ගහං,
එතදඤ්ඤාය මෙධාවී-භුඤ්ජෙථ චෙව දදෙථ ච;
දත්වා ච භුත්වා ච යථානුභාවං
අනින්දිතො සග්ගමුපෙති ඨානන්ති.

---

**5 - 1 - ( 1 - 2 - 3 - 4 ).**

i. **මාතෘකා:-**

**ලෝකය ඇවිලීමත් නිවීමත් කෙසේද යනබව.**

ii. **පිණ්ඩාර්ථය:-**

එකොළොස් ගිනි, දානපුණ්‍යචෙතනාව, එය දායකයාට ම යි; දීමෙන් පිටට ගතයුතුයි, නොදීමෙන් ඇවිලෙයි, දුන් දේ සුවඵලවයි, නුදුන් දේ සැප නොදෙයි, දීමෙන්ද අනුභවයෙන්ද ඒ ආනුභාවයෙන් අනින්දිතව ස්වර්ගයට පැමිණේ.

iii. **භාවය:-**

1. ඇවිලගත් ගෙයි තුබූ යම් බඳුනක් බැහැරට ගණීද, ඒ බඳුන ඔහුට වැඩ පිණිස වේ; යම් බඩුවක් පිටතට නොගත්තේ නම් ඒ බඩුව එහි දැවෙයි.

2. එපරිද්දෙන් සත්වලොකය තෙමේ ජරාවෙන්ද, මරණයෙන්ද, එකොළොස් ගින්නෙන් ම ඇවිල ගත්තේය; එබැවින් දානයෙන් පිටතට ගත්තේය; දෙනලද්ද සුනීහෘත වේ; හොඳින් පිටතට ගත්තේ වේ; නොහොත් තැන්පත්කළේ වේ.

3. දුන් දේ සුවපල වේ; නුදුන් ඒ දේ එසේ නොවේ. සොරු ගණිත්; රජදරුවෝ ගණිත්; ගින්න දවයි; නැසෙයි.

4. තවද මරණයෙන් පරිග්‍රහ සහිත ශරීරය දුරින් දුරු කරයි; නුවණැත්තෝ මේ කාරණය දැනගෙණ අනුභව ද කරන්

නේය; දෙන්නේ ද වේ, දීමෙන්ද, කැමෙන්ද, ඒ ආනුභා වූ පරිද් **දෙන්** නින්ද නොලැබ සුවයෙන් අග්‍රස්ථානය (දෙව්ලොව) ට පැමිණේ.

iv. **අනුවාදය:—**

**සැවැත්** නුවරදී නාමගොත්‍රයෙන් අප්‍රසිඩ දෙවතාවෙක් කීයේය.

v. **ප්‍රකටීකරණාර්ථ:-**

**ජරාය මරණේන ච**=මේ දෙශනා ශීර්ෂයයි; රාග, (ඇල්ම) දේස (වෛර), මොහ (මුළාව), ව්‍යාධි (රෝග), ජරා (දිරීම), මරණ, සොක (සිත තැවීම), පරිදෙව (වැළපීම), දුක්ඛ (දුක), දෞමනස්‍ස (දෞර්මනස-මානසික දුක්ඛය), උපායාස (ඇතුළත දැවෙන බලවත් සොකය), යන එකොළොස් ගින්නකින් ලෝවැසි තෙම ආදීප්ත වේ.

**කියේ මැනේ:-**

රාගො ච දේසො ච මොහො ච ව්‍යාධි
ජරා ච මරණම්පි ච සොකමෙව,
පරිදෙව දුක්ඛම්පි ච දෙමනස්සු
පායාස මෙකාදස අග්ගි මාහා'ති.

**දානෙන**=දානවෙතනාව කාරණකොට ගෙණ, තමන් සතු දේ පරිත්‍යාග කිරීමෙන්;

**දින්නං හොති සුනිභතං**=දානපුණ්‍යචෙතනාවෙන් දුන් දෙය වනාහි දායකයාට ම වෙයි. නීහට බඩු ගෙහිමියාට අයිති වන්නාක් මෙනි.

**චොරා හරන්ති**=නුදුන් භොගයන් සොරහු ද හැරගණිත්; රජවරු ද ගණිත්; ගින්නද දවයි.

**නස්සති**=තුබූතැනද නැසෙයි.

**අන්තෙන**=මරණයෙන්;

**සරීරං ච පරිග්ගහං**=ශරීරය ද වෛරාදීන්ගේ වශයෙන් නො වැනසූ භොගයන්ද;

**සග්ගමුපෙති=චෙසතුරු** මහාරාජාදීන් මෙන් ස්වර්ගයෙහි උපදී.

—:—

## 5. 1. ආදීප්ත සූත්‍රප්‍රදීපයයි.

—:—

**5. කිං දදො බලදො හොති - කිං දදො හොති වණ්ණදො,**
**කිං දදො සුඛදො හොති - කිං දදො හොති චක්ඛුදො;**
**කො ච සබ්බදදො හොති - තං මෙ අක්ඛාහි පුච්ඡිතො'ති.**

**6. අන්නදො බලදො හොති - වත්ථදො හොති වණ්ණදො,**
**යානදො සුඛදො හොති - දීපදො හොති චක්ඛුදො.**

**7. සො ච සබ්බදදො හොති - යො දදාති උපස්සයං,**
**අමතං දදො ච සො හොති - යො ධම්මමනුසාසතීති.**

---

**5 – 2 ( 5 - 6 – 7. )**

i. **මාතෘකා :-**

**ලැබීමට දියයුතු දේ සහ අනුරූප විපාක.**

ii. **පිණ්ඩාර්ථය:-**

ආහාරයෙන් බලසම්පන්න වේ, ඇඳීමෙන් වර්ණවත් වේ, (ශ්‍රමණයන්ට කැප යානාවල් දීමෙහි අනුසස්, සැරයටියත් යානාවකි,) යනතින් සැප ලැබේ, පහතින් ඇස් ලැබේ, ආවාස යෙන් සියල්ල ලැබේ, දහම් දෙසන්නා **අමෘතදායක** දෙයි, සියළු දානයන්ට වඩා ධර්මදානය අග්‍රයි

iii. **භාවය:—**

5. කුමක් දෙන්නේ බලය (ශක්තිය) දේද, කුමක් දෙන තැනැත්තේ වර්ණය දේද, කුමක් දෙන්නේ සුව දේද, කිනම් දෙයක් දෙන්නේ චක්ෂුස් දේද, යමෙක් සියල්ල දෙන්නේත් වේද, ඒ කාරණය විචාරණ ලද මට වදාළ මැනවි.

6. ආහාර පාන දෙන තැනැත්තේ බලදායක වෙයි; වස්ත්‍ර දෙන්නේ වර්ණදායක වේ; යාන් දෙන්නේ සැපදායක වේ; ප්‍රදීප දෙන තැනැත්තේ චක්ෂුස් දායක වේ.

7. යමෙක් ආවාසදානය කෙරේද හෙතෙම යට කී සියල්ලම දෙන්නේ වේ. යම් ධර්මධරකෙනෙක් ධර්මානුශාසන කෙරේද ඒ ධර්මධරතෙම **"අමෘතදායක"** වේ.

v **ප්‍රකටීකරණාර්ථ :-**

**අන්නදො**=යම් හෙයකින් ඉතා බලවතා ද දෙතුන් බතක් නුබුදීමෙන් නැගී සිටින්නට නොහැකි වෙයි ද; දුබලයා වී නමුත් වැළඳීම් හේතුවින් වනාහි බලසම්පන්න වේ ද; එසේ හෙයින් ආහාරදෙන්නා බල දෙන්නේයයි කියූ.

**වණ්ණදෙ**=යම් හෙයකින් මනා රූ ඇත්තේ ද දුස්සොළු තිස්සලු (දුම්සත්‍ර-තිම්සත්‍ර) වූයේ විරූප වේ ද; අවහෙළා දක්නෝ දක්නට නොහැකි වේ ද; වස්ත්‍රයෙන් ප්‍රතිච්ඡන්නවූයේ දිව්‍යපුත්‍රයෙක් මෙන් ශොභමාන වේ ද; ඉන්නිසා වන් (වණ්ණ) දුන්නේ වේ යයි කියේය.

**යානදෙ**= 'හස්තියාන' ආදිය දායකයි. ඒ 'යහන්' අතුරෙන්:-

"න හත්ථියානං සමණස්ස කප්පති
න අස්සයානං න රථෙන යාතුං,
ඉදඤ්ච යානං සමණස්ස කප්පති
උපාහනා රක්ඛතො සීලක්ඛන්ධනති."

කිහෙයින් ඡත්‍ර- උපාහන (කුඩ-වහන්) සැරයටි- ඇඳ- පුටු දායකද; යමෙක් මාගී (පින් පිණිස) ශුඩකෙරේද, හිණිමන්- පෙත්මන් කෙරේද, ඝේදඬු- පාලම් කෙරේද, නැව්- ඔරු- පාරු පිළියෙල කෙරේද, ඒ සියල්ලත් යානදායකම වෙයි..

**සුඛදෙ හොති**:= යානය තමා සුවපහස් එලවන හෙයින් සැප දෙන්නේ වේ.

**චක්ඛුදෙ** (හොති):= අඳුරෙහි ඇස් ඇත්තන්ටත් රූ දැකුම් නැති හෙයින් ප්‍රදීපදෙන්නේ චක්ඛුදායක නම් වෙයි; අනුරුද්ධ තෙරුන් මෙන් දිවැස් සම්පත් ද ලබයි.

**සබ්බදදෙ හොති**:=සියලු බලාදීන්ගේම දායක වෙයි; දෙතුන් ගමෙක්හි පිණ්ඩපාතයට ගොස් කිසිත් නොලැබ පෙරළා ආවුන්ට ද සිහිල් පොකුණේ නහා පතිශ්‍රයට ප්‍රවිෂ්ඨව(පියස්සයටට පිවිස) දෙරපියාගෙන මොහොතක් නිදා නැගිට නිසන්නහුටද විසභාග සන්තති (නොසම සන්තැත්ත) උපසම වෙයි; සභාගසන්තතිය බැසගණියි; වණ්ණායතනය අහරින් (ගෙණවුත්) පැකිත්තාක්(දැමීමටක්)මෙන් වෙයි; පිටත හැසිරෙන්නහුටද පයේ කටු විදෙයි; කණු පැහැරෙයි; උල් ඇනෙයි; සිරිසප් ආදි පරිශ්‍රයද සොර ආදි බියද උපදියි; ගෙට වැදී දෙරපියා නිදිගත්තහුට ඒ සියළුම සම්බාධයෝ නොවෙත්; හදරන්නහුට ධර්මප්‍රීතිසුඛයද කමටහන් මෙනෙහි කරන්නහුට **උපසමසුඛය** ද උපදියි; එසේම බිහි සෙරෙන්න (පිටත හැසිරෙන්න)හුට ද දහඩිය වැගිරෙයි; ඇස් කරකැවෙයි; සෙනස්නට පිවිස්නා කෙණෙහි ලිදේ බැස්සාක් මෙන් වෙයි,

මැසි (ඇඳක්) පුටු ආදිය නොපැනෙත්; මොහොතක් උන්න හුගේ වනාහි චක්ෂුඃප්‍රසාදය අහරින් දැමූවාක් මෙන් වෙසි; වාර වාතපාත මසඬපීඨාදීන් පෙණෙත්.

එයින් කියනලදී:= "සො'ච සබ්බදදෙ හොති යො දදති උපස්සයං" යි.

**අමතං දදෙ' ච සො හොති**:=ප්‍රණීත භොජනයෙන් පාත්‍රය පුරවන්නාක් මෙන් අමරණදානය නම් වෙසි.

**යො ධම්මමනුසාසති**:= යමෙක් ධර්‍මය අනුශාසන කෙරේද, අර්‍ථකථා කියයි ද, පාළිය වාචනාකෙරේද, ඇසූ ප්‍රශ්න විසඳයි ද, කර්‍මස්ථාන අභිමුඛ කොට කියයි ද, ධර්‍මදෙශනාකරයිද, ධර්‍මශ්‍රවණ කරවයිද, තෙල සියල්ලමත් "**ධම්මමනුසාසති**" නම්. සර්‍වදාන යන්වම වඩා මේ **ධර්‍මදානය** අග්‍රයයි දතයුතුයි.

කියේ මැනෝ:-

"සබ්බදානං ධම්මදානං ජිනාති
සබ්බං රසං ධම්මරසො ජිනාති,
සබ්බං රතිං ධම්මරතී ජිනාති
තණ්හක්ඛයො සබ්බදුක්ඛං ජිනාති" යි.

——:——

# 5. 2. තිරෝද සූත්‍රප්‍රදීපයයි.

——:——

8. අන්න මෙවාභි නන්දන්ති-උභයෙ දෙවමානුසා,
අථ කො නාම සො යක්ඛො-යං අන්නං නාභිනන්දතී'ති.

9. යෙ'නං දදන්ති සද්ධාය-විප්පසන්නෙන චෙතසා,
තමෙව අන්නං භජති-අස්මිං ලොකෙ පරම්හි ච.

10. තස්මා විනෙය්‍ය මච්ඡෙරං-දජ්ජා දානං මලාභිභූ,
පුඤ්ඤානි පරලොකස්මිං-පතිට්ඨා හොන්ති පාණිනන්ති.

---

5 - 3 - (8 - 9 - 10)

i. **මාතෘකා:—**

**ආහාරදානයෙන් මෙලෝ පරලෝ දෙක්හිම සැප ලැබෙන බව.**

ii. **පිණ්ඩාර්ථය:-**

දෙවියෝ ද ආහාරය ප්‍රාර්ථනා කරති; මනුෂ්‍යයෝ ද ආහාරය ප්‍රාර්ථනා කරති; අන්නාභිනන්දනය නොකරන්නේ කිනම් යකෙක්ද? දුන්දෙය ලුහුබඳියි. මජරකම හික්මවන්නේය. මල මැඩ දන් දෙන්නේය. **පරලොවට පිහිට වන්නේ පිනයි.**

iii. **භාවය:—**

8. දෙව්මිනිස් දෙකොටසම ආහාරය සතුටින් පිළිගණිත්; තවද යම්හෙයකින් යමෙක් ආහාරය නොපතයිද හෙතෙම මොන සතෙක් ද?

9. සැදැහැයෙන් විශෙෂයෙන් ප්‍රසන්න සිතින් යම් කෙනෙක් බත් පැන් අහර දෙත්ද, ඒ දුන් ආහාරයතෙම මේ ලෙව්හි ද පරලෙව්හි ද ඒ අන්නදායකයාම භජනයකරයි.

10. සතුල්ලපකායිකවර්ගයෙහි 10 වෙනි භාවය බලනු.

v. **ප්‍රකටීකරණාර්ථ:-**

**අභිනන්දන්ති**:= ප්‍රාර්ථනාකරත්.

**භජති**:= උපගමනය කරයි: වෙතට එළඹෙයි. **චිත්තගහපති සිවලී සථවිරාදීන්** කෙරෙහි මෙන් දන ඵලවිපාක පසුපස ලුහු බඳියි.

**චිත්තගහපති වත.**

"එත'දග්ගං භික්ඛවෙ මම සාවකානං ධම්මකථිකානං උපාසකානං යදිදං චිත්තො ගහපති" යනුවෙන් ධර්මකථික උපාසකයන් අතුරෙන් අග්‍රතනතුරු ලද්දේය.

හෙතෙම වනාහි පියුමතුරා බුදුන් කල හංසවතීයෙහි කුලවත් ගෘහයක උපන්නේය. පසු කාලයක බණ අසන්නේ ඒ පදුමුත්තර ශාස්තෘන්වහන්සේ එක් උපාසකයෙක් ධර්මකථිකයින් අතුරෙන් අග්‍රස්ථානයෙහි තබනවා දැක පුණ්‍යාධිකාර (කර්ම) කොට ඒ ස්ථානාන්තර ප්‍රාර්ථනා කෙළේය. හෙතෙම කල්ප ශතසහස්‍රයක් දිව්‍යමනුෂ්‍ය සම්පත් විඳිමින් සැරිසරා කාශ්‍යප බුද්ධ කාලයෙහි මුවවැදි ගෙදරක උපන්නේය; අපරභාගයෙහි එක්දවසක් වැසි වසිද්දී මෘගයන් මැරීමට සැත්ගෙණ මහවනයට ගොස් මුවරු බලමින් හැසිරෙන්නේ එක්තරා අකටපබ්භාරයක (කඳුබෑවුම් පත්බරයක) හිස වසා පංශුකූල පොරවා ගල්පුවරුවක හිඳගත් එක් භික්ෂුවක් දැක "එක් ආයුෂ්මතුන්වහන්සේ නමක් මහණදම් කරමින් වැඩහිඳින්නේවනැයි" සංඥා උපදවා වේගයෙන් ගෙදර ගොස් එක් උදුනක ඊයේ ගෙනා මස් ද එක් උදුනක බත් ද පිසවා පිණ්ඩචාරික භික්ෂූන් දැක උන්වහන්සේලාගේ පාත්‍රගෙණ ගෙදර පණවතලද අස්නෙහි වඩාහිඳුවා භික්ෂාව පිළිගන්වා "ස්වාමිවරුන් වළඳවනසේක්වා" යි අනිකෙක් අණවා ඒ බත කළයක දමා කොළපතකින් මුවබැඳ බත්කළය රැගෙනයන්නේ, අතරමගදී තන්වැදූරුම් මල්කඩා පත්ගොටුවකින් ගෙන තෙරුන් වැඩහිඳි තැනට ගොස් බත්කළය ඔතාරා (බිමතබා) "වහන්ස! මට සංග්‍රහ කළ මැනව" යි කියා තෙරුන්ගේ පාත්‍රය ගෙන බත් පුරවා තෙරුන් අත තබා ඒ මුසුමලින් තෙරුන් පුදා එකත්පසක සිටියේ "යම්සේ මේ රස පිණ්ඩපාතය සමග පුෂ්පපූජාව සිත පිරිතොස් (සතුටු) කෙළේද එපරිද්දෙන් මට උපනුපන් තැන දහස්ගණන් පඬුරු එත්වා, පස්වණක් කුසුම්වැසි ද වසීවා" යි කියේය. තෙරුන්වහන්සේ ඔහුගේ හෙතුසම්පත් දැක දෙතිස් අයුරු කමටහන් කියාදුන්නේය. ඒ මුවවැදිතෙම යාවජීව (ජීවිතාන්තය දක්වා)යෙන් කුසල්කොට දෙව්ලොව උපන්නේය. උපන්තැන දනමත්තක් අවදියෙන් දිවමල් වැසි වැස්සේය. තෙමේ ද අනික් දෙවතාවන් අතුරෙන් අධිකතර රූපයෙන් සමන්නාගත විය; හෙතෙම එක් බුද්ධාන්තරයක් දිව්‍යමනුෂ්‍යයන් අතර සංසරණය කොට මේ බුද්ධොත්පාදයෙහි මගධරට මච්ඡිකා සණ්ඩ නගරයෙහි සිටුකුලයක උපන්නේය; ඔහුගේ උත්පත්ති කාලයෙහි සියළුම නගරය තුළ දන පමණ උසින් පඤ්චවර්ණ කුසුම වර්ෂාවක් වැස්සේය.

ඉක්බිති ඔහුගේ මව්පියෝ අපේ පුත්තෙමේ ම තමාගේ නම ගෙණ ආයේය. ඔහු උපන් දවසේම මුළුනුවර පස්වන්මලින් විසිතුරු වූයේනුයි චිත්තකුමාරයයි නම් කළාහුය. හෙතෙම

මෑතභාගයෙහි ගෘහවාසයෙහි පිහිටියේ පියාගේ ඇවෑමෙන් ඒ නුවර **සිටුතනතුරට** පැමිණියේය. ඒ කාලයෙහි **පස්වග** තෙරුන් වහන්සේලාට අයත් **මහානාම** නම් තෙරණුවෝ **මච්ඡිකාසණ්ඩ නගරයට** වැඩියේය. චිත්තගහපති (ගොවි) තෙමේ උන්වහන්සේගේ ඉරියව් පැවැත්මෙහි පැහැදී පාත්‍රය රැගෙන ගෙට පමුණුවා පිණ්ඩපාතය දීමෙන් ප්‍රතිමානයකොට කළ බත්කිස ඇති ඒ මහානාම තෙරුන් **අම්බාටකාරාමයෙහි** උයනට වැඩම කරවා එහි උන්වහන්සේට වසන තැන් කරවා නිබඳ තම ගෙදර පිණ්ඩපාතය ගෙණ වසන්නට ප්‍රතිඥගත්තේය.

**මහානාම** තෙරුන්වහන්සේද ඒ **චිත්තගෘහපතියාගේ** උපනිශ්‍රය සම්පත් දැක දහම්දෙසනසේක් **සළායතන** බෙදීමට **සළායතන විභත්තියම** දෙසූසේක. **චිත්තගෘහපතිතෙමේ** පූරිම භවයෙහි මඩනාලද සංස්කාරතා හෙතුවෙන් නොබෝකලකින්ම **අනාගාමිඵලයට** පැමිණියේය.

ඉක්බිති එක් දවසක් **ඉසිදත්ත** තෙරුන්වහන්සේ එහි වැඩමවා වාසයකරණසේක් චිත්තගෘහපතියාගේ නිවෙසනයෙහි දන් වළඳ අවසන්හි **මහානාම** තෙරුන් විසින් පැන විසඳන්ට නොහැකිවන්නෙන් ආරාධනාකරණ ලදසේක් ඒ ගැහැවියාගේ ප්‍රශ්න විසඳ ඔහු විසින් **ඉසිදත්ත** තෙරණුවෝ පූර්වයෙහි ගිහි යහළුවෙක් බැව් දැනගත්කල "දැන් මෙහි නොවිසියයුතු ය යි" කැමති සේ බැහැර වැඩිසේක.

නැවත එක්දවසක් **සිත්ගැහැවි** තෙමේ **මහානාම** තෙරුන්ට සෘද්ධිප්‍රාතිහාර්යයක් කරණු පිණිස යාච්ඥකෙළේය. උන්වහන්සේත් ඔහුට **තෙජෝසමාපත්ති පෙළහර** දක්වා "දැන් මෙහි වාසයකරන්ට නොයුතුයයි" සුවසේ බැහැරට වැඩිසේක.

නැවත එක් දවසක් දැගසව් (සැරයුත්- මුගලන් දෙනම) භික්ෂූන් දහස් සඟුන් පිරිවරා **අම්බාටකාරාමයට** වැඩියාහ; චිත්ත ගෘහපතිතෙමේ උන්වහන්සේලාට මහත් සත්කාර සූදානම්කෙළේය. **සුධම්ම** නම් තෙරණුවෝ ඒ සත්කාර නො ඉවසමින් සිටානන්ට **තිලසඞ්ගුලික** වාදයෙන් (තලහැඟිලි කථාවෙන්) ගටා බැණ ඒ කාරණයෙන් **ප්‍රණාමිත** ලද්දේ ගිහියන්ට බැණීමේ **පටිසාරණීය කර්මය** ලැබුයේ ශාස්තෲන්වහන්සේ සමීපයට ගොස් අවවාද ලබා දශබලධාරී බුදුන්ගේ අවවාදයෙහි සිටියේ චිත්තගහපතියා සමාකරවාගෙන අම්බාටකාරාමයෙහි විහරණයකරමින් විදසුන් වඩා අර්හත්වයට පැමිණිසේක.

එකල්හි උපාසකතෙම මෙසේ සිතුයේය. "මම දසබල බුදුන් නොදැක චිරකාලයක් පසුකෙළෙමි; ශාස්තෘන් සමීපයට යන් නහු විසින් වනාහි හිස්අතින් යෑම අයුක්තය"යි ගැල් පන්සියය කින් තලතෙල්, උක්සකුරු, මීපැණි, ආදිය ගෙන්වාගෙන "දසබල බුදුන් දකිනු කැමති යම් කෙනෙක් වෙත්නම් ඔව්හු මා සමග එත්වා"යි නුවර බෙර හසුරුවා පුරුෂයන් දෙදහසකින් පිරිවරණ ලදුව උන්වහන්සේ දක්නට පිටත්විය. තිස්යොදුන් මගදී දෙව තාවෝ පන්නක්කාර (පඬුරු) එළෙව්වාහ; හෙතෙම බුදුන් ලඟට ගොස් පඤ්චප්‍රතිෂ්ඨිතයෙන් බුදුන් වැන්දේය; එකෙණෙහි අහසින් පස්වන්මලින් මල්වැසි වැස්සේය. තථාගතයන්වහන්සේ ඔහුගේ අදහස් වශයෙන් **සළායතන විභඞ්ගයම** වදළසේක. අඩමසක් පමණ කල් දශබල බුදුන්ට දන් දෙන්නාවූ ඔහුට සිය නිවෙස්නෙන් ගෙනාවූ සහල්, තෙල්, උක්සකුරු මීපැණි ආදිය නොකෙව්නේය.

**රජගහනුවර** වැසියන් විසින් ප්‍රහිත පණ්ණාකාර ම අලේ (අවසන්) විය; හෙතෙම බුදුන් දැක තම නුවරට යන්නේ ගැල් වලින් ගෙනා සියල්ල භික්ෂුසඞ්ඝයාට දුන්නේය.

ගැල් හිස්වූ පමණකින්ම දෙවතාවෝ සප්තවිධ රත්නයන් පිරෙව්වාහ; මහජනයා අතරෙහි කථා පහළ විය. "මේ චිත්ත **ගෘහපති**තෙමේ කෙතරම් සත්කාර සම්මානයකට පාත්‍රවීද! හේ ඉතා පුදුමයි" කියායි. ඒ අසා වදරා තථාගතයන්වහන්සේ **ධම්මපදයෙහි** මේ ගාථාව වදළසේක.

"සද්ධො සීලෙන සම්පන්නො
යසො භොගසමප්පිතො,
යං යං පදෙසං භජති
තත්ථ තත්ථෙව පූජිතො'ති."

**ඒ සිත්ගෘහැවි**තෙමේ එතැන් පටන් ආර්‍ය්‍යශ්‍රාවක උපාසක යන්ගෙන්ම පන්සියයකින් පිරිවරණ ලදුයේ හැසිරෙයි.

ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ මැතභාගයෙහි උපාසකයින් පටිපාටියෙන් තනතුරුවල තබා වදාරණසේක් **චිත්තසංයුත්ත කය** අජ්ඣාතපත්තිකොට ඔහු ධර්මකථිකයින් අතුරෙන් අග්‍රස්ථාන යෙහි තැබූසේක.

**සද්ධා** := යම්හෙයකින් මේ ලොකයෙහි ද, පරලොකයෙහි ද, අන්න (ආහාර) දුයකයාම අනුව යයි ද; එහෙයිනි.

—:—

## 5. 3. අනත්ත සූත්‍රප්‍රදීපයයි.

—:—

**11. එක මූලං ද්විරාවට්ටං-තිමලං පඤ්චපත්ථරං,**
**සමුද්දං ද්වාදසාවට්ටං-පාතාලං අතරී ඉසී'ති.**

---

**5 – 4 – ( 11. )**

**i. මාතෘකා:-**

**සමුද්‍ර වැනි සංසාර පාතාලය.**

**ii. පිණ්ඩාර්ථය:-**

අවිද්‍යාව තණ්හාවට මූල වේ; තණ්හාව අවිද්‍යාවට මූල වේ; එක මූල තණ්හාවයි; ශාශ්වතදෘෂ්ටි ආවර්තය-උච්ඡේද දෘෂ්ටි ආවර්තය; රාග, ද්වේෂ, මෝහ මලත්‍රය; මෙයින් මෝහය තෘෂ්ණාවට සහජාත කෙලවරින් මල වේ; උපනිඃශ්‍රය කෙලවරින් රාග-ද්වේෂ දෙක තෘෂ්ණාවට මල වේ; පඤ්චකාමගුණයෝ තෘෂ්ණාහුගේ පත්ථර වෙත්; තෘෂ්ණාසමුද්‍රය අපූරණීය වේ; තෘෂ්ණාව අධ්‍යාත්මික බාහිර ආයතන දෙලොසෙහි කරකැවෙයි; නොපිහිටියහැකි හෙයින් පාතාලය වේ.

**iii. භාවය:-**

එක මූලක් ද, ආවර්තදෙකක් ද, මලත්‍රයක් ද, ප්‍රස්තර (පැතිරීම්) පසක් හා ආවර්ත දෙලසක් ද ඇති සමුද්‍රය වැනි පාතාලය (පතලේ) මුනිතෙම එතර කෙළේය.

**iv. අනුවාදය:-**

තෘෂ්ණා-අවිද්‍යා- දෘෂ්ටි- රාග-ද්වේෂ- මෝහ- රූප- ශබ්ද-ගන්ධ-රස- ස්ප්‍රෂ්ටව්‍ය-චක්‍ෂුරායතන- ශ්‍රෝත්‍රායතන- ඝ්‍රාණායතන-ජිහ්වායතන- කායායතන- මනසායතන- රූපායතන- ශබ්දායතන-ගන්ධායතන- රසායතන- පොට්ඨබ්බායතන- ධම්මායතන යන මෙයින් යුත් සමුද්‍රය මෙන් මහත් පතලය මුනිවර තෙමේ ඉක්ම ගියේ යයි අදහසයි.

**v. ප්‍රකටීකරණාර්ථ:-**

**එකමූලං**=අවිද්‍යා තෘෂ්ණාවට මූලයයි; තෘෂ්ණා අවිද්‍යාවට මූල යයි. මෙහි වනාහි තෘෂ්ණාව අභිප්‍රේතයි.

**අවිද්‍යා-තෘෂ්ණා ප්‍රකටීකරණය,**

1. **“අවින්දියං වින්දතීති=අවිජ්ජා”** පුරන්ට අයුතු යන අර්ථයෙන් කායදුශ්චරිතාදිය ‘අවින්දිය’ නම්. ඒ නොලැබියයුතු දේ ලබානුයි. “අවිද්‍යා” නම් වේ.

“විදිතබ්බං න වින්දතීති=අවිජ්ජා” පූරන්නට යුතු කාය සුචරිතාදිය නොවිඳිනුයි, නොලබානුයි “අවිද්‍යා” නම් වේ.

“අවිදිතං කරෝතීති=අවිජ්ජා” ස්කන්ධයන්ගේ රාශ්‍යර්ථය, ආයතනයන්ගේ ආයතනාර්ථය, ධාතූන්ගේ ශූන්‍යතාර්ථය, ඉන්ද්‍රියයන්ගේ අධිපති අර්ථය, සත්‍යයන්ගේ තථ අර්ථය, නොදත් බව කෙරේ නුයි “අවිද්‍යා” නම් වේ. දුඃඛාදීන්ගේ පීළනාදිවශයෙන් සිව්වැදෑරුම් සිව්වැදෑරුම් අර්ථය නොදැනුම් කෙරේනුයි “අවිද්‍යා” නම් වේ.

අනන්තවිරහිතෙ-ජවාපෙතී'ති=අවිජ්ජා; අනන්ත විරහිත සංසාරයෙහි සියලු යෝනි-ගති-භව-විඤ්ඤාණට්ඨිති-සත්තාවාස යන මෙතෙක් තැන්වල සත්වයන් දුවවානුයි “අවිද්‍යා” නම්.

අවිජ්ජමානෙසු ජවති විජ්ජමානෙසු න ජවතීති=අවිජ්ජා. පරමාර්ථ හෙයින් විද්‍යමාන නොවූ ස්ත්‍රිය-පුරුෂයාය යනාදියෙහි දුවයි; පරමාර්ථයෙන් විද්‍යමානවූ ස්කන්ධාදියෙහි නොදුවයි නුයි “අවිද්‍යා” නම්.

ඡාදනතො'පි අවිජ්ජා; චක්ෂුර් විඥානාදී වස්තුආරම්මණයන්ගේද, ප්‍රතීත්‍යසමුත්පාද-ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්මයන්ගේ වැසීමෙන්ද “අවිද්‍යා” නම්.

“අඤ්ඤාණ ලක්ඛණා අවිජ්ජා, සම්මොහන රසා අවිජ්ජා, ඡාදන පච්චුපට්ඨානා අවිජ්ජා, ආසව පදට්ඨානා අවිජ්ජාති”.

2. පරිතස්සතීති=තණ්හා; පරිත්‍රස්ත වේනුයි තෘෂ්ණා නම්. හාත්පසින් තැවෙයි; උද්වේගයට පැමිණෙයි නුයි ‘තණ්හා” නම්

“හෙතුලක්ඛණා තණ්හා, අභිනන්දන රසා තණ්හා, අතිත්ත භාවපච්චුපට්ඨානා තණ්හා, වෙදනා පදට්ඨානා තණ්හා'ති”.

අවිද්‍යාව=අඥාන, අදර්ශන, මෝහාදීභාවයෙන් එකවිධයි. අප්‍රතිපත්ති-මිථ්‍යාප්‍රතිපත්ති හෙයින් ද්විවිධයි. සංස්කාර-අසංස්කාර හෙයින්ද දෙවැදෑරුම් වේ. වේදනාත්‍රය සම්ප්‍රයෝගයෙන් ත්‍රිවිධයි. චතුස්සත්‍ය අප්‍රතිවේධ හෙයින් චතුර්විධයි. ගතිපඤ්චක ආදීනව ඡාදනයෙන් පඤ්චවිධයි.

ද්වාර-ආරම්මණ වශයෙන් වනාහි සියලුම අරූපධර්ම විෂයෙහි ෂඩ්විධ බැව් දතයුතුයි.

“රූපතණ්හාදිභෙදෙන-ඡ තණ්හා ඉධ දීපිතා,
එකෙකා තිවිධා තත්‍ථ-පවත්තාකාරතො මතා'ති.”

රූප තෘෂ්ණාවය, ශබ්ද තෘෂ්ණාවය, ගන්ධ තෘෂ්ණාවය, රස තෘෂ්ණාවය, ස්ප්‍රෂ්ටව්‍ය තෘෂ්ණාවය, ධර්ම තෘෂ්ණාව යයි අරමුණු. වශයෙන් හා නම් වශයෙන් **විභඞ්ගයෙහි** ෂඩ්තෘෂ්ණාකෙනෙක් දක්වන ලද. ඒ තෘෂ්ණාවන් අතුරෙන් එක එක තෘෂ්ණාවක් පවත්නා ආකාරයෙන් කාමතණ්හා-භවතණ්හා-විභවතණ්හා යි මෙසේ ත්‍රිවිධ බැව් දන්නාලදී.

i. **රූපතණ්හාවම** වනාහි යම් විටක ඇසට හමුවූ රූපාලම්බනය තමා කාමාස්වාද වශයෙන් රස විඳිමින් පවතී ද එය **කාම තණ්හා** නම් වේ

ii. යම් කලෙක ඒ රූපාරම්මණයම ධ්‍රුවය, සස්සත යයි පැවති ශාස්වතදෘෂ්ටිය සමග පවතී ද එකල්හි **භවතෘෂ්ණා** නම් වේ. "සස්සතදිට්ඨි සහගතො හි රාගො භව තණ්හා"යි කියනු ලැබේ.

iii. යම් කලෙක වනාහි ඒ රූපාලම්බනයම උච්ඡේද වෙයි; විනාශයට යයි කියා පැවති උච්ඡේද දෘෂ්ටිය සමග පවතී ද එකල්හි **විභවතණ්හා** නම් වේ.

"උච්ඡේද දිට්ඨිසහගතො හි රාගො විභව තණ්හා" යයි කියනු ලැබේ.

**ශබ්දතෘෂ්ණාව** වනාහි යම් විටක කණට හමුවූ ශබ්දයේ එල්බගෙන **කාමාස්වාද** වශයෙන් රසවිඳිමින් පවතීද, එවිට **සද්ද කාමතණ්හා** නම් වේ යයි මේ ක්‍රමයෙන්ම ශබ්දතෘෂ්ණාදියෙහි දූයි ඒ රූපතණ්හාදි සය **අටළොස් (18) තණ්හාවක්** වෙත්.

ඒ අට්ඨාරස තණ්හාව **අධ්‍යාත්මික** රූපාදීන්හි අටළොසයි; **බාහිර** රූපාදීන්හි අටළොස යයි කියා සතිසක් වෙත්. අතීත තෘෂ්ණා සතිසයි; ප්‍රත්‍යුත්පන්න තෘෂ්ණා සතිසයි; අනාගත තෘෂ්ණා සතිසයි කියා **එක්සිය අටක්** තෘෂ්ණා වෙත්.

ඒ අට්ඨසතතණ්හාවන් නැවත හකුලා බලන්නේ රූපාරම්මණ තණ්හා, සද්දාරම්මණ තණ්හා, ගන්ධාරම්මණ තණ්හා, රසාරම්මණ තණ්හා, ඵොට්ඨබ්බාරම්මණ තණ්හා, ධම්මාරම්මණ තණ්හා යන සයම කාමතණ්හාදී වශයෙන් ත්‍රිවිධ තණ්හාවක්. වෙත් යයි දතයුතුයි.

"තස්ස අවිජ්ජා තණ්හා-මූලමතීතාදයො තයො කාලා,
ද්වෙ අට්ඨ ද්වෙ එව ච-සරූපතො තෙසු අඞ්ගානී"ති.

භවචක්‍රයට අවිද්‍යාවද, තෘෂ්ණාවද යන ධර්මදෙක මුල් යයි දත යුතුයි. ඒ මේ භව චක්‍රය පූර්වාන්ත ආහරණයෙන් අවිද්‍යා මූලයි; වේදනා අවසානයි.

අපරන්ත සන්තානයෙන් **තණ්හා** මූලයි; ජරාමරණ අවසානයි කියා විවිධ වේ. ඒ දෙකෙන් පුරිම **අවිජ්ජාමූලය දිට්ඨි චරිත** වශයෙන් වදාරණලදී. පච්ඡිම **තණ්හාමූලය තණ්හා චරිත** වශයෙනි.

**දිට්ඨිචරිතයින්ට** වනාහි අවිද්‍යාව සංසාර නායිකා වෙයි; තණ්හා චරිතයින්ට තෘෂ්ණාව සංසාරනායිකා වෙයි; උච්ඡෙද දෘෂ්ටිසමුග්ඝාතයට හෝ අවිද්‍යාමූල දෙශනාවයි; ඵලොත්පත්තියෙන් හෙතූන්ගේ අනුපච්ඡෙදය ප්‍රකාශකරණ හෙයිනි. ශාස්වතදෘෂ්ටිසමුද්ඝාතයට හෝ තෘෂ්ණාමූල දෙශනාවයි; උපන්නන්ගේ ජරා මරණ ප්‍රකාශ වන හෙයිනි.

**ගබ්භසෙය්‍යක** සත්ත්වයන්ගේ වසයෙන් පළමු අවිද්‍යාමූල යයි, අනුපූර්ව ප්‍රවෘත්ති දක්වන බැවිනි. **ඔපපාතික** සත්ත්වයන්ගේ වසයෙන්දෙවන තෘෂ්ණාමූල යයි, **සහොත්පත්ති** දක්වන බැවිනි.

**දෙශනාක්‍රමය.**

වැල මුලින් කපා සියල්ල ඇදගෙණ වැඩට යොදන්නාක් මෙන් භාග්‍යවතුන් වහන්සේ "ඉති ඛො භික්ඛවෙ අවිජ්ජාපච්චයා සඞ්ඛාරා -පෙ- ජාතිපච්චයා ජරාමරණ'න්ති". මූල පටන් පර්‍යන්තය තෙක්ද, **පටිච්චසමුප්පාදය** දෙශනා කරයි. වැල මැදින් කපා යටට ඔතාරා මුල තෙක් ගෙණ වැඩට යොදන්නාක්මෙන් භාග්‍යවතුන් වහන්සේ "ඉමෙ ච භික්ඛවෙ චත්තාරො ආහාරා කිං නිදානා? කිං සමුදයා? කිං ජාතිකා? කිං පභවා?, ඉමෙ චත්තාරො ආහාරා තණ්හානිදානා, තණ්හා සමුදයා, තණ්හා ජාතිකා, තණ්හා පභවා; තණ්හා කිං නිදානා? -පෙ- වෙදනා-ඵස්සො-සළායතනං-නාමරූපං-විඤ්ඤාණං. සඞ්ඛාරා කිං නිදානා?- සඞ්ඛාරා අවිජ්ජා නිදානා, අවිජ්ජාපපභවා'ති" මැද පටන් ආදියතෙක් දෙශනා කරයි.

"අස්සුතවා භික්ඛවෙ පුථුජ්ජනො කායිකාය දුක්ඛවෙදනාය පුට්ඨො සමානො සොචති, කිලමති, පරිදෙවති, උරත්තාලිං කන්දති, සම්මොහං ආපජ්ජති" යනුවෙන් භවචක්‍රයාගේ සම්බන්ධය දතයුතුයි.

"යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී සෙය්‍යථිදං? කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා; සා ඛො පනෙසා තණ්හා කත්ථ උප්පජ්ජමානා උප්පජ්ජති, කත්ථ නිවිසමානා නිවිසති; යං ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති.

චක්ඛුං ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති". ලොකයෙහි වනාහි චක්ෂුරාදියෙහි මමත්වය කරණකොටගෙණ අභිනිවිෂ්ට සත්වයෝ සම්පත්තියෙහි පිහිටියාහු තමාගේ ඇස කැඩපත් ආදීන්හි නිමිති

ගැන්මේ අනුසාරයෙන් විප්‍රසන්නවූ පඤ්චප්‍රසාදය ස්වර්ණවිමාන යෙක්හි උද්ඝාටිතව (ඉහළ තගා) තැබූ මැණික්මය සිව් මැදුරු කවුළුවක් මෙන් කල්පණා කරත්.

**කර්ණ** රිදී ප්‍රණාලිකාවක් මෙන් ද, පාමඩ්ග සූත්‍රකයක් මෙන් ද හගිත්. **තුඩග නාසයයි** ලත් ව්‍යවහාර ඇති ඝ්‍රාණය වටකොට තැබූ හිරියල් වැටියක් මෙන් ද සලකත්. **දිව** රක්තකම්බලපටල යක් මෙන් ද මොලොක් සිනිඳු මිහිරි රස දෙන්නෙකැයිද සිතත්. **කාය** සල්ලටියක් මෙන් ද, රන්තොරණක් මෙන් ද අදහස් කරයි.

**සිත** අනුන්ගේ සිතෙන් අසදෘශ යසී උදාර යයි හගිත්. **රූපය** ස්වර්ණ කර්ණිකාර පුෂ්පාදිවර්ණයක් මෙන් ද, **ශබ්දය** මත් කුරවිකෙවිල්ලන්ගේ නාදයක් මෙන් ද, මඳකොට පිඹිනාලද මිණිවස නිඝෝෂයක් මෙන් ද, තමා විසින් ලැබූ චතුසමුට්ඨානික ගන්ධාරම්මණාදිය වෙන කවරෙකුට මෙබඳු සුගන්ධාදීන් ඇත්දැයි හගිත්.

**මෙසේ සලකන්නාවූ ඔවුන්ගේ ඇස් ආදිය ප්‍රිය රූපද වෙත්; සාතරූප ද වෙත්.**

එසේ ඇති කල ඔවුන්ට එහි නුපන්නාවූ ද තණ්හා උපදියි; උපන් තණ්හා ද පුන පුනා පැවැත්ම වශයෙන් නිවිසෙයි; නිර්විෂ්ටයි.

එහෙයින් භාග්‍යවතුන් වහන්සේ "චක්ඛුං ලොකෙ පියරූපං" යනාදිය වදාළසේක.

**අවිද්‍යා භවතෘෂ්ණා මූල කාරණ පරියාය.**

භාග්‍යවතුන් වහන්සේ වට්ටකථා කියනසේක් අවිද්‍යාව හෝ භවතෘෂ්ණාව යන මෙ ධර්මදෙක ශීර්ෂකොට වදාරයි.

"පුරිමා භික්ඛවෙ කොටි න පඤ්ඤායති අවිජ්ජාය; ඉතො පුබ්බෙ අවිජ්ජා නා'හොසි, අථ පච්ඡා සම්භවී'ති. එවං චෙතං භික්ඛවෙ වුච්චති, අථ ච පන පඤ්ඤායති ඉදප්පච්චයා අවිජ්ජා'ති".

භව **තෘෂ්ණාවත්** මෙසේ වදාරයි="පුරිමා භික්ඛවෙ කොටි න පඤ්ඤායති, භවතණ්හාය; ඉතො පුබ්බෙ භවතණ්හා නාහොසි, අථ පච්ඡා සම්භවීති. එව'ඤ්චෙතං භික්ඛවෙ වුච්චති; අථ ච පන පඤ්ඤායති ඉදප්පච්චයා භවතණ්හාති".

කුමක් හෙයින් භාග්‍යවතුන් වහන්සේ වෘත්ත කථා කියන සේක් මේ **අවිද්‍යා-තෘෂ්ණා** ධර්ම දෙකම පමණක් ශීර්ෂකොට (මුල් කාරණකොට) වදාළසේක් දැයි. සුගති දුගතිගාමිකර්මවයට විශෙෂ හෙතුභූත හෙයිනි.

1. දුගතිගාමී කර්මයට වනාහි විශෙෂ හෙතුව **අවිද්‍යාවයි.**
2. සුගතිගාමීකර්මයට විශෙෂ හෙතුව **භවතෘෂ්ණාවයි.**

i. කුමක්හෙයින්ද යත්:= යම්හෙයකින් අවිද්‍යාවෙන් මඩනා ලද පෘථග්ජනතෙම අග්නිසන්තාප මුගුරුවලින් තැළීම යන මෙයින් වෙහෙසට පත් මරණ පත් දෙන ඒ පරිශ්‍රම ආතුර බැවින් ආස්වාද රහිතවූද, තමාට අනර්ථාවහවූද, උණුදිය බොන්නාක් මෙන් කෙලෙස් සන්තාපයෙන් නිරස්සාද වූ ද දුගතියෙහි වැටීමෙන් තමාට අනර්ථ ගෙණදෙන්නාවූ ද, ප්‍රාණාති පාතාදි අනෙකප්‍රකාර දුර්ගතිගාමී කර්ම ආරම්භකරයි.

සුගතිගාමීකර්මයට විශෙෂහෙතු භවතණ්හාවයි. කුමකින්ද යත්? යම්හෙයකින් භවතණ්හාවෙන් අභිභූත පෘථග්ජනතෙම ගින්නෙන් රත්කොට මුගුරින් තළා වෙහෙසට පත්කර මරණු ලබන ගවදෙනගේ ශීතොදක තෘෂ්ණාවෙන් ආශ්වාද සහිත වූ තමාගේ පරිශ්‍රම විනොදනය කරන්නාවූ සිහිල් පැන්බීමක් වැනි කෙලෙස් සතැවුලි විරහයෙන් රස විඳගැණීම් ඇති සුගතියට පැමිණවීමෙන් තමාගේ දුගති දුක් පරිස්සම් දුරුකරණ පණිවා විරමණ ඈ නන් අයුරු සුගතිගැමි කම් ඇරබැයි.

වට්ටකථාවට සීඝ්‍රභූත මේ ධර්මදෙක අතුරෙන් කිසියම් තැනකදී භාග්‍යවතුන්වහන්සේ එකධම්මමූලිකව ධර්මය දෙශනාකරණසේක. ඒ කවරේදයත්:- "ඉති ඛො භික්ඛවෙ අවිජ්ජාපච්චයා සඞ්ඛාරා සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං" යනාදියයි.

එසේම, උපාදානීයෙසු භික්ඛවෙ ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරතො තණ්හා පවඩ්ඪති; තණ්හාපච්චයා උපාදානං" යනාදි යයි.

කිසිතැනක උභයමූලිකවත් වදාරයි. ඒ කවරේදයත්:-

"අවිජ්ජානීවරණස්ස භික්ඛවෙ බාලස්ස තණ්හාය සම්ප යුත්තස්ස එවමයං කායො සමුදාගතො; ඉති අයඤ්චෙව කායො බහිද්ධා ච නාමරූපං ඉත්ථෙතං ද්වයං, ද්වයං පටිච්ච ඵස්සා සළෙවා යතනානි යෙහි ඵුට්ඨො බාලො සුඛදුක්ඛං පටිසංවෙදෙති"යනාදි යයි.

විරාවට්ටං:= ඒ තෘෂ්ණාව ශාශ්වත-උච්ඡෙද දෘෂ්ටිදෙකෙන් ආවෘත වේනුයි 'විරාවට්ට' නම් වේ.

තිමලං:=ඒ තෘෂ්ණාව රාගාදි ත්‍රිවිධ මල කරණකොටගෙණ තිමල නම් වේ. ඒ මලත්‍රයෙන් මොහමලය මේ තෘෂ්ණාවට සහජාත ප්‍රත්‍යයෙන් මල වේ. රාග-ද්වෙෂ මලවය උපනිශ්‍රය වශයෙන් මල වේ. පඤ්චපත්ථරං:= පඤ්චකාමගුණ විෂයෙහි මේ තෘෂ්ණාව ප්‍රසෘත වේ.

සමුද්දං:= ඒ තෘෂ්ණාව නොපිරවිය හැකි අර්ථයෙන් 'සමුද්‍ර' නම් වේ.

ද්වාදසාවට්ටං:= අධ්‍යාත්මික බාහිරායතන දෙළොසෙහි මේ තෘෂ්ණාව ආවෘතන-පරිවෘතන වේනු යි "ද්වාදසාවෘතන" නමි.

අතරි:= මෙයින් එතර විය; මේ පාතාලය මුනිවරතෙම සමති ක්‍රමණය කෙළේය යන අර්ථයි.

---

## 5. 4. එකමූල සූත්‍රප්‍රදීපයයි.

---

12. අනොමනාමං නිපුණත්ථදස්සිං
පඤ්ඤාදදං කාමාලයෙ අසත්තං,
තං පස්සථ සබ්බවිදුං සුමෙධං
අරියෙ පථෙ කමමානං මහෙසින්ති.

**5 - 5 - ( 12. )**

i. මාතෘකා:—

**නම් අඩක් කියා බුදුන් දැකීම.**

ii. පිණ්ඩාර්ථය:-

පිරිපුන් නමක්, සියුම් අර්ථ දක්නා, ප්‍රඥ දායකයෙක්, කාමාල යෙහි නොඇලුනෙක්, ආර්‍ය්‍යපථයෙහි ඇවිද්දෙක්, සියල්ල දත්, සුමෙධ, මහාඍෂි.

භාවය:—

12. විකල නොවූ හෙවත් පිරිපුන් නම් ඇති සියලු අර්ථදර්ශීවූ ප්‍රඥාව දෙන්නාවූ කාමගෘහයෙහි අශක්තවූ ආර්‍ය්‍යමාර්ගයෙහි ඇවිද්දාවූ සර්වඥ සුන්දර ප්‍රාඥ ඒ මහරුසි බුදුන් දකිව්.

v. ප්‍රකාවිකාරණාර්ථ:—

අනොමනාමං:= සර්වගුණ සමන්‍වාගත හෙයින් අවිකල නම් ඇති; 'පරිපූරනාමය' යන අදහසයි.

නිපුණත්ථදස්සිං:=භාග්‍යවතුන් වහන්සේ අණු සියුම් ස්කන්ධ අනතර් ආදි (අනන්තර ප්‍රත්‍යාදි) අර්ථ දක්නුයි නිපුණාර්ථදර්ශීය.

පඤ්ඤාදදං:= ප්‍රඥාධිගමයට පටිපදාකථන වශයෙන් ප්‍රඥ හුගේ දායකයා යන අදහසයි.

කාමාලයෙ අසත්තං:=පස්කම්ගුණ ආලයෙහි නො ලැග්ගාවූ.

කමමානං:= භාග්‍යවතුන් වහන්සේ මහබෝමැඩදීම ආර්‍ය්‍ය මාර්ගය හෙතුකොටගෙණ ගියේය, දැන් නොයයි, අතීතගමන වනාහි අල්වාගෙණ මෙහි කියනලදී.

මහෙසිං:=මහත්වූ ශීලස්කන්ධාදීන් සොයන්නාවූ(පිරියෙස්නා) මහ ඍෂිවරයා;

සබ්බවිදුං:= සර්වධර්මයන් සර්වාකාරයෙන් විදිත හෙයින් සියල්ල දත්;

සුමෙධං:=සර්වධර්මදෙශනා සමර්ථ ශොභන මෙධායෙන් සමන් වාගත හෙයින් "සුමෙධ" නම්වූ;

——:——

## 5. 5. අනොමනාම සූත්‍රප්‍රදීපයයි.

——:——

13. අච්ඡරාගණසඞ්ඝුට්ඨං-පිසාචගණසෙවිතං,
වනන්තං මොහනං නාම-කථං යාත්‍රා භවිස්සතීති.

14. උජුකො නාම සො මග්ගො-අභයා නාම සා දිසා,
රථො අකූජනො නාම-ධම්මචක්කෙහි සංයුතො.

15. හිරී තස්ස අපාලම්බො-සතස්ස* පරිවාරණං,
ධම්මාහං සාරථිං බ්‍රෑමි-සම්මාදිට්ඨි පුරෙ ජවං.

16. යස්ස එතාදිසං යානං-ඉත්ථියා පුරිසස්ස වා,
ස වෙ එතෙන යානෙන-නිබ්බාණස්සෙව සන්තිකෙ'ති.

---

5 - 6 - (13 - 14 - 15 - 16.)

i. මාතෘකා:—

**මොහන වනයෙන් නිවණට යාම.**

ii. පිණ්ඩාර්ථය:—

ධුරයෙහි කාලක්‍රියාව, මහණකමෙන් දෙව්ලොව යාම, චුතිය නොදැණ් ඉපදීම, දෙව්ලොව මහණදම් රැකීමට ස්ථානයක් නොවන බව, කැඩපතේ ඡායාව දුක චුතිය දැනීම, සගසැපත් සුලබයි, බුදුඋපත් දුලබයි, දිව්‍යාප්සරාවන්ට 'පිසාච' යයි කීම, නන්දනුයනට මොහන නාමය, පූර්වභාග ප්‍රතිපදාව, ඇදනැති මග, කොඩ-නොගහන (අකූජන) රථය, ධර්මරෝද දෙකක්, හිරි-ඔතප් රිය ඇඳි, සිහිය පිරිවරයි, දහම් රියැදුරු, රහත් කුළින් සෝවාන් පෙල.

iii. භාවය:-

13. දිව්‍යප්සරා නමැති පිශාච සමූහයාගේ මනහරවූ ඝෝෂා වෙන් සෙවිනාලද ප්‍රසිද්ධ "මොහන" නම් වනයෙන් නිර්ගමනය (නික්මයාම) කෙසේ වන්නේද?

14. ඒ (යන) මාර්ගය නම් ඇදනැත්තේය; ඒ දිශාව නිර්භය වේ; සද්ධර්මචක්‍රවලින් සංයුක්තවූ ඒ රථය අකූජන (හඬ නොනගන්නේ) නමි.

15. ඒ රථයේ ආලම්බන පුවරුව හිරි ඔත්තප්පයයි, සමෘතිය (සිහිය) මාර්ගරථයාගේ පරිවාරණයයි, ලොව්තුරු මගදහම් රථාචාර්යයයි මම කියමි. විදර්ශනා සම්‍යක්දෘෂ්ටිය පෙරටුව දුවන්නාය.

16. යම් ස්ත්‍රියෙකුට හෝ පුරුෂයෙකුට හෝ මෙබඳු යාන යක් වේනම් හෙතෙමේ ඒකාන්තයෙන් මේ කී යානයෙන් නිර්වාණය ලඟටම යන්නේය.

---

* 'සත්‍යස්ස" යනුද පාඨාන්තරයි.

iv. **අනුවාදය:-**

මේ කියනලද දිව්‍යපුත්‍ර තෙමේ වනාහි ශාස්තෘශාසනයෙහි පැවිදිබව ලබා වත් පිළිවෙත් පුරමින් පස්වස්වූ කල්හි පවාරණය කොට මාතිකා (භික්ෂුභික්ෂුනී ප්‍රාතිමොක්ෂ) දෙක ප්‍රගුණකොට කර්මාකර්ම (පෝය පවුරුණු ආදිය) උගෙණ සිත් අලවන කමටහනක් උගෙණ සැහැල්ලු වෘත්ති ඇත්තේ අරණ්‍යයට ප්‍රවිෂ්ටව භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මධ්‍යමයාමයක් ශයනයට කොටසකැයි අනුදන්නාලද්දේද, ඒ නිදන කොටස සැපැත් කල්හිද 'මම ප්‍රමාදයට හයවෙමි'යි මැසි ඇඳ ඔසවා තබා දිවා රෑ දෙක්හි නිරාහාරව කම්මට්ඨානයම මෙනෙහි කෙළේය.

ඉක්බිති උන්වහන්සේගේ අභ්‍යන්තරයෙහි ශස්ත්‍රකවාතයෝ ඉපදී කිපීමෙන් **ජීවිතපර්‍ය්‍යාදන** කළාහුය. නොහොත් උන්වහන්සේ ධුරයෙහිම කාලක්‍රියා කෙළේය.

යම්කිසි භික්ෂුනමක් වනාහි සක්මන් මලුවේ සක්මන්කරමින් හෝ ආලම්බනස්ථම්භය නිසා සිටියේ හෝ සක්මන් කෙළවර සිවුර හිසේ තබා හිඳගත්තේ හෝ නිදාගත්තේ හෝ පිරිස මැද අලඞ්කාර කළ ධර්මාසනයෙහි ධර්මදෙශනාකරන්නේ හෝ කළුරිය කෙරේද ඒ හැමදෙනම ධුරයෙහි කාලක්‍රියාකරයි නම්.

මෙසේ මුන්වහන්සේත් සක්මනේ කාලක්‍රියාකොට හෙතු සම්පත් මඳ බැවින් ආශ්‍රවක්ෂයට අප්‍රාප්තවූයේ **තාවතිංසා භවනයෙහි** මහවිමන්දෙර නිදා පිබිදියාක්මෙන් පිළිසිඳගත්තේය; එකෙණෙහිම ඔහුට රන්තොරණක් මෙන් තුන්ගව් ආත්මභාවය පහළවිය. ඇතුල්විමනැ දහසක් පමණ අප්සරාවෝ ඔහු දැක 'විමන් හිමි දෙව්පිත් ආයේය; ඔහු රමණයකරන්නෙමු'යි තූර්‍ය්‍යයන් ගෙණ පිරිවැරූහ. දෙව්පිත්තෙමේ ඒතාක් චුතවූ බැව් නොදනියි, ප්‍රව්‍රජිත සංඥීමය; දිව්‍යප්සරාවන් දැක විහාරචාරිකාවට ආවාවූ මාගමුන් දුටු ලජ්ජී පාංශුකූලික මහණෙක් සේ මත්තෙහි තුබූ දුහුල් සළුව එකස්කරමින් අංසකූටය ප්‍රතිච්ඡාදනය කොට ඉන්ද්‍රියයන් යට බලවා අධොමුඛව සිටියේය.

ඔහුගේ කායවිකාරයෙන්ම ඒ දෙවඟනෝ මේ ශ්‍රමණ දිව්‍යපුත්‍රයෙකැයි දැන මෙසේ කීවාහුය. "ස්වාමිනි! දෙවුපිතෙනි මේ දිව්‍යලොකයයි; මෙය මහණදම්කරණ ස්ථානයක් නොවේ; සම්පත් අනුභවකරණ අවකාශය මෙයය යි." හෙතෙම එයසාද එසේම සිටියේය.

දෙව්දුවරු "මේ තවමත් නොමසලකයි" කියා තූර්‍ය්‍යනාදයන් පටන්ගත්තෝය. හේ එසේවූවද ඒ නොබලන්නේ සිටිවනම සිටියේය.

ඉක්බිති සම්පූර්ණ ශරීරය දක්නට හැකි කැඩපත (සර්වාංගික ආදර්ශය)ක් ඔහු පෙරටුව තැබූහ. හෙතෙම ඡායාව දැක චුතවූ බව දැන "මා විසින් මේ ස්ථානය පතාගෙණ මහණදම් නොකරනලදය, උත්තමාර්ථයවූ අර්හත්වය ප්‍රාර්ථනාකොට ශ්‍රමණ ධර්මය රක්ෂාකරණලද්දේය"යි දිව්‍යසම්පත්තියෙන් විපිළිසර විය.

සුවර්ණපට්ටබන්ධනය (රන්පට බැඳීම) තකාගෙණ යුද්ධභූමියට බැසගත් මල්ලවතෙමේ මුදල් මිටක් ලැබී සිතන්නාක්මෙන් හෙතෙම සිතනුයේ මේ සගසැපත නම් සුලබය; බුදුවරයින්ගේ ප්‍රාදුර්භාවය දුර්ලභයයි දිව්‍යවිමානයට අප්‍රවිෂ්ටවම සම්භේදයකට නොපැමිණි සීලයෙන් යුක්තවම දිව්‍යාප්සරා සමූහයා විසින් පිරිවරනලදුයේම දසබලධාරී බුදුන්ගේ සමීපයට ආගමනයකොට වැඳ එකත්පසක සිටියේ මේ ගාථාව කීයේය.

ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ මේ දිව්‍යපුත්‍රතෙමේ අතිසල්ලේඛිතයෙක් (ඉතා සියුම් අදහස් ඇත්තෙක්) මය; මේ කිමෙක්දැයි ආවර්ජනා කරණසේක් තම සස්නෙහි පැවිදිව සිටි බැව් දැන වදරා මේ අත්‍යාරබ්ධවීර්යය ඇති බැවින් කාලක්‍රියාකොට ගොස් දෙව්ලොව උපන්නේය; අදත් ඔහුගේ සක්මණෙහි ම ආත්මභාවය වේ; අසම්භින්නශීලයෙන් යුක්තව ආයේයයි සිතූසේක.

බුදුවරයෝද අත්‍යන්තාභිනිවේශ ඇති ආදිකර්මිකයාට පළමු කොට සිල් පිරිසිඳු **කරව? සමාධිභාවනා කරව? කර්මස්වකතා ප්‍රඥාව සෘජුකරවයි.** ප්‍රථමයෙන් පූර්වභාග ප්‍රතිපදා දක්වා වදරත්; **සිත්තරෙක්** නොකළ පිරියම් ඇති අතවැසියාට භිත්තිපරිකර්ම කියන්නාක් මෙනි.

කාරකවූ යුක්තප්‍රයුක්තකයාහට අර්හත්මාර්ග පදස්ථානවූ සණ්හ සුඛුමශූන්‍යතා විදර්ශනාවම අභිමුඛකොට වදරත්.

මේ දෙව්පිත්ද කාරකයෙක; තුමූත් සිල් ඇත්තේය; ඔහට එක් මාර්ගඵලයක් හෝ නොආයේයයි ශූන්‍යතාවිදර්ශනා ප්‍රකාශ කරන්නේ "උජුකො නාම" යනාදිය වදළසේක. මෙසේ භාග්‍යවතුන් වහන්සේ දෙසුන් නිමවා අවසන්හි චතුරාර්යසත්‍ය දක්වා වදළසේක. දේශනාපර්යවසානයෙහි දිව්‍යපුත්‍රතෙමේ ශ්‍රෝතාපත්තිඵලයෙහි පිහිටියේය.

යම්සේ රජුගේ භෝජනකාලයෙහි තමන්ගේ ප්‍රමාණයෙන් කබලොත්ක්ෂේපකළ කල්හි (බත්පිඩ ගත් කලැ) ඇකයෙහි උන් රජපුත් තම මුවපමණින් ඉන් කබලක් කරගණියි ද, එපරිද්දෙන්

භාග්‍යවතුන් වහන්සේ රහත්පල කුළුගන්වා දෙසුන් දෙසන කල්හි දූ සත්‍වයෝ තමන්ගේ උපනිශ්‍රයානුරූපයෙන් සෝවාන් ඵලාදියට පැමිණෙන්නාහ.

මේ දිව්‍යපුත්‍රයා ද ශ්‍රොතාපත්තිඵලයට පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ, සුවඳමල් ආදියෙන් පුදා පිටත්ව ගියේය.

v. **ප්‍රකටීකරණානි:—**

**අච්ඡරාගණ සංඝුට්ඨං**:=අප්සරගණයා විසින් ගීතවාදිත ශබ්ද වලින් මනාකොට ඝොෂණය කරණලද යන අදහසයි.

**පිසාච ගණසෙවිතං**:= ඒ අප්සරාවන් සමූහයම පිශාචසමූහයක් (මළ යකින්නියන්) කොට කියයි.

**වනනනං**:=**නන්දන වනය** සඳහා කියයි. මේ දිව්‍යපුත්‍රතෙමේ කාම තිගීත (පහවූ කාමචෙතනා) සිත් ඇති බැවින් තමාගේ ගුරු ගෞරවයෙන් දිව්‍යස්ත්‍රීගණයාට දිව්‍යස්ත්‍රීගණයයි කියන්ට නො කැමැත්තේ පිශාච ගණයයි බණියි. **නන්දන** වනයටත් **නන්දන** යයි නොකියා සත්‍වයන් මූළාකරණ හෙයින් **මොහන** යයි බණියි.

**කථං යාත්‍රා භවිස්සති**:= නික්මයාම කෙසේ වන්නේ ද? අතික්‍රමණය කෙසේවන්නේදැයි අභිත්‍වයට ආසන්නකාරණයවූ විපස්සනාව ප්‍රකාශකළ මැනව භාග්‍යවතුනි! යි කියා සිටියි.

**උජුකො**:= කායවඞ්කාදීන්ගේ අභාව හෙයින් අටගිමග "උජුක" නම්.

**අභයා නාම සා දිසා**:= මේ නිවන් **සඳහා** වදාළහ. ඒ නිව ණෙහි වනාහි කිසි බියක් නැත; නිවණට **පැමිණියහුට** බියක් නැතැයි "**අභයා** නාම **සාදිසා**" යි වදාරණලදී.

**රථො අකූජනො**:=ආර්‍යඅෂ්ටාඞ්ගික මාර්ගයම මෙයින් අභිප්‍රෙතයි; යම්සේ ප්‍රකෘතික රථය අක්‍ෂයන් අභ්‍යඞ්ග නොකළකල්හි (කඩඇණයට තෙල් නොදැමූ කල) වැඩිගණනක් මිනිසුන් නැංගේ නම් කොඩගසයි; විරුව කෙරෙයි. ආර්‍යමාර්ගරථය නොඑසේය. ඒ ආර්‍යමාර්ගරථය වනාහි එක පහරින් සුවාසූදහස් සතුන් නැගි කලත් නොහඬයි; විරුවනොකරයි. (නොම විරවයි.) එහෙයින් **අකූජන** යයි කියනලදී.

**ධම්මචක්කෙහි සංයුතො**:= කායික චෛතසික වීර්‍යසඞ්ඛ්‍යාත ධම්චක්‍රවලින් **සංයොජන** කෙලේය.

**සිරි**=මෙහි "සිරි" ශබ්දග්‍රහණයෙන් ඔත්තප්පය ද ගන්නා ලදම වේ.

**තස්ස අපාලම්බො**=යම් සේ බාහිර රථයාගේ රථයෙහි සිටි යොධයන් නොවැටෙන පිණිස දැව මුවා ආලම්බනකයක් වෙයි. එසේ මේ මාර්ගරථයට අධ්‍යාත්මික බාහ්‍ය සමුට්ඨාන ඇති හිරි-ඔතප් අපාලම්බනයයි.

**සත්‍යස්ස පරිවාරණං**=රියකට සිංහචර්මාදි පරිවාරයක් මෙන් මේ මාර්ගරථයට සම්ප්‍රයුක්ත ස්මෘතිය පරිවාරණ වේ.

**ධම්මං**= ලොකොත්තර මාර්ගයයි.

**සම්මාදිට්ඨි පුරෙජවං**=විදර්ශනා සම්‍යක් දෘෂ්ටි තොමෝ පෙර ටුව දුවන්නී මොහුගේ **පූර්වගාමිකානුසී** "සම්මාදිට්ඨි පුරෙජව" නම්. ඒ "සම්මාදිට්ඨි පුරෙජවං"යි කියනලදී.

යම් සේ පළමුවෙන්ම රාජපුරුෂයන් විසින් කන් කොරු ආදීන් බැහැර කිරීමෙන් මාර්ග ශුද්ධකළ කල්හි පසුව රජතෙම නික්මෙයි; එපරිද්දෙන් විදසුන් සම්දිටුවෙන් අනිත්‍යාදි වශයෙන් සකන්ධාදීන් ශොධිත කල පසුව භූමිලබ්ධවූ (පිහිටි) වෘත්තය පරිඥ කරන්නාවූ මාර්ග සම්‍යක්දෘෂ්ටි උපදියි.

එහෙයින් වදාරණලදී:—

"ධම්මා'හං සාරථිං බ්‍රෑමි-සම්මාදිට්ඨි පුරෙජවං"යි.

—:—

## 5. 6. ධම්මරථ සූත්‍රප්‍රදීපයයි.

—:—

**17.** **කෙසං දිවා ච රත්තො ච-සදා පුඤ්ඤං පවඩ්ඪති,**
**ධම්මට්ඨා සීලසම්පන්නා-කෙ ජනා සග්ගගාමිනො'ති.**

**18.** **ආරාමරොපා වනරොපා-යෙ ජනා සෙතුකාරකා,**
**පපං ච උදපානං ච-යෙ දදන්ති උපස්සයං.**

**19.** **තෙසං දිවා ච රත්තො ච-සදා පුඤ්ඤං පවඩ්ඪති,**
**ධම්මට්ඨා සීලසම්පන්නා-තෙ ජනා සග්ගගාමිනො'ති.**

---

**6 - 7 - (17 - 18 - 19)**

i. **මාතෘකා:-**

**රෑ දවල් පින් වැඩෙන ධර්මස්ථ ශීලසම්පන්නයෝ දෙව්ලොව යන බව.**

ii. **පිණ්ඩාර්ථය:-**

හැමදා පින් වැඩෙන ධර්මය, කුසල් දම් පිරීමෙන් සිල් සපන් වන අයුරු, සිහි කල කළ හැපියට පින් වැඩීම, ආරාම විභාගය, නිදන්නහුට පින් නොවැඩෙන බව.

iii. **භාවය:-**

17. දවලටත් රෑටත් හැමදා කවර කෙනෙකුන්ට පින් වැඩේ ද? කවර ජන කෙනෙක් ධර්මයෙහි පිහිටියාහු සම්පන්න සීල ඇත්තාහු ස්වර්ගගාමී වෙත්ද?

18-19. යම් ඒ ජනයෝ පුෂ්පාරාම ඵලාරාම රෝපණය කරන්නෝ ද, ස්වයංජාත වනයෙහි චෛත්‍යාදිය කරදීමෙන් හෝ සෙවන පිණිස ගස් වැවීමෙන් උයන්කරන්නෝද, විෂම තන්හි හේ දඬු පාලම් නැව් කරනබන්නෝ ද, යම් කෙනෙක් පැන්හල්, ලින්, පොකුණු, තටාකාදිය ද; වාසාගාර, සෙනසුන් ද කරවා දෙත් නම්;

(19). ඔවුන්ට දිවා රෑ දෙක්හිම සිහිකළවිට නිරතුරු පින් වැඩේ. ඒ ධර්මස්ථවූ සීල සමන්විතවූ ජනයෝ දෙව්ලොව යන්නෝය.

v. **ප්‍රකටීකරණාර්ථ:-**

**ධම්මට්ඨා සීලසම්පන්නා**=ධර්මස්ථයෝ කවු ද? ශීල සමෘද්ධයෝ කවුදැයි විචාරයි. භාග්‍යවතුන් වහන්සේ මේ ප්‍රශ්නය ස්ථාවර වස්තුවකින් දක්වනසේක් "ආරාම රෝපා" යනාදිය වදාළහ.

(එහි) **ආරාමරොපා**=මල් අරම්, පලතුරු අරම්, හා උයන්වතු වැවීම කරන්නෝ;

**වනරොපා**=ස්වයංජාත (ඉබේ හටගත්) වනයෙහි වැට බැඳ චෛත්‍ය, බෝධි, සක්මන් මළු, කුටි, ලෙන්, රාත්‍රිස්ථාන, දිවාස්ථානයන් කරන්නෝ ද, සෙවන පිණිස ගස් වවා දෙන්නෝ ද වන රොපණය කරන්නෝමය.

**සෙතුකාරකා**=විෂමයෙහි හෙය (ඒදඬු-පාලම්)කරන්නෝද උදකයෙහි නැව් ප්‍රතිපාදනය කරන්නෝද යන අර්ථයි.

**පපං**-පියසුතු (පැන්)දනසාලා (පැන් තාළි)

**උදපානං**=පොකුණු තලාකාදිය;

**උපස්සයං**=වාසාගාර (අම්බලම්)

**සදා පුඤ්ඤං පවඩ්ඪති**=අකුශල විතර්කයක් හෝ කල්පනා කරන්නහුට වත් නිදන්නෙකුට වත් පින් නොවැඩෙයි. යම් යම් වේලාවක(පිණ)සිහිකරයි ද ඒ ඒ කාලයෙහි ප්‍රකාරයෙන් වැඩෙයි. මේ අර්ථය සඳහා "හැමදා පින් වැඩේ" යයි වදාරණ ලදී.

**ධම්මට්ඨා සීලසම්පන්නා**=ඒ පින් වැඩෙන දහමේ පිහිටි හෙයින් නිති සීලයෙන් සම්පූර්ණ හෙයින් ද ධම්මට්ඨ සීලසම්පන්න වෙත්. නොහොත් මේ අයුරු පින් කරන්නන්ට දසකුසල්දම් පිරෙත්; ඒ දශකුශලයෙහි සිටි හෙයින් ධර්මස්ථයි; ඒ ශීලයෙන්ම සමන්විත හෙයින් සීල සම්පන්නයෝයි.

—:—

## 5. 7. වනරොප (පුඤ්ඤවඩ්ඪන) සූත්‍රප්‍රදීපයයි.

—:—

**20.** **ඉදං හි තං ජේතවනං-ඉසිසඞ්ඝනිසෙවිතං,**
**ආවුත්ථං ධම්මරාජෙන-පීතිසඤ්ජනනං මම.**

**21.** **කම්මං විජ්ජා ච ධම්මො ච-සීලං ජීවිතමුත්තමං,**
**එතෙන මච්චා සුජ්ඣන්ති-න ගොත්තෙන ධනෙන වා.**

**22.** **තස්මා හි පණ්ඩිතො පොසො-සම්පස්සං අත්ථමත්තනො,**
**යොනිසො විචිනෙ ධම්මං-එවං තත්ථ විසුජ්ඣති.**

**23.** **සාරිපුත්තො'ව පඤ්ඤාය-සීලෙනූපසමෙන ච,**
**යො'පි පාරඞ්ගතො භික්ඛු-එතා'ව පරමො සියා'ති.**

---

**5 - 8 - ( 20 - 21 - 22 - 23. )**

i. **මාතෘකා:—**

**ජේතවන ගුණවැනුම සහ සත්ව විශුද්ධිය.**

ii. **පිණ්ඩාර්ථය:—**

අනේපිඬු දෙව්පිත්, සිල්වත් ජීවිත උත්තම බව, අෂ්ටාඞ්ගික මාර්ගයෙන් සත්වයෝ විසුද්ධ වෙත්; ගොත්‍රයෙන් හා ධනයෙන් විශුද්ධ නොවෙත්; සමාධිපාක්ෂිකධර්ම හෝ පඤ්චස්කන්ධධර්ම උපායෙන් සොයන්නේය. **ශාරිපුත්‍ර** ස්ථවිරයන් වහන්සේ ප්‍රඥාදියෙන් **ශ්‍රේෂ්ඨයි.**

iii. **භාවය:—**

20. ඉසි සඟුන් සෙවිනාලද ධර්මරජයන් වහන්සේ වැඩ හිඳින ඒ මේ **ජේතවනය** මට ප්‍රීති උපදවයි.

**21.** කර්මයත්, විද්‍යාවත්, ධර්මයත්, උත්තම සීලවත්ත ජීවිතයත් යන මෙයින් (අරි අටඟි මගින්) සත්වයෝ විශුද්ධ වෙත්; ගොත්‍ර යෙන් හෝ ධනයෙන් විශුද්ධ නොවෙත්.

22. එහෙයින් පණ්ඩිත ජනතෙම ආත්මාර්ථය මනාකොට බලමින් සමාධිපාක්ෂික ධර්ම තැනහොත් පඤ්චස්කන්ධ ධර්ම උපායෙන් වඩන්නේය; නොහොත් සොයන්නේය. මෙසේ ආර්‍ය්‍ය මාර්ග හෙතුකොට හෝ චතුස්සත්‍ය ප්‍රතිවෙධය නිමිතිකොට විශුද්ධ වේ.

23. මෙකී ප්‍රඥාවෙන් ද, ශීලයෙන් ද, කෙලශොපශමන යෙන් ද, ශාරිපුත්‍ර ස්ථවිර තෙමේම අග්‍රයි. නිවන් පරතෙරට ගිය යම් කිසි මහණකෙනෙක් වේ ද, ඒ නිවන්දුටු මහණ ගන තෙමේ මේ සැරියුත් තෙරුන්ම උතුම්කොට ඇති වන්නේය.

iv. **අනුවාදය:-**

**අනාථ පිණ්ඩික දිව්‍යපුත්‍ර** තෙමේ **ජේතවනාරාමයාගේ** ද, බුද්ධාදීන්ගේ ද, වර්‍ණගුණකථනයට ආයේ මෙසේ "**ඉදං හි තං ජේතවනං**" යනාදිය කීයේය.

**අනාථපිණ්ඩික වත සැකෙවින් මෙසේයි:— "එතදග්ගං භික්ඛවෙ මම සාවකානං උපාසකානං දායකානං යදිදං සුදත්තො ගහපති අනාථපිණ්ඩිකො"** යනුවෙන් දානාභිරත දායකයින්ගෙන් අග්‍ර තනතුරු ලත් හෙතෙම වනාහි **පදුමුත්තර** බුද්ධ කාලයෙහි **හංසවතී** නුවර කුලගෙයක උපන්නේ බුදුන්ගේ දහම්කථාව අසා සිටියේ ශාස්තෘන්වහන්සේ **එක් උපාසකයෙක්** දායකයින් අතරෙන් අගතැන් තබනවා **දැක** අධිකාර කර්‍මකොට ඒ තනතුර ප්‍රාර්‍ථනා කෙළේය. හෙතෙම කල්පලක්‍ෂයක් මුළුල්ලෙහි දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා මේ බුද්ධොත්පාදයෙහි **සැවැත් නුවර සුමන සිටානන්ගේ** ගෙදර උපන්නේය; ඔහුට **"සුදත්ත"** යයි නම් තැබුවෝය; හෙතෙම මෑතකාලයෙහි ගෘහවාසයෙහි පිහිටියේ දායකවූ දානපති වූයේ ඒ දානපති ගුණයෙන්ම පතළ නාමධෙය ඇත්තේ **'අනාථපිණ්ඩික'** නම් විය.

හෙතෙම සකටභාර පන්සියයකින් බඩු ගෙණ **රජගහනුවර** තමාගේ ප්‍රිය සහාය සිටානන්ගේ ගෙදරට ගොස් නැවතී **එහිදී** භාග්‍යවත් බුදුන් උපන් බැව් අසා ඉතා අළුයම් සමයෙහි දෙවතානුභාවයෙන් විවෘතකරණලද දොරටුවෙන් ශාස්තෘන් වෙත එළඹ ධර්‍මය අසා සෝවාන් පෙලෙහි පිහිටා දෙවෙනි දවස්හි බුද්ධප්‍රමුඛ සඟනට මහාදානයක් දීමෙන් පසුව **සැවැත් නුවරට** වැඩමවන පිණිස බුදුන් ගෙන් පිළිත ගෙන අතරමග වූ පන්සාළිස් යොදුන් මාර්‍ගයෙහි ලක්‍ෂය ලක්‍ෂය බැගින් වියදම් දී යොදුනෙන් යොදුන විහාර කරවා **ජේතවන උයන** කොළගණන් කහවණු ඇතිරීමෙන් අටළොස් කෝටියකින් මිලදී ගෙන දහඅටකෝටියකින් විහාරය කරවා නිමිකල්හි භික්‍ෂු, භික්‍ෂුණී, උපාසක, උපාසිකා, සිව්පිරිසට පෙරබත් කාලයෙහිද, පසුබත් කාලයෙහිද, ක්‍ෂමති සේ දන්දෙන්නේ අටළොස කෝටියකින් විහාරමහ නිමවූයේය. විහාරපූජෝත්සවය **නව මසකින්** නිමාවට ගියේය; **පස් මසකින්** යයි ද සමහරු කියත්; **තුන් මසකින්** විහාර පූජාව කෙළේය යන්නෙහි වනාහි සියළු ආචාර්‍යයන්ගේම විවාදයක් නැත.

මෙසේ රන්කහවනු සිව් පණස් කෙළක් ධනය වියදම් කොට හැම කලටම ගෙදරදී මෙබඳුවූම දානයක් ද තැබුවේය. දිනපතා සලාකබත් පන්සියයක්ද වෙත්, පාක්‍ෂික බත් පන්සියයක් ද, හුළු

කැන් සලාක පන්සියක් ද, පක්‍ෂයකට වරක් බැගින් කැඳ (යාගු) පන්සියක් ද, ධුරබත් පන්සියක්ද, ආගන්තුක බත් පන්සියක් ද, ගමික බත් පන්සියක් ද, ගිලන්බත් පන්සියක් ද, ගිලානොප ස්ථායක බත් පන්සියක් ද, ආසන පන්සියක් ද, ගෘහයෙහි නිති පතා පණවන ලද්දහුම වෙත්.

ඉක්බිති අපරභාගයෙහි ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ **ජේතවන** මහා විහාරයෙහි වැඩහිඳින කල්හි උපාසකවරුන් තනතුරුවල තබා වදාරණසේක් ඔහු දායකයින් ගෙන් **අග්‍රස්ථාන යෙහි** තැබූසේක.

සොවාන් පුගුලන් කෙරෙහි **අනෙපිඬු මහ සිටු විශාඛා උපාසිකාව** හා **සක්දෙව් රජු ද** යන මෙතුන් දෙනහට **භවනිකාන්ති** බලවත් බැවින් ඔව්හු දෙව්ලොවැ අනුක්‍රමයෙන් ඉපි ද ඒ ඒ දිව්‍ය ලොකයෙහි ආයු පමණින් වැස දිව සැප අනුභව කොට පර නිර්මිත වසවර්ති දෙව්ලොව සිට ධ්‍යාන උපයා බ්‍රහ්මලොකයන්හි අනුක්‍රමයෙන් උපද එහිදු ආයු පමණින් සිට උදාරතර ප්‍රීති සුඛ අනුභව කොට **ශුභකෘත්ස්න** තලයෙහි සිට මාර්ග භාවනාකොට අනාගාමී වැ ශුද්ධාවාසයෙහි අනුක්‍රමයෙන් උපද එහිදු ඒ ඒ තලයෙහි ආයු පමණින් වැස සමාපත්ති සැප අනුභව කොට අකනිෂ්ඨ තල යෙහි සිට රහත්වැ පිරිනිවෙත්.

v. **ප්‍රකීර්ණකරණාර්ථ**:-

**ඉසිසඞ්ඝනිසෙවිතං**= භික්‍ෂුසඞ්ඝයාවිසින් නිති සෙවනාලද; මෙසේ පළමු ගාථාවෙන් ජේතවන වණීනා කථනය කොට දැන් ආය්‍ය මාර්ග වණීනය කියන්නේ "කම්මං විජ්ජා" යනාදිය කීයේය.

**කම්මං**=මාර්ග චෙතනාවයි. **විජ්ජා**=මාර්ග ප්‍රඥවයි. **ධම්මො**= සමාධිපාක්‍ෂික ධර්මයයි.

**සීලං ජීවිතමුත්තමං**-සීලයෙහි පිහිටියහුගේ ජීවිතය උතුම් යයි දක්වයි. (නොහොත්)

**විජ්ජා**=දිට්ඨි-සංකප්පයෝයි.

**ධම්මො**=වායාම-සති-සමාධි තුනයි.

**සීලං**=වාක්-කර්මාන්තයෝයි;

**ජීවිත මුත්තමං**=එකී සීලයෙහි සිටියහුගේ ජීවිතය **තම** උත්තමයි.

**එතෙන මච්චා සුජ්ඣන්ති**=මේ ආය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයෙන් සත්වයෝ විශුද්ධ වෙත්.

**යොනිසො විචිනෙ ධම්මං**=උපායෙන් සමාධිපක්‍ෂයෙහි වූ ධර්මය විමසා රැස් කරන්නේය.

**එවං තත්ථ විසුජ්ඣති**=මෙසේ ඒ ආර්‍යමාර්ගයෙහි ලා විශුඩ වේ. (නොහොත්) යොනිසො විචිනෙ ධම්මං=උපායෙන් පඤ්ච ස්කන්ධ ධර්මය විමර්ශනය කරන්නේය. **එවං තත්ථ විසුජ්ඣති**=මේ ක්‍රමයෙන් ඒ දුඃඛාදී චතුරාර්‍යසත්‍යධර්මයන් විෂයෙහි විශුඩ වෙයි.

දැන් සාරිපුත්‍රස්ථවිරයන් වහන්සේගේ ගුණ කියන්නේ "සාරිපුත්තොව" යනාදිය කීයේය.

එහි "සාරිපුත්තොව" යනු අවධාරණ වචනයයි. මේ කියන ලද ප්‍රඥාදීන් ගෙන් **සැරියුත්** තෙරුන් වහන්සේම ශ්‍රෙෂ්ඨයයි කියයි.

**උපසමෙන**=කෙලෙස් උපසමයෙන්; (සංසිඳීමෙන්)

**පාරගතො**=නිර්‍වාණයට ගියේ, යම් කිසි නිවන්පත් භික්‍ෂු කෙනෙක් වේ නම් උන්වහන්සේ;

**එතාව පරමො සියා**=සැරියුත් තෙරුන් වහන්සේට වඩා උත්තරිතරයෙක් නම් නැතැයි කියයි.

——:——

# 5. 8. ජේතවන සූත්‍රප්‍රදීපයයි.

——:——

24. යෙ'ධ මච්ඡරිනො ලොකෙ-කදරියා පරිභාසකා,
අඤ්ඤෙසං දදමානානං-අන්තරායකරා නරා.

25. කීදිසො තෙසං විපාකො-සම්පරායො ච කීදිසො,
භගවන්තං * පුට්ඨුමාගම්ම-කථං ජානෙමු තං මයන්ති.

26. යෙ'ධ මච්ඡරිනො ලොකෙ-කදරියා පරිභාසකා;
අඤ්ඤෙසං දදමානානං-අන්තරායකරා නරා,

27. නිරයං තිරච්ඡානයොනිං-යමලොකං චූපපජ්ජරෙ,
සචෙ එන්ති මනුස්සත්තං-දළිද්දෙ ජායරෙ කුලෙ;
චොළං පිණ්ඩො රති ඛිඩ්ඩා-යත්ථ කිච්ඡෙන ලබ්භති.

28. පරතො ආසිංසරෙ බාලා-තම්පි තෙසං න ලබ්භති,
දිට්ඨෙව ධම්මෙ ස විපාකො-සම්පරායො ච දුග්ගතී'ති.

29. ඉතිහෙතං විජානාම-අඤ්ඤං පුච්ඡාම ගොතමං,
යෙ'ධ ලද්ධා මනුස්සත්තං-වදඤ්ඤූ වීතමච්ඡරා;
බුද්ධෙ පසන්නා ධම්මෙ ච සඞ්ඝෙ ච තිබ්බගාරවා.

30. කීදිසො තෙසං විපාකො-සම්පරායො ච කීදිසො,
භගවන්තං පුට්ඨුමාගම්ම-කථං ජානෙමු තං මයන්ති.

31. යෙ'ධ ලද්ධා මනුස්සත්තං-වදඤ්ඤූ වීතමච්ඡරා,
බුද්ධෙ පසන්නා ධම්මෙ ච-සඞ්ඝෙ ච තිබ්බගාරවා;
එතෙ සග්ගෙ පකාසෙන්ති-යත්ථ තෙ උපපජ්ජරෙ.

32. සචෙ එන්ති මනුස්සත්තං-අඩ්ඪෙ ආජායරෙ කුලෙ,
චොළං පිණ්ඩො රති ඛිඩ්ඩා-යත්ථාකිච්ඡෙන ලබ්භති.

33. පරසම්භතෙසු භොගෙසු-වසවත්තී'ව මොදරෙ,
දිට්ඨෙව ධම්මෙ ස විපාකො-සම්පරායො ච සුග්ගතී'ති.

---

5 – 9 – ( 24 – 25 – 26 – 27 – 28 – 29 – 33. )

i. මාතෘකා:-

තද මසුරන්ට යම ලෝකය සතු බව හා
සඟබත් දෙන්නන් බබලන බව.

ii. පිණ්ඩාර්ථය:-

මුදු මච්ඡරිය, ථද්ධ මච්ඡරිය,(කෑදරකම) අන්තරාය තුනක්, පර ලොව දුගතිය, දුගී බව, ඉහාත්ම විපාක, තුනුරුවන්ට ගෞරවය, තුෂ්ණීම් භාවයෙන් ඉල්වන්නෝ, ආඪ්‍ය කුලයෙහි ඉපදීම, අනුන් ගෙන් ලැබීම, පරලොව සුගතිය.

---

* "පුට්ඨුමාගාම" යනු ද පාඨාන්තරයි

iii. **භාවය:-**

24. මේ ලොකයෙහි යම් කෙනෙක් මසුරෝ වෙත්ද, කෑදරයෝ වෙත් ද, පිරිහෙළා බණින්නෝ ද, දන්දෙන අනුන්ට අන්තරායකාරී සත්ත්වයෝ වෙත් ද.

25. ඔවුන්ට කෙබඳු විපාක වේද? පරලොව කෙසේද? භාග්‍යවතුන් වහන්සේ විචාරනට ඇවිත් සිටිමු; ඒ කාරණය අපි කෙසේ දනිමු දැයි.

26. මෙම සූත්‍රයෙහි 24 භාවය බලනු.

27. ඒ පව්කාරයෝ නරකයෙහි උපදිත්; තිරිසන්යෝනියට යත්; යමලොකයෙහි ද උපදින්නාහ. යම් හෙයකින් මිනිසත් බවට ආවත් දිළිඳු කුලයෙහි උපදින්නෝය. යම් කුලයක රෙදි කෑබලි ඉඳුල් පිඩු හා රතික්‍රීඩා දුකසේ ලබත් නම් එබඳු කුලයක උපදිත්.

28. ඒ බාලයෝ අනුන්ගෙන් යම් දෙයක් බලා ඉඳිත් නම්; එයද උන්ට නොලැබේ. හේ මේ අත්බැවෙහි විපාකයි. පරලොව විපාකය දුගතියයි.

29. ගෞතමයන් වහන්සේගෙන් මේ වදාළ කාරණය එසේ දැන ගැණිමු; අනිකක් ද විචාරමු. මේ ලොකයෙහි යම් කෙනෙක් මනුෂ්‍යාත්මය ලබා සඟවදන් දන්නෝව මසුරු බැවින් වෙන්ව බුදුන් කෙරේ පැහැදුනෝ ධර්මයෙහි ද, සඞ්ඝයා කෙරෙහි ද අතිශයින් තියුණු ගෞරව ඇත්තෝ වෙත් ද?

30. මෙම සූත්‍රයෙහි 25 වන ගයෙහි භාවය බලනු.

31. මෙහි යම් කෙනෙක් මිනිසත් බව ලබාගෙණ දෙය්‍යධර්ම සංවිභාගකොට දන්දෙන්නෝ ද, වීතමාත්සර්‍ය ඇත්තෝ ද, බුද්ධ ප්‍රසන්නයෝ ද, ධර්මයෙහි ද, සඞ්ඝයා කෙරෙහි ද, තීව්‍ර ගෞරව ඇත්තෝ ද ඔව්හු යම් තැනක උපන්නෝ නම් සැපයෙන් අග්‍ර වූවෝ විමාන ප්‍රභායෙන් බබලත්.

32. ඉදින් මිනිසත්බවට එත් ද ආඪ්‍යකුලයෙහි උපදිත්; සළු, පිළි, ආහාරපිණ්ඩ, පස්කාම්රති කෙළිසෙල්ලම් යම් තැනක නොදුකින් ලබයි නම් එබඳු ආඪ්‍යකුලයකයි.

33. පරසම්භෘත භොගයන් කෙරෙහි වශවර්තීන් මෙන් සතුටු වෙත්. (අනුන් රැස්කළ වස්තුවෙහි අයිතිකාරයෝව මුදිත වෙත්) මේ දිටු ධර්මයෙහි (මෙලොව) විපාකයි; නැවත ඉපදීමෙහිත් සුගතියයි.

iv. **අනුවාදය:-**

මසුරුකමෙන් සමන්විත ඇතමෙක් වනාහි තමාගේ වාසස්ථානයෙහිදී සඟනමකට අත දිගහැරත් නොම වදියි; අන් තැනක යන්නේ විහාරයට පිවිස සකසා වැඳ මිහිරි පිළිසඳර කථා කරයි. "හාමුදුරුවෙනි අප වාසස්ථානයට නොවඩින්නේ ද? හේ සම්පූර්ණ ප්‍රදේශයකි; අපි ආර්යයන් වහන්සේලාට කැඳ බත් ආදියෙන් උපස්ථාන කරන්ට ප්‍රතිබලැත්තෝ"යි කියයි. භික්ෂූන් වහන්සේලාද "මේ උපාසක තෙමේ සැදැහැත්තේය, යාගුභක්තාදියෙන් සංග්‍රහ කරයි" සිතා ඉන්පසු එක් තෙර නමක් ඔහුගේ ගමට පිඬු පිණිස වඩියි. ඒ මසුරුතෙමේ තෙරුන් දක වෙන පැත්තකින් යයි; නැතහොත් ගෙට වදියි. යම් විදියකින් සම්මුඛබවට ආයේද අතින් වැඳ "හාමුදුරුවන්ට දානය දීපල්ලා, මම එක්තරා වැඩකට යමි"යි පැන යයි. තෙරුන් වහන්සේ ද මුළු ගමේ ඇවිද හිස් පාත්‍රයෙන්ම නික්මෙයි. මේ **තරුණ මොලොක් මසුරු කමයි.** යම් හෙයකින් දන් නොදෙතත් දායකයෙක් මෙන් පෙණෙයි. මෙහි තද මසුරුකම ඉදිරිපත් වේ.

යම් ඒ **දැඩි මසුරුකමින්** සමන්නාගතවූයේ භික්ෂූන් පිඬු පිණිස වන් කලැ "**ඵෙරණ සිතා**"යි කණවැකුනේ "කිමෙක් ද? මගේ පා රිදෙත්" යනාදිය කියා ගල්ටැඹ (කණුව)ක් මෙන් දෑ තද සිටියි; සාමීචිමාත්‍රයක් හෝ නොකරයි.

v. **ප්‍රකටීකරණාදී:—**

"**කදරියා**" යන මේ පදය "මච්ඡරිනො" යන පදයටම සමානවූවකි. මොලොක්වූ ද මසිරිය "**මච්ඡරිය**" යයිම කියනු ලැබේ. තද "**මසිරිය**" වනාහි "කදරිය" නම්. (කෑදරයායි)

**පරිභාසකා**=ගෘහවාරයෙහි සිටි භික්ෂූන් දක "**මොකද? තමුන්නාන්සේලා සී සා ආවහුද? වපුරා ආවහුද? නැත්නම් ගොයම් කපා ආවහුද? අපි අපටවත් නොලබමු, කොහෙන්ද? ඔබවහන්සේලාට; වහා ම නික්ම යන්ඩ.**" යනාදිය කීමෙන් තැතිගන්වන්නෝ "**පරිභාසක**" නම්.

**අන්තරාය කරා**=දායකයාට සග්ගන්තරාය ද, ප්‍රතිග්‍රාහකයින්ට ලාභන්තරාය ද තමාට උපඝාතය (විනාශය) දැයි මෙකී අන්තරාය යන් කරන්නෝ;

**රතී**=පස්කම් ගුණයෙහි ඇල්මයි.

**කිඩ්ඩා**=කායික ක්‍රීඩා (සෙල්ලම්) ආදියයි.

**දිට්ඨෙ'ව ධම්මෙ ස විපාකො**=ඒ උපන් තැන එම ආත්මභාව යෙහි තෙල විපාකයි.

**සම්පරායෙ ච දුග්ගති "යමලොකං ච උපපජ්ජරෙ"** කියන ලද පරලෙව්හි දුගතිය වේ.

**වදඤ්ඤූ**=භික්ෂූහු ගෘහචාරයෙහි සිටියෝ කොහොමත් තුෂ්ණී භූත වෙත්ද, අදහස් වශයෙන් වනාහි "භික්ෂාදානය කරව්"කියත් මය. එහි යම් නුවණැත්තෙක් "අපි (කැඳ බත් ආදිය) පිසමු; මූන් වහන්සේලා නො පිසත්; පිසවාගෙණ අනුභව කරන්නන් ලඟට ඇවිත් නොලබන්නෝ කොහෙන් ලබන්නාහු දැ"යි දනවක්‍ක කොටස් බෙදත්. ඔහු තුමූ "වදඤ්ඤූ" නම් වෙත්.

**පභාසෙන්ති**=විමානප්‍රභායෙන් දිළිසෙත්.

**පරසම්භතෙසු**=අනුන් විසින් සම්පිණ්ඩනය (රැස්) කළ වස්තු වෙහි;

**සම්පරායෙ ච සුගති**="එතෙ සග්ගෙ"යි මෙසේ වදාළ පර ලොව ද සුගතියයි.

මෙසේ කුශලාකුශල දෙපක්‍ෂයෙහි වූවන්ට ම ඒ උන් භව යෙන් චුතවී නැවත තමාට පිහිටවන ලොකය **සුගතිය** හෝ **දුගතිය** හෝ වෙයි.

—:—

## 5. 9. මච්ඡරි සූත්‍රප්‍රදීපයයි.

—:—

34. අවිහං උපපන්නාසෙ-විමුත්තා සත්ත භික්ඛවො,
රාගදොසපරික්ඛීණා-තිණ්ණා ලොකෙ විසත්තිකන්ති.
35. කෙ ච තෙ අතරුං සඞ්කං-මච්චුධෙය්‍යං සුදුත්තරං.
කෙ හිත්වා මානුසං දෙහං-දිබ්බං යොගං උපච්චගුන්ති.
36. උපකො පලගණ්ඩො ච-පුක්කුසාති ච තෙ තයො,
භද්දියො ඛණ්ඩදෙවො ච-බහුදන්ති ච පිඞ්ගියො;
තෙ හිත්වා මානුසං දෙහං-දිබ්බං යොගං උපච්චගුන්ති.
37 කුසලි භාසසි තෙසං-මාරපාසප්පහායිනං,
කස්ස තෙ ධම්මමඤ්ඤාය-අච්ඡිදුං භවබන්ධනන්ති.
38. නාඤ්ඤත්‍ර භගවතා-නාඤ්ඤත්‍ර තව සාසනා,
යස්ස තෙ ධම්මමඤ්ඤාය-අච්ඡිදුං භවබන්ධනං.
39 යත්ථ නාමං ච රූපං ච-අසෙසං උපරුජ්ඣති,
තං තෙ ධම්මිධඤ්ඤාය-අච්ඡිදුං භවබන්ධනන්ති.
40. ගම්භීරං භාසසි වාචං-දුබ්බිජානං සුදුබ්බුධං,
කස්ස ත්වං ධම්මමඤ්ඤාය-වාචං භාසසි ඊදිසන්ති.
41. කුම්භකාරො පුරෙ ආසිං-වෙහලිඞ්ගෙ ඝටීකරො,
මාතාපෙත්තිභරො ආසිං-කස්සපස්ස උපාසකො.
42. විරතො මෙථුනා ධම්මා-බ්‍රහ්මචාරී නිරාමිසො,
අහු වා තෙ සගාමෙය්‍යො-අහු වා තෙ පුරෙ සඛා.
43 සො'හමෙතෙ පජානාමි-විමුත්තෙ සත්ත භික්ඛවෙ,
රාගදොසපරික්ඛීණෙ-තිණ්ණෙ ලොකෙ විසත්තිකන්ති.
44. එවමෙතං තදා ආසි-යථා භාසසි භග්ගව,
කුම්භකාරො පුරෙ ආසි-වෙහලිඞ්ගෙ ඝටීකරො;
මාතාපෙත්තිභරො ආසි-කස්සපස්ස උපාසකො.
45. විරතො මෙථුනා ධම්මා-බ්‍රහ්මචාරී නිරාමිසො,
අහුවා මෙ සගාමෙය්‍යො-අහුවා මෙ පුරෙ සඛාති.
46 එව'මෙතං පුරාණානං-සහායානං අහු සඞ්ගමො,
උභින්නං භාවිතත්තානං-සරීරන්තිමධාරිනන්ති.

——:——

## 5. ආදිත්ත වග්ගො.

——:——

---

### 5 – 10 – (34-46)

i. **මාතෘකා:-** මානුසදෙහ-දිබ්බයොග-විමුක්ති සහාය සඞ්ගම.

ii. **පිණ්ඩාර්ථය:-**

උත්පත්තිසමනන්තර අරහත්ඵල විමුක්තිය, ඕරම්භාගීය සංයොජන පස, උද්ධම්භාගීය සංයොජන පස, කුශලභාෂිත ප්‍රශංසා, නිරාමිස බ්‍රහ්මචාරී, සගාමෙය්‍යයා.

iii. **භාවය:-**

34. භික්ෂූන් සත්නමක් අවිහ බඹලොවට නිබ්බත්තිවශයෙන් පැමිණුනාහු බ්‍රහ්මලොකොත්පත්ති සමනන්තරව අර්හත්ඵලවිමුක්ති

වශයෙන් මිදුනාහ. රාගවෙෂක්‍ෂය කළාහු සබ්බලොකයෙහි විසත්තිකා 'සඞ්ඛ්‍යාත තෘෂ්ණාව තරණය කළාහුයයි ඝටීකාර බ්‍රහ්මතෙමේ කීයේය.

35. "කවුරු කවුරු රාග, දෙස, මොහ, මාන, දිට්ඨි සඞ්ඛ්‍යය තරණයට අතිදුෂ්කරවූ මෘත්‍යුධෙය සඞ්ඛ්‍යාත ත්‍රෛභූමික වෘත්තය තරණයකළාහුද, කවර කෙනෙක් මානුෂිකදෙහ සඞ්ඛ්‍යාත කාම ධාතු භජනයකරණ සංයොජන පස හැරදමා දිව්‍යයොග නම් වූ රූපී බ්‍රහ්මලොකාදිය සෙවනයකරණ සංයොජනපස ඉක්මවාගියාහුද"යි "ඝටීකාර" බ්‍රහ්මයෙන් බුදුහු ඇසූය.

36. උපකය, පලගණ්ඩය, පුක්කුසාතිය, යන තිදෙන හා භද්දිය, භද්දදෙව, බාහුදන්ති, පිඞ්ගිය, යන සතරදෙන ද ඔරම්භාගිය සංයොජන පස (මනුෂ්‍යදෙහය) හැරදමා උද්ධම්භාගිය සංයොජන පස (දිබ්බයොගය) ඉක්මවාගියාහුයයි ඝටීකාර තෙම කීයේය.

37 මරපුඩු හැරදමූ ඒ උපකාදී තෙරවරුන්ට අනවද්‍යකුශල භාෂණවශයෙන් සතුතිකරන්නෙහිය. "ඒ සත්තම කවරෙකුගේ ධම්ය දැනගෙණ භවබැඳුම් සිඳලූ"දැයි බුදුන් වදාළසේක.

38. "ඒ සත්තම යමෙකුගේ ධම්ය දැන භවබන්ධන සිඳලූවාහු නම් එය භාග්‍යවතුන් හැර නොවේ; ඔබගේ සස්නෙන් වෙන්වී ද නොවේ.

39. යම් අනඞ්බන ධම් ධාතුවෙක්හි නාමයත් රූපයත් අශෙසව (ඉතුරු නැතිව) නිරුඬවේද; ඒ ධම්ය මේ ඔබවහන්සේගේ ශාසනයෙහිදී ඒ තෙර සත්තම දැනගෙණ වෘත්තබන්ධනය සින්දාහුය" යි බ්‍රහ්මතෙම කීයේය.

40. "ගැඹුරු අර්ථ (අදහස්) ඇති විජානන දුෂ්කරවූ අතිශය දුරවබොධවූ බස් කීයෙහිය. නුඹ කවර කෙනෙකුන්ගේ ධම්යක් දැන මෙබඳු වචන කියන්නෙහි"දැයි අසා වදාළසේක.

41. "පෙර කාසුප් බුද්ධකාල වෙහලිඞ්ග නුවරෙහි ඝටීකාර නම් කුම්භකාරයෙක් වූයෙමි; ඒ මම කාශ්‍යප බුදුන්ගේ උපාසකයෙක්විමි.

42. මෛථුනධම්යෙන් වෙන්වී නිරාමිස බ්‍රහ්මචාරී අනාගාමියෙක් වූයෙමි; මට එකම ගම්වැසියෙක් වූයේය. (ජොතිපාල මාණව නම් ඔහු) මගේ පෙර යහළුවෙක් වූයේය"යි බ්‍රහ්මතෙම කීයේය.

43. "ඒ මම(නුඹේ යහළුවූ ජොතිපාල මානව තෙමේ)පඤ්චවිධ විමුක්තියෙන් මිදුනාවූ රාග-වෙෂ පරික්ෂීණ කළාවූ ලොකයෙහි

**විසත්තිකා** තරණය කළාවූ ඒ භික්ෂූන් සත්නම දනිමි. **භාග්‍යවය!** නුඹ යම්සේ කියන්නෙහි නම් ඒ කාරණය එකල්හි එසේවී"යයි වදාළසේක.

44-45 යන දෙක 41-42 ට සමානයි.

46. භාවිත ආත්ම ඇති, අන්තිම ශරීරධාරීවූ, පූර්ණ යශස් වත්වූ (බුදුරජාණන්වහන්සේ සහ ඝටීකාර බ්‍රහ්මයාගේ) දෙදෙනාගේ සඞ්ගමය මෙසේ වීයයි සඞ්ගීතිකාරවරු කීහ.

v. **අනුවාදය:-** උපකාදීන්ගේ කථාවස්තු සහ **ඝටිකාර සූත්‍රය** බලනු.

v. **ප්‍රකාශීකරණාදී:-**

**උපපන්නාසෙ**=උත්පත්ති වශයෙන් උපගතවූ.

**විමුත්තා**= **අවිහය** ආදී **ශුද්ධාවාස** බ්‍රහ්මලොකයෙහි උත්පත්තියට සමනන්තරවම අර්හත්ඵල විමුක්තියෙන් මිදුනාවූ.

**මානුසං දෙහං**=මෙහි **පඤ්චොරම්භාගිය** සංයොජනයන්ම මිනිස් දෙහයයි කියනලද්දහ.

**දිබ්බං යොගං**=**උද්ධම්භාගිය** සංයොජන පස දිබ්බයොග නම්.

**උපච්චගුං**= අතික්‍රමණය කළාහුය.

**උපකො**= යනාදිය ඒ තෙරුන්ගේ නාමයෝ වෙත්.

**කුසලී භාසසි තෙසං**= කුශලය යන මේ මොහුට ඇත්තේනුයි **කුසලී** නම්. ඒ තෙරුන්ට කුශලයයි අනවද්‍යයයි කියන්නෙහි, ස්තුතිකරන්නෙහි, ප්‍රශංසා කරන්නෙහි දෙව්පිත් පණ්ඩිතයෙක් වනැ"යි වදාරයි. **තං තෙ ධම්මං ඉධඤ්ඤාය**= ඒසත්වීරවරු ඒ නිර්වාණධර්මය මෙහි ඔබවහන්සේගේ ශාසනයෙහිදී දැනගෙණ;

**බ්‍රහ්මචාරී නිරාමිසො**= නිරාමිස බ්‍රහ්මචාරීනම් **අනාගාමී** වූයෙමි යි අභිප්‍රායයි. **සගාමෙය්‍යො**= එක ගමේ වැසියෙක්වූ (මේ සූත්‍රයෙහි පිරිඅවසන්ගය (46)සඞ්ගීතිකාරකයන් විසින් තබනලදී.)

## 5. 10 ඝටීකාර සූත්‍රප්‍රදීපයයි.

——:——

පස්වන ආදිත්තවර්ගය සමාප්තයි.

——:——

**තස්සුද්දානං.**

ආදිත්තං කිංදදං අන්නං-එකමූලං අනෝමියං,
අච්ඡරා වනරොපෙතං-මච්ඡරෙන ඝටීකරෝ'ති.

——:——

1. කිංසු යාව ජරා සාධු-කිංසු සාධු* පතිට්ඨිතා,
කිංසු නරානං රතනං-කිංසු චොරෙහි දූහරන්ති.

2. සීලං යාව ජරා සාධු- සද්ධා සාධු පතිට්ඨිතා,
පඤ්ඤා නරානං රතනං-පුඤ්ඤං චොරෙහි දූහරන්ති.

---

**6 - 1 - (1-2)**

i. **මාතෘකා:-**

**සාධුධර්ම, මිනිසුන්ගේ රත්න හා, සොරකම් නොකටහැකිදේ කුමක්ද යනබව.**

ii. **පිණ්ඩාර්ථය:-**

සීලය හැමකලටම හොබියි. ඇඳුම් පැළඳුම් තරුණකලට (පමණක්) ශොභන වේ. සිල්රැකුමට ගැරහුම් නැත. පිහිටි ශ්‍රද්ධා සාධු වේ. ප්‍රඥාව දුර්ලභ පහළවීමකි. **අරූපධර්ම** සොරෙන් නොගතහැකියි.

iii. **භාවය:-**

1. ජරාව දක්වා කුමක් යහපත් ද? පිහිටනලද කුමක් යහපත්ද? මනුෂ්‍යයින්ට රත්නවූයේ කුමක් ද? සොරුන් විසින් පැහැරනොගතහැකි දේ කුමක් ද?

2. සීලය ජරාව දක්වා සාධුයි, යහපත් වේ. ප්‍රතිෂ්ඨිත ශ්‍රද්ධා යහපත්ය, මිනිසුන්ට රත්නය ප්‍රඥාවයි. සොරුන් විසින් නොගත හැක්කේ පුණ්‍යචේතනාවයි.

iv. **අනුවාදය:-**

කායකර්මාදි සමාදාන වශයෙන් ද, කුශලාකුශල ධර්මයන් පිහිටීම් වශයෙන් ද, සීලන ලක්ෂණවූ සීලය දුශ්ශීල්‍යවිධ්වංසන කෘත්‍ය ඇති අනවද්‍යසම්පත් රසය වේ. කාය, වචී, මනො සුචිතා වෙන් එළඹසිටියි. හිරිඔතප් ලංවීමෙන් සීලය උපදියි; පවතියි.

**සීලන** ලක්ෂණයෙන් එකම ආකාරයක් ඇති මේ සියලුම සීලය **සිරිත්-විරිත්** හෙයින් දෙවිදියකි. එසේම **ආභිසමාචාරික ආදිබ්‍රහ්මචරියක** වශයෙන් ද, **විරති-අවිරති** වශයෙන් ද; **නිශ්‍රිත-අනිශ්‍රිත** වශයෙන් ද; **කාලපර්යන්ත-ආප්‍රාණකොටික** වශයෙන් ද; **සපර්යන්ත-අපර්යන්ත** වශයෙන්ද; **ලෞකික-ලොකොත්තර** වශයෙන් ද; විවිධ වේ.

---

* "පතිට්ඨිතං" යනුද පාඨාන්තරයි.

හීන, මධ්‍යම, ප්‍රණීත විසින් ද; ආත්මාධිපති, ලෝකාධිපති, ධම්මාධිපති විසින් ද; පරාමට්ඨ, අපරාමට්ඨ, පටිප්පස්සද්ධි විසින් ද; විසුද්ධ, අවිසුද්ධ, වෙමතික විසින් ද; සෙඛ, අසෙඛ නෙවසෙඛනාසෙඛ විසින් ද; තුන්වැදෑරුම් වේ.

හානභාගිය, ඨිතිභාගිය, විසෙසභාගිය, නිබ්බෙධභාගිය, වශයෙන් ද; භික්ඛුසිල, භික්ඛුනිසිල, අනුපසම්පන්න සිල, ගහට්ඨසිල වශයෙන් ද; ප්‍රකෘතිශීලය, ආචාරශීලය, ධර්මතා ශීලය. පූර්වහෙතුක ශීලය වශයෙන් ද; ප්‍රාතිමොක්ෂසංවරශීලය ඉන්ද්‍රිය සංවරශීලය, ආජීවපාරිශුද්ධිශීලය, ප්‍රත්‍යසන්නිශ්‍රිත ශීලය වශයෙන් ද; සිව්වැදෑරුම් වේ.

පරියන්තපාරිසුද්ධි සීලය, අපරියන්ත පාරිසුද්ධි සීලය, පරිපුණ්ණ පාරිසුද්ධි සීලය, අපරාමට්ඨ පාරිසුද්ධි සීලය, පටිප්පස්සද්ධිපාරිසුද්ධි සීලය වශයෙන් ද; පහාන, වෙරමණී, චෙතනා, සංවර, අවීතික්කම වශයෙන් ද පස්වැදෑරම් වේ.

2 **චාරිත් වාරිත් සිල්**:= භාග්‍යවතුන්වහන්සේ විසින් මේ යමක් කටයුතුයයි පණවනලද ශික්ෂාපද පිරීමක් වේද ඒ **චාරිත්** (චාරිත්‍ර) **සිල්** නම් වේ.

මේ නොකටයුත්තැයි ප්‍රතික්ෂෙප කළ යමක් නොකිරීම **වාරිත්** (වාරිත්‍ර) **සිල්** නමි. "චරන්ති තස්මිං සීලෙ පරිපූරකාරිතාය පවත්තන්තීති චාරිත්තං, වාරිතං තායන්ති රක්ඛන්ති තෙනාති වාරිත්තං" මෙසේ චාරිත්‍ර-වාරිත්‍ර විවිධත්වය දතයුතුයි.

2\. 2. { i. ආභිසමාචාරික ශීලය,
ii. ආදිබ්‍රහ්මචරියක ශීලය.

උත්තම සමාචාරය (උතුම් හැසිරීම) අභිසමාචාරිකයි; උත්තම සමාචාරය අරභයා පණවනලද්ද "ආභිසමාචාරික" යි; ආජීවට්ඨමකයෙන් අවශෙෂ ශීලයට මේ නමකි.

මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයට මූල්බව වීනුයි ආදිබ්‍රහ්මචර්‍ය්‍යකයි; ආජීවය අටවැනිකොට ඇති ශීලයට මේ නම් වේ. ඒ ආජීවට්ඨමකශීලය වනාහි මාර්ගයට ආදිභාව විය; මුල්කොටම පිරිසිදු කළයුතු හෙයිනි. එහෙයින් වදාරණලදී: "පුබ්බෙව ඛො පනස්ස කාය කම්මං වචී කම්මං ආජීවො සුපරිසුද්ධො හොති". කාය කම් තුනත් වචී කම් සතරත් ආජීවයත් පළමුකොටම මෙසේ පිරිසිදු වෙයි කියායි. යම් ඒ සික පදයෝ ක්ෂුද්‍රානුක්ෂුද්‍ර යයි කියනලද්දාහුද මේ **ආභිසමාචාරික ශීලය** වේ. සෙස්ස **ආදි බ්‍රහ්මචරියකයි.** **භික්ෂු-භික්ෂුණී විභඞ්ග** දෙකේ ඇතුළත් වූයේ "ආදි බ්‍රහ්ම චරි

**යක ශීල**"යයි. කඳුවක් පරියාපන්නවූයේ ආභිසමාචාරික ශීලයයි. ආභිසමාචාරික ශීලසම්පත්තියෙන් **ආදි බ්‍රහ්මචරියක සීල** සම්පාදනය වේ. එහෙයින් වදාරණලදී: "සො වත භික්ඛවෙ භික්ඛු ආභිසමාචාරිකං ධම්මං අපරිපූරෙත්වා ආදි බ්‍රහ්මචරියකං ධම්මං පරිපූරෙස්සතීති නෙතං ඨානං විජ්ජති"යි මෙසේ **ආභිසමාචාරික ආදි බ්‍රහ්මචරියක** වශයෙන් දෙවිදියකින්ද සිලය දතයුතුයි.

2. 3. { i. විරති ශීලය.
ii. අවිරති ශීලය.

ප්‍රාණඝාතනාදියෙන් වෙරමණී (වෙන්වීම්) මාත්‍රය **විරති ශීල** යයි; සෙසු චෙතනාදිය අවිරති ශීලයයි. මෙසේ විරති අවිරති වශයෙන් විප්‍රකාරය දතයුතුයි.

2. 4. { i. නිස්සිත සීලය.
ii. අනිස්සිත සීලය.

මෙහි **තෘෂ්ණා නිශ්‍රය දෘෂ්ටි නිශ්‍රය**යි දෙකකි. එයින් මම මේ සීලය හෙතු කොට ශෙත දෙවියෙක් හෝ වන්නෙමි; දිව්‍යාන්‍යතර යෙක් හෝ රජෙක් හෝ වන්නෙමියි මෙසේ භව සම්පත් කැමති වන්නාහු විසින් පවත්වන ලද්දේ **තෘෂ්ණා නිශ්‍රිත** වේ.

ශීලයෙන් ව්‍රතයෙන් ශුද්ධියයි, මේ කල්පනා දෘෂ්ටියෙන් පවත් වන ලද්දේ **දෘෂ්ටි නිශ්‍රිත** වේ.

යම් ලොකොත්තර ශීලයක් වේද ඒ ලොකොත්තර ශීලයටම සම්භාර (නැමුනු) ලෞකික ශීලයකුත් වේ නම් මේ අනිශ්‍රිත වේ. මෙසේ නිශ්‍රිත අනිශ්‍රිත වශයෙන් විභෙදය දතයුතුයි.

2. 5. { i. කාල පරියන්ත සීලය.
ii. ආපාණ කොටික සීලය.

කාලයක් පරිච්ඡෙද කොට (මෙතරම් කලක් යයි) සමාදන්වූ සීලය **කාලපරියන්ත** නම් වේ.

• යාව ජීව සමාදානයෙන් ඒ දිවි ඇතිතාක් පවත්වන ලද්දේ **ආපාණ කොටික ශීලය** වේ.

මෙසේ කල්පිරියත් දිවිකෙළවර වශයෙන් දෙයාකාරය දත යුතුයි සපරියන්ත අපරියන්ත ක්‍රමය මෙසේයි,-

2. 6. { i. සපරියන්ත ශීලය.
ii. අපරියන්ත ශීලය.

ලාභ පිරියන්, යස පිරියන්, ඤාති පිරියන්, අඞ්ග පිරියන්, ජීවිත පිරියන්, වශයෙන් දක්නාලද කෙළවර ඇත්තේ **සපරියන්ත** ශීලය වේ. නො එසේ වූයේ අපරියන්ත ශීලය වේ.

"කතමං තං සීලං ලාභපරියන්තං-ඉධෙකච්චො ලාභහෙතු ලාභපච්චයා ලාභකාරණා යථාසමාදින්නසික්ඛාපදං වීතික්කමති; ඉදං තං සීලං **ලාභපරියන්තං**,"

"කතමං තං සීලං න ලාභපරියන්තං-ඉධෙකච්චො ලාභහෙතු ලාභපච්චයා ලාභකාරණා යථාසමාදින්නසික්ඛාපදවීතික්කමාය චිත්තම්පි න උප්පාදෙති; කිං සො වීතික්කමිස්සති; ඉදං තං සීලං **"න ලාභපරියන්තං"** මේ උපායෙන්ම අනිත් **යසපරියන්ත** සීලාදිය විස්තර කටයුත්තාහ.

2. 7. { i. ලෞකික ශීලය.
ii. ලොකොත්තර ශීලය. }

සියළුම ආශ්‍රව සහිත ශීලය ලෞකික වේ; අනාශ්‍රවය ලොකොත්තර වේ. එයින් ලෞකිකය භව විසෙස් ආවහනය කරයි; භවයෙන් නික්ම යාමටද සම්භාර වේ; මෙසේ වදාරණ ලදී: "විනයො සංවරත්ථාය, සංවරො අවිප්පටිසාරත්ථාය, අවිප්පටිසාරො පාමොජ්ජත්ථාය, පාමොජ්ජං පීතත්ථාය, පීති පස්සද්ධත්ථාය, පස්සද්ධි සුඛත්ථාය, සුඛං සමාධත්ථාය, සමාධි යථාභූතඤාණදස්සනත්ථාය, යථාභූතඤාණදස්සනං නිබ්බිදත්ථාය, නිබ්බිදා විරාගත්ථාය, විරාගො විමුත්තත්ථාය, විමුත්ති විමුත්තිඤාණදස්සනත්ථාය, විමුත්තිඤාණ දස්සනං අනුපාදාපරිනිබ්බාණත්ථාය. එතදත්ථා කථා, එතදත්ථා, මන්තනා, එතදත්ථා උපනිසා, එතදත්ථං සොතාවධානං යදිදං අනුපාදා චිත්තස්ස විමොක්ඛො"ති සි.

ලොකුත්තර සීලය භවනිස්සරණය එළවන්නේ වෙයි; ප්‍රත්‍යවෙක්ෂා (පස්විකුම්) ඥානයටද භූමියකි; මෙසේ **ලොවි-ලොවුතුරු** විසින් දෙවිදිය වේ.

3. 1. { i. **හීනසීලය.**
ii. **මජ්ඣිමසීලය.**
iii. **පණීතසීලය.** }

1. හීන ඡන්දයෙන්, හීන චිත්තයෙන්, හීන වීර්‍ය්‍යයෙන්, හීන විමංසාවෙන් පවත්වනලද්දේ **හීනසීලය** වේ.

2. මධ්‍යම ඡන්ද, චිත්ත, වීර්‍ය්‍ය, විමංසාවන්ගෙන් පවත්වන ලද්දේ **මධ්‍යම ශීලය** වේ.

3. ප්‍රණීත ඡන්දය, චිත්තය, වීර්යය, වීමංසාව යන මෙයින් පවත්වන ලද්දේ **ප්‍රණීත ශීලය** වේ.

1. යසස් කැමැත්තෙන් සමාදන්වූයේ හෝ හීනයි.
2. පින්පල කැමැත්තෙන් සමාදන්වූයේ මධ්‍යමයි.
3. මේ කටයුතුමයයි ආර්යභාවය පිණිස සමාදන්වූයේ ප්‍රණීතයි.

i. මම සීල සම්පන්න වෙමි; මේ අනිත් භික්ෂූහු දුශ්ශීලයෝය, පාපධර්ම ඇත්තෝය, කියා අත්තුක්කංසන-පරවම්භන දෙකෙන් උපක්ලිෂ්ටවූයේ හීන සීලයයි.

ii. අත්තුක්කංසන-පරවම්භන දෙකෙන් අනුපක්ලිෂ්ට වූ ලෞකික ශීලය මධ්‍යමයි.

iii. ලෝකෝත්තර ශීලය ප්‍රණීත වේ.

i. තෘෂ්ණා වශයෙන් හෝ භවභෝග පිණිස පැවැත්තේ හීන සීලයයි.

ii. තමන්ගේ විමෝක්ෂය පිණිස පැවැත්තේ මධ්‍යම ශීලයයි.

iii. සියලු සතුන්ගේ විමෝක්ෂය පිණිස පැවැත්වූ පාරමිතා සීලය ප්‍රණීතයි; මෙසේ හීන, මධ්‍යම, ප්‍රණීත වශයෙන් ත්‍රිවිධ සීලයක් වේ.

3. 2. {
i. **අත්තාධිපතෙය්‍ය සීලය.**
ii. **ලෝකාධිපතෙය්‍ය සීලය.**
iii. **ධම්මාධිපතෙය්‍ය සීලය.**

1. තමහට නුසුදුසු දේ අත්හරිනු කැමති ආත්ම ගෞරව ඇත්තහු විසින් තමා කෙරෙහි ගෞරවයෙන් පැවැත්වූ ශීලය **ආත්මාධිපති** නම් වේ.

ii. ලෝක අපවාද පරිහරණය කැමති ලෝකය ගරු කරන්නා විසින් ලෝක ගරුත්වයෙන් පවත්වල ලද්දේ **ලෝකාධිපතෙය්‍ය** ශීලයයි,

iii. ධර්ම මහත්වයට පුදනු කැමති ධර්මගරුකයා විසින් ධර්ම ගෞරවයෙන් පවත්වන ලද්දේ **ධර්මාධිපතෙය්‍ය ශීලය** වේ.

3. 3. {
i. **පරාමට්ඨ සීලය.**
ii. **අපරාමට්ඨ සීලය.**
iii. **පටිප්පස්සද්ධ සීලය.**

i. නිශ්‍රිත ශීලයම තෘෂ්ණා-දෘෂ්ටි දෙකෙන් පරාමර්ශණය කළ බැවින් **පරාමට්ඨ ශීලය** වේ.

ii. පෘථග්ජන කල්‍යාණකයාට මාර්ගසමාහාර වූයේද ශෛක්ෂ යන්ට මාර්ග සම්ප්‍රයුක්ත වූයේද **අපරාමෘෂ්ට ශීලයයි**.

iii. ශෛක්ෂයන්ගේ හා අශෛක්ෂයන්ගේ ඵලසම්ප්‍රයුක්ත වූයේ **ප්‍රතිප්‍රශ්‍රබ්ධ ශීලය** වේ.

3. 4. {
- i. විසුද්ධ සීලය.
- ii. **අවිසුද්ධ සීලය.**
- iii. **වෙමතික සීලය.**

i. ආපත්තියට නොපැමිණෙන්නහු විසින් යමක් පුරණ ලද ද ආපත්තියට පැමිණීමෙන් පසු හෝ කරණලද ප්‍රතිකර්ම ඇත්තේ ද ඒ **විශුද්ධ ශීලය** වේ.

ii. ආපත්තියට පැමිණියහුගේ නොකළ පිළියම් ඇත්තේ **අවිශුද්ධ ශීලය** වේ.

iii. ආපත්ති කර වස්තුවෙහි හෝ ආපත්තියෙහි හෝ අජ්ඣාචාරයෙහි හෝ විමති ඇත්තහුගේ සීලය **වෛමතික ශීලය** වේ.

මේ ත්‍රිවිධ ශීලයන් අතරෙහි යෝගීහු විසින් අවිශුද්ධ ශීලය විශෝධන කටයුතුයි. වෛමතිකයෙහි වස්තුව්‍යතික්‍රමනය නොකොට විමති ප්‍රතිවිනෝද කටයුත්තීය, මෙසේ ඔහුට පහසු වන්නේය.

3 5. {
- i. **සෙඛ සීලය.**
- ii. **අසෙඛ සීලය.**
- iii. **නෙවසෙඛනාසෙඛ සීලය.**

i. සතර ආර්‍යමාර්ගයන් විසින් ද, ශ්‍රාමණ්‍ය ඵල තුනෙන් ද සම්ප්‍රයුක්ත වූයේ **ශෛක්ෂ ශීලයයි**.

ii. අර්හත්ඵල සම්ප්‍රයුක්තවූයේ **අශෛක්ෂ ශීලයයි**.

iii. **සෙස්ස සෙඛත් නොවෙයි, අසෙඛත් නොවේ**; ශෛක්ෂාදී වශයෙන් ත්‍රිවිධ ශීලය මෙසේය.

ලෝකයෙහි ඒ ඒ සත්ත්වයන්ගේ ප්‍රකෘතියටත් සීලයයි කියනු ලැබේ. මේ තෙමේ සුඛ සීලය, මෙතෙම දුක්ඛ සීලය, මෙතෙම කලහ සීලය, මේ මණ්ඩන සීලයයි කියති; ඒ ක්‍රමයෙන් **කුශල ශීල, අකුශල ශීල, අව්‍යාකෘත ශීලයයි** ත්‍රිවිධ ශීලයක් ද වේ.

4. 1. {
- i. **හානභාගිය සීලය.**
- ii. **ඨිතිභාගිය සීලය.**
- iii. **විශෙෂභාගිය සීලය.**
- iv. **නිබ්බෙධභාගිය සීලය.**

1. "යො'ධ සෙවති දුස්සීලෙ-සීලවන්තෙ න සෙවති,
වත්ථුවීතික්කමෙ දොසං-න පස්සති අවිද්දසු.
මිච්ඡාසඞ්කප්පබහුලො-ඉන්ද්‍රියානි න රක්ඛති,
එවරූපස්ස වෙ සීලං-ජායතෙ හානභාගියං.

2. යො'පනත්තමනො හොති-සීලසම්පත්තියා ඉධ,
කම්මට්ඨානානුයොගම්හි-න උප්පාදෙති මානසං.

තුට්ඨස්ස සීලමත්තෙන-අඝටන්තස්ස උත්තරිං,
තස්ස තං ඨිතිභාගියං-සීලං භවති භික්ඛුනො.

3. සම්පන්නසීලො ඝටති-සමාධත්ථාය යො පන,
විසෙසභාගියං සීලං-හොති එතස්ස භික්ඛුනො.

4. අතුට්ඨො සීලමත්තෙන-නිබ්බිදං යො'නුයුඤ්ජති,
හොති නිබ්බෙධභාගියං-සීලමෙතස්ස භික්ඛුනො"ති.

මෙසේ හානභාගියාදි වශයෙන් චතුර්විධ ශීලය වේ.

4. 2.
- i. **භික්ඛු සීලය.**
- ii. **භික්ඛුනී සීලය.**
- iii. **අනුපසම්පන්න සීලය.**
- iv. **ගහට්ඨ සීලය.**

i. භික්ෂූන් අරබයා පැණවූ ශික්ෂාපදයන් හා, ඔවුන්ට භික්ෂුනීන්ගේ ප්‍රඥප්තියෙන් රැක්ක යුතු යම් සිකපද වෙත් ද මේ **භික්ෂු ශීලයයි.**

ii. භික්ෂුනීන් අරබයා පණවන ලද ශික්ෂාපදත් ඇලාට භික්ෂූන්ගේ ප්‍රඥප්තියෙන් රැක්ක යුත්තත් යන මේ **භික්ෂුනී ශීලය** වේ.

iii. සාමණේර සාමණේරීන්ගේ දශශීලයෝ **අනුපසම්පන්න ශීලය** වේ.

iv. උපාසක-උපාසිකාවුන්ගේ නිත්‍යශීල වශයෙන් පඤ්ච ශික්ෂාපදයන් ද, උත්සාහ ඇති කල්හි දශ ශික්ෂාපදයන් ද, පෞෂථාඞ්ග වශයෙන් ශික්ෂාපද අටද යන මේ **ගෘහස්ථ ශීලයයි.**

4. 3.
- i. **ප්‍රකෘති ශීලය.**
- ii. **ආචාර ශීලය.**
- iii. **ධර්මතා ශීලය.**
- iv. **පූර්වහේතුක ශීලය.**

i. **උතුරුකුරු දිවයින්** වැසි මිනිසුන්ගේ අව්‍යතික්‍රමය **ප්‍රකෘති ශිලය** වේ.

ii. කුලපාෂාණ්ඩ දෙශ පාෂාණ්ඩයන්ගේ තම තමන් මර්‍යාදා වෙන් ගෙනෙන ලද චාරිත්‍රය **ආචාර ශිලය** වේ.

iii. "ධම්මතා එසා ආනන්ද! යදා බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති, න බොධිසත්තමාතු පුරිසෙසු මානසං උප්පජ්ජති කාමගුණූපසංහිතං"යි මෙසේ වදාළ බොධිසත්ව මෑනියන්ගේ **ධර්මතා ශිලය** වේ.

iv. **මහාකාශ්‍යප** ස්ථවිරාදී ශුද්ධ **සත්ත්ව**යන්ට ද, බොධිසත්වයින් වහන්සේට ද ඒ ඒ ජාතිවල ශීලය **පූර්වහෙතුක සිලය** වේ.

4\. 4.
- i. **ප්‍රාතිමොක්ෂ සංවර ශිලය.**
- ii. **ඉන්ද්‍රියසංවර ශිලය.**
- iii. **ආජීවපාරිශුද්ධි ශිලය.**
- iv. **ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශිලය.**

i. භාග්‍යවතුන් වහන්සේ විසින් "ඉධ භික්ඛු පාතිමොක්ඛ සංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු"යි මෙසේ වදාළ ශීලය **ප්‍රාතිමොක්ෂ සංවර** ශීල නම් වේ; (විස්තර විශුද්ධි **මාර්ගය** බලා දතයුතු).

ප්‍රාතිමොක්ෂ සංවරශීලය ශ්‍රද්ධාවෙන් සම්පාදනය කටයුතු වේ; හේ ශ්‍රද්ධා සාධනයි, ශ්‍රාවකවිෂය අතික්‍රාන්තයි; ශික්ෂාපද ප්‍රඥප්ති යෙහිදී ශික්ෂාපද ප්‍රඥප්තිහුගේ නප්‍රතික්ෂෙපය ද මෙහි නිදර්ශන වේ. එහෙයින් පණවනලද පරිද්දෙන් ශික්ෂාපද අනවශෙෂව ශ්‍රද්ධාවෙන් සමාදන්ව ගෙන ජීවිතයෙහි අපෙක්ෂාවක් නොකරන්නහු විසින් මනාකොට සම්පාදනය කටයුතුයි.

ii. "සො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති, නානුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙතං චක්ඛු'න්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති; රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති; සොතෙන සද්දං සුත්වා -පෙ- ඝාණෙන ගන්ධං ඝායිත්වා, ජිව්හාය රසං සායිත්වා, කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා, මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති, නානුබ්‍යඤ්ජනග්ගාහී -පෙ- මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති"යි කියනලද මෙය **ඉන්ද්‍රිය සංවර** ශීලය වේ.

යම් සේ ප්‍රාතිමොක්ෂ සංවරය ශ්‍රද්ධාවෙන් සම්පාදනය කෙරේද, එසේම සමෘතියෙන් ඉන්ද්‍රියසංවර ශීලය සම්පාදනය කටයුතුයි; හේ වනාහි සතිසාධනයි, ඒ ඉන්ද්‍රිය සංවරය තෙම සමෘතියෙහි අධිෂ්ඨිතවූ ඉන්ද්‍රියයන්ට අභිධ්‍යාදීන් විසින් අන්වාශ්‍රවනීය (ලංවියහැකි) නොවන හෙයිනි.

iii. ආජීවය හෙතුකොට ගෙන පණවනලද ශික්ෂාපද සදෙනාගේ වීතික්කමනය සම්බන්ධ යම් කොහොන් බවක් වාචාල බවක් නිමිති කියා පෑමක්, මෙහෙයා කීමක්, ලාභයෙන් ලාභය වසනු කැමැත්ත ආදී මේ ආකාර පාපධර්මවශයෙන් පැවති මිථ්‍යාජීවයෙන් වෙන්වීමක් වේ නම් මේ **ආජීවපාරිශුද්ධි ශීලය** වේ.

වීර්‍ය්‍යයෙන් ආජීවපාරිශුද්ධිය සම්පාදනය කටයුතුයි; ආජීව පාරිශුද්ධි තොමෝ වීර්‍ය්‍යසාධන වේ; මනාකොට ආරබ්ධ වීර්‍ය්‍ය ඇත්තහුට මිථ්‍යාජීවප්‍රහාන සම්භවය වන හෙයිනි; එහෙයින් එක්විසි අනේසන ප්‍රතිරූප හැර දමා වෙර වෑයමෙන් පිණ්ඩපාත හැසිරීම් ආදි වූ සම්‍යක් එෂනාවන්ගෙන් ආජීවපාරිශුද්ධි තොමෝ සම්පාදනය කටයුත්තීය; පිරිසිදු ඉපදීම් පසයම ප්‍රතිසෙවනය කරන්නහු විසින් අපරිශුද්ධ උත්පාදයන් ආශීර්විෂයන් මෙන් දුරුකරමින් ආජීවය සුද්ධකළයුතු වේ.

iv. “පටිසඞ්ඛායොනිසො චීවරං පටිසෙවති යාව දෙව සීතස්ස පටිඝාතාය” යනාදී නයින් කියනලද පස්විකීමෙන් පිරිසිදු සිව්පස පරිභොගය **ප්‍රත්‍යයසන්නිශ්‍රිත ශීලය** නම් වේ.

යම් සේ වීර්‍ය්‍යයෙන් ආජීවපාරිශුද්ධිය වේ ද, එසේම ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය ප්‍රඥාවෙන් සම්පාදනය කටයුතුයි; ඒ පච්චය සන්නිස්සිතය වනාහි ප්‍රඥාසාධන වේ. ප්‍රඥාවන්තයාට සිව්පසයන්හි ආදීනව ආනිශංස දර්ශන සමර්ථභාවයෙනි; එහෙයින් ප්‍රත්‍යය ගෙධය හැරදමා දැහැමෙන් සෙමෙන් උපන් පසයන් යථොක්ත විධියෙන් ප්‍රඥාවෙන් පරීක්ෂාකරගෙන පරිභොග කරන්නහු විසින් ඒ ප්‍රත්‍යය සන්නිශ්‍රිතය සම්පාදෙතව්‍යයි; මේ සංවරශීල සතර දෙනම,-

4. 5.
1. දෙශනා ශුද්ධිය.
2. සංවර ශුද්ධිය.
3. පරියෙට්ඨි ශුද්ධිය.
4. පච්චවෙක්ඛණා ශුද්ධිය. කියා වෙත්.

5. 1. i. **පරියන්ත පාරිශුද්ධි ශීලය,**
ii. **අපරියන්ත පාරිශුද්ධි ශීලය,**
iii. **පරිපූර්ණ පාරිශුද්ධි ශීලය,**
iv. **අපරාමට්ඨ පාරිශුද්ධි ශීලය,**
v. **පටිප්පස්සද්ධි පාරිශුද්ධි ශීලය,**

i. "කතමං තං පරියන්තපාරිශුද්ධිසීලං,? අනුපසම්පන්නානං පරියන්තසික්ඛාපදානං ඉදං **පරියන්තපාරිසුද්ධිසීලං**

කතමං තං අපරියන්ත පාරිසුද්ධි සීලං,? උපසම්පන්නානං අපරියන්තසික්ඛාපදානං **ඉදං අපරියන්තපාරසුද්ධිසීලං.**

iii. කතමං පරිපුණ්ණපාරිසුද්ධිසීලං,? පුථුජ්ජනකල්‍යාණකානං කුසලධම්මෙ යුත්තානං සෙක්ඛපරියන්තෙ පරිපූරකාරීනං කායෙච ජීවිතෙ ච අනපෙක්ඛානං පරිච්චත්තජීවිතානං **ඉදං පරිපුණ්ණ පාරිසුද්ධිසීලං.**

iv. කතමං අපරාමට්ඨපාරිසුද්ධිසීලං? සත්තන්නං සෙඛානං **ඉදං අපරාමට්ඨපාරිසුද්ධිසීලං.**

v. කතමං පටිප්පස්සද්ධි පාරිසුද්ධිසීලං? තථාගත සාවකානං ඛීණාසවානං පච්චෙකබුද්ධානං තථාගතානං අරහන්තානං සම්මා සම්බුද්ධානං ඉදං **පටිප්පස්සද්ධිපාරිසුද්ධිසීලං**" යි "**පටිසම්භිදා**" **වෙහි** වදාළ හෙයින් "**විශුද්ධිභාගී**" යෙන් බලං දතයුතුයි.

5. 2. i. **ප්‍රහාණ ශීලය,**
ii. **වෙරමණී ශීලය,**
iii. **චේතනා ශීලය,**
iv. **සංවර ශීලය,**
v. **අව්‍යතික්‍රම ශීලය,** යන පස,

**පඤ්චසීලානි පාණාතිපාතස්ස පහාණං සීලං, වෙරමණී සීලං, චෙතනා සීලං, සංවරො සීලං, අවීතික්කමො සීලං; අදින්නා දානස්ස...පෙ...අරහත්තමග්ගෙන සබ්බකිලෙසානං, පහාණං සීලං, වෙරමණී...පෙ...චෙතනා -සංවරො-අවීතික්කමො සීලං.**

**මෙබඳු සීලයෝ චිත්තයාගේ අවිප්‍රතිසාරය පිණිස පවතිත්; ප්‍රමොද්‍යය පිණිස වෙත්; ප්‍රීතිය පිණිස වෙත්; ප්‍රශ්‍රබ්ධිය පිණිස වෙත්; සෞමනස පිණිස වෙත්; ආසෙවනය පිණිස වෙත්; භාව නාව පිණිස වෙත්; බහුලීකර්මය පිණිස වෙත්; අලඞ්කාර පිණිස**

වෙත්; පරිෂ්කාරය පිණිස වෙත්; පරිවාරය පිණිස වෙත්; පාරිපූරිය පිණිස වෙත්; ඒකාන්තනිර්වේදය පිණිස වෙත්; නිරෝධය, උපශමය, අභිඥාව, සම්බෝධය, නිර්වාණය පිණිස වෙත්යයි.

මෙහිද ප්‍රහාණයයි කියන ලද ප්‍රකාර ප්‍රාණාතිපතනාදීන්ගේ නොඉපදීම් මාත්‍රය හැර අමුතු ධර්මයක් නැත.

i. යම් හෙයකින් වනාහි ඒ ඒ ප්‍රහාණය තත් තත් කුශල ධර්ම ප්‍රතිෂ්ඨානාර්ථයෙන් උපධාරණය වේ; විකම්ප්‍යාභාවකරණයෙන්ද සමාධානය වේ; එහෙයින් පූර්වයෙහි කියනලද්දාවූම උපධාරණ සමාධාන සඞ්ඛ්‍යාත ශීලනාර්ථයෙන් සීලයයි කියන ලදී.

ii වෙරමණී ආදී අන්‍ය සතර ධර්මයෝ ඒ ඒ කාරණයෙන් වෙන්වීම් වශයෙන්ද;

iii. ඒ ඒ ධර්මයාගේ සංවර වශයෙන්ද;

iv. වෙරමණී-සංවර උභයසම්ප්‍රයුක්ත චේතනාවශයෙන්ද,

v. ඒ ඒ වස්තු අව්‍යතික්‍රමණය කරන්නහුට නොඉක්මවීම් වශයෙන්ද, චිත්තයාගේ පැවතීම් ස්වභාවය සඳහා කියන ලදහ; ඒ ප්‍රහාණාදීන්ගේ ශීලාර්ථය වනාහි පළමු ජටාසූත්‍ර ප්‍රදීපයේදී ප්‍රකාශිතමය;

මෙසේ ප්‍රහාණ ශීලාදිවශයෙන්ද පඤ්චවිධ වේ.

v. ප්‍රකටීකරණාර්ථ:-

සාධු=ලද්ධකයි, භද්‍රකයි, යහපතියි, මැනැවියි, ලැබිය යුතුයි, උපසෙවිතව්‍යයි,

සීලං යාව ජරා=මෙයින් මේ කාරණය දක්වයි.

යම් සේ මුතු මැණික් රත්න වස්ත්‍රාදී ආභරණයෝ තරුණ කාලයේදීම හොබිත්ද; ජරාවෙන් දිරාගියකල්හි ඒ ආභරණ දරන්නේ, මෙතෙම අදත් බාල බැව් පතයි; උමතුවෙක් මෙතැයි කියයුතු බවට පැමිණෙයිද; සීලය නො එසේය; සීලය වනාහි හැම කල් ශොභන වේ; බාල කාලයෙහිද සිල් රක්නහුට "සීලයෙන් මොනවට" දැයි කියන්නෝ නැත; මධ්‍යම කාලයෙහිද, මහළු කාලයෙහිද, එසේ කියන්නෝත් නැත.

සද්ධා සාධුපතිට්ඨිතා=හත්ථාලවක - විශාඛාගෘහපතිආදීන්ට මෙන් මාර්ගයෙන් ආවාවූ පිහිටි සැදැහැ යහපත්ය.

**පඤ්ඤ, නරානං රතනං**= මෙහි **චිත්තීකතාර්ථාදියෙන්** රත්නයයි දතයුතුයි; මෙය කියන ලදමය, ඉදින් චිත්‍රීකෘතහෙයින් රත්න නම් භාග්‍යවතුන්වහන්සේ කරණ ලද චිත්‍රයක් වැනි පුරුෂ ශ්‍රෙෂ්ඨයෙක් නොවේද? යම් කෙනෙක් ලොකයෙහි චිචිත්‍රී කෘත වෙත් නම් ඔවුන් අතුරෙන් භාග්‍යවතුන්වහන්සේ චිත්‍රීකෘත වේ.

ඉදින් රතිකෘතනුයි "**රතන**" යයි ගැණේ නම් භාග්‍යවතුන් වහන්සේ රතිකර පුරුෂ සිංහයෙක් නොවේද? උන්වහන්සේගේ වචනයෙන් හැසිරෙන්නෝ ධ්‍යාන කරති. සුඛයෙන් අභිරමණය කරත්.

ඉදින් **අතුල** නුයි **රතන** වේ නම් භාග්‍යවතුන්වහන්සේ අතුල්‍ය පුරුෂ ශ්‍රෙෂ්ඨයෙක් නොවේද? ගුණවලින් කිරන්ට හෝ පමණකරන්ට නොහැක; ගුණපාරමියට ගියේය. ඉදින් **දුල්ලභ** නුයි **රතන** වේ නම් භාග්‍යවතුන් නොලැබිය හැකි පුරුෂොත්තමයෙක් නොවේද?

ඉදින් **අනොමසත්තපරිභොග** යයි රතන වේ නම් භාග්‍යවතුන් වහන්සේ සීලයෙන්, සමාධියෙන්, ප්‍රඥාවෙන් විමුක්තියෙන්, විමුක්ති ඥානදර්ශණයෙන් "අනොම" නොවේදැයි."

මෙහි වනාහි දුර්ලභ ප්‍රාදුර්භාවාර්ථයෙන් **ප්‍රඥාව රතනය** යි කියන ලදී.

**"රතිං නයති වහති ජනයති වඩ්ඪෙතීති රතනං."** රති වඩානුයි **"රතන"** නම් වේ.

"චිත්තීකතං මහග්ඝඤ්ච
අතුලං දුල්ලභදස්සනං,
අනොමසත්තපරිභොගං
රතනං තෙන වුච්චති."

**පුඤ්ඤං**=පුණ්‍ය චෙතනාවයි; පුණ්‍ය චෙතනාතොමෝ අරූප හෙයින් සොරුගන්ට නොහැකි වෙයි.

—:—

## 6. 1. ජරා සූත්‍රප්‍රදීපයයි.

—:—

3. කිංසු අජරසා සාධු-කිංසු සාධු පතිට්ඨිතා,
කිංසු නරානං රතනං-කිංසු චොරෙහි දූහරං?

4. සීලං අජරසා සාධු-සද්ධා සාධු පතිට්ඨිතා,
පඤ්ඤා නරානං රතනං-පුඤ්ඤං චොරෙහි දූහරනති.

---

6 - 2 - ( 3 - 4.)

i. **මාතෘකා:—**

**අවිපත්තියෙන් සාධුබව.**

ii. **පිණ්ඩාර්ථය:-**

සම්පන්න අවිපන්නයි, අසම්පන්න විපන්නයි; සිල් නැත්නම් ගුරු ඇදුරන්ටත් එපා වෙයි.

iii. **භාවය:-**

3. කුමක් නම් නොදිරීමෙන් හඳුක වේද? කුමක් නම් තම සතන්හි පිහිටියේ යහපත්ද? කුමක් මිනිසුන්ට රත්නද? කුමක් සොරුන් විසින් පැහැර නොගත හැකිද?

4. සීලය නොදිරීමෙන් හඳුන වේ; ශ්‍රද්ධාව සිය සතන්හි පිහිටියේ ලද්ධක (යහපත්) වේ; ප්‍රඥතොමෝ මනුෂ්‍යයින්ට දුලබ පහලවීම් හෙයින් රත්න වේ. පින් සිතිවිල්ල සොරුන් විසින් පැහැර නොගත හැකි වේ.

iv. **අනුවාදය:—**

**සීලවිපන්න** නම් බිඳුනු සංවර සිල් ඇත්තේය.

v. **ප්‍රකටීකරණාර්ථ:—**

**අජරසා සාධු**=නොදිරීමෙන් අවිපත්තියෙන් යන අර්ථයි; සීලය වනාහි විපන්න නොවූයේම යහපත් වේ; සීලවිපන්නයාට (සිල්බිඳගත්තහුට) ආචාර්යඋපාධ්‍යාය ආදීහුද සඞ්ග්‍රහ නොකරත්; ගිය ගිය තැන නිගාකර ඉවත දැමිය යුත්තෙක් ම වේ.

—:—

## 6. 2. අජර සූත්‍රප්‍රදීපයයි.

—:—

5. **කිංසු පවසතො මිත්තං - කිංසු මිත්තං සකෙ ඝරෙ,**
**කිං මිත්තං අත්ථජාතස්ස - කිං මිත්තං සම්පරායිකන්ති.**

6. **සත්ථො පවසතො මිත්තං - මාතා මිත්තං සකෙ ඝරෙ,**
**සහායො අත්ථජාතස්ස - හොති මිත්තං පුනප්පුනං;**
**සයංකතානි පුඤ්ඤානි - තං මිත්තං සම්පරායිකන්ති.**

---

**6 - 3 - ( 5 - 6. )**

i. **මාතෘකා:-** මිත්‍ර ගත්තු සහ මිත්‍ර වසතු.

ii. **පිණ්ඩාර්ථය:** -

පිටරට මිත්‍රයා, ගෙදර මිතුරා, වැඩක් ඇති විට මිත්‍රයා-සහ පරලොව මිතුරා.

iii. **භාවය:-**

5. පිටරට වස්නහුට මිතුරා කවරේද? සවකීය ගෘහයෙහි මිත්‍ර කවිද? කටයුත්තක් උපන්නහුට මිත්‍ර කවරෙක්ද? සම්පරායික මිතුරා කවර කෙනෙක් ද?

6. ප්‍රවාසී (විදෙශ) හට සම්පවාරියා හෝ තවලම මිතුරා වේ; තම ගෙදර දී මව් තොමෝ මිතුරු වේ; උපන් කටයුතු (කිසක්) ඇත්තහුට සහායතෙම නැවත නැවත මිත්‍ර වේ; තමා විසින් කරගන්නාලද පින් ඇත්නම් ඒ පරලොව මිතුරු වේ.

iv. **අනුවාදය:-**

**මෙත්තෘයන** (සෙනෝ කිරීම්) වශයෙන් මිත්‍ර වේ; මිත්‍රයෝ **චිත්‍රකාර** වෙත්; **අගාරිය** මිත්‍රයෝය, **අනගාරිය** මිත්‍රයෝය කියාසි. අගාරිකයෝ ත්‍රිවිධ වෙත්; **උපකාරකයෝය, සමානසුඛදුක්ඛයෝය, අනුකම්පකයෝයයි;** අනගාරිකයෝ විශෙෂයෙන් අර්ථ කියා දෙන්නෝමය.

v. **ප්‍රකටීකරණාර්ථ:—**

**සත්ථො**=එකට ගමන් කරණ ජඞ්ඝසත්ථයක් හෝ ශකටසත්ථයක් හෝ; **මිත්තං**=රොගයක් උපන්කල පල්ලැක්කිය (පාවඩ්කිය) කින් හෝ අතික් යානාවකින් හෝ හැරගෙන ගොස් ක්ෂෙමාන්තයට පමුණුවන හෙයින් (උපකාර හෙයින්) මිත්‍ර වේ.

**සකෙ ඝරෙ**=තමන්ගේ ගෙදරදී යම්බඳු රොගයක් උපන්කල පුත්‍රභාර්‍ය්‍යාදීහු පිළිකුල් කරත්; මෑනියෝ වනාහි අසුචියද සඳුනක් මෙන් හගිති; එහෙයින් සවකීය ගෘහයෙහි ඒ මව් මිත්‍ර වේ. (අනුකම්පක වශයෙනි.)

**සහායො අත්ථජාතස්ස**=උපන් කෘත්‍යයක් ඇත්තහුගේ ඒ කටයුත්ත යමෙක් උසුලයි ද, එතරකරයි ද, හෙතෙම කෘත්‍යයන්හි එකට යන බැවින් සහායවූ මිත්‍රයි; රාබොනයාලුවෝ වනාහි මිත්‍රයෝ නොවෙත්.

**සම්පරායිකං**=පරලොවට හිත වූ;

---

**6. 3. මිත්ත සූත්‍රප්‍රදීපයයි.**

---

7\. කිංසු වත්ථු මනුස්සානං-කිංසූධ පරමො* සඛා,
කිංසු භූතූපජීවන්ති-යෙ පාණා පඨවිං සිතා'ති.

8\. පුත්තා වත්ථු මනුස්සානං-භරියා'ව පරමා සඛා,
වුට්ඨිං භූතූපජීවන්ති-යෙ පාණා පඨවිං සිතා'ති.

---

6 – 4 ( 7 – 8. )

i. **මාතෘකා:-**

**මිනිසුන්ගේ වස්තුව, මිතුරා, ජීවනය;**

ii. **පිණ්ඩාර්ථය:-**

වස්තුව නම් පිහිට වන දෙය ය; ඒ පුත්‍රයෝයි; බිරින්ද පරම මිත්‍රයාය; පොළොවේ වාසය කරන්නෝ වැස්සෙන් ජීවත් වෙති.

iii. **භාවය:-**

7\. මනුෂ්‍යයින්ගේ ප්‍රතිෂ්ඨාව කුමක්ද? උතුම් සකියා කව්ද? පෘථිවි ආශ්‍රිත යම් ප්‍රාණිකෙනෙක් වෙත්ද? ඒ භූතයෝ කුමක උපකාරයෙන් ජීවත් වෙත්ද?

8\. පුත්‍රයෝ මනුෂ්‍යයන්ගේ ප්‍රතිෂ්ඨා වෙත්; භාර්‍ය්‍යාවම උතුම් සකියාය; පොළෝ සෙවිනා යම් ප්‍රාණීහු වෙත් නම් ඒ සත්ත්වයෝ වැසි ඇසුරු කොට ජීවත් වෙති; (වර්ෂාජලයේ උපකාරයෙන් දිවි පවත් වත්).

iv. **අනුවාදය:-**

**පුත්‍ර වස්තුබව.**

"පඤ්චට්ඨානානි සම්පස්සං-පුත්තං ඉච්ඡන්ති පණ්ඩිතා,
1\. භතො වා නො භරිස්සති— 2. කිච්චං වා නො කරිස්සති,
3\. කුලවංසො චිරං ඨස්සති— 4. දායජ්ජං පටිපජ්ජති,
5\. අථ වා පන පෙතානං—දක්ඛිණං අනුපදස්සති"යි.

1\. අප විසින් කිරි පෙවීම අත්පා වැඩීමාදියෙන් පොෂණය කරණ ලද්දේ පිළිදගුම් කරණ ලද්දේය; අප මහලු කල අත්පා සේදවීම නෑවීම කැඳබත්දීමාදියෙන් පොෂ්‍යය කරන්නේ යයි සිත පිහිටුවයි.

2\. තමන් වැඩ පැත්තකින් තබා අපට රාජකුලාදියෙහි උපන් කෘත්‍යයට ගොස් ඒ රාජකාරි කරන්නේයයි සිත පිහිටුවයි.

3\. අපසන්තක කෙත් වත් රන් රුවන් ආදිය විනාශ නොකොට රකින පුතුන් ඇති කල්හි කුලවංශය චිරස්ථායි වන්නේ යයි ද, අප විසින් පැවැත්වූ සලාකබත් ආදිය නොකඩ කොට පවත්වන්නේය; එසේත් අපකුල පරපුර බෝකල් පවත්නේයයි ද, සිත පිහිටුවයි, 4. කුලවංශානුරූප ප්‍රතිපත්තියෙන් තමන් දායාදයට සුදුසුවූවෙකු කරන්නේ අප සතු දායාද පිළිපදින්නේ යයි ද සිත පිහිටුවයි.

---

* "පරමා" යනුද පාඨාන්තරයි.

5. "ප්‍රාප්තිදූතය කොට තුන්වෙනිදූ පමන් දූතය අනුප්‍රදූතය කරන්නේය." කියාද සිත පිහිටුවන්නේය.

**වුට්ඨිඋපජීවනය**=භූතයන්ගේ ජීවත්වීමට හේතුවූ **වර්‍ෂාවට අන්තරාය පසක්** වදාරා තිබේ. "**පඤ්චිමෙ භික්ඛවෙ වස්සස්ස අන්තරායා** යං නෙමිත්තා න ජානන්ති, යත්‍ථ නෙමිත්තානං චක්ඛු නක්ඛමති, කතමෙ පඤ්ච?

1. උපරි භික්ඛවෙ ආකාසෙ තෙජොධාතු පකුප්පති තෙන උප්පන්නා මෙඝා පටිවිගච්ඡන්ති; අයං භික්ඛවෙ **පඨමො** වස්සස්ස අන්තරායො, යං නෙමිත්තා න ජානන්ති, යත්‍ථ නෙමිත්තානං චක්ඛු නක්ඛමති.

2. පුනචපරං භික්ඛවෙ උපරි ආකාසෙ වායොධාතු පකුප්පති, තෙන උප්පන්නා මෙඝා පටිවිගච්ඡන්ති; අයං භික්ඛවෙ **දුතියො** වස්සස්ස අන්තරායො යං නෙමිත්තා න ජානන්ති, යත්‍ථ නෙමිත්තානං චක්ඛු නක්ඛමති.

3. පුනචපරං භික්ඛවෙ **රාහු අසුරින්දො** පාණිනා උදකං පටිච්ඡිත්වා මහාසමුද්දෙ ඡඩ්ඩෙති; අයං භික්ඛවෙ **තතියො** වස්සස්ස අන්තරායො යං නෙමිත්තා න ජානන්ති, යත්‍ථ නෙමිත්තානං චක්ඛු නක්ඛමති.

4. පුනචපරං භික්ඛවෙ **වස්සවලාහකා දෙවා** පමත්තා හොන්ති; අයං භික්ඛවෙ **චතුත්‍ථො** වස්සස්ස අන්තරායො යං නෙමිත්තා න ජානන්ති, යත්‍ථ නෙමිත්තානං චක්ඛු නක්ඛමති.

5. පුනචපරං භික්ඛවෙ මනුස්සා අධම්මිකා හොන්ති; අයං භික්ඛවෙ **පඤ්චමො** වස්සස්ස අන්තරායො, යං නෙමිත්තා න ජානන්ති, යත්‍ථ නෙමිත්තානං චක්ඛු නක්ඛමති; ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච වස්සස්ස අන්තරායා යං නෙමිත්තා න ජානන්ති; යත්‍ථ නෙමිත්තානං චක්ඛු නක්ඛමතීති".

(මෙසින් නිමිත්ත පාඨකවූ ජ්‍යොතිර්ඥනාදීන් සමන්විත ඍෂිවරුදීන්ට වත් නොපෙණෙන වර්‍ෂා ඇති වගත් **ආකාශ පරීක්‍ෂණාකාරාදියෙන්ද** රවි-ශුක්‍රාදී ග්‍රහයොගවලින්ද කියන වර්‍ෂා විභාග වෙනස්වන ආකාරයත් දූන සුබබුට්ඨි දුබ්බුට්ඨි විභාග දතයුතුයි.)

v. **ප්‍රකටීකරණාර්ථ.**

**පුත්තා වඩ්ඪ**=මහලු කාලයෙහි ප්‍රතිජග්ගනාර්‍ථයෙන් පුත්‍රයෝ ප්‍රතිෂ්ඨා වෙත්.

**පරමො**=අනුන්ට නොකියයුතු වූද රහස කියන්නට යුත්තී බැවින් භාර්‍ය්‍යාව **පරමසඛ** නම් වේ.

---

## 6. 4. වඩ්ඪ සූත්‍රප්‍රදීපයයි.

9. කිංසු ජනෙති පුරිසං-කිංසු තස්ස විධාවති,
කිංසු සංසාරමාපාදි-කිංසු තස්ස මහබ්භයං?

10. තණ්හා ජනෙති පුරිසං-චිත්තමස්ස විධාවති,
සත්තො සංසාරමාපාදි-දුක්ඛමස්ස මහබ්භයන්ති.

---

6-5 (9-10)

i. මාතෘකා:-

පුද්ගලයා ඉපදවීම, ඔබමොබ දිවීම, සසරට පැමිණීම, මහාභය, ඇති වන්නේ කෙසේද? යන බව.

ii. පිණ්ඩාර්ථය:-

තණ්හාව සත්වයා උපදවයි; හිත දුවයි; සසරට වන්නේ සතෙකි; තෘෂ්ණාවෙන් ඉපදී හිතෙන් දුව පැන සසරට වන් පුරුෂයාට දුක මහත්භයකි.

iii. භාවය:-

9. කුමක් පුද්ගලයා උපදවාද? ඔහුගේ කුමක් එහා මෙහා දුවයිද? කවරෙක් සසරට පත්විද? ඔහුට මහත් භය කුමක්ද?

10. තෘෂ්ණාතොමෝ පුද්ගලයා උපදවයි; ඒ පුද්ගලයාගේ සිත එහා මෙහා දුවයි; සත්වතෙම සසරට පැමිණියේය; ඕහට වෘත්ත දුක්ඛය මහත් භය වේ.

iv. අනුවාදය:-

චිත්තමස්ස විධාවති.

පළමුකොට වනාහි ප්‍රතිසන්ධිචිත්තය වේ; ද්විතීය භවඞ්ග චිත්තය, තෘතීය භවඞ්ග චිත්තය...පෙ...සොළසම භවඞ්ගචිත්තය කියා සිත් දහසයක් උපදිත්.

ඒ සොළොස් චිත්තයන් කෙරෙහි එක එක හිතට උප්පාද ක්ෂණය, ස්ථිතික්ෂණය භඞ්ගක්ෂණය, වශයෙන් තුන් තුන් ක්ෂණයෝ වෙත්. (16 × 3=48)

එහි එක එක සිතක් සම්බන්ධ තුන් තුන් ක්ෂණයන්හි සමතිස් සමතිස් කර්මජරූප උපදිත්; (48 × 30=1440 යි) ඒ කර්මජ රූප කලාපයෙහි ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාද ක්ෂණයෙහි සමුත්ථිත කර්මජ රූපය සතළොස්වෙනි භවඞ්ගචිත්තයාගේ උත්පාදක්ෂණයෙහිම නිරුද්ධ වේ

ප්‍රතිසන්ධිචිත්තයාගේ ස්ථිති ක්ෂණයෙහි නැගි කර්මජරූපය සතළොස්වෙනි භවඞ්ග චිත්තයාගේ ස්ථිති ක්ෂණයෙහිදීම නිරුද්ධ වේ.

**ප්‍රතිසන්ධිචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි** නැංගාවූ කර්මජ රූපය සතලොස් වෙනි භවඞ්ගචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහිම නිරුද්ධවේ.

මෙසේ විතීය භවාඞ්ගචිත්තය ආදිකොට තමතමන්ගේ සත ලොස් (17) වෙනි චිත්තය සමග යොදගත් නය ක්‍රමය පැමිණ විය යුතුයි.

මෙසේ සොලොස් ත්‍රිකයෝ අටසාළිසක් වෙත්; මේ අටසාළිස් කර්මජරූප "ප්‍රවේණි" නම්; ඒ මේ 'අටසාළිස් කර්මජ රූප ප්‍රවේණි තොමෝ රාත්‍රියෙහිද, දවල්ද, කන්තන්වද, බොන්තන්වද, නිදන්තන්වද, ප්‍රමත්තසින්වද, නදී ශ්‍රොතසක් (ගංවතුරපාරක්) මෙන් ඒකාන්තව පවතින්නීමය. මෙසේ එකට ඉපදීම් වෙන් වෙන්ව නිරුද්ධ වීම් වශයෙන් මේ ආකාරය දතයුතුයි;

**නානුප්පාද එක නිරොධතා** (වෙන් වෙන් ව ඉපිද එකට නිරුඩවන බව) පච්ඡිමකර්මජ (අන්තිම සමතිස් කර්මජ) රූපයෙන් **දක්විය** යුතුයි.

එහි ආයු සංස්කාර පර්‍යවසානයෙහි (ආයු පිරිහීමේ කෙළවර) සොලොස් චිත්තයන්ගේ වාරය ඇති කල්හි **යට "සොලොස් චිත්තවාරය"** මතු **"සොලොස් චිත්තවාරය"** යන දෙක එකට යෙදිය යුතු වෙත්; යට සොලොසෙහි වනාහි ප්‍රථම චිත්තයාගේ ඉපදීම්කෙණෙහි නැංගාවූ සමතිස් කර්මජරූපය මතු සොලොසෙහි පළමු සිතේ ඉපදීම්කෙණෙහිම නිරුඩ වේ. යට සොලොසෙහි වනාහි ප්‍රථම චිත්තයාගේ සිටීම්කෙණෙහි නැංගාවූ සමතිස් කර්මජරූපය මතු සොලොසෙහි පළමු චිත්ත යාගේ සිටීම්කෙණෙහිම නිරුඩ වේ.

යට සොලොසෙහි වනාහි ප්‍රථම චිත්තයාගේ බිඳීම්කෙණෙහි නැංගාවූ **සමතිස් කර්මජ රූපය** මතු සොලොසෙහි ප්‍රථම චිත්ත යාගේ බිඳීම් කෙණෙහිම නිරුඩ වේ.

හෙටසිම සොළසකයෙහි වනාහි ද්‍රිතියචිත්තයාගේ **උත්පා දක්ෂණයෙහි** සමුට්ඨිත සමතිංස කම්මජරූපය උපරි සොළසක යෙහි ද්‍රිතියචිත්තයාගේ උත්පාදක්ෂණයෙහි නිරුඩවේ. ...පෙ... හෙට්ඨිම සොළසකයෙහි දහසයවෙනි චිත්තයාගේ උප්පාදක්ඛණ යෙහි සමුට්ඨිත සමතිංස කම්මජරූපය වනාහි **චුතිචිත්තයාගේ උප්පාදක්ඛණයෙහිම** නිරුඩ වේ.

හෙට්ඨිම සොළසකයෙහි සොලොස් වන චිත්තයාගේ **ඨිතික්ඛණයෙහි** සමුට්ඨිත **සමතිංස** කම්මජරූපය වනාහි චුති චිත්තයාගේ **ඨිතික්ඛණයෙහිම** නිරුඩ වේ

හෙට්ඨිම සොළසකයෙහි සොළොස්වන චිත්තයාගේ භඞ්ගක්ඛණයෙහි සමුට්ඨිත සමතිංස කම්මජ රූපය වනාහි චුති චිත්තයාගේ භඞ්ගක්ඛණයෙහිම නිරුද්ධවේ. එතැන් පටන් කම්මජ රූපප්පවෙණී නොපවතියි.

ඉදින් පැවැත්තේ නම් සත්වයෝ **අක්ඛය, අවය, අජර, අමර** නම් වන්නාහුය.

මෙහි වනාහි යම් ඒ සතළොස්වන භවඞ්ගචිත්තයාගේ ඉපදීම්කෙණෙහිම නිරුද්ධවේයයි ආදීනයෙන් "**එක් සිතක ඉපදීම්කෙණෙහි උපන් රූපය අන් සිතක ඉපදීම්කෙණෙහි නිරුද්ධ වේ ය**"යි පැරණි සිංහල අටුවා කථාවෙහි ආගතහෙයින් කියන ලදැයි **විභඞ්ග අටුවාවෙහි**' දැක්වෙයි.

එය "**යස්ස කායසඞ්ඛාරො නිරුජ්ඣති, තස්ස චිත්ත සඞ්ඛාරො නිරුජ්ඣතීති ආමන්තා**" යන මේ පාළියට විරුද්ධ වේ. ඒ කෙසේද? කායසංස්කාරය වනාහි චිත්තසමුට්ඨානවූ ආශ්වාස ප්‍රාශ්වාස (අස්-පස්) වාතය වේ.

චිත්තසමුට්ඨානරූපයද චිත්තයාගේ උප්පාදක්ඛණයෙහි ඉපිද අන්‍ය සොළොස් චිත්තයන් යම් තාක් උපදීද ඒතාක් සිටියි; ඒ සොළොස් චිත්තයන් අතරෙන් සර්ව පශ්චිම (අන්තිම) සිත සමග නිරුද්ධ වේ;

මෙසේ යම් සිතක් සමග චිත්තසමුට්ඨාන රූපය උපදීද එතැන් පටන් සතළොස් වෙනි සිත සමග නිරුද්ධ වේ; වෙන කිසි චිත්තයක්හුගේ උප්පාදක්ඛණයෙහි හෝ ඨිතික්ඛණයෙහි හෝ නිරුද්ධ නොවේ; වෙන කිසි සිතක්හුගේ ස්ථිතික්ෂණයෙහි හෝ භඞ්ගක්ෂණයෙහි හෝ උත්පාද නොවේ; මෝ තොමෝ චිත්ත සමුට්ඨානරූපයාගේ ධර්මතායයි නියම හෙයින් චිත්ත සංස්කාරයා සමග එකක්ෂණයෙහි නිරුද්ධ වන හෙයින් ආමන්තා (එසේයයි) කියන ලදී.

යම් මේ චිත්තසමුට්ඨාන රූපයක්හුගේ ක්ෂණ නියමයක් කීයනලද ද, කර්මාදී සමුට්ඨාන රූපයාගේද මෙයම ක්ෂණ නියමය වේ,

එහෙයින් ප්‍රතිසන්ධිචිත්තය සහ එකට උපන් කර්මජරූපය තෙමේ එතැන් පටන් සතළොස් වැන්න හා සමග නිරුද්ධ වේ. ප්‍රතිසන්ධි චිත්තයාගේ ස්ථිතික්ෂණයෙහි උපන් සමුට්ඨාන රූපය අටළොස් වන චිත්තයාගේ උප්පාදක්ඛණයෙහි නිරුද්ධ වේ.

ප්‍රතිසන්ධි චිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි උපන් සමුට්ඨාන රූපය දහඅටවෙනි චිත්තයාගේ ස්ථානක්ෂණයෙහි නිරුද්ධවේ යයි, මේ ක්‍රමයෙන් මෙහි යොජනා කටයුත්තිය

**හෙටසිම සොළසකයෙහි** දහසය වෙනි චිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි සමුට්ඨිත සමත්‍රිංශත් කර්මජරූපය චුති චිත්තයාගේ භඞ්ගක්ෂණයෙහිම නිරුද්ධ වේ; ඉන් මත්තෙහි චුති සෘතු සඞ්ඛ්‍යාත ශීත උෂ්ණ දෙකින් සමුත්ථානිකවූ **රූප පරම්පරා** ඔම සිටියි; "බැහැර ගෙන ගොස් දවා පියව්" කියා කියයුතු බව වේ. මෙසේ වෙන් වෙන්ව ඉපිද එකට නිරුද්ධ වීම් වශයෙන් දතයුත්තාහ.

v. **ප්‍රකටීකරණාර්ථ:—**

**විධාවති**=පර සමුද්‍රාදී ගමන වශයෙන් ඔබ් නොබද දුවයි.

සිතට චිත්තාහි මකුළු හුයක් පමණවත් පූර්වාදී දිසාභාග යෙන් ගමණක් නම් නැත; දූරයෙහි ඇත්තාවූද අරමුණ පිළි ගණියි; එහෙයින් **දූරඞ්ගම** නම් වේ; සිත් සතක් හෝ අටක් එකතුව එක කණිණිකා බඩව එකක්ෂණයෙහි උපදින්ට සමර්ථයෝ නම් නොවෙත්; උත්පත්ති කාලයෙහි එක එක සිතම උපදියි; ඒ උපන් සිත නිරුද්ධ කල්හි නැවත එක එක උපදියිනුයි. එකචර වේ; චිත්තයාගේ ශරීර සංස්ථානක් හෝ නීලාදී ප්‍රකාර වර්ණ භෙදයක් හෝ නැතැයි **අශරීර** නම් විය; හෘදය රූපය ඇසුරු කොට පවතීනුයි **ගුහාශය** නම් විය.

එහෙයින් වදාරණලදී.

> "දූරඞ්ගමං එකචරං-අසරීරං ගුහාසයං,
> යෙ චිත්තං සඤ්ඤමෙස්සන්ති-මොක්ඛන්ති මාරබන්ධනා"ති.

—:—

# 6. 5 ප්‍රථම ජනන සූත්‍රප්‍රදීපයයි.

—:—

**11. කිංසු ජනෙති පුරිසං-කිංසු තස්ස විධාවති,**
**කිංසු සංසාරමාපාදි-කිස්මා * න පරිමුච්චතීති. ?**

**12. තණ්හා ජනෙති පුරිසං-චිත්තමස්ස විධාවති;**
**සත්තො සංසාරමාපාදි-දුක්ඛා න පරිමුච්චතීති.**

---

**6 – 6 – ( 11 – 12, )**

i. **මාතෘකා:-**

**දුකෙන් නොමිදීම.**

ii. iii. v. විශෙෂ නැත.

iv. **අනුවාදය;—**

කායප්‍රසාද වස්තුක සුඛ දුඃඛයෝ වෙත්; සුඛය දුඃඛයට ප්‍රතිපක්‍ෂ වේ; දුඃඛය සුඛයට ප්‍රතිපක්‍ෂ වේ; සැපයෙන් පැතිරි තැන යම් තරමක්ද ඒ තරමට දුකත් පැතිරෙයි; දුකෙන් පැතිරි තැන යම් තරම්ද ඒ තරම් සැපය පැතිරෙයි.

මේ දුඃඛය නම් අනේකය; නානාප්‍රකාරය; ඒ කවරේද?

1. **දුක්ඛ දුක්ඛය,**
2. **විපරිණාම දුක්ඛය,**
3. **සඞ්ඛාර දුක්ඛය,**
4. **පටිච්ඡන්න දුක්ඛය,**
5. **අපටිච්ඡන්න දුක්ඛය,**
6. **පරියාය දුක්ඛය,**
7. **නිප්පරියාය දුක්ඛය** කියායි.

1. එහි කායික චෛතසික දුක්ඛවේදනා තොමෝ ස්වභාවයෙන්ද, නාමයෙන්ද, දුක් බැවින් **දුක්ඛදුක්ඛ** නම්.

2. සුඛ වේදනා තොමෝ **විපරිණාමයෙන්** (පෙරළීමෙන්) දුක් ඉපැත්මට හෙතු බැවින් **විපරිණාමදුක්ඛ** නම්.

3. උපෙක්‍ෂා වේදනාවද අවශෙෂ ත්‍රෛභූමික **සංස්කාරයෝ**ද උදයව්‍යය පීඩිතත්වයෙන් **සඞ්ඛාරදුක්ඛ** නම්. එසේ පීඩනය වනාහි මාර්ගඵලයන්ටද ඇත; එහෙයින් ඒ මාර්ගඵලධර්මයෝ දුඃඛසත්‍යපර්‍ය්‍යාපන්නත්වයෙන් **සංස්කාරදුඃඛ** නමැයි දතයුතුයි.

4. කණ්ණ ශූල, දන්ත ශූල, රාගජ පරිදාහ, දොසජ පරිදාහ ආදී කායික චෛතසිකවූ ආබාධය තෙමේ පිළිවිස දතගත යුතු හෙයින්ද, උපක්‍රම අප්‍රකට හෙයින්ද, **පටිච්ඡන්නදුක්ඛ** නම්. අප්‍රකට දුක යයිද කියනු ලැබේ.

---

* "කිස්සා" යනුද පාඨාන්තරයි.

5. **දෙතිස් කම්කටුලු කිරීම්** ආදීන්ගෙන් හටගත්තාවූ ආබාධය තෙමේ තො අසාම දතගතයුතු බැවින්ද, උපක්‍රමයාගේ ප්‍රකට භාවයෙන්ද, **අපටිච්ඡන්න** දුක්ඛ නම්. ප්‍රකට දුක්ඛයයිද, කියනු ලැබේ.

6. දුක්ඛදුක්ඛය හැර අවශෙෂවූ **දුක්ඛසත්‍යවිභඞ්ගයෙහි** ආවාවූ ජාති ආදී සියල්ලද ඒ ඒ දුඃඛයට වස්තුභාවයෙන් **පර්යාය දුක්ඛ** නම්.

7. දුක්ඛදුක්ඛය **නිෂ්පර්යාය**දුක්ඛ නම්. ඒ දුක්ඛයන් අතරෙහි **පර්යාය** දුක්ඛය **නිෂ්පර්යාය** දුක්ඛය යන මේ පද දෙකෙහි සිට **දුඃඛආර්‍ය්‍යසත්‍යය** කිය යුතුයි.

### ජාතිදුක්ඛය.

මේ ජාතිය (ඉපදීම) වනාහි තොමෝ ම දුක් නොවන්නීය. දුක් ඉපදීමට වස්තුභාවයෙන් දුක්යයි වදාරණලදී. කවර නම් දුක කට මේ ජාතිතොමෝ වස්තුවේද? යම් ඒ **බාලපණ්ඩිත** සූත්‍රා දීන්හි භාග්‍යවතුන් වහන්සේ විසින් ද උපමාවශයෙන් ප්‍රකාශිත **ආපායික** දුඃඛයක් වේද, සුගතියෙහිද මිනිස්ලොව **ගර්භාවක්‍රාන්ති මූලකාදී** යම් දුකක් උපදී ද, ඒ සියල්ලටම මේ ජාති තොමෝ වස්තුවන්නීය.

එහි මේ **ගර්භාවක්‍රාන්ති මූලකාදී** භෙද ඇති දුඃඛය වන්නේය.

1. මේ සත්ව තෙමේ වනාහි මව්කුස පිළිසිඳ ගන්නේ උත් පල-පදම-පුණ්ඩරීකාදියෙහි නූපදියි; තවද වනාහි ආමාසයට යට පක්වාශයට උඩින් උදරපටල පිටයි කණ්ටක දෙදෙනාගේ අතරෙහි පරම සම්බාධවූ තීව්‍රාන්ධකාරයෙහි නානාකුණප ගන්ධ පරි භාවිතවූ අසූචියෙන් පරම දුගඳ පවන් හැසිරෙන්නාවූ අධිමාත්‍ර ජුගුප්සා ඇති කුක්ෂි ප්‍රදෙශයෙහි කුණුමස් කුණුකොමුපිඩු ගෝරෑ වල් ආදී තැන්වල කෘමියෙක් (පණුවෙක්) මෙන් උපදියි; ඒ සත්ව තෙම එහි උපන්නේ දස මසක් මව්කුස හටගත් උෂ්මයෙන් පුටපාකයක් මෙන් පැසෙන්නේ පිටිපිඩක් සේ සේදෙන්නේ හැකි ළිම් දිගහැරීම් රහිතව අධිමාත්‍ර දුඃඛයක් ප්‍රත්‍යනුභව කෙරේ යන මේ තාක් **ගර්භාවක්‍රාන්තිමූලකදුක්ඛය** වේ.

2. යම් හෙයකින් වනාහි ඒ සත්වතෙමේ මවගේ වහා පැකි ළීම්, යාම්, හිඳීම්, නැගිටීම්, පෙරළීම් ආදියෙහි සුරාධූර්තයන් අතට පත් එළුවෙක් මෙන්ද, අහිගුණ්ඩික අතටපත් නයි පැටි යෙක් මෙන්ද, එහා මෙහා ඇදීම් උඩයට අවට ගසාදැමීම් ආදී උපක්‍රම වලින් අදිමත් (අධිමාත්‍ර) දුක්විඳියිද;

මෑනියෝ සිහිල්පැන් බොන කාලයෙහි **සීතනරකයෙහි** උපන්නෙක් මෙන්ද, උණු යාගු භක්තාදීන් අධ්‍යවහරණ කාලයෙහි ගිනි අඟුරු වැස්සෙන් තෙමෙන්නාක් මෙන්ද, ලුණු ඇඹුල් ආදිය අනුභවකරණ කල ඉරිගසා කාරම් වැක්කෙරීම් ආදී කම්කටුල්ලට.පැමිණියෙක් මෙන් ද යම් තියුණු දුකෙක් විඳියි ද මේ **"ගැබ් පරිහරණ මූලක දුක්ඛය"** වේ.

3. ඔහුගේ මෑනියන් මුසගහීවූ කලැ මිත්‍රාමාත්‍ය සුහෘදදීන් විසිනුත් නොදැකිය යුතු දුක්ඛොත්පත්තිස්ථානයෙහි (යොනියෙහි) සිඳීම් පැළීම් ආදියෙන් යම් දුකෙක් උපදීද මේ **ගැබ් විපත්මුල්** දුකයි.

4. වදනු ලබන මව් විසින් කර්මජවාතයන් කරණකොට ගෙණ පෙරළා නරක ප්‍රපාතයක් වැනි ඉතා භයානක යොනිමාර්ගයට ප්‍රතිපතනය වන්නේ පරමසම්බාධ ඇති යොනිමුඛයෙන් තලසිඟුලෙන් අදිනු ලබන මහඇතෙකුට මෙන්ද සගල (සඬසාට) පව්වෙන් (සුණු) විසුණු කරනු ලබන තිරිසතෙකුට මෙන්ද, යම් දුකෙක් වේද, මේ **විජායන මූලක දුක්ඛ** යයි.

5. උපන්නහුට වනාහි තරුණ වනයක් සදෘශ සුකුමාල ශරීරය අතට ගැණීම නැහැවීම ඇවත සළුයෙන් පිරිමැදීම ආදී කාලයෙහි හිඳිමුව මුවහත් ආයුධවලින් විදීම පැළීම සමාන යම් දුකෙක් උපදී ද මේ **මව්කුසින් බිහිවීම් මුල්කොට ඇති දුකයි.**

6. ඉන් මතු පැවැත්ම ඇතිකලැ තමා විසින් ම තමන්ට වධකරන්නහුටද, **අචෙලක ව්‍රතාදී** වශයෙන් ආතාපන පරිතාපන අනුයොග වතෙහි යෙදුනුහුට ද, ක්‍රොධ වශයෙන් නොකා ඉන්නහුටද උඩඑල්ලී මැරෙන්න හුටද යම් දුකෙක් වේ නම් මේ **ආත්මඋපක්‍රම මූලික දුක්ඛය** වේ.

7. යම් හෙයකින් අනුන්ගෙන් වධබන්ධනාදිය විඳින්නහුට දුක් උපදී ද මේ **පරොපක්‍රම මූලික දුක්ඛය** වේ.

මෙසේ මේ සියලුම දුකට මේ ජාතිය වස්තුවක් වේමය; එහෙයින් මෙය කියනලදී.

1. "ජායෙථ නො චෙ නරකෙසු සත්තො
තත්ථ'ග්ගිදාහාදික මප්පසය්හං,
ලභෙථ දුක්ඛං නු කුහිං පතිට්ඨං
ඉච්චා'හ දුක්ඛා'ති මුනීධ ජාති.

2. දුක්ඛං තිරච්ඡෙසු කසාපතොද
දණ්ඩාභිඝාතාදි භවං අනෙකං,
යං තං කථං තත්‍ථ භවෙය්‍ය ජාතිං
විනා තහිං ජාති තතො'පි දුක්ඛා.

3. පෙතෙසු දුක්ඛං පන ඛුප්පිපාසා
වාතා'තපාදිප්පභවං විචිත්තං,
යස්මා අජාතස්ස න තත්‍ථ අත්‍ථි
තස්මා'පි දුක්ඛං මුනි ජාතිමාහ.

4. තිබ්බන්ධකාරෙ ච අසය්හසීතෙ
ලොකන්තරෙ යං අසුරෙසු දුක්ඛං,
න තං භවෙ තත්‍ථ න චස්ස ජාති
යතො අයං ජාති තතො'පි දුක්ඛා.

5. යඤ්චා'පි ගූථනරකෙ විය මාතුගබ්භෙ
සත්තො වසං චිරමතො බහි නික්ඛමං ච,
පප්පොති දුක්ඛ'මතිඝොරමිදම්පි නත්‍ථි
ජාතිං විනා ඉතිපි ජාතිරයං හි දුක්ඛා.

6. කිං භාසිතෙන බහුනා නනු යං කුහිඤ්චි
අත්‍ථි'ධ කිඤ්චිද'පි දුක්ඛමිදං කදාචි,
නෙවත්‍ථි ජාති විරහෙ යදතො මහෙසී
දුක්ඛාති සබ්බපඨමං ඉමමාහ ජාතින්ති.

——:——

## 6. 6. දුතියජනන සූත්‍රප්‍රදීපයයි.

——:——

13. කිංසු ජනෙති පුරිසං-කිංසු තස්ස විධාවති,
කිංසු සංසාරමාපාදි-කිංසු තස්ස පරායණන්ති.

14. තණ්හා ජනෙති පුරිසං-චිත්තමස්ස විධාවති.
සත්තො සංසාරමාපාදි-කම්මං තස්ස පරායණන්ති.

---

**6 - 7 - ( 13 - 14. )**

i. **මාතෘකා :—**

**කර්මය සත්වයාට පරායණ බව.**

ii. **පිණ්ඩාර්ථය:—** iii. **භාවය:—** iv. **අනුවාදය:—**අවිශෙෂයි.

v. **ප්‍රකටීකරණාර්ථ:-**

**පරායණං**=නිෂ්පත්තිය, අවශ්‍යය (ප්‍රතිෂ්ඨාවයි). **කම්මපරායණත්වය:-**

**සූත්‍රාන්ත** පරියායෙන් **එකොළොස්** කර්මකෙනෙක් බෙදන ලද්දාහු වෙත්; එනම්:—

| | | |
|---|---|---|
| 1. | දිට්ඨධම්ම වෙදනීය | කර්මය |
| 2. | උපපජ්ජ වෙදනීය | ,, |
| 3. | අපරාපරිය වෙදනීය | ,, |
| 4. | යග්ගරුක | ,, |
| 5. | යබ්බහුල | ,, |
| 6. | යදාසන්න | ,, |
| 7. | කටත්තාවාපන | ,, |
| 8. | ජනක | ,, |
| 9. | උපත්ථම්භක | ,, |
| 10. | උපපීලක | ,, |
| 11. | උපඝාතක (උපච්ඡේදක) කර්මය කියායි. | |

1. මේ එකොළොස් කර්ම අතුරෙහි එකජවන වීථියෙහි වූ **ජවන් සිත්සත** ඇතුලත කුසල් හෝ අකුසල් හෝ පළමු ජවන චේතනාව **දිට්ඨධම්ම වෙදනීය කර්මය** නම් වේ; එය මේ ආත්ම **භාවයේදී** ම විපාක දෙයි.

**කාකවලිය-පූර්ණක** සිටුවරුන්ට මෙන් කුශල විපාක දෙයි; **නන්ද යක්ෂ**, **නන්ද** මානවක, **නන්ද ගොඝාතක**, **කොකාලිය**, **සුප්පබුද්ධ**, **දෙවදත්ත**, **කිඤ්චමානවිකා** ආදීන්ට මෙන් අකුශල විපාක දෙයි.

එසේ විපාක දෙන්ට නොහැකිවන්නේ නම් **අහෝසිකර්ම** නම් වේ; අවිපාකයට පැමිණේ; එහි මුවවැදිඋපමාව සාධක කටයුතුයි.

යම් සේ මුවවැද්දාවිසින් මෘගයෙක් දැක දුන්න ඇද විදි සැරය නොවැරදුනේ නම් ඒ මෘගයා එහිම හෙලයි; ඉන්පසු මුව වැදි ඒ මුවා හමගසා දමා කඩකඩ කොට කපා මස් රැගෙන අඹු දරුවන් තොස්වමින් යයි. යම්හෙයකින් වැරදුනේ නම් මුවා පලාගොස් නැවත ඒ දිහාවත් නොබලයි; මෙසේ මේ සම්ප්‍රදාය දතයුතුයි. ඊතලය නොවැරදී ගොස් මුවාට වැදීම මෙන් ම '**දිට්ඨ ධම්ම වේදනීය**' කර්මයට විපාකවාර ප්‍රතිලාභය වේ. විදීම වැරදීම මෙන් අවිපාකභාව සම්පාදනයයි.

2. **අත්ථසාධිකා සප්තම ජවන චේතනා** තොමෝ වනාහි **උපපජ්ජවේදනීය කර්ම** නම් වේ; ඒ උපපද්‍ය වේද්‍යකර්ම අනන්තර (ඊලඟ) ආත්මභාවයෙහි විපාක දෙයි; ඒ උපපද්‍යවේද්‍ය විපාකදීම **කුශලපක්ෂයෙහි අෂ්ටසමාපත්තිවිපාක** වශයෙන්ද **අකුශල පක්ෂයෙහි පඤ්චානන්තරියකර්මවිපාක** වශයෙන්ද වෙදිතව්‍යයි; එයින් **අෂ්ටසමාපත්තිලාභී** තෙමේ එක සමාපත්ති කර්මයකින් බඹලොව උපදියි; **ආනන්තර්යකර්ම පසම** කෙළේ එකම කර්මය කින් නිරයෙහි උපදියි; ඉතුරු සමාපත්තීහුද **ආනන්තරිය** කර්ම යෝද **අහෝසි කර්ම** බවට ම පැමිණෙත්; විපාක නොදෙන්නෝ වෙත්; මේ අදහසද පළමු කී මුව වැදි උපමාවෙන්ම පෙන්විය යුතුයි.

3. **දිට්ඨධම්මවේදනීය**වූ ප්‍රථම ජවන චේතනාවටත්-**උප පජ්ජවේදනීය**වූ සප්තම ජවන චේතනාවටත් අතරෙහිවූ ජවන චේතනා පස වනාහි **අපරපරියාය වේදනීය** කර්ම නම් වෙත්; ඒ අපරපරියාය වේදනීය කර්මය වනාහි අනාගතයෙහි යම් කලක අවකාශ ලබයි නම් එකල්හි විපාක දෙයි. **සංසාරප්‍රවෘත්තිය** ඇති තාක් අහෝසි කර්ම නම් නොවේ; එය බලු දඩයක්කාරයෙකුගේ උපමාවකින් පෙන්විය යුතුයි.

යම් සේ බලුවැද්දා විසින් මෘගයෙක් දැක බල්ලෙක් හරින ලද්දේ මෘගයා ලුහුබැඳ ගොස් යම් තැනකදී ලබයි නම් එතනදීම ඩැහගණියි; එපරිද්දෙන් ම මේ **අපරාපරියාය වේද්‍යකර්මයද** යම් තැනක ඉඩ ලැබී නම් එතනම විපාක දෙයි; එයින් මිදුනු සතෙක් නම් නැත.

4. කුශලාකුශලයන් අතරෙහි වනාහි **ගරුක අගරුක** දෙකෙන් යමක් ගරුක නම් ඊට **යග්ගරුක නාමය** වේ; ඒ මෙය කුශලපක්ෂයෙහි මහග්ගත කර්මයයි; අකුශල පක්ෂයෙහි පඤ්චා නන්තරිය කර්මයයි වෙදිතව්‍යයි; ඒ යග්ගරුක කර්මය ඇති කල්හි සෙසු කුසල් හෝ අකුසල් විපාක දෙන්නට නොහැකි වෙත්; ඒ

මෙබඳු වූ **කුසල යග්ගරුකය, අකුසල යග්ගරුකය,** යන දෙකුම ප්‍රතිසන්ධිවිපාක දෙත්; යම්සේ මෑ ඇටයක් පමණවත් ගල් කැටය හෝ යගුළිය හෝ දියරෙදයක දැමූවා දිය පිට පීනවන්නට නොහැකි වේද, යටට ම බසීද, එසේම කුසලෙහිද අකුසලෙහිද යම් ගරුකයක් වේද එයම අරගන යයි.

5. කුසල් අකුසල් දෙකෙහි වනාහි යමක් බොහෝ නම් ඒ **යබ්බහුල** කර්මය වේ; ඒ යබ්බහුල කර්මය දීර්ඝකාලයක් ලැබූ ආසේවන වශයෙන් දැනගත යුතුයි. යම් කෙනෙකින් බලවත් කුශල කර්මවිෂයෙහි සෞමනස්ස කරවූයේද, බලවත් අකුශල කර්මවිෂයෙහි සන්තාපකරවූයේද, එය **යබ්බහුල** නම් වේ.

ඒ මෙසේයි:-මල්ලව යොධයන් දෙදෙනෙක් යුද්ධ භූමියට බැසගත් කල්හි යමෙක් බලවත් නම් අනික් දුබලයා හෙළාදමා යයි; එපරිද්දෙන් ම ඉතර දුර්වල කර්මය යටකොට දමා ආසේවන වශයෙන් යබ්බහුල යමක් හෝ වේද, සන්තාපන වශයෙන් යමක් හෝ බලවත්ද, එය විපාක දෙයි; **දුටුගැමුණු අභය රජුගේ** කර්මය මෙනි.

ඒ දුට්ඨගාමිණී අභයරජු වනාහි **චූලඞ්ගණිය** යුද්ධයෙහි පැරදුනේ අස්වෙළඹ පිට නැගී පලාගියේය; ඔහුගේ **චූලූපට්ඨාක තිස්ස** නම් අමාත්‍යයා එකතුව ම පස්සෙන් විය.

ඒ දුටුගැමුණු රජ තෙමේ එක් අඩවියකට පිවිස ගෙන හිඳ ගත්තේ ජිඝච්ඡායෙන් බාධා වන කල "**භාතික තිස්සය!** අතිශයින් කෑමාසාව අප පෙළයි; කුමක් කරන්නෙමු"දැයි කීයේය.

"දෙවයන් වහන්ස! මවිසින් සළු අතර තබා එක් රන්තලි බතක් මේ වඩනලදැ"යි, "එසේ නම්, ගන්නැයි" ඒ ඇමතියාද රන්තලිය බැහැර (නීහරණ) කොට රජු පෙරටුව තැබී. රජ්ජුරුවෝ ඒ දැක "සතර කොටසක් කරව"යි කීහ.

"අපි තුන්දෙනෙකි, දෙවයන් වහන්ස! කුමකින් සිව් කොටසක් කරවනු ලැබේදැ"යි; "භාතික තිස්සය! **යම් කැනකපටන් ආත්මය සිහිකරම්ද, මගේ ආර්යයන්ට නොදී ආහාර පරිභොගයක් කළ විරූ නැත; ඒ මම අදත් නොදී නොබුදින්නෙමි"**යි කීහ; ඒ තිස්ස අමාත්‍ය තෙමේ ද රන්සරලුබත සිව්කොටස් කෙළේය.

රජතෙමේද "කාලඝෝෂා කරව"යි කීයේය; දෙවයිනි! 'අත් හැර දමූ අරණ්‍යයෙහි (හැඩි අරන්හි) ආර්යයන් කොහෙන් ලබන්නෙමු දැයි"; "මේ තොප බරනොවේ, ඉදින් මා සැදැහැ

ඇත්තේ නම් ඇගෙන් (ආයෂීයන්)ලබන්නෙමි; විස්සත්ත (නිර්භය) ව කෑගසන්නෙහි"යි කියේය. හේ "කාලොභනෙන (කල්‍යයි! වහන්ස)"යි තුන්විටක් හඬ පෑවේය.

ඉක්බිත්තෙන් බොධිමාතු මහාතිස්ස තෙරුන් වහන්සේ ඔහුගේ ඒ හඬ දිව්‍යසෝදයින් (දිව්‍යශ්‍රොත්‍රඥානයෙන්) අසා "කොහේ දෑ මේ හඬැ"යි අවජන්නෝ "අද දුටුගැමුණු අබාරජු සුද පැරද අඹවි වැද හිඳින්නේ එක් සරක (බදුන්) බතක් සතර කොටස් කරවා එකෙකුව් නුබුදින්නෙමි"යි කාලඝොෂාකරවි යයි දූන වඳුරු "අද මා විසින් රජුට සඞ්ග්‍රහ කරන්ට වටිය"යි මනො ගති (සෘඞ්)යෙන් අවුත් රජු පෙරටුව සිටිසේක.

රජ්ජුරුවෝ උන්වහන්සේ දූක ප්‍රසන්න සිත් ඇත්තෝ "බලන්න! භාතික තිස්සැ"යි කියා තෙරුන් වැඳ "වහන්ස! පාත්‍රය දෙන්නැයි" කිවෝය; තෙරනුවෝ පාත්‍රය පෑසේක; රජතෙමේ තම කොටසත් සමග තෙරුන්ගේ කොටස පාත්‍රයෙහි පාක්කුඹම් කොට; "භනෙත! ආහාරපරිස්සයො නාම මා කදාචි හොතු!" කියා වැඳ පිළිගැන්විය; තිෂ්‍යාමාත්‍ය තෙමේද "මගේ ස්වාමිදරුවෝ බලා සිටියදී බුදින්නට නොහැක්කෙමි"යි තම කොටසද තෙරුන් ගේ පාත්‍රයෙහිම වැගිරවී. වෙලඹුත් සිතී. "මගේ කොටසත් තෙරුන්ටම දෙන්නට වටී"යයි; රජානෝ වෙලඹ බලා මෝත් තම කොටස තෙරුන්ගේ පාත්‍රයෙහිම ප්‍රක්ෂෙපකරනු පිළිසිතෝ (කැමති වන්නී) යයි දූන ඒ කොටසද එහිම බහා තෙරුන් වැඳ පිටත් කෙළේය. උන්වහන්සේද ඒ බත රැගෙන ගොස් ආදියේ පටන් බික්සඟනට අලෙව් (පිඩු කොටසින්) සැකෙවින් දුන්සේක.

රජ්ජුරුවෝත් සිතනුවෝ "ඇති යෙම්ම ජිගැසිතයම්භ; අයිරිත් බත්තුලු පැහිදුම් කළෙෝ නම් යහපතැ (සොඳ වතවතැ) යි"; තෙරනුවෝ රජු සිත් දූන අතිරේක භක්තය ඔවුන්ට යැපෙන මත් කොට ඉවා පාත්‍රය අහසට දූම්සේක; පාත්‍රය අවුත් රජු අත පිහිටියේය; බත තුන්දෙනාටම ඇතිතාක්විය; වැලිඳූ රජතෙමේ "පාත්‍රය සෝද තුවඡපාත්‍රය නොයවන්නෙමි"යි උතුරු සළුව මුදු දියගසාගෙන ඒ උත්තර සාටකය පාත්‍රයේ තබා "මේ පාත්‍රය ගොසින් මගේ ආයෂීයන් වහන්සේ අතැ පිහිටාවා"කියා අහසට දූමී. පාත්‍රය ගොස් තෙරුන් අත පිහිටියේය.

අපරභාගයෙහි තථාගත ශරීර ධාතූන්ගේ අටවෙනි භාගය පිහිටුවා එක්සිය විසිරියන් මහාචෛත්‍යය කරවන්නාවූ රජුගේ කාලක්‍රියාසමය මහසෑ නොනිමි කලැම අනුප්‍රාප්ත වූයේය.

ඉක්බිති මහාචෛත්‍යයාගේ දක්ෂිණපාර්ශ්වයෙහි තිපත්තාවූ ඒ රජුට පඤ්චතිකායවශයෙන් භික්ෂුසඞ්ඝයා සජ්ඣායනා කරද්දී සදෙව්ලොවින් රථ සයක් අවුත් ඉදිරිපිට අහසෙහි සිටියා හුය.

රජ්ජුරුවෝ "පින්පොත ගෙණ එව්!" යයි මුලපටන් එය කියවෙව්වේය. වැලිදු ඔහු කිසි කමක් නොපිරිතොස්සි (සන්තොෂ නොකෙළේය); ඒ රජ "නැවතත් කියව්"යයි කීයේ පුස්සකවාචක තෙමේද "දෙවයන් වහන්ස! ඔබ චූලඞ්ගණියෂ යුධයෙහි පැරද මහවන වැදහුන්තහු විසින් එක් මණ්ඩයක ලූ බතක් සතර කොටස් කරවා බොධිමාතුමහාතිස්ස ස්ථවිරයන් වහන්සේට භික්ෂාදනය භරණ ලදූ"යි කීයේය. රජ්ජුරුවෝ "නවත්ව"යි කියා භික්සඟ විචාළේය: "හිමිදරුවෙනි! කවර දෙව්ලොවක් රමණීද"යි, මහරජ "හැම බෝසතුන්ගේ වාසස්ථානවූ තුසිත භවනයයි", රජතෙමේ කාලක්‍රියාකොට තුසිත භවනයෙන් ආවාවූ රථයෙහි පිහිටා ගෙණ එම දෙව්ලොවට ගියේය. මේ බලවත් කර්මයක්හුගේ විපාකදන වස්තුවකි.

6. කුසල් අකුසල් දෙකින් ආසන්නමරණයෙහිදී යමක් වනාහි අනුස්සරණයට හැක්කේද ඒ යදාසන්න නම් වේ.

ඒ මේ කර්මය වනාහි යම් සේ ගොගණ පරිපූර්ණ ගාලක දෙර විවට කැලෑ දුරින් දඹුණුව බලගවයන් ඇතත් යම් එකෙක් වජ වාරයට (ගාල් දෙරකඩට) ආසන්නවේද, යටත් පිරිසෙයින් දුබල ජරගෙරියෙක් වුවත් ඒ ගවයාම ප්‍රථමයෙන් නික්මෙයි; එමෙන්ම අන් කුසල් අකුසල් ඇතත් මැරෙණ කලට ආසන්න බැවින් විපාක දෙයි,

**එහි මේ වස්තුව මෙසේ.**

මධුඅඞ්ගණ (මීයුගුණුගම)ග්‍රාමයෙහි වනාහි එක් දමිළ දෞවාරිකයෙක් පාන්දරම බිළියගෙන ගොස් මසුන් මරා තුන්කොට සක් කර එක්කොටසකින් සහල් ගණියි, එක්කොටසකින් දී ගණියි; එක්කොටසක් පිසයි; මේ ක්‍රමයෙන් පණස්වසක් ප්‍රාණාතිපාත කර්මකොට අපරභාගයෙහි මහලුවූයේ අනුටඨාන සෙය්‍යාවට උපගතවිය.

එකෙණෙහි ගිරිවෙහෙර (ගිරිහඬුවෙහෙර) වැසි චූලපිණ්ඩපාතිකතිස්ස තෙරුන්වහන්සේ "මේ සත්‍ා මා බලාසිටියදී නොනැසේවා"යි ගොස් ඔහු ගෙදරදෙර සිටියේය; ඉක්බිති ඔහුගේ

බිරින්ද "සාමිනි! තෙරනුවෝ ආවෝයි" ආරෙවනා ආලාය. "මම පණස්වසක් වනතුරුත් තෙරුන් සන්තිකයට නගත පුණිය; මගේ කවරනම් ගුණයකින් තෙරනුවෝ එන්නේ ද? "පල! වඩින්ඩ කියාපිය කියා"යි හෙතෙම කීයේ ඕහොමෝ ද "වහන්ස අරුණුයැ"යි කීවාය. එකල තෙරනුවෝ උපාසකයාගේ සිරුරු පවත් කෙසේදැයි ඇසූහ; (ඕතොමෝ) "දුබලය වහන්සැයි". "තෙරනුවෝ ගෙට ගොස් සිහි උපදවා සිල්ගන්නෙහිදැයි" ඇසූහ. "එහෙමයි, වහන්ස, දෙන්නැයි"; තෙරනුවෝ **තෙසරණ දී පන් සිල්** දෙන්ට ඇරබී; ඔහුට පන්සිල් යයි කියනකලැම දිව පිට ගිලිහිය; තෙරනුවෝ "වටින්නේ එතෙකැ"යි නික්මී ගියහ.

හෙතෙමේ ද කළුරියකොට **චාතුර්මහාරාජිකභවනයෙහි** උපන; උපන් කෙණෙහි ම "කිනම් කමක්කොට මා විසින් මේ ලද්දේදැයි" ආවජිනාකරන්නේ තෙරුන් නිසා ලද බැව් දැන දෙව්ලොවින් අවුත් තෙරුන් වැඳ සක්මනැ සිටියේය.

"ඔය කව්ද?" "වහන්ස! මම **දමිළදෞවාරිකයෙමි**"යි කියේය. "කොහේ උපන්නෙහිද?" "වහන්ස, චාතුර්මහාරාජිකයන් කෙරෙහිය, "ඉදින් මට ආයණියන්වහන්සේ පන්සිල් දුන් නම් මතු දෙව්ලොවැ උපන්නේ වන්නෙමියි"; "මම කුමක් කරන්නෙම්ද? තුඹ ගන්නට නොහැක්ක පුතැ" යි. හෙතෙම තෙරුන් වැඳ දෙව්ලොවටම ගියේය. **මේ නම් කුසල් කර්මවතකි.**

**අනතර** ගඬගාවෙහි වනාහි **මහාවාචකාල** නම් උපාසකයෙක් විය; හෙතෙම තිස්වසක් සෝවාන්මාගීය පිණිස **මත්තිංශදකාරය සජ්ඣායනා** කොට මම මෙසේ දෙතිස්ආකාර පිළිකුල්භාව නාව හදුරන්නේ ඔභාස මාත්‍රයකුදු නිපදවන්නට නොහැක්කේ විය.

බුඩසාසනය **අනීයානික** වන්නේයයි දිට්ඨිවිපල්ලාසයට පැමිණ කාලක්‍රියාකොට ගොස් **මහාගඞ්ගාවෙහි** නවඉස්බක **කිඹුල්ප්‍රෙතයෙක්ව** උපන්නේය; එක් සමයක නවජකනීඨියෙන් (කසාතොට-දස්තොට?) පාෂාණසනමහශකටයන් හැටක් ගියා හුය; ඒ **සුංසුමාර ප්‍රෙත**තෙමේ ඒ සියලු ගොණුන් ද පහන් ද කෑයේය. මේ අකුසල **සදෘසනාන** කර්මයෙහි වසතුවකි.

7. මේ කියනලද **යගරුක සබහුල සදෘසනාන** තුනෙන් මුක්තවූ **අඥන** වශයෙන් කරණලද්ද **කටත්තාවාපන කර්මය** නම් වේ.

ඒ මෙසේයි:—

. • උමතුවෙකු විසින් විසිකළ කඩක් (හියක්) යම් කොතැනක හෝ යයි; එමෙන්ම ඒ යගගරුකාදීන්ගේ අභාවයෙහි යම්කිසි තැනක විපාකදෙයි.

8. **ජනකකම්ය** වනාහි එක් ප්‍රතිසන්ධියක් උපදවා ප්‍රවෘත්ති යක් නුපදවයි; පැවැත්මෙහිදී අතික් කම්යක් විපාක උපදවයි; යම්සේ වනාහි මෑනියෝ උපදවනු පමණෙක් ද කිරිමවු පොෂණය කරයිද; එපරිද්දෙන් මව්මෙන් **ප්‍රතිසන්ධිනිවිත්ක ජනකකම්ය** වේ; කිරිමව් මෙන් ප්‍රවෘත්තියෙහි සම්ප්‍රාප්තකම්ය වේ.

9. **උපස්ථම්භකකම්ය** නම් කුසලයෙහි ද ලැබෙයි; අකු සලයෙහිද ලැබෙයි. එක්තරා එකෙක් වනාහි කුසලකම්යක් කොට සුගතිභවයෙහි උපදියි; එහි සිටියේ පුනපුනා කුසල් කොට ඒ උපන් කම්ය උපස්ථම්භනය කිරීමෙන් අනේකවර්ශත සහස්‍රයක් සුගතිභවයෙහිම හැසිරෙයි; එක්තරා එකෙක් අකුසල යක්කොට දුගතිභවයෙහි උපදියි; හෙතෙම එහි සිටියේ නැවත නැවත අකුසල්කොට ඒ කම්ය උපස්ථම්භනය කිරීමෙන් බොහෝ වර්ශතසහස්‍රයක් දුගතිභවයෙහිම හැසිරෙයි.

**අන්‍ය ක්‍රමයක් 8 – 9.**

ජනකය නම් කුසලත් වෙයි, අකුසලත් වෙයි; එය පිළිසිඳ ගැන්මෙහි ද පැවැත්මෙහි ද රූපාරූපවිපාකස්කන්ධ දනවයි.

උපස්ථම්භකය වනාහි විපාක උපදවන්නට නොහැකි වෙයි; අතික් කම්යකින් දුන්නාවූ ප්‍රතිසන්ධිය විසින් විපාක ඉපදවූ කල්හි උපදනා සුව දුක් උවටැම් කෙරෙයි, බෝකල් පවත්වයි.

10. **උපපීලකකම්ය** නම් අන්‍යකම්යකින් දුන්නාවූ ප්‍රති සන්ධිය විසින් උපදවන ලද විපාකයන් ඇතිකල්හි උපදින සුව දුක් පෙළයි, බාධාකරයි, අදත් පැවැත්මට ඉඩනොදෙයි; එහි මෙ න්‍යායයෙව්; **කුශලකම්ය** විපාක දෙන කල අකුශලකම්ය **උපපීලකව** ඒ කුසලවිපාකය පලදෙන්ට ඉඩ නොදෙයි.

අකුශලකම්ය විපාක දෙනකල කුශලකම්ය උපපීලක වී ඒ ඒ අකුශලකම්ය පලදෙන්ට ඉඩ නොදෙයි.

යම්සේ වැඩෙමින් පවතින්නාවූ වෘක්ෂයක් හෝ ගසක් හෝ වැලක් හෝ යම් කිසිවෙක් දණ්ඩකින් හෝ ශස්ත්‍රයකින් හෝ

බිඳින්නේනම් සිඳින්නේනම් එකල්හි ඒ වෘක්‍ෂය හෝ ගස හෝ වැල හෝ වැඩෙන්නට නොහැකි වන්නේද; එපරිද්දෙන්ම කුශලකර්‍මය විපාකදෙමින් පවත්නා කල අකුශලකර්‍මය විසින් උපපීඩිතව විපාකදෙන්නට නොහැකි වෙයි.

අකුසලකර්‍මය හෝ විපාකදෙමින් පවත්නා කල කුසලය විසින් උපපීඩිතව විපාක දෙන්නට නොහැකිවෙයි. එහි සුනඛඝාතකයාගේ අකුසලකර්‍මය තෙමේ කුශලකර්‍මය උපපීඩන කෙළේය. චෞරඝාතකයාගේ කුශලකර්‍මයතෙමේ අකුශලකර්‍මයට බාධා කෙළේය.

## සොරුන් මැරුවහු (චෞරඝාතක) ගේ පින්කම් තෙමේ පව්කම්පලය වැලැක්වීම.

රජගහනුවර වනාහි චාවකාලක නමැත්තේ පණස්වසක් සොරුන් මැරීම්කර්‍මය කෙළේය. ඉක්බිති අමාත්‍යයෝ රජුට කීවාහුය "දෙවයිනි! චාවකාලකයා මහළුය, සොරුන්මරන්ට නොහැක්කේයයි"; "එසේ නම් ඔහු ඒ තනතුරෙන් අහක්කරවිය යි" ඇමතියෝද ඌ පහකොට අනිකෙක් ඒ තනතුරෙහි තැබූහ; චාවකාලකයා යම්තාක් ඒ කර්‍මය කෙළේ ද ඒතාක් අලුත් වස්ත්‍ර අඳින්ටවත් සුවඳ මල් පළඳින්ට වත් කිරිබත් කන්ටවත් පිසදූම්මිනැවීම් පිරිමැදීම් පිළිවෙළින් අනුභවකරන්ටවත් නොලත්තේය.

හෙතෙම "දීඝීරාත්‍රයක් මුළුල්លෙහි (බොහෝකලක්) කලිෂට වෙශයෙන් හැසිරීමැයි, මට පායාසයක් පිසව"යි බිරිඳට අණවා නාන උපකරණ ගෙන්වා ගෙන නානතොටට ගොස් පැන් සනහා කරළු (අළුත්වස්ත්‍ර) හැඳගෙන සුවඳවිලවුන් ගන්වා මල් පැළඳ ගෘහයට එන අතර ශාරීපුත්‍රස්ථවිරයන්වහන්සේ දැක "සංකලිෂ්ටකර්‍මයෙන් ද අපගතවූයෙමි; ආයුෂ්යන්වහන්සේ ද මවිසින් දක්නාලද්දේ" යයි තුටු මනසැත්තේ තෙරුන් ගෙදරට වැඩමවා අලුත් ගිතෙල් හකුරු සීනිවලින් සම්පාදනයකරණලද පායාසයෙන් වැළඳවීය; තෙරුන්වහන්සේ ඔහුට අනුමෝදනා කෙළේය. හෙතෙම අනුමෝදනා අසා අනුලෝම්ක්‍ෂාන්තියක් (මද අස්වැසිල්ලක් ) ලබා තෙරුන් අනුගමන්කොට නැවතෙමින් සිටියේ අතරමග තරුණ වහුදෙනෙක් විසින් ඇණ මැඩ ජීවිතක්‍ෂයට පත්කරණලද්දේ මැරීගොස් තව්තිසා භවනයෙහි උපන්නේය; භික්‍ෂූන්වහන්සේලා තථාගතයන්වහන්සේ අතින් විචාළාහුය: "ස්වාමිනි! චෞරඝාතක අදම කිලුටුකමෙන් ඉවත්කරණ ලදුයේ අදම කළුරිය කෙළේය,

කොහේ උපන්නේදැයි"; "මහණෙනි! තව්තිසාභවනයෙහියයි;' ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! චොරඝාතකතෙමේ දීර්ඝකාලයක් මුළුල්ලෙහි මනුෂ්‍යඝාතනය කෙළේය; ඔබවහන්සේ ද මෙසේ වදාරන්නහුය; කිම! පව්කමට පලනැත්තේදැ" යි; "මහණෙනි! එසේ නොකියව්, බලවත් කල්‍යාණමිත්‍ර උපනිශ්‍රයක් ලැබී **ධම්ම සෙනාපතිට** පිණ්ඩපාතයක් දී අනුමෙවෙති බණ අසා අනුලොම ඛන්තිප්‍රතිලාභයෙන් හෙතෙම එහි උපන්නේය"යි.
කියනලද මැයි.

"සුභාසිතං සුණිත්වාන-නාගරියො චොරඝාතකො,
අනුලොමඛන්තිං ලද්ධාන-මොදතී තිදිවං ගතො"යි.

11, **උපඝාතක**කර්මය වනාහි තෙමේ කුසල් ද අකුසල්ද වූයේ අන්‍ය දුර්වල කර්ම ඝාතනය කොට ඒ කර්මහුගේ විපාක වළක්වා තමාගේ විපාකපලයට අවකාශකරයි; මෙසේ වනාහි කර්මය විසින් අවකාශකළ කල්හි ඒ උපඝාතක කර්මවිපාකය උපන්නේ නමැයි කියනු ලැබේ; **උපච්ඡේදක** යනුද මීටම නමකි.

**මේ එහිනය වේ.**

කුසල්කර්මහුගේ විපාකදෙනකල එක් **අකුසලකර්මයක්** තෙමේ මතුවී සිට ඒ කුසල්කම සිඳදමා හෙලයි.

අකුසල කර්මයක්හුගේ විපක්වන (පැසවන) කාලයෙහි එක් කුසල්කර්මයක් මතුවී සිට ඒ අකුසලකර්මය සිඳදමා හෙලයි; මේ **උපච්ඡේදකකර්මය** නම්. එහිලා බැලිමෙහි **අජාසත් රජහුගේ** පාපකර්මය තෙමේ කුසල් සිඳ ලන්නේ විය; **අඞ්ගුලිමාල** තෙරුන්නාන්සේගේ පුණ්‍යකර්මයතෙමේ අකුශල් සිඳලන්නේ විය.

මෙසේ **සුත්තන්තික** පරියායයෙන් **එකොළොස්කර්ම** කොතෙක් විභාගකරණලද්දාහු වෙත්.

අභිධර්මක්‍රමයෙන් **සොළොස්කර්ම කොතෙක්** විභක්තියට නැගෙත්.

ඒ කවරේදයත්:- **අකුශලපක්‍ෂය** 8 කි.

1. i අත්ථෙකච්චානි පාපකානි කම්මසමාදානානි **ගතිසම්පත්ති** පටිබාළ්හානි න විපච්චන්ති.

2. ii අත්ථෙකච්චානි පාපකානි කම්මසමාදානානි **උපධිසම්පත්ති** පටිබාළ්හානි න විපච්චන්ති.

3. iii අත්ථෙකච්චානි පාපකානි කම්මසමාදානානි **කාලසම්පත්ති** පටිබාළ්හානි න විපච්චන්ති.

4. iv අනේකචච්චානි පාපකානි කම්මසමාදානානි පයෝග සම්පත්ති පතිබාළ්හානි න විපච්චන්ති.

5. v අනේකචච්චානි පාපකානි කම්මසමාදානානි ගතිවිපත්තිං ආගම්ම විපච්චන්ති.

6. vi අනේකචච්චානි පාපකානි කම්මසමාදානානි උපධි විපත්තිං ආගම්ම විපච්චන්ති.

7. vii අනේකචච්චානි පාපකානි කම්මසමාදානානි කාල විපත්තිං ආගම්ම විපච්චන්ති.

8. viii අනේකචච්චානි පාපකානි කම්මසමාදානානි පයෝග විපත්තිං ආගම්ම විපච්චන්ති.

කුසලපක්ඛය. 8.

9. i අනේකචච්චානි කල්‍යාණානි කම්මසමාදානානි ගතිවිපත්ති පතිබාළ්හානි න විපච්චන්ති.

10. ii අනේකචච්චානි කල්‍යාණානි කම්මසමාදානානි උපධි විපත්ති පතිබාළ්හානි න විපච්චන්ති.

11. iii අනේකචච්චානි කල්‍යාණානි කම්මසමාදානානි කාල විපත්ති පතිබාළ්හානි න විපච්චන්ති.

12. iv අනේකචච්චානි කල්‍යාණානි කම්මසමාදානානි පයෝග විපත්ති පතිබාළ්හානි න විපච්චන්ති.

13. v අනේකචච්චානි කල්‍යාණානි කම්මසමාදානානි ගති සම්පත්තිං ආගම්ම විපච්චන්ති.

14. vi අනේකචච්චානි කල්‍යාණානි කම්මසමාදානානි උපධි සම්පත්තිං ආගම්ම විපච්චන්ති.

15. vii අනේකචච්චානි කල්‍යාණානි කම්මසමාදානානි කාල සම්පත්තිං ආගම්ම විපච්චන්ති.

16. viii අනේකචච්චානි කල්‍යාණානි කම්මසමාදානානි පයෝග සම්පත්තිං ආගම්ම විපච්චන්ති.

—:—

## 6. 7. කම්මපරායණ(තතිය ජනන)සූත්‍රප්‍රදීපයයි.

—:—

**15. කිංසු උප්පථො අක්ඛාතො-කිංසු රත්තින්දිවක්ඛයො,**
**කිං මලං බ්‍රහ්මචරියස්ස-කිං සිනානමනොදකන්ති?**

**16. රාගො උප්පථො අක්ඛාතො-වයො රත්තින්දිවක්ඛයො,**
**ඉත්ථී මලං බ්‍රහ්මචරියස්ස-එත්ථායං සජ්ජතෙ පජා;**
**තපො ච බ්‍රහ්මචරියං ච-තං සිනානමනොදකන්ති.**

---

**6 - ෂ - ( 15 - 16 )**

i. **මාතෘකා:-**

**සුගති නිවන් දෙසට නොමග; රෑ-දවල් ක්ෂය කරන්නා; බඹසර මල; පැන් නැතිව නෑම.**

ii. **පිණ්ඩාර්ථය:-**

සුගතිගමනටත්-නිවන්යන්නටත් රාගය උපපථ(විරූදුමග)යි; රැයින් දවාලින් වයස් ගෙවෙයි; රෑ දවල් දෙකේම වයස් ගිනවේ; **මාගම් මල බඹසර කෙලසයි, (සත්‍ව කෙරෙහි ප්‍රජාව ඇලෙයි);** තපසත් බඹසරත් නොදිය නෑමයි.

iii. **භාවය:-**

15. කුමක් උන්මාර්ගයයි කියන ලද ද? කුමක් රාත්‍රිදිනක්ෂය කෙරේ ද? බ්‍රහ්මචරියට කිලුට කුමක්ද? නිරුදකස්නානය කුමක්ද?

16. රාගයතෙම සුගතියට හා නිවණටත් යන්නහුට උන්මාර්ග (උමං) යයි කියන ලද්දේය; වයස රෑදවල් ක්ෂය කෙරේ, ස්ත්‍රී තොමෝ බඹසරට කිලුටයි, මේ ස්ත්‍රීසංඛ්‍යාත මලය කෙරෙහි මේ ප්‍රජාතොමෝ ඇලේ, (ඇඳේ); කෙලෙස් තවන තපසද මෛථුන විරති බඹසර ද යන මේ නිරුදක ස්නානය වේ.

iv. **අනුවාදය:-**

රජ්ජන වසයෙන් පැවති රාගය අල්පසාවජ්ජයි; ලෝකවජ්ජ විසින්ද විපාකවජ්ජ විසින්දැයි දෙවිදියේ වරදින්ම අල්පසාවද්‍ය වේ, (අල්පදෝස වේ); ඒ කෙසේද? මව් පියාදීහු ද බෑ බුහුනි ආදීහු ද දරුවන්ට ද සොහොයුරන්ට ද ආවාහ-විවාහ මඞ්ගල නම්වූ පාවා ගැනීම්-සරණ පාවාදීම් කරති; මෙසේ මේ ලෝකාවද්‍ය වශයෙන් ප්‍රවෘත්තවූ රාගයතෙම **අල්පසාවද්‍ය** වේ. සදරසනෙනාස මූලික රාගයෙන් වනාහි අපායෙහි ප්‍රතිසන්ධියක් නම් නොවේයයි මෙසේ විපාකවජ්ජ වසයෙන් **අල්පසාවද්‍ය** වේ.

මේ රාගය තෙම **දන්ධවිරාගී ද** වේ; විරජ්ජමාන (නො ඇලෙන) මේ වනාහි හෙම්හිට නො ඇලෙයි; ශීඝ්‍රව නොම්දෙයි; තෙල් දැලි රැඳීමක් සේ චිරකාලයක් අනුබන්ධනය කෙරේ. දෙතුන් භවාන්තරයකට ගොසිනුත් අපගමනය නොකෙරේනුයි දන්ධවිරාගී නම් වේ.

එහි මේ කථාවස්තුවකි.

එක්තරා පුරුෂයෙක් වනාහි සොහොයුරු බිරිඳ හා මිථ්‍යාචාර කරයි. ඒ ස්ත්‍රීටත් තම සැමියාට වඩා හෙතෙමේ ම ප්‍රියතර විය. ඈ ඌට කීවා **"මේ කරුණ ප්‍රකාශවූකල මහත් ගර්හාවන් නිස; නුඹේ ඝාතිකයා ඝාතනය කරවයි"**; හෙතෙම ඈට "නස්ස! වසලි!! මෙසේ තවත් නොකියයි" පන්නා හැරියේය. ඈ නිශබ්දව කිපදිනක් යවා නැවතත් කීවාය; ඔහුගේ සිත දුදුරුබවට ගියේය. ඉන් තුන්වෙනිවර කිකල "කුමක් කොට ඉඩක් ලබන්නෙම්" දැයි ඇසුයේය.

ඉක්බිති ඔහට ඈ උපායක් කියන්නී "තෝ මා කීවක්ම කරව, අසුවල් තැන මහකුඹුක ලඟ තොටක් ඇත, සියුම් මූවහත් දඬු වැය ගෙණ එහි සිටුව"යි. හෙතෙමේ එසේ කෙළේය. ඔහුගේ දෙටු බෑයා වනාහි අරණ්‍යයෙහි කර්මාන්ත කොට ගෘහයට ආයේය. ඈ ඔහු කෙරේ මෘදු සිතැත්තියක් මෙන් වී "එන්ඩ ස්වාමිනි! නුඹගේ හිස බලන්නෙම්"යි බලන්නී නුඹේ හිස උපක්කිලිට්ඨයයි. (හොඳ ටම කිලුටැයි) ඇඹුල් පිඩක් දී "යන්ඩ, අසවල් තැනින් හිස සෝදා ගෙණ එනු මැනවැ"යි පිටත් කළාය.

හෙතෙමේ ද ඈ විසින් කී තොටට ම ගොස් ආමලකී (නෙල්ලි) කල්කයෙන් ශිර්ෂම්‍රක්‍ෂණ කොට (ගල්වා) දියට බැසගෙණ අවනම්‍රව හිස සේදීය. එවිට අනිකා රුක අතරෙන් නික්ම කදැට පහරා (ගෙලැට ගසා) සොහොයුරා දිවියෙන් තොරකොට ගෙට ගියේය.

ඒ මළ අනිකා භාර්‍යාසෙනහ පරිත්‍යක්තයට නොහැකි වන්නේ ඒ ගෙදරම **ගැරඬියෙක් ව** උපන්නේය.

ඒ ගැරඬියා ද ඈ සිටියත් හිඳියත් ගොසින් සිරුර වැටෙයි. ඉන්පසු ඈ මේ ඌ ම වන්නේයයි ඌ මැරෙව්වාය; ඒ සතා ඈ පිළිබඳ සෙනේහයින් ඒ ගෙදර ම **කුක්කෙක්ව** උපන්නේය; ඒ **කුක්කුර තෙමේ** පයින් යන කල් පටන් ඈ පසු පස්සේ ඇවිදියි. මහවනයට යතත් එක්කම යයි. ඒ දැක මිනිස්සු පිටවුනා "බලු වැද්දා, කොතනට යන්නේ"දැයි උපපණ්ඩනය (කවටකම) කරත්; ඈ නැවතත් ඌ මැරෙව්වාය. හෙතෙමේත් නැවතද ඒ ගෙද රම **වස්සෙක්ව** උපන්නේය. එසේම ඈ පසුපස්සේ හැසිරෙයි. එදා ද මිනිස්සු ඒ දැක "**ගොපල්ලා** නික්මුනේය, දෙන්නු කොතන යද්දැ"යි හෙළාදකිත්. ඈ එතනදීත් ඌ ගහදැම්මෙව්වාය. ඒ වාරයේදී ත් හෙතෙමේ ඈ මත්තෙහිවූ සෙනේ සිඳ දමන්ට නොහැකි වන්නේ සතරවෙනි වාරයෙහි ද ඈගේම කුසයෙහි **ජාතිස්සරයෙක්ව** උපන්නේය.

හෙතෙමේ පටිපාටියෙන් ආතමභාව සතරකදී ඈ විසින් මැරූ බැව් දැන "මෑ වැනි හැතිරියෙකුගේ කුසෙහි උපන්නෙමි"යි එතැන් පටන් ඈගේ අතෙන්වත් තමා පහස්නට නොදෙයි; ඉදින් ඈ ඔහු පහසී නම් අඬයි, වැලපෙයි; එහෙයින් ඔහු අය්‍ය කා (මුත්තනී)ම පිළිදුගී; මෑත භාගයෙහි වැඩිවියට පැමිණි ඔහුට "දරුව! කිම! නුඹ මව් අතින් තමා පහස්නට නොදෙහිද? යම් හෙයකින් මව් තා පහසී නම් මහ හඬින් හඬහි. කැගසහි-කිමැයි" කියා මුත්තා විසින් පිළිවිසියේ "ඈ මගේ මව් නොවේ. ඈ හැතිරී"යයි එ පුවත් සියල්ල ආරෙවන කෙළේය.

ඒ මුත්තනුවෝ ඔහු ආලිඞගන කොට අඩා "එව! දරුව! කිම අපට මෙබඳු තැන වැසීමෙනැ"යි ඔහු කැටුව නික්මී එක් වෙහෙර කට ගොස් පැවිදි ගෙන දෙදෙනම එහි වසන්නෝ රහත් බවට පැමිණියාහුය.

v. ප්‍රකරණනිරුත්ති:—

රාගො උපපපතො=සුගතියට ද නිර්වාණයට ද යන්නහුට රාගයතෙම අමාගී වේ.

රතින්දිවක්ඛයො=වයස් තෙමේ රෑ දවල් ගතකරන්නේ වේ; (රාත්‍රි-දිත දෙකින් වයස් ක්‍ෂය වේ.)

ඉත්ථි මලං=සෙසු බාහිරමල භස්ම-ක්‍ෂාරාදියෙන් ධොවන කොට සුඹකරන්නට හැකි වේ; මාතුගාම මලයෙන් දූෂිතවූයේ වනාහි සුඹ කරන්නට නම් නොහැකියි; එහෙයින් "ස්ත්‍රීමලැ"යි කියන ලදී.

එත්ථ=මෙහි මේ ස්ත්‍රී කෙරෙහි ප්‍රජව ඈලෙයි.

තපො=ඉන්ද්‍රියසංවර ධුතගුණ විරිය දුෂ්කර කාරිකාවන්ට මේ නම් වේ; මෙහි දුෂ්කරකාරිකය හැර තබා සියලුම කෙලශසන්තා පිකා ප්‍රතිසඳ වටී.

බ්‍රහ්මචරියං=මෛථුන විරතියයි.

——:——

## 6. 8. උපපථ සූත්‍රප්‍රදීපයයි.

——:——

17. කිංසු දුතියා පුරිසස්ස හොති-කිංසු චෙනං පසාසති,
කිස්ස චාභිරතො මච්චො-සබ්බදුක්ඛා පමුච්චතීති?

18. සද්ධා දුතියා පුරිසස්ස හොති-පඤ්ඤා චෙනං පසාසති,
නිබ්බානාභිරතො මච්චො-සබ්බදුක්ඛා පමුච්චතීති.

---

6 - 9 - (17 - 18)

i. **මාතෘකා:—**

**නිවන්ලාමට ශ්‍රද්ධා ප්‍රඥා උපකාරීබව.**

ii. **පිණ්ඩාර්ථය:-**

දෙව්ලොව යතත්- නිවන් යතත් සැදැහැ දෙවැන්නිය; ප්‍රඥාව අනුශාසක වේ; නිර්වාණාභිරතියෙන් සියලු දුක් ගෙවේ.

iii. **භාවය:-**

17. කුමක් පුද්ගලයාට දෙවෙනිවේ ද? කුමක් මොහුට අනුශාසනා කරයි ද? කුමක ඇලුන මිනිස්තෙම සියලු දුකින් මිදේද?

18. ශ්‍රද්ධාව පුද්ගලයාට සහායකෘත්‍යකරන්නෙන් තමහට දෙවැනි වේ; ප්‍රඥාවතොමෝ මේ පුද්ගලයාට මේ කරව, මේ නොකරව යි අනුශාසනා කරයි. නිර්වාණයකෙරෙහි ඇලුනු මනුෂ්‍ය තෙම සකල වෘත්තදුඃඛයෙන් මිදෙයි.

iv. **අනුවාදය:-**

විශෙෂයෙන් මෙහි වනාහි ශ්‍රද්ධා ප්‍රඥා දෙදෙනාගේ ද, සමාධි වීර්‍ය්‍ය දෙදෙනාගේද සමබැව් පසසත්; බලවත් ශ්‍රද්ධා ඇත්තේ මන්දප්‍රාඥවූයේ මුඛපසන්නා වෙයි, අවස්තුවෙහි පහදියි.

බලවත් ප්‍රඥා ඇත්තේ මන්දශ්‍රද්ධාවත් වූයේ කෛරාටික පක්ෂය භජනය කරයි; බෙහෙතින් හටගත් රොගය මෙන් අචිකිච්ඡ වේ; චිත්තොත්පාද මාත්‍රයෙන්ම කුසල් වේ යයි අතිධාවන කොට දානාදිය නොකරන්නේ නිරයේ උපදියි.

ශ්‍රද්ධා-ප්‍රඥා දෙදෙනාගේ සමත්වයෙන් වස්තුවෙහිම (සුදුසු කරුණෙහිම) පහදියි; මන්දවීර්‍ය්‍යවත් බලවත් සමාධිය වනාහි කොසජ්ජය අභිභවනය කරයි; සමාධියතෙමේ කෞසීද්‍යපාක්ෂිකත්වයෙනි.

මන්දසමාධිමත් බලවත් වීර්‍ය්‍යය ඖද්ධත්‍යාභිභවනය කෙරේ, වීර්‍ය්‍යය තමා ඖද්ධත්‍ය පාක්ෂික බැවිනි.

සමාධිය වනාහි වීර්‍ය්‍යයෙන් සංයොජිතවූයේ කෞසීද්‍යයෙහි පතනය වන්ට නොලබයි; වීර්‍ය්‍යය සමාධියෙන් සංයොජිතවූයේ ඖද්ධත්‍යයෙහි පතිත වන්ට නොලබයි; එහෙයින් ඒ දෙක සම කටයුතුයි; උභයසමතාවයෙන් ම අප්පණා වෙයි.

තවද **සමාධිකම්මිකයාට** බලවතී ශ්‍රද්ධා වටනේය; එසේ අදහන්නේ අවකපන්නේ අර්පණාවට පැමිණෙන්නේය.

සමාධි-ප්‍රඥා දෙදෙනා අතුරෙහි වනාහි සමාධිකර්මයෙහි යෙදුනහුට බලවතී එකාග්‍රතාවය වටින්නේය; එසේ ඇතිකල්හි හෙතෙම අර්පණාප්‍රාප්ත වෙයි; **විපස්සනාකම්මිකයාට** බලවත් ප්‍රඥාව වටියි; එසේ ඇතිකල්හි හෙතෙම ලක්ෂණප්‍රතිවෙධයට පැමිණෙයි; දෙදෙනාගේ සම බැවින් ද අර්පිතා වේමය; සිහිය වනාහි හැම තැනම බලවතී වටියි.

**සතිතොමෝ** වනාහි සිත ඖද්ධත්‍යපාක්ෂිකවූ ශ්‍රද්ධා-වීර්‍ය්‍ය-ප්‍රඥාවන්ගේ වශයෙන් උද්ධතබවට වැටීමෙන් ද, කෞසීද්‍ය පාක්ෂිකවූ සමාධියෙන් කුසීතයට වැටීමෙන් ද රකියි.

එහෙයින් ඒ **සතිතොමෝ** ලොණධූපනයක් මෙන් ද, සියලු ව්‍යඤ්ජනයන්හි, සබ්බකම්මික අමාත්‍යයෙක් මෙන් ද සියලු රාජකෘත්‍යයන්හි, සියලුතැන ඉච්ඡිතව්‍ය වේ.

එයින් වදාරණලදී.

**“සති පන සබ්බත්ථිකා වුත්තා භගවතා, කිං කාරණා, චිත්තං හි සතිපටිසරණං, ආරක්ඛපච්චුපට්ඨානා ච සති, න විනා සතියා චිත්තස්ස පග්ගහනිග්ගහො හොති”** කියායි.

v. **ප්‍රකටීකරණාර්ථ**:-

**දුතියා**=සුගතියට ද නිර්වාණයට ද යන්නහුට ශ්‍රද්ධාතොමෝ දෙවැනිවන්නීය. (සහාය වන්නීය.)

**පඤ්ඤා ච නං පසාසති**=ප්‍රඥාව ඒ පුරුෂයාට මේ දේ කරව, මේ දේ නොකරවයි අනුශාසනා කරයි.

—:—

## 6. 9. දුතියා සූත්‍රප්‍රදීපයයි.

—:—

19. කිංසු නිදානං ගාථානං - කිංසු තාසං වියඤ්ජනං,
කිංසු සන්නිස්සිතා ගාථා - කිංසු ගාථානමාසයො'ති?

20. ඡන්දො නිදානං ගාථානං - අක්ඛරා තාසං වියඤ්ජනා,
නාම සන්නිස්සිතා ගාථා - කවි ගාථානමාසයො'ති.

## 6. ජරාවග්ගො.

6 - 10 (19 - 20)

i. මාතෘකා:-

**ගාථාවන්ගේ නිදාන, 2 ජනන, 3 නිඃශ්‍රිත, 4 ආශ්‍රය සතර.**

ii. පිණ්ඩාර්ථය:-

ගාථා ඡන්දසින් ආරම්භකරයි; අකුරුවලින් උපදවයි; නාමයක් ඇසුරු කරයි; කිවියෝ පිහිට කරත්.

iii. භාවය:—

කුමක් ගාථාවන්ට මුල් (කාරණ) වේද? කුමක් ඔවුන් සම්බන්ධ ව්‍යඤ්ජන වෙත්ද? ගාථාවෝ කුමක් ඇසුරුකොට ඇත්තාහු වෙත්ද? කවරෙක් ගාථාවන්ට ප්‍රතිෂ්ඨා වේද?

20. සවිසි ඡන්දස් අතුරෙන් ගායත්‍රී ආදී ඡන්දස ගාථාවන්ට මූලකාරණය වේ; අක්ෂරයෝ ඔවුන් උපදවා ප්‍රකාශ කරත්; ගාථාවෝ ප්‍රඥප්ති (නාම) ඇසුරුකොට ඇත්තාහු වෙත්; කවිජනතෙම ගාථාවන්ට ප්‍රතිෂ්ඨා වේ; ගාථා පවත්වන හෙයිනි.

iv. අනුවාදය:—

ධර්මයෙහි වනාහි සූත්‍රාන්තවෘත්ත නම් ඇත; ජාතකවෘත්ත නම් ඇත; ගාථාවෘත්ත නම් ඇත; ඒ වෘත්ත විනාශකොට අති දීර්ඝකර කියන්ට නොවටියි; චතුරශ්‍රවෘත්තයෙන් පරිමණ්ඩල පද ව්‍යඤ්ජන දක්විය යුත්තාහ; "ගාථාභිගීතං මෙ අභොජනෙය්‍යං" "ගාථාභිගීතං පනුදන්ති බුද්ධා" යනාදියයි; සරභාණක කාලයෙහි වනාහි තරඞ්ගවෘත්ත, නරඞ්ගභෙදවෘත්ත, ගලිතවෘත්තාදි දෙතිස්වෘත්තයෝ ඇත්තාහ; ඔවුන් අතුරෙන් යම් වෘත්තයක් කැමති නම් ඒ වෘත්තයෙන් කියන්නට වටියි; සියලු වෘත්තයන්ගේ පදව්‍යඤ්ජන නොනසා විකාරනොකොට ශ්‍රමණසාරූප්‍ය චතුරශ්‍ර නයෙන් පැවැත්වීම මෙහි ලක්ෂණයයි.

1. සූත්‍ර, 2. ගෙය්‍ය, 3. වෙය්‍යාකරණ, 4. ගාථා, 5. උදාන 6. ඉතිවුත්තක, 7. ජාතක, 8. අබ්භූතධම්ම, 9. වෙදල්ල යන ශාස්තෘශාසන ප්‍රභෙද නවයෙන් ගාථාඞ්ගය සතරවෙනි වේ.

ඒ නවාඞ්ගයන් අතුරෙහි උභතොවිභඞ්ග-නිද්දෙස-ඛන්ධක-පරිවාරයෝද සුත්තනිපාතයෙහි මඞ්ගලසුත්ත-රතනසුත්ත-නාලක සුත්ත-තුවටකසුත්තයෝ ද අනිකුදු සූත්‍ර නම් ඇති තථාගත වචන සූත්‍රයයි දතයුතුයි.

සියලු සගාථක සුත්තයනුත් ගෙය්‍යයයි දතයුතුයි; විශෙෂ යෙන් සංයුත්තනිකායෙහි සකල සගාථකවර්ගයම ගෙය්‍ය නම්; මුළු අභිධම්මපිටකය ද නිග්ගාථක සුත්ත ද යම් අනිකුදු අඞ්ග අටින් අසඞ්ගෘහීතවූ ඒ බුද්ධවචනයකුත් වේ නම් ඒ වෙය්‍යාකරණයයි දතයුතුයි. ධම්මපදය, ථෙරගාථා, ථෙරීගාථා, සුත්තනිපාතයෙහි සූත්‍රනාමික නොවූ සුද්ධිකගාථාවෝ ද ගාථා යයි දතයුත්තාහ.

සොමනස්සඤාණමයික ගාථාප්‍රතිසංයුක්ත දෙඅසූ සූත්‍රාන්ත කෙනෙක් උදානයයි දතයුතුයි.

සගාථක සූත්‍රය ගෙය්‍යය, නිග්ගාථක සූත්‍රය වෙය්‍යාකරණ යයි අට්ඨකථාවෙහි කියනලදි; ගාථාසඞ්ග්‍රහය වනාහි කෙසේ යෙද්දයි මෙය මෙහි විමසියයුතුයි; ධම්මපදාදීන්ගේ මෙන් හුදෙක් ගාථාබන්ධභාවය ගාථාඞ්ගයාගේ තද්භාවනිමිත්තයි.

ධම්මපද ආදියෙහි ද කෙවලගාථාබන්ධයන්හි ගාථාසමඤ්ඤ පිහිටනලදි. නිද්දෙසයෙහි ද කිසියම් කෙවල ගාථාබන්ධප්‍රදෙශයක් උපලභ්‍ය නොවේ; සම්‍යක්සම්බුද්ධයන්වහන්සේවිසින් වදාළා වූම අට්ඨකවග්ගාදි සඞ්ගෘහිත ගාථාවන්ගේ නිද්දෙසමාත්‍රයක් ධර්මසෙනාපතීන්වහන්සේවිසින් කරණලදී. අර්ථවිභාගය පිණිස ආනීතවූ පිහිතවූ අට්ඨකවග්ගාදි සඞ්ගෘහිතවූ නිර්දේශ කටයුතු මූලගාථාවෝ සුත්තනිපාත පර්‍යාපන්නබැවින් අන්‍යයෝම යයි නිද්දෙසසඞ්ඛ්‍යාවට නොයත්.

උභතොවිභඞ්ගාදීන්හි ආගතභාවය ඇතිකල්හි ද ඒ ගාථා ව්‍යවහාරය නොලබන්නාහු ජාතකාදී ගාථාපරියාපන්න ගාථාවන් මෙනි; එහෙයින් මෙහි කාරණාන්තරය සෙවියයුතුයි; යුක්තතරය හෝ ගතයුතුයි.

නාලකසුත්ත-තුවටකසුත්තයෝ යයි කියනලද මෙහි නාලක සූත්‍රය නම් පියුමතුරා බුදුන්ගේ ශ්‍රාවක මොනෙය්‍යප්‍රතිපදා ප්‍රතිපන්නයන් දැක ඒ මොනෙය්‍යාර්ථය කැමතිවන්නහුවිසින් එතැන් පටන් කල්ප සියදහසක් පාරමීන් පුරා ආවාවූ අසිත (කාලදෙවල) සෘෂිහුගේ භාගිනෙය්‍ය නාලකතෙරුන්විසින්

**දම්සක්** පැවැත්වූ දවසින් සත්වෙනි දවසේ "**අඤ්ඤාතමෙතං**" යනාදී ගාථා දෙකින් **මොනෙය්‍ය** ප්‍රතිපදා පිළිවිසිනාලද භාග්‍ය වතුන්වහන්සේවිසින් "**මොනෙය්‍යං තෙ උපඤ්ඤිස්සං**" යන ආදියෙන් **නාලක** තෙරුන්වහන්සේට වදාරණලද **මොනෙය්‍ය** ප්‍රතිපදා පරිදීපක සූත්‍රයයි.

**තුවටක** සූත්‍රය වනාහි **මහාසමය**සූත්‍රාන්ත දේශනාවට රැස්වූ දෙවියන් අතුරෙහි "අරහත්ඵලයට **පැමිණීමේ** ප්‍රතිපත්ති කවරීදෝ"යි උපන් සිත් ඇති ඇතැම් දෙවතාකෙනෙකුන්ට ඒ කාරණය ප්‍රකාශකරන්ට ' **පුච්ඡාමි තං ආදිච්චබන්ධුං**" ආදීන් **නිර්මිතබුදුන්**විසින් තමන්වහන්සේ පිළිවිස්වා "**මූලං පපඤ්ච සංඛාය**" යනාදීන් වදාළ සූත්‍රයයි.

මෙසේ මේ **සුත්තනිපාතයෙහි** ආවාවූ **මඞ්ගල සූත්‍රාදීන්ගේ** ද සූත්‍රාඞ්ගයෙහි සඞ්ග්‍රහය දක්වනලදී; එහිම ආවාවූ සූත්‍රනාමික නොවූ **ඛුද්දකගාථාවන්ගේ** ගාථාඞ්ග සඞ්ග්‍රහය ද දක්වනු ලබන්නේය.

එසේ ඇතිකල්හි සූත්‍රනිපාතාර්ථකථාරම්භයෙහි: —

**"ගාථාසතසමාකිණ්ණො-ගෙය්‍යබ්‍යාකරණඞ්කිතො,**
**කස්මා සුත්තනිපාතො'ති-සඞ්ඛ්‍යමෙසගතො'ති චෙ"යි.**

සකල සූත්‍රනිපාතයටම **ගෙය්‍ය**, **වෙය්‍යාකරණාඞ්ගසඞ්ග්‍රහය** එහෙයින් චෝදනා කරණලදූයි මෙය විරොධ නොවේ.

හුදෙක් වනාහි එහි චෝදකයාවිසින් **සගාථකබව**ද කිසි තැනක පුච්ඡාවිසජ්ජනමාත්‍රයද ගෙන චෝදනාමාත්‍රයක් කරණලදූයි ගතයුතුයි; අන්‍යාකාරයකින් සූත්‍රනිපාතයෙහි **නිර්ගාථක** සූත්‍රයක්හුගේම අභාවහෙයින් වෙය්‍යාකරණාඞ්ගසඞ්ග්‍රහය චෝදෙතව්‍ය නොවන්නේනුයි **සගාථකවර්ගයෙහි** ගෙය්‍යයයි යෙදිය යුතුයි.

අෂ්ටාඞ්ගයෙන් අසඞ්ගෘහිතය නම් **ප්‍රතිසම්භිදා**දියයි ගණ්ඨිපදතුනේම කියනලදී; සමහර කෙනෙක් වනාහි **පටිසම්භිදා**මාර්ගාඞ්ගයාගේ **ගෙය්‍යාඞ්ග-වෙය්‍යාකරණාඞ්ග** දෙක සඞ්ග්‍රහයයි කියති; එය "**ප්‍රතිසම්භිදාමාර්ගාර්ථකථාවෙහි**" කියනලදමය. "**නවවිධ ශාස්තෘශාසනාඞ්ගයන් අතුරෙහි යථාසම්භවයෙන් ලැබෙන පරිද්දෙන් ගෙය්‍යාඞ්ග-වෙය්‍යාකරණාඞ්ග** දෙදෙනා **සඞ්ගෘහීතයයි.**"

අසුත්තනාමිකා සුද්ධිකගාථා නම් වස්තු ගාථායයි ගැටපද තුළෙන්ම කියනලදී. එහි වස්තුගාථා නම්:-

"කොසලානං පුරං රම්මං
අගමා දක්ඛිණං පථං,
ආකිඤ්චඤ්ඤං පත්ථයානො
බ්‍රාහ්මණො මන්තපාරගූ"

යනාදීන් **පාරායණවග්ගයාගේ** නිදානය ආරොපණය කරන්නාවූ ආයුෂ්මත් **ආනන්ද** ස්ථවිරයන්වහන්සේවිසින් **සඞ්ගීති**කාලයෙහි කියනලද **සපනස්** ගාථාවෝ ද **ආනන්ද**තෙරුන්විසින් ම සඞ්ගායනා කාලයෙහි **නාලකසූත්‍ර**නිදානාරොපණය කරන්නහු විසින් කියනලද:

"ආනන්ද ජාතෙ තිදසගණෙ පතීතෙ
සක්කඤ්ච ඉන්දං සුචිවසනෙ ච දෙවෙ,
දුස්සං ගහෙත්වා අතිරිව ථොමයන්තෙ
අසිතො ඉසි අද්දස දිවාවිහාරෙ."

යන ආදීන් විස්සක් පමණ ගාථාවෝ ද කියනු ලැබෙත්; එහි "**නාලක** සූත්‍රයාගේ වස්තුගාථාවෝ **නාලකසූත්‍රසඞ්ඛ්‍යාවටම** යෙත්" යයි අටුවායෙහි කියනලදී. ඒ කාරණය **සූත්‍රනිපාතාර්ථකථාවෙහි** කියනලදී.

භාග්‍යවතුන් පිරිනිවන් වැඩි කල්හි වනාහි සඞ්ගීතිකාරක ආයුෂ්මත් **මහාකාශ්‍යප**ස්ථවිරයන්විසින් ආයුෂ්මත් **ආනන්ද ස්ථවිර**තෙම **එම මොනෙය්‍ය පටිපද** පිළිවිසියේ ද යමකින් යම් කලකත් සමාදන්කරවූ නාලකතෙමේ භාග්‍යවතුන් විචාළේ ද ඒ සියල්ල පහළකොට දක්වනු කැමැත්තෝ "**ආනන්දජාතෙ**" යන ආදීවූ විසිවත්ගාථාවන් කියේය; ඒ සියල්ලත් **නාලක සූත්‍රයැයි** කියනු ලැබේ; එබැවින් නාලකසූත්‍රයාගේ වස්තුගාථාවෝ **නාලකසූත්‍රග්‍රහණයෙන්ම සඞ්ග්‍රහකරණ ලදහයි.**

**පාරායණිකවග්ගයේ** වස්තුගාථාවෝ මෙහි **සුද්ධිකගාථායයි** ගතයුතුයි; එහිම වූ **අජිතමානවකාදි සොළොස් බමුණන්ගේ** පුච්ඡාගාථා ද **භාග්‍යවත්හුගේ** විසජ්ජනගාථා ද මෙහි **සුද්ධික ගාථායයි මෙසේත් කියන්ට** යෙදෙයි; ඒ ගාථාවෝ ද පාළියෙහි

සූත්‍රනාමයෙන් නොකියා අජිතමාණවකපුච්ඡා-තිස්සමෙත්තෙය්‍යමාණවකපුච්ඡා යනු ආදීන් ආ බැවින් චූණ්ණිය ග්‍රන්ථවලින් අමිශ්‍ර හෙයින් ද නොසුත්තනාමිකවු සුද්ධිකගාථා නමැයි කියන්ට වටියි.

v. **ප්‍රකවිකරණාදී:-**

**ඡන්දෝ නිදානං=නායකාති** ආදී ඡන්දස ගාථාවන්ට නිදාන වේ; පූර්වප්‍රස්ථාපන ගාථා අරබනුයේ වනාහි කවර ඡන්දසකින් වේදැයි ආරම්භ කරයි.

**විසජ්ජනං:-** ජනනයයි, අකුර වනාහි පදය උපදවයි; පදය ගාථා උපදවයි; ගාථාව අර්ථ ප්‍රකාශකරයි.

**නාම සන්නිස්සිතා:-** සමුද්‍රාදී ප්‍රඥප්තිනිශ්‍රිතයි. ගාථා පටන් ගන්නහුවිසින් සමුද්‍රය හෝ පෘථිවිය හෝ යම්කිසි නමක් නිශ්‍රයකොට ම ආරම්භ කරයි.

**ආසයො:-** යනු ප්‍රතිෂ්ඨාවයි; කිවියාගෙන් වනාහි ගාථාවෝ පවතිත්; ඒ කිවිතෙම ඒ ගාථාවන්ට පිහිට වෙයි.

—:—

## 6. 10. කවි සූත්‍රප්‍රදීපයයි.

—:—

සවෙනි ( 6 ) ජරා වග නිමි.

( තස්සුද්දානං

ජරා අජ්ජරසා මිත්තං - වත්ථුං තීනි ජනෙත ච,
උපස්සයො ච දුතියො ච - කවිනා පූරිතො වග්ගො.)

—:—

1. **කිංසු සබ්බං අද්ධභවී-කිස්මා භීයො න විජ්ජති,**
**කිස්සස්ස එකධම්මස්ස-සබ්බෙව වසමන්වගූ'ති?**

2. **නාමං සබ්බං අද්ධභවී-නාමා භීයො න විජ්ජති,**
**නාමස්ස එකධම්මස්ස-සබ්බෙව වසමන්වගූ'ති.**

---

**7 - 1 ( 1 - 2 ).**

i. **මාතෘකා:—**

**නාමයෙන් මිදුනු සත්ව-සංස්කාර නැත.**

ii. **පිණ්ඩාර්ථය:—**

නමින් සියල්ල යටපත් වී, නමට වඩා දෙයක් නැත; සියල්ල වසග වන එකම ධර්මය නාමය වේ.

iii. **භාවය:—**

**1.** කුමක් සකල ප්‍රඥප්තිපථයට අනුපතිත වේ ද? කුමකට වඩා අධිකයක් අවිද්‍යමාන ද? සියල්ලෝම කිනම් එකම ධර්මයක් හුගේ වසයට අනුගතයෝ ද?

2. **සමඥ්ඥා නාමය** සකල ප්‍රඥප්තිපථයට අනුපතිත වෙයි; නාමයට වඩා අධිකයක් විද්‍යමාන නොවේ; සියල්ලෝම නාම සඞ්ඛ්‍යාත එකධර්මයාගේ වසයට අනුගතයහ.

iv. **අනුවාදය:-**

"එකධම්මො ඛො මානව සබ්බසු ධම්මෙසු අනුපතති සබ්බෙපි මානව ධම්මා එකධම්මස්මිං ඔසරන්ති; කතමො නු ඛො සො මානව ධම්මො". කියා නාමය **සඳහා** මේ ප්‍රශ්නය අසන ලදී. **එකම ධර්මයක්** විනාහි සියලු ධර්මයෙහි වැටෙයි; **සියලුම ධර්මයෝ** එකම ධර්මයෙක්හි කැටිවෙත්; ඒ ධර්මය නම් නාමයයි.

**ප්‍රඥප්තිනාමරූප විභාගය.**

"තත්‍ථ රූපධම්මා රූපක්ඛන්ධො'ව, චිත්ත චෙතසිකසඞ්ඛාතා චත්තාරො අරූපිනො ඛන්ධා නිබ්බාණඤ්චෙති පඤ්චවිධම්පි අරූපන්ති ච නාමන්ති ච පවුච්චති; තතො අවසෙසා පඤ්ඤත්ති පන **(1)පඤ්ඤපියත්තා පඤ්ඤත්ති** (2) **පඤ්ඤාපණතො පඤ්ඤත්ති ච දුවිධා හොති**.

**1. කථං? තං තං** භූතපරිනාමාකාර **මුපාදාය තථා තථා පඤ්ඤත්තා භූමිපබ්බතාදිකා, 2.** සම්භාරසන්නිවෙසාකාර මුපාදාය ගෙහ රථ සකටාදිකා, 3. ඛන්ධපඤ්චකමුපාදාය පුරිසපුග්ගලා

දිකා, 4. චන්දාවත්තනාදිකමුපාදාය දිසාකාලාදිකා, 5. අසම්ඵුට්ඨාකාරමුපාදාය කූපගුහාදිකා, 6. තං තං භූතනිමිත්තං භාවනාවිසෙසඤ්ච උපාදාය කසිණනිමිත්තාදිකා චෙති එවමාදිප්පභෙදා පන පරමත්ථතො අවිජ්ජමානාපි අත්ථච්ඡායාකාරෙන චිත්තුප්පාදානමාලම්බනභූතා තං තං උපාදාය උපනිධාය කාරණං කත්වා තථා තථා පරිකප්පියමානා සඞ්ඛායන්ති, සමඤ්ඤායන්ති, වොහරීයන්ති, පඤ්ඤපීයන්තීති=පඤ්ඤත්තීති පවුච්චති; **අයං පඤ්ඤත්ති පඤ්ඤපියත්තා පඤ්ඤත්ති නාම.**

2. පඤ්ඤාපනතො පඤ්ඤත්ති පන නාම-නාමකම්මාදිනාමෙන පරිදීපිතා.

**1. සා විජ්ජමානපඤ්ඤත්ති, 2. අවිජ්ජමානපඤ්ඤත්ති, 3. විජ්ජමානෙන අවිජ්ජමානපඤ්ඤත්ති. 4. අවිජ්ජමානෙන විජ්ජමානපඤ්ඤත්ති, 5. විජ්ජමානෙන විජ්ජමානපඤ්ඤත්ති, 6. අවිජ්ජමානෙන අවිජ්ජමානපඤ්ඤත්ති චෙති ඡබ්බිධා හොති**

1. තත්ථ යදා පන පරමත්ථතො විජ්ජමානං රූපවෙදනාදිං එතාය පඤ්ඤපෙන්ති, තදායං **විජ්ජමානපඤ්ඤත්ති**.

2. යදා පන පරමත්ථතො අවිජ්ජමානං භූමිපබ්බතාදිං එතාය පඤ්ඤපෙන්ති, තදායං **අවිජ්ජමානපඤ්ඤත්තීති** පවුච්චති.

3. උභින්නං පන වොමිස්සකවසෙන සෙසා යථාක්කමං ඡළභිඤ්ඤො, 4. ඉත්ථිසද්දො, 5. චක්ඛුවිඤ්ඤාණං, 6. රාජපුත්තො'ති ච වෙදිතබ්බා.

"වචීඝොසානුසාරෙන-සොතවිඤ්ඤාණවීථියා,
පවත්තානන්තරුප්පන්න-මනොද්වාරස්ස ගොචරා.
අත්ථා යස්සානුසාරෙන-විඤ්ඤායන්ති තතො පරං,
සායං පඤ්ඤත්ති විඤ්ඤෙය්‍යා-ලොකසඞ්කෙතනිම්මිතා'ති".

**වචනීය ප්‍රඥප්තිය, වාචක ප්‍රඥප්තිය** කියා ප්‍රඥප්තිභෙදය ද්විප්‍රකාරයයි කියනලදී; "**පඤ්ඤපියත්තා**" යනු ඒ ඒ ප්‍රකාරයෙන් හැඟවිය යුතු බැවිනි; මෙයින් රූපාදී ධර්මයන්ගේ සමූහ සන්තානාදී අවස්ථාවිශෙෂ භෙද ඇති සම්මුතිසත්‍යවූ උපාදාප්‍රඥප්ති සඞ්ඛ්‍යාත අර්ථප්‍රඥප්තිය කියනලදී.

ඒ අර්ථ ප්‍රඥප්ති තොමෝ වනාහි නාම ප්‍රඥප්තියෙන් පැණ වනු ලැබේ.

"**පඤ්ඤපීයතො**" යනු ප්‍රකාරවලින් අර්ථ ප්‍රඥප්තිය කරණ කොටගෙණ හඟවන හෙයිනි; මෙයින් වනාහි **පණවන්නේ** නුයි "ප්‍රඥප්ති" යයි ලද නම් ඇති අර්ථයන්ගේ අභිධාන **සංඛ්‍යාතවූ** නාම ප්‍රඥප්තිය කියනලදී.

**1.** "**භූතපරිණාමාකාරමුපාදාය**" යනු පෘථිවි ආදීවූ මහා භූතයන්ගේ ප්‍රබන්ධවශයෙන් පවතින්නාවූ පැතිරීම්-කැටිවීම් ආදී අයුරෙන් පරිණාමාකාරය ගෙන ඇසුරු කොට එසේ භූමි ආදි වශයෙන් භූමිය, පර්වතය, වෘක්ෂය, යනාදී **සන්තාන ප්‍රඥප්ති යයි.**

2. "**සම්භාර සන්නිවේසාකාරමුපාදාය**" යනු දරුසම්භ මෘත්තිකාසම්භාදිවූ සම්භාර ඇති උපකරණයන්ගේ සන්නිවේසාකාර රචනාදීන් විශිෂ්ටවූ ඒ ඒ සටහන් ආදී අයුරු ඇති රථය ශකටය ග්‍රාමය ඝටය පටය යනාදී **සමූහ ප්‍රඥප්තියයි.**

3. "**ඛන්ධපඤ්චකමුපාදාය**" යනු රූපාදී ස්කන්ධයන්ගේ රාශි වශයෙන් පවත්නාවූ රූපනලක්ෂණ වේදියනලක්ෂණ විජානනලක්ෂණ ආකාරගෙණ පුරුෂ පුද්ගල ආදී **සත්වප්‍රඥප්ති** යයි.

4. "**චන්දාවත්තනාදිකමුපාදාය**" යනු චන්ද්‍ර සූර්ය නක්ෂත්‍රයන්ගේ සිනෙරු (මහමෙර) ප්‍රදක්ෂිණා කිරීම් වශයෙන් උදය ආදී ආවර්තනාකාර ඇති පුරත්ථිම දිසා ආදී දිශාප්‍රඥප්තියත් පූර්වාහ්ණාදී කාලප්‍රඥප්තියත් මාසය ඍතුය යනාදී ඒ ඒ නාමයෙන් වෙසෙසන ලද මාසය ආදී ප්‍රඥප්තිය දූයි දිසා, කාල, නාම විසිටය ප්‍රඥප්තියයි.

5. "**අසම්ඵුට්ඨාකාරමුපාදාය**" යනු ඒ ඒ රූප කලාපාදියෙන් නො පහස්නාලද සුසිරාදී ආකාර ඇති කූපය, ගුහාව, ඡිද්‍රය **ආදී ආකාර ප්‍රඥප්තියයි.**

6. "**තං තං භූතනිමිත්තං භාවනා විසේසඤ්ච උපාදාය**" යනු පඨවිකසිණ, ආපොකසිණ, තෙජොකසිණ, වායොකසිණ ආදී ඒ ඒ භූත නිමිත්ත ඇති පරිකම්මභාවනා. **උපචාරභාවනා,** අප්පනාභාවනාදි භෙදවත් භාවනාහුගේ ප්‍රබන්ධ විශෙෂ ඇති කසිණ නිමිත්තය, අසුභ නිමිත්තය, යනාදී ප්‍රභෙදවූ යෝගීන්ට එලඹ සිටි **උග්ගහනිමිත්ත පටිභාගනිමිත්ත** ආදී භෙද ඇත්තාවූද **නිමිත්තප්‍රඥප්තියයි.**

**"එවමාදිප්පභෙදා"** යනු භසිණ්ණශසාපිමාකාසය, නිරොධය, කසිණය ආදි භෙදයෝද පරමාත්ථයෙන් අවිද්‍යමානවුවත් පරමාත්ථ ධම්මයාගේ ඡායාවක ආකාරයෙන් ප්‍රතිභාග (පිළිරූ) ආකාරයෙන් චිත්තොත්පාදයන්ට ආලම්බනවූවාහු ඒ ඒ නිමිත්ත උපාදානයෙන් උපත්තියෙන් කාරණකොටගෙණ එසේ එසේ පරිකල්පනය කර මින් සලකයි, නම් කරයි, ව්‍යවහාර කරයි, පණවයි නුයි ප්‍රඥප්ති යයි ප්‍රකාශ කරණු ලැබේ; මේ කියන ලද්දේ පණවනලද හෙයින් ප්‍රඥප්තියයි.

**"පඤ්ඤාපනතො පඤ්ඤත්තිය"**යි කියන ලද්ද වනාහි **1. නාමය, 2. නාමකම්මය, 3. නාමධෙය්‍යය, 4. නිරුත්තිය, 5. බ්‍යඤ්ජනය, 6. අභිලාපය** යන මේ නාම සයෙන් ප්‍රකාශ කරණලදී.

1. අර්ථයන්හි නමයි නුයි **"නාම"** වේ; ඒ නාමය **අන්වර්ථ නාම-රූළ්හිනාම** වශයෙන් විවිධ වේ; **සාමඤ්ඤනාමය, ගුණ නාමය, ක්‍රියානාමය, යදිච්ඡානාමය** වශයෙන් චතුර්විධ වේ.

2. **අන්වර්ථ-රූඪි, සාමාන්‍ය, ගුණ, ක්‍රියා** යදිච්ඡා **නාමයම නාමකම්** වේ.

3. එසේ අනුරුත් අරුණු ආදියම නාමධෙය්‍ය වේ.

4. අක්ෂරවාරයෙන් (අකුරුමගින්) අර්ථ නීහරණකොට උක්තිය කථනය නිරුක්තිය වේ.

5. අර්ථය ප්‍රකාශකිරීම බ්‍යඤ්ජන නාම වේ.

6. අභිලපනය (ඉදිරිපිට කීම) අභිලාප වේ; ශබ්දගත අක්ෂර සන්නිවෙස ක්‍රමයයි.

2. ඒ මේ නාම ප්‍රඥප්තිය විද්‍යමාන අවිද්‍යමාන තදුභය සංයො ගවශයෙන් ෂට්විධ වේයයි දැක්වීමට **විද්‍යමානප්‍රඥප්ති** ආදිය කියනලදී.

1. එහි යම්කලක වනාහි පරමාර්ථවශයෙන් විද්‍යමාන රූප වෙදනා යන ආදියෙන් පවසත්ද එකල්හි මේ නාමය විද්‍යමාන ප්‍රඥප්ති වේ.

එහි යම් කලක වනාහි පරමාර්ථවශයෙන් අවිද්‍යමාන භූමි පර්වතාදිය ප්‍රකාශ කරත්ද එකල්හි මේ නාමය **අවිද්‍යමානප්‍රඥප්ති** යයි කියනු ලැබේ.

විද්‍යමාන-අවිද්‍යමාන දෙදෙනාගේ වොමිස්සක වශයෙන් විද්‍යමානයෙන් අවිද්‍යමානප්‍රඥප්තිය, අවිද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්තිය, විද්‍යමානයෙන් විද්‍යමානප්‍රඥප්තිය, අවිද්‍යමානයෙන් අවිද්‍යමානප්‍රඥප්තිය යන සෙසු නාම සතරද පිළිවෙළින් දතයුතු වෙත්.

විද්‍යමානයෙන් අවිද්‍යමානප්‍රඥප්තියට **ඡළභිඤ්ඤො** යනු උදාහරණයි.

"පඤ්චාභිඤ්ඤා **ආසවක්ඛයඤ්ඤාණ**න්ති ඡ අභිඤ්ඤා අස්සා'ති **"ඡළභිඤ්ඤො"**-මෙහි අභිඥවත් විද්‍යමාන බැවින්ද තත්ප්‍රතිලාභී පුද්ගල තමා අවිද්‍යමාන හෙයින්ද මේ **විද්‍යමානයෙන් අවිද්‍යමාන ප්‍රඥප්ති** නම්.

අවිද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්තියට **"ඉත්ථිසද්දො"** යනු උදාහරණයි.

මෙහි යට කී සෙයින් ස්ත්‍රී අවිද්‍යමාන බැවින්ද ශබ්දය තමා විද්‍යමාන බැවින්ද ස්ත්‍රීශබ්දය යනු අවිද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්තියයි.

විද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්තියට **"චක්ඛුවිඤ්ඤාණං"** යනු උදාහරණයි.

ප්‍රසාද චක්ෂුර්හුගේද තත් නිශ්‍රිත විඥානයාගේද විද්‍යමානත්වයෙන් **චක්ඛුවිඤ්ඤාණං** යනු විද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්තියයි.

**අවිද්‍යමානයෙන් අවිද්‍යමාන ප්‍රඥප්තියට "රාජපුත්තො" යනු** උදාහරණයි.

**රජුගේද පුත්‍රහුගේද සම්මුති සත්‍යවූ හෙයින් "රාජපුත්තො" යනු නැති දෙයින් නැති දේ පැණවීම් නාමයයි.**

**භූමි පර්වත රූප වේදනාදී වාග්චාරික ශබ්දයාගේ අනුසාරයෙන් අනුගමනයෙන් අනුසරණයෙන් ආලම්බන කරණයෙන් පැවැත්තාවූ ශ්‍රොත්‍රවිඥාණවීථියගේ වෘත්තියෙන් අනතුරුව උපන් මනොවාරය තමා නාම විනානාකාර ප්‍රවෘත්තවූ මනොවාරික විඤ්ඤාණසන්තානයට මෙය මෙයාකාර අර්ථයක්හු පිළිබඳ "නාම" යයි පූර්වයෙහිම ගත්තාලද සඞ්කෙත උපනිශ්‍රය සම්බන්ධ ගොචර අරමුණුවූවාවූ ඒ නාම ග්‍රහණයෙන් මතු සම්මුති පරමාර්ථ විෂයවූ යම් නාම ප්‍රඥප්තියක්හුගේ අනුසෙරෙන් අනුගමනින් සංවෘති පරමාර්ථ භෙද ඇති අර්ථයෝ හඟවත්.**

ඒ මේ භූමි පණීත රූපවේදනාදිවූ පැණවියයුතු අර්ථ පණවත්නාවූ ලෝකසඞ්කේතය කාරණකොටගෙණ නිර්මිතවූ ලෝකව්‍යවහාරයෙන් සිඩවූ, මනොවාරයෙන් ගන්නා ලද්දාවූ අක්ෂරාවලිනික්වූ, ප්‍රඥප්තියෙන් දතගතහැකිවූ **පඤ්ඤාපනතො පඤ්ඤත්ති,** සඞ්ඛ්‍යාතවූ **නාමප්‍රඥප්ති** යයි දතයුතු වන්නීය.

මෙහිදු **ශ්‍රොත්‍රවිඥාන** වීථියට අනන්තරව වන්නාවූ මනොවාරික වීථියද සොතවිඤ්ඤාණවීථිග්‍රහණයෙන්ම සඞ්ග්‍රහකොටගෙණ ශ්‍රොත්‍රවිඥාන වීථියට යයි කියනලදී.

සටආදි ශබ්දයක් වනාහි අසන්නහුට එක එක ශබ්දයක් අරබයා ප්‍රත්‍යුත්පන්න අතීත ආරම්මණ වශයෙන් දෙකක් දෙකක් ජවන්වාරයෝද බුඩියෙන් ගන්නාලද නමක් පිළිබඳ පණතවූ අක්ෂරාවලිය අරභයා එක් ජවන්වාරයක්දැයි මෙසේ ශ්‍රොත්‍රවිඥාන වීථියට අනන්තරවූ අතීත ශබ්ද ආරම්මණවූ ජවනවිත්තවීථියට අනතුරුව නාම ප්‍රඥප්තිහුගේ ග්‍රහණය වේ. "ඉන් මත්තෙහි අර්ථාවබොධ වේ" යයි ආචාර්‍ය්‍යයෝ කියති."

v. **ප්‍රකීර්ණකාර්ථ:—**

**නාමං සබ්බං** අන්වභවි=නාමය සියල්ල අභිභවනය කරයි, සියල්ලට අනුව වැටෙයි. ඕපපාතිකවූ හෝ කිත්තිමවූ හෝ නාමයෙන් මිදුනාවූ **සත්වයෙක්** හෝ සංස්කාරයක් හෝ නැත්තේය. යම් බඳුවූ රූකකට හෝ පාෂාණයකට හෝ මෙනම්වූ "නාම"යයි හෙවත් අසවල් නමය කියා නොදනිත් නම් **අනාමකය** හෙවත් "නමනැත්තා" කියාම ඔහුට නමක් වේ.

——:——

## 7. 1. නාම සූත්‍රප්‍රදීපයයි.

——:——

3. කෙනස්සු නීයති ලොකො-කෙනස්සු පරිකස්සති,
කිස්සස්ස එකධම්මස්ස-සබ්බෙව වසමන්වගූ'ති?.

4. චිත්තෙන නීයති ලොකො-චිත්තෙන පරිකස්සති,
චිත්තස්ස එකධම්මස්ස-සබ්බෙව වසමන්වගූ'ති.

---

**7 - 2 - ( 3 - 4. )**

i. **මාතෘකා:-**

**වසඟයට යන එකම ධර්මය සිත වේ.**

ii. **පිණ්ඩාර්ථය:-**

සිතෙන් යවනු ලැබේ, සිතෙන් අදිනු ලැබේ. සිතට යටත් වන්නෝ භාවනා නැත්තෝය.

iii. **භාවය:-**

3. කුමකින් ලෝවැසි ජනතෙම පමුණුවනු ලැබේද? කුමකින් ඔබිමොබ අදිනු ලැබේද? සියල්ලෝම ඒ කිනම් එකම ධර්මයක්හුගේ වසයට අනුගතයෝද?

4. ලෝවැසි තෙම සිතින් පමුණුවනු ලැබේ; සිතින් පරිකර්ෂණ කරනු ලැබේ; සියල්ලෝම චිත්ත සඞ්ඛ්‍යාත එකාමධර්මයාගේ වසයට අනුගතයෝය.

iv. **අනුවාදය:-**

චිත්තය රූපාදී අරමුණුවල **විප්ඵන්දමාන** යි, (මදක් විශෙෂයෙන් සෙලවෙයි); එක් ඉරියව්වක නොපිහිටන්නේ ගම් දරුවෙක් මෙන් එක අරමුණක නොසිටින්නේ **චපලයි; විඤ්ඤාණචිත්‍ර, භූමිචිත්‍ර, වත්ථුචිත්‍ර, ආරම්මණචිත්‍ර, ක්‍රියාචිත්‍ර** ආදී විසිතුරු හෙයින් 'චිත්‍ර' යි.

චිත්තය, **කිට්ඨසම්බාධයෙහි** හෙවත් ගොයම්ලෙඩ කාලයෙහි ගොයම් කන ගවයන් මෙන් එක් සැප අරමුණකම නොතැබිය හැකි බැවින් දුරක්ඛයි; විසභාග අරමුණට යන්නහු වළක්වන්ට **දුෂ්කරයි, දුන්නිවාරයි; "සිත"** නම්වූ මෙය දුකසේ නිග්‍රහ කටයුතු යයි **දුන්නිග්ගහයි**, වහාම උපදියි, වහාම නිරුඬ වේනුයි ලහුයි.

**යම් ඒ කොතැනක නමුත්-වැටෙන සවභාව ඇති මේ සිත** වනාහි ලැබියයුතු තැන **හෝ** නොලැබියයුතු තැන **හෝ යුක්ත ස්ථානය හෝ අයුක්ත ස්ථානය හෝ නොදනියි, ජාතිය නොබලයි, ගොත්‍රය නොබලයි, වංශය නොබලයි; යම් යම් තැනක කැමති** නම් ඒ ඒ තැන **ඇද** වැටෙයි-ඤුසි **යථාකාමනිපාතයි.**

අතිශයින් දුර්දර්ශී හෙයින් සුදුද්දසයි, මනාකොට නිපුණ පරම සණහසුවුම හෙයින් සුනිපුණයි.

සිතට වනාහි මකුළුහුයක් පමණවත් පුරත්‍යිමාදි දිශාභාග යෙන් ගමනක් නම් නැත; ඉතා දුර ඇත්තාවූද අරමුණ වනාහි පිළිගනීනුයි දූරඞ්ගම නම් විය.

සිත් හතක් අටක් නම් එකතුව කණිණිකාබඬව එක්ක්ෂණ යෙක්හි උපදින්ට සමර්ථ නම් නැත; උත්පත්තිකාලයෙහි එක එක සිතම උපදියි; ඒ ඒ සිත නිරුඞ කල්හි නැවතත් එක එකම උපදියිනුයි එකචර නම්විය.

සිතට ශරීර සංස්ථානයක් හෝ නීලාදී ප්‍රකාරවර්ණ භෙදයක් හෝ නැත කියා අශරීර නම්විය.

සිත වනාහි සතරමහාභූත ගුහාව පිළිබඳ හෘදය වස්තුරූපය නිසා පවතීනුයි ගුහාශය නම් වී.

1. සරාග චිත්තය, 2. වීතරාග චිත්තය,
3. සදෙස චිත්තය, 4. වීතදෙස චිත්තය,
5. සමොහ චිත්තය, 6. වීතමොහ චිත්තය,
7. සංඛිත්ත චිත්තය, 8. විකඛිත්ත චිත්තය,
9. මහග්ගත චිත්තය, 10. අමහග්ගත චිත්තය,
11. සඋත්තර චිත්තය, 12. අනුත්තර චිත්තය,
13. සමාහිත චිත්තය, 14. අසමාහිත චිත්තය,
15. විමුත්ත චිත්තය, 16. අවිමුත්ත චිත්තය,

යන මේ සොලොස් ආකාර චිත්තය චිත්තානුපස්සනා සති පට්ඨාන භාවනා වශයෙන් දතයුතුයි.

v. ප්‍රකටීකරණාර්ථ:-

සබ්බව වසමත්ත‍වගූ=යම්කෙනෙක් චිත්තයාගේ වසයට යත්ද ඒ චිත්තවසිකයන්ගේම අනවශෙෂ (ඉතිරි නොකොට) පරියා දනයයි.

—:—

## 7. 2. චිත්ත සූත්‍රප්‍රදීපයයි.

—:—

5. කෙනස්සු නීයති ලොකො-කෙනස්සු පරිකස්සති,
කිස්සස්ස එකධම්මස්ස-සබ්බ'ව වසමන්වගූ'ති?

6. තණ්හාය නීයති ලොකො-තණ්හාය පරිකස්සති,
තණ්හාය එකධම්මස්ස-සබ්බ'ව වසමන්වගූ'ති.

---

7 - 3 - (5 - 6)

i. **මාතෘකා:—**

**තෘෂ්ණාවට සියල් ලෝ යට වෙත්.**

ii. **පිණ්ඩාර්ථය:—**

තණ්හාවෙන් ගෙණයයි; තන්හාවෙන් අදියි; තන්හාවට හැම පුහුදුනෙක්ම යටත් වෙයි.

iii. **භාවය:—**

5. කුමකින් ලෝවැසිතෙම භවයෙන් භවයට උත්පත්තිය පිණිස ගෙණයනු ලැබේද? කුමකින් ඔබමොබ අදිනු ලැබේද? සියල්ලෝම ඒ කිනම් එකම ධර්මයක්හුගේ වසයට අනුගතද?

6. ලෝවැසිතෙම තෘෂ්ණාවෙන් භවයෙන් භවයට උත්පත්තිය පිණිස ගෙණයනු ලැබේ; තෘෂ්ණාවෙන් ඔබිමොබ අදිනු ලැබේ; සියල්ලෝම තෘෂ්ණාසඞ්ඛ්‍යාත එක ධර්මයාගේ වසයට අනුගතයහ.

iv. **අනුවාදය:—**

**ගූථසූකරපොතිකා වස්තුව මෙහිදී සැලකිය යුතුයි.**

එක් දවසක් ශාස්තෲන් වහන්සේ රජගහනුවරට පිඩුපිණිස වඩිනසේක් එක් සූකරපොතිකාවක් දැක සිනා පහළකළසේක. සිනා පහළකරන්නාවූ උන්වහන්සේගේ මුවවිවර විනිර්ගත දන්තාවභාස මණ්ඩලය දැක ආනන්ද ස්ථවිරතෙම "ස්වාමීනි! භාග්‍ය වතුන්වහන්ස, සිනා පහළකිරීමට හේතු කවරේදැයි" සිනාවට කරුණ ඇසිය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ "ආනන්ද! අර සූකරපොතිකා දක්නෙහිදැයි"; "වහන්ස! එසේයයි"; "තෙල ඊරිතැම්බි කකුසඳ බුදුන්ගේ සාසනයෙහි එක්තරා ආසනසාලාවක භාත්පස කිකිළියක් වූවාය. ඕතොමෝ එක් යොගාවචරයෙකුගේ විදර්ශනාකර්ම ස්ථානයක් සජ්ඣායනා කරද්දී ඒ ධර්මඝොෂාව අසා එයින් චුත වූවා රාජකුලයක ඉපදී උබ්බරී නම් රජදූවනියක් විය.

ඈ මෑතභාගයෙහි සිරුරු වලඤ්ජනට්ඨානයට වැද පණුවන් රැසක් දැක එහි පුලවකසංඥා උපදවා **ප්‍රථමධ්‍යානය** ලැබූවාය; ඈ එහි ආයු ඇතිතාක් සිට ඉන් චුතවී **බ්‍රහ්මලොකයෙහි** උපන්නීය.

ඒ බඹලොවින් චුතවීමෙන් පසුව වනාගි භවගති වසයෙන් අලොල්මත්ව (කැලතෙමින්) දැන් **ශූකරයොනියෙහි** උපන්නීය.

මේ කාරණය දැක මාවිසින් සිනා පහළකරණලදැ"යි; ඒ අසා **ආනන්ද ස්ථවිර** ප්‍රමුඛ භික්ෂූහු මහත් සංවෙගයට පැමිණියාහුය. බුදුරජානන් වහන්සේ උන්වහන්සේලාට සංවෙග උපදවා **භව තෘෂ්ණාවෙහි** ආදීනව ප්‍රකාශකරණසේක් **අන්තරවීථියෙහි** සිටගෙණම මේ ගාථා වදාළසේක.

1. "යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ
ඡින්නො'පි රුක්ඛො පුනරෙව රූහති,
එවම්පි තණ්හානුසයෙ අනූහතෙ
නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනං.

2. යස්ස ඡත්තිංසති සොතා
මනාපස්සවණා භුසා,
වහා වහන්ති දුද්දිට්ඨිං
සංකප්පා රාගනිස්සිතා.

3. සවන්ති සබ්බධි සොතා
ලතා උබ්භිජ්ජ තිට්ඨති,
තඤ්ච දිස්වා ලතං ජාතං
මූලං පඤ්ඤාය ඡින්දථ.

4. සරිතානි සිනෙහිතානි ච
සොමනස්සානි භවන්ති ජන්තුනො,
තෙ සාතසිතා සුඛෙසිනො
තෙ වෙ ජාතිජරූපගා නරා.

5. තසිණාය පුරක්ඛතා පජා
පරිසප්පන්ති සසො'ව බාධිතො,
සංයොජනසඞ්ගසත්තා
දුක්ඛමුපෙන්ති පුනප්පුනං චිරාය.

6. තසිණාය පුරක්ඛතා පජා
පරිසප්පන්ති සසො'ව බාධිතො,
තස්මා තසිණං විනොදයෙ
භික්ඛු ආකඞ්ඛී විරාගමත්තනො"ති.

1. යම්සේ යම් රුක්ක සතරදිසාවෙහි සතරපිහිටියකින් හා යටට සෘජුව ගියාවූද පඤ්චවිධ මූලයන් සිඳීම් පැළීම් පණුවන් විදීම් ආදීවූ කිසියම් උපද්‍රවයකින් අනුපද්‍රැතකල්හි තෙරපත් තෙන් දෘඪකල ඒ ගස මත්තෙහි සින්දේ නමුත් (කරටිය කැපුවත්) සාඛානුසාඛාවන්ගේ වසයෙන් අතුපතරින් ගැවසී නැවතත් නගයි ද.

එපරිද්දෙන්ම ආධ්‍යාත්මික තෘෂ්ණාවෙන් අනුසයිතවූ අහීත් මාර්ගඥානයෙන් මුල් උදුරා නොවැනසූ අසමුච්ඡින්නවූ ඒ ඒ භව යෙහි ජාති ආදී භෙද ඇති මේ දුක්ඛය නැවත නැවතත් උපදියි යන අදහසයි.

2. යම් පුද්ගලයෙකුට මෙසේ ආධ්‍යාත්මිකය උපාදකොට අටළොස්තෘෂ්ණාවිචරිත කෙනෙක් ද බාහිරය උපාදකොට අටළොරස තණ්හාවිචරිත කෙනෙක්දැයි මේ කී තණ්හාවිචරිතයන් ගේ වශයෙන් ෂට්ත්‍රිංශත් කෙනෙකුගෙන් සමන්විතව මනාප වත් රූපාදීන්හි අස්සවනී පවතීනුයි "මනාපස්සවණා" නම්වූ තෘෂ්ණාතොමෝ බොහෝ බලවත් වෙයි.

ඒ පුද්ගලයා විපන්නවූ නැණවත් බැවින් දුද්දිට්ඨිය පුන පුනා උපදින හෙයින් මහත්තභාවයෙන් වාහක්ක් වී ධ්‍යානයක් හෝ විදර්ශනාවක් හෝ නිශ්‍රයනොකොට රාගනිශ්‍රිත සංකල්ප යෝතුමූ උසුලත් යන අභිප්‍රායයි.

3. ඒ තෘෂ්ණාස්‍රොතස්හු චක්ෂුර්ද්වාරාදීන්ගේ වශයෙන් සියලු රූපාදී ආරම්මණයන්හි වැහෙන හෙයින් ද රූපතණ්හා සමග සද්දතණ්හා, ගන්ධතණ්හා, රසතණ්හා, ඵොට්ඨබ්බතණ්හා, ධම්මතණ්හා යන සියල්ල අභිනවවූවන් සමගින් හෝ ගලාබසින හෙයින් "සබ්බධිසවන්ති" නම්වූ පළිවෙඨනාර්ථයෙන් ද සංසිබ්බනාර්ථයෙන් ද (වෙලුමෙන් හා ගෙතුමෙන්) වැළක් වැනිනුයි "ලතා" නම්වූ තණ්හාව සදෙරින් ඉපිද රූපාදී අරමුණුවල පවතියි; ඒ තෘෂ්ණාලතාව "එසෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති" යන හටගත් තැන් වශයෙන් දැන ශස්ත්‍රයෙන් වන යෙහි හටගත් වැල කපන්නාක් මෙන් මාර්ගප්‍රඥවෙන් මුල් සිඳ දමව් යන අර්ථ වේ.

4. අනුශ්‍රොතසට ප්‍රයාතවූ හෙවත් ගලා බසින්නාවූද, චීවරාදියෙහි පැවති සිනෙහ වශයෙන් තෙත්වූ, තෘෂ්ණාස්නෙහ ම්‍රක්ෂිතවූ ද, තෘෂ්ණාවසික සත්වයාට මෙබඳුවූ සෞමනස්සයෝ වෙත්.

ඒ තණ්හාවසික පුද්ගලයෝ සාතසුඛනිස්සිත වත් සුඛ එසී සුව පිරියෙස්නෝ වෙත්; මෙබඳුවූ යම් ඒ සත්ත්වකෙනෙක් වෙත්නම් ඔහුතුමූ ජාතිජරා ව්‍යාධි මරණයන්ට උපගමනය කරත්මය.

5. මේ සත්ත්වයෝ ත්‍රාසකරණ අර්ථයෙන් තසිණා යයි නම්වූ තෘෂ්ණාවවිසින් පුරස්කෘතයෝ පරිවාරිතයෝව වැද්දාවිසින් ආරණ්‍යයෙහි බැන්දවූ සාවෙක්මෙන් සැසපෙත්; බියවෙත්.

දශවිධ සංයෝජනයෙන් ද, සප්තවිධවූ රාගසඞ්ගාදිය කරණකොට ගෙණ ද සත්ත්වයෝ බැඳි එහි ලැගී දීර්ඝකාලයක් මුළුල්ලෙහි නැවත නැවත ජාති ආදී දුකට එළඹෙත්යයි අදහස වේ.

6. යම් හෙයකින් තැතිගන්නා තෘෂ්ණාවෙන් පෙරටුවූ පිළිවෙළම්ලත් සත්ත්වයෝ බැඳගත් සාවෙක් මෙන් වෙවුලන්නාහු ද එහෙයින් තමන්ගේ විරාගයවූ රාගාදී විගමන ඇති නිර්වාණය පතන්නාවූ කැමතිවන්නාවූ මහණතෙම රහත්මගින් මේ තසිණාව විනොදනය නුදනය නිහරණය කොට බැහැරදමන්නේයයි අර්ථ වේ.

මේ දෙසුන් අවසන්හි බොහෝ පින්ඇත්තෝ සෝවාන්ඵලාදියට පැමිණියාහුය.

ඒ සූකරපොතිකාව ද එයින් චුතවී සුවර්ණභූමියෙහි රජකුලයක උපන්නිය; එයින් චුතවී ගොස් වාරාණසී රටෙහි උපන්නාය; එයින් චුතව සුප්පාරකපට්ටනෙහි අස්වෙළඳ ගෘහයක ද, එයින් සැව අවුත් අනුරාධපුරයෙහි ඉසුරුගෙයක ද, එයිනුත් මැරී ගොස් ඉසුරුගමට දකුණුදිසාවෙහි භොක්කන්ත ග්‍රාමයෙහි සුමන නම් කුටුම්බිකයාගේ දුහිතෘවී නමින් සුමනා නම් වී උපන්නාය.

ඉන්පසු ඇගේ පියාවූ සුමන කෞළඹි පුත්‍රයනමේ ඒ ගම අත්හැර දීඝවාපිරට (දිගාමඩුල්ල) මාමුණි නම් ගමේ විසූයේය;

දුටුගැමුණු මහරජුගේ ඇමතිවූ ලකුණ්ඨක අතිම්බර නමැත්තේ කිසියම් කටයුත්තකින් එහි ගියේ ඇ දැක මහත් මඟුල් කොට ගෙණවුත් මහාපුණ්ණ ග්‍රාමයට (මාපුණුගමට) ගියේය.

ඉක්බිත්තෙන් කොටපබ්බත (කොටගල) මහාවිහාරවාසී මහා අනුල නම් තෙරුන්වහන්සේ ඒ ගමේ පිණ්ඩපාතය පිණිස වඩිනසේක් ඇගේ ගෘහවාරයෙහි වැඩසිටියේ ඇ දැක භික්ෂූන් සමග මෙසේ කීසේක.

“ආවුසො සූකරපොතිකා නාම ලකුණ්ටකඅතිම්බරමහාමච්චස්ස භරියාභාවං පත්තා අහො! අච්ඡරියතානි.”

"ඇවැත්නි! සූකරපොතිකාව වනාහි ලකුණ්ටක අතිම්බර (මිටිඉඹුරු) මහඇමතිගේ බිරිඳබවට පැමිණියා ඔහෝ! අසිරිය"යි.

ඈ ඒ කථාව අසා ඒ ඉකුත්වූ භවයන් උත්ඝාටනයකොට **ජාතිස්සරඥාණය** ලැබුවාය; එකෙණෙහිම උපන් සංවෙග ඇත්තී ස්වාමියාට යාච්ඤාකොට මහත් ඓශ්වර්යයෙන් **පඤ්චබාලක** ථෙරීන්ගේ සන්තිකයෙහි පැවිදිව **තිස්සමහාවිහාරයෙහි මහාසතිපට්ඨානසූත්‍ර** කථා ශ්‍රවණයකොට සෝවාන්ඵලෙහි පිහිටියාය.

ඉන්පසු කාලයක දෙමළුන් මර්දනයකළ කල්හි මවුපියන්ගේ වාසස්ථානයවූ **බොක්කන්ත** ගමට ම ගොස් ඒ ගම වාසය කරන්නී **කල්ලකමහාවිහාරයෙහිදී ආසිවිසොපමසූත්‍රය** අසා **රහත්ඵලයට** පැමිණියාය.

ඕතොමෝ පිරිනිවන්පානා දවසේ භික්ෂු-භික්ෂුණීන් විසින් පුළුවුස්නාලද්දී භික්ෂුණීසඞ්ඝයාට සියලු මේ පුවත නිරතුරුකොට කියා සන්නිපතිත භික්ෂුසඞ්ඝ මැද **මණ්ඩලාරාම** (වට්ටාරම) වාසිවූ **ධම්මභාණක මහාතිස්සථෙරුන්** සමග සංසන්දනයකොට "මම පෙර මනුෂ්‍යයොනියෙන් චුතව **කිකිළියක්** වී එහිදී බල්ලෙක් **සමීපයෙන්** ශීර්ෂච්ඡේදනයට ප්‍රාප්තව මැරීගොස් **රජගහනුවර** උපන්නා පරිබ්‍රාජිකාවන් අතරෙහි පැවිදිගෙන ප්‍රථම ධ්‍යානභූමියෙහි උපනිමි; ඒ **බ්‍රහ්මපාරිසජ්ජයෙන්** චුතවී ගොස් සිටුකුලයක උපනිමි; එයින් නොබෝකලකින් සැව ගොස් **සූකරයොනියෙහි** උත්පත්තියට ගියා එයිනුත් මැරීගොස් **සුවණ්ණභූමියෙහි** උපන්නෙම් එයින්ද චුතවී **සුප්පාරක** පටුන්ගම උපන්නෙමි; එයින් මැරී **කාවෙරී** පටුනෙහි උපන්නෙමි; එයින් චුතවූවා **අනුරාධපුරයට** ඇවිත් උපනෙමි; අනුරාධපුරයෙන් මැරීගොස් **භෝකන්ත ගාම** උත්පත්තියටද, යන මෙසේ සමවිෂමවූ තෙළෙස් ආත්මභාවයක් ලබා දැන් උත්කණ්ඨිත වූයෙමි.

එහෙයින් "**සබ්බෙපි අප්පමාදෙන සම්පාදෙථ**" සියලුදෙනාම සිහිනුවනින් සම්පාදනය කරව්" කියා මහණ මෙහෙණී උවසු උවැසි සිව්පිරිස් සංවෙගයට පමුණුවා පිරිණිවන්පැවාය.

v. **ප්‍රකීර්ණකරණාර්ථ** :-

**සබ්බව**=යම් කෙනෙක් තෘෂ්ණාවශයට යත්නම් ඔවුන්ගේම නිරවශෙෂ පර්‍යාදාන වශයෙන් මේ කීමයි.

——:——

## 7. 3. තණ්හා සූත්‍රප්‍රදීපයයි.

——.——

7\. කිංසු සංයොජනො ලොකො - කිංසු තස්ස විචාරණං,
කිස්සස්ස විප්පහානෙන - නිබ්බානමිති වුච්චති?

8\. නන්දි සංයොජනො ලොකො - විතක්කස්ස විචාරණං,
තණ්හාය විප්පහානෙන - නිබ්බානමිති වුච්චති.

---

## 7 - 4 - ( 7 - 8. )

i. **මාතෘකා:-**

**නන්දිරාග බැම්ම, විතර්ක පාදයෝ, නිර්වාණය.**

ii. **පිණ්ඩාර්ථය:-**

**නන්දිරාගය** බැම්මකි; **විතර්කයෝ** පාද වෙත්; **තෘෂ්ණාප්‍රහාණයෙන් නිර්වාණය** වේ.

iii. **භාවය:-**

**7.** ලෝවැසි දනතෙම කුමක් බන්ධන කොට ඇත්තේද? ඔහුගේ හැසිරෙණ පාදයෝ කවුරුද? කුමක්හුගේ විශෙෂප්‍රහාණයෙන් නිර්වාණයයි කියනු ලැබේද?

8\. ලෝවැසි දනතෙම නන්දිරාගය බන්ධනකොට ඇත්තේය; ඔහුගේ හැසිරෙණ පාදයෝ විතර්කයෝ වෙත්; තෘෂ්ණාහුගේ විශෙෂ ප්‍රහාණයෙන් නිර්වාණයයි කියනු ලැබේ.

iv. **අනුවාදය:-**

"රාගො උප්පජ්ජමානො සත්තෙ බන්ධති පලිබුන්ධෙති තස්මා **කිඤ්චනන්ති** වුච්චති.

රාගො උප්පජ්ජමානො චිත්තං මලිනං කරොති මලං ගාහාපෙති තස්මා **මලන්ති** වුච්චති.

යස්මා රාගාදිසු චෙව කායදුච්චරිතාදිසු ච සත්තා පක්ඛලන්ති; පක්ඛලිතා ච පන සාසනතො'පි සුගතිතො'පි පතන්ති; තස්මා පක්ඛලනපාතනහෙතුතො රාගො **විසමන්ති** ආදි වුත්තං.

අනුදහනට්ඨෙන අග්ගිවියා'ති රාගග්ගීති; රාගො උප්පජ්ජමානො සත්තෙ අනුදහති, ඣාපෙති තස්මා අග්ගීති වුච්චති."

"එක් දහර **මෙහෙණින්නක් සිතුල්පව්** විහාරයෙහි උපොසථාගාරයට ගොස් චාරපාලක රූපයක් බලමින් සිටියාය; ඉක්බිති ඇගේ ඇතුළත රාගය උපන; ඒ මෙහෙණිතොමෝ එසින්ම

දූවී කාලක්‍රියාකළාය; මෙහෙණින්නෝ යන්තියෝ මේ දහර මෙහෙණී සිටියා දැක ඈ කැඳවා එව් යයි කීවාහුය; එක් මෙහෙණක් ගොස් කුමක් නිසා සිටින්නී දැයි අත්වලින් අල්වාගත්තාය; අතින් ගත්පමණින් ඈ පෙරළී බිම වැටුනාය; මේ රාගයෙන් අනුදහනයට කථාවස්තුවකි.”

“යා'යං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී සෙය්‍යථිදං? කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා.”

“අභිනන්දන සඞ්ඛාතෙන නන්දිරාගෙන සහගතාති නන්දිරාග සහගතා, නන්දිරාගෙන සද්ධිං අත්‍ථතො එකත්තමෙව ගතාති වුත්තං හොති.

තත්‍ර තත්‍රාභිනන්දිනීති යත්‍ර යත්‍ර අත්තභාවො, තත්‍ර තත්‍රාභිනන්දිනී; රූපාදිසු වා ආරම්මණෙසු තත්‍රාභිනන්දිනී, රූපාභිනන්දිනී, සද්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්මාභිනන්දිනීති අත්‍ථො. සෙය්‍යථිදන්ති නිපාතො. තස්ස සා කතමා'තිචෙ?ති අත්‍ථො.

කාමතණ්හාති කාමෙ තණ්හා “කාමතණ්හා,” පඤ්චකාම ගුණිකරාගස්සෙතං අධිවචනං; භවෙ තණ්හා “භවතණ්හා”, භව පත්‍ථනාවසෙන උප්පන්නස්ස සස්සතදිට්ඨිසහගතස්ස රූපාරූප භවරාගස්ස ච ඣානනිකන්තියා චෙතං අධිවචනං.

විභවෙ තණ්හා “විභවතණ්හා”, උච්ඡෙද දිට්ඨි සහගතස්ස රාගස්සෙතං අධිවචනං.”

මේ අටුවා පෙළ පාඨානුසාරයෙන් ද නන්දිරාග සහගත තෘෂ්ණාවගේ “වස්තු විස්තරය” දක්ක හැකියි.

1. ලොකයෙහි වනාහි චක්ෂුරාදියෙහි මමත්වය නිසා අභිනිවිෂ්ටවූ සත්වයෝ සම්පත්තියෙහි පිහිටා තමාගේ ඇස කැඩපත් ආදියෙහි නිමිත්තග්‍රහණානුසාරයෙන් විප්‍රසන්න පඤ්චප්‍රසාද ඇත්ත රන්විමනක උග්ඝාටිත (එල්වාතැබූ) මාණික්‍යමය සීමැදුරු කවුළුවක් මෙන් කල්පනා කරති.

2. සෙද සවන් රජත ප්‍රණාලිකාවක් (රිදීපිල්ලක්) මෙන් ද, පාමඩගසූත්‍ර (නූරුවලා) හුයක් මෙන් ද, හගින්.

3. තුඩගනාස යයි ලත් වහර ඇති ඝාණය වට කොට තැබූ හිරියල් වැටියක් මෙන් සලකත්.

4. **දිව** රක්ත කම්බල පටලයක් මෙන් මෘදු සිනිඳු මිහිරි රස දෙන්නකැයි හඟිත්.

5. **කාය** සාලලට්ඨියක් (තරුණ සල්ගසක්) මෙන් ද සුවර්ණ තෝරණයක් මෙන් ද සලකත්.

6. **සිත** අන්‍යයන්ගේ මනසින් අසදෘශකොට උළාර යයි හඟිත්.

**රූපය** සුවර්ණකර්ණිකාරපුෂ්පාදි වර්ණයක් මෙන් ද, **ශබ්දය** මත් කුරවිකෙවිල්හඬක් මෙන්ද, මන්දධමිතමණිවංසනිර්ඝෝෂයක් මෙන් ද, තමා විසින් ලබාගත්තාවූ **චතුස්සමුට්ඨානික** ගන්ධාරම්ම**ණාදිය** වෙත කවරෙකුට මෙබඳු අරමුණු ඇත් දැයි කල්පනා කරත්.

මෙසේ සලකන්නාවූ ඒ සත්ත්වයන්ට ඒ ඇස් ආදීහු ප්‍රිය රූපයෝ වෙත්; සාතරූපයෝද වෙත්; එසේ ඇතිකල ඔවුන්ට ඒ ඇස් කන් නාසාදියෙහි පෙරනූපන් තන්හාවද උපදියි; උපන් තෘෂ්ණාවද නැවත නැවත ප්‍රවෘත්ති වශයෙන් පිහිටයි; වැදගණියි; නිවිසෙයි; එහෙයින් භාග්‍යවතුන් වහන්සේ "චක්ඛුං ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති". යනාදිය වදාළසේක.

v. **ප්‍රකටීකරණාර්ථ:-**

**කිංසු සංයොජනො**=කුමක් සංයොජනවීද, කුමක් බන්ධනවීද;

**විතක්කස්ස විචාරණං**=විතර්කය ලොකයාගේ ඒ ඒ භවාදියෙහි හසුරුවන පාදයෝ වෙත්.

——:——

## 7. 4. සංයොජන සූත්‍රප්‍රදීපයයි.

——:——

9. කිංසු සම්බන්ධනො ලොකො - කිංසු තස්ස විචාරණං,
කිස්සස්ස විප්පහානෙන - සබ්බං ඡින්දති බන්ධනන්ති?.

10. නන්දි සම්බන්ධනො ලොකො - විතක්කස්ස විචාරණං,
තණ්හාය විප්පහානෙන - සබ්බං ඡින්දති බන්ධනන්ති.

---

**7 – 5 ( 9 – 10. )**

i. **මාතෘකා:-**

**සියලු බැඳුම් සිඳ හැරීම.**

ii. **පිණ්ඩාර්ථය:—**

නන්දිය ලොකසම්බන්ධයයි; විතර්කය චරණයයි; තෘෂ්ණා විප්‍රහාණය සියලු බැඳුම් සිඳීමයි.

iii. **භාවය:-**

9. ලෝවැසිතෙම කුමක් බන්ධනකොට ඇත්තේද? ඔහුගේ විචාරණයෝ කවරහුද? ඒ කුමක්හුගේ විශෙෂප්‍රහාණයෙන් සියලු බව බැඳුම් සිඳීද?

10. ලෝවැසිතෙම නන්දිරාගය බන්ධනකොට ඇත්තේය; ඔහුගේ විතර්කයෝ විචාරණ (පාද) යෝයි. තෘෂ්ණාහුගේ විශෙෂ ප්‍රහාණ හේතුවින් සියලු බවබැඳුම් සිඳියි.

iv. **අනුවාදය:-**

"**විතක්කණං** විතක්කො; ඌහණන්ති වුත්තං හොති. ස්වායං ආරම්මණෙ චිත්තස්ස අභිනිරොපණ ලක්ඛණො, ආහනන පරියාහනන රසො, තථා හි තෙන යොගාවචරො ආරම්මණං විතක්කාහතං විතක්කපරියාහතං කරොතීති වුච්චති; ආරම්මණෙ චිත්තස්ස ආනයනපච්චුපට්ඨානො.

**විචරණං** විචාරො, අනුසඤ්චරණන්ති වුත්තං හොති; ස්වායං ආරම්මණානුමජ්ජනලක්ඛණො, තත්ථ සහජාතානුයොජනරසො, චිත්තස්ස අනුප්පබන්ධනපච්චුපට්ඨානො.

සන්තෙ'පි ච තෙසං කත්ථචි අවිප්පයොගො ඔළාරිකට්ඨෙන ඝණ්ටාභිඝාතසද්දො විය චෙතසො පඨමාභිනිපාතො විතක්කො.

සුඛුමට්ඨෙන අනුරවො විය අනුප්පබන්ධො විචාරො, විප්ඵාරවා චෙත්ථ විතක්කො පරිප්ඵන්දභාවො චිත්තස්ස, ආකාසෙ උප්පතිතුකාමස්ස පක්ඛිනො පක්ඛවික්ඛෙපො විය පදුමාභිමුඛපාතො විය

ච ගන්ධානුබන්ධචෙතසො භමරස්ස සන්තානවුත්ති විචාරො; න අති පරිප්ඵන්දභාවො චිත්තස්ස; ආකාසෙ උප්පතිතස්ස පක්ඛිනො පක්ඛප්පසාරණං විය පරිබ්භමණං විය ච පදුමාභිමුඛපතිතස්ස භමරස්ස පදුමස්ස උපරිභාගෙ; සො පන තෙසං විසෙසො පඨම දුතියජ්ඣානෙසු පාකටො හොති; ඉති ඉමිනා ච විතක්කෙන ඉමිනා ච විචාරෙන සහවත්තති රුක්ඛො විය පුප්ඵෙන ච ඵලෙන චාති."

විතර්කය ථීනමිද්ධයට ප්‍රතිපක්‍ෂයි, විචාරය විචිකිච්ඡාවට ප්‍රතිපක්‍ෂයි; "විතක්කනං විතක්කො"යි කියනලද්දේ යථාප්‍රත්‍යය සේ පවත්නාවූ ස්වභාව ධර්මයන්ගේ කිසියම් වසවර්තිතාවක් නැති හෙයින් කල්පනාකිරීම් මාත්‍රය තමාගේ ප්‍රත්‍යයයන්ගෙන් පැවැත්ම පමණක්මනුයි භාවනිර්දෙශ හෙයිනි; ඒ මේ විතක්කනය නම් මේ මෙසේ යයි ආරම්මණපරිකල්පනා යයි කියේය. යම්හෙයකින් සිත විතර්කබලයෙන් අරමුණට නැංගාක් මෙන් වේද එහෙයින් ඒ විතර්කයතෙමේ ආරම්මණඅභිනිරොපනලක්‍ෂණ යයි කියන ලද්දේය.

යම් සේ වනාහි කිසිවෙක් රාජවල්ලභවූ නෑයෙක් හෝ මිත්‍රයෙක් නිසා රජගෙදරට ඇතුල් වේ ද, අනුප්‍රවිෂ්ඨ වේ ද, එසේම විතර්කය නිසා සිත අරමුණට නගියි. ඉදින් එසේ නම් අවිතර්කචිත්තය කෙසේ අරමුණට නගිදැයි? විතර්ක බලයෙන්ම අරමුණට නගියි. යම්සේ රාජවල්ලභ ඤාති මිත්‍ර කෙනෙක් නිසා රජගෙදරට ගොස් පුරුදු පුරුෂතෙමේ ඒ පුරුද්ද කාරණකොටගෙණ රාජවල්ලභයා නැතිව ද නිරාසංකව රාජගෘහයට පිවිසේ ද, එමෙන් පුරුද්දෙන් විතර්කයෙන් වෙන්වත් අවිතර්කචිත්තයතෙමේ ආරම්මණයට ආරොහණය වෙයි.

මෙහි 'පුරුද්දෙන්' යනුද සන්තානයෙහි පැවති විතර්කභාවනා සඞ්ඛ්‍යාත පරිචයෙන් යනුයි.

විතර්කයට වනාහි සියසතන්හි නිරතුරු පැවතීම්හුගේ වසයෙන් චිත්තය තමා ආරම්මණාභිරූහනය චිරපරිචිත වේ.

එහෙයින් ඒ සිත කිසියම්කලකදී විතර්කයෙන් වෙන්ව ද ඒ අරමුණෙහි පවතීමය.

යම්සේ ඒ සිත ඥානසහිතවූවක් වී සම්මසනවශයෙන් බෝකල් පුරුදුද; කිසිවිටක ඥාන රහිතවූවක් වී සම්මසනවශයෙන් පවතියි.

යම් සේ හෝ කෙලෙස් සහිත ව පැවැත්තේ සර්වප්‍රකාරයෙන් කෙලෙස් රහිතවත් පුරුද්දෙන් කිලෙසවාසනා වසයෙන් පවතිද එමෙන් සියල්ල දතයුතුයි.

ආහනන පරියාහනන රසයයි ආදියෙන් අභිමුඛකොට හෝ හනනය හඬනැගීම "**ආහනන**" යයි.

හාත් පසින් පෙරලා හෝ ආහනනය පරියාහනනයයි; රූපං, රපා, පඨවී, පඨවී කියා ආකොටනය කරන්නහුට මෙන් (තැළීම) පැවැත්ම **ආහනනයයි** ද **පරියාහනනයයි** ද වෙදි තව්‍යයි.

යම් ආරම්මණයෙක්හි සිත අභිනිරොපණය කරයිද ඒ අරමුණ ඒ සිතට ගැණීමට යොග්‍යකරන්නාවූ විතර්කයතෙමේ ගසන්නාක් මෙන් වේ.

එය **එසේ** නම් **නාගසෙන** ස්ථවිරයන්වහන්සේ විසින් "ආකොටනලක්ඛණො විතක්කො; යථා මහාරාජ භෙරි ආකොටිතා, අථ පච්ඡා අනුරවති, අනුසද්දායති; එවමෙව ඛො මහාරාජ යථා **ආකොටනා** එවං **විතක්කො** දට්ඨබ්බො; අථ පච්ඡා අනුරවනා අනුසද්දනා එවං **විචාරො** දට්ඨබ්බො" කියා ආකොටන ලක්ෂණතාවය විතර්කය සම්බන්ධ කුමකින් කියනලද්දීද, මේ විරොධ නොවේ; තෙරුන් විසින් වනාහි කාර්‍ය්‍යසන්නිශ්‍රිතකොට ලක්ෂණ කියනලදී. ධර්මයන්ගේ වනාහි ස්වභාවවිනිර්මුක්තවූ කිසියම් ක්‍රියාවක් නම් නැත්තේය. ගතයුතු ආකාරයද එසේමය. **බොධනෙය්‍ය ජනානුරොධයෙන්** වනාහි පරමාර්ථයෙන් එකීභාවය ඇත්තේද ස්වභාවධර්මයතෙමේ පරියාය වචන වලින් මෙන් සමාරොපිත (ආරූඪ කරණලද) රූප වලින් බොහෝ ප්‍රකාරයන් ගෙන් ප්‍රකාශ කරනු ලැබේ; එසේ ඇතිකල්හි **පරමාර්ථය**තෙමේ මනාකොට ප්‍රකාශකරණ ලද්දේ වේ.

**ආනයනය** පච්චුපට්ඨානයයි. මෙහි **ආනයනය** නම් සිතෙහි ආරම්මණයාගේ උපනයනයයි; ලඟට පැමිණවීම හෝ ඇද ගැණීමයි; අනුසඤ්චරණයයි; අනුපරිබ්‍රමනයයි; ඒ මේ විශෙෂය ස්වසන්තානයෙහි ලැබෙනකල්හි ම සන්තානයෙහි ප්‍රකට වේයයි දක්ක යුතු වේ; සෙසු ධර්මවිෂයෙහිදු මේ ක්‍රමයම වේ.

**අනුමජ්ජනය** යනු අරමුණෙහි චිත්තයාගේ අනුමර්සනයයි; පරිමජ්ජන (පිරිමැදීම)යි අර්ථ වේ.

ඒ එසේ මැයි: විචාරයතෙමේ පිරිමදින අත්දෙක මෙන් ද හැසිරෙණ අත මෙන් දූයි කියන ලදී.

අරමුණෙහි සහජාතයන්ගේ **අනුයෝජනය** අරමුණෙහි අනු විචරණ සංඛ්‍යාත අනුමජ්ජන වසයෙන්ම දතයුතුයි.

**අනුප්පබන්ධනය** නම් අරමුණෙහි සිත නොකඩවූවාක්මෙන් පැවැත්මයි. ඒ එසේමැයි: **"සො අනුප්පබන්ධනතායි"** නිර්දේශ කරණලදී. එහෙයින්ම ඝණ්ඨාවක අනුරවය මෙන්ය, බමරහුගේ පරිභ්‍රමණය මෙනැයි ද කියනලදී.

කිසියම් තැනක යයි ප්‍රථමධ්‍යානයෙහි පරිත්ත චිත්තොත්පාද යන්හිද, ඖදරිකාර්ථ යෙනැයි විචාරයාගේ ඖදරිකාර්ථයෙහි.

යම් සේ වනාහි **ඝණ්ඨාභිඝාතශබ්දය**තෙම ප්‍රථමාභිනිපාත වෙයි; එමෙන් අරමුණට අභිමුඛව නිරෝපනය (නැගීම්) කරණ අර්ථයෙන් විතර්කයතෙමේ චිත්තයාගේ ප්‍රථම අභිනිපාතය (පළමු ඉදිරිපත්වීම) මෙන් වේ යයි **ඝණ්ඨාභිඝාතශබ්දය** මෙනැයි යනාදිය කීහ.

මෙහි **විප්ඵාරය** නම් විතර්කය තමා පිහම්ඩයට ප්‍රතිපක්‍ෂවූයේ ආරම්මණයෙහි අනොලීනතා අසංකොචය (නොහැකිලීම) යි. ඒ විප්ඵාරය වනාහි අභිනිරෝපනභාවයෙන් චලනය මෙන් වේ යයි යන අදහසින් චිත්තයාගේ පරිප්ඵන්දනභාව යයි කීහ.

පරිභ්‍රමණය මෙනැයි මෙහි පරිශ්‍රයාභාවවිමංසනය පිණිස පිරිබමනැයි දතයුතුයි.

(දුකනිපාත අටුවාකථාවෙහි) අහසෙහි යන්නාවූ මහත් **ලිහිණිසෙකුගේ** දෙ අත්හැන්දෙන් වාතය ගෙණ පියාපත් බාගත යන්නාක් මෙන් අරමුණෙහි සිත තංවා තැබීමෙන් පැවැත්තේ **විතර්කය**යි.

වාතග්‍රහණය පිණිස පියාපත් සොලවන්නහුගේ ගමන මෙන් අනුමජ්ජනභාවයෙන් පැවතියේ **විචාරය**යි කියනලදී. ඒ කීම අනුප්‍රබන්ධවශයෙන් ප්‍රවෘත්තියෙහි යෙදෙයි.

ඒ එසේමැයි: උපචාරයෙහි හෝ අර්පණාවෙහි හෝ සන්තානයෙන් පැවැත්මෙහි විතර්කය නිශ්චලව අරමුණට බැසගෙණමෙන් පවතියි; පළමු අභිනිපාතය (වැටීම) ප්‍රකට නොවේ.

යම් සේ අපුබ්බාරම්මණයෙහි ප්‍රථම අභිනිපාතවූ **විතර්කය** විප්ඵාර හෝ වෙයි. එකම අරමුණෙහි නිරතුරු අනුප්‍රබන්ධවශයෙන් පැවැත්මෙහි එසේ නොවේ; එහි ඉතා පැතිරීම් වශයෙන්

නොපවත්නේ වෙයි; සන්සුන් භාවයෙනි. **ප්‍රථමධ්‍යාන-ද්විතීය ධ්‍යාන** දෙක්හි ප්‍රකට වේ යයි **විතර්කයාගේ** විශෙෂයවූ අභිනිරොපනාකාරය ඖළාරික බැවින් ප්‍රථමධ්‍යානයෙහිදී ප්‍රකට වෙයි.

ඒ විතර්කය නැති බැවින් පඤ්චකනයවූ ද්විතීයධ්‍යානයෙහි **විචාරයාගේ** විශෙෂයවූ අනුමජ්ජනාකාරය ප්‍රකට වේ; මේ මෙහි තවත් නයක් වේ.

මලබැඳි රන් බඳුනක් එක් අතකින් දැඩිකොට ගෙණ අනික් අතින් සුණුතෙල් එළුලොම් ආදියෙන් කළ සුඹුලකින් පිරිමදින් නහුගේ දැඩිකොට ගන්නා අතමෙන් **විතර්කයද** පිරිමදින අත මෙන් විචාරයද;

තවද දඬුපහරින් සක බමවා බඳුන් කරණ කුඹලාගේ මැටි පිඩු උපුල්ලන අතමෙන් **විතර්කයද** ඒ කුම්භකාරයාගේම ඔබ මොබ හසුරුවන අත මෙන් **විචාර** යද;

එසේම කාංසභාජනාදියෙහි කිසියම් මඬුලු වට රේඛාවක් කරන්නහුට භාජනමධ්‍යයෙහි සිටුවාතැබූ කටුවක් මෙන් අභිනිරොපන **විතර්කයද** පිටත්හි කරකැවෙන කටුවමෙන් අනුමජ්ජනවූ **“විචාර”** ද දතයුතුයි.

යම් සේ මල් ගෙඩි අතු ආදී අවයවවිනිර්මුක්තවූ අවිද්‍යමාන වූද වෘක්ෂය තෙමේ “**සපුප්ඵො රුක්ඛො-සඵලො රුක්ඛො**” (මල් ගස ය පලතුරු ගස ය) කියා ව්‍යවහාර කෙරේ ද, එසේම විතර්කාදි අඞ්ගවිනිර්මුක්තවූ අවිද්‍යමානප්‍රඥප්තිවූ **ධ්‍යානය** සවිතර්කය-සවිචාරයයි ව්‍යවහාර කරනු ලැබේ යයි දක්වන්නට **“රුක්ඛොවිය”** යනාදිය කියනලදී. කාමවිතර්කාදිය ප්‍රසිද්ධයි.

v. **ප්‍රකාශිකරණාර්ථ:-** යට කී නයයි.

——:——

# 7. 5. බන්ධන සූත්‍රප්‍රදීපයයි.

——:——

**11. කෙනස්සුඛාභතො ලොකො-කෙනස්සු පරිවාරිතො,**
**කෙන සල්ලෙන ඔතිණ්ණො-කිස්ස ධූමායිතො සදා'ති?.**

**12. මච්චුනාඛාභතො ලොකො-ජරාය පරිවාරිතො,**
**තණ්හාසල්ලෙන ඔතිණ්ණො-ඉච්ඡා ධූමායිතො සදා'ති.**

---

## 7 - 6 - ( 11 - 12. )

i. **මාතෘකා:-**

**ලොකය දුම් ගසන ආකාරය.**

ii. **පිණ්ඩාර්ථය:-**

ලෝවැසිතෙම මාරයාවිසින් එලවනලදුව ජරාවෙන් වටකොට තෘෂ්ණාඋලෙන් ඇණ ඉච්ඡාවෙන් දවනුලබයි.

iii. **භාවය:-**

11. ලෝවැසිතෙම කුමක් විසින් අනි ආහතද? (එලවාගෙන ආවේද?) කුමකින් පිරිවරණ ලද ද? කුමන උලකින් යට බැස්විද? කුමකින් හැම කල් දුම් ගසන්නේද?

12. ලෝවැසිතෙම **මරුවා** විසින් අභිආහරණය කරණ ලද්දේය. **ජරාව** විසින් පිරිවරණ ලද්දේය. **තෘෂ්ණාශල්‍යයෙන්** බැසගන්නා ලද්දේය. හැම කල්හි **ඉච්ඡාවෙන්** ඇවිල ගන්නා ලද්දේ වේ.

iv. **අනුවාදය:-**

**"ජරාය පරිවාරිතො"** **යන මෙහි ජරාවිභාගය.** "ජරා ජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො අයං වුච්චති ජරා"

**ජරානිද්දෙසයෙහි** "ජරාව" යනු සවභාවාර්ථ ප්‍රථමාය. "ජීරණතා" යනු ආකාර නිදසුණයි. "ඛණ්ඩිච්චං" යනාදී පද තුන කාලාතික්‍රමයෙහි කෘත්‍යනිදේශයි. පසුව කී පදදෙක ප්‍රකෘති නිදේශයි.

මෞ නොමෞ වනාහි ජරා යන මේ පදයෙන් සැබැවින් දක්වන ලදී. එයින් "ජරා" පදයට සභාව පච්චත්තය (ප්‍රථමා)වේ.

**ජීරණතා**-යනු මේ ආකාර හෙයින් ඒ පදයට ආකාර නිදසුණ වී; "ඛණ්ඩිච්චං" යන මෙයින් කල්යැමෙදි දත් නිය ඛණ්ඩිත භාවකරණ කිසෙන්ද, "පාලිච්චං" යන මෙයින් කෙස් ලොම් පලිතභාවකරණ කෘත්‍යයෙන්ද, "වලිත්තචතා" යන මෙයින් මාංස මලාතිකකොට සමෙහි වලිතභාවකරණ කිස හෙයින් ද දක්වී.

එහෙයින් ඒ ජරාවට මේ ඛණ්ඩ ඵලිත වලිතවතා තුන්දෙන කාලාතික්‍රමකෘතත්‍ය නිදේශයෝ වෙත්; ඒ පදවලින් මේ විකාරයන් දැකීම් වසයෙන් පහලවූවාහ යි ප්‍රකටජරාව දක්වන ලදී.

යම් සේ වනාහි ජලය හෝ වාතය හෝ ගින්න හෝ ගිය මග තෘණ වෘක්‍ෂාදීන් සංසග්ගප්‍රතිභග්නතාවෙන් (හැනීම් පැටළීම්) හෝ දමුවීමෙන් ප්‍රකට වේ ද,

ඒ උදකාදීන් ගතමාගීයතෙමෙ ඒ උදකාදීන්ගෙන්ම ප්‍රකට නොවේ ද,

එපරිද්දෙන්ම ජරාවගේ ගතමාගීයතෙමේ දත් ආදියෙහි ඛණ්ඩිච්චාදි වසයෙන් ප්‍රකට වේ. චක්‍ෂුර් උන්මීලනය(ඇස් ඇරීම) කොටද දැන ගනු ලැබේ. ඛණ්ඩිච්චාදිය නො එසේය; ජරාව නොඑසේය; ජරාව ඇසින් දැක්කහැකි නොවේ ම ය.

"ආයුනො සංහානි ඉන්‍ද්‍රියානං පරිපාකො". යන මේ පද වලින් වනාහි කාලාතික්‍රමයෙහිම අභිව්‍යක්තවූ ආයුක්‍ෂය හා චක්‍ෂුරාදි ඉන්‍ද්‍රිය පරිපාක සඞ්ඛ්‍යාතවූ ප්‍රකෘතියෙන් ජරාව දක්වීතලදී.

එහෙයින් ඒ ජරාව පිළිබඳ මේ පසුව කී ආයුසංහානියත් ඉන්‍ද්‍රියපරිපාකයත් දෙක ප්‍රකෘතිනිද්දේශයෝයි දතයුත්තාහ. එහි යම් හෙයකින් ජරාවට පැමිණියහුට ආයු ගෙවේද එහෙයින් ජරාව ආයුසංහානි යයි ඵලූපචාරන්‍යායයෙන් කියනලදී.

යම් හෙයකින් දහරකාලයෙහි සුප්‍රසන්නවූ සියුම්වූ තමූත් ආත්ම විෂයවූ දේ සුවයෙන් ම ගැන්මට සමර්ථවූ චක්‍ෂුරාදී ඉන්‍ද්‍රිය යෝ ජරාවට ප්‍රාප්තයා සම්බන්ධව පරිපක්වවූවාහු ආලුලිතවූවාහු අවිසදයෝව ඖදාරිකවූ තමූත් තමාට විසය දේ ගන්ට අසමර්ථ වෙත්ද; එයින් ඉන්‍ද්‍රියපරිපාකය ජරාව යයි එලොපචාරයෙන් කියනලදී.

ඒ මේ සියලුම ජරාතොමෝ මෙසේ නිද්දිෂ්ඨවූවා ප්‍රකට ජරාවය, ප්‍රතිච්ඡන්න ජරාවය කියා ද්විප්‍රකාර වේ.

ඒ ද්විප්‍රකාරයෙහි දත් ආදියෙහි ඛණ්ඩාදිභාවය පෙන්වන හෙයින් රූපධර්මයන් අතරෙහිවූ ජරාව පාකටජරා නම්.

අරූප ධර්මයන් අතරෙහිවූ ජරාව එබඳු විකාර නොපෙන්වන හෙයින් පටිච්ඡන්න ජරා නම්.

එහි යම් මේ ඛණ්ඩාදිභාවයක් පෙනේද ඒ එබඳු දත් ආදිය පිළිබඳ සුවිඥෙය්‍ය බැවින් වණ්ණයම වේ; ඒ වණ්ණය ඇසින් දැක සිතින් සිතා මේ දත් ජරාවෙන් පහට යයි (ජරාපාටැයි) ජරාව දැනගණියි.

උදකස්ථානයෙහි බද්ධවූ ගොසිඞ්ගාදිය (ගෙරි අං ආදිය) බලා දක්නේ යට ජලය ඇති බැව් දැනගැණීම මෙනි.

තවද අවීචිජරාව, සවීචිජරාව යයි මෙසේත් මේ ජරාව ද්විවිධ වේ.

ඒ දෙවිදියෙන් මාණික්‍ය, රන්, රිදී, පබළු, වජ්‍ර සූර්‍යකාන්තාදීන්ගේ හා මණ්ඩදසඛාදියෙහි ප්‍රාණීන්ගේ මෙන්ද, පුෂ්ප ඵල පල්ලවාදියෙහි අප්‍රාණීන්ගේ මෙන්ද අතරතුර වර්ණ විශෙෂාදීන් දුර්විඥෙයත්වයෙන් (වන් වෙසෙස් නොදතහැකි බැවින්) ජරාව අවීචිජරා නම් වේ. නිරතුරුජරා යයි යන අදහසයි.

එයින් අන්‍යවූ කී පරිදි වස්තූන්හි වනාහි අනන්තරනන්තරයෙන් වර්ණවිශෙෂාදීන් මොනවට දතහැකි බැවින් ජරාව තොමෝ සවීචිජරා නම්; එයින් සවීචිජරාව, උපාදින්න සවීචි ජරාව-අනුපාදින්න සවීචි ජරාව වසයෙන් මෙසේ දැක්විය යුතු වේ.

දහරකුමරුවන්ට වනාහි පළමුවෙන්ම කිරිදත් නම් නගිත්; ඒ දත් තිරනැත. ඒ කිරිදත් මැටුනු කල්හි නැවත දත් නගිත්, මතුවෙත්; ඒදත් ප්‍රථමයෙන් සුදුවෙත්. ජරා වාතයෙන්ප්‍රහත කාලයෙහි වනාහි කළුවන් වෙත්.

හිසකෙස් වනාහි පළමුකොටම තඹපාට ද වෙත්; කළුපාට ද වෙත්; සුදුපාට ද වෙත්. සිවිය වනාහි ලේසහිත වේ. වැඩෙන්නට වැඩෙන්නට ඔදාතයන්ගේ ඔදාත බවද කාලකයන්ගේ කාලක බවද පෙනෙයි; ජරාවාතයෙන් පහරනු ලැබූකල වලි ගණියි; රැලි වැටෙයි.

සියලුම ගොයම් වපුලකල්හි සුදුවෙයි; පසුව නිල් වේ. ජරා වාතයෙන් පහට කලැ වනාහි පඬුවන් වේ. මෙය අඹ අකුරකින් ද දක්වන්නට වටියි.

"අයං වුච්චති ජරා"යි, මේ ජරා නම කියනු ලැබේ; ඒ මේ ජරාතොමෝ ස්කන්ධපරිපාක ලක්ෂණ වූවාය, මරණූපනයන රස වේ; යෞවන විනාශය ප්‍රත්‍යුපස්ථාන වේ; **ජරාවගේ දුක්ඛට්ඨය වෙදිතබ්බයි.**

මෙහි වනාහි මේ ජරාවත් තොමෝම දුක්නොවන්නීය. දුඃඛයාගේ වස්තුභාවයෙන් දුක් යයි කියනලදී; කවර නම් දුක්ඛට වස්තුද? කායදුක්ඛයටද දෞර්මනස්ස දුක්ඛයටද වස්තු බැවිනි. ජීර්ණයාගේ ආත්මභාවය වනාහි දිරූ ගැලක් මෙන් දුබල වේ; සිටින්නට හෝ යන්නට හෝ හිඳින්නට හෝ වෑයම්කරන්නහුට බලවත් කායදුක්ඛය උපදියි; පුත්‍රදාරවන් පෙර මෙන් නොසලකන කල්හි දෙම්නස් උපදියි. මෙසේ මේ දෙවිදියේ දුක්වලටම වස්තු බැවින් දුක්යයි දතයුතුයි. තවද;

"අඞ්ගානං සිථිලීභාවා-ඉන්ද්‍රියානං විකාරතො,
යොබ්බනස්ස විනාසෙන-බලස්ස උපඝාතතො.

විප්පවාසා සතාදීනං-පුත්තදාරෙහි අත්තනො,
අපසාදනීයතො චෙව-භීයො බාලත්තපත්තියා.

පප්පොති දුක්ඛං යං මච්චො-කායිකං මානසං තථා,
සබ්බමෙතං ජරාහෙතු-යස්මා තස්මා ජරා දුඛා'ති".

v. **ප්‍රකීර්ණකාර්ථ:—**

**කෙනස්සුබ්භාහතො**=මෙහි "සු" කාරය නිපාත මාත්‍රයකි. කුමකින් අභිමුඛයට ආහත ද යන අර්ථයි.

**ඉච්ඡා ධූමායිතො**=ඉච්ඡාවෙන් ඇවිලෙන ලද්දේය.

—:—

# 7. 6. අබ්භාහත සූත්‍රප්‍රදීපයයි.

—:—

13. කෙනස්සු උඩ්ඩිතො ලොකො
කෙනස්සු පරිවාරිතො,
කෙනස්සු පිහිතො ලොකො
කිස්මිං ලොකො පතිට්ඨිතො'ති?

14. තණ්හාය උඩ්ඩිතො ලොකො
ජරාය පරිවාරිතො,
මච්චුනා පිහිතො ලොකො
දුක්ඛෙ ලොකො පතිට්ඨිතො'ති.

---

7 - 7 - (13 - 14)

i. **මාතෘකා**:—

**මරහුවිසින් ලෝකය පියනලද බව හා දුකෙහි පිහිටිබව.**

ii. **පිණ්ඩාර්ථය**:—

තණ්හාවෙන් උඩ එල්වා, ජරාවෙන් පිරිවරා, මරණයෙන් වැසූ ලෝකය දුකෙහි පිහිටියේය.

iii. **භාවය**:—

13. ලෝකයතෙම කුමකින් උල්ලඹියිතද? කුමකින් පිරි වරණලද දැ? කුමකින් වසනලද දැ? කුමක පිහිටියේද?

14. **සංඛාතනය ලෝකය** තෘෂ්ණාවෙන් උල්ලඹියිතයි; **ජරාවෙන්** පිරිවරණලදී; මරුවා විසින් වසාලන ලද්දේය; දුකෙහි පිහිටියේය.

iv. **අනුවාදය**:—

**“මච්චුනා පිහිතො ලොකො”** මරණ විභාගය:-“චුති චවනතා භෙදො අන්තරධානං මච්චු මරණං කාලකිරියා ඛන්ධානං භෙදො කළෙබරස්ස නික්ඛෙපො ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදො ඉදං වුච්චති මරණං.”

**මරණ නිර්දේශයෙහි** වචනක වශයෙන් චුති කියා වේ; එක් සිව් පස් කඳු පිළිබඳ චුතියට මෙය සාමාන්‍ය වචනයකි.

**චවනතා**-යනු භාව වචනයෙන් ලක්ෂණ නිදර්ශනයයි; **භෙදො** යනු චුතියයි; ස්කන්ධයන්ගේ භඞ්ගොත්පත්ති පරිදීපනයයි.

**අන්තරධානං**-යනු බිඳුනු කලයක්මෙන් භින්නවූ චුතවූ ස්කන්ධයන්ගේ යම්කිසි ක්‍රමයකින් තුබූ තැනින් වෙන්වීම දක්වීමයි.

**මච්චු මරණං**-යනු මෘත්‍යුසඞ්ඛ්‍යාත මරණයයි; කාල නම් **අන්තකයාය;** ඒ අන්තක (වසවර්තිමාර)යාගේ ක්‍රියාව කාලක්‍රියා වයි; මෙ පමණකින් සම්මුතියෙන් මරණය දක්වනලදී.

දැන් පරමාර්ථයෙන් දක්වන්නට **"ඛන්ධානං භෙදො"** යනාදිය වදාළසේක; පරමාර්ථයෙන් වනාහි ස්කන්ධයෝම බිඳෙත්; සත්ත්වයා නම්වූ කිසිවෙක් නොමැරෙයි; ස්කන්ධයන් බිඳෙනකල්හි වනාහි "සත්ත්වයා මැරෙයි" කියා ද, බුන්කල්හි **මළේ** යයි ද, ව්‍යවහාර වේ. මෙහිදු චතුවොකාර පඤ්චවොකාර වශයෙන් **ස්කන්ධ භෙදය** වේ; "එකවොකාර" භවවශයෙන් කලෙබර නික්ඛෙපය වේ. "චතුවොකාර" වශයෙන් හෝ ස්කන්ධභෙදයයි; **එකවොකාර පඤ්චවොකාර** දෙක වසයෙන් කලෙබරනික්ඛෙපය වෙදිතව්‍යයි; කුමක්හෙයින් ද යත්? **එකවොකාර පඤ්චවොකාර** භවවයෙහිමත් රූපකායසඞ්ඛ්‍යාතකලෙබරසම්භවය හෙයිනි. යම් හෙයකින් චාතුර්මහාරාජිකාදීන්හි ස්කන්ධයෝ බිඳෙත් මද; නමුත් කිසිවක් නික්ෂෙප නොකරයිද; එහෙයින් ඔවුන්ගේ වශයෙන් ස්කන්ධයන්ගේ භෙදය වේ; මනුෂ්‍යාදීන් අතරෙහි කලෙබරයාගේ නික්ෂෙපය වේ; මෙහිද කලෙබර (මිනී) අභකදමත හෙයින් **මරණය කලෙබරනික්ඛෙපයයි** කියනලදී.

ජීවිතින්ද්‍රිය උපච්ඡේදය නම් මෙයින් ඉන්ද්‍රියබද්ධයාට ම මරණය නම් වෙයි; අනින්ද්‍රියබද්ධයාට මරණනම් නැතැයි දක්වයි. ගොයම් මැරුණේය, රුකක් මළේය යනා මේ වනාහි ව්‍යවහාර මාත්‍රයක්ම වේ; අර්ථවශයෙන් කාරණා වශයෙන් වනාහි මේ ආකාර වචනයන් ශෂ්‍යාදීන්ගේ ක්ෂය-ව්‍යයභාවය ම දක්වත්.

**"ඉදං වුච්චති මරණං"** යනු මේ සියල්ලමත් "මරණ" නමැයි කියනු ලැබේ. තවද මෙහි **ඛණිකමරණය, සම්මුතිමරණය, සමුච්ඡෙද මරණය** කියා මේ භෙදයද වෙදිතව්‍යයි.

1. ඒ මරණ තුන අතුරෙන් **ඛණිකමරණය** නම් ප්‍රවෘත්ති කාලයෙහි රූපාරූප ධර්මයන්ගේ භෙදයයි.

2. තිස්සයා මළේය, ඵුස්සයා මළේය, යනා මේ සම්මුති මරණ නමි.

3. ක්ෂීණාශ්‍රවයන්ගේ අප්‍රතිසන්ධික කාලක්‍රියාව **සමුච්ඡෙද** මරණ නම් වේ.

මේ කාරුණෙහිවූ අර්ථයෙහි වනාහි **සම්මුති මරණය** අදහස් කරණලදී. **ජාතික්ඛය** මරණය, **උපක්කම** මරණය, **සරස** මරණය, **ආයුක්ඛය** මරණය, **පුඤ්ඤක්ඛය** මරණය, කියාද ඒ **සම්මුති**මරණයට ම නම් වේ.

ඒ මේ චුතිලක්ඛණය වියොග**රස**යි; විප්‍රවාස **ප්‍රත්‍යුපස්ථාන**යි, මරණයාගේ දුඃඛාර්ථය වෙදිතව්‍යයි කියායි.

මෙහි වනාහි මේ මරණය ද තෙමේ ම දුක් නොවේ; දුඃඛයාගේ වස්තුභාවයෙන් වනාහි දුකයයි කියනලදී.

**මරණය**-යනු කායික ශාරීරික වේදනාවෝතුමූ ප්‍රතිවාතයෙහි ගැන්වූ ඇවිලිගත් තණහුලක් මෙන් සිරුර දවති; නිරය නිමිති ආදිය වැටහෙනකල බලවත් දෞර්මනස උපදයි; මෙසේ මෙකියනලද ශාරීරික මානසික දුක් දෙදෙනාට ම පිහිටවන වස්තු බැවින් දුක්යයි නුවනින් දතයුතුයි. නවද;

“පාපස්ස පාපකම්මාදි-නිමිත්තමනුපස්සතො,
භද්දස්සාපසහන්තස්ස-වියොගං පියවත්ථුකං.

මීයමානස්ස යං දුක්ඛං-මානසං අවිසෙසතො,
සබ්බෙසං වාපි යං සන්ධි-බන්ධනච්ඡෙදනාදිකං.

විතුජ්ජමානමම්මානං-හොති දුක්ඛං සරීරජං,
අසය්හමප්පටිකාරං-දුක්ඛස්සෙතස්සිදං යතො;
මරණං වත්ථු තෙනෙතං-දුක්ඛමිච්චෙව භාසිතන්ති”

v. **ප්‍රකටීකරණාර්ථ**:—

**තණ්හාය උඩ්ඩිතො**=තෘෂ්ණාවෙන් උල්ලඞ්ඝිතවූයේ යන අර්ථයි. **ඇස** වනාහි තෘෂ්ණාරජ්ජුයෙන් අවුනාගෙන **රූප** නමැති නාගදන්තයෙහි එල්ලනලද්දේය. **කණ** තෘෂ්ණාරජ්ජුයෙන් අවුනා ශබ්ද නමැති ඇත්දතේ එල්ලන ලද්දේයයි මෙසේ තෘෂ්ණා රැහැනින් ලෝකය උඩ එල්වනලද්දේය.

**මච්චුනා පිහිතො**=අනන්තර ආත්මභාවයෙහිදී (පසුගිය අත්බැව්හි) කළකම්ය නුදුරුය, එක් සිතක් අතරය, බලවත්වූ මාරනාන්තික වේදනාව කරණකොටගෙණ පර්වතයකින් මෙන් අවස්තෘත හෙයින් (ගලකින් වැසුවාක් මෙන්) සත්වයෝ නොද නිත්‍යයි '**මච්චුනා පිහිතො ලොකො**' යි වදරණලදී.

——:——

## 7. 7. උඩ්ඩිත සූත්‍රප්‍රදීපයයි.

——:——

**15. කෙනස්සු පිහිතො ලොකො-කිස්මිං ලොකො පතිට්ඨිතො,**
**කෙනස්සු උඩ්ඩිතො ලොකො-කෙනස්සු පරිවාරිතො'ති.**

**16. මච්චුනා පිහිතො ලොකො-දුක්ඛෙ ලොකො පතිට්ඨිතො,**
**තණ්හාය උඩ්ඩිතො ලොකො-ජරාය පරිවාරිතො'ති.**

---

**7 - 8 - (15 - 16)**

i. **මාතෘකා:—**

**ජරාවෙන් පිරිවරණලද ලොකය තෘෂ්ණාව විසින් උඩ එල්වනලද බව.**

ii. **පිණ්ඩාර්ථය:—**

මාරයා විසින් පිරිවරණලද ලොකය දුකෙහි පිහිටියේ තෘෂ්ණාවෙන් ඔසවතලද්දේ ජරාවෙන් පිරිවරණ ලද්දේය.

iii. **භාවය:—**

15. ලොකයතෙම කුමකින් වසනලද ද? ලොකය කුමක් මතුයෙහි පිහිටියේ ද? ලොකය කුමකින් නගා එල්වාතබන ලද්දේද? කුමකින් පිරිවරණලද ද?

16. ලොකයතෙම මාරයා විසින් වසාපියන ලද්දේය; දුකෙහි පිහිටියේය; තෘෂ්ණාව විසින් නගා එල්වා තබතලද්දේය. ජරාවෙන් පිරිවරණ ලද්දේය.

iv. **අනුවාද**- v. **ප්‍රකාශීකරණාර්ථ** උඩිත 7-7-(13-14) සූත්‍රයෙහි දැක්වූ පරිදියි.

පූර්වෝක්ත (13-14) සූත්‍රයෙහි දැක්වූ ප්‍රශ්නයම දෙවතාවා විසින් හෙට්ඨා-උපරි (යටි - උඩු) වශයෙන් මෙහි ද විවරණ ලද්දේය.

—:—

## 7. 8. පිහිත සූත්‍රප්‍රදීපයයි.

—:—

**17. කෙනස්සු බජ්ඣති ලොකො - කිස්ස විනයාය මුච්චති,**
**කිස්සස්ස විප්පහානෙන - සබ්බං ඡින්දති බන්ධනන්ති?**

**18. ඉච්ඡාය බජ්ඣති ලොකො - ඉච්ඡා විනයාය මුච්චති,**
**ඉච්ඡාය විප්පහානෙන - සබ්බං ඡින්දති බන්ධනන්ති.**

---

**7 – 9 – (17 – 18)**

i. **මාතෘකා:—**

**ඉච්ඡාවෙන් වෙස්විමෙන් බන්ධන සිඳේ.**

ii. **පිණ්ඩාර්ථය:—**

ඉච්ඡාවෙන් බැඳෙයි; ඉච්ඡා විනයෙන් මිදෙයි; ඉච්ඡා විප්‍රහාණයෙන් සියලු බැඳුම් සිඳියි.

iii. **භාවය:—**

17. කුමකින් ලෝවැසිතෙම බැඳේද? කුමක් නැසීම් හෙතුවින් සසරදුකින් මිදේද? ඒ ලොකයාගේ කුමක් සම්බන්ධවූ විප්‍රහාණයෙන් සියළු දුඃඛ බන්ධන සිඳීද?

18. ලෝවැසිතෙම ඊප්සාවෙන් බැඳේ; ඊප්සාවිනයයෙන් දුකින් මිදේ; ඉච්ඡාහුගේ විප්‍රහාණයෙන් හැම බව බහන් සිඳියි.

iv. **අනුවාදය:—**

"තත්‍ථ කතමා අත්‍රිච්ඡතා; ඉතරීතරචීවර- පිණ්ඩපාත-සෙනාසන-ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි-පඤ්චහි වා කාමගුණෙහි අසන්තුට්ඨස්ස භීය්‍යොකම්‍යතා යා එවරූපා ඉච්ඡා ඉච්ඡාගතං අත්‍රිච්ඡතා රාගො සාරාගො අනුනයො අනුරොධො නන්‍දි නන්‍දිරාගො චිත්තස්ස සාරාගො අයං වුච්චති අත්‍රිච්ඡතා" "තත්‍ථ කතමා මහිච්ඡතා? ඉතරීතරචීවර-පිණ්ඩපාත- සෙනාසන-ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි පඤ්චහි වා කාමගුණෙහි අසන්තුට්ඨස්ස භීය්‍යොකම්‍යතා, යා එවරූපා ඉච්ඡා ඉච්ඡාගතං මහිච්ඡතා රාගො සාරාගො චිත්තස්ස සාරාගො, අයං වුච්චති මහිච්ඡතා" යි යමක් සඳහා කියනලදනම් ඒ මහාලොභයයි.

තවද මෙහි **අත්‍රිච්ඡතා, පාපිච්ඡතා, මහිච්ඡතා, අසපිච්ඡතා** යන භෙදය දතයුතුයි. එහි "සකලාභෙ අතිත්තස්ස පරලාභෙ පත්‍ථනා අත්‍රිච්ඡතා නාම "යම් අතෘප්තිතාවකින් සමන්නාගත පුද්ගලයාට එකභාජනයෙහි පිසූ කැවුම් අතරෙහිද තමන්ගේ පාත්‍රයෙහි පතිතවූ පූ මනාසේ නොපැසුනාක් මෙන් ද කුඩා එකක් මෙන් ද, වැටහෙයි; ඒ පූපයම වනාහි අනුන්ගේ පාත්‍රයෙහි ප්‍රක්ෂිප්තවූයේ සුපක්වයක් මෙන් ද මහතෙකක් මෙන් ද කියයි.

"අසන්තගුණ සම්භාවනතා පන පටිග්ගහණෙ ච අමත්තඤ්ඤුතා පාපිච්ඡතා නාම" ඔ වනාහි "ඉධෙකච්චො අස්සද්ධො සමානො සද්ධො'ති මං ජනො ජනාතු" යන ආදීනයින් අභිධර්මයෙහි ආවාමය. ඒ පාපෙච්ඡාවෙන් (පව්වූ අදහසින්) යුක්තවූ පුද්ගලතෙමේ කොහොත් බැව්හි පිහිටයි.

"සන්තගුණපභාවනතා පන පරිග්ගහණෙ ච අමත්තඤ්ඤුතා මහිච්ඡතා නාම" ඒ මහෙච්ඡාභාවය ද "ඉධෙකච්චො සද්ධො සම්මතො සද්ධො'ති මං ජනො ජානාතු ඉති ඉච්ඡති; සීලවා සම්මතො සීලවා'ති මං ජනො ජානාතු" යන මේ ක්‍රමයෙන් ආචාමය; මේ මහිච්ඡතාවෙන් සමන්විතගත පුද්ගලතෙමේ දුකසේ සන්තර්පණය කළහැකි වෙයි; වැදූ මෑණියෝ නමුත් ඔහුගේ හිත ගන්නට නොහැකි වෙයි. එයින් මේ කියනලදී.

"අග්ගික්ඛන්ධො සමුද්දො ච–මහිච්ඡො චාපි පුග්ගලො,
සකටෙන පච්චයං දෙන්තු–තයො'පෙතෙ අතප්පියා'ති"

**"සන්තගුණනිගූහනතා පන පටිග්ගහණෙ ච මත්තඤ්ඤුතා අප්පිච්ඡතා නාම"** ඒ අල්පේච්ඡාභාවයෙන් (අපිස් බැවින්) යුත් පුද්ගල තමා කෙරේ විද්‍යමානගුණය ද වසාදමන්ට කැමති බැවින් "ශ්‍රද්ධා ඇත්තේම සැදැහැත්තේ යයි මහජනතෙම දැන ගණීවායි" ඉච්ඡා නොකරයි; **"සීලවන්තස්ස, පවිවිත්තස්ස,** බහුස්සු**තස්ස, ආරද්ධවිරියස්ස, සමාධිසම්පන්නස්ස, පඤ්ඤවන්තස්ස,** රහත් වූසේක් ම රහත්යයි මා දනා දනිවා"යි නොඉවසියි; **මජ්ඣන්තික තෙරුන්** මෙති. ඒ තෙරනුවෝ වනාහි මහාක්ෂීණාශ්‍රව වූසේක. උන්වහන්සේගේ පාසිවුරු වනාහි පාදයක් (කහවණුවෙන් හතරෙන් කොටසක්) වටියි. උන්වහන්සේ **අසොක** නම් දැහැමි රජුගේ **විහාරමහ** දවසෙහි සඞ්ඝස්ථවිරයෝ වූසේක.

ඉක්බිති උන්වහන්සේගේ චීවර ලූඛ බව දැක මනුෂ්‍යයෝ "වහන්ස! ටිකක් එහාටවෙන්ඩ"යි කිවාහුය. තෙරනුවෝ "මා වැනි ක්ෂීණාශ්‍රවයන් රජුට සඞ්ග්‍රහ නොකරණකල්හි අන් කවරෙක් කරන්නේද"යි සිතා වදුරු පෘථිවියෙහි නිමග්නව සඞ්ඝස්ථවිර යන්ට නැඹූ උක්ඛිත්තපිණ්ඩය (උප්පිඩ) පිළිගණිමින් ම මතුවිය. මෙසේ ඛීණාසව වූසේක්ම "ඛීණාසවයයි මා ජනයා දනීවා"යි නොකැමතිවෙයි; මෙසේ අපිස් භික්ෂුව වනාහි නූපන් ලාබ උපදවයි, උපන් ලාබ තහවුරු කෙරෙයි; දායකයින්ගේ සිත ආරාධන කරයි. යම් යම් සේ අප්පිච්ඡවූයේ වනාහි තමාගේ අල්පේච්ඡාභාවයෙන් අල්පයක් ගණී ද, එසේ එසේ උන්වහන් සේගේ වතෙහි පහන්වූ මිනිස්සු බොහෝ කොට දෙති.

අපරවූ ද සිව්වැදෑරුම් අප්පිච්ඡකෙනෙක් වෙත්. **පච්චය අප්පිච්ඡය, ධුතඞ්ග අප්පිච්ඡය, පරියත්ති අප්පිච්ඡය, අධිගම අප්පිච්ඡය** කියායි. ඔවුනතුරෙන් සිව්පසයෙහි අපිස් වූයේ ප්‍රත්‍යය අල්පේච්ඡ නම් වේ; හෙතෙම දායකයාණන්ගේ වශය දනියි; තමාගේ බලය දනියි; ඉදින් දෙය්‍යධර්මය බොහෝ වේ නම් දායකයා

අල්පයක් දෙනුකැමැත්තේ නම් ඔහුගේ හැටියෙන් මදක් ගණීයි; දෙය්‍යධර්මය අල්ප වේ නම් දායකයා බොහෝ දෙනුකැමැත්තේ නම් දියයුතු වස්තුහුගේ පමණින් මදක්ගණීයි; දෙය්‍යධර්මයත් බොහෝ නම් දායකයාත් බොහෝකොට දෙනුකැමැත්තේ නම් තමන්ගේ තරම් දැන පමණින් ම ගණීයි.

ධුතඞ්ගසමාදානය තමා කෙරෙහි ඇති බැව් නොදන්වනු කැමැත්තේ **දුහග අපිස්** නම් වේ.

එය ප්‍රකාශකිරීම පිණිස මේ කථාවස්තු වෙත්. **සොසානික මහා කුමාර තෙරනුවෝ** වනාහි සැටවසක් සොහොනේ විසූසේක. අන්‍ය එකද භික්ෂු කෙනෙක් නොදත්තේය.

එහෙයින් කියනලදී.

"සුසානෙ සට්ඨිවස්සානි-අබ්බොකිණ්ණං වසාමහං,
දුතියො මං න ජානෙය්‍ය-අහො සොසානිකුත්තමො"යි.

**චෙතියපබ්බත විහාරයෙහි භාතිය ස්ථවිර දෙනමක්** වාසය කළාහුය; බාලතෙරනුවෝ උපස්ථායකයන් විසින් එවනලද උක්දඬු මිටියක් රැගෙන වැඩිමහල් තෙරුන් ලඟට වැඩියෝය. වහන්ස! "පරිභොගකරණ සේක්වායි"; තෙරුන්වහන්සේ ද බත් කිස නිමවා මුවදෝනා කාලය වේ. උන්වහන්සේ "කම්නැත ඇවැත්නියි" කීහ. කිම! ස්වාමීනි! "එකාසනික වන්නෙහිදැ" යි. "අරන් එන්ඩ, ඇවැත්නි! උක්බඩැ"යි පනස්වසක් එකාසනිකවූ සේක්ම දුහඝ වහනුයේ වැළඳිම්කොට මුව සෝදා නැවත ධුතඞ්ග අධිටඨානකොට වැඩිසේක.

තවද යමෙක් වනාහි **සාකෙතතිස්ස ස්ථවිර** මෙන් බහුශ්‍රැත භාවය හඟවන්නට නොකැමතිවේ ද මේ පය්‍යාප්ති අල්පෙච්ඡිත නම් වේ.

ඒ තෙරුන්වහන්සේ වනාහි සැණෙක් නැතැයි **උදෙසුම්** පිළිවිසිම්හි ඔකස්නොකරන්නෝ "වහන්ස! මැරෙණකෙනෙක් ලබන්නහුදැයි" සෝලි කරණලද්දේ ගණයා හැරදමා **කාණ්ඩකාර වාලිකසමුද්දවිහාරයට** වැඩියේ එහි ඇතුල් වස ස්ථවිර නවක මධ්‍යම භික්ෂූන්ට උපකාරීව **මහාපවාරණ උපොසථ** දවසේ ධර්මකථාවෙන් දනව්ව කොබවා වැඩියේය.

තවද යමෙක් වනාහි සෝවාන් ආදීන් අතුරෙන් එක්තරු කෙනෙක්ව සෝවාන් ආදීබැව් දන්වන්ට නොකැමැතිවේ ද මේ අධිගම අප්පිච්ඡ නම්. කුලපුත්‍ර තුන්දෙනා මෙන් ද **ඝටීකාර කුම්භකාර** මෙන් ද වෙත්.

මේ කාරණයෙහි වනාහි ලද අසෙවුන් ඇත්තාවූ බලවත් අලෝභයෙන් සමන්නාගතවූ ශෛක්‍ෂ ද පෘථග්ජන ද අපිස්යයි දතයුතු වේ.

චීවරාදි යමක් යමක් ලද්දේ ඒ ඒ දෙයින් අසතුටුවන පැවිද්ද, වද, රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍ය කාමවස්තු අතරෙහි යමක් යමක් ලැබුයේ එයින් එයින් අසතුටුවන ගිහියාට ද බොහෝ කැමැත්තෙන් වෙසෙස් කැමැත්තෙන් ඉස්නා වසයෙන් ඉච්ඡා නම් වේ. ඉච්ඡාගතය, "ඊප්ෂිතාකාරය" යි, "අත්තනො ලාභං අතිච්ච ඉච්ඡනභාවො අතිච්ඡතා" "අත්‍රිච්ඡතාතිපි එතිස්සා එව නාමං" "ලක්ඛණතො පන සකලාභෙ අසන්තුට්ඨි පරලාභෙ ච පත්ථනා; එතං අත්‍රිච්ඡා ලක්ඛණං"

ඉක්මවා ආසාකරණ අත්‍රිච්ඡපුද්ගලහට තමාවිසින් ලත් ප්‍රණීතය ද ලාමකයක් මෙන් හඟියි.

අනුන් විසින් ලත් ලාමකය ද ප්‍රණීතයක් මෙන් හඟියි; එක බඳුනෙහි පිසූ කැඳ හෝ බත් හෝ පූ හෝ තමන් පතෙහි බැහුයේ ලාමකමෙන් ද අනුන් පතෙහි බැහුදේ ප්‍රණීතමෙන් ද ප්‍රකථනයකරයි; මේ අත්‍රිච්ඡතා වනාහි ප්‍රව්‍රජිතයන්ට ද, තිරිසන් ගතයන්ට ද, වේමැයි.

එහි මේ කථාවස්තු වෙත්.

එක්තරා කෙලෙඹියෙක් මෙහෙණින්නන් තිසක් නිමන්තන (පවරා) කොට පූ සහිත බත් දුන්නේය; සඞ්ඝස්ථවිරීන් වහන්සේ සියලු භික්ෂුණීන්ගේ පාත්‍රාවල කැවුම් පෙරළා ගෙන්වා බලා පසුව තමන් ලද්දම කැවාය.

බරණැස් රජතෙමේ ද "අඟුරෙහි පිසූ මස් කන්නෙමි" යි දේවීත් කැඳවාගෙණ මහවනයට පිවිසියේ එක් කිඳුරඟනක් දැක තම බිසව් හැරදමා ඒ කින්නරී පසුපස්සේ ගියේය.

දේවී නැවතී ආශ්‍රමපදයට ගොස් කිසුණුපිරියම්කොට අෂ්ටසමාපත්තීන්ද පඤ්චඅභිඥවන් ද ලබා හිඳින්නී රජු එනවා දැක අහසට පැනනැඟී ගියාය. ඒ දුටු වෘක්‍ෂයෙහි අධිගෘහිත දෙවතාවා මේ ගාථාව කිවාය.

"අත්‍රිච්ඡං අතිලොභෙන-අතිලොභ මදෙන ච,
එවං හීයති අත්ථො-චන්දං ච අසිතාභුයා'ති.

යම්සේ සඳකිඳුරිය පතන්නේ අසිතාභූ රාජදුහිතෘ කෙරෙන් පිරිහුනේද, මෙසේ අයිරිත් ඉස්නාවූ අතිලෝභය කාරණකොට ගෙණ තමන් හැරදමයි, පරදවයි කියා දෙවතාවා රජු සමග ක්‍රීඩා කෙළේය.

(තවද උරසක්දර පූජිස්වන හා අපිස් ඇමතිවතද බලා විස්තර දතයුතුයි.)

v. ප්‍රකවිකරණාර්ථ:—පෙරසේමැයි.

——:——

## 7. 9. ඉච්ඡා සූත්‍රප්‍රදීපයයි.

——:——

**19. කිස්මිං ලොකො සමුප්පන්නො-කිස්මිං කුබ්බති සන්ථවං,**
**කිස්ස ලොකො උපාදාය-කිස්මිං ලොකො විහඤ්ඤතීති?.**

**20. ඡසු ලොකො සමුප්පන්නො-ඡසු කුබ්බති සන්ථවං,**
**ඡන්නමෙව උපාදාය-ඡසු ලොකො විහඤ්ඤතීති.**

**7. අද්ධවග්ගො.**

---

**7 - 10 - ( 19 - 20. )**

i. **මාතෘකා:—**

**සයකින් සයක් ගැලපීම ලොකයයි.**

ii. **පිණ්ඩාර්ථය:-**

අධ්‍යාත්මික ආයතන සය උපන් කල උත්පත්තිය වේ; බාහිර ආයතන සයේ සන්ථවය කරයි; ඒ ඇතුළත පිටත දෘඩිකොටගෙණ වැනසෙයි.

iii. **භාවය:-**

19. කුමක් උපන්කල්හි ලෝකය උපන්නේ වේද? කුමක් කෙරෙහි සන්ථවය කෙරේද? ලෝවැසිතෙම කුමක් දෘඩිකොට අල්වාගෙණ නොහොත් කුමකට පැමිණ කුමක් නිසා පවතීද? ලෝවැසිතෙම කුමක් නිමිතිකොට පෙළේද? වෙහෙසේද?

20. ඇස, කණ, නහය, දිව, කය, මන යන ආධ්‍යාත්මික ආයතන සය උපන්කල්හි ලෝකය උපන්නේ වේ, ඒ සයෙහිම මිත්‍රසන්ථවය (ඇල්ම) කෙරේ, ඒ ෂඩායතනය නිසාම පවතියි; ලෝවැසිතෙම ඒ සළායතනයන්හි පෙළේ (වෙහෙසේ).

iv. **අනුවාදය:-**

**ආයතනාර්ථ විභාග.**

"චක්ඛතී'ති-චක්ඛු", රූපය ආශ්වාද කරයි, විභාවනා කරයි යන අර්ථයි.

"රූපයතී'ති රූපං" වර්ණ විකාරයට පැමිණෙමින් හෘදයට ගිය බැව් ප්‍රකාශ කෙරෙයි, යන අර්ථයි.

"සුණාතීති සොතං"-"සප්පතී"ති සද්දො"- උදාහරීයතී'ති අත්ථො, (ඉහළට ගනියි) "ඝායතීති" ඝාණං-"ගන්ධයතී'ති ගන්ධො" ආත්මවස්තු සූචනය (මහනය) කරණු ලැබේ යන අර්ථයි. ජීවිතං අව්හායතීති ජිව්හා-රසන්ති තං සත්තා'ති රසො, ආශ්වාදන කෙවත් රසවිඳීම් කරත්, යන අර්ථයි; "කුච්ඡිතානං සාසවධම්මානං ආයොති කායො"-"අංග" නම් උත්පත්ති දේශයයි; ඵුසියතී'ති ඵොට්ඨබ්බං" "මනතී'ති මනො-" "අත්තනො ලක්ඛණං ධාරයන්තීති ධම්මා,"

අවිශෙෂයෙන් (දෙළසට ම වෙනසක් නැතිව) එනාහි ආයතන හෙයින්ද, ආයයන් "තනන' හෙයින්ද, ආයතනයට නයන හෙයින්ද, "ආයතන"යයි දතයුතුයි.

චක්ෂුර් රූපාදීන් විෂයෙහි එනාහි ඒ ඒ චාර ආරම්මණවූ චිත්ත චෛතසික ධර්මයෝ ස්වකීය ස්වකීය අනුභවනාදිකෘත්‍යයෙන් ආයත කරත්, උට්ඨානකරත්, වෑයම් කරත් යයි කියේ වේ.

ඒ ආයභූත ධර්මයන් එනාහි මොවුන් "තනති, විතරති"යි කියේ වෙයි; අනමතග්ග සංසාරයෙහි පැවැත්තාවූ ඉතාමත් දික්වූ මේ සංසාරදුඃඛ යම්තාක් නොනවත්නේද ඒතාක් පමුණුවත්මය, පවත්වතියි කියන ලදුයේ වෙයි.

තවද 1. නිවසනතැන, 2. ආකරය, 3, සමොසරණස්ථානය (රැස්වන තැන), 4. සංජාතිදෙශ, 5. කාරණය යන අර්ථයන් හි ද ආයතන ශබ්දය යෙදෙනබව දතයුතුයි.

v. ප්‍රකටීකරණාර්ථ:—

කිස්මිං ලොකො සමුප්පන්නො=කුමක් උපන් කල්හි ලොකය උපන්නේදැයි කියනු ලැබේ.

ඡසු=ෂට්විධ අධ්‍යාත්මික ආයතනයන් උපන්කල්හි උපන්නේය.

ඡසු කුබ්බති=ඒ සයෙහිම වැනසෙයි, පෙළෙයි; මෙයේ අජ්ඣත්තිකායතන වශයෙන් මේ ප්‍රශ්නය ආයේය. අධ්‍යාත්මික-බාහිරයන්ගේ වශයෙන් එනාහි ආහරණය කරන්ට වපියි. ෂට්විධ අධ්‍යාත්මික ආයතනයන් උපන් කල්හි මේ ලෝකය උපන්නේ නම් වේ; බාහිර ආයතන සය කෙරෙහි සන්ථවයකරයි. ෂට්අධ්‍යාත්මිකයන් උපාදාන කොට ෂට්විධ බාහිරයන් විෂයෙහි විශෙෂයෙන් නැසෙන්නේය.

——:——

## 7. 10. ලොක සූත්‍රප්‍රදීපයයි.

——:——

සත්වන අනු වගයි.

(තස්සුද්දානං.

කාමං චිත්තං ච තණ්හා ච-සංයොජනඤ්ච බන්ධනා,
අබ්භාහතුඩ්ඩිතො පිහිතො-ඉච්ඡා ලොකෙන තෙදසා'ති.)

——:——

1. කිංසු ඡෙත්වා සුඛං සෙති-කිංසු ඡෙත්වා න සොචති,
කිස්සස්ස ඒකධම්මස්ස-වධං රොචෙසි ගොතමා'ති?

2. කොධං ඡෙත්වා සුඛං සෙති-කොධං ඡෙත්වා න සොචති,
කොධස්ස විසමූලස්ස-මධුරග්ගස්ස දෙවතෙ;
වධං අරියා පසංසන්ති-තං හි ඡෙත්වා න සොචතී'ති.

---

**8 - 1 ( 1 - 2. )**

i. **මාතෘකා:—** **සැප සයනය ක්‍රොධ නැත්තාවය.**

ii. **පිණ්ඩාර්ථය:—**

මූල විෂ අග මිහිරි ක්‍රොධය නැතිකොට සුවසේ සයනය කරයි; ශොක නොකරයි; ක්‍රොධ වධයට ආර්‍ය්‍යයෝ පසසත්.

iii. **භාවය:—**

1. ගෞතමයන් වහන්ස! කුමක් නසා සුවසේ සයනය කෙරේද? කුමක් නසා ශොක නොකෙරේද? ඒ කිනම් එකම ධර්‍මයක්හුගේ විනාශය නුඹවහන්සේ රුස්නෙහිද?

2. එම්බා දෙවතාව! ක්‍රොධය නසා සුවසේ සයනය කෙරෙයි; ක්‍රොධය නැසීමෙන් ශොක නොකරයි; විෂ සඞ්ඛ්‍යාත දුඃඛවිපාකයට මුල්වූ මිහිරිවූ කෙළවර ඇති ක්‍රොධය වැනසීම සම්බුඩාදී ආර්‍ය්‍යයෝ පසසත්; යම් හෙයකින් ඒ ක්‍රොධය නසා සොක නො කෙරේද එහෙයිනි.

iv. **අනුවාදය:—**

**ප්‍රතිඝනිමිත්ත** ඇති කල්හි අයොනිසොමනසිකාරයෙන් (අනුවතින් මෙනෙහිකිරීමෙන්) වනාහි ව්‍යාපාදයාගේ ඉපැද්ම වෙයි. එහි ප්‍රතිඝයද පටිඝනිමිත්ත වේ; ප්‍රතිඝාරම්මණයද පටිඝනිමිත්ත වේ. අයොනිසොමනස්කාරය වනාහි සැමතන්හි එකම් ලක්ෂණයි. එය ඒ නිමිත්තෙහි බහුලව පවත්වන්නහුට ව්‍යාපාදය උපදියි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වදාළසේක

"අත්ථි භික්ඛවෙ පටිඝනිමිත්තං. තත්ථ අයොනිසොමනසිකාර බහුලීකාරෙ අයමාහාරෙ අනුප්පන්නස්ස වා බ්‍යාපාදස්ස උප්පාදාය උප්පන්නස්ස වා බ්‍යාපාදස්ස භීය්‍යොභාවාය වෙපුල්ලාය"යි.

මෛත්‍රී චිත්තවිමුක්තිය කරණකොට ගෙණ (ක්‍රියාකින් මෛත්‍රී කිරීමෙන්) ඔහුගේ ප්‍රහාණය වෙයි. එහි "මෙත්තා" යි කීතල්හි අර්පණාවද, උපචාරයද වටියි; 'චිත්තවිමුක්තිය' යනු අර්පණාවමයි.

**යොනිසො මනසිකාරය** කී ලකුණු ඇත්තේමය: එය එහි බහුලව පවත්වන්නහුට ව්‍යාපාදය ප්‍රහීණ වෙයි.

එහෙයින් වදාළසේක.

"අත්ථි භික්ඛවෙ මෙත්තාචෙතො විමුත්ති, තත්ථ යොනිසො මනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා බ්‍යාපාදස්ස අනුප්පාදය, උප්පන්නස්ස වා බ්‍යාපාදස්ස පහාණාය න භීයො භාවාය න වෙපුල්ලාය"යි.

තවද ධර්මයෝ සදෙනෙක් ව්‍යාපාද ප්‍රහාණය පිණිස පවතිත් (නම් වැටෙත්). 1. මෙත්තානිමිත්තයාගේ උද්ග්‍රහණය, 2. මෙත්තා භාවනානුයොගය, 3. කම්මස්සකතා පච්චවෙක්ඛණය, 4. පටිසඞ්ඛානබහුලතාය, 5. කල්‍යාණමිත්තතාය, 6. සප්පායකථායයි, 1. ඔදිස්සක අනොදිස්සක දිසාඵරණ යන ක්‍රම තුනෙන් එක්තරා ක්‍රමයකින් මෛත්‍රිය උගන්නහුටද ව්‍යාපාදය ප්‍රහීණ වේ. 2. ඒ ත්‍රිවිධාකාරයෙන් මෛත්‍රීභාවනා කරන්නහුටත් ව්‍යාපාදය ප්‍රහීණ වේ. 3. තමන්ගේත් අනුන්ගේත් කර්මය ප්‍රත්‍යවෙක්ෂා කරන්නහුටත් ව්‍යාපාදය ප්‍රහීණ වේ. 4. මෙරමා හා තමන්ගේ කම්මස්සකතාවය පස්විතා පිළිසකන්හි සිටියහුවත් (නුවණින් සිතා බලන්නාහටත්) ව්‍යාපාදය ප්‍රහීණ වේ. 5. අස්සගුත්තත්ථෙරයන් වැනි මෛත්‍රීභාවනායෙහි ඇලුණු කල්‍යාණමිත්‍රයන් සෙවිනහුටද ව්‍යාපාදය ප්‍රහීණ වේ. ඉඳීම්-හිටීම් ආදියෙහි මෛත්‍රීනිශ්‍රිත සත් ප්‍රායකථාවෙන්ද ව්‍යාපාදය ප්‍රහීණ වේ. එහෙයින් වදාරණලදී.

"ඡ ධම්මා ව්‍යාපාදස්ස පහාණාය සංවත්තන්ති."යි මෙකී සද හමින් ප්‍රහීණ ව්‍යාපාදයතෙමේ අනාගාමි මාර්ගයෙන් ආයති අනුත්පාද වේයයි දතයුත්තේය.

v. **ප්‍රකට්කරණාර්ථ:**- මධුරග්ගස්ස= (මිහිරි අගැති) ඉතා කිපී බැන්නහුට පෙරළා බැණීමෙන් ද, පහරදුන්නහුට පිළිපහරදීමෙන් ද, සිත් සැනසෙයි; ඒ සඳහා මේ ක්‍රොධය "මධුරග්‍ර" යයි කියන ලද්දේය. මෙතැනදී කෙළවරට "අග්‍ර"යයි කියනලදී.

——:——

## 8. 1. ඣත්වා සූත්‍රප්‍රදීපයයි.

——:——

3. කිංසු රථස්ස පඤ්ඤාණං - කිංසු පඤ්ඤාණමග්ගිනො,
කිංසු රට්ඨස්ස පඤ්ඤාණං - කිංසු පඤ්ඤාණමිත්ථියා'ති?

4. ධජො රථස්ස පඤ්ඤාණං - ධූමො පඤ්ඤාණමග්ගිනො,
රාජා රට්ඨස්ස පඤ්ඤාණං - භත්තා පඤ්ඤාණමිත්ථියා'ති.

---

## 8 - 2 - ( 3 - 4. )

i. **මාතෘකා:-** රථාදීන්ගේ පෙනුම ධ්වජාදිය වේ.

ii. **පිණ්ඩාර්ථය:-**

රථයට ධජයත්, ගින්නට දුමත්, රටකට රජත්, ස්ත්‍රියට හිමියාත් "පෙනුම්" වෙත්.

iii. **භාවය:—**

3. රථය සම්බන්ධ පෙනීමේ උපකරණය කුමක්ද? වහ්නිහුගේ හැඳිනීමට ලකුණ කුමක්ද? රටක් ප්‍රකාශවීමේ වස්තුව කුමක්ද? ස්ත්‍රීගේ හැඳිනීමට කාරණය කුමක්ද?

4. රථය සම්බන්ධ පෙනීමේ උපකරණය ධජය වේ; වහ්නිහුගේ හැඳිනීමට ලකුණ දුම වේ; රටක් ප්‍රකාශවීමේ වස්තුව රජතෙමේය; ස්ත්‍රිය හැඳිනීමට කාරණය ස්වාමි පුරුෂ තෙමේය.

iv. **අනුවාදය:—**

"රාජානො නාම පඨව්‍යා රාජා, පදෙස රාජා, මණ්ඩලිකා, අන්තරභොගිකා, අක්ඛදස්සා මහාමත්තා, යෙ වා පන ඡෙජ්ජභෙජ්ජං අනුසාසන්ති, එතෙ රාජානො නාම".

v. **ප්‍රකීර්ණකාර්ථ:-**

**පඤ්ඤාණං**= "**පඤ්ඤායති එතෙනාති පඤ්ඤාණං**" මේ කාරණකොටගෙණ පෙනේ නුයි "පඤ්ඤාණ" නම් වී.

**ධජො රථස්ස**=මහත්වූ සංග්‍රාමශීර්ෂයෙහි වනාහි දුරදීම ධජය දැක අසවල් රජුගේ මේ රථයයි ප්‍රකට වේ; එහෙයින් "ධජො රථස්ස පඤ්ඤාණං"යි කියනලදී. "අග්නියද "දුරදීම දුමෙන් පෙනේ."

**සොළිරටය, පඩුරටය** කියා මෙසේ රටද රජුකාරණකොට පෙණෙයි.

චක්‍රවර්තිරජුගේ ධීතෘ වුවත් ස්ත්‍රීවනාහි අසවල් නැමැත්තහුගේ බිරිඳ යයි භර්තෘප්‍රාප්තවම පෙණෙයි. එහෙයින් "ධූමො පඤ්ඤාණමග්ගිනො" යනාදිය කියනලදී.

—:—

## 8. 2. රථ සූත්‍රප්‍රදීපයයි.

—:—

5. කිංසූ'ධ විත්තං පුරිසස්ස සෙට්ඨං
කිංසු සුචිණ්ණො සුඛමාවහාති,
කිංසු හවෙ සාදුතරං රසානං
කථං ජීවිං ජීවිතමාහු සෙට්ඨන්ති?.

6. සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං
ධම්මො සුචිණ්ණො සුඛමාවහාති,
සච්චං හවෙ සාදුතරං රසානං
පඤ්ඤාජීවිං ජීවිතමාහු සෙට්ඨන්ති.

---

**8 - 8 - ( 5 - 6. )**

i. **මාතෘකා ;-**

**ප්‍රඥාවෙන් ජීවත්වන්නහුගේ ජීවිතය ශ්‍රේෂ්ඨයි.**

ii. **පිණ්ඩාර්ථය:-**

ශ්‍රේෂ්ඨවස්තුව ශ්‍රද්ධාවයි; දසකුසල්දම් පුසින්නේ (මොනවට පුරුදු කරණලද්දේ) සැප ලබයි; සත්‍යයම අතිමධුරයි; ගැහැවි හෝ පැවිදි හෝ ප්‍රඥාවෙන් ජීවත්වන්නේම ශ්‍රේෂ්ඨ වේ.

iii. **භාවය:-**

5. මේ ලෝකයෙහි පුද්ගලයාහට කුමක්නම් ශ්‍රේෂ්ඨවස්තුව වේද? කුමක්නම් මොනවට පුරුදුකරණලද්දේ සැප ගෙණදේද? ලුණු ඇඹුල් ආදී රසයන් අතුරෙන් කිනම් රසයක් ඒකාන්ත යෙන් ඉතා මිහිරි ද? කෙපරිද්දෙන් ජීවත්වන්නෙකුගේ ජීවිතය ශ්‍රේෂ්ඨ ජීවිතයයි කියද්ද?

6. මේ ලෝකයෙහි පුද්ගලයාහට ශ්‍රද්ධාව ශ්‍රේෂ්ඨවස්තුව වේ; දශකුශල කර්‍මපථ ධර්‍මය මනාකොට පුරුදුකරණලද්දේ සැප එල වයි; ලවණාම්ලාදිරසයන් අතුරෙන් සත්‍යරසය ඉතාමත් මිහිරියි; ප්‍රඥාවෙන් ජීවත්වන්නහුගේ ජීවිතය ශ්‍රේෂ්ඨජීවිතයයි ආචාර්‍ය්‍යයෝ කියති.

iv. **අනුවාදය:—**

ශ්‍රද්ධාව-කරණාර්ථය, කර්තෘඅර්ථය, භාවාර්ථය වශයෙන් නිරුක්ති දක්වා ධර්මාර්ථ කථනය ආචාර්‍ය්‍යසම්ප්‍රදාය වේ; ශ්‍රද්ධාව චෛතසිකයයි, සිතේ උපදීන පිරිසිදු ධර්මයන්ගෙන් ශෝභන චෛතසිකයක්වූ ඇදහීම නිසාම කුශල් පිරේ; සියලු අංගම් ශ්‍රද්ධාසංඛ්‍යාත හස්තිය පිට පවතියි; මිථ්‍යාදෘෂ්ටික ශාස්තෘන් ඇදහීමෙන් අකුශල චෛතසිකයට බසියි; සම්‍යක්දෘෂ්ටිකශාස්තෘන් ඇදහීමෙන් කුශලචෛතසික පහළ වේ.

කර්මයේ හැටියට විපාක ලැබේ යයි සැලකීම ද යම් ඇදහීමක් නිසාම වේ. ඇදහීමක් විශ්වාසකිරීමක් නැත්නම් ඔවුන්ට ආගමක් නැත. ඇදහීම මුල්කොටම සියලු යහපත වන හෙයින් ශ්‍රද්ධාවෙන් වියුක්ත කිසිම කුශලයක් හෝ සීලසංවරයක් නොලැබේ.

"ඇදහීම මෙයින් වේ" යන අදහසයි, "මෝ ඇදහීම" යන අර්ථවත් මේ ගුණය (ශ්‍රද්ධාව) සිතේම ඇතිවන දෙයකි. බුද්ධාදීන් කෙරෙහි ප්‍රසාදයවූ මෙය මැණිකක් වැනි වේ.

මේ ශ්‍රද්ධාමාණික්‍යය නැත්නම් කුසල් සිත් නමැති කිරීටයේ අලඞ්කාරයක් ද නැත; ඔටුන්න නැත්තේ රජෙක් ද නොවේ; රජෙක් නැත්නම් රටක් ද නොවේ; නොරටේ වාසයක් ද නැත. ශ්‍රද්ධාමාණික්‍යාලඞ්කෘතකිරිටය වැනි කුශලචිත්තයෙන් **පුණ්‍ය විපාක රජ** සුගතිරාජ්‍යය නමැති රට පාලනයකරණ හෙයින් දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යාදී රටවැසියෝ සුවසේ වාසය කරති.

තවද මේ **ශ්‍රද්ධාව** අධිපතිකම් කරණ හෙයින් **ඉන්ද්‍රිය** නම් වේ; යමක් නිශ්චයකිරීම ලක්ෂණකොට ඇති ඇදහීමෙන්ම මරණින් මතු දෙව්, මිනිස්, සැප හා නිවන්සැප ලබාගත හැකිවෙයි. "**ප්‍රත්‍යක්ෂ-අනුමාන**" දෙක ලෝකයෙහි තිරිසන්ගතයන් කෙරෙහි ද පවතියි. "**ශ්‍රද්ධාසිද්ධිය**" නැත්නම් මනුෂ්‍යවිශෙෂයක් නැත; නො අදහන්නා කිසිවකට නොගරුය, ගරුනොකරන්නා නො අදහන්නේය, නො අදහන්නාට පරලොවක් නැතැයි සිතේ, පරලොවක් නැතැයි සිතේනම් **අනුමානසිද්ධකුණ්** නොලැබේ; අනුමානසිද්ධියවත් නැත්නම් ඇසින් දුටුදේම ප්‍රත්‍යක්ෂයයි සලකා කණින් ඇසූදෙය ද ප්‍රතික්ෂෙප කරයි. දෙව්ලෝ බඹලෝ නිවන් තබා මෙලෝවත් නොදත් අශ්‍රද්ධාවන්තයෝ පව්පින් කෙසේ දනිත් ද? පව්පින් නොදන්නෝ දන් දේද? සිල්රකී ද? භාවනාකරයි ද? නැත්මය, සැදැහැ නැති එබන්දෙ යමක් දුන්නත් දානය නොවේ; යමක් රැක්කත් සීලය නොවේ, යමක් වැඩුවත් භාවනා නොවේ.

**ශ්‍රද්ධාවේ ලක්ෂණ දෙකක් වෙත්. සම්ප්‍රසාදන-සම්ප්‍රස්කන්දන** (පැහැදීම-පැනයාම) වශයෙනි.

## උපමාවක්.

සක්විතිරජුන්ගේ උදකප්‍රසාදමාණික්‍යය දියට දැමූකල වතුරේ කුණු, රොඩු, සෙවෙල් සහ පණුවෝ ද මඩ යටට බසිති. එසේම මේ ශ්‍රද්ධාව **පඤ්චනීවරණයන්** (කාමච්ඡන්ද-ව්‍යාපාද-ථින

මිද්ධ-උද්ධච්ච-අවිජ්ජා) ද අවශෙෂ කෙලෙස් ද ඉවත්කොට යට බස්වා හිත පහදවයි; නොකැලඹුනු පහන්සිතින් යොගාවචරයා ඇන්දෙයි, සිල්රකියි, භාවනාකරයි.

### දෙවන ශ්‍රද්ධාවට උපමාවක්.

කිඹුලුන්, මෝරුන්, ආදීන් ඇති දියපිරුණු මහා නදියක් ලඟට පැමිණි බාතසුලු (බයගුලු) ජනයන් දැක ගොඩ සිටි යුද්ධ දක්ෂ යොධයෙක් අවුත් "කුමක් නිසා තෙපි ප්‍රමාදවන්නහුද"යි විචාළේ "අනතුරු සහිත නිසා ගඟදියට බස්නට නොහැක් කෙමු"යි ඔවුන්ගේ පිළිවදන් අසා තියුණු මුවහත් කඩුවක් අතට ගෙණ මා පසුපස එව්! යයි කියා ගඟට බැස ආ ආ කිඹුල්, මෝර, ආදීන් වලක්වා මෙගොඩ සිටි මිනිසුන් එගොඩටත් එගොඩ සිටි මිනිසුන් මෙගොඩටත් සුවසේ ගෙණ එයි.

එමෙන්ම දන්දීමාදී සියල්ලටම ශ්‍රද්ධාව පෙරටුව පැනගොස් කාමාසාදී කිඹුල්, මෝර, රකුසන් ඉවත්කොට මිථ්‍යාදෘෂ්ටිගඞ්ගා වෙන් ජනයන් එතරකර කුසල්බිමේ තබයි.

v. **ප්‍රකටීකරණාර්ථ**:—

**සද්ධීධ විත්තං**:= ශ්‍රද්ධාවෙන් මුතු මැණික් ආදී වස්තූන් ද ලබයි. **ත්‍රිවිධකුලසම්පත්තිය** ද (ඛත්තිය- බ්‍රාහ්මණ- ගෘහපති මහාසාර කුල තුන) ස්වර්ගලොක සම්පත්තියද, නිර්වාණදර්ශනය ද ලබයි. ඉන්නිසා මුතු මැණික් ආදී වස්තූන්ගෙන් සැදැහැයම ශ්‍රෙෂ්ඨයි.

**සුඛමාවහාති**:=සියලුම **සාසව-අනාසව** නොකිලිටි සුවයම එළවයි.

**පඤ්ඤාජීවිං ජීවිතමාහු සෙට්ඨං**= යමෙක් ගෘහස්ථවූයේ ම පඤ්චසීලයෙහි පිහිටා සලාකබත් ආදිය දෙන්නේ ප්‍රඥාව කරණකොට ජීවත්වේ ද, ප්‍රව්‍රජිතවූයේ වනාහි දැහැමින් උපන් සිව්පසය මෙනම් අර්ථයයි ප්‍රත්‍යවෙක්ෂාකොට පරිභොගකරන්නේ කම්මටහන් ලබාගෙන විදර්ශනාකරන්නේ ආර්‍යඵලාධිගමවශයෙන් ප්‍රඥාවෙන් ජීවත්වෙයි ද, ඒ ප්‍රඥාජීවිපුද්ගලයා ශ්‍රෙෂ්ඨජීවිත ඇත්තෙක්ව ජීවත්වෙයි කියා ආර්‍යයෝ කීහ.

—:—

## 8. 3. විත්ත සූත්‍රප්‍රදීපයයි.

—:—

7. කිංසු උප්පතතං සෙට්ඨං-කිංසු නිපතතං වරං,
කිංසු පවජමානානං-කිංසු පවදතං වරන්ති?.
8. බීජං උප්පතතං සෙට්ඨං-වුට්ඨි නිපතතං වරා,
ගාවො පවජ්ජමානානං-පුත්තො පවදතං වරොති.
9. විජ්ජා උප්පතතං සෙට්ඨා-අවිජ්ජා නිපතතං වරා,
සඞ්ඝො පවජ්ජමානානං-බුද්ධො පවදතං වරො'ති.

---

8 - 4 (7 - 8 - 9)

i. **මාතෘකා:-**

**ශ්‍රේෂ්ඨ වස්තු කවරේද යන බව.**

ii. **පිණ්ඩාර්ථය:-**

"උඩට නගින ධාන්‍යබීජයත්, පහළට වැටෙන වැසිපොදත්, පයින් යන ගවයාත්, කථාකරණ පුතාත් ශ්‍රේෂ්ඨ"යයි **දෙවතාවා** විසඳුයේය.

"විද්‍යාඋත්පතනයත්, අවිද්‍යා නිපතනයත්, පයින්වඩින සඞ්ඝයාත්, ප්‍රවාදීබුදුනුත් ශ්‍රේෂ්ඨය"යි **තථාගතයන් වහන්සේ** වදාළසේක.

iii. **භාවය:—**

7. උත්පතනය කරන්නන් අතරෙන් කුමක් ශ්‍රේෂ්ඨද? පහත වැටෙන්නවුන් අතරෙන් කුමක් ශ්‍රේෂ්ඨද? පයින් යන්නන් අතරෙන් කවරෙක් ශ්‍රේෂ්ඨද? ලොකයාට කියන්නන් අතරෙන් කවරෙක් උත්තමද?

8. පැලවී බිමින් නගින්නන් අතරෙන් සාලි-ව්‍රීහ්‍යාදී සප්ත විධ ධාන්‍යබීජ ශ්‍රේෂ්ඨයි; බිමට වැටෙන්නන් අතරෙන් වැස්ස උතුම් වේ; පයින් ගමන්කරන්නන් අතරෙන් ගෙරි උතුම් වෙත්; බස් බණන්නන් අතරෙන් පුත්‍රතෙම උතුම් වේ.

9. උත්පතනය කරන්නවුන් අතරෙන් සතරමාර්ගී විද්‍යාව ශ්‍රේෂ්ඨ වේ; යටපත් වන්නන් අතුරෙන් **වෘත්තමූලක මහා අවිද්‍යාව** යට බැසීම අතිශයින් ප්‍රශස්තයි; (සතරමග නුවන උද්ගත වීමත්-අවිද්‍යාව යටපත් වීමත් සියල්ලටම වඩා උතුම්බව මෙයින් දක්වන ලදී) පයින් වඩින්නන් අතරෙන් සඞ්ඝතෙම උතුම් වේ; ලොකයාට කියන්නන් අතරෙන් සම්බුද්ධතෙම උත්තම වේ.

vi. **අනුවාදය:—**

**බීජ විශේෂ පසකි. 1. මූලබීජ, 2. ඛන්ධබීජ, 3. ඵලුබීජ, 4. අග්ගබීජ, 5. බීජබීජ කියායි.**

මුලින් හටගන්නා (පැලවෙන) ඉඟුරු, වදකහ, වම්බුතු ආදිය මූලබීජ නම්.

කඳෙන් හටගන්නා ඇසතු, නුග, දිඹුල් ආදිය ඛන්ධබීජ නම්.
පුරුක් වලින් හටගන්නා උක්, උණ, බට ආදිය ඵලුබීජ නම්.
අගින් හටගන්නා අඳු, මුරුවා ආදිය අග්ගබීජ නම්.
බීජයන්ගෙන් හටගන්නා මුං උඳු ආදිය බීජබීජ නම්.

වන ප්‍රදෙශයන්හි දඹුවල වෙළී හටගන්නා අමූලක (මුල් නැත්තාවූ) එක් (ලතා) වැල් විශෙෂයක්ද වෙයි.

v.' **ප්‍රකට්කරණාර්ථ**:-

**බීජං**=ඉහළ නගින්නන්ට සප්තවිධ ධාන්‍යබීජ **ශ්‍රෙෂ්ඨයි**; ඒ ධාන්‍ය උදගමනයෙහි ජනපදය **ක්ෂෙම** වෙයි; **සුභික්ෂ**වෙයි.

**නිපතතං**=නිපතනය වන්නන්ගෙන් **මෙඝවෘෂ්ටිය** අති ප්‍රශස්තයි, මේ වැසි ඇතිකල්හි වනාහි විවිධ **ශස්‍යයන්** උපදිත්. දනව් පිරෙත්; **ඛෙමවෙත්**; ආහාර සුලභවෙත්,

**පවජමානානං**=ජඞගමවූ පයින් හැසිරෙන්නවුන්ගෙන් ගවයෝ ශ්‍රෙෂ්ඨයහ; ඒ හෙරින් නිසාම **සත්ත්වයෝ** පස්ගෝරස පරි භොගකරන්නාහු සුවසේ වාසය කරති.

**පවදතං**=රාජකුල මධ්‍යාදියෙහි කථා පවත්වන්නන්ගෙන් පුත්‍රතෙම උත්තම වේ; හෙතෙම වනාහි මවුපියන්ට අනර්ථාවහවූ යමක් නොකියයි.

**විජ්ජා උප්පතතං සෙට්ඨා**=පළමු ප්‍රශනයන් අසාගෙණ ලඟ සිටියාවූ එක් දෙවතාවෙක් වනාහි "දෙවතාව! තුඹ කුමක් නිසා ඔය ප්‍රශනය දශබලධාරී බුදුන් අතින් විචාරන්නෙහිද? මම තුඹට කියන්නෙම්සි," තමාගේ ලබ්ධිය පරිද්දෙන් "**බීජං උප්පතතං සෙට්ඨං**" යනාදිය කීයේය.

ඉක්බිති ඔහට අනික් දෙවතාවා කියනුයේ "යාවපධංසි, වදෙසි දෙවතෙ" "කොපමණ ප්‍රගල්භ මුඛරිද! මම භාග්‍යවත් බුදුන්ගෙන් ප්‍රශනකරමි, තුඹ කුමට කියෙහිදැ"යි නවත්වා ඒ ප්‍රශනයම දශබලධාරීන් අතින් විචාළාය; ඉක්බිති ඔහට ශාස්තෘන් වහන්සේ විසඳු වදුරණසේක් "**විජ්ජා උප්පතතං**" යනාදිය කීසේක.

එහි - **විජ්ජා**=චාතුර්මාගී විද්‍යාවයි; ඕ වනාහි උඩට නගිමින් සර්ව කුශලධර්මයන් සමුද්ඝාතනය කරයි. එහෙයින් "**උප්පතතං සෙට්ඨා**"යි වදාළහ.

**අවිජ්ජා**=වෘත්තමූලක මහා අවිද්‍යාවයි. ඕ වනාහි නිපතනය කරන්නන් අතරෙන් කිඳබසින්නන් අතරෙන් උත්තම වේ.

**පවජමානානං**=පියසරින් යන්නාවූ ජඞගමයන්ගෙන් පුණ්‍ය ක්ෂෙත්‍රවූ සඞඝතෙම උත්තම වේ. පා ගමණින් වඩිත ඒ සගුන් ඒ ඒ තැන දැක පහන් සිතැත්තාවූ සත්ත්වයෝ සවසතියට පැමිණෙත්,

• **බුද්ධො**=යම් බඳු පුතෙක් හෝ වේවා, අනිකෙක් හෝ වේවා යම් කිසි බස් කියන්නවුන් අතුරෙන් බුදුරජනන් වහන්සේ උතුම් වේ. උන්වහන්සේලාගේ ධර්මදෙශනා ශ්‍රවණයට අවුත් නොයෙක් දහස්ගණන් ප්‍රාණීන්ට **බන්ධනමොක්ෂය** (සසර බැම් මෙන් මිදීම) වේ.

—:—

## 8. 4, වුට්ඨි සූත්‍රප්‍රදීපයයි.

—:—

10. කිංසූ'ධ භීතා ජනතා අනේකා
මග්ගො ච නේකායතනං පවුත්තො,
පුච්ඡාමි තං ගොතම භූරිපඤ්ඤ?
කිස්මිං ඨිතො පරලොකං න භායේ'ති.

11. වාචං මනඤ්ච පණිධාය සම්මා
කායේන පාපානි අකුබ්බමානො,
බව්හන්නපානං ඝරමාවසන්තො
සද්ධෝ මුදූ සංවිභාගී වදඤ්ඤූ;
එතේසු ධම්මෙසු ඨිතො චතූසු
පරලොකං නභායෙ'ති?.

---

8 – 5 – (10 – 11)

i. මාතෘකා:-

ධර්ම සතරක පිහිටියේ නම් පරලොවට බිය නොවන්නේය.

ii. පිණ්ඩාර්ථය:—

මේ අප්‍රමාණ ජනතාව අටතිස් අරමුණු වශයෙන් තිවන් මගක් කියාතිබෙත්දී කුමකට බයවී දෙසැට දෘෂ්ටි අල්වාගත්තා හුද? කුමක පිහිටියේ පරලොවට නොබන්නේද? වචනයත් සිතත් හොඳහැටි තබාගෙන කයින් පව්නොකරන්නේ බොහෝ කෑම් බීම් ඇතිව ශ්‍රද්ධාවත්, මෘදුකමත්, බෙදාදීමත්, වදන් දැණිමත් ඇත්තේ පරලොවට භය නොවේ.

iii. භාවය:-

10. ගෞතමයන් වහන්ස! තිසීංණමාර්ගීය නානාවිධ අධිගම උපායවත් කොට නුඹවහන්සේ විසින් වදාරණලද්දේය; එසේ වූ කල්හි මේ ලෝකයෙහි නොයෙක් ජනසමූහයා කුමකට බිය පත්ව දෙසැටදිටු අල්වාගත්තෝ ද? මහපොළව සේ බහුප්‍රාඥයන් වහන්ස! කිනම් ධර්මයෙක්හි පිහිටා සිටි තැනැත්තෝ මෙලොවින් සැව පරලෝ යන්නෝ භයනොවන්නේ ද? යන මේ කාරණය නුඹවහන්සේ අතින් විචාරමි.

11. වාග්වාරය ද, මනොවාරය ද, මනාකොට පිහිටුවා කායවාරයෙන් පාපයන් නොකරමින් බොහෝ ආහාරපාන ඇති අනාථපිණ්ඩිකාදීන් මෙන් ගිහිගෙයි වාසයකරන්නේ සැදැහැත්තේ මොළොක් ගුණ ඇත්තේ අසුරෙන් ගත් දෙයක් නියගින් පළා පරුහටදී වළඳන සුළුවූයේ, ප්‍රතිග්‍රාහකයන්ගේ අදහස් දන්නා සවභාව ඇත්තේ, මේ ශ්‍රද්ධාදී චතුර්විධ ධර්මයන්හි පිහිටා සිටියේ පරලොවයන්නේ නොබාන්නේය.

v. ප්‍රකටීකරණාර්ථ:—

මග්ගා ච නෙකායතනං පවුත්තා - අටතිස් අරමුණු වශයෙන් අනෙක කාරණයෙන් කියනලද්දේය; එසේ ඇතිකල්හි කුමකට භයවී මේ ජනතාව දෙසැටදිටු අල්වාගත්තාදැයි කියයි. (අටතිස් අරමුණු=කසිණ-8, අසුභ- 10, අනුස්සති-10, බ්‍රහ්මවිහාර 4, ආරූප්ප-4, සඤ්ඤා-1, වවත්ථාන-1 යන තිස්අටයි. දෙසැට දිටු=සස්සතවාද-4, එකච්චසස්සතවාද-4, අන්තානන්තික-4, අමරාවික්ඛෙපික-4, අධිච්චසමුප්පන්නික-2, සඤ්ඤීවාද-16, අසඤ්ඤීවාද-8, නෙවසඤ්ඤීනාසඤ්ඤීවාද-8, උච්ඡේදවාද-7, පරමදිට්ඨධම්මනිබ්බාණවාද-5)

**පරලොකං න භායෙ**= මේ ලොකයෙන් චුතවී පරලොව යන්නේ; බියනොවේ.

**බව්හන්නපානං ඝරමාවසන්තො**—අනේපිඬුසිටුආදීන් මෙන් බොහෝ ආහාරපාන ඇති ගෙහි වසන්නේ;

**සංවිභාගී**=අනුරෙන් ගත් දෙයත් නියෙන් පලා පරහට දී බුදින සුළුවූයේ; දූන් ගාථාවෙහි අඞ්ගයන් උදුරා දක්විය යුත්තාහුයි.

“**වාචං**” යන පදයෙන් සතරවැදෑරුම් වාක්සුචරිතයන් ද, “**මනෙන**” යන පදයෙන් ත්‍රිවිධ මනොසුචරිතයන් ද “**කායෙන**” යන පදයෙන් ත්‍රිවිධකාය සුචරිතයන්දැයි යන මේ දශකුශලකර්ම පථයෝ පූර්වසුධි අඞ්ග නම්.

“**බව්හන්නපානං ඝරමාවසන්තො**” යන මේ පදයෙන් යඤ්ඤඋපක්ඛර (දානොපකරණ) ගන්නාලදී.

“**සද්ධො**” යනු එක් අඞ්ගයකි; “**මුදූ**” යනු එකකි; “**සංවිභාගී**” යනු එකකි; “**වදඤ්ඤූ**” යනු එකකැයි මෙසේ මේ සතර අවයව යන් සඳහා “**එතෙසු ධම්මෙසු ඨිතො චතුසු**” යි කීහ.

**තවත් ක්‍රමයක්.**

“**වාචං**” යනාදී තුන් අවයවයන් ද, “**බව්හන්නපානං**” යන මෙයින් යාගොපකරණ ද ගන්නාලදී. **සද්ධො**, මුදූ, **සංවිභාගී වදඤ්ඤූ** යනු එක් අඞ්ගයකි.

**තවත් එක නයෙක් වේ.**

“**වාචං මනං**” යනු ද එක් අඞ්ගයකි; **කායෙන පාපානි අකුබ්බමානො, බව්හන්නපානං ඝරමාවසන්තො**” යනු ද එක් අඞ්ගයකි; “**සද්ධො මුදූ**” යනු එකකි; ‘**සංවිභාගී වදඤ්ඤූ**” යනු එකකි; මෙකී සතරධර්මයන්හි සිටියේ “**ධම්මට්ඨිත**” නම් වේ; හෙතෙම පරලොව යන්නේ නොබියවෙයි.

———:———

## 8. 5. ගීත සූත්‍රප්‍රදීපයයි.

———:———

12. කිංසු ජීරති කිං න ජීරති-කිංසු උප්පථො'ති වුච්චති,
කිංසු ධම්මානං පරිපන්ථො-කිංසු රත්තින්දිවක්ඛයො?

13. කිං මලං බ්‍රහ්මචරියස්ස-කිං සිනානමනොදකං,
කති ලොකස්මිං ඡිද්දානි-යත්ථ විත්තං න තිට්ඨති;
භගවන්තං පුට්ඨුමාගම්ම-කථං ජානෙමු තං මයන්ති?

14. රූපං ජීරති මච්චානං-නාමගොත්තං න ජීරති,
රාගො උප්පථො'ති වුච්චති;
ලොභො ධම්මානං පරිපන්ථො-වයො රත්තින්දිවක්ඛයො,
ඉත්ථී මලං බ්‍රහ්මචරියස්ස-එත්ථායං සජ්ජතෙ පජා.

15. තපො ච බ්‍රහ්මචරියං ච-තං සිනානමනොදකං,
ඡ ලොකස්මිං ඡිද්දානි-යත්ථ විත්තං න තිට්ඨති.

16. ආලස්සං ච පමාදො ච-අනුට්ඨානමසංයමො,
නිද්දා තන්දී ච තෙ ඡිද්දෙ-සබ්බසො තං විවජ්ජයෙ'ති.

---

**8 - 6 - (12 - 13 - 14 - 15 - 16.)**

i. **මාතෘකා:—**

**දිරණ දෑ ආදිය හා ලෝකයෙහි සිදුරු කෙතෙක්ද යනබව.**

ii. **පිණ්ඩාර්ථය:—**

රූපය දිරයි, නාමගොත්‍ර නොදිරයි, රාගය උන්මාර්ගයි. ලෝභය දහමට උවදුරයි, වයස රෑ දවල් ගෙවයි, ස්ත්‍රීතොමෝ බ්‍රහ්මචර්යයට කිලුටයි. තපසත් බඹසරත් නොදියනෑමයි, අලසබැව් ආදී සිදුරුසයේ සිත නොසිටියි.

iii. **භාවය:—**

12. කුමක් දිරා ද? කුමක් නොදිරා ද? කවර ධර්මයක් උන්මාර්ගයයි කියනු ලැබේද? ධර්මයන්ට උවදුර කුමක් ද? කුමක් දිවා රෑ දෙක ගෙවා ද?

13. බඹසරට කිලුට කුමක් ද? නිරුදක ස්නානය කවරේද? යම් තැනෙක්හි සිත නොපිහිටා නම් ලෝකයෙහි එබඳු සිදුරු කෙතෙක් ද? භාග්‍යවතුන්වහන්සේ විචාරණුසඳහා අවුත් සිටිමු; එය අපි කෙසේ දනිමුද?

14. සත්වයන්ගේ රූපය දිරයි, නම් ගොත් දෙක නොදිරයි; රාගයතෙම නොමග වේ යයි කියනු ලැබේ. ලොභයතෙම ලෞකික-ලෝකෝත්තර ධර්මයන්ට උවදුරයි; වයස රෑ දවල් දෙක ගෙවයි; ස්ත්‍රී බ්‍රහ්මචර්යයට කිලුටයි, මේ මලයෙහි ප්‍රජා තොමෝ ඇලෙයි.

15. ක්ලේශසන්තාපෝපායවූ තපස ද බඹසර ද යන ඒ සියල්ල නිරුදක ස්නානයයි; යම් තැනක සිත නොපිහිටා ද එබඳු සිදුරු ලෝකයෙහි සයක් වෙත්.

16. සිටි තැනම සිටින උන් තැනම ඉන්න අලස බවද, නිද්‍රාවශයෙන් හෝ ක්ලේශවශයෙන් හෝ වන ස්මෘති විප්‍රවාසයද, කර්මය කරන්නට යුතුකල් කර්මකිරීමෙහි වීර්යාභාවය ද, ශීලසංයමාභාවයද, (සදාචාර රහිතබවද) නිද්‍රාබහුල බවද, **අතිභෝජනාදි** වශයෙන්වූ ආගන්තුක ආලස්‍යය ද, යන මොහු සිදුරුයි; ඒ සිදුරුසය සර්වප්‍රකාරයෙන් දුරුකරන්නේයි.

IV. **අනුවාදය**:—

**රූප විභාග**=“කිඤ්ච භික්ඛවෙ රූපං වදෙථ, රුප්පතීති ඛො භික්ඛවෙ තස්මා රූපන්ති වුච්චති; කෙන රුප්පති? සීතෙනපි රුප්පති, උණ්හෙනපි රුප්පති, ජිඝච්ඡායපි රුප්පති, පිපාසායපි රුප්පති, ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙනපි රුප්පති, රුප්පතීති ඛො භික්ඛවෙ තස්මා රූපන්ති වුච්චති” යි වදාළසේක. එහි “කිං” යනු කාරණපුච්ඡාවකි, කිනම් කාරණයකින් රූපයයි කියව් ද? කිනම් කරුණක් නිසා ඒ රූප නම්වීදැයි යන අදහසයි.

“රුප්පතීති” යන මෙහි “ඉති” යනු කාරණුද්දෙසයි, යම් හෙයකින් රුප්පනය වේද එහෙයින් “රූපයයි කියනුලැබේය” යන අර්ථවේ. “රුප්පති” යනු කිපෙයි, ගැටෙයි, පෙළෙයි බිඳෙයි යන අර්ථයි; මෙසේ මෙයින් එතකින් රුප්පනාර්ථයෙන් රූපය කියනලදී. රුප්පනලක්ඛණයෙන් රූපයයිද කියන්ට වටියි; තෙල රුප්පනලක්ඛණ වේ. **සීතයෙන්** කිපෙයි, ගැටෙයි පෙළෙයි, බිඳෙයි යනාදියෙහි වනාහි සීත කරණකොටගෙණ රුප්පනය **ලෝකාන්තරික** නිරයෙහි ප්‍රකට වේ.

**උෂ්ණයෙන්** රුප්පනය **අවීචිමහානරකයෙහි** ප්‍රකාශයි; එහි වනාහි රත්වූ ලෝහපෘථිවියෙහි උඩුකුරුව හොවා පඤ්චවිධ බන්ධනාදීන් කරණකල්හි සත්වයෝ මහදුක් අනුභව කරත්.

**ජිඝච්ඡාවෙන්** රුප්පනය **පෙතවිසයෙහිද, දුර්භික්ෂ කාලයෙහිද,** පාකට වේ. ප්‍රේතවිෂයයෙහි වනාහි සත්වයෝ දෙතුන් බුද්ධාන්තරයක් මුළුල්ලෙහි කිසිම ආමිෂයක් අතින්ගෙණ මුඛයෙහි බහන්නෝ නම් නොවෙත්; ඇතුළු ඇවිලගත් සුසිර රූකක්මෙන් වෙති. දුර්භික්ෂකල කඤ්ජිකමාත්‍රත් නොලැබ මරණපත් තැන්ගේ පමණ නම් නැත.

**පවසින්** රූපපතය **කාලකඤ්ජක** අසුරාදීන්හි ප්‍රකාශ වේ. එහි වනාහි සත්ත්වයෝ දෙතුන් බුඩානතරයකුත් හෘදය තෙමන ප්‍රමාණයක් වත් දිව තෙමන මතක් වත් දියබින්දුවක් ලබන්නට නොහැකි වෙත්; පැන් බොන්නෙමු, සි නදියට ගියවුන්ටත් නදී තොමෝ වැලිතලාවක් සම්පාදනය කරයි; මහමුහුදට වැදුනාහු වත් මහාසමුද්‍රය පිඝිපාසාණයක් වෙයි; ඔව්හු සුසුම්ලන්නෝ බලවත් දුකින් පෙළී හැසිරෙත්.

ඩංස-මකසාදීන් සංසපශීයෙන් රූපපතය-මදුරු-මැසි ආදීන් බහුල පෙදෙස්වල පහළ වේ.

පඤ්චවීසති කොට්ඨාස ඡන්නවුති කොට්ඨාස ප්‍රභෙදවත් සියලු රූප අතීත, අනාගත, පච්චුප්පන්න, අජ්ඣත්ත, බහිඩා, ඔළාරික, සුඛුම, හීන, පණීත, දූර, සන්තික වශයෙන් දතයුතුයි.

v. **ප්‍රකවිකරණාණී**: —

**නාමගොත්තං න ජීරති**=අතීත බුදුවරසින්ගේ නම් ගොත් නොදිරයි, අදත් පවතියි; එහෙසින් **නාමගොත්‍ර නොදිරයි** කියා වදරණලදී.

**ආලස්සං**= අලසබවයි, යමකින් සිටිතැන සිටියේම හුන්තැන හුන්නේම වේද තෙල් උතුරතත් තෘප්තිනොකරයි.

**පමාදෙ**= නිද්‍රාවෙන් හෝ කෙලෙස් විසින් හෝ පමාවයි.

**අනුට්ඨානං**=කටයුතු සමයෙහි කටයුතු කරණ වීර්‍ය්‍ය නැති බවයි.

**අසඤ්ඤමො**= සීලසංයම නොමැතිබවයි, හැරදූමූ ආචාර තාවයයි.

**නිද්දා**=**කායචාපල්‍යශොපසශ** බහුල බැවින් යමින් ද, සිටිමින් ද, හිඳිමින් ද, නිදාවැටෙයි; වැදහොත්තෝ කියනුම කවරේ ද?

**තන්දී**= අතිච්ඡතාදීවශයෙන් ආගන්තුක අලස බවයි; තන්ද්‍රා වයි.

—:—

## 8. 6. න ජීරති සූත්‍රප්‍රදීපයයි.

—:—

17. කිංසු ඉස්සරියං ලොකෙ-කිංසු භණ්ඩානමුත්තමං,
කිංසු සත්ථමලං ලොකෙ-කිංසු ලොකස්මිං අබ්බුදං.

18. කිංසු හරන්තං වාරෙන්ති-හරන්තො පන කො පියො,
කිංසු පුනප්පුනායන්තං-අභිනන්දන්ති පණ්ඩිතා'ති.

19. වසො ඉස්සරියං ලොකෙ-ඉත්ථී භණ්ඩානමුත්තමා,
කොධො සත්ථමලං ලොකෙ-චොරා ලොකස්මිං අබ්බුදා.

20. චොරං හරන්තං වාරෙන්ති-හරන්තො සමණො පියො,
සමණං පුනප්පුනායන්තං-අභිනන්දන්ති පණ්ඩිතා'ති.

---

8 - 7 - (17 - 18 - 19 - 20.)

i. **මාතෘකා:—**

**ශ්‍රමණයන් වහන්සේ නැවත නැවත ආවත් නුවණැත්තෝ පිළිගණිති.**

ii. **පිණ්ඩාර්ථය:—**

අනුන් යටත්කිරීම ඓශ්වර්‍ය්‍යය වේ; උතුම් බඩුව නම් ස්ත්‍රිය; ක්‍රොධය මළකඩකෑ කඩුව මෙනි; සොරු ලොව වනසන්නෝයි; මනුෂ්‍යයෝ හැරගන්නාවූ සොරු වළක්වති; තමුත් හැරගන්නා ශ්‍රමණයන්වහන්සේ ප්‍රියවෙයි; පුනපුනා එන භික්ෂුව පණ්ඩිතයෝ සතුටින් පිළිගණිත්.

iii. **භාවය:—**

17. ලෝකයෙහි ඉසුර කවරේද? බඩු අතුරෙන් කුමක් උතුම්ද? ලෝකයෙහි මලගත් සැත කුමක් ද? ලෝකයෙහි අර්බුදයෝ (විනාශකාරයෝ) කවරහුද?

18. පැහැරගන්නා කවරෙකු වළහත් ද? හැරගෙනයන්නාවූ කවරෙක් ප්‍රියවේ ද? නැවත නැවත එන්නාවූ කවරෙකු ප්‍රාඥයෝ සතුටින් පිළිගණිත් ද?

19. ලෝකයෙහි වශය (අණ පවත්වන පිරිවර ඇතිවීම) ඓශ්වර්‍ය්‍යය වේ; බඩු අතුරෙන් ස්ත්‍රී සඞ්ඛ්‍යාත භාණ්ඩය උත්තම මයි; ලෝකයෙහි ක්‍රොධය මලගත් ශස්ත්‍රය වැනියි ද්වෙෂ නොහොත් ප්‍රඥශස්ත්‍රයට එයම මලයි; ලොකයෙහි චෞරයෝ විනාශකයෝය.

20. ධනධාන්‍යාදිය පැහැරගෙණ යන්නාවූ සොරු වළක්වති; ලාබත් ආදිය ගෙණයන්නාවූ ශ්‍රමණතෙම ප්‍රිය වේ; පණ්ඩිතයෝ නැවත නැවත එන්නාවූ ශ්‍රමණයා අභිනන්දන කරත්.

iv. **අනුවාදය:—**

**උත්තමභාණ්ඩය**= 1. කෙසකල්‍යාණය, 2. මංසකල්‍යාණය, 3. අට්ඨි කල්‍යාණය, 4. ඡවිකල්‍යාණය, 5. වය කල්‍යාණය යන පඤ්චකල්‍යාණ සමන්නාගත යම් දැරියක් වේ නම් ඕතොමෝ උත්තම භාණ්ඩයයි, "ස්ත්‍රීරත්නයයි" කියනලදී.

ස්ත්‍රීලක්ෂණ මෙසේ දතයුතු:

1. කෙසකල්‍යාණය=මහා පුණ්‍යවන්ත ස්ත්‍රීන්ගේ හිසකෙස් මෝරකලාප (මොනරපිල්) සමානව කොණ්ඩය ලිහා විසුරුවන ලද්දහු හැඳිවත කෙළවර පහරා නැවතී උඞ්ඪවාග්‍රව (උඩට නැමීගිය අග් ඇතිව) සිටිත්; මේ **කෙශකල්‍යාණ** නම්.

2. දන්තාවරණය (දෙතොල) බිම්බුපල (කෙම් ගෙඩි) සමාන වර්ණ සම්පූර්ණවේ; සමසේ මොනවට පහස්නාලද්දේ වේ; මේ **මංසකල්‍යාණ** නම්.

3. දන්තයෝ ශ්වෙතයහ, සමානයහ, අවිවරයහ, ඔසවා තැබූ දියමන්ති පෙළක් මෙන් ද සමකොට සිඳිනලද සක්පතක් මෙන් ද ශොභමාන වෙත්; මේ **අට්ඨිකල්‍යාණ** නම්.

4. කාලවර්ණස්ත්‍රීගේ වර්ණකාදීන් අවිලිප්තවම සිවිවන් සිනිඳුයි, නිළුපුල්දමක් සේ වෙයි; අවදාතවර්ණ ස්ත්‍රීගේ කිණිහිරි මල්දම් සමානයි. මේ **ඡවිකල්‍යාණ** නම්.

5. දසවරක් දරුවන් ලැබුවා නමුත් එක්වරක් වැදූවාක් මෙන් අවිනෂ්ටයෞවුන් බැව් ඇත්තීම වෙයි; මේ **වයඃකල්‍යාණ** නම්. (විශාඛාවත බලනු.)

v. **ප්‍රකාශීකරණාර්ථ:—**

**ඉත්ථි**=අත්හැර නොදැමියහැකි බඩුව බැවින් ඉතිරි බඩුවෙන් උතුමැයි, "වරබඩු"යයි කීහ. තවද සියලු බොධිසත්වවරයෝද, චක්‍රවර්ත්තිහුද, මාතෘකුක්ෂියෙහිම පහළවන්නාහයි, "**ඉත්ථි භණ්ඩාන මුත්තමං**" යි වදාළසේක.

**ක්‍රොධො සත්ථමලං**=ක්‍රොධය මලගෘහිත ශස්ත්‍රය සදෘශයි; ප්‍රඥා ශස්ත්‍රයට හෝ කිලුටැයි **සැත්මල** නම්.

අබ්බුදං- විනාශකාරණය; සොරූ ලෝකයෙහි විනාශක යෝය යන අදහසයි.

**හරනෙනා**-සලාකබත් ආදිය පිළිගෙන වඩින්නෝ; ලාබත් ආදිය වනාහි තැබූකල්හි ම මිනිසුන් විසින් පරිත්‍යාගකරණ ලද්දවූද ඔවුන් සන්තක ඒවා හැරගෙණ යන්නාවූ මහණතෙමේ ප්‍රිය වේ, නොහැර ගෙනයන කල්හි පුණ්‍යහානිය නිසා විපිළිසර වෙත්.

---:---

## 8. 7. ඉස්සර සූත්‍රප්‍රදීපයයි.

---:---

**21. කිමච්ඡකාමො න දදෙ-කිං මච්චො න පරිච්චජෙ.**
**කිංසු මුඤ්චෙය්‍ය කල්‍යාණං-පාපිකං ච න මොචයෙ'ති.**
**22. අත්තානං න දදෙ පොසො-අත්තානං න පරිච්චජෙ,**
**වාචං මුඤ්චෙය්‍ය කල්‍යාණිං-පාපිකං ච න මොචයෙ'ති.**

---

**8 - 8 - (21 - 22.)**

i. **මාතෘකා:**—

**බොධිසත්ත්වයෙකෙනෙක් ම ආත්මපරිත්‍යාග කරන්නේය.**

ii. **පිණ්ඩාර්ථය:**—

ආත්මය දන නොකරයි, තමා අත්නොහරියි, කල්‍යාණබස් කියන්නේය. පරුෂබස් නොකියන්නේය.

iii. **භාවය:**—

21. අර්ථකාමී පුද්ගලතෙම කුමක් නම් නොදෙන්නේද? සත්ත්වතෙම කිනම් දෙයක් පරිත්‍යාග නොකරන්නේ ද? යහපත්වූ කුමක් මුදන්නේ ද? පවිටුවූ කුමක්නම් නොමුදන්නේද?

22. හැම බෝසතුන් හැර සෙසු සත්ත්වතෙම තමා පරහට දන කොට නොදෙන්නේය; තමන් සිංහ ව්‍යාඝ්‍රාදීන්ට පරිත්‍යාග නොකරන්නේය; සිලුටු මොලොක්වූ බස මුදන්නේය; (කියන් නේය) පවිටු බස් මුවෙන් නොමුදන්නේය.

iv. **අනුවාදය:**—

"අත්තානඤ්චෙ පියං ජඤ්ඤා-රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං,
තිණ්ණමඤ්ඤතරං යාමං-පටිජග්ගෙය්‍ය පණ්ඩිතො."

යනාදීන් ආත්ම විභාග දතයුතු. ආත්මය දනකොට නොදියයුතු.

දනයෝ සිව්දෙනෙක් වෙත්. **1. අනොත්ථජනය, 2 ධනක්ඛිනය, 3. කරමරණිතය, 4. සාමං දුසච්‍යුපගතය** කියායි.

v. **ප්‍රකීර්ණකාර්ථ:**—

**අත්තානං න දදෙ**=අනුන්ට දස්කොට තමා නොදෙන්නේය; මෙය සියලු බෝසතුන් අත්හැර කියනලදී..

**න පරිච්චජෙ**=සිංහ ව්‍යාඝ්‍රාදීන්ට පරිත්‍යාග නොකරන්නේය. බෝසතුන් හැර කියනලදී.

—:—

## 8. 8. කාම සූත්‍රප්‍රදීපයයි.

—:—

23. කිංසු බන්ධති පාථෙය්‍යං - කිංසු භොගානමාසයො,
කිංසු නරං පරිකඩ්ඪති - කිංසු ලොකස්මිං දුජ්ජහං;
කිංසු බද්ධා පුථුසත්තා - පාසෙන සකුණී යථා'ති.

24. සද්ධා බන්ධති පාථෙය්‍යං - සිරි භොගාන මාසයො,
ඉච්ඡා නරං පරිකඩ්ඪති - ඉච්ඡා ලොකස්මිං දුජ්ජහා;
ඉච්ඡා බද්ධා පුථුසත්තා - පාසෙන සකුණී යථා'ති.

---

8 - 9 - ( 23 - 24 )

i. **මාතෘකා:-**

**ශ්‍රී තොමෝ භොග වාසස්ථාන බව හා ඉච්ඡාව දුරලීම දුෂ්කර බැව්.**

ii. **පිණ්ඩාර්ථය:-**

ශ්‍රද්ධාවෙන් මග වියදම් බැඳගණිති; ඓශ්වර්‍ය්‍යය භොගාශයයි; ඊප්සාපාසයෙන් බැඳුනු සත්ත්වයෝ පුඩුවෙහි බැඳුනු සකුණියක් (පක්ෂීන්) මෙනි.

iii. **භාවය:-**

23. කුමක්තෙම මාගෝපකරණ බඳිද? භොගයන්ගේ ආශය ස්ථානය කවරේද? කවර ධර්මයක්තෙමේ මිනිසා අදීද? ලොකයෙහි කිනම් ධර්මයක් නොහැරිය හැකිද? පුඩුවකින් බැඳුනු ලිහිණියෙක් මෙන් බොහෝ සත්ත්වයෝ කුමකින් බැඳුනාහුද?

24. ශ්‍රද්ධාතොමෝ (සම්බල) මාගෝපකරණ බඳියි; ශ්‍රී භොග සම්පත්තීන්ට වාසස්ථාන වේ; ඉච්ඡාව මිනිසා ඒ ඒ අරමුණුකරා අදියි; ලොකයෙහි ඊප්සාතොමෝ දුකසේ දුරලිය යුතුය. පාශ බන්ධනයෙන් බැඳුනාවූ පක්ෂීන් මෙන් බොහෝ සත්ත්වයෝ ඊප්සාවෙන් බැඳුනාහු වෙත්.

iv. **අනුවාදය:-**

"සද්ධො සීලෙන සම්පන්නො
යසො භොග සමප්පිතො,
යං යං පදෙසං භජති
තත්‍ථ තත්‍ථෙව පූජිතො'ති".

ලෞකික-ලොකොත්තර ශ්‍රද්ධාවෙන් සමන්නාගතවූයේ අගාරිය (ගිහි) සීල, අනගාරිය (පැවිදි) සීල දෙකෙන් අගාරිය සීලයෙන් සමන්විතවූ අනාථපිණ්ඩිකාදීන්ට මෙන් පඤ්චශත උපාසක පරිවාර සඞ්ඛ්‍යාත යම්බඳු අගාරිකයශසක් වේ නම් එබඳු යශසින්ද, ධාන්‍යාදී ධනයද සප්තවිධ ආර්‍ය්‍යධන සඞ්ඛ්‍යාතයදැයි යන ත්‍රිප්‍රකාර භොගයෙන් යුක්තවූයේ පුරත්ථිමාදී යම් යම් දිශාවක චිත්තගෘහපති වැනි කුලපුත්‍රයෙක් භජනය කරයිද, ඒ ඒ තැන මේ ආකාර ලාභසත්කාරයෙන් පුදනලද්දේ වේ යයි දතයුතු.

"උට්ඨානවතො සතිමතො-සුචිකම්මස්ස නිසම්මකාරිනො,
සඤ්ඤතස්ස ච ධම්මජීවිනො-අප්පමත්තස්ස යසොභිවඩ්ඪති."

v. **ප්‍රකීර්ණාර්ථ**:-

**සද්ධා බන්ධති පාථෙය්‍යං**=සැදැහැ උපදවා දන්දෙයි; සිල්රකියි; පෙහෙවස් කම්කරයි; එහෙයින් මේ කියනලදී.

**සිරි**=ඓශ්වර්‍ය්‍යය; සිරිය.

**ආසයො**=වසන තැන;

**සිරි භොගාන මාසයො**-ඓශ්වර්‍ය්‍යය අභිමුඛවූකල්හි ගොඩිනුත් දියෙනුත් බෝග සම්පත් පැමිණෙත්මය; එහෙයින් මේ කියන ලදී.

**පරිකස්සති**=ඒ ඒ අරමුණට ඇදීම කරයි.

—:—

## 8. 9. පාථෙය්‍ය සූත්‍රප්‍රදීපයයි.

—:—

25. කිංසු ලොකස්මිං පජ්ජොතො-කිංසු ලොකස්මිං ජාගරො,
කිංසු කම්මෙ ස ජීවානං-කිමස්ස ඉරියාපථො.

26. කිංසු අලසං අනලසං ච-මාතා පුත්තං'ව පොසති,
කිංසු භූතූපජීවන්ති-යෙ පාණා පඨවිං සිතාති.

27. පඤ්ඤා ලොකස්මිං පජ්ජොතො-සති ලොකස්මිං ජාගරො,
ගාවො කම්මෙ සජීවානං-සීතස්ස ඉරියාපථො.

28. වුට්ඨි අලසං අනලසං ච-මාතා පුත්තං 'ව පොසති,
වුට්ඨිං භූතූපජීවන්ති-යෙ පාණා පඨවිං සිතා'ති.

---

8 – 10 – ( 25 – 28. )

i. **මාතෘකා:-**

**ලොකප්‍රදීපය ප්‍රඥාවයි; වැස්ස මව මෙනි.**

ii. **පිණ්ඩාර්ථය:-**

ලෙව්හි පැන පහන වැනිය, සිහිය ජාගරයි. ජීවත්වන්නන්ට ගවයෝ කම් සහාය වෙත්; සත්ත්වයාගේ ඉරියව්ව නගුලයි, අලස යාත් අනලසයාත් වැස්ස රකියි; පොළොවෙහි සිටින්නෝ වැස් සෙන් දිවි රකිති.

iii. **භාවය:-**

25. ලෝකයෙහි ප්‍රදීපයක් වැනිවූයේ කුමක්ද? ලෝකයෙහි කිනම් සවභාවයක් ජාගරබ්‍රාහමණයෙක් මෙන් වේද? කෘෂිකර්මාදියෙහි සමග ජීවත්වන්නවුන්ට කිනම් කෙනෙක් සහායවේද? ඒ සජිවකායයාගේ ජීවිකාවෘත්තිය කවරේද?

26. කුමක් අලසයාත් අලස නොවූවහුත් මව්තොමෝ පුතු මෙන් පොෂණ කෙරේද? යම් සත්ත්වකෙනෙක් පෘථිවි ආශ්‍රිත වෙත්ද ඒ සත්ත්වයෝ කුමක් නිසා ජීවත් වෙත්ද?

27. ප්‍රඥතොමෝ ලෙව්හි ප්‍රදීපයක් වැනි වේ; සමෘති තොමෝ ලෝකයෙහි ජාගර (නිදිවරන) බ්‍රාහමණයෙකු වැනි වේ; කර්මයෙහි සමග ජීවත්වන්නවුන්ට ගෙරි කර්මසහාය කර්මද්‍රතියක වෙත්; මේ සත්ත්වකායයාගේ ජීවිකාවෘත්තිය නගුලයි.

28. වෘෂ්ටිතොමෝ අලසයාත් අනලසයාත් මවක්තොමෝ පුතු රකින්නාක් මෙන් පොෂණය කරයි; පොළව ආශ්‍රය කරණ යම් ප්‍රාණීකෙනෙක් වෙත්ද ඒ සත්ත්වයෝ වෘෂ්ටිය ඇසුරුකොට ජීවත්වෙති.

iv. **අනුවාදය:-**

**ගාවො තමෙව සඤ්ජීවානං**=මෙයින් පණ්ඩිතගොපාලකයාගේ එකොළොස් අඞ්ගයකින් ගෙරින් රැකීම දක්වේ.

1. තමන්ගේ ගවයන්ගේ ගණන්වශයෙන් හෝ වර්ණවශයෙන් හැඳිනීම.

2. ගෙරින්ගේ ශරීරයෙහි කරණලද දුනු-තෝමර ත්‍රිසූලාදි ලකුණු දැනීම.

3. **ආසාටිකා**=සාටතයෙන් හෙවත් ගෙරින්ගේ වණ තුවාල සොයා බලා පණු ඉහඳ හැරදමා බෙහෙත්දීම.

4. **වණ පටිච්ඡාදනය**=බෙහෙත් දමා කොහුවලින් හෝ රෙදිකෑලිවලින් වණ බැඳ තැබීම.

5. වණ පිළියම සඳහා දුම්දීම.

6 **තිත්ථඥානය**=තොටුපල් සම විසමවශයෙන් පරීක්ෂා කිරීම.

7. **පීත ජානනය**=ගෙරින්ගේ පැන් පානය සොයා බැලීම.

8. **වීථිජානනය**=මේ මග සමය, නිර්භයය, මේ අහර සැක සහිතය, ප්‍රතිභය සහිතය කියා දැන ගැණීම.

9. **ගොචර කුසල භාවය**=ගෙරින්ගේ ගොදුරු දැනගැණීම.

10. **සාවසෙස**(ඉතුරුකොට) **දොහිභාවය**-වස්සාට ප්‍රමාණවත් සේ ඉතිරිකොට තබා කිරි දෙවීම.

11. **ගොපරිණායක අතිරෙක පූජාව**=නායක ගවයන්ට පූජා පැවැත්වීම. යන මේ කරුණු එකොළොසින් ගෙරි රකින්නන්ට සියලු කටයුත්තෙහිම සහජීවී ගවයෝ වෙති.

v. **ප්‍රකටීකරණාර්ථ:-ජාගරො**=නොනිදන බමුණෙක් මෙන් වෙයි; **ගාවො තමෙව සඤ්ජීවානං**-කටයුත්ත සමග ජීවත්වන්නවුන්ට ගෙරිම කටයුත්තෙහි කර්මසහාය කර්මද්‍රව්‍යයක නම් වෙත්; ගවමඬුලු සමග කෘෂිකර්මාදීහු නිපදිත්; එහෙයිනි. **සිතස්ස ඉරියාපථො**=නගුල (සීවැල) ඒසඞ්ඛසමූහයාට ඉරියව්වයි, ජීවිත වෘත්තියයි. යමෙකුගේ නගුලෙන් වනාහි කෙත අල්පමාත්‍ර සීසෑමක් නොවූයේ නොවේ නම් හෙතෙම කෙසේ ජීවත්වන්නේ දැයි කියයි.

—:—

## 8. 10. පජ්ජොත සූත්‍රප්‍රදීපයයි.

—:—

29. කෙසූ'ධ අරඤ්ඤා ලොකෙ-කෙසං වුසිතං න නස්සති,
කෙ'ධ ඉච්ඡං පරිජානන්ති-කෙසං භොජිස්සියං සදා.

30. කිංසු මාතා පිතා භාතා-වන්දන්ති නං පතිට්ඨිතං,
කිංසූ'ධ ජාතිහීනං-අභිවාදෙන්ති ඛත්තියා'ති.

31. සමණී'ධ අරඤ්ඤා ලොකෙ-සමණානං වුසිතං න නස්සති,
සමණා ඉච්ඡං පරිජානන්ති-සමණානං භොජිස්සියං සදා.

32. සමණං මාතා පිතා භාතා-වන්දන්ති නං පතිට්ඨිතං,
සමණී'ධ ජාතිහීනං-අභිවාදෙන්ති ඛත්තියා'ති.

8. ඛත්තා වග්ගො.

---

දෙවතා සංයුත්තං සමත්තං.

---

8 - 11 - ( 29 - 30 - 31 - 32. )

i. **මාතෘකා;-**

**හීන ජාති ඇතත් සිල්වත් මහණහුට දෙවියෝ පවා වඳිත්.**

ii. **පිණ්ඩාර්ථය:-**

රහත් මහණුන්ට කෙලෙස් නැත, ආර්‍ය්‍ය මාර්‍ගවාසය නොනැසෙයි, ලෞකික ලෝකොත්තර ප්‍රඥාවෙන් ඉච්ඡාව දැනගණිත්, ක්ෂීණාශ්‍රව ශ්‍රමණයන්ට සදාකාලික නිදහස වේ. මව්පිය බෑයෝ පැවිද්දාට වඳිත්. සැඩොල්කුලෙන් පැවිදිවූවත් සිල් සපත්හට ක්ෂත්‍රියයෝ වඳිත්.

iii. **භාවය:-**

29. මේ ලෝකයෙහි කවර නම් කෙනෙක් නිකෙලසීවෙත්ද? කවරෙකුන් විසින් වැස නිමවනලද්ද නොනසීද? මේ ලෝකයෙහි කවර කෙනෙක් ඊප්සාව පිරිසිඳ දනිත්ද? නොහොත් ක්ෂය කරත්ද? කවරෙකුන්ට හැමකල්හි භුජිස්සභාවය වේද?

30. ශීලයෙහි පිහිටියාවූ කවරෙකු මව් ද, පියතෙමේ ද, භ්‍රාතෘද (යන මොව්හු) වඳිත්ද, මේ ලෝකයෙහි හීන ජාති ඇති කවරෙකුට ක්ෂත්‍රියයෝ වඳිත්ද?

31. මේ ලෙව්හි ශ්‍රමණයෝ නිකෙලසීහු වෙත්, ශ්‍රමණයන් විසින් වැස නිමවූ ආර්‍ය්‍යමාර්ගී වාසය නොනසියි; ශුද්ධ ශ්‍රමණයෝ ඊප්සාව ක්ෂය කරත්; ක්ෂීණාශ්‍රව ශ්‍රමණයන්ට හැමකල්හි භුජිස්සභාවය වේ, නිදහස්බව වේයයි සේයි.

32. සිල්හි පිහිටියාවූ මහණහුට මව්ද, පියා ද, සහෝදරයා ද යන මොව්හු වඳිත්; මේ ලෙව්හි ජාතියෙන් හීනවූ හෙවත් අඩුකුල ඇතත් ශ්‍රමණයාට ක්ෂත්‍රියයෝ වඳිත්.

iv **අනුවාදය:-**

"ඉධෙව භික්ඛවෙ සමණො, ඉධ දුතියො සමණො, ඉධ තතියො සමණො, ඉධ චතුත්ථො සමණො සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙ" යනාදීන් ශ්‍රමණ විශෙෂ දතයුතුයි

1 **සමණො-සොතාපන්නො**="කතමො ච භික්ඛවෙ සමණො, ඉධ භික්ඛවෙ භික්ඛු තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො අයං භික්ඛවෙ සමණො.

**දුතියො-සකදාගාමි**

2. කතමො ච භික්ඛවෙ දුතියො සමණො, ඉධ භික්ඛවෙ භික්ඛු තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාග දොස මොහානං තනුත්තා සකදාගාමී හොති, සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරෙති; අයං භික්ඛවෙ දුතියො සමණො

**තතියො-අනාගාමි.**

3. කතමො ච භික්ඛවෙ තතියො සමණො, ඉධ භික්ඛවෙ භික්ඛු පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී; අනාවත්තිධම්මො තස්මා ලොකා; අයං භික්ඛවෙ තතියො සමණො.

**චතුත්ථො-අරහන්තො**

4. කතමො ච භික්ඛවෙ චතුත්ථො සමණො, ඉධ භික්ඛවෙ භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති; අයං භික්ඛවෙ චතුත්ථො සමණො." යන මේ පාඨයන්ගෙන් **සෝතාපන්න, සකෘදාගාමි, අනාගාමි, අරහන්ත** යන සතර ඵලයෙහි පිහිටි ශ්‍රමණයන්වහන්සේලාම අදහස් කරණලදී

මේ ශාසනයෙන් බාහිරකයන්ගේ දෙසැටදෘෂ්ටිසංඛ්‍යාත පරප්‍රවාදයෝ සතර ඵලයෙහි පිහිටි මහණුන්ගෙන්ද සූන්‍ය වෙති.

සතර මාර්ගස්ථ ශ්‍රමණයන්ගෙන්ද ශූන්‍යවෙත්.

සතර මාර්ගයපිණිස ආරබ්ධ විදර්ශකයන්ගෙන්ද සූන්‍ය වෙත් මෙසේ දෙළොස් ආකාර මහණුන්ගෙන් ම සුන් වෙත්.

මේ කාරණය සඳහාම භාග්‍යවතුන්වහන්සේවිසින් මහා පරිනිර්වාණ සූත්‍රයෙහි මෙසේ වදාරා තිබේ.

"එකූනතිංසො වයසා සුභද්ද-යං පබ්බජිං කිං කුසලානුඑසී,
වස්සානි පඤ්ඤාස සමාධිකානි-යතො අහං පබ්බජිතො සුභද්ද;
ඤායස්ස ධම්මස්ස පදෙසවත්ති-ඉතො බහිද්ධා සමණොපි නත්ථි".

මෙහි **"පදෙස වත්ති"** යනුවෙන් ආරද්ධවිපස්සකතෙමේ අධිප්පෙත වේ. එහෙයින් සෝවාන්මගට පමිණගත් විදසුන් ඇත්

තෙක් හෝ සෝවාන්මගට පැමිණියෙක් හෝ සෝවාන්පෙලෙහි පිහිටියෙක් හෝ නැත; සකෘදාගාමිමාර්ගයට ආරබ්ධ විදර්ශක, මාර්ගස්ථ, ඵලස්ථ දෙවෙනි ශ්‍රමණයෙක් ද නැත.

අනාගාමි, අරහත් මාර්ගදෙක්හි ද මේ ක්‍රමයයි; කුමක් නිසා මේ ශ්‍රමණයෝ අන්තැනක නැත්තාහුද? ක්ෂෙත්‍ර නොවනහෙයිනි. යම් සේ හිඳි අඟ අබැට නොසිටීද, දියපිට ගිනි නොදල්වේද, ගල් පොත්තක් මත බීජයෝ නොපැලවෙත්ද, එමෙන්ම බාහිර තීර්ථායතනයන්හි මේ ශ්‍රමණයෝ නූපදිත්; මේ සස්නෙහිම උපදිත්; මනා කෙත් බැවිනි.

v. **ප්‍රකීර්ණකරණාර්ථ.**- **සමණා**=ක්ෂීණාශ්‍රව ශ්‍රමණයෝ; ඒ රහතුන් වහන්සේලා වනාහි ඒකාන්තයෙන් **අරණයෝ** නම් වෙත්.

**වුසිතං න නස්සති**= උන්වහන්සේලාගේ ආර්යමාර්ගවාසය නොනැසේ

**පරිජානන්ති**=පෘථග්ජන කල්‍යාණකයා පටන් සෙඛයෝ ලෞකික-ලෝකෝත්තර ප්‍රඥාවෙන් පිරිසිඳ දැන ක්ෂය කරති.

**භොජිස්සියං**=ක්ෂයවූ ආශ්‍රව ඇති ශ්‍රමණයන්ටම තිති බුජිස් බැව නම් වේ.

**ඛත්තියා**=හුදෙක් ක්ෂත්‍රකුලයේ රජවරු පමණක් නොව දෙවියෝද සීලසම්පන්නවූ ශ්‍රමණයාට වඳිත්මයයි වදාළසේක.

—:—

## 8. 11. අරණ සූත්‍රප්‍රදීපයයි.

අටවන ඛත්වා වගයි.

(කස්සුද්දනං.

ඛත්වා රථං ච චිත්තං ච-වුට්ඨී භීතා න ජීරති,
ඉස්සරං කාමපාථෙය්‍යං-පජ්ජෝතො අරණේනචා'ති.)

—:—

**මෙතෙකින් සංයුක්තප්‍රදීපිකා නම් සගාථක ධර්මකථාවෙහි**

## දෙවතා සංයුක්ත වර්ණනාව නිමියේය.

පාලිං අට්ඨකථං චාපි-ව්‍යාඛ්‍යාතං සීහලං මයා,
සමාලෝකිය සද්ධම්ම-ගන්ථාගතනයේන'පි.
මාතිකා පිණ්ඩ භාවත්ථ-අනුවාදෙ ච පාකටි,
කරණං දීපයන්තෙන-ලිඛිතං සඞ්ගහං හිතං,
ලෝක සාසන මත්ථාය-බොධත්ථාය භවාභවෙ,
ගරූනං ගාරවත්ථාය-මාතා පිතු සුඛාය ච.



